# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

(තුන්වන කාණ්ඩය)

## අමරදාස රත්නපාල

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 8,9 සහ10 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක, අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත.

**Please note** : The TABLE OF CONTENTS of this book is located in page no:8-10 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the Table of contents and you will be directed to the relevant page.

# පෙරවදන

අභිධර්මයෙහි එන්නේ පරමාර්ථ ධර්ම සතරෙකි. සත්ත්වසන්තානයෙහි පහළ වන තාක් සිත් චිත්ත පරමාර්ථ වශයෙනුත්, හැම සිත්හි ලැබිය හැකි තාක් හොඳ-නොහොඳ ගුණ විශෙෂයන් චෛතසික පරමාර්ථ වශයෙනුත්, මේ චිත්ත චෛතසික නම්වූ නාම ධර්මයනට ආධාර වූ ශරීරයෙහි ලැබිය හැකි තාක් ද්‍රව්‍ය සමූහය රූප පරමාර්ථ වශයෙනුත්, මේ නාමරූප හෙවත් පංචස්කන්ධ සංඛ්‍යාත සත්ත්වයාම පිළිබඳ වුවත් චිත්ත චෛතසිකයන් හා සම්ප්‍රයෝග ලක්ෂණයෙන්වත්, රූපයන් හා කලාප බන්ධන වශයෙන්වත් කිසිකලෙකත් නො-බැඳෙන බැවින් ඒකාන්ත කෙවල (තනි) ධර්මයක් වූ ද, සොවාන් ආදී සතර මඟින් දක්නාතෙක් ප්‍රත්‍යක්ෂයෙන් නො පෙනෙතත් නිත්‍යව නොවෙනස්ව පවත්නා වූ නිර්වාණ ධර්මය නිර්වාණ පරමාර්ථ වශයෙනුත් අභිධර්ම-යෙහි අඳුන්වාදී ඇත. අභිධර්මපිටකයට අයත් සප්ත-ප්‍රකරණයෙහි ම එන්නේ මේ සතර පරමාර්ථ පිළිබඳ විස්තර ය.

ආභිධර්මිකයන්ගේ ගෞරවාදරයට බඳුන් වූ අභිධර්මාර්ථ සංග්‍රහය නම්වූ ග්‍රන්ථරත්නයට දිඹුලාගල මහා කස්සප සඟරජ මාහිමිපාණන්ගේ ශිෂ්‍ය සාගරමති සාරිපුත්ත ස්වාමීන්ද්‍රයන් විසින් ඉතා ව්‍යක්ත ලෙස සැපැයුණු සන්නයක් ඇත. මේ හැර මේ ග්‍රන්ථය සඳහා ලියැවුණු ටීකා සන්න හා පරිවාර ග්‍රන්ථයෝ ද බොහෝ වෙති.

උගතුන්ගේ සිතැද ගත් මේ අභිධර්මාර්ථ සංග්‍රහය ම අනුව යමින් අමරදාස රත්නපාල දොස්තර මහත්මා විසින් මහත් වෑයමකින් සපයා ඇති මේ අභිධර්මාර්ථ ප්‍රදීපිකා නම්වූ ග්‍රන්ථයෙහි අභිධර්ම කාරණා ඉතා විසිතුරු-වත්, විසදවත් ලියා ඇති බව කිය යුතු ය.

කාණ්ඩ සතරෙකින් හා දෙදහසකට අධික පිටු ගණනකින් යුතුව මෙතරම් විස්තර විභාග සහිතව ලියැවුණු මේ සා විශාල අනෙක් අභිධර්මග්‍රන්ථයක් මෙතෙක් මේ රටෙහි ලියැවී නැතිසේ ය.

නවීනයනට මෙන් ම ප්‍රවීනයනට ද මේ ග්‍රන්ථය බෙහෙවින් උපකාර වනුවා පමණක් නොව මෙය ජනකාන්ත ද වනුවා ඇත. වෛද්‍යවෘත්තියෙහි යෙදෙන ගමනේ මෙබඳු වටනා ග්‍රන්ථයක් ලියා බෞද්ධ ධර්ම සාහිත්‍යය පෝෂණය කිරීම ගැන කවුරුනුත් රත්නපාල මහතාට කෘතඥ විය යුතු බව කියනු කැමැත්තෙමි

**පියදස්සි ස්ථවිර**

**1964 ජූලි 8 වැනිදා**
**බම්බලපිටියේ**
**වජිරාරාමයේ දී ය.**

# පිරිනැමුම

දහහත් හැවිරිදි වියේදී මෙලොව ජීවිතය හළ මා දෙටු පුත්

## විධුර රවින්ද්‍රනාථට

මේ පොතත්, මෙය ලිවීමෙන් ලත් පිනුත්
පිරිනැමෙයි

# හැඳින්වීම

**අභිධර්මාර්ථ ප්‍රදීපිකා** නම් වූ මේ පොත අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් සම්පාදනය කරන ලද්දකි. අභිධර්ම පිටකයට අයත් සප්තප්‍රකරණයන්හි ඇතුළු වූ ධර්මාර්ථයන් පිඩුකොට ත්‍රිපිටකධර අනුරුද්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් සම්පාදිත **අභිධර්මාර්ථ සංග්‍රහය** නම් ග්‍රන්ථය බොහෝ කලෙක සිට අභිධර්මය උගන්නවුනට මහෝපකාරී විය. බුදුරජාණන් වහන්සේ විසින් දෙසිත ත්‍රිපිටක ධර්මයෙහි සඳහන්වන ධර්මාර්ථයන් මනාව වටහාගැනීමට පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනීමක්වත් තිබිය යුතුය. මෝහයෙන් වඩනාලද පුහුදුන් සිත් සතන් මිථ්‍යාමත වලින් මුදවා පිරිසුදු සම්‍යග් දෘෂ්ටියෙහි යොදවා ගැනීම ධර්මඥානයෙන්ම කළ යුත්තෙකි. කුසලාකුසල ධර්මයන් හැඳින එහි ඉෂ්ටා‘නිෂ්ට විපාකයන් දැනගැනීමටත් චතුරාර්ය සත්‍ය ධර්මාවබෝධය පිණිස වැඩිය යුතු සමථ විදර්ශනා භාවනානුයෝගයටත් ඉවහල්වන ධර්ම සමූහය අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ඇතුළත් වේ. එබැවින් ධර්මය ඉගෙනීමෙහි කැමැත්ත ඇති, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් තියුණු කර ගැනීමට උත්සාහ දරන සත්පුරුෂයන්හට අභිධර්මාර්ථ සංග්‍රහය වැනි අන් ග්‍රන්ථයක් නැතැයි කිව යුතුය.

පෙර ධර්ම විනයධර උතුමන් විසින් ඉතා ගෞරවයෙන් ආචාර්ය පරම්පරානුගත විධි නොඉක්මවා තම සිසුන් පිරිසුදු ශීලයෙහි පිහිටුවා ධර්මඥානය ලබාදීමෙන් පර්යාප්ති ප්‍රතිපත්ති ශාසනය රැකගත් බව ශාසන ඉතිහාසයෙන් හෙළිවේ. පසු කලෙක විදෙශයෙන් පැමිණි අන්‍ය ලබ්ධිකයන්ගේ තපුරු බලපෑම් නිසාත් වෙනත් නොයෙක් අවහිරකම් නිසාත් පිරිහෙන්නට ගිය මේ සසුන, කලින් කල පහළවූ ගිහි පැවිදි උතුමන්ගේ උත්සාහයෙන්, අතුරුදහන් වන්නට ඉඩ නොදී රැකගත් හෙයින් අදත් සැදැහැතියන්හට දහම් ඉගෙනීමටත් පිළිවෙත් පිරීමටත් ඉඩ ඇත්තේමය. නුවණත්, ශ්‍රද්ධාවත්, උත්සාහයත්

ඇතොත් භික්ෂූන් වහන්සේට දහම් ඉගෙන පිළිවෙත් පිරීමට එතරම් අවහිරයක් නම් නැත. එහෙත් එවැනි භාග්‍යයක් නැතිව නොයෙක් දුෂ්කරතා මධ්‍යයෙහි රැකීරක්ෂා ගේ දොර වැඩ කටයුතු ආදියෙහි යෙදී සිටින සැදැහැවත් ගිහි පින්වතුන්හට වරින්වර නොයෙක් මාතෘකායෙන් කැරෙන ධර්ම දේශනා හැර පිළිවෙළින් ධර්මය ඉගෙනීමට ක්‍රමයක් නැති හෙයින් පින්පව් හැඳින ගැනීමට පවා නොහැකිව ඔවුන් ශ්‍රද්ධාදි ගුණයන්ගෙන් පිරිහෙමින් ලෝකයේ නන් දෙසින් ගලා එන මිථ්‍යා මතවලට ඇබ්බැහි වෙමින් ධර්මයට පිටුපායන්නා සේ පෙනෙන්නට ඇත.

භාග්‍යයකට මෙන් මෑතෙක සිට ධර්මධර ස්වාමීන් වහන්සේලා සහ උගත් ගිහි උතුමන් විසින්ද ධර්මය උගන්නවුන්ගේ ප්‍රයෝජනය පිණිස හෙළ බසින් දහම් පත් පොත් මුද්‍රණය කරවා පළකර හැරීමත් ධර්ම පන්ති පැවැත්වීමත් නිසා ගිහි පින්වතුන්හට ධර්මය උගෙනීමට මගක් සැලසී ඇතිබව සඳහන් කළයුතුය.

මෙයට දසවසකට පමණ පෙර කොළඹ තරුණ බෞද්ධ සමිතියේ එවකට ප්‍රධාන ලේකම් ධුරය දැරූ සී. වී. පෙරේරා මහත්මාටද ධර්ම පන්තියක් ඇරඹීමේ අවශ්‍යතාවය වැටහී අපට ආරාධනා කෙළෙන් වර්ෂ 1954 ක් වූ මැයි මස 3 වන දින කොළඹ තරුණ බෞද්ධ සමිති ශාලාවේදී "පරමාර්ථ ධර්ම පඞ්ක්තිය" නමින් ධර්ම පන්තියක් අරඹා එතැන් සිට අද වන තෙක් නොකඩවා සති පතා එම ධර්ම පන්ති පවත්වාගෙන යමි. අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් එහි ඇතුළු ධර්මයන් හැකිතාක් ලිහිල් බසින් විස්තර කරදීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ ඒ ධර්ම කොටස් එම ආකාරයෙන්ම මුද්‍රණය කොට පළකළහොත් ලක්දිව නොයෙක් පළාත්වල සිටින පින්වතුනටද ඉන් මහත්සේ ඵල ලැබිය හැකි බව බොහෝ දෙනාගේ අදහස වූයෙන් එම පාඨම් මුද්‍රණය කොට ධර්මදානයක් වශයෙන් නොමිළයේ බෙදා හැරීමට සී. වී. පෙරේරා මහත්මාම ඉදිරිපත් විය. කටයුතු අධික

දුෂ්කර කාලයක් වූයේ වී නමුත් බොහෝ දෙනාට වන ධර්ම ලාභය සලකා ධර්ම පත්‍රිකා ලියා දීමට භාර ගෙන අවකාශ ඇති පරිදි එය කර දුනිමි. සුළු වශයෙන් කිරීමට අදහස් කළ කටයුත්ත විස්තර ඇතිව ධර්මය උගෙනීමට කැමති පින්වතුන් ඇතිබව දැනගන්නට ලැබුන හෙයින් අපට ඇති අනවකාශයත් ප්‍රකාශක භවතුන්හට දරන්නට සිදුවන වියදමත් නොසලකා ධර්ම ලාභයම සලකා පිටු දෙදහසකට අධිකවූ ප්‍රමාණයක් ලියා මුද්‍රණය කරවා නොමිලයේ බෙදා හරින්නට හැකි විය මේ පත්‍රිකා පිළිවෙළින් මුද්‍රණය කරවා බෙදා හරින්නට සී. ටී පෙරේරා මහත්මා දැරූ උත්සාහයත් වියදම් කළ ප්‍රමාණයත් බොහෝය. මේ ධර්ම දානමය පුණ්‍ය කර්මයෙහි ඇති වැදගත්කම වටහාගත් වෙනත් සැදැහැවතුන් විසින්ද නොයෙක් වර මුදල් පරිත්‍යාග කිරීම ආදියෙන් ඒ මහත්මාට අනුබල දුන් බවද සතුටින් සඳහන් කළ යුතුය. පිටු 500 කින් පමණ යුත් අවසාන පරිච්ඡේදය කොළඹ තරුණ බෞද්ධ සමිතියේ පාලක මණ්ඩලය භාර ගෙන ඒ සමිතියේ වියදමින් මුද්‍රණය කරවා දීම මේ සත්කාර්‍යයට විශෙෂ රුකුලක් විය.

වර්ෂ 1959 දී ආරම්භ කළ **"පරමාර්ථ ධර්ම පත්‍රිකා"** සියල්ල මුද්‍රණය කිරීමත් බෙදා හැරීමත් පුරා අවුරුදු සතරක් මුළුල්ලේම සිදු විය. එක් වරකට මුද්‍රණය කළ හැකි වූයේ පත්‍රිකා සීමා සහිත ප්‍රමාණයක් බැවින් පසුව මේ ධර්මය උගන්නට අදහස් කළ පින්වතුන්හට මුල් පරිච්ඡේද ලබා ගැනීමට නොහැකිවූයෙන් නැවතත් එය මුද්‍රණය කරවා දෙන ලෙස නොයෙක් පළාත්වලින් ආරාධනා ලදිමි. එහෙයින් මේ පොත මෙසේ මුද්‍රණය කරවන්නට සිදුවූයේ.

අභිධර්මාර්ථ සංග්‍රහය අනුව යමින් එහි එන ධර්මයන් පිළිබඳ විස්තර විවරණයක් මෙහි ඇතුළත් කළ හෙයින් මේ පොතට **"අභිධර්මාර්ථ ප්‍රදීපිකා"** යන නම යෙදුවෙමු. අභිධර්මාර්ථ සංග්‍රහ පාලියත්, එහි භාවයත් ඒ ඒ පරිච්ඡේද වලට මුලින් යොදා ඇත. කාණ්ඩ සතරක් හැටියට පළ වන මේ ග්‍රන්ථයෙහි පළමු කාණ්ඩයෙහි **චිත්ත සංග්‍රහ**

Free Distribution www.aathaapi.org

**විභාග** නම් වූ ප්‍රථම පරිච්ඡේදයද, **චෛතසික සංග්‍රහ විභාග** නම් වූ ද්විතීය පරිච්ඡේදයද, **ප්‍රකීර්ණක සංග්‍රහ විභාග** නම් වූ තෘතීය පරිච්ඡේදයද, **වීථි සංග්‍රහ විභාග** නම් වූ චතුර්ථ පරිච්ඡේදයද, **වීථිමුක්ත සංග්‍රහ විභාග** නම් වූ පඤ්චම පරිච්ඡේදයද ඇතුළත් වේ. දෙවන කාණ්ඩයෙහි **රූප සංග්‍රහ විභාග** නම් වූ ෂට්ඨම පරිච්ඡේදය සහ **සමුච්චය සංග්‍රහ විභාග** නම් වූ සප්තම පරිච්ඡේදයද, තුන්වන කාණ්ඩයෙහි **ප්‍රත්‍යය සංග්‍රහ විභාග** නම් වූ අෂ්ටම පරිච්ඡේදයද, සතරවන කාණ්ඩයෙහි **කර්මස්ථාන විභාග** නම් වූ නවවන පරිච්ඡේදයද ඇතුළත් වේ.

මේ පොත ලිවීමේදී **විශුද්ධි මාර්ගය, අඨසාලිනි** නම් වූ **ධම් සඟුණු අටුවාව,** විභඞ්ග අටුවාව ආදි අභිධර්ම ග්‍රන්ථ උපයෝගි කරගත් බව සඳහන් කරනු කැමැත්තෙමි

විශේෂයෙන් පාලි භාෂාවෙහි වැඩි දැනීමක් නැති පින්වතුන්ගේ ප්‍රයෝජනය සලකා මේ ධර්ම විවරණය හැකිතාක් ලිහිල් බසින් ලියා ඇති බවත් පෙළ අටුවාවන්හි එන පාලිපාඨ මෙහි නොයෙදූ බවත් සලකනු මැනවි.

මේ පොත හදාරන භවතුනට අභිධර්මය පිළිබඳ යම් කිසි දැනීමක් ඇති කර ගත හැකි වූයේ නම් එයම අපගේ වෑයමේ ප්‍රතිඵලයක් හැටියට සලකමි.

මෙබඳු ග්‍රන්ථයක් ලියන්නට තරම් අවශ්‍ය මූලික ශාස්ත්‍ර ඥානයත්, ධර්ම ඥානයත් ජීවිතයේ මුල් අවධියේම මට ලබා දුන් මා ගුරුදෙව් **දන්ගෙදර සිරි සරණපාල මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ** සහ ධර්ම සාකච්ඡාදියෙන් මට පිහිට වූ **පැලෑණේ සිරි වජිරඤාණ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත්** නමස්කාරපූර්ව කෘතඥතාවෙන් සිහිකොට පින් දෙමි. එසේම නෑසියන් මා දෙමාපිය ගුරුවරාදීන්ටද මෙහි පින් අනුමෝදන් කරවමි.

පෙර වදනක් ලියා දෙමින් මට අනුග්‍රහ කළ වජිරාරාම **වාසි පියදස්සි හිමිපාණන්ට** ද, සෝදුපත් බලා දුන් පින්වතුන්ට හා ප්‍රකාශක භවතුන්ට ද කෘතඥ වෙමි.

**සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!**

**අමරදාස රත්නපාල**

# පටුන


## ප්‍රත්‍යය සඞ්ග්‍රහ විභාගය නම් වූ අෂ්ටම පරිච්ඡේදය


| | පිටුව |
|---|---|
| පෙළ | 1 |
| භාවය | 7 |
| **පටිච්ච සමුප්පාදය** | **15** |
| අවිජ්ජා පච්චයා සඞ්ඛාරා | 35 |
| සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං | 55 |
| විඤ්ඤාණ පච්චයා නාමරූපං | 81 |
| නාමරූප පච්චයා සළායතනං | 86 |
| සළායතන පච්චයා ඵස්සො | 89 |
| ඵස්ස පච්චයා වේදනා | 91 |
| වේදනා පච්චයා තණ්හා | 92 |
| තණ්හා පච්චයා උපාදානං | 94 |
| උපාදාන පච්චයා භවො | 100 |
| භව පච්චයා ජාති | 107 |
| ජාති පච්චයා ජරාමරණං | 108 |
| මූල දෙක | 113 |
| කාල තුන | 115 |
| ත්‍රිසන්ධිය | 115 |
| චතුර්විධ සංක්‍ෂෙපය | 116 |
| විසි ආකාර අර | 116 |
| අතීත හෙතු පඤ්චකය | 116 |

| | පිටුව |
|---|---|
| වර්තමාන ඵල පඤ්චකය | 118 |
| වර්තමාන හේතු පඤ්චකය | 119 |
| අනාගත ඵල පඤ්චකය | 120 |
| ත්‍රිවිධ වට්ට | 122 |
| **පට්ඨාන නය** | 138 |
| සූවිසි ප්‍රත්‍ය ධර්ම | 139 |
| හෙතු ප්‍රත්‍යය | 142 |
| ආරම්මණ ප්‍රත්‍යය | 157 |
| අධිපති ප්‍රත්‍යය | 230 |
| අනන්තර ප්‍රත්‍යය | 256 |
| සමනන්තර ප්‍රත්‍යය | 276 |
| සහජාත ප්‍රත්‍යය | 281 |
| අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය | 301 |
| නිස්සය ප්‍රත්‍යය | 310 |
| උපනිස්සය ප්‍රත්‍යය | 337 |
| පුරේජාත ප්‍රත්‍යය | 406 |
| පච්ඡාජාත ප්‍රත්‍යය | 420 |
| ආසෙවන ප්‍රත්‍යය | 425 |
| කම්ම ප්‍රත්‍යය | 432 |
| විපාක ප්‍රත්‍යය | 444 |
| ආහාර ප්‍රත්‍යය | 449 |
| ඉන්ද්‍රිය ප්‍රත්‍යය | 460 |
| ඣාන ප්‍රත්‍යය | 471 |
| මග්ග ප්‍රත්‍යය | 479 |

| | පිටුව |
|---|---|
| සම්පයුත්ත ප්‍රත්‍යය | 488 |
| විප්පයුත්ත ප්‍රත්‍යය | 494 |
| අත්ථි ප්‍රත්‍යය | 504 |
| නත්ථි ප්‍රත්‍යය | 530 |
| විගත ප්‍රත්‍යය | 534 |
| අවිගත පත්‍යය | 535 |
| **සූවිසි ප්‍රත්‍යය විනිශ්චය** | 537 |
| **ප්‍රඥප්ති** | 543 |

# භව චක්‍රය



# අභිධම්මත්ථ සඞ්ගහො

## අට්ඨමො පරිච්ඡෙදො

## පච්චය සඞ්ගහ විභාගො

1. යෙසං සඞ්ඛත ධම්මානං - යෙ ධම්මා පච්චයා යථා.
තංවිභාග මි හෙදානි - පවක්ඛාමි යථාරහං.

2. පටිච්චසමුප්පාදනයො, පට්ඨානනයො චෙති පච්චය සඞ්ගහො දුවිධො වෙදිතබ්බො. තත්ථ තබ්භාවභාවීභාවාකාර මත්තොපලක්ඛිතො පටිච්චසමුප්පාදනයො. පට්ඨාන නයො පන ආහච්ච පච්චයට්ඨිතිමාරබ්භ පවුච්චති. උභයං පන වොමිස්සෙත්වා පපඤ්චෙන්ති ආචරියා.

3. තත්ථ අවිජ්ජා පච්චයා සඞ්ඛාරා, සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

**අයමෙත්ථ පටිච්ච සමුප්පාද නයො.**

Free Distribution www.aathaapi.org

4. තත්ථ තයො අද්ධා, ද්වාදසඞ්ගානි, වීසතාකාරා, තිසන්ධි, චතුසඞ්ඛෙපා, තීණිවට්ටානි, ද්වෙමූලානිච වෙදිතබ්බානි.

5. කථං? අවිජ්ජා සඞ්ඛාරා අතීතො අද්ධා, ජාති ජරාමරණං අනාගතො අද්ධා, මජ්ඣෙ අට්ඨ පච්චුප්පන්නො අද්ධාති තයො අද්ධා.

6. අවිජ්ජා, සඞ්ඛාරා, විඤ්ඤාණං, නාමරූපං, සළායතනං, ඵස්සො, වෙදනා, තණ්හා, උපාදානං, භවො, ජාති, ජරාමරණන්ති ද්වාදසඞ්ගානි. සොකාදිවචනං පනෙත්ථ නිස්සන්දඵල නිදස්සනං.

7. අවිජ්ජා සඞ්ඛාරග්ගහණෙන පනෙත්ථ තණ්හූපාදාන භවාපි ගහිතා භවන්ති, තථා තණ්හූපාදාන භවග්ගහණෙනච අවිජ්ජා සඞ්ඛාරා, ජාති ජරා මරණග්ගහණෙනච විඤ්ඤාණාදි ඵලපඤ්චකමෙව ගහිතන්ති කත්වා.

8. අතීතෙ හෙතවො පඤ්ච - ඉදානි ඵල පඤ්චකං
ඉදානි හෙතවො පඤ්ච - ආයතිං ඵල පඤ්චකන්ති.
වීසතාකාරා තිසන්ධි - චතුසඞ්ඛෙපාච භවන්ති.

9. අවිජ්ජා තණ්හූපාදානාච කිලෙසවට්ටං. කම්මභව සඞ්ඛාතො භවෙකදෙසො සඞ්ඛාරාච කම්මවට්ටං. උපපත්ති භව සඞ්ඛාතො භවෙකදෙසො අවසෙසාච විපාකවට්ටන්ති තීණිවට්ටානි

10. අවිජ්ජා තණ්හා වසෙන ද්වෙමූලානිච වෙදිතබ්බානි.

11. තෙසමෙවච මූලානං. නිරොධෙන නිරුජ්ඣති.
ජරාමරණ මුච්ඡාය - පීළිතානමභිණ්හසො.
ආසවානං සමුප්පාදා - අවිජ්ජාච පවත්තති.
වට්ටමාබද්ධ මිච්චෙවං - තෙභූමකමනාදිකං.
පටිච්චසමුප්පාදොති - පට්ඨපෙසි මහාමුනි.

12. හෙතුපච්චයො, ආරම්මණපච්චයො, අධිපතිපච්චයො, අනන්තරපච්චයො, සමනන්තරපච්චයො, සහජාතපච්චයො, අඤ්ඤමඤ්ඤපච්චයො, නිස්සයපච්චයො,

උපනිස්සයපච්චයො, පුරෙජාත පච්චයො, පච්ඡාජාත පච්චයො, ආසෙවනපච්චයො, කම්මපච්චයො, විපාකපච්චයො, ආහාරපච්චයො, ඉන්ද්‍රිය පච්චයො, ඣානපච්චයො, මග්ග-පච්චයො, සම්පයුත්ත පච්චයො, විප්පයුත්ත පච්චයො, අත්ථි පච්චයො, නත්ථි පච්චයො, විගත පච්චයො, අවිගත පච්චයොති.

## අයමෙත්ථ පට්ඨාන නයො.

13. ඡධා නාමං තු නාමස්ස - පඤ්චධා නාමරූපිනං.
එකධා පුන රූපස්ස - රූපං නාමස්ස චෙකධා.
පඤ්ඤත්ති නාමරූපානි - නාමස්ස දුවිධා ද්වයං.
ද්වයස්ස නවධා චෙති - ඡබ්බිධා පච්චයා කථං.

14. අනන්තර නිරුද්ධා චිත්ත චෙතසිකා ධම්මා පච්චුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං අනන්තර, සමනන්තර, නත්ථි, විගතවසෙන, පුරිමානි ජවනානි පච්ඡිමානං ජවනානං ආසෙවන වසෙන, සහජාතා චිත්ත චෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සම්පයුත්තවසෙනාති ච ඡධා නාමං නාමස්ස පච්චයො හොති.

15. හෙතු, ඣානඞ්ග, මග්ගඞ්ගානි සහජාතානං නාමරූපානං හෙතාදිවසෙන, සහජාතා චෙතනා සහජාතානං නාමරූපානං නානාක්ඛණිකා චෙතනා කම්මාභිනිබ්බත්තානං නාමරූපානං කම්මවසෙන, විපාකක්ඛන්ධා අඤ්ඤමඤ්ඤං සහජාතානං රූපානං විපාකවසෙනෙති ච පඤ්චධා නාමං, නාමරූපානං පච්චයො හොති.

16. පච්ඡාජාතා චිත්තචෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාතවසෙනෙති එකධාව නාමං රූපස්ස පච්චයො හොති.

17. ඡ වත්ථූනි පවත්තියං සත්තන්නං විඤ්ඤාණධාතූනං පඤ්චාරම්මණානි ච පඤ්චවිඤ්ඤාණ වීථියා පුරෙජාත වසෙනෙති එකධාව රූපං නාමස්ස පච්චයො හොති.

18. ආරම්මණවසෙන උපනිස්සයවසෙනෙති ච දුවිධා පඤ්ඤත්ති නාමරූපානි නාමස්සෙව පච්චයා හොන්ති.

19. තත්ථ රූපාදිවසෙන ඡබ්බිධාහොති ආරම්මණං.

20. උපනිස්සයොපන තිවිධොහොති, ආරම්මණූපනිස්සයො, අනන්තරූප නිස්සයො, පකතූපනිස්සයො චෙති

21. තත්ථ ආරම්මණමෙව ගරුකතං ආරම්මණූපනිස්සයො.

22. අනන්තර නිරුද්ධා චිත්ත චෙතසිකා ධම්මා අනන්තරූපනිස්සයො.

23. රාගාදයො පන ධම්මා සද්ධාදයොච සුඛං දුක්ඛං පුග්ගලො භොජනං, උතු, සෙනාසනංච යථාරහං අජ්ඣත්තංච බහිද්ධාච කුසලාදිධම්මානං කම්මං විපාකානංතිච බහුධා හොති පකතූපනිස්සයො.

24. අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි, අවිගත, වසෙනෙති යථාරහං නවධා නාමරූපානි නාමරූපානං පච්චයා භවන්ති.

25. තත්ථ ගරුකතමාරම්මණං ආරම්මණාධිපති වසෙන නාමානං, සහජාතාධිපති චතුබ්බිධොපි සහජාත වසෙන සහජාතානං නාමරූපානංතිච දුවිධො හොති අධිපති පච්චයො.

26. චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සහජාත රූපානංච මහාභූතා අඤ්ඤමඤ්ඤං උපාදාරූපානංච පටිසන්ධික්ඛණෙ වත්ථු විපාකා අඤ්ඤමඤ්ඤංතිච තිවිධො හොති සහජාත පච්චයො.

27. චිත්ත චෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං, මහාභූතා අඤ්ඤමඤ්ඤං, පටිසන්ධික්ඛණෙ වත්ථු විපාකා අඤ්ඤමඤ්ඤං තිච තිවිධොහොති අඤ්ඤමඤ්ඤ පච්චයො.

28. චිත්තචෙතසිකා ධම්මා අඤ්ඤමඤ්ඤං සහජාත රූපානංච, මහාභූතා අඤ්ඤමඤ්ඤං උපාදාරූපානංච, ඡවත්ථූනි සත්තන්නං විඤ්ඤාණධාතූනංතිච තිවිධො හොති නිස්සය පච්චයො.

29. කබලීකාරො ආහාරො ඉමස්ස කායස්ස අරූපිනො ආහාරා සහජාතානං නාමරූපානංතිච දුවිධො හොති ආහාර පච්චයො.

30 පඤ්චපපසාදා පඤ්චන්නං විඤ්ඤාණං, රූපජීවිතින්ද්‍රියං උපාදින්න රූපානං, අරූපිනො ඉන්ද්‍රියා සහජාතානං නාමරූපානංතිච තිවිධො හොති ඉන්ද්‍රිය පච්චයො.

31. ඔක්කන්තික්ඛණෙ වත්ථු විපාකානං, චිත්තචෙතසිකා ධම්මා සහජාතරූපානං සහජාත වසෙන, පච්ඡාජාතා චිත්තචෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත වසෙන, ඡවත්ථූනි පවත්තියං සත්තන්නං විඤ්ඤාණ ධාතූනං පුරෙජාතවසෙනෙතිච තිවිධොහොති විප්පයුත්ත පච්චයො.

32. සහජාතං පුරෙජාතං - පච්ඡාජාතංච සබ්බථා.
කබලීකාරො ආහාරො - රූපජීවිත මිච්චයං.

පඤ්චවිධොහොති අත්ථි පච්චයො අවිගත පච්චයොච.

33. ආරම්මණූපනිස්සය කම්මත්ථි පච්චයෙසුච සබ්බෙපි පච්චයා සමොධානං ගච්ඡන්ති.

34. සහජාත රූපංති පනෙත්ථ සබ්බත්ථාපි පවත්තෙ චිත්ත සමුට්ඨානානං, පටිසන්ධියං කටත්තාරූපානංච වසෙන දුවිධං හොතීති වෙදිතබ්බං.

35. ඉතිතෙකාලිකා ධම්මා - කාලමුත්තාච සම්භවා
අජ්ඣත්තංච බහිද්ධාච - සඞ්ඛතා සඞ්ඛතා තථා.
පඤ්ඤත්තිනාමරූපානං - වසෙන තිවිධා ඨිතා
පච්චයානාම පට්ඨානෙ - චතුවීසති සබ්බථා

36. තත්ථ රූප ධම්මා රූපක්ඛන්ධොච චිත්තචෙතසික සඞ්ඛාතා චත්තාරො අරූපිනො ඛන්ධා නිබ්බානං චෙති පඤ්චවිධංපි අරූපංතිච නාමන්තිච පවුච්චති.

37. තතො අවසෙසා පඤ්ඤත්ති පන පඤ්ඤාපියත්තා පඤ්ඤත්ති පඤ්ඤාපනතො පඤ්ඤත්ති තිච දුවිධා හොති

38. කථං තන්තම්භූත විපරිණාමාකාරමුපාදාය තථා තථා පඤ්ඤත්තා භූමිපබ්බතාදිකා, සම්භාර සන්නිවෙසා-කාරමුපාදාය ගෙහ රථ සකටාදිකා, ඛන්ධපඤ්චකමුපාදාය පුරිසපුග්ගලාදිකා, චන්දාවත්තනාදිකමුපාදාය දිසාකාලාදිකා, අසම්ඵුට්ඨාකාරමුපාදාය කූප ගුහාදිකා, තං තං භූත නිමිත්තං භාවනා විසෙසංච උපාදාය කසිණ නිමිත්තාදිකා චෙති එවමාදිප්පභෙදා පන පරමත්ථතො අවිජ්ජමානාපි අත්ථච්ඡායා කාරෙන චිත්තුප්පාදාන මාරම්මණා භූතා තං තං උපාදාය උප නිධාය කාරණං කත්වා තථා තථා පරිකප්පියමානා සඞ්ඛායන්ති සමඤ්ඤායන්ති වොහරීයන්ති පඤ්ඤාපීයන්තීති පඤ්ඤත්තීති පවුච්චති.

**අයං පඤ්ඤත්ති පඤ්ඤාපියත්තා පඤ්ඤත්ති නාම.**

39. පඤ්ඤාපනතො පඤ්ඤත්ති පන නාම් නාම කම්මාදිනාමෙන පරිදීපිතා, සා විජ්ජමාන පඤ්ඤත්ති, අවිජ්ජමාන පඤ්ඤත්ති, විජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති, අවිජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති විජ්ජ-මානෙනවිජ්ජමාන පඤ්ඤත්ති, අවිජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති චෙති ඡබ්බිධා හොති.

40. තත්ථ යදා පන පරමත්ථතො විජ්ජමානං රූප වෙදනාදිං එතාය පඤ්ඤාපෙන්ති තදායං විජ්ජමාන පඤ්ඤත්ති. යදා පන පරමත්ථතො අවිජ්ජමානං භූමි පබ්බතාදිං එතාය පඤ්ඤාපෙන්ති තදායං අවිජ්ජමාන පඤ්ඤත්තීති පවුච්චති උභින්නං පන වොමිස්සකවසෙන සෙසා යථාක්කමං ඡළභිඤ්ඤා ඉත්ථිසද්දො, චක්ඛුවිඤ්ඤාණං රාජපුත්තොව වෙදිතබ්බා.

41. වචීඝොසානුසාරෙන - සොතවිඤ්ඤාණ වීථියා
පවත්තානන්තරුප්පන්න - මනොද්වාරස්ස ගොචරා

අත්ථා යස්සානුසාරෙන - විඤ්ඤායන්ති තතොපරං
සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා ලොකසඞ්කෙත නිම්මිතාති.

**ඉති අභිධම්මත්ථසඞ්ගහෙ පච්චය සඞ්ගහ විභාගො නාම අට්ඨමො පරිච්ඡෙදො.**

---

Free Distribution www.aathaapi.org

# අභිධර්මාර්ථ සංග්‍රහය

## අෂ්ටම පරිච්ඡේදය

## ප්‍රත්‍යය සඞ්ග්‍රහ විභාගය

### (භාවය)

1. යම් සඞ්ඛත ධර්මකෙනෙකුන්ට යම් ධර්මකෙනෙක් යම් ආකාරයකින් ප්‍රත්‍යයවෙත් ද එහි විභාගය දැන් සුදුසු පරිද්දෙන් කියන්නෙමි.

2. පටිච්චසමුප්පාද නය **පට්ඨාන නය** යයි දෙවැදෑරුම්වූ ප්‍රත්‍යය සංග්‍රහය දතයුතු. ඒ ප්‍රත්‍යය ධර්මයන්ගේ වීමෙන් වන සුළුවූ, වීම් ආකාර මාත්‍රයෙන් උපලක්ෂිතවූයේ පටිච්ච සමුප්පාද නය නම් වේ. පට්ඨාන නය වනාහි වෙසෙසා පැවති ප්‍රත්‍යය අරභයා කියනු ලැබේ. ආචාර්යවරයෝ ඒ නය දෙක මිශ්‍ර කොට විස්තර කෙරෙත්.

3. එහි අවිද්‍යා ප්‍රත්‍යයයෙන් සංස්කාරයෝ ද සංසකාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණයද, විඤ්ඤාණප්‍රත්‍යයයෙන් නාම රූපයද, නාමරූප ප්‍රත්‍යයයෙන් සළායතනයද, සළායතන ප්‍රත්‍යයයෙන් ඵස්සයද, ඵස්ස ප්‍රත්‍යයයෙන් වේදනාවද, වේදනා ප්‍රත්‍යයයෙන් තණ්හාවද තණ්හාප්‍රත්‍යයයෙන්

උපාදානයද, උපාදාන ප්‍රත්‍යයෙන් භවයද භවප්‍රත්‍යය-යෙන් ජාතියද, ජාතිප්‍රත්‍යයෙන් ජරා-මරණයද ශෝක පරිදේව දුක්ඛ දෞර්මනස්ස උපායාසයෝද හටගනිත්. මෙසේ මේ සියළු දුක්ඛ රාශියගේ පහළවීම වෙයි.

**මෙය ප්‍රත්‍යය සංග්‍රහයෙහි පටිච්ච සමුප්පාද නය වෙයි.**

4. එහි අද්ධ තුනක් ද, අඞ්ග දොළොසක් ද, ආකාර විස්සක්ද, සන්ධි තුනක්ද, සඞ්ඛේප සතරක් ද, වට්ට තුනක්ද, මූල් දෙකක් ද දතයුත්තාහ.

5. කෙසේද? අවිජ්ජා සඞ්ඛාර දෙක අතීත අද්ධ නම්. ජාති ජරා මරණ අනාගත අද්ධ නම් මධ්‍යයෙහිවූ අඞ්ග අට ප්‍රත්‍යුත්පන්න අද්ධ නම්. මෙසේ අද්ධ තුනෙක් වෙති.

6. අවිජ්ජා, සඞ්ඛාර, විඤ්ඤාණ නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරාමරණයයි අඞ්ග දොළොසෙක් වෙති. මෙහි ශෝකාදි වචන ජාතියගේ ද අප්‍රධාන ඵලය දක්වීමය.

7. අවිජ්ජා සඞ්ඛාරයන් ගැනීමෙන් තණ්හා, උපාදාන, කර්මභවයෝ ද ගන්නා ලද්දාහු වෙත්. එසේම තණ්හා උපාදාන භවයන් ගැනීමෙන් අවිජ්ජා සඞ්ඛාරද, - ජාති ජරා මරණයන් ගැනීමෙන් විඤ්ඤාණාදි ඵල පඤ්චකයද ගන්නා ලද්දේ වෙයි.

8. අතීත භවයෙහි හේතු පඤ්චකයක් ද, මේ ප්‍රත්‍යුත්පන්න භවයෙහි ඵල පඤ්චකයක්ද, මේ ප්‍රත්‍යුත්පන්න භවයෙහි හේතු පඤ්චකයක් ද, අනාගතයෙහි ඵල පඤ්චකයෙක් දැයි මෙසේ ආකාර විස්සෙක් ද සන්ධි තුනෙක් ද සඞ්ඛේප සතරෙක්ද වේ.

9. අවිජ්ජා, තණ්හා, උපාදානයෝ ක්ලේශවට්ට නම්. කර්මභව සඞ්ඛ්‍යාත වූ භව ඒකදේශය හා සඞ්ඛාරයෝ ද කම්මවට්ට නම්. උප්පත්ති භව සඞ්ඛ්‍යාතවූ භව ඒකදේශය හා සෙසු විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා,

ජාති, ජරා, මරණයෝද විපාකවට්ට නම්. මෙසේ වට්ට තුනෙක් වෙති.

10. අවිජ්ජා, තණ්හා වශයෙන් මූල් දෙකක්ද දත යුතුය.

11. ඒ මූලයන් නිරුද්ධ කිරීමෙන්ම වට්ටය නිරුද්ධ වෙයි. ජරා මරණ මූර්ඡායෙන් නිතර පෙළෙන සත්ත්ව සන්තානයෙහි ආශ්‍රව ධර්මයන් උපදනා බැවින් අවිද්‍යාවද පවතී මෙසේ කියනලද නයින් අතර නොසිඳී පවත්නා මුල් කොනක් නැති ත්‍රෛභූමික වෘත්තය මහා මුනීන්ද්‍රයන් වහන්සේ විසින් පටිච්ච සමුප්පාද යයි පනවා වදාළ සේක.

12. හෙතුප්‍රත්‍යය, ආරම්මණ ප්‍රත්‍යය, අධිපති ප්‍රත්‍යය, අනන්තර ප්‍රත්‍යය, සමනන්තර ප්‍රත්‍යය, සහජාත ප්‍රත්‍යය, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය, නිස්සය ප්‍රත්‍යය, උපනිස්සය ප්‍රත්‍යය, පුරෙජාත ප්‍රත්‍යය, පච්ඡාජාත ප්‍රත්‍යය, ආසේවන ප්‍රත්‍යය, කර්ම ප්‍රත්‍යය, විපාක ප්‍රත්‍යය, ආහාර ප්‍රත්‍යය, ඉන්ද්‍රිය ප්‍රත්‍යය, ධ්‍යාන ප්‍රත්‍යය, මාර්ග ප්‍රත්‍යය, සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය, විප්‍රයුක්ත ප්‍රත්‍යය, අත්ථි ප්‍රත්‍යය, නත්ථි ප්‍රත්‍යය, විගතප්‍රත්‍යය, අවිගත ප්‍රත්‍යයයි යන මෙය පට්ඨාන නය වෙයි.

13. නාමය නාමයට ෂට් ප්‍රකාරයකින්ද, නාමය නාමරූපයන්ට පඤ්චප්‍රකාරයකින්ද, නැවත රූපයට එක් ප්‍රකාරයකින්ද, රූපය නාමයට එක් ප්‍රකාරයකින්ද, ප්‍රඥප්ති නාම රූපයෝ නාමයට ද්විප්‍රකාරයකින්ද නාම රූපද්වය නාම රූප ද්වයට නව ප්‍රකාරයකින්ද, උපකාර වෙයි මෙසේ ප්‍රත්‍යයයෝ ෂට්ප්‍රකාර වෙත්. කෙසේද?

14. අනතුරුව නිරුද්ධවූ චිත්ත චෛතසික ධර්මයෝ ප්‍රත්‍යුත්පන්න චිත්ත චෛතසික ධර්මයන්ට අනන්තර, සමනන්තර, නත්ථි, විගත වශයෙන්ද, පූර්වයෙහි උපන් ජවනයෝ පසුව උපදනා ජවනයන්ට ආසේවන වශයෙන්ද සහජාතවූ චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට සම්ප්‍ර-යුක්ත වශයෙන් දැයි නාමය නාමයට ෂට් ආකාරයකින් ප්‍රත්‍යය වෙයි.

15. හෙතු ධ්‍යානාඞ්ග මාර්ගාඞ්ගයෝ සහජාතවූ නාම රූපයන්ට හෙතු ආදි වශයෙන්ද සහජාත චෙතනාව සහජාත නාමරූපයන්ටත් නානාක්‍ෂණික චෙතනාව කර්මයෙන් හටගත්තා නාමරූපයන්ටත් කර්ම වශයෙන්ද, විපාක නාමස්කන්ධයෝ ඔවුනොවුන්ටත් සහජාත රූපයන්-ටත් විපාකවශයෙන්ද උපකාර වෙත්. මෙසේ නාමය නාමරූපයන්ට පඤ්චප්‍රකාරයකින් උපකාර වෙයි.

16 පසුව උපදනා චිත්තචෛතසික ධර්මයෝ පූර්වයෙහි උපදනා මේ කයට පච්ඡාජාත වශයෙන් උපකාර වෙත්. මෙසේ නාමය එක් ප්‍රකාරයකින් රූපයට උපකාර වෙයි.

17. ෂට් වස්තූහු ප්‍රවෘත්ති කාලයෙහි සප්තවිඤ්ඤාණ ධාතූන්ටත් පඤ්චාරම්මණයෝ පඤ්චවිඤ්ඤාණ වීථියටත් පුරේජාත වශයෙන් උපකාර වෙත් මෙසේ රූපය නාමයට එක් ප්‍රකාරයකින් උපකාරවෙයි.

18. ආරම්මණ වශයෙන්ද උපනිස්සය වශයෙන්දැයි දෙයාකාරයෙන් ප්‍රඥප්ති නාම රූපයෝ නාමයටම ප්‍රත්‍යය වෙත්.

19. එහි ආරම්මණ ප්‍රත්‍යය රූපාදි වශයෙන් ෂඩ්විධ වෙයි.

20. උපනිශ්‍රය ප්‍රත්‍යය වනාහි ආරම්මණූපනිස්සය අනන්තරූපනිස්සය පකතූපනිස්සය යයි ත්‍රිවිධ වෙයි.

21. ඔවුන් අතුරෙන් ගරුකොට සලකන ලද අරමුණම ආරම්මණූපනිස්සය නම් වේ.

22. අනතුරුව නිරුද්ධවූ චිත්ත චෛතසික ධර්මයෝ අනන්තරූපනිස්සය නම් වේ.

23 රාගාදී අකුසල ධර්මද, ශ්‍රද්ධාදී කුශල ධර්මද, සුඛයද, දුක්ඛයද, පුද්ගලයාද, භොජනයද, ඍතුවද, සෙනසුනද, සුදුසු පරිද්දෙන් අධ්‍යාත්ම සන්තානයෙහිත්, බාහිර සන්තානයෙහිත් කුසලාදි ධර්මයන්ටද, කර්මය, විපාකයන්ටද

උපකාරවෙයි. මෙසේ පකතූපනිස්සය ප්‍රත්‍යය බොහෝ ප්‍රභෙද ඇත්තේ වෙයි.

24. අධිපති, සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය, ආහාර ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි, අවිගත වශයෙන් සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යය ශක්ති නවයෙකින් නාමරූපයෝ නාමරූපයන්ට ප්‍රත්‍යය වෙත්.

25. එහි ගරුකොට සලකනලද අරමුණු ආරම්මණාධිපති වශයෙන් නාමයන්ටද, චතුර්විධවූද සහජාතාධිපති තෙම සහජාත වශයෙන් සහජාත නාමරූපයන්ට දැයි මෙසේ අධිපතිප්‍රත්‍යය විධ වෙයි.

26. චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ටද, සහජාත රූපයන්ටද, මහා භූතයෝ ඔවුනොවුන්ටද, උපාදාරූපයන්ටද, ප්‍රතිසන්ධික්ෂණයෙහි හදයවස්තුවත් විපාක නාමස්කන්ධයෝත් ඔවුනොවුන්ටද උපකාර වෙත්. මෙසේ සහජාත ප්‍රත්‍යය ත්‍රිවිධ වෙයි.

27. චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ටද, මහා භූතයෝ ඔවුනොවුන්ටද, ප්‍රතිසන්ධික්ෂණයෙහි හෘදයවස්තු විපාකයෝ ඔවුනොවුන්ටද උපකාර වෙත්. මෙසේ අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ත්‍රිවිධ වෙයි.

28. චිත්ත චෛතසික ධර්මයන් ඔවුනොවුන්ටද, සහජාතරූපයන්ටද, මහාභූතයෝ ඔවුනොවුන්ටද, උපාදාරූපයන්ටද, ෂට්වස්තුහු ෂට්විඤ්ඤාණධාතුන්ටද උපකාර වෙත්. මෙසේ නිස්සය ප්‍රත්‍යය ත්‍රිවිධවෙයි.

29. කබලීකාරාහාරය මේ කයටද අරූපී ආහාරයෝ සහජාත නාමරූපයන්ටදැයි මෙසේ ආහාර ප්‍රත්‍යය දෙයාකාරයෙන් උපකාර වෙයි.

30. පඤ්චප්‍රසාද රූපයෝ පඤ්චවිඤ්ඤාණ ධාතුන්ටද රූපජීවිතින්ද්‍රියය උපාදින්න රූපයන්ටද අරූපී ඉන්ද්‍රියයෝ සහජාත නාමරූපයන්ටද උපකාර වෙත්. මෙසේ ඉන්ද්‍රිය ප්‍රත්‍යය ත්‍රිවිධ වෙත්.

Free Distribution www.aathaapi.org

31. ප්‍රතිසන්ධික්ෂණයෙහි හදය වස්තුව විපාක ස්කන්ධයන්ටද, චිත්තචෛතසික ධර්මයෝ සහජාත රූපයන්ට සහජාත වශයෙන්ද, පසුව උපදනා චිත්තචෛතසික ධර්මයෝ පූර්වයෙහි හටගත් මෙ රූපකයට පච්ඡාජාත විප්‍රයුක්ත වශයෙන්ද, ෂට්වස්තුහු ප්‍රවෘත්තිකාලයෙහි සප්ත විඥානධාතුන්ට පුරෙජාත විප්‍රයුක්ත වශයෙන් ද උපකාර වෙත්. මෙසේ විප්‍රයුක්ත ප්‍රත්‍යය ත්‍රිවිධ වෙයි.

32. සියලු ආකාරයෙන් සහජාතයද, පුරෙජාතයද, පච්ඡාජාතයද, කබලීකාරාහාරයද, රූපජීවිතින්ද්‍රියය ද යන මෙ පඤ්චවිධවූ ප්‍රත්‍යය ජාතය අත්ථිප්‍රත්‍යයද වෙයි අවිගත ප්‍රත්‍යයද වෙයි.

33. ආරම්මණ, උපනිශ්‍රය කර්ම අත්ථි ප්‍රත්‍යයන්හි සියලු ප්‍රත්‍යයයෝ සමොධානයට හෙවත් සංග්‍රහයට යෙත්.

34. එහි සියලු තන්හි සහජාත රූපයන් ප්‍රවෘත්ති කාලයෙහි චිත්තජරූපයන්ගේ වශයෙන්ද, ප්‍රතිසන්ධි කාලයෙහි කර්මජ රූපයන්ගේ වශයෙන්ද දෙවැදෑරුම් වේයයි දතයුතු.

35. මෙසේ ලැබෙන පරිද්දෙන් ත්‍රෛකාලිකවූ ද, අධ්‍යාත්මවූ ද, බාහිරවූ ද, එසේම සඞ්ඛතවූ ද අසඞ්ඛතවූ ද, ප්‍රඥප්ති නාම රූපයන්ගේ වශයෙන් තුන් ප්‍රකාරයකින් සිටියාවූ ධර්මයෝ පට්ඨානයෙහි සර්වප්‍රකාරයෙන් සුවිසි ප්‍රත්‍යයෝ නාම වෙත්.

36 එහි රූපධර්මයෝ රූපස්කන්ධ නම් වේ චිත්ත චෛතසික සඞ්ඛ්‍යාත සතර නාමස්කන්ධ හා නිර්වාණයද යන පඤ්චවිධ ධර්මයෝ අරූප යයිද නාමයයිද කියනු ලැබේ.

37. එයින් අවශෙෂවූ ප්‍රඥප්තිය වනාහි පණවනු ලබන ප්‍රඥප්තියය පණවන ප්‍රඥප්තියයි ද විධ වේ.

38 කෙසේ ද? ඒ ඒ මහාභූතයන්ගේ විපරිණාමාකාරය නිසා ඒ ඒ ආකාරයෙන් සම්මත කරණ ලද්දාවූ භූමි පර්වතාදි ප්‍රඥප්තියද, දැව ආදි සම්භාරයන්ගේ එක්රැස් පැවතීම් ආකාරය නිසා ඒ ඒ ආකාරයෙන් සම්මත කරණ ලද ගෘහ රථ සකටාදි ප්‍රඥප්තියද, ස්කන්ධපඤ්චකය නිසා සම්මත කරනලද පුරුෂ පුද්ගලාදි ප්‍රඥප්තියද සඳ හිරු නක්ෂත්‍රාදින්ගේ පැවැත්ම කරණකොට ගෙන සම්මත කරන ලද දිසා කාල ප්‍රඥප්තියද, අසම්ඵුට්ඨාකාරය නිසා සම්මත කරන ලද කූප ගුහාදී ප්‍රඥප්තියද, ඒ ඒ භූතාදීවූ නිමිත්ද, භාවනා විශෙෂ නිසා සම්මත කරණ ලද කසිණ නිමිති ආදි ප්‍රඥප්තියද මෙසේ මේ ආදි පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වූද එහි ඡායාකාරයෙන් චිත්ත-චෛතසිකයන්ට අරමුණු වූවාහු, ඒ ඒ වස්තුව නිසා ඒ ඒ ආකාරයෙන් කල්පනා කරණ ලදුව කියනු ලැබේ. ප්‍රකාරයෙන් දන්නා ලැබේ. ව්‍යවහාර කරනු ලැබේ. ප්‍රඥප්ති යයිද කියනු ලැබේ. මේ ප්‍රඥප්තිය පණවනු ලබන අර්ථ ප්‍රඥප්ති නම්.

39. පණවන ලද හෙයින් ප්‍රඥප්තිය වනාහි නාමනාම කම්මාදි නාමයෙන් දක්වන ලදී. එය විද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යමාන ප්‍රඥප්තිය, විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තිය, විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්තිය, අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්තිය යයි ෂඩ්විධ වේ.

40. එයින් යම් කලෙක පරමාර්ථ වශයෙන් විද්‍යමානවූ රූපවේදනාදිය මෙය කරණ කොට ගෙන පණවත්ද එකල්හි එය විද්‍යමාන ප්‍රඥප්තියයිද, යම් කලෙක පරමාර්ථ වශයෙන් අවිද්‍යමානවූ භූමිපර්වතාදිය මෙය කරණ කොට ගෙන පණවත් ද එකල්හි අවිද්‍යමාන ප්‍රඥප්තියයි කියනු ලැබේ. ඒ දෙක මිශ්‍ර කිරීම් වශයෙන් සෙසු ප්‍රඥප්තීහු පිළිවෙළින් ඡළභිඥ, ස්ත්‍රී ශබ්දය, චක්ඛුවිඤ්ඤාණය, රාජ පුත්‍රයයිද දතයුත්තාහ.

41, වාග් ශබ්දයාගේ අනුසාරයෙන් සොතවිඤ්ඤාණ-වීථි ආදීන්ගේ පැවැත්මට අනතුරුව උපදනා මනොද්වාර වීථියට අරමුණුවූ යම් නාම ප්‍රඥප්තියක් අනුගමනය කිරීමෙන් එයට පසුව දතගනු ලැබෙත් ද, ඒ නාම ප්‍රඥප්ති ලොක සංකෙතයෙන් නිර්මිතවී යයි දත යුත්තීය.

**මෙසේ අභිධර්මාර්ථ සංග්‍රහයෙහි ප්‍රත්‍යය සංග්‍රහ විභාග නම් වූ අෂ්ටම පරිච්ඡෙදය යි**

---

# අභිධර්මාර්ථ ප්‍රදීපිකා

## අෂ්ටම පරිච්ඡේදය

## ප්‍රත්‍යය සඞ්ග්‍රහ විභාගය

### පටිච්චසමුප්පාදය

ප්‍රත්‍යය ධර්ම ඇති කල්හි ප්‍රත්‍යයොත්පන්න ධර්ම ඇති වන්නාවූ ආකාර මාත්‍රය දක්වීම සඳහා මේ පටිච්චසමුප්පාද ධර්මය දෙශනා කරන ලදී. ඒ ඒ ධර්ම හටගැනීමට, පැවැත්මට උපකාරවන ධර්මයන්ට **ප්‍රත්‍ය ධර්මයෝ** යයි ද, ඒ ප්‍රත්‍යය ධර්මයෙන් හටගත් ධර්මයන්ට **ප්‍රත්‍යයොත්පන්නධර්මයෝ** යයි ද කියනු ලැබේ. **සංඛත ධර්ම, සංඛාර ධර්ම** යන නම් වලින් හැඳින්වෙන්නේත් මේ ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝ මැයි. මේ පටිච්චසමුප්පාද දෙශනාවෙන් ඵලය උපදවන හේතුව සඞ්ඛ්‍යාත පටිච්චසමුප්පාදය ද, ඵලය සඞ්ඛ්‍යාත පටිච්ච සමුප්පන්නයද යන හේතු ඵල ධර්මයන් දක්වන ලද බව දතයුතු. සියළුම සඞ්ඛත ධර්මයෝ ප්‍රත්‍යයන්ගෙන් හටගත් ධර්මයෝ යි. එනම්: චිත්ත චෛතසික රූප ධර්මයෝයි. ප්‍රත්‍යයෙන් හට නොගත් නිර්වාණ ධර්මයට **අසඞ්ඛත ධර්ම** යයි කියති. තවද එක් ධර්මයක් අන්‍ය ධර්මයකට ප්‍රත්‍යවීම නොයෙක් ආකාරයෙන් සිදු වන්නේය. එසේ ප්‍රත්‍යවන ආකාර සූවිස්සකි. ඒ සූවිසි ප්‍රත්‍යයන් පිළිබඳ විභාගය පට්ඨාන දෙශනා නමින් හඳුන්වනු ලැබේ.

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරා**
**සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං**
**විඤ්ඤාණ පච්චයා නාම රූපං**
**නාමරූප පච්චයා සළායතනං**
**සළායතන පච්චයා ඵස්සො**
**ඵස්ස පච්චයා වෙදනා**
**වෙදනා පච්චයා තණ්හා**
**තණ්හා පච්චයා උපාදානං**
**උපාදාන පච්චයා භවො**
**භව පච්චයා ජාති**
**ජාති පච්චයා ජරා මරණං සොකපරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති.**
**එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.**

මෙය පටිච්ච සමුප්පාද දෙශනා පාඨය යි.

ඉතා ගම්භීරවූ මේ පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳ අවබොධයක් ඇතිකරගනු කැමැත්තන් විසින් එය—

1. **දෙශනා භෙදයෙන් ද,**
2. **අර්ථ වශයෙන් ද,**
3. **ලක්ෂණාදි වශයෙන් ද,**
4. **එකවිධාදි වශයෙන් ද,**
5. **අඞ්ග පිරිසිඳීම් වශයෙන් ද,** විනිශ්චය දතයුතු යි.

1. **දෙශනා භෙදයෙන්** විනිශ්චය මෙසේ යි.

පටිච්ච සමුප්පාද දෙශනා තොමෝ චතුර්විධ වේ. වැල් අදනා පුරුෂයන් සතර දෙනෙකුන්ගේ වැල් ඇදීම මෙන් භාග්‍යවතුන් වහන්සේ ද මේ පටිච්චසමුප්පාද දෙශනාව සතර ආකාරයකින් දෙශනා කළ සේක. එනම්:-

1. **මුල පටන් අග දක්වා ද,**
2. **මැද පටන් අග දක්වා ද,**
3. **අග පටන් මුල දක්වා ද,**
4. **මැද පටන් මුල දක්වා ද** කියා යි

1. වැල් හරණාවූ පුද්ගලයන් සතරදෙනෙකු අතුරෙන් එක් පුරුෂයෙක් වැලෙහි මූලම පළමුකොට දැක ඒ වැල මුලින් සිඳ මුළු වැලම කඩාගෙන ගෙනස් අදහස් කළ කටයුත්තෙහි යම්සේ යොදවාද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** ආදී වශයෙන් මූල පටන් අග දක්වා ද පටිච්චසමුප්පාදය වදාරන සේක.

**කම්මවට්ට, විපාකවට්ට, කිලෙසවට්ට** යන්ගේ මූල කාරණය වන බැවින්ද, අවිද්‍යා තොමෝ ප්‍රතීත්‍ය සමුප්පා-දයාගේ මූල කාරණය යයි ගන්නාලදී. වැලේ මුල දුටු කල්හි එතැන් පටන් වැල කපා ගන්නාක් මෙන් පටිච්ච සමුප්පාදයාගේද මූල දුටු කල්හි එතැන් පටන් පටිච්ච සමුප්පාද දෙශනාව වේ යයි උපමා සංසන්දනය නොකළ යුතු. වෛනෙය ජනයන්ගේ අදහස් වශයෙන් හෝ අවබොධ කරවිය යුතු බැවින් වැලේ මුල, මැද, අග දැක්ම මෙන් පටිච්චසමුප්පාදයාගේ මූල මැද අග සාමාන්‍ය දර්‍ශනයෙකි. මෙය දෙශනා විලාසයකි.

2. වැල් හරණාවූ පුරුෂයන් අතුරෙන් එක් පුරුෂයෙක් වැලෙහි මැද පළමුකොට දක්නේද, හෙතෙම වැල මැදින් සිඳ මත්තෙහිවූ කොටසම හැරගෙන කැමැති කටයුත්තෙහි යම්සේ යොදවාද, එපරිද්දෙන්ම **වෙදනාව** අතිශයින් කැමැති වන්නාවූ "අහෝ සුඛං, අහෝ සුඛං" යනාදි වශයෙන් කීමට පැමිණියාවූ බලවත් තෘෂ්ණාවෙන් මමය මාගේ යයි කියන්නාවූ බලවත්වූ තෘෂ්ණාවෙහි පිහිටියාවූ ඒ පුද්ගලයාහට එයටත් වඩා බලවත් වූ උපාදාන නම් වූ තෘෂ්ණාව උපදී. වේදනාවන්හි යම් බලවත් තෘෂ්ණාවක් උපදීද, එය **උපාදාන** නම්. ඒ පුද්ගලයා හට උපාදාන ප්‍රත්‍යයෙන් **භවය** හටගනී. භව ප්‍රත්‍යයෙන් නාමරූප ධර්‍මයන්ගේ **ජාතිය** ද හටගනී. මෙසේ මැද පටන් අවසානය දක්වාත් මේ ධර්‍මය දෙශනා කරණ සේක.

3. වැල් හරණාවූ පුරුෂයන් අතුරෙන් එක් පුරුෂයෙක් වැලෙහි අග පළමුකොට දකීද, ඒ පුරුෂතෙම අග පටන් මූල

දක්වා මුළු වැල ගෙන යම්සේ කටයුත්තෙහි යොදවාද එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ ජාති ප්‍රත්‍යයෙන් ජරා, මරණය වෙයි, භව ප්‍රත්‍යයෙන් ජාතිය වෙයි, උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි යනාදී වශයෙන් අග සිට මුල දක්වාත් පටිච්ච සමුප්පාදය වදාරන සේක.

4. එක් පුරුෂයෙක් වැලෙහි මැදම පළමුකොට දක්නේද, හෙතෙම වැලෙහි මැද සිට මුල දක්වා කඩාගෙන යම් සේ කැමැති පරිද්දෙන් කටයුත්තෙහි යොදවාද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ මේ සතර ආහාරයෝ, එනම්: කබලිංකාරාහාරය, ඵස්සාහාරය, මනොසඤ්චෙතනාහාරය, විඤ්ඤාණාහාරය, තෘෂ්ණාව නිදානකොට ඇත්තාහ. තෘෂ්ණාව හේතුකොට ඇත්තාහ. තෘෂ්ණාව ජාතිකොට ඇත්තාහ, තෘෂ්ණාව ප්‍රභව කොට ඇත්තාහ, තෘෂ්ණාතොමෝ වේදනාව නිදානකොට ඇත්තීය යනාදී වශයෙන් මැද පටන් මුල දක්වා මේ ධර්මය වදාරන සේක.

තවද, මුල පටන් අග දක්වා වදාළ අනුලොම දෙශනාව සංස්කාර ධර්මයන්ගේ ප්‍රවෘත්තියට කාරණවූ අවිද්‍යාදී විශෙෂයෙන් අතිශයින් මූළාවූ විනෙය ජනයා නුවණැසින් බලා වදාරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ විසින් තම තමන්ගේ ඵලානුරූපවූ කරුණු වලින් වෘත්ත දුක්ඛයාගේ පැවැත්ම මතාකොට දැක්වීම පිණිසද වෘත්තදුක්ඛය උපදනා පිළිවෙල දැක්වීම පිණිසද පවත්වනලද යයි දතයුතු

අග පටන් මුල දක්වා වදාළ පටිලොම දෙශනාව, මේ සත්ත්ව ලොකය ඒකාන්තයෙන්ම දුක්ඛයට පැමිණියේව, පිළිසිඳ ගන්නා පිළිසිඳ ගනී හෙවත් උපදින්නා උපදී. දිරන්නා දිරයි, මිය යන්නා මැරෙයි මේ ආදී වශයෙන් දුකට පැමිණියාවූ සත්ත්ව ලොකයා මහා කුළුණු නුවණැසින් දක්නාවූ තථාගතයන් වහන්සේ පූර්වභාග ප්‍රතිවෙධානුසාරයෙන් ජරා මරණ මුල්කොට ඇති ඒ ඒ වෘත්ත දුක්ඛයාගේ තමා විසින් අවබොධ කළාවූ කරුණු මොනවට දැක්වීම පිණිස පවත්වන ලදී.

මැද පටන් මූල දක්වා දෙශනාව, විපාක වෘත්ත වශයෙන් සංක්ෂිප්තවූ අනාගතාහාරයෙන්ගේ තොහොත් කර්මවෘත්ත වශයෙන් සංක්ෂිප්තවූ ප්‍රත්‍යුත්පන්නාහාරයින්ගේ කරුණු පිරිසඳ දැනීම් අනුව යාමෙන් අතීත ධවය තාක් ගෙනහැර දක්වා නැවත අතීතාධවය පටන්ගෙන හේතු ඵල ධර්මයන්ගේ පිළිවෙල මොනවාට දැක්වීම පිණිස පවත්වන ලදී.

මැද පටන් අවසානය දක්වා දෙශනාව ප්‍රත්‍යුත්පන්නාවූ අධවයෙහි අනාගත භවයට හේතුවූ තණ්හා, උපාදාන, කර්ම භව, අවිද්‍යා, සංඛාර ධර්මයන්ගේ හටගැන්මෙහි පටන් ගෙන අනාගතාධවය මොනවට දැක්වීම පිණිස පවත්වන ලදී.

මේ පටිච්ච සමුප්පාද දෙශනායෙහි අවිද්‍යාව පළමුකොට දක්වන ලද්දේ, හේතුවෙන් තොරව වේයයි ලබ්ධි ඇත්තාවූ ප්‍රකෘති වාදීන්ගේ ප්‍රකෘතිය මෙන් කරුණක් නැතිව හේතු රහිතව සත්ත්ව ලොකයාගේ පටන්ගත් මූල හේතුව දැක්වීම සඳහා තොවන බව දතයුතුය. ආශ්‍රවයන්ගේ හට ගැනීම් හේතුවෙන් අවිද්‍යාවගේ හටගැනීම වේ යයි දක්වා තිබේ. මේ අවිද්‍යා තෘෂ්ණාදීන්ට පූර්ව කෙළවරක් නැත. සුගති දුගති අත් බැව් දෙකට පමුණුවන්නාවූ කුසලා කුසල කර්මයාගේ අවිද්‍යා තෘෂ්ණා සඞ්ඛ්‍යාතවූ මේ උභය ධර්මයන් විශෙෂ හේතුව වන බැවින් ඒ ධර්මයන් මුල්කොට වදාළ සේක. දුගතියට පමුණුවන්නාවූ අකුසල කර්මයාගේ විශෙෂ හේතුවක් හැටියට අවිද්‍යාව දතයුතු. යම් හෙයකින් අවිද්‍යාව විසින් මඩනා ලද පෘථග්ජන තෙම වග්ති සන්-තාපය, මුගුරු පහරය යනාදී හේතුවෙන් වූ විඩාවෙන් මැඩුනාවූ, වධයට පත් ගවදෙනක් ඒ ගින්නෙන් තැවීම්, මුගුරෙන් පැහැරීම් හේතුකොටගෙන වූ කායික දුක්ඛ වෙදනා සඞ්ඛ්‍යාත විඩාවෙන් මැඩුනු බැවින් ආස්වාදයක් නැති නමුදු, සැනසීමක් නැති නමුදු, තමහට අවැඩක් එළවන්නේ විනමුත් උණු දිය බීමට පටන්ගන්නාක් මෙන් කෙලශාග්නි සන්තාප හේතුවෙන් සැනසීමක් නැත්තේවී නමුත් දුගතියෙහි ලා හෙළන හෙයිනුදු තමහට අවැඩක්

එළවන්නේ වී නමුදු සත්ත්ව ඝාතනය මුල්කොට ඇත්තාවූ නොයෙක් ප්‍රභෙද ඇති දුගතියට පමුණුවන්නාවූ අකුසලකර්ම කරන්නට පටන්ගනී. එහෙයින් අවිද්‍යාව, දුගතියට පමුණුවන්නාවූ කර්මයාගේ විශෙෂ හේතුව වේ යයි දතයුතු.

සුගතියට පමුණුවන්නාවූ කුසල කර්මයට විශෙෂ හේතුව භව තෘෂ්ණාවයි. මේ භව තෘෂ්ණාව විසින් මඩනාලද්දාවූ පෘථග්ජන තෙම යථොක්ත ප්‍රකාරවූ, මරණයට ගෙණ යන ගවදෙනක්, ඇල්දිය ආශාවෙන් සැනසීම් ඇත්තාවූ, තමාගේ විඩා සන්සිඳුවන්නාවූද, ඇල්දිය පීමට පටන් ගන්නාක් මෙන්, කෙලශ සඞ්ඛ්‍යාත වහ්නි සන්තාපයෙන් තොරවන හෙයින් සැනසීම් ඇත්තාවූ, සුගතියට පැමිණ වීමෙන්, තමාගේ දුගතියෙහිවූ දුක්විඩා දුරලන්නාවූද, සත්ත්වඝාතනයෙන් වැළකීම් මුල්කොට ඇති නොයෙක් ප්‍රභෙද ඇත්තාවූ, සුගතියට පමුණුවන්නාවූ කුසලකර්ම කරන්නට පටන්ගනී. එහෙයින් භව තෘෂ්ණාව, සුගතියට පමුණුවන්නාවූ කුසල කර්මයට විශෙෂ හෙතුව වේ.

භාග්‍යවතුන් වහන්සේ මේ පටිච්ච සමුප්පාද දෙශනාව එක් ධර්මයක් මුල්කොටද දෙශනා කළසේක. එනම්: අවිද්‍යාවම කාරණකොට ඇත්තාවූ සංස්කාරයෝ හටගනිත්. සංස්කාරයන්ම කරුණුකොට ඇත්තාවූ විඥානය හටගනී යනාදි වශයෙනි. තවද අන්තැනෙක, උපාදානයන්ට අරමුණුවූ ත්‍රෛභූමික ධර්මයන්හි ආස්වාදය කිරීම් වශයෙන් සුඛ සොම්නස් නැවත නැවත විඳිනු කැමතිව වාසය කරන්නාවූ පුද්ගලයාහට තෘෂ්ණාව වැඩෙයි. තෘෂ්ණා හේතුවෙන් උපාදානය හටගනී යනාදී වශයෙන්ද දෙශනා කරණ ලදී. එපරිද්දෙන්ම ඇතැම් තැනෙක, අවිද්‍යා තෘෂ්ණා දෙකම මුල්කොට ඇත්තාවූ පටිච්චසමුප්පාද දෙශනාව වදාරණ ලදී. එනම්, අවිද්‍යා නීවරණය ඇත්තාවූ නොහොත් අවිද්‍යාව විසින් මුවාකරන ලද්දාවූ තෘෂ්ණාව හා සමන්විතවූ බාල පෘථග්ජනයා හට, මේ ස්කන්ධපඤ්චකය, ආයතන ෂට්කය මෙසේ උපන. පරසන්තානයෙහි නාමරූපයෝද මෙසේ උපන, අධ්‍යාත්ම බාහිර ආයතන

Free Distribution www.aathaapi.org

මෙසේ උපන, මෙසේ වාරාලම්බන වශයෙන් උපන් අධ්‍යාත්ම බාහිර ආයතනයන් නිසා ස්පර්ශය උපන, ස්පර්ශයෙන් අරමුණ පහස්නාලද්දාවූ බාලයා සුඛ දුක්ඛ වේදනාව නැවත නැවත විඳී. දුක්ඛයෙහි තෘෂ්ණාව මැඩගෙන පවත්නා අවිද්‍යාවගේ බලවත් භාවය නිසා ඒකාන්ත යෙන් අනර්ථදායකවූ අත්තකිලමථානු යෝගයට අනුව යෙදෙති. සුඛයෙහි අවිද්‍යාව මැඩගෙන පවත්නා තෘෂ්ණාව නිසා අනර්ථදායක අනායර්‍ය සුඛයෙහි යොදවත්.

මෙසේ නොයෙක් ප්‍රකාර පටිච්චසමුප්පාද දෙශනාව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන බව දතයුතු.

2. **අර්ථ වශයෙන්** විනිශ්චය මෙසේ දතයුතු.

1. **අවිද්‍යාව.** පූරන්නට හෝ සම්පූර්ණ කරන්නට නොහොත් රැස්කරන්නට නුසුදුසු වන අර්ථයෙන්, කාය දුශ්චරිතාදීහු විඳීමට හෙවත් ලැබීමට නුසුදුසු ධර්මයෝයි එසේ අවින්දිය හෙවත් විඳීමට හෝ ලැබීමට නොසැ-හෙන්නාවූ ඒ කාය දුශ්චරිතාදීහු විඳීද, ලබාද, එහෙයින් ඒ ධර්ම ජාතියට **අවිද්‍යා** යයි කියනු ලැබේ. තවද විඳීමට හෝ ලැබීමට සුදුසුවූ කාය සුචරිතාදිය නොවිඳීද, නො-ලබාද, එහෙයින් **අවිද්‍යා** යයි ද වේ.

ස්කන්ධයන්ගේ රාශ්‍යාර්ථයද, ආයතනයන්ගේ ආයත-නාර්ථයද, ධාතූන්ගේ ආත්ම ජීවයන් කෙරෙන් ශූන්‍ය භාවයද, සත්‍යයන්ගේ අවිපරීත හෙවත් නොවෙනස්වන සැබෑ බවද, ඉන්ද්‍රියයන්ගේ අධිපති භාවයද නොදන්නා ලද්දක්හු කරන බැවින්ද **අවිද්‍යා** නම් වේ.

එසේම දුක්ඛාදීන්ගේ පීඩනාර්ථාදී වශයෙන් වදාළාවූ චතුර්විධ චතුර්විධවූ අර්ථය හෙවත් ස්වභාවය නොදන්නා ලද්දක්හු කරන බැවින්ද **අවිද්‍යා** නම්.

කෙළවර නැත්තාවූ සසරෙහි සියලු අණ්ඩජාදීහු චතුර්විධ යෝනිය, දෙවගති ආදීවූ ගතිය, කාම රූප,

අරූපාදිවූ භවය, නානාත්තකාය නානත්ත සඤ්ඤාදිවූ සප්ත විඤ්ඤාණස්ථිතිය, නවවිධ සත්තාවාසය යන තන්හි සත්ත්වයන් පවත්වන හෙයින්ද අවිද්‍යා නම්.

පරමාර්ථ වශයෙන් වනාහි, අවිද්‍යමානවූ හෙවත් නැත්තාවූ ස්ත්‍රීපුරුෂාදිවූ ප්‍රඥප්ති ධර්මයන්හි නොපැකිළ පවත්නා හෙයින්ද, පරමාර්ථවශයෙන් විද්‍යාමානවූද ස්කන්ධාදීන්හි නොපවත්නා හෙයින්ද **අවිද්‍යා** නම්.

චක්ඛු විඤ්ඤාණාදීන්ගේ වස්තු ආලම්බනවූ ධර්මයන්ද, අවිද්‍යාදි පටිච්ච සමුප්පාද ධර්මයන්ද, ජරා මරණාදිවූ ප්‍රත්‍යය සමුප්පන්න ධර්මයන්ද මුවහ කරන හෙයින් **අවිද්‍යා** නම්.

මේ අවිද්‍යා හේතුවෙන් නොහොත් අවිද්‍යාප්‍රත්‍යයෙන් හෙවත් අවිද්‍යා සඞ්ඛ්‍යාත උපකාර හේතුවෙන් සකස් කළ යුතුවූ ඵල ධර්මයට සංස්කාරයයි කියනු ලැබේ.

2 **සංස්කාර.** සංස්කාරයෝ විධ වේ

එනම්: 1. **අවිද්‍යාප්‍රත්‍යයෙන් හටගත් සංස්කාරයෝය,**

2. **සංස්කාර ශබ්දග්‍රහණයෙන් ආවාවූ සංස්කාරයෝය.**

**අවිද්‍යාප්‍රත්‍යයෙන්** සම්භවවූ සංස්කාරයෝ නම්:-

1. **පුණ්‍යාභි සංස්කාර**
2. **අපුණ්‍යාභි සංස්කාර**
3. **ආනෙඤ්ජාභි සංස්කාර**
4. **කාය සංස්කාර**
5, **වචී සංස්කාර**
6. **චිත්ත සංස්කාර**

**සංස්කාර ශබ්දයෙන්** ආ සංස්කාරයෝ **නම්.**

1. **සඞ්ඛත සඞ්ඛාර** හෙවත් සියළුම හේතුව හා සමග පවත්නාවූ ධර්මයෝය.

2. **අභිසඞ්ඛත සඞ්ඛාර** නම් වූ කර්ම හෙතුවෙන් නිපන් ත්‍රෛභූමික රූපාරූප ධර්මයෝය.

3. **අභිසඞ්ඛරණක සඞ්ඛාර** නම් වූ ත්‍රෛභූමික කුසලාකුසල චෙතනාවෝය.

4. **පයොගාභිසඞ්ඛාර** නම් වූ කායික චෛතසික වූ වීර්‍ය්‍යය යන මොව්හු වෙත්.

**කාය සංස්කාරයෝ** නම් කරජකය විසින් සකස් කරනු ලබන ආශ්වාස ප්‍රශ්වාසයෝයි.

**වචී සංස්කාරයෝ** නම් වාග්භේදකර ශබ්ද පිළියෙල කරන්නාවූ විතක්ක විචාරයෝයි.

**චිත්තසංස්කාරයෝ** නම් සිත සකස් කරන්නා වූ සංඥා වෙදනාවන් නොහොත් විතක්ක විචාරයන් හැර ඉතිරි පනසක් පමණවූ චෛතසික සමූහයයි.

මේ සියල්ලම **සඞ්ඛත සංස්කාරයන්ට** ඇතුළත් වේ.

3. **විඤ්ඤාණ.** ආරම්මණ විජානන ධර්ම ජාතය විඤ්ඤාණ නමි.

4. **නාමරූප** නැඹුරුවේනුයි **නාම** නමි. විකාරයට පැමිණේනුයි **රූප** නමි.

5. **සළායතන.** ආය භූතවූ, චිත්ත චෛතසික ධර්මයන් නොහොත් අනවරාග්‍ර සංසාරයෙහි ප්‍රවෘත්ත වූ, ආයභූත වූ සංස්කාර දුක්ඛයන් විතර කෙරේද, තනාද, ඉතා දික් වූ සංසාර වෘත්ත දුක්ඛයන් පවත්වාද, ඒ හෙයින් ඒ චක්ෂුරාදීවූ ධර්මයෝ **ආයතන** නම් වෙත්.

6. **ඵස්සය** අරමුණු පහස්නේ **ඵස්ස** නමි.

7. **වෙදනා.** අරමුණු රස අනුභව කෙරේනුයි වෙදනා නමි

8. **තණ්හා.** අරමුණු ආස්වාදය **කරනු** කැමති වේනුයි තණ්හා නම්.

9. **උපාදාන.** දැඩිකොට ගනීනුයි උපාදාන නම්.

10. **භව.** **උත්පත්ති** භවය ඇති **කරන්නාවූ** **කර්ම** භවය භව නම්.

11. **ජාති.** ඉපදීම හෝ පහළවීම **ජාති** නම්.

12. **ජරා.** දිරණ බව හෝ පැරණි බව ජරා නම්.

**මරණ.** ස්කන්ධයන්ගේ නැතිවීම, චුතිය, මරණ නම්.

**සෝක.** ශෝක කිරීම සෝක නම්.

**පරිදේව.** හැඬීම හෝ වැළපීම පරිදේව නම්,

**දුක්ඛ** යම් වේදයිතයෙක් දුක් උපදවාද ඒ වේදයිතය දුක්ඛ නම්.

**දෝමනස්ස.** දුෂ්ට වූ සිත් ඇති පුද්ගලයාගේ ස්වභාවය දෝමනස්ස නම්.

**උපායාස** දැඩිවූ ආයාසය හෙවත් චිත්තපීඩාව උපායාස නම්.

3. **ලක්ෂණාදි වශයෙන් විනිශ්චය.**

1. **අවිජ්ජා**

**අඤ්ඤාණ ලක්ඛණා** — නොදැනීම ලක්ෂණ කොට ඇත්තීය, හෙවත් ඇතිසැටි දැනීම ලක්ෂණ කොට ඇති ඥානයට ප්‍රතිපක්ෂභාව සඞ්ඛ්‍යාත ලක්ෂණ ඇත්තීය.

**සම්මෝහන රසා**—සම්ප්‍රයුක්ත ධර්මයන් හා තත් සම්බන්ධ පුද්ගලයා වැඩියක් මුළා කරවන කෘත්‍යය ඇත්තීය.

**ඡාදන පච්චුපට්ඨානා**—ආලම්බන ස්වභාවය වසන දහමක් වශයෙන් නුවණට වැටහේ.

2. **සඞ්ඛාර**

**අභිසඞ්ඛරණ ලක්ඛණා**—සකස්කොට කිරීම හෝ මොනවට පිළියෙල කිරීම ලක්‍ෂණ කොට ඇත්තාහ.

**ආයූහන රසා**—ප්‍රතිසන්ධි ජනනය පිණිස උත්සාහ කරන කෘත්‍යය ඇත්තේය, නොහොත් රාශිභූතව නාමරූප සඞ්ඛ්‍යාත ඵල ධර්මයන් කරන නොහොත් රැස් කරන කෘත්‍යය ඇත්තේය.

**චෙතනා පච්චුපට්ඨානා** — ව්‍යාපාර භාවය යයි කියන ලද චෙතනා භාවයෙන් නුවණට වැටහෙන්නේය.

**අවිජ්ජා පදට්ඨානා** — අවිද්‍යාව ආසන්න කාරණ කොට ඇත්තේය.

3. **විඤ්ඤාණං**

**විජානන ලක්ඛණං** — විශෙෂ වශයෙන් අරමුණු දැනගැනීම ලක්‍ෂණ කොට ඇත්තේය.

**පුබ්බඞ්ගම රසං** — වෙදනාදී නාමස්කන්ධත්‍රය රූපස්කන්ධය යන මොවුනට පෙරදැරිව පවත්නා හෙයින් පූර්වඞ්ගම කෘත්‍යය ඇත්තේය.

**පටිසන්ධි පච්චුපට්ඨානං**—පළමු භවය හා ගැළපීම් නුවණට වැටහේ.

**සඞ්ඛාර පදට්ඨානං** — සංස්කාරයන් ආසන්න කාරණකොට ඇත්තේය, නොහොත්,

**වත්ථාරම්මණ පදට්ඨානං**— වස්තු ආලම්බනයන් ආසන්න කාරණ කොට ඇත්තේය.

## 4. නාමරූප

### 1. නාමය

**නමන ලක්ඛණං** — අරමුණට නමන ලක්‍ෂණ ඇත්තේය.

**සම්පයොග රසං** — සිත හා සමගද, ඔවුනොවුන් හා සමගද චතුර්විධ සම්ප්‍රයොග ලක්‍ෂණ ඇති කොට යොදන කෘත්‍යය ඇත්තේය.

**අවිනිබ්භොග පච්චුපට්ඨානං** — චිත්තය හා විනිර්භොගය නොකට හැකිව හෙවත් සිත හා වෙන් නොකොට හැකිව නුවණට වැටහීම වේ නොහොත් වෙදනාදී ත්‍රිවිධ ස්කන්ධයන් ඔවුනොවුන් වෙන් නොකොට හැකි ධර්මයක්ව නුවණට වැටහීම වේ

**විඤ්ඤාණ පදට්ඨානං** — විඥානය ආසන්න කාරණ කොට ඇත්තේය.

**රූපං**

**රුප්පන ලක්ඛණං** — විකාරයට පැමිණීම ලක්‍ෂණ කොට ඇත්තේය.

**විකිරණ රසං** - ඔවුනොවුන් සම්ප්‍රයොග ලක්‍ෂණ රහිතවන බැවින් විකීර්ණ කෘත්‍යය ඇත්තේය. හෙවත් සුණුවන කිස ඇත්තේය.

**අව්‍යාකත පච්චුපට්ඨානං** — අව්‍යාකෘත භාවයෙන් නුවණට වැටහේ, නොහොත් අව්‍යකෘතත්වය යයි කියන ලද අනාලම්බන භාවයෙන් නුවණට වැටහීම වේ.

**විඤ්ඤාණ පදට්ඨානං** — විඥානය ආසන්න කාරණ කොට ඇත්තේය.

5. **ආයතනං**

**ආයතන ලක්ඛණං**—ගළපන ලක්ෂණ ඇත්තේය, නොහොත් සංසාර වෘත්තදුක්ඛය විස්තර කරණ ලක්ෂණ ඇත්තේය.

**දස්සනාදි රසං**— දර්ශනාදියට කරුණුවන කිස ඇත්තේය

**වත්ථුද්වාරභාව පච්චුපට්ඨානං**—යෙදෙන පරිද්දෙන් පඤ්චවිඤ්ඤාණ ධාතු, මනො ධාතු, මනො විඤ්ඤාණ ධාතූන්ගේ වස්තුද්වාර භාවයෙන් නුවණට වැටහීම වේ.

**නාමරූප පදට්ඨානං**— නාම රූපය ආසන්න කාරණ කොට ඇත්තේය.

6 **ඵස්සො**

**ඵුසන ලක්ඛණො**— අරමුණු පහස්නා ලක්ෂණ ඇත්තේය.

**සඞ්ඝට්ටන රසො**— ආලම්බන සංඝර්ෂණ කෘත්‍යය හෙවත් අරමුණු ගැටීම කෘත්‍යය ඇත්තේය

**සඞ්ගති පච්චුපට්ඨානො**—වස්තු ආලම්බන විඤ්ඤාණයන්ගේ සමාගමයව, එක්වීමව, නුවණට වැටහේ.

**සළායතන පදට්ඨානො**— ෂඩායතනය ආසන්න කාරණ කොට ඇත්තේය.

7. **වෙදනා**

**අනුභවන ලක්ඛණා** — අනුභව කිරීම ලක්ෂණ කොට ඇත්තීය.

**විසය රස සම්භෝග රසා**— ආලම්බන රසාස්වාදය කෘත්‍යය කොට ඇත්තීය.

**සුඛ දුක්ඛ පච්චුපට්ඨානා**—සුව දුක් පියවිව නුවණට වැටහීම වේ.

**ඵස්ස පදට්ඨානා**—ස්පර්ශය ආසන්න කාරණ කොට ඇත්තීය.

8. **තණ්හා**

**හෙතුලක්ඛණා**— දුකට කරුණු වන බව ලක්ෂණ කොට ඇත්තීය.

**අභිනන්දන රසා**—ඒ ඒ අරමුණු, ඒ ඒ භූමි, ඒ ඒ භවයන්හි වැඩියක් ඇලෙන කිස ඇත්තීය.

**අතිත්තිභාව පච්චුපට්ඨානා**— චිත්තයාගේ හෝ පුද්ගලයාගේ හෝ රූපාදීන්හි ඇතැයි යන තෘප්ති රහිත භාවයෙන් නුවණට වැටහීම වේ.

**වෙදනා පදට්ඨානා**—වේදනාව ආසන්න කාරණා කොට ඇත්තීය.

9. **උපාදානං**

**ගහණ ලක්ඛණං**— අරමුණු දැඩි කොට ගන්නා ලක්ෂණ ඇත්තේය.

**අමුඤ්චන රසං**— තෘෂ්ණා දෘෂ්ට්‍යාභිනිවේශයාගේ වශයෙන් ගත් අරමුණු නොමුදන කෘත්‍යය ඇත්තේය.

**තණ්හාදළ්හත්ත දිට්ඨි පච්චුපට්ඨානං**— කාමූපාදානය තෘෂ්ණාවගේ දැඩි බවව, සෙසු උපාදානයන් දෘෂ්ටිව නුවණට වැටහීම වේ.

**තණ්හා පදට්ඨානං**—තෘෂ්ණාව ආසන්න කාරණා කොට ඇත්තේය.

10. භවො

**කම්ම කම්මඵල ලක්ඛණො**—කර්ම භව, උත්පත්ති භව වශයෙන් හටගන්වන, හටගන්නා කිස ඇත්තේය.

**කුසලාකුසලව්‍යාකත පච්චුපට්ඨානො**— කර්ම භව වශයෙන් කුසල් අකුසල්වද, උත්පත්ති භව වශයෙන් අව්‍යාකෘතවද නුවණට වැටහීම වේ.

**උපාදාන පදට්ඨානො**—උපාදානය ආසන්න කාරණා කොට ඇත්තේය.

11. ජාති—

**තත්ථ තත්ථ භවෙ පඨමාභිනිබ්බත්ති ලක්ඛණා**— ඒ ඒ භවයෙහි පළමුව ඉපදීම ලක්ෂණකොට ඇත්තීය.

**නීයාතන රසා**—පළමු උපන් ආත්මභාවය එළවා දීමක් බඳු කෘත්‍යය ඇත්තීය, හෙවත් එසේතම් ගනීවායි ගිවිස ගැන්මක් වැනිව පවත්නා කිස ඇත්තීය.

**අතීතභවතො ඉධ උම්මුජ්ජන පච්චුපට්ඨානා**— අතීත භවයෙන් මේ ප්‍රත්‍යුත්පන්න භවයෙහි සන්තතියගේම මතුවීම වැටහීම කොට ඇත්තීය.

12. ජරා—

**ඛන්ධ පරිපාක ලක්ඛණා**— පඤ්චස්කන්ධයන්ගේ මිහි කිරීම ලක්ෂණ කොට ඇත්තීය.

**මරණූපනයන රසා**— මරණයට එළවීම් කිස ඇත්තීය.

**යොබ්බන විනාස පච්චුපට්ඨානා**— යොවුන් බව නැසීම් වශයෙන් වැටහෙන්නීය.

**මරණං**—

**චුති ලක්ඛණං**— චුතවීම ලක්‍ෂණ කොට ඇත්තේය, හෙවත් ප්‍රත්‍යක්‍ෂවූ ආත්මභාවයෙන් ගිලිහීම් ස්වභාවය ඇත්තේය.

**වියොග රසං**— සම්ප්‍රාප්ත භවයෙහි ස්කන්ධයන් කෙරෙන් වෙන්වීම් කෘත්‍යය ඇත්තේය.

**විප්පවාස පච්චුපට්ඨානං**—පූර්ව භවයෙහි හෝ පූර්ව භවය හා වියෝව විසීම් වශයෙන් වැටහෙනුය.

**සොක**—

**අන්තො නිජ්ඣාන ලක්ඛණො**— අභ්‍යන්තරයෙහිම හෙවත් ලෙහි තුළම හැකුළුණාවූ සිතීම ලක්‍ෂණ කොට ඇත්තේය, හෙවත් ඇතුළතම වියළීම තැවීම ලක්‍ෂණ කොට ඇත්තේය.

**චෙතසො පරිනිජ්ඣායන රසො**— චිත්තයාගේ දැවීම් කිස ඇත්තේය.

**අනුසොචන පච්චුපට්ඨානො**— ඒ ඒ ගුණදෙස් අනු ගමනය කොට පසුතැවීමව වැටහෙනුය.

**පරිදෙව**—

**ලාලප්පන ලක්ඛණො**— නැවත නැවත තෙපලීම ලක්‍ෂණ කොට ඇත්තේය.

**ගුණදොස පරිකිත්තනරසො**—ගුණ දෙස් හඟවන කිස ඇත්තේය.

**සම්භව පච්චුපට්ඨානො**—නොනැවතී, නොපිහිටි බවක්ව වැටහීම ඇත්තේය.

**දුක්ඛ:**

**පීඩන ලක්ෂණ**—කය පෙළන ලක්ෂණ ඇත්තේය.
අඥානයන්ට **දෞර්මනස් උපදවන කිස ඇත්තේය.**
කායිකාබාධය වැටහීම් **කොට ඇත්තේය.**
හෙවත් **කායික** පීඩාවක්ව වැටහෙන්**නේ**ය.

**දෞර්මනස්ස:**

**සිත** පෙළන ලක්ෂණ ඇත්තේය
සිතට හිංසා **කරණ කෘත්‍යය** ඇත්තේය.
මානසික ව්‍යාධියක් බව වැටහීම් **කොට** ඇත්තේය.
හෙවත් **සිතෙහි** ලෙඩ බවක්ව වැටහෙන්නේය.

**උපායාස:**

**ව්‍යාසනතිලක්ඛණා**—විරූපවූ ආසඞ්ග සඞ්ඛ්‍යාත ආසක්ති යෙහි නියමයෙන් බැඳුනු බව ලක්ෂණ කොට ඇත්තේය.

**නිත්ථුනන රසො**—තැතනුම් **කරණ කිස** ඇත්තේය.

**විසාද පච්චුපට්ඨානා**— සිතෙහි යටපත් බවක්ව වැට හෙන්නේය.

## ඒකවිධාදි වශයෙන් විනිශ්චය

**අවිද්‍යාව— අඥාණ** හෙවත් ධර්මස්වභාවය හෝ ආලම්බනය නොදැනීමය, **අදස්සන** හෙවත් ධර්මස්වභාවය හෝ ආලම්බනය නොදැකීමය, **මොහ** හෙවත් ධර්මස්වභාවයෙහි හෝ ආලම්බනයෙහි මූළා වීමය යනාදි **ස්වභාවයන්**ගේ වශයෙන් ද, **අනනුබොධාදීන්**ගේ වශයෙන්ද **එකවිධ** වේ.

**අප්පටිපත්ති** නම්වූ නොපිළිපැදීම යයි කියනලද දුක්ඛාදි චතුස්සත්‍යයන්හි මූලාවීම හෙවත් දෘෂ්ටි විප්‍රයුක්තතාවය, **මිච්ඡාපටිපත්ති** නම්වූ අසුභාදීන්හි සුභාදි විපර්‍යාස සඞ්ඛ්‍යාත වූ වරදවා පිළිපැදීමය හෙවත් දෘෂ්ටි සම්ප්‍රයුක්තතාවය යනාදි වශයෙන් **ද්විවිධ** වේ.

**සසංස්කාර, අසංස්කාර**යන්ගේ වශයෙන්ද ද්විවිධ වේ

වේදනාත්‍රය හා එකොත්පාදදි භාවයෙන් සම්ප්‍රයොගවීම් වශයෙන් **ත්‍රිවිධ** වේ.

චතුස්සත්‍යය ප්‍රතිවෙධ ඥානයට ප්‍රතිපක්ෂවීම් වශයෙන් චතුර්විධ වේ.

දෙව ගති, මනුෂ්‍ය ගති, නිරය ගති, ප්‍රේත ගති, තිරශ්චීන ගතීන්හි වරදවා ගැනීම් වශයෙන් **පඤ්චවිධ** වේ.

චාරාලම්බන වශයෙන් සියළුම ප්‍රතීත්‍ය සමුප්පාදඞ්ගභූතවූ නාම ධර්මයන් විෂයෙහි **ෂඩ්විධ** වේ.

**සංස්කාර**— ආශ්‍රවයන්ට අරමුණු වූ ධර්මයන් විපාක සවභාවය උපදවන්නාවූ ධර්මයන් යනාදීන්ගේ වශයෙන් **එකවිධ** වේ.

කුසල සංසකාර, අකුසල සංසකාරයන්ගේ වශයෙන් **ද්විධ** වේ. එසේම පරිත්ත සංසකාර මහද්ගත සංසකාර වශයෙන්ද, හීන සංසකාර මධ්‍යම සංසකාර වශයෙන්ද, මිථ්‍යානියත සංසකාර අනියත සංසකාරයන්ගේ වශයෙන්ද **ද්විධ** වේ.

පුණ්‍යාභි සංසකාර අපුණ්‍යාභි සංසකාර අනෙඤ්ජාභි සංසකාරයන්ගේ වශයෙන්ද, කාය සංසකාර වචී සංසකාර චිත්ත සංසකාරයන්ගේ වශයෙන්ද **ත්‍රිවිධ** වේ.

අණ්ඩජාදි චතුර්විධ යෝනීන්හි ඇතුළත් අත්බැව්හි පැවැත්වීම් වශයෙන් **චතුර්විධ** වේ.

දෙවගති ආදි පඤ්චවිධ ගතීන්ට සත්ත්වයන් පමුණුවන හෙයින් පඤ්චවිධ වේ.

**විඤ්ඤාණය**— ලෞකික විපාක විඤ්ඤාණාදි වශයෙන්ද අව්‍යාකෘත, සංස්කෘත, සප්‍රත්‍යාදි භාවයෙන්ද, උපාදින්න, උපාදානීය විපාක ධර්මාදීන්ගේ වශයෙන්ද **ඒකවිධ** වේ.

සහෙතුක අහේතුක වශයෙන්ද, සසඞ්ඛාර අසඞ්ඛාර ආදීන්ගේ වශයෙන්ද **ද්විධ** වේ.

භවත්‍රයෙහි ඇතුළත්වීම් වශයෙන්ද, වෙදනාත්‍රය හා එක්ව යෙදීම් වශයෙන්ද, අහෙතුක ද්විහෙතුක ත්‍රිහෙතුක වශයෙන්ද **ත්‍රිවිධ** වේ.

යෝනි වශයෙන් **චතුර්විධ** වේ.

ගති වශයෙන් **පඤ්චවිධ** වේ.

**නාම රූප**— විඤ්ඤාණ සඞ්ඛ්‍යාත නිශ්‍රයස්ථාන ඇති හෙයින්ද නොහොත් විඤ්ඤාණයාගේ නිශ්‍රයස්ථාන වශයෙන්ද, කර්මයම ප්‍රත්‍යකොට පවත්නා වශයෙන්ද **ඒකවිධ** වේ.

සාලම්බන, අනාලම්බන වශයෙන් හෙවත් අරමුණු ගැණීම්, අරමුණු නො ගැණීම් වශයෙන් **ද්විධ** වේ.

යෝනි වශයෙන් **චතුර්විධ** වේ.

ගති වශයෙන් **පඤ්චවිධ** වේ.

**සළායතන**— සඤ්ජාත සමොසරණ වශයෙන් හෙවත් විඤ්ඤාණය හා සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ හටගන්නා තැන්, රැස්ව සිටිනා තැන් වශයෙන් **ඒකවිධ** වේ.



Free Distribution www.aathaapi.org

මහාභූත ප්‍රසාද, විඥානාදීන්ගේ වශයෙන් විධ වේ.

ඝ්‍රාණාදිත්‍රයගේ සම්පත්තගොචරග්‍රාහය,

චක්ඛුශ්‍රොත්‍රයන්ගේ අසම්පත්ත ගොචරග්‍රාහය

මනායතනයාගේ නොභය ගොචර ග්‍රාහය යනාදීන්ගේ වශයෙන් ත්‍රිවිධ වේ.

යොනි වශයෙන් චතුර්විධ වේ.

ගති වශයෙන් පඤ්චවිධ වේ.

අභිඥ්ඥ පදයන්ගේ එකවිධාදි භාවය මේ නයින් දතයුතු

## අඞ්ගපිරිසිඳුම් වශයෙන් විනිශ්චය:

මේ පටිච්ච සමුප්පාද දෙශනයෙහි සොකාදීහු භවචක්‍රයාගේ නොසිඳ පැවැත්ම දැක්වීම පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී.

ජරා මරණයන් විසින් මඩනාලද අඥාන බාලයා හට ඒ සොකාදීහු හටගනිති. දෙශනාවෙහි සඳහන් වන පරිදි පටිච්ච සමුප්පාදය අසා දැනුම් ඉගෙනුම් නැත්තාවූ පෘථග්ජන තෙම කායිකවූ දුක්ඛ වෙදනාවෙන් පෙළෙන ලදුයේම නොහොත් පහස්නා ලදුයේම සොක කරයි, කලානන වෙයි. විලාප ගසා හඬයි, ළෙහි අත්ගසා කඳුළු හෙළා හඬයි, වැඩියක් සිහි මුළා බවට පැමිණෙයි. යම්තාක් කල් ඒ සොකාදීන්ගේ පැවත්ම ඇද්ද ඒතාක් කල් අවිද්‍යාවගේ පැවැත්මද වේ. එහෙයින් නැවතත් අවිද්‍යා සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය හෙතු කොටගෙන හෙවත් අවිද්‍යා හෙතුවෙන් සංස්කාරයෝ හට ගනිත්. මෙසේ හෙයින් භව චක්‍රයාගේ පිළිවෙල නොසිඳ ගැලපීම වේ. එසේ පිළිවෙල නොසිඳ ගැලපීම වන හෙයින් ඒ සොකාදීන්ගේද ජරාමරණ හා සමගම නොහොත් ජරා මරණයන්ම එක් සංක්ෂෙපයක්හු කොට පටිච්ච සමුප්පාදඞ්ගයෝ දොළොස් දෙනෙක්ම වෙති.

ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණයද සොකාදීහුද හටගනිති. ජරාමරණ සොකාදීන් අතුරෙන් ජරාමරණාඞ්ගය ඒකාන්-තික භාවයෙන්ම ගැණෙනු ලැබේ. සොකාදීහු වනාහි රූප භවාදීන්හි අවිද්‍යමාන බැවින් අනෛකාන්තිකවූවාහු, හුදු ප්‍රකට ඵල වශයෙන් අවිද්‍යාව ගෙනහැර පෑම පිණිස ගන්නාලදස. අවිද්‍යානිදර්ශනයෙන්, ජාතිය ඇති කල්හි අනාගත චිතීයාත්ම භාවයෙන් ඔබ්බෙහි තෘතීයාත්ම භවාදීන්ගේ ප්‍රතිසන්ධියගේ කාරණයට කාරණභූත අවිද්‍යාව දක්වන ලදී. එයින් භව චක්‍රයාගේ නොසිඳ පැවැත්ම දක්වන ලද්දේ වේ.

**නිර්දෙශ වාරය:**

## අවිජ්ජා පච්චයා සංඛාරා

**අවිජ්ජා පච්චයා සඞ්ඛාරා**— අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර වන්නේය.

මෙහි **අවිද්‍යාව** විස්තර වන තැන්හි **දුක්ඛෙ අඤ්ඤාණං, දුක්ඛ සමුදයෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධ ගාමිනියා පටිපදාය අඤ්ඤාණං** යනාදි වශයෙන් වදාරා ඇත.

මේ අවිද්‍යාව දුක්ඛ සත්‍යයයාගේ යථාවසරසලක්ෂණය හෙවත් අවිපරීතවූ තමාගේ සවභාව ලක්ෂණය යම් හෙයකින් දැනීමට, දක්නට, ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනීමට නොදෙයිද, දැනීමට නොහැකි පරිදි මුවාකොට, දක්නට නොහැකි පරිදි හාත්පස ඔතා, ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනීමට නොහැකි පරිදි ගොතා පවතීද, එහෙයින් **දුක්ඛෙ අඤ්ඤාණං** යයි වදාරණ ලදී. එපරිද්දෙන්ම දුක්ඛයට කාරණවූ සමුදය සත්‍යයයාගේද දුක්ඛයාගේ නිරුද්ධවීමවූ නිරොධ සත්‍යයයාගේද දුක්ඛයාගේ, නිරොධයට පමුණුවන්නාවූ ප්‍රතිපදාවගේද, යථාවසරස ලක්ෂණ හෙවත් අවිපරීතවූ තමාගේ සවභාව ලක්ෂණය යම් හෙයකින් දැනීමට දක්නට ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනීමට නොදෙයිද, දැනීමට නොහැකි පරිදි මුවාකොට, දක්නට නොහැකි පරිදි හාත්පස ඔතා, ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනීමට

නොහැකි පරිදි ගොතා පවතීද, එහෙයින් **දුක්ඛ සමුදයෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධෙ අඤ්ඤාණං, දුක්ඛ නිරොධ ගාමිනියා පටිපදාය අඤ්ඤාණං** යයි වදාරණ ලදී.

මෙසේ චතුරාර්‍ය්‍ය සත්‍යයයන්ගේ වශයෙන් සතර තැනෙක්හි නොදැනීම අවිද්‍යාව යයි කියනු ලැබේ.

එපරිද්දෙන්ම, **පුබ්බන්තෙ අඤ්ඤාණං, අපරන්තෙ අඤ්ඤාණං, පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං, පටිච්ච සමුප්පන්න ධම්මෙ අඤ්ඤාණං** යනාදි වශයෙන් සතර තැනෙක්හි නොදැනීමද අවිද්‍යාව යයි වදාරනු ලැබේ.

අතීතවූ අධ්ව යයි කියනලද අතීතවූ හෙවත් ක්ෂණත්‍රයට පැමිණියාවූ ස්කන්ධ ධාතු ආයතනයන් පිළිබඳවූ නොදැනීම, **පුබ්බන්තෙ අඤ්ඤාණං** යයිද, අනාගතවූ අධ්ව යයි කියන ලද අනාගතවූ හෙවත් ක්ෂණත්‍රයට නොපැමිණියාවූ ස්කන්ධ ධාතු ආයතනයන් පිළිබඳවූ නොදැනීම, **අපරන්තෙ අඤ්ඤාණං** යයිද, අතීතානාගතවූ අධ්ව යයි කියනලද අතීතානාගතවූ ස්කන්ධ, ධාතු, ආයතනයන් පිළිබඳ නොදැනීම **පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං** යයිද පටිච්ච සමුප්පන්න ධර්මයන් පිළිබඳවූ නොදැනීම **පටිච්ච සමුප්පන්න ධම්මෙ අඤ්ඤාණං** යයිද දතයුතුයි.

මෙසේ අට තැනෙක්හි නොදැනීම අවිද්‍යා නම්. මෙහිදී අවිද්‍යාව කෘත්‍යය වශයෙන්ද ජාති වශයෙන්ද වදාරන ලදී. මේ අට තැන් දැනීමට, දැකීමට, ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනීමට නොදේද යනාදියයෙන් අවිද්‍යාව **කෘත්‍ය** වශයෙන්ද උපදින්නී නමුදු මේ අට තැන්හි උපදීද යනාදියෙන් අවිද්‍යාව, **ජාති** වශයෙන්ද වදාරන ලදී.

**ලක්ෂණ** වශයෙන් වනාහි, අවිද්‍යාවගේ ලක්ෂණයන් විසිපස් පදයෙකින් පමණ දක්වා තිබේ.

1. **අඤ්ඤාණං**— ඥානය නම්වූ ප්‍රඥාව, ඵල සමූහයද හේතු සමූහයද චතුස්සත්‍ය ධර්මයද **මනාකොට** දනී. මේ අවිද්‍යාව ඇතිවූ **කල්හි එසේ** අවිපරීතාර්ථය **දැනීමට** ඉඩ නොදී ඥානයට විපක්‍ෂ වශයෙන් ඇතිවන බැවින්, අවිද්‍යාවට **අඤ්ඤාණ** යයි කියනු ලැබේ.

2. **අදස්සනං**— දර්ශන නම්වූ ප්‍රඥාවෙන්ද ඒ අවිප-රීතාර්ථාදීවූ ආකාරය මනාකොට දකී. අවිද්‍යා තොමෝ වනාහි ඉපිද ඒ අවිපරීතාර්ථාදීවූ ආකාරය දක්නට නොදෙයි. එ හෙයින් **අදස්සන** ය යි කියති.

3. **අනභිසමයො**— අභිසමය නම්වූ ප්‍රඥාවෙන්ද, අවි පරීතාර්ථාදීවූ ආකාරය මොනවට දකී. අවිද්‍යාව ඇති කල්හි එම අර්ථාදිය මොනවට දැනගන්නට නොදී එයට ප්‍රතිපක්‍ෂ වශයෙන් ඇතිවන හෙයින් **අනභිසමය** ය යි කියනු ලැබේ

4. **අනනුබොධො**

5. **අසම්බොධො**

6. **අප්පටිවෙධො**

අනුබොධ, සම්බොධ, පටිවෙධ යනුද ප්‍රඥාවගේම නාම යෝයි. අවිපරීතාර්ථාදීවූ ආකාරය ඒ ප්‍රඥා තොමෝ අනු බොධය කෙරෙයි, සම්බොධය කෙරෙයි. ප්‍රතිවෙධය කෙරෙයි. අවිද්‍යා තොමෝ ඉපිද ඒ අවිපරීතාර්ථාදීවූ ආකාරය අනුබොධය කරන්නට, සම්බොධය කරන්නට ප්‍රතිවෙධය කරන්නට නොදී එයට ප්‍රතිපක්‍ෂ වශයෙන් පවතී. එහෙයින් අවිද්‍යාවට **අනනුබොධ, අසම්බොධ, අප්පටිවෙධ** යයි කියනු ලැබේ.

7 **අසඞ්ගාහණා**— සඞ්ගාහනා නමුදු ප්‍රඥාවට නමෙකි. ඒ ප්‍රඥාව අවිපරීතාර්ථාදීවූ ආකාරය සිත්හි රුවා නොහොත් සිතින් හෝ පුද්ගලයා විසින් හෝ ගත්තක්හු කොට ගටා හනී. අවිද්‍යාව ඇතිවූ කල්හි එය ගටා ගන්නට නොදෙන හෙයින් **අසඞ්ගාහණා** නම් වේ.

8. **අපරියොගාහණා**— පරියොගාහනා යනුද ප්‍රඥාවට නමෙකි. ඒ ප්‍රඥාව අවිපරීතාර්ථාදිවූ ආකාරය අලලා අවතීර්ණව හෙවත් අනුව බැසගනී අවිද්‍යා තොමෝ ඉපිද එය අලලා අනුව පිවිස ගන්නට නොදෙන හෙයින් **අපරියොගාහණා** නම් වේ.

9. **අසම්පෙක්ඛණා**— සම්පෙක්ඛණ නම් වූ ප්‍රඥාවෙන් අවිපරීතාර්ථාදිවූ ආකාරය සමකොටද, මනා කොටද ප්‍රේක්ෂණය කෙරෙයි. අවිද්‍යාව ඒ ආකාරය සමකොටද මනාකොටද ප්‍රේක්ෂණය **කරන්නට** නොදෙන හෙයින් **අසම්පෙක්ඛණ** නම් වේ.

10. **අපච්චවෙක්ඛනා**— පච්චවෙක්ඛනා නම්වූ ප්‍රඥා-වෙන් ඒ ආකාරය ප්‍රත්‍යවෙක්ෂා කරයි. අවිද්‍යාව ඉපිද ඒ ආකාරය ප්‍රත්‍යවෙක්ෂා කරන්නට නොදෙන හෙයින් **අපච්චවෙක්ඛනා** නම් වේ.

11. **අපච්චක්ඛ කම්මං**— අවිද්‍යාවගේ ප්‍රත්‍යක්ෂවූ කිසි කටයුත්තෙක් නැත. තමනුත් ප්‍රත්‍යවෙක්ෂා නොකොට කටයුත්ත කරයි. එහෙයින් **අපච්චක්ඛකම්ම** හෙවත් **අප්‍රත්‍යක්ෂ කර්‍ම** නම් වේ.

12 **දුම්මෙජ්ඣං**— මේධා නම් වූ ප්‍රඥාවට විපක්ෂවන හෙයින් **දුර්මේධ්‍ය** නම්.

13. **බාල්‍යං**— වරදවා සිතීම් ආදී වූ බාලභාව හේතු-වෙන් **බාල්‍ය** නමුදු වේ.

14. **අසම්පජඤ්ඤං**— සම්පජඤ්ඤ නමුදු ප්‍රඥාවට නමෙකි සම්පජඤ්ඤ නම් වූ ප්‍රඥාවෙන් හෙතුඵල ධර්‍මයන්ද චතුස්සත්‍යය ධර්‍මයන්ද මනාකොට ප්‍රකාරයෙන් දනී, අවිද්‍යාව ඒ ආකාරය ප්‍රකාරයෙන් දැනීමට නොදෙන හෙයින් **අසම්පජඤ්ඤ** නම් වේ.

15. **මොහො**— අරමුණෙහි මුළාවීම් වශයෙන් **මොහ** නම්.

16. **පමොහො** — බලවත් මුළාවීම් වශයෙන් **පමොහ** නම්

17. **සම්මොහො** — හාත්පස මුළාවීම් වශයෙන් **සම්මොහ** නම්.

18 **අවිජ්ජා** — විඳීමට හෝ ලැබීමට නුසුදුසුවූ කාය දුශචරිතාදිය විඳීනුයි **අවිජ්ජා** නමි.

19. **අවිජ්ජෝඝො** — වෘතානදුක්ඛයෙහි සත්වයන් ගිල්වන හෙයින් **අවිජ්ජෝඝ** නම් වේ.

20. **අවිජ්ජා යොගො** — වෘතානදුක්ඛයෙහි සත්වයන් යොදවන හෙයින් **අවිජ්ජා යොග** නම් වේ.

21. **අවිජ්ජානුසයො** — මාර්ගයෙන් අප්‍රහීණ වූවහුගේ වශයෙන් නැවත නැවත සන්තානයෙහි උපදනා හෙයින් **අවිජ්ජානුසය** නමි.

22. **අවිජ්ජා පරියුට්ඨානං**— මං පැහැරීමෙහි යෙදුනු සොරහු මාර්ගිකයන් පහරන්නාක් මෙන් කුසල් සිත් පැහැර ගන්නා, සොරා ගන්නා හෙයින් අවිජ්ජා පරියුට්ඨාන නම් වේ.

22. **අවිජ්ජාලඞ්ගී**—නගරවාරයෙහි පරිඝ යයි කියන ලද ලඞ්ගිය තොහොත් දොර අගුල යෙදූ කල්හි ඇතුල් නුවර මිනිසුන්ගේ පිටවීයාමත්, නුවරින් පිට සිටින මිනිසුන්ගේ නුවරට ඇතුල්වීමත් වැළකේ. එපරිද්දෙන් යම් පුද්ගලයෙක්හුගේ සව ආත්මභාව සඞ්ඛ්‍යාත පුරයෙහි මේ අවිද්‍යා තොමෝ පතිතවේද, ඒ පුද්ගලයාගේ නිවණට පමුණුවන්නාවූ ප්‍රඥා සඞ්ඛ්‍යාත ගතිය වළකී. එහෙයින් **අවිජ්ජාලඞ්ගී** නමුදු වේ.

34. **අකුසලං**—අවිද්‍යාව අකුසලයකි.

25. **අකුසල මූලං** — අවිද්‍යාව අකුසලයන්ගේ මූල හෙතුවක්ද වේ. එනම් මොහයයි.

මෙබඳු ලක්‍ෂණ ඇති අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ ලැබෙති.

## සඞ්ඛාරා

මෙහිදී සංස්කාර ශබ්දයෙන් ආ සංස්කාරයන් නොගෙන අවිද්‍යා ප්‍රත්‍යයයෙන් ආ සංස්කාරයන් පමණක් ගනු ලැබේ.

අවිද්‍යා ප්‍රත්‍යයෙන් ආ සංස්කාරයෝ ත්‍රිවිධ වේ.

එනම්: 1. **පුඤ්ඤාභිසඞ්ඛාර**
2. **අපුඤ්ඤාභිසඞ්ඛාර**
3. **ආනෙඤ්ජාභිසංඛාර**

1. **පුඤ්ඤාභිසංඛාර**—යම් කුසල ධර්මයක් තෙම කුසල් කරන්නාවූ පුද්ගලයා පවිත්‍ර කෙරෙයිද, අදහස සම්පූර්ණ කෙරේද, පූජ්‍යවූ භාවයන් උපදවයිද, එහෙයින් ඒ කුසල ධර්මයාට **පුණ්‍ය** යයි කියනු ලැබේ.

විපාකස්කන්ධයද, කටත්තා හෙවත් කර්මජරූපයද යම් කුසල ධර්මයක් තෙම අභිසංස්කරණය කෙරේද, සකස් කෙරේද, එහෙයින් ඒ කුසල කර්මය අභිසංස්කාරද වේ, පුණ්‍යයද වේ. එහෙයින් **පුඤ්ඤාභිසංස්කාර** යයි කියනු ලැබේ.

2. **අපුඤ්ඤාභිසඞ්ඛාර**—පුණ්‍යයට විපක්‍ෂ වූයේ අපුණ්‍ය නම්. අපුණ්‍යම අභිසංස්කරණය කෙරේනුයි **අපුඤ්ඤාභිසඞ්ඛාර** නම්.

3. **ආනෙඤ්ජාභිසංඛාර** — කම්පා නොවේනුයි **ආනෙඤ්ජ** නම්. කම්පා නොවන්නාවූ කුසල ධර්මයම අභිසංස්කාර වේනුයි **ආනෙඤ්ජාභි සඞ්ඛාර** නම්.

තවද, 1. **කාය සංඛාර**
2. **වචී සංඛාර**
3. **චිත්ත සංඛාර** යයි ද සංස්කාරයෝ ත්‍රිවිධවේ.

කාය ද්වාරය විසින් පවත්වන ලද කුසලා කුසල කර්මයතෙම, නොහොත් කායද්වාර හේතුකොට ගෙන පැවැත්තාවූ කුසලාකුසලය තෙමේ, නොහොත් කාය ද්වාරය විසින් සකස් කරන ලද, නොහොත් කායද්වාරයාගේ සංස්කාරය **කාය සංඛාර** නම්. එපරිද්දෙන්ම වාග්ද්වාරය කරණකොටගෙන පැවති සංස්කාරයෝ **වචී සංඛාර** යයිද මනොද්වාරය කරණ කොටගෙන පැවති සංස්කාරයෝ **චිත්ත සඞ්ඛාර** යයිද කියනු ලැබේ.

පුණ්‍යවූ සංසකාරය ඉදින් සකස් කරන්නේ නම්, පුණ්‍ය ඵල සඞ්ඛ්‍යාත භව සම්පත්තිය කරා එළඹ සිටියාවූ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විඤ්ඤාණය වේ. අපුණ්‍යවූ සංස්කාරය සකස් කරන්නේනම්, විපත්ති භවය කරා එළඹ සිටියාවූ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විඤ්ඤාණය වේ. නොසෑලෙන්නාවූ, සමාධියට ප්‍රතිපක්ෂ ධර්මයන්ට අති දූරසථවූ බැවින්, ආනෙඤ්ජ නම් වූ සංස්කාරයන් සකස් කරන්නේ නම් ආනිඤ්ජන භව සම්පත්තිය කරා එළඹ සිටියාවූ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විඤ්ඤාණය වේ.

විස්තර වශයෙන් වනාහි,

**පුණ්‍යාභිසංස්කාරය** නම් කුසල චේතනාවයි. මේ කුසල චේතනාව දෙයාකාර වේ. එනම්:

**අෂ්ටවිධ කාමාවචර කුසල චේතනාවෝය**

**පඤ්චවිධ රූපාවචර කුසල චේතනාවෝය**

'මෙයින් අෂ්ටවිධ කාමාවචර කුසල චේතනාවෝ,

**දාන චේතනාවෝය**

**සීල චේතනාවෝ යයි** විධ වේ.

තෙලෙස් චේතනාවෝම **භාවනාමයවූ කුසල චේතනා** වෝයි. මේ තෙළෙස් චේතනාවන් අතුරෙන් ඥානවිප්‍රයුක්ත චේතනාවන්ගේ භාවනාමයභාවය අප්‍රකටය. පුහුණු කළාවූ

ධර්මය හඳුරන්නාවූ පුද්ගල තෙමේ, එක් අනුසන්ධියකුදු අනුසන්ධි දෙකකුදු ඉක්මගිය කල්හිත් නොදනී, නොහොත් හදාළ ධර්මය අනුසන්ධියට වත් කල්හිත් එක් අනුසන්ධියක්ද අනුසන්ධි දෙකක්ද නොදනී. පසුව ආවර්ජනා කරන කල්හි දැන ගන්නේ යම්සේද, එපරිද්දෙන්ම, කසිණ පරිකර්ම කරන්නාවූ යෝගාවචරයාහටද, පුහුණුවූ දැහැන ප්‍රත්‍යවේක්ෂා කරන්නාවූ යෝගාවචරයාහටද, පුහුණුවූ කමටහන මෙනෙහි කරන්නාවූ යෝගාවචරයා හටද ඥාන විප්‍රයුක්තවූ භාවනාවකුදු වේ. එහෙයින් තෙලෙස් චේතනාවෝම භාවනාමය කුසල් වන බව දක්වන ලදී.

දානය අරභයා, දානය නිසා යම් චේතනාවක්, යම් සංචේතනාවක්, යම් චින්තන සඞ්ඛ්‍යාවූ පුද්ගලයාගේ භාවය යයි කියන ලද සිතිවිල්ලක් උපදීද මේ චේතනා තොමෝ **දානමය වූ පුණ්‍යාභිසංස්කාරය** යයි කියනු ලැබේ.

ශීලය අරභයා යම් චේතනාවක්, යම් සංචේතනාවක් යම් සිතිවිල්ලක් උපදීද, ඒ චේතනා තොමෝ **ශීලමයවූ පුණ්‍යාභිසංස්කාරය** නම් වේ.

භාවනාව නිසා යම් චේතනාවක්, යම් සිතිවිල්ලක් උපදීද, ඒ චේතනා තොමෝ **භාවනාමයවූ පුණ්‍යාභිසංස්කාරය** නම් වේ.

තවද, සිවුරු පිරිකර ආදීවූ සිව්පසයන් අතුරෙන්ද, රූපාලම්බනාදීවූ ෂඩාලම්බනයන් අතුරෙන්ද, බත් ආදීවූ දාන වස්තූන් අතුරෙන්ද, ඒ ඒ දානවස්තු පරිත්‍යාග කරන්නාවූ පුද්ගලයාහට දාන වස්තු සපයන පූර්වභාග අවස්ථාවෙහිද, පරිත්‍යාග කරන අවස්ථාවෙහිද, පසුව සොම්නස් සිතින් නැවත නැවත අනුස්මරණය කරණ අවස්ථාවෙහිද යන මේ තුන් අවස්ථාවෙහි පවත්නා චේතනා තොමෝ **දානමය චේතනා** නමි.

සීලය සම්පූර්ණ කිරීම පිණිස පැවිදි වන්නෙමියි වෙහෙර වදනාහටද, පැවිදි වන්නාහටද, අදහස මුදුන් පමුණුවා ගෙන මම පැවිද්දෙක් වූයෙමියි, එය ඉතා මැනවැයි ආවර්ජනය කරන්නාහටද, ප්‍රාතිමෝක්ෂ ශීලය රක්නාහටද චීවරාදිවූ ප්‍රත්‍යයයන් ප්‍රත්‍යවේක්ෂා කොට වළඳන්නාහටද රූපාදි ෂඩාලම්බනයන් හමුවූ කල්හි චක්ෂුරාදි ෂඩ්වාරයන් රක්නාහටද ආජීවය පිරිසිදු කරන්නාහටද, පවත්නා චේතනා තොමෝ **ශීලමය චේතනා** නමි.

විදර්ශනා මගින් චක්ඛායතනාදියද චක්ෂුර් විඥානාදියද චක්ෂු සම්ඵස්සාදියද, රූප සඥාදියද, **ජරා මරණයද** අනිත්‍ය **වශයෙන්ද**, දුක්ඛ වශයෙන්ද, අනාත්ම වශයෙන්ද භාවනා කරන්නා හට උපදනා චේතනාවෝ **භාවනාමය චේතනා** නමි.

2. **අපුණ්ඤාභි සංඛාරයෝ** නම් අකුසල චේතනාවෝයි දොළොස් අකුසල් සිත් හා සමග එකොත්පාදදි චතුර්විධ සම්ප්‍රයොග ලක්ෂණයෙන්ද යුක්තවූ චේතනාවෝයි. එය කාමාවචරයහ. දෞම්නස් දෙසිත හැර ඉතිරි දසවිධ අකුසල චේතනාවෝ රූපාරූප භවයෙහිත් උපදිත් නමුදු, ඒ රූපාරූප භවයෙහි පටිසන්ධි නොදෙත්. කාම භූමියෙහිම පිළිසිඳ ගැනීම් වශයෙන් විපාකය පවත්වත් එහෙයින් කාමාවචර යයි දෙශනා කරනලදී.

3. **ආනෙඤ්ජාභිසඞ්ඛාරයෝ** නම් සතර අරූපාවචර කුසල චේතනාවෝයි. අකම්පනාර්ථ හෙයින්ද, අකම්පන ස්වභාවයවූ විපාකය පිළියෙල කරන අර්ථයෙන්ද, **ආනෙඤ්ජාභිසංඛාර** යයි කියනු ලැබෙත්.

රූපාවචර චතුර්ථධ්‍යාන වශයෙන් ත්‍රිවිධවූ කුසල විපාක ක්‍රියා චේතනාවෝද, දොළොස් වැදෑරුම් අරූපාවචර කුසල විපාක ක්‍රියා චේතනාවෝද යන පසළොස් වැදෑරුම් වූ චේතනා ධර්මයෝ තුමූ නොසැලෙන අර්ථයෙන් **ආනෙඤ්ජ** නම් වෙත්. එයින් රූපාවචර කුසල චේතනාවෝ

නොසැලෙන නමුත් තමා හා අසමානවූද සමානවූද සැලීම් නැත්තාවූද, රූප නාම විපාකවය උපදවත්. එහෙයින් අනෙඤ්ජාභි සංඛාර නම් නොවේ. රූපාවචර විපාක ක්‍රියා චේතනාවෝ වනාභි විපාක ජනක සවභාවයක් නැති හෙයින් විපාකය සකස් නොකෙරෙත්. අරූපාවචර වූ විපාක ක්‍රියා චේතනාවෝ තුමූත් ඒ රූපාවචර විපාක ක්‍රියා චේතනාවන් මෙන් විපාක නොදේ. මෙසේ හෙයින් එකොළොස් ප්‍රකාරවූ ඒ චේතනාවෝ අකම්පනාර්ථයෙන් ආනෙඤ්ජ නම් වෙත්. නමුත් අභිසංස්කාරයෝ නොවෙත්.

සතර වැදෑරුම්වූ අරූපාවචරවූ කුසල චේතනා තොමෝ හස්ති අශ්වාදීන්ගේ සෙවනැල්ල ඔවුන් හා සමාන වූවා වන මෙන් එපරිද්දෙන්ම තමා හා සමානවූ නොසැලෙන්නාවූ අරූප විපාකයක්ම උපදවයි. එහෙයින් **ආනෙඤ්ජාභිසඞ්ඛාර** යයි කියනු ලැබේ.

යථොක්ත නයින්, පුණ්‍යාභිසඞ්ඛාර වශයෙන් තෙළෙසක්ද, අපුණ්‍යාභිසඞ්ඛාර වශයෙන් දොළොසක්ද, ආනෙඤ්ජාභි සඞ්ඛාර වශයෙන් සතරක්දැයි චේතනාවෝ එකුන් තිසක් (29) ක් වේ. මෙසේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රමාණාතික්‍රාන්තවූ සත්ත්වයන්ට උපදනාවූ කුසලාකුසල චේතනා තුමූ මහා තරාදියකින් කිරන්නක්හු මෙන්ද, නැළියක බනා මැන ගන්නක්හු මෙන්ද, සර්වඥතාඥානයෙන් පිරිසිඳ දැන එකුන් තිසක්ම දක්වා වදාළ සේක.

3. **කායසඞ්ඛාර**— ප්‍රමාණ රහිතවූ චක්‍රවාලයන්හි ප්‍රමාණ රහිතවූ සත්ත්වයෝ තුමූ කුසලාකුසල කර්ම රැස් කරන්නාහු යම් ද්වාර කෙනෙකුන් කාරණකොට ගෙන සකස් කෙරෙද්ද, ත්‍රිවිධවූ ඒ කර්මද්වාරයන් දක්වා වදාරන්නාවූ භාග්‍යවතුන්වහන්සේ **කාය සඞ්ඛාර, වචී සඞ්ඛාර, චිත්ත සඞ්ඛාරයන්** වදාළ සේක. ඔවුන් අතුරෙන් **කාය සඞ්ඛාර** නොහොත් **කාය සඤ්චේතනා** යනු කාය විඤ්ඤත්ති රූපය හටගන්වා, කායද්වාරය හෙතුකොට ගෙන ප්‍රවෘත්තවූ, අෂ්ට විධවූ කාමාවචර කුසල චේතනාවෝද, ද්වාදස විධවූ අකුසල

චේතනාවෝද යන මේ විසිවැදෑරුම්වූ චේතනාවෝයි, නොහොත් කායද්වාරයෙහි ඇද ගැනීමට, සම්ප්‍රයුක්තයාගේ ගැනීමට සෙලවීමට පමුණුවමින් උපන්නාවූ විසි වැදෑරුම් කුසලාකුසල චේතනාවෝයි.

5. **වචීසඞ්ඛාර** හෙවත් **වචීසඤ්චේතනා** යනු වාග් විඥප්ති රූපය හටගන්වා, වාග්ද්වාරය හේතුකොට ගෙන ප්‍රවෘත්ත වූ එම විසි වැදෑරුම්වූ චේතනාවෝයි නොහොත් වාග් ද්වාරයෙහි හනු සඤ්චලනයට, වාග් භේදයට පමුණුවමින් උපන්නාවූ විසි වැදෑරුම්වූ චේතනාවෝයි.

6. **චිත්තසඞ්ඛාර** හෙවත් **මනෝසඤ්චේතනා** වනාහි විප්‍රකාරවූ විඥප්ති රූපයක් නූපදවා, මනෝද්වාරයෙහි උපන්නාවූ සියළුම එකුන්තිස් වැදෑරුම්වූ චේතනාවෝයි.

**පුණ්‍යාභිසංස්කාරය**— කාය දුශ්චරිතයෙන් වෙන්වන පුද්ගලයා හට කිසි කලෙක්හි **කාය සංස්කාරද** වේ. වාග් දුශ්චරිතයෙන් වෙන්වන පුද්ගලයා හට කිසි කලෙක්හි **වචී සංස්කාරයද** වේ. එම් නයින්, කාමාවචරවූ අට වැදෑරුම් කුසල චේතනාවෝ, **පුණ්‍යාභිසංස්කාරයක්** වේ, **චිත්ත සංස්කාරයක්** වේ මනෝද්වාරයෙහි උපන්නාවූ ඒ තෙලෙස් කුසල චේතනාවෝ **පුණ්‍යාභිසංස්කාරයක්** වේ, **චිත්ත සංස්කාරයක්** වේ.

**අපුණ්‍යාභිසංස්කාරය**— කාය දුශ්චරිත වශයෙන් පවත්නා කල්හි කිසිකලෙක **කාය සංස්කාරය** වේ. වචී දුශ්චරිත වශයෙන් පවත්නා කල්හි කිසි කලෙක **වචී සංස්කාරද** වේ කාය වාග්ද්වාරයන් හැර මනෝද්වාරයෙහි පවත්නා කල්හි **චිත්තසංස්කාරය** වේ. මෙසේ **අපුණ්‍යාභිසංස්කාරය කායසංස්කාරත්** වේ, **වචීසංස්කාරත්** වේ, **චිත්තසංස්කාරත්** වේ

**කාය සංස්කාරය,** කිසි කලෙක **පුණ්‍යාභිසංස්කාරය** වේ කිසි කලෙක **අපුණ්‍යාභිසංස්කාරද** වේ නුමුත් **ආනෙඤ්ජාභි සංස්කාර** නොවේ.

**වචී සංස්කාරයද,** කිසි කලෙක **පුණ්‍යාභිසංස්කාරද** වේ, **අපුණ්‍යාභිසංස්කාරද** වේ, **ආනෙඤ්ජාභිසංස්කාර** නොවේ.

**චිත්ත සංස්කාරය,** කිසි කලෙක **පුණ්‍යාභිසංස්කාරය** වේ, කිසි කලෙක **අපුණ්‍යාභිසංස්කාරද** වේ, කිසි කලෙක **ආනෙඤ්ජාභිසංස්කාරද** වේ.

මේ කියන ලද සංස්කාරයෝ තුමූ අවිද්‍යා ප්‍රත්‍යයෙන් වන්නාවූ සංස්කාරයෝ නම්හුයි.

අවිද්‍යාවගේ වීම ඇති කල්හි නොහොත් අවිද්‍යාවගේ වීමෙන් සංස්කාරයන්ගේ වීම වේ.

යම් පුද්ගලයෙකු හට දුක්ඛාදීන්හි අවිද්‍යා සංඛ්‍යාතවූ අඥාන භාවය හෙවත් මූලාවීම ප්‍රහීණ නොවූයේද, ඒ පුද්ගල තෙම පළමුකොට **දුක්ඛ සත්‍යයෙහිද, අතීත ස්කන්ධ කොට්ඨාසාදීන්හිද අවිද්‍යාවෙන් හෙවත් මූලාවීමෙන්** සංසාර දුක්ඛය, සුඛය යන සංඥාවෙන් ගෙන, ඒ සංසාර දුක්ඛයාගේ කාරණභූතවූ ත්‍රිවිධ සංස්කාර ධර්මයන් රැස් කරන්නට පටන් ගනී. **සමුදය සත්‍යයෙහි මූලාවීම** හෙතුකොට ගෙන සංසාර දුක්ඛයාගේ කාරණභූතවූද, තෘෂ්ණාවගේ පිරිවරවූද, සංස්කාර ධර්මයන් සුඛයාගේ හෙතු වශයෙන් හඟිමින් රැස් කරන්නට පටන් ගනී **නිරොධ සත්‍යයෙහිද මාර්ග සත්‍යයෙහිද මූලාවීමෙන්** සංසාර දුක්ඛයාගේ අවිනාශ ස්වභාවවූද දෙව බ්‍රහ්මාදි ගති විෂයෙහි නිර්වාණය යන හැඟීම් ඇත්තේවී, නිරොධ සත්‍යයාගේද අනුපාය මාර්ගවූත්, යාඥවිධි, අමරතපස් ආදීන්හි, නිරොධ සත්‍යය සාක්ෂාත් කරණයට හෙතුවූ මාර්ගය යන සංඥා ඇත්තේවී, දුක්ඛ නිරොධ සංඛ්‍යාත

නිර්වාණය ප්‍රාර්ථනා කරමින් යාග විධාන අමරතපස් චරණාදී හෙතුවෙන් ත්‍රිවිධවූද සංස්කාර ධර්මයන් රැස්-කරන්නට පටන් ගනී. අමර තපස් නම් නිර්වාණය පිණිස යයි කියා ශරීර තැවීම් ආදිවූ දුෂ්කර ක්‍රියාවෝය. නොහොත් දෙවාත්මභාවය පිණිසවූ තපසය.

තවද, ඒ පුද්ගලතෙම ඒ සංසාර දුක්ඛය, සුඛය යයි ගත් සංඥා වශයෙන්, සතර සත්‍යයන්හි මාර්ගඥානයෙන් ප්‍රහීණ නොකළාවූ අවිද්‍යාව ඇති බැවින් අතිශයින් ජාති, ජරා, ව්‍යාධි, මරණාදී නානා ප්‍රකාර ආදීනවයෙන් සංකීර්ණවූ පුණ්‍ය ඵලය යයි කියනලද සංසාර දුක්ඛය දුක්ඛ වශයෙන් නොදන්නේව, ඒ සංසාර දුක්ඛය අයත්කර ගැනීම පිණිස කාය, වාග්, චිත්ත සංස්කාර භෙදය ඇති පුණ්‍යාභිසංස්කාරය රැස්කරන්නට පටන්ගනී. දිව්‍යාප්සරාවන් පතන පුද්ගල-යෙක් ඉන්ද්‍රකූටාදි පර්වතයකට නැඟීමට දුක් ගන්නාක් මෙනි. සුඛය යයි සම්මත කරණලද්දවූද, ඒ පුණ්‍ය ඵලයාගේ කෙළවර මහා තැවිලි උපදවන විපරිණාම දුක්ඛ ස්වභාවයද, සැප නැති බවද නොදක්නේවිනමුත් ඒ පුණ්‍ය ඵලයට හෙතුවූ පුණ්‍යාභිසංස්කාරයන් සකස්කරන්නට පටන්ගනී. පළගැටියෙක් පහන්සිලට වදින්නට පටන්ගන්නාක් මෙනි. මී බිඳෙහි ලොල්වූ පුද්ගලයෙක් මී වැකි කඩුමුවත ලෙවීමට පටන්ගන්නාක්මෙනි.

විපාක සහිතවූ කම්සැප බුත්නිවිදීම් ආදියෙහි ආදීනව නොදක්නා පුද්ගලතෙම සුඛය යන සංඥාවෙන්ද, කෙලෙසුන් විසින් මඩිනලද බැවිනද, තුන්දොර පැවැත්තාවූ අපුණ්‍යාභි-සංස්කාරය රැස්කරන්නට පටන්ගනී. ළදරුවෙක් අසූචි ගෙන කෙළීමට පටන්ගන්නාක් මෙනි. මැරෙනු කැමැති පුද්ගලයෙක් විස කෑමට පටන්ගන්නාක් මෙනි.

අරූපාවචර විපාකයන් හිත්, සංස්කාර දුක්ඛ, විපරිණාම දුක්ඛයන්ගේ ස්වභාවය නොවටහගන්නා පුද්ගලතෙම ශාස්වත උච්ඡේදදී වශයෙන් විපරීතග්‍රහණයෙන් චිත්ත සංස්කාරවූ **ආනෙඤ්ජාභිසංස්කාරය** රැස්කරන්නට පටන්ගනී. මංමුලාවූවෙක් යකුන් වසන පුරයට යොමුවූ මගට පිළිපැදීමට පටන්ගන්නාක් මෙනි.

යම්හෙයකින් අවිද්‍යාවගේ හේතුවෙන්ම සංස්කාරයන්ගේ ඇතිවීම වේද, අවිද්‍යා හේතුව නැති කල්හි සංස්කාරයෝ නොවෙත්. එහෙයින් සංස්කාරයෝ අවිද්‍යා ප්‍රත්‍යයෙන් වේ යයි කියන ලදී.

**අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වන ආකාරය.**

**අවිද්‍යාව, පුණ්‍යාභිසංස්කාරයන්ට** දෙපරිද්දෙකින් ප්‍රත්‍යය වේ එනම්:

1 **ආරම්මණ ප්‍රත්‍යය** වශයෙන් ප්‍රත්‍යය වීමද,

2. **උපනිශ්‍රය ප්‍රත්‍යය** වශයෙන් ප්‍රත්‍යය වීමද වේ.

1. **අවිද්‍යාව, ක්ෂය** වශයෙන්, **ව්‍යය** වශයෙන් සම්මර්ශනය කරන කල්හි **කාමාවචරවූ පුණ්‍යාභිසංස්කාරයන්ට ආරම්මණ ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වේ.

අභිඥා චිත්තයෙන් මෝහ සහිතවූ චිත්තය දන්නා කල්හි, රූපාවචරවූ පුණ්‍යාභිසංස්කාරයන්ට **ආරම්මණ ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වේ

2. අවිද්‍යාව ඉක්මවීම පිණිස දාන, සීලාදීවූ පුණ්‍ය ක්‍රියා වස්තූන් සම්පූර්ණ කරන්නා හටද, රූපාවචර ධ්‍යානයන් උපදවන්නා හටද, ඒ කාමාවචර, රූපාවචර පුණ්‍යාභිසංස්කාරයන්ට **උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වේ. මෝහයෙන් **මැඩියක්** මුළාවූ බැවින් **කාමභව**, රූපභව සම්පත්තීන් පතා එම **කාමාවචර පුණ්‍යාභිසංස්කාරයන්** කරන්නාහටද, **උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වේ.

**අවිද්‍යාව, අපුණ්‍යාභිසංස්කාරයන්ට** නොයෙක් පරිද්දෙන් ප්‍රත්‍යය වේ

1. අවිද්‍යාව අරමුණුකොට රාග, දිට්ඨි, විචිකිච්ඡා, උද්ධච්ච, දොමනස්සයන් උපදනා කල්හි **ආරම්මණ ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වේ.

2. ගරුකොට ආස්වාදය කරණ කල්හි **ආරම්මණාධිපති** සහ **ආරම්මණූපනිස්සය ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වේ.

3. අවිද්‍යාවෙන් සම්මූළ්හව ආදීනව නොදක්නාසීලිව ප්‍රාණඝාතාදීන් කරන්නාහට **උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වේ.

4. විතීය ජවනාදීන්ට **අනන්තර ප්‍රත්‍යය, සමනන්තර ප්‍රත්‍යය, අනන්තරොපනිශ්‍රය ප්‍රත්‍යය, ආසෙවන ප්‍රත්‍යය, නාස්ති ප්‍රත්‍යය, විගත ප්‍රත්‍යය** යනාදී වශයෙන් ප්‍රත්‍යය වේ

5. සියලු අකුසල් කරන්නාහට, **හෙතු ප්‍රත්‍යය, සහජාත ප්‍රත්‍යය, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය, නිශ්‍රය ප්‍රත්‍යය, සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය, අස්ති ප්‍රත්‍යය, අවිගත ප්‍රත්‍යය** යනාදි වශයෙන් ප්‍රත්‍යය වේ.

**අවිද්‍යාව, ආනෙඤ්ජාභිසංස්කාරයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්** ප්‍රත්‍යය වේ.

**අවිද්‍යා හේතුවෙන් සංස්කාරයන් වෙයයි කී කල්හි එක් හේතුවක් සහ එක් ඵලයක් දක්වා** ඇත. **මෙසේ දැක්වීමට කාරණ**ද **දතයුතු**.

1. **එක් හේතුවකින් මේ භවයෙහි හෝ මේ ප්‍රත්‍ය වීමෙහි කිසි එක් ඵලයෙක් නැත.**

2. **එක් හේතුවකින් නොයෙක් ඵලයකුදු** නැත.

3. නොයෙක් හේතුවලින් එක් ඵලයකුදු නැත.

4. **නොයෙක් හේතුවලින් වනාහි නොයෙක් ඵලයෙක්ම වේ.**

අනෙකවිධවූ ඍතු පෘථිවි, බීජ ජල සඞ්ඛ්‍යාත හේතුවලින් අනෙකවිධවූම රූප, ගන්ධ, රසාදීන් සමෘද්ධවූ අඞ්කුර යයි කියනලද ඵලයෙක් උපදනා බව දක්නා ලැබේ.

යම්බඳුවූ එක් එක් හේතු ඵලයෙකු දක්වීම භාග්‍යවතුන් වහන්සේ විසින් කර වදරන ලදද, ඒ එක් එක් හේතු ඵලයෙක් දක්වීමෙහි අර්ථයෙක් ද ඇත ප්‍රයෝජනයෙක්ද විද්‍යමාන වෙයි. භාග්‍යවතුන්වහන්සේ සමහර තැනෙක යම් කිසි ප්‍රයෝජනයක් **ප්‍රධාන බැවින්ද,** කිසි තැනෙක්හි **ප්‍රකට බැවින්ද,** කිසි තැනෙක්හි **අසාධාරණ බැවින්ද,** කිසි තැනෙක්හි **දෙශනා විලාසය** වශයෙන්ද, වෛනෙය ජනයන්ට සුදුසු පරිද්දෙන් එකම · හේතුවෙකු එකම ඵලයෙකු හෝ දක්වා වදාරණ සේක.

**ඵස්ස පච්චයා වේදනා** යයි කී තැන ඵස්සය තෙම වේදනාවගේ ප්‍රධාන හේතුව වේ. වේදනාව ඵස්සයාගේ ප්‍රධාන ඵලය වේ. **සෙම්හසමුට්ඨානා ආබාධා** යනාදී තන්හි **ප්‍රකට** එක් හේතුවක් දක්වා ඇත. **යෙකෙචි භික්ඛවෙ අකුසලා ධම්මා සබ්බෙ තෙ අයොනිසො මනසිකාර මූලකාති.** මහණෙනි! සියලු අකුසල ධර්ම කෙනෙක් ඇද්ද ඒ සියලු අකුසල ධර්මයෝ තුමූ අයොනිසො මනස්කාර සඞ්ඛ්‍යාත අකුසල ජවන සම්පාදක ආවර්ජනය මුල්කොට ඇතියහ. මේ ආදී තැන්හි **අසාධාරණ** බැවින් එක් හේතුවක්ම වදාළ සේක වස්තු ආලම්බනාදීහු **සාධාරණ** හේතුහු වෙති. එහෙයින් මේ **අවිද්‍යා** තොමෝ අවිද්‍යාව කෙරෙන් අන්‍යවූ වස්තු ආලම්බන සහජාත ධර්මයන් මුල්කොට ඇති සංස්කාරයන්ට කාරණා වුවත් විද්‍යමාන කල්හි සුඛාස්වාදයකැයි නැවත නැවත දක්නා කැමැතිවූ මූඪයා හට තෘෂ්ණාව වැඩෙයි. මෙසේ අවිද්‍යා සඞ්ඛ්‍යාත

හේතුවෙත් ආශ්‍රවයන්ගේ පහලවීම වේ. මෙසේද, අනිකුදු තෘෂ්ණාහා ආශ්‍රවාදීවූ සංස්කාරයන්ට කාරණා වූවන්ගේ හේතුව වේ. යථොක්ත නයින් **ප්‍රධාන බැවින්ද** අවිද්‍යාවෙන් සම්මූර්ඡිතවූ අන්ධබාලතෙම පුණ්‍යාභිසංස්කාරයන් සකස් කෙරෙයි යන තන්හි **ප්‍රකට බැවින්ද, අසාධාරණ බැවින්ද,** සංස්කාර ධර්මයන්ගේ හේතුව වශයෙන් ප්‍රකාශ කරණ ලදී. **සංඛාර පච්චයා** විඤ්ඤාණං යනාදීවූ සියලු පදයන්හි එක් එක් හෙතු ඵල කෙනෙකුන් ඇර දක්වීමෙහි ප්‍රයෝජනය මෙසේම දතයුතු.

ඒකාන්තයෙන්ම **අනිෂ්ට** ඵල ඇත්තාවූ, සාවද්‍යවූ අවිද්‍යාවගේ, පුණ්‍යාභිසංස්කාර, ආනෙඤ්ජාභිසංස්කාරයන්ට ප්‍රත්‍යය වන බව කෙසේ නම් සෙදෙයි ද.

යම් ප්‍රත්‍යුත්පන්න ධර්ම කෙනෙකුන්ට **විරුද්ධවූත්, අවිරුද්ධවූත්, සදෘශවූත්, අසදෘශවූත්** ප්‍රත්‍යය වීම ප්‍රකටය. ධර්මයන්ට **ස්ථාන, ස්වභාව, කෘත්‍යයාදි** වශයෙන් විරොධවූද, අවිරොධවූද ප්‍රත්‍යය වීම ප්‍රකටය. පළමු පැවති සිත පසුව පවත්නා සිතට ස්ථාන භාවයෙන් හෙවත් විද්‍යමානත්වයෙන් විරුද්ධවූයේ තමුදු ප්‍රත්‍යය වෙයි. පළමු පුහුණු කළ ශිල්පාදීහුද, පසුව පවත්නාවූ ශිල්පාදීවූ ක්‍රියාවන්ටද, නාමය තෙම රූපයටද, ස්වභාවයෙන් විරුද්ධවූයේ තමුදු ප්‍රත්‍යය වෙයි. ක්ෂීරාදීහු දධි ආදීන්ටද, ආලෝකය තෙම චක්ෂුර් විඥානයටද, කෘත්‍යයෙන් විරුද්ධවූයේ තමුදු ප්‍රත්‍යය වෙයි. චක්ෂුස් රූපාදීහු චක්ෂුර්විඥානාදීන්ටද ස්ථාන අවිරුද්ධ භාවයෙන් හෙවත් විද්‍යමානත්වයෙන් අවිරුද්ධ වූවාහු ප්‍රත්‍යය වෙත්. පූර්වවූ ජවනාදීහු පසුව ජවනාදීන්ට ස්වභාව වශයෙන්ද අවිරුද්ධ වූවාහු. කෘත්‍යයෙන්ද අවිරුද්ධ වූවාහු ප්‍රත්‍යයයෝ වෙත්. විරුද්ධ අවිරුද්ධ ප්‍රත්‍යයයෝ සිද්ධවූවාක් මෙන් සදෘශ, අසදෘශවූ ප්‍රත්‍යයයෝද සිද්ධය සමානවූම යුතු, ආහාර සඞ්ඛ්‍යාතවූ රූපය තෙම රූපයට ප්‍රත්‍යය වේ. මෙය සමාන භාවයෙන් ප්‍රත්‍යය වීමයි. අසමානවූද රූපය තෙම නාමයටත්, නාමය තෙම රූපයටත්

Free Distribution www.aathaapi.org

අසමාන වශයෙන් ප්‍රත්‍යය වේ. ගවලොම්, රතු එළු ලොම්හු දුර්වාතම්ලද වදකහ හෙළු හීතණයන්ගේ උත්පත්ති යට ප්‍රත්‍යය වේ දධි, තල, පිටි ආදීහු භූසනාණ නම් ලද ඖෂධ විෂයයාගේ උත්පත්තියට ප්‍රත්‍යය වේ. මෙය අසමාන භාවයෙන් ප්‍රත්‍යය වීමයි.

යම් ප්‍රත්‍යොත්පන්න ධර්ම කෙනෙකුන්ට යම් ප්‍රත්‍යය ධර්ම කෙනෙක් විරුද්ධ, අවිරුද්ධ වූවෝව, සමාන, අසමාන වූවෝව ප්‍රත්‍යය වූවාහුද, ඒ ප්‍රත්‍යොත්පන්න ධර්මයෝ තුමූ ඒ ප්‍රත්‍යය ධර්මයන්ගේ විපාකයෝම නොවෙද්ද, එහෙයින් මේ අවිද්‍යා තොමෝ ප්‍රධානවූ විපාක ගෙනදීම් වශයෙන්ද, නියතයෙන්ම අනිටුවූ අකුසල විපාක සවභාවයාගේ ශක්ති වශයෙන්ද සාවද්‍යවූවා නමුදු, සියළුම පුණ්‍යාභිසංස්කාරාදීන්ට සුදුසු පරිද්දෙන් ස්ථාන, සවභාව, කෘත්‍ය වශයෙනුදු, විරුද්ධ අවිරුද්ධ ප්‍රත්‍යය වශයෙනුදු, සමාන අසමාන ප්‍රත්‍යය වශයෙනුදු ප්‍රත්‍යය වේමැයි.

යම් පුද්ගලයෙක් චුති ප්‍රතිසන්ධියෙහිත්, සකන්ධ ආයතන ධාතූන්ගේ පිළිවෙල නොසිඳ පැවැත්ම යයි කියනලද සංසාර වෘත්තයෙහිත්, සංසකාර ධර්මයන්ගේ ලක්ෂණයෙහිත්, ප්‍රතීත්‍යසමුත්පන්න ධර්ම හෙවත් ඵල ධර්මයන්හිත් නොහොත් අවිද්‍යාදීවූ පටිච්චසමුප්පාද ධර්ම, ජරා මරණාදීවූ පටිච්ච සමුප්පන්න ධර්ම සඞ්ඛ්‍යාත හේතුඵල ධර්මයෙහිත් වෙසෙසින් මූළාවේද, ඒ පුද්ගල තෙමේ ත්‍රිවිධවූ ඒ සංසකාරයන් යම් හෙයකින් සකස් කෙරේද, එහෙසින් මේ අවිද්‍යා තොමෝ ත්‍රිවිධවූ ද ඒ සංසකාරයන්ට ප්‍රත්‍යය වේ.

චුති ප්‍රතිසන්ධි ආදී ධර්මයන්හි මූළා වීමෙන් ත්‍රිවිධ සංසකාරයන් රැස්කිරීම මෙසේ දතයුතු.

චුතියෙහි පළමුකොට වෙසෙසින් මූළාවූ පුද්ගලතෙම, සියළුම භව, යොනි, ගති, විඥානස්ථිති, සත්වාවාසයන්හි සකන්ධයන්ගේ එක් අත්බැවෙක අවසන්වන බිඳීම මරණ නම්. මෙපරිද්දෙන් චුතිය නොගෙන සත්ත්ව තෙමේ මැරෙයි.

සත්ත්වයාගේ දෙශාන්තරයට සංක්‍රමණය නොහොත් ආත්මය තෙමේ පණ හැර ආය ආත්මයාගේ අන් සිරුරකට වැදීමය යනාදී මිථ්‍යා මත කල්පනාකොට ගනී.

ප්‍රතිසන්ධියෙහි වෙසෙසින් මුළාවූ පුද්ගලතෙම, සියළු භවයන්හි ස්කන්ධයන්ගේ පහළවීම ජාති නම්. මෙපරිද්දෙන් ප්‍රතිසන්ධිය නොගෙන සත්ත්ව තෙමේ නොහොත් ආත්ම තෙමේ උපදී. සත්ත්වයාගේ නොහොත් ආත්මයාගේ අභිනව ශරීරයෙක්හි පහළවීම වේ මේ ආදී වශයෙන් මිථ්‍යා මතයන් කල්පනාකොට ගනී.

සසරෙහි වෙසෙසින් මුළාවූ පුද්ගලතෙම ස්කන්ධයන්ගේද ධාතු ආයතනයන්ගේද නොසිඳ පවත්නාවූ පරිපාටි තොමෝ සසර යයි නොගෙන මේ සත්ත්ව තෙමේ, මේ ආත්ම තෙමේ මෙලොවින් පරලොවට යේ, පරලොවින් මෙලොවට එයි යනාදී වශයෙන් මිථ්‍යා මතයන් කල්පනාකොට ගනී.

සංස්කාර ධර්මයන්ගේ ලක්ෂණයෙහි වෙසෙසින් මුළාවූ පුද්ගලතෙමේ සංස්කාර ධර්මයන්ගේ නමන රූප්පනාදීවූ ද කර්කශ ස්පර්ශනාදීවූද, තමතමන් සතුවූ ලක්ෂණයද, අනිත්‍යාදීවූ සමාන ලක්ෂණයද, නොගෙන සංස්කාර ධර්මයන් ආත්ම වශයෙන්ද, ආත්මීය හෙවත් ආත්මසන්තක වස්තු වශයෙන්ද කල්පනාකොට ගනී

පටිච්චසමුප්පාද ධර්ම පටිච්චසමුප්පන්න ධර්මයන්හි වෙසෙසින් මුළාවූ පුද්ගල තෙම අවිද්‍යාදී ප්‍රත්‍යය ශක්තියෙන් සංස්කාරාදී ඵල ධර්මයන්ගේ ප්‍රවෘත්තිය නොගෙන ආත්මය තෙම දනී, හෝ නොදනී, ඒ ආත්මය තෙම තමාද කරන්නේයි, මෙරමාද කරවන්නේයි, ඒ ආත්මය තෙම ප්‍රතිසන්ධික්ෂණයෙහි උපදී, ඒ ආත්මයාගේ අණු පරමෙශ්වරාදී හේතුහු කලල රූපාදී භාවයෙන් සිරුර පිහිටුවත්, චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ සපයත් ඒ ආත්මය නම් ලද සත්ත්වතෙම චක්ෂුරාදී ඉන්ද්‍රියයන් හා සමන්විත වූයේව ආලම්බන ස්පර්ශ

කෙරෙහි ආලම්බනයන්හි ඇලෙයි. අලම්බන වූවත් දුසි කොට ගනී අනතුරු ආත්මභාවය හා ගළපයි. ඒ ආත්ම භාවය තෙම නැවත අන්‍ය භවයෙක්හි වේ මෙපරිද්දෙන් සියළු සත්ත්වයෝ තුමූ නියත ගති ඇතියහ. නිෂ්කාරණොත් පත්තිය ඇතියහ. ස්වභාවයෙන්ද නානාප්‍රකාර භාවයට පැමිණියහ. මෙපරිද්දෙන් වරදවා කල්පනා කෙරෙයි. මෙසේ අවිද්‍යාව විසින් නුවණැස ඇඳිරි කළාවූ ඒ බාල ජන තෙමේ වරදවා කල්පනා කරන්නේය. අන්ධ මිනිසෙක් පොළෝතලයෙහි ඔබිමොබ හැසිරෙන්නේ නිසි මගටත් නොමගටත්, ගොඩැල්ලටත්, වළ තැනටත්, සමතලව්වටත්, නොසමතලව්වටත් පිළිපදනේද එමෙන්ම පුණ්‍යාභිසංස්කාරයන්ද, අපුණ්‍යාභිසංස්කාරයන්ද, ආනෙඤ්ජාභිසංස්කාරයන්ද අවිද්‍යාවම ප්‍රත්‍යය කොටගෙන සකස් කෙරෙයි.

තමන් රැක බලා මගට පමුණුවන්නෙකු නැති උත්පත්තියෙන්ම අන්ධවූ මිනිසෙක් කිසිවිටෙක නිසි මගින්ද, කිසිවිටෙක නොනිසි මගින්ද පිළිපදනේ යම්සේද, එමෙන්ම අභීත් ඵල සඞ්ඛ්‍යාත මාර්ගය මොනවට පිළිවෙල කර දෙන්නාවූ කල්‍යාණ මිත්‍රයෙකු රහිතවූ අඥාන ජනතෙමේ සසරෙහි සැරිසරන්නේ කිසිකලෙක පුණ්‍යාභිසංස්කාරයන් රැස් කෙරෙයි. කිසිකලෙක අපුණ්‍යාභිසංස්කාරයන් රැස් කෙරෙයි. ඒ අඥානතෙම යම් කලෙක ධර්මය දැන නිර්වාණ ධර්මය මාර්ගඥානයෙන් පසක් කොට සත්‍යයයන් අවබොධ කරන්නේද එකල්හි අවිද්‍යාවගේ සංසිඳීම් හේතුවෙන් කෙලෙස් විඩා සන්හුන්ව හැසිරෙන්නේයි.

## සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං

කළාවූ කුසලාකුසල කර්මයන් හෙතුකොටගෙන කර්ම විපාක වශයෙන් දෙතිස් විඤ්ඤාණයෝ ලැබෙත්නාහ. ඒ දෙතිස් විඤ්ඤාණයෝ නම්:

| | | | |
|---|---|---|---|
| 1. | **චක්ඛු විඤ්ඤාණ** - | කුසල විපාක චක්ඛු විඤ්ඤාණ | 2 |
| | | අකුසල විපාක චක්ඛු විඤ්ඤාණ | |
| 2. | **සෝත විඤ්ඤාණ** - | කුසල විපාක සෝත විඤ්ඤාණ | 2 |
| | | අකුසල විපාක සෝතවිඤ්ඤාණ | |
| 3. | **ඝාණ විඤ්ඤාණ** - | කුසල විපාක ඝාණ විඤ්ඤාණ | 2 |
| | | අකුසල විපාක ඝාණ විඤ්ඤාණ | |
| 4. | **ජිව්හා විඤ්ඤාණ** - | කුසල විපාක ජිව්හා විඤ්ඤාණ | 2 |
| | | අකුසල විපාක ජිව්හා විඤ්ඤාණ | |
| 5. | **කාය විඤ්ඤාණ** - | කුසල විපාක කාය විඤ්ඤාණ | 2 |
| | | අකුසල විපාක කාය විඤ්ඤාණ | |
| 6. | **මනෝ විඤ්ඤාණ** - | කුසල විපාක මනෝ ධාතු | 2 |
| | | අකුසල විපාක මනෝ ධාතු | |
| | | අහෙතුක මනෝ විඤ්ඤාණ ධාතු (සන්තීරණත්‍රිකය) | 3 |
| | | අෂ්ටවිධ කාමාවචර සහෙතුක විපාක | 8 |
| | | පඤ්චවිධ රූපාවචර විපාක | - 5 |
| | | චතුර්විධ අරූපාවචර විපාක | - 4 |
| | | | 32 |

මේ දෙතිස් විපාකයෝ ලෞකික විපාක විඤ්ඤාණයෝයි. ලෝකෝත්තර විපාක (ඵල) චිත්තයෝ සංසාරවෘත්ත කථායෙහි නොයෙදෙන හෙයින් මෙහිදී නොගත්නාලද බව දතයුතු.

Free Distribution www.aathaapi.org

**පුණ්‍යාභිසංස්කාර, අපුණ්‍යාභිසංස්කාර, ආනෙඤ්ජා-භිසංස්කාර** යන ත්‍රිවිධ සංස්කාරයන් අතුරෙන් **කාමාවචර පුණ්‍යාභිසංස්කාර** ප්‍රත්‍යයෙන් වන්නාවූ විපාක විඤ්ඤාණයෝ සොළොසෙකි. එනම්:

**කුසල විපාක චක්ඛු විඤ්ඤාණාදි පඤ්චවිඤ්ඤාණයෝය** 5
**කුසල විපාක සම්පටිච්ඡන නම්වූ මනොධාතුවය** 1
**කුසල විපාක සොම්නස් සන්තීරණ සහිතවූ උභය මනොවිඤ්ඤාණ ධාතුවය** 2
**අෂ්ටවිධ කාමාවචර මහා විපාකයෝය** 8

16

**රූපාවචර පුණ්‍යාභිසංස්කාර ප්‍රත්‍යයෙන්** වන්නාවූ විපාක විඤ්ඤාණයෝ පසෙකි එනම්: රූපාවචර විපාක සිත් පසය.

මෙසේ පුණ්‍යාභිසංස්කාර ප්‍රත්‍යයෙන් එක්විසි විපාක විඤ්ඤාණයන් ලැබෙත්.

**අපුණ්‍යාභිසංස්කාර ප්‍රත්‍යයෙන්** වන්නාවූ විපාක විඤ්ඤාණයෝ සත්දෙනෙකි. එනම්:

**අකුසල විපාක චක්ඛු විඤ්ඤාණාදි වූ** පඤ්චවිධ විඤ්ඤාණයෝය 5
**අකුසල විපාක සම්පටිච්ඡන** නම්වූ මනො ධාතුවය 1
**අකුසල විපාක සන්තීරණ** මනො විඤ්ඤාණ ධාතුවය 1

7

**ආනෙඤ්ජාභිසංස්කාර ප්‍රත්‍යයෙන්** වන්නාවූ විපාක විඤ්ඤාණයෝ සතරෙකි. එනම්: චතුර්විධ අරූප විපාක විඤ්ඤාණයෝ යි.

සියලුම **විපාක විඥානයෝ**

1. **ප්‍රවෘත්ති විපාක විඥානයෝ ය.**
2. **ප්‍රතිසන්ධි විපාක විඥානයෝය සි** විධ වේ.

1. ඒ විපාක විඥානයන් අතුරෙන්

| | |
|---|---|
| ද්විපඤ්චවිඥානයෝය | 10 |
| ද්විධ විපාක මනොධාතු (සම්පටිච්ඡන 2) | 2 |
| සොම්නස් අහෙතුක මනොවිඥාණ ධාතු (සොම්නස් සන්තීරණය) | 1 |
| | 13 |

යන තෙළෙස් විපාක විඥානයෝ පඤ්චවොකාර භවයෙහි ප්‍රවෘත්තික්ෂණයෙහිම පවතිත්, හෙවත් ප්‍රවෘත්ති විපාක වශයෙන් ලැබෙත්.

ඉතිරි එකුන්විසි (19) විපාක විඥානයෝ ත්‍රිවිධභව-යන්හි ඒ ඒ භවයන්හි උපදනා පුද්ගලයන්ට සුදුසු පරිද්දෙන් ප්‍රවෘත්තික්ෂණයෙහිද පටිසන්ධික්ෂණයෙහිද පවතිත්.

**කුසල විපාකවූ චක්ෂුර්විඥානාදිවූ** පස්දෙන, කුසල විපාකයකින් හෝ අකුසල විපාකයකින් හෝ පිළිසිඳ ගත්තාවූ පිළිවෙලින් මිහිකිරිමට පැමිණි ඉදුරන් ඇති, සත්ත්වයාගේ චක්ෂුරාදීන්ට හමුවූ ඉෂ්ටාලම්බනවූ හෝ ඉෂ්ට මධ්‍යස්ථාලම්බන වූ හෝ රූපාලම්බනාදීවූ ආලම්බනයක් අරමුණු කොට චක්ෂුරාදි ප්‍රසාද රූපයක් ඇසුරුකොට ගෙන දර්ශන කෘත්‍යය, ශ්‍රවණ කෘත්‍යය, ආඝ්‍රාණ කෘත්‍යය, ආස්වාදන කෘත්‍යය, ස්පර්ශන කෘත්‍යය සිදුකරන්නෝව පවතිත්.

**අකුසල විපාකවූ චක්ෂුර්විඥානාදීවූ** පස්දෙනද එපරිද්දෙන්ම චක්ෂුරාදීන්ට හමුවූ අනිෂ්ටාලම්බනවූ රූපා-ලම්බනාදිවූ ආලම්බනයක් අරමුණු කොට පවතිත්.

දසවිධවූ මේ විපඤ්චවිඥානයෝ නියතවූ වාරාලම්බන වස්තුස්ථානයන් හා නියතවූ කෘත්‍යය ඇත්තාහුම වෙත්.

විපඤ්චව විඤ්ඤාණයන් ඉපිද නිරුද්ධවූ ඉක්බිති ඒ දසවිධ විඤ්ඤාණයන් අතුරෙන් කුසල විපාකවූ චක්ෂුර් විඤ්ඤාණාදීන්ට අනතුරුව කුසල විපාක මනොධාතු හෙවත් කුසල විපාක සම්පටිච්ඡනය ඒ කුසල විපාකවූ පඤ්චව විඤ්ඤාණයන්ගේම ආලම්බනය අරමුණුකොට, හෘදයවස්තු රූපය ඇසුරුකොට සම්පටිච්ඡන කෘත්‍යය හෙවත් අරමුණ පිළිගැනීම් කිස සාදන්නීව පවතී.

අකුසල විපාකවූ පඤ්චව විඤ්ඤාණයන්ගේ අනතුරුව වූ අකුසල විපාක මනො ධාතු හෙවත් අකුසල විපාක සම්පටිච්ඡනයද එපරිද්දෙන්ම පවතී.

මේ සම්පටිච්ඡනචය වනාහි අනියතවූ වාරාලම්බන ඇත්තේද, නියතවූ වස්තුස්ථාන ඇත්තේද, නියතවූ කෘත්‍ය ඇත්තේද වේ.

**සොමනස්ස අහේතුක මනො විඤ්ඤාණ ධාතුව** හෙවත් සොමනස්ස සන්තීරණය, කුසල විපාක මනොධාතුව නම් ලද කුසල විපාක සම්පටිච්ඡන චිත්තයාගේ නිරොධයට ඉක්බිති, ඒ කුසල විපාක මනොධාතුවගේම අරමුණ අරමුණු කොට, හදයවස්තුව ඇසුරුකොට, සන්තීරණ කෘත්‍යය සාදමින් ද, ෂඩාරම්මණයන්හි බලවත් ආලම්බනයෙහි කාමාවචර සත්ත්වයනට බෙහෙවින් ලොභ සම්ප්‍රයුක්ත ජවනයන්ගේ අන්තයෙහි භවාඞ්ග වීථිය පසිඳ, ජවනයා විසින් ගත් අරමුණෙහි එල්බ තදාලම්බන කෘත්‍යය වශයෙන් දෙවරක් ද පවති.

**ඉතිරි විපාක විඤ්ඤාණයන්** අතුරෙන් කිසි විපාක විඤ්ඤාණයෙක් තමහට සුදුසුවූ ප්‍රතිසන්ධියෙහි නොහොත් සුදුසුවූ ප්‍රතිසන්ධි කෘත්‍ය වශයෙන් නොපවත්නේ නොවෙයි. පවත්නේමය.

ප්‍රවෘත්ති කාලයෙහි වනාහි පළමුකොට කුසලාකුසල විපාක සන්තීරණ නම් ලද ත්‍රිප්‍රකාරවූ අහේතුක මනොවිඤ්ඤාණ ධාතුහු, පඤ්චද්වාරයෙහි කුසල විපාක අකුසල

විපාක සම්පටිච්ඡන චිත්තයන්ට අනතුරුව **සන්තීරණ කෘත්‍යය ද,** ෂඩ්ද්වාරයන්හි පූර්වයෙහි කීනයින්ම **තදාලම්බන කෘත්‍යය ද,** තමා විසින් දෙනලද ප්‍රතිසන්ධි විපාකයෙන් මත්තෙහි භවාඞ්ග සන්තතිය සිඳපියන්නාවූ වීථි චිත්තොත්පාදයක්හු අවිද්‍යමාන කල්හි **භවාඞ්ග කෘත්‍යය ද,** අවසානයෙහි **චුති කෘත්‍යය ද,** යන මේ චතුර්විධ කෘත්‍යයන් සාදමින් නියත **වස්තු** ඇත්තෝව අනියතවූ ආලම්බන ස්ථාන කෘත්‍ය **ඇත්තෝව** පවතිත්.

**අෂ්ටවිධ කාමාවචර විපාක සිත්හු,** ප්‍රවෘත්ති කාලයෙහි කීනයින්ම ෂඩ්ද්වාරයන්හි **තදාලම්බන කෘත්‍යය ද,** තමතමා විසින් දෙනලද ප්‍රතිසන්ධි විපාකයෙන් මත්තෙහි භවාඞ්ග සන්තතිය සිඳපියන්නාවූ වීථි චිත්තොත්පාදයක්හු අවිද්‍යමාන කල්හි **භවාඞ්ග කෘත්‍යය ද,** අවසානයෙහි **චුති කෘත්‍යය ද,** යන මේ ත්‍රිවිධ කෘත්‍යයන් සාදමින් නියත වස්තු ඇත්තෝව අනියතවූ ආලම්බන ස්ථාන කෘත්‍යය ඇත්තෝව පවතිත්.

**පඤ්චවිධ රූපාවචර විපාක සිත්හුද චතුර්විධ අරූප විපාක සිත්හුද** තම තමා විසින් දෙනලද ප්‍රතිසන්ධිවිපාකයෙන් මත්තෙහි භවාඞ්ග සන්තතිය සිඳපියන්නාවූ වීථි චිත්තොත්පාදයක්හු අවිද්‍යමාන කල්හි **භවාඞ්ග කෘත්‍යයද** අවසානයෙහි **චුති කෘත්‍යයද** යන මේ කෘත්‍යය දෙක සාදමින් පවතිත්. ඔවුන් අතුරෙන් **රූපාවචර විපාක සිත්හු,** නියතවූ වස්තු ආලම්බන ඇත්තාහු, අනියතවූ ස්ථාන කෘත්‍යය ඇත්තාහු වෙත්. **අරූපාවචර විපාක සිත්හු,** අවස්තුකවූවාහු. නියතවූ ආලම්බන ඇත්තාහු. අනියත ස්ථාන කෘත්‍යය ඇත්තාහුව පවතිත්.

යථොක්ත නයින් පළමුකොට දෙතිස් වැදෑරුම් වූ ද, විපාක විඥානය තෙම ප්‍රවෘත්ති කාලයෙහි සංස්කාර ප්‍රත්‍ය ශක්තියෙන් පවතී. ඒ ප්‍රවෘත්තියෙහි, ඒ දෙතිස් වැදෑරුම්වූ විපාක විඥානයට පුණ්‍යාභිසංස්කාරාදීවූ ඒ ඒ සංස්කාරයෝ තුමූ **නානා ක්ෂණික කර්ම ප්‍රත්‍යය වශයෙන්ද** ප්‍රත්‍යය වේ.

ඒ දෙතිස් විපාක **විඤ්ඤාණයන්** අතුරෙන් යම් එකොළොස් තදාලම්බන චිත්ත කෙනෙක් දක්වන ලදද ඒ එකොළොස් තදාලම්බන චිත්තයන් අතුරෙන් එක් තදාලම්බනයකුදු රූපාරූප භවයෙහි තදාලම්බන කෘත්‍යවත්ව නොපවතී **කාමාවචර ප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත බීජයක්හු අවිද්‍යමාන හෙයිනි.**

ඒ තදාලම්බන චිත්තය, නියමයෙන් රූපාරූප භවයෙහි යම්සේ නොපවතීද, එසේම සියලුම කාමාවචර ධර්මයන් කෙරෙන් අන්‍යවූ මහද්ගත ලොකොත්තර ධර්මයන් අනුව නොපවතී ජනක නොවන බැවින්ද, රූපාරූප භවයන්හි ප්‍රතිසන්ධිය දනවන්නාවූ ජනක කර්මයාගේ කාමාවචර ජවන සඞ්ඛ්‍යාත තදාලම්බන විපාක ජනක කර්මය හා නොසම වන බැවින්ද වේ. ගෙයින් නික්ම බැහැර යනු කැමැත්තාවූ ළදරුවෙකු, තමා ඉපදවූ පියහුගේ හෝ අන්‍යවූ පියහු වැනි වූ හිත කැමැත්තාවූ නෑයෙකුගේ හෝ ඇඟිල්ල ගෙන කැටිව යන මෙන් අන්‍යවූ රාජපුරුෂාදී අයකු ලුහුනොබඳනාහු මෙන්, එසේ මේ තදාලම්බන චිත්තයද භවඞ්ග චිත්තයාගේ ආලම්බනය කෙරෙන් බැහැර නික්ම යනු කැමැත්තේ, තමා හා කාමාවචර භවයෙහි සමානභාග වන බැවින් තමා දනවන්නාවූ පියා වූ හෝ පියා වැනි වූ හෝ කාමාවචර ජවනයම අනුව පවතී. අන්‍යවූ මහද්ගත ජවනයකු හෝ ලොකොත්තර ජවනයකු හෝ අනුව නොපවතී.

තදාලම්බනය, මහද්ගත ලොකොත්තර ධර්මයන් අනුව නොපවතිත මෙන්, කාමාවචර ධර්මයෝද, මහද්ගත ආලම්බන ඇත්තෝව නොපවතිත් තමන් පුරුදු නොකළ මහද්ගත ලොකොත්තර දෙශය වන බැවින්ද ඒකාන්තයෙන් පරිත්තාලම්බන වූ කාමාවචර ධර්මයන් අරමුණුකොට ඇති බැවින් ද අනුව නොපවතී.

තදාලම්බනය පියකු හෝ පියා වැනි වූ නෑයෙකු හෝ ලුහුබඳනේ නමුදු, ළදරු තෙමේ ගේ මිදුල්, අසලමග සතර මංසන්ධි යනාදී වූ පුරුදු කළ පියෙස්හිම ලුහුබඳන මෙන්,

Free Distribution www.aathaapi.org

වනයකට හෝ සංග්‍රාම භූමියකට හෝ යන්නාවූ පියා හෝ පියා වැනි වූ ඥාතියෙකු හෝ ලුහු නොබඳනාක් මෙන් කාමාවචර ධර්මයන් අනුව පවත්නේ වී නමුදු මහද්ගත ලෝකෝත්තර ධර්මයන් කෙරෙන් අන්‍ය වූ පුරුදුකළාවූම විෂය සන්තානයෙහි පවත්නාවූ කාමාවචර ධර්මයන් අනුව පවතී. මහද්ගත ලෝකෝත්තර ධර්මයන් අරමුණුකොට ඇත්තා වූ කාමාවචර ධර්මයන් අනුව නොපවතී.

මෙසේ මේ එකොළොස් තදාලම්බන සිත්හු

1. නම්ගොත් අරමුණුකොට කාමාවචර ජවනයා පැවති කල්හි තදාලම්බනය නොගනිත්.

2 ප්‍රඥප්තිය අරමුණුකොට කාමාවචර ජවනයා ප්‍රවෘත්තවූ කල්හි තදාලම්බනය නොලැබේ.

3. අනිත්‍යාදි ත්‍රිලක්‍ෂණයන් අරමුණුකොට ඇති විදර්ශනාවෙහි තදාලම්බනය නොලැබේ.

4. ව්‍යුත්ථානගාමිණී නම් වූ බලවත් විදර්ශනාවෙහි තදාලම්බනය නොලැබේ.

5. රූපාවචර අරූපාවචර ධර්මයන් අරමුණුකොට කාමාවචර ජවනයා ප්‍රවෘත්තවූ කල්හි තදාලම්බනය නොලැබේ.

6. මිච්ඡත්ත නියත ධර්මයන්හි තදාලම්බනය නොලැබේ.

7. සම්මත්ත නියත ධර්මයන්හි තදාලම්බනය නොලැබේ.

8. ලෝකෝත්තර ධර්මයන් අරමුණුකොට කාමාවචර ජවනයා ප්‍රවෘත්තවූ කල්හි තදාලම්බනය නොලැබේ.

9. පඤ්චාභිඥා ඥාණය අරමුණුකොට කාමාවචර ජවනයා ප්‍රවෘත්තවූ කල්හි තදාලම්බනය නොලැබේ.

10. පටිසම්භිදා ඥාණය අරමුණුකොට කාමාවචර ජවනයා ප්‍රවෘත්තවූ කල්හි තදාලම්බනය නොලැබේ.

Free Distribution www.aathaapi.org

11. කාමාවචරවූ දුබ්බලාරම්මණය හෙවත් මහන්තාරම්මණ, පරිත්තාරම්මණ, අතිපරිත්තාරම්මණයෙහි තදාලම්බනය නොලැබේ.

**ෂඩ්ද්වාරයන්හි බලවත්වූ ආලම්බනයක්හු හමුවූ කල්හි තදාලම්බනය ලැබේ.** එනම් : අතිමහන්ත විභූතාලම්බනයක් හමුවූ කල්හි තදාලම්බනය ලැබේ. එසේ ලැබෙන්නේ වී නමුදු කාමාවචර භූමියෙහිම ලැබේ රූපාරූප භවයන්හි තදාලම්බනයක් නැත.

2. **ප්‍රතිසන්ධි විපාක විඥ්ඤාණය.**

අසංඥසත්ත ප්‍රතිසන්ධිය හා සමග **ප්‍රතිසන්ධිහු** විස්සෙක් (20) වෙති. **ප්‍රතිසන්ධි චිත්තයෝ** එකුන් විස්සෙකි (19) කි

**අකුසල විපාක අහේතුක මනෝ විඥ්ඤාණ ධාතුව** හෙවත් උපෙක්ඛාසහගත සන්තීරණ අකුසල විපාක චිත්තය, සතර **අපාය** දුගතීන්හි ප්‍රතිසන්ධිතොම වේ.

**කුසල විපාක අහේතුක මනෝ විඥ්ඤාණ ධාතුව** හෙවත් **උපෙක්ඛා** සහගත **සන්තීරණ** කුසල විපාක චිත්තය මිනිස් ලෙව්හි **ජාතිඅන්ධය, ජාති බධිරය, ජාති උම්මත්තකය, එළමූග,** (බිහිරි ඇසීම් දෙක්හි අසමත් බව) **නපුංසකය** යනාදී **සත්ත්වයන්**ගේ ප්‍රතිසන්ධිය වේ.

**අෂ්ටවිධවූ සහේතුක** මහා **විපාක** සිත්වලින් ෂට් කාමාවචර දෙව්ලෙව්හිද, මනුෂ්‍ය ලෝකයන්හිද පිනැත්තවුන්ගේ ප්‍රතිසන්ධිය වේ.

**පඤ්චවිධවූ රූපාවචර විපාක සිත්වලින්** රූපාවචර බ්‍රහ්ම ලෝකයෙහි ප්‍රතිසන්ධිය වේ.

**චතුර්විධ අරූපාවචර විපාක සිත්වලින්** අරූපාවචර බ්‍රහ්මලෝකයෙහි ප්‍රතිසන්ධිය වේ.

මෙසේ යම් ප්‍රතිසන්ධි චිත්තයකින් යම් භූමියෙක්හි ප්‍රතිසන්ධිය වේද, ඒ ප්‍රතිසන්ධි තොමෝම ඒ භූමියට යොග්‍යවූ ප්‍රතිසන්ධි නම් වේ.

සැකෙවින් ප්‍රතිසන්ධියගේ **කම්ම, කම්ම නිමිති,** ගති **නිමිති** යයි ත්‍රිවිධ වූ ආලම්බනයෙක් ඇත.

**කර්මය** නම්, සකස් කළාවූ කුසලාකුසල චෙතනාවෝයි.

**කම්ම නිමිත්ත.** යම් වස්තුවක් අරමුණුකොට සකස් කෙරේද, ඒ වස්තුව **කම්ම නිමිත්ත** නමි.

ඒ **කම්ම කම්ම නිමිත්ත** යන් අතුරෙහි අතීතවූ කල්ප කොටි ශත සහශ්‍රයෙකින් මත්තෙහිදු කර්මයක්හු සකස් කළ කල්හි, ඒ පිළිසිඳ ගන්නා කෙණෙහි කර්මය හෝ කර්ම නිමිත්ත හෝ පැමිණ එළඹ සිටී. ඉදිරියෙන් යන්නාවූ පුරුෂයෙකුගේ හිස, පිටුපසින් අවුත් තියුණු වූ කඩුපතෙකින් සිඳිද්ද, වැද හෙව නිදන්නාවූ පුරුෂයාගේ හිස තියුණු වූ කඩුපතෙකින් සිඳිද්ද, ජලයෙහි ගිල්වා මරද්ද, මෙබඳු වූ කාලසන්හිද එක්තරා කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ එළඹ සිටි. බිම කණින යවුල් දඬු මත්තෙහි වසා සිටි මැස්සකු මුගුරෙන් පහරා සුණු කෙරෙද්ද, මෙබඳුවූ කල්හිත් කර්මය හෝ කර්ම නිමිත්ත හෝ එළඹ සිටී. මෙ පරිද්දෙන් සුණු කරනු ලබන්නාවූ මැස්සාගේ වනාහි පළමුකොට කායද්වාරයෙහි ප්‍රවෘත්තවූ චිත්ත වීථියෙන් මරණය සිදුනොවේ. දෙවන චිත්ත වීථියත් ඉක්ම තුන්වන වර උපදනා චිත්ත වීථියෙන් මරණය සිදුවේ.

**ගතිනිමිත්ත** - මතු උපදින්නාවූ භවයෙහි එක් වර්ණ සංස්ථානයක් වැටහේද, එය ගති නිමිත්ත නමි. එසින් **නිරය භූමිය** වැටහෙන කල්හි ලොහොකුඹු නිරය හා සමාන වූයේව වැටහේ. **මිනිස් ලොව** වැටහෙන කල්හි මව් කුස, කම්බල වස්ත්‍රයෙන් සැරසූ යානයක් හා සමානව වැටහේ. **දෙව්ලොව** වැටහෙන කල්හි දිව්‍ය කප්රුක්, විමන්, යහන් ඈ අරමුණු වැටහෙත්.

තවද, ප්‍රතිසන්ධියගේ ආලම්බනයෝ තිදෙනෙක් වෙති

එනම්: 1. **අතීතාලම්බනය**

2. **පච්චුප්පන්නාලම්බනය**

3. **නවත්තබ්බාලම්බනය** (ප්‍රඥප්ති අරමුණ)

**අසංඥසත්වතල වාසීන්ගේ** ප්‍රතිසන්ධි තොම අනාරම්මණය හෙවත් අරමුණු රහිතය.

ත්‍රිවිධ ප්‍රතිසන්ධීන් අතුරෙන්

**විඤ්ඤාණඤ්චායතන**

**නෙවසඤ්ඤානාසඤ්ඤායතන**

යන ප්‍රතිසන්ධීන්ගේ අරමුණ අතීතාලම්බනම වේ.

**දසවිධ කාමාවචර** ප්‍රතිසන්ධීන්ගේ අරමුණ අතීතාලම්බන හෝ පච්චුප්පන්නාලම්බනයෝ යි.

**සෙසු** ප්‍රතිසන්ධීන්ගේ අරමුණ නවත්තබ්බාලම්බන හෙවත් ප්‍රඥප්ත්‍යාලම්බන යයි.

1 **අතීත වූ ආලම්බන ඇති චුති චිත්තයාගේ අනතුරුව වූ අතීතාලම්බන ඇති ප්‍රතිසන්ධිය.** කාමාවචර සුගතියෙහි සිටියාවූ, පාපකර්ම ඇත්තාවූ, ඒ පුද්ගලයා හට ඒ පාපකර්මයෝ මරණාසන්න කාලයෙහි නැඹුරු වෙත්. මරණ මඤ්චකයෙහි වැදහොත්තාවූ පුද්ගලයා හට යම් පරිද්දෙකින් සකස්කළාවූ පාපකර්මයෙක් හෝ කර්මනිමිත්ත යෙක් හෝ මනොවාරයෙහි හමුබවට පැමිණේද, ඒ කර්ම කර්මනිමිත්තය අරභයා උපන්නාවූ, තදාලම්බනයන් අවසන් කොට ඇති වීථි චිත්තයාගේ හෝ ශුද්ධවූ හෙවත් තදාලම්බනයන් හා අසම්මිශ්‍රවූ ජවන වීථියගේ හෝ ඉක්බිති භවඞ්ග චිත්තයාගේ ආලම්බනය අරමුණුකොට චුති චිත්තය උපදී ඒ චුතිචිත්තය නිරුද්ධවූ කල්හි හමුවූ හෙවත් අරමුණු බවට පැමිණියාවූ ඒ කර්මය හෝ කර්ම නිමිත්ත හෝ අරමුණුකොට, මාර්ගයෙන් ප්‍රහීණ නොකළාවූ කෙලශයන්ගේ බලයෙන් භවාන්තරයෙහි නැඹුරු කරන

ලද්දවූ දුගති භවයෙහි අනාගතවූ ප්‍රතිසන්ධි චිත්තය උපදී. මෙය අතීතාලම්බන ඇති චුති චිත්තයාගේ අනතුරුව වූ අතීතාලම්බන ඇති ප්‍රතිසන්ධිය වේ.

2. **අතීතාලම්බන ඇති චුතියගේ අනතුරුව වූ ප්‍රත්‍යුත්පන්නාලම්බන ඇති ප්‍රතිසන්ධිය.** අන් පුද්ගලයෙකු හට මරණාසන්න කාලයෙහි කියනලද ප්‍රකාර ඇති කර්මයාගේ වශයෙන් නිරයාදීන්හි නිරය ගිනිජාලාදීවූ දුර්ගති නිමිත්තෙක් මනොවාරයෙහි හමුවීමට පැමිණේද, ඒ පුද්ගලයාහට දෙවරක් භවාඞ්ග චිත්තය ඉපිද නිරුද්ධවූ කල්හි ඒ අරමුණම අරමුණු කොට එකළාවූ මනොවාරාවර්ජනයද, මරණයාගේ ලංවීමෙන් මදව පැවති වේගය ඇති බැවින් ජවන් සිත් පසක්ද, තදාලම්බන සිත් දෙකක්දැයි මෙසේ ත්‍රිවිධවූ විථි සිත් උපදිත්. ඒ විථි චිත්තයන්ට ඉක්බිති භවඞ්ග චිත්තයාගේ අරමුණ අරමුණුකොට එකළාවූ චුති චිත්තය උපදී මෙසේ පැවති එකොළොස් චිත්තක්ෂණයන්ට අනතුරුව ඉතිරිවූ චිත්තක්ෂණ පසකට ආයු ඇති හෙයින් මරණාසන්න ජවන් සිත් විසින් ගන්නාලද ඒ අරමුණෙහිම ප්‍රතිසන්ධි චිත්තයද එයට අනතුරුව භවඞ්ග සිත්ද පහළවේ. මේ ප්‍රතිසන්ධි තොමෝ අතීතාලම්බන ඇති චුතියගේ අනතුරුව වූ ප්‍රත්‍යුත්පන්නාලම්බන ඇති ප්‍රතිසන්ධිය වේ.

3. අනික් පුද්ගලයෙකු හට මරණාසන්න කාලයෙහි පඤ්චවිධවූ වාරයන් අතුරෙන් එක්තරා වාරයකින් රාගාදීන්ගේ කාරණාවූ ළාමකවූ අරමුණක් හමුවූ කල්හි, ඒ පුද්ගලයාගේ පිළිවෙල නොයික්ම උපන් වොට්ඨපන චිත්තයාගේ අනන්තයෙහි මරණයාගේ ලංවීමෙන් මදව පැවති වේගය ඇති බැවින් ජවන් සිත් පසක්ද, තදාලම්බන දෙකක්ද උපදිත්. ඒ වීථි චිත්තයන්ට ඉක්බිත්ව භවාඞ්ගයාගේ ආලම්බනය අරමුණුකොට එකළාවූ චුති චිත්තය උපදී. මෙසේ භවාඞ්ග සිත් 2 ක්ද, පඤ්චවාරාවර්ජනයද. චක්ෂුර්විඥනාදියෙන් එක් විඥනයක්ද, සම්පටිච්ඡනයද,

සන්තීරණයද, වොට්ඨපනයද, ජවන් 5 ද, තදාරම්මණ 2 කද, චුති චිත්තයද යන පසළොසක් සිත්හු ඉක්මගොස් අනතුරුව ඉතිරිවූ එක් චිත්තක්ෂණයට ආයු ඇති, මරණාසන්න ජවන් විසින් ගත්තාලද අරමුණම ගෙන ප්‍රතිසන්ධි චිත්තය උපදී. මේ ප්‍රතිසන්ධි තොමෝද **අතීතාලම්බන ඇති චුතියගේ අනතුරුව වූ ප්‍රත්‍යුත්පන්නාලම්බන ඇති ප්‍රතිසන්ධිය** වේ.

මේ කියන ලද්දේ **අතීතාලම්බන ඇති සුගති චුතියගේ අනතුරුව වූ අතීත ප්‍රත්‍යුත්පන්නාලම්බන ඇති දුගති ප්‍රතිසන්ධියගේ පවත්නා පරිදිය.**

4 දුර්ගතියෙහි සිටියාවූ මරණාසන්න කාලයෙහි, සකස් කළාවූ නිරවද්‍ය කර්ම ඇති සත්ත්වයාහට ඒ නිරවද්‍ය කර්මය හෝ කර්ම නිමිත්ත හෝ මනොද්වාරයෙහි අරමුණු බවට පැමිණේ. ඒ කර්ම කර්මනිමිති අරභයා උපන්නාවූ චිත්ත වීථියේ චුති චිත්තය නිරුද්ධවූ කල්හි සුගති භවයෙහි අනන්තරවූ ප්‍රතිසන්ධි චිත්තය උපදී.

මෙසේ **අතීතාලම්බන ඇති, දුගති චුතියෙන් අනතුරුව වූ අතීත ප්‍රත්‍යුත්පන්නාලම්බන ඇති සුගති ප්‍රතිසන්ධියගේ පවත්නා පරිදි** දතයුතු.

අතීත භවයෙහි හෝ ඒ පුරුෂ පුද්ගලයා විසින් දුක් විඳීමට කරුණුවූ යම් පාපකර්මයක් කරන ලදද, ඒ පාපකර්මයද, ප්‍රත්‍යුත්පන්න භවයෙහි හෝ ඒ පුරුෂ පුද්ගලයා විසින් යම් පාපකර්මයක් කරනලද නම් ඒ පාප කර්මයද, මරණාසන්න ජවන කාලයෙහි හෝ ඒ පුරුෂ පුද්ගලයා විසින් යම් මිථ්‍යා දෘෂ්ටියක් සම්පූර්ණ කරනලදු නම්, සමාදන්වන ලදු නම්, ඒ මිථ්‍යා දෘෂ්ටියද යන ත්‍රිවිධ පාප කර්මයෙන් ඒ පුද්ගල තෙම කායයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි අපාය දුර්ගති විනිපාතවූ නිරයෙහි උපදනේය.

5. සුගතියෙහි සිටියාවූ සකස් කළ කුසල ධර්ම ඇත්තාවූ, මරණ මඤ්චකයෙහි වැදහොත් පුද්ගලයාහට යම් යම් පරිද්දෙන් සකස්කළාවූ කුසල කර්මයෙක් හෝ කර්ම නිමිත්තයෙක් හෝ මනෝද්වාරයෙහි හමුවීමට පැමිණේ. ඒ අනවද්‍ය කර්ම කර්මනිමිත්තයන්ගේ හමුවීමද, සකස්කළ කුසලකර්ම ඇත්තාහටමය.

සකස්කළ මහද්ගත කුසලකර්ම ඇති පුද්ගලයාහට වනාහි කර්මනිමිත්තයම හමුවීමට පැමිණේ.

ඒ කර්ම කර්මනිමිත්ත අරභයා උපන්නාවූ තදාලම්බනයන් අවසන් කොට ඇත්තාවූ හෝ තදාලම්බනයෙන් අසම්මිශ්‍රවූ හෝ ජවන් වීථියගේ අනතුරුව වූ, භවාඞ්ග චිත්තයාගේ ආලම්බනය අරමුණුකොට චුති චිත්තය උපදනේය. ඒ චුති චිත්තය නිරුද්ධවූ කල්හි, හමුවූ ඒ කර්මය හෝ කර්ම නිමිත්තය හෝ අරමුණු කොට, මාර්ගයෙන් නුසුන්කළ කෙලෙස් බලයෙන් නැඹුරු කළාවූ, සුගති භවයෙහි අන්තර්ගතවූ ප්‍රතිසන්ධි චිත්තය උපදනේය **මේ ප්‍රතිසන්ධි තොමෝ අතීතාලම්බන ඇත්තාවූ චුතියගේ අනතුරුවවූ අතීතාලම්බන ඇත්තාවූ හෝ නවත්තබ්බාලම්බන ඇත්තාවූ හෝ ප්‍රතිසන්ධි තොමෝයි.**

6. අනික් පුද්ගලයෙකුහට මරණාසන්න කාලයෙහි කාමාවචර කුසල කර්මයාගේ වශයෙන් මනුෂ්‍ය ලෝකයෙහි මාතෘකුක්ෂිවර්ණ සඞ්ඛ්‍යාතවූ හෝ සුගති නිමිත්තයෙක් මනොද්වාරයෙහි හමුවීමට පැමිණේ. ඒ පුද්ගලයාහට දුර්ගති නිමිත්තයෙහි දක්වූ පිළිවෙළින්ම චුති චිත්තයට අනතුරුව ප්‍රතිසන්ධි චිත්තය උපදී **මේ ප්‍රතිසන්ධි තොමෝ අතීතාලම්බන ඇති චුතියගේ අනතුරුවවූ ප්‍රත්‍යුත්පන්නාලම්බන ඇති පටිසන්ධි නම්.**

7. අනික් පුද්ගලයෙකුහට මරණාසන්න කාලයෙහි නෑයෝ ඉදිරිපත්ව, දරුව තාගේ ප්‍රයෝජනය පිණිස මේ බුද්ධ පූජාව කරුණු ලැබේ, සිත පහදව, මෙසේ

පුෂ්පදම, ධජ, පතාකාදීන්ගේ වශයෙන් රූපාලම්බන යෙකු හෝ ධර්ම ශ්‍රවණ, තූර්ය පූජාදි වශයෙන් ශබ්දාලම්බන යෙකු හෝ, ධූම සුගන්ධාදීන්ගේ වශයෙන් ගන්ධාලම්බන යෙකු හෝ, පුත මේ රසය ආස්වාදනය කරව තාගේ ප්‍රයෝජනය පිණිස දියයුතුවූ දනවස්තුවෙක. මෙසේ කියා මීපැණි යනාදීන්ගේ වශයෙන් රසාලම්බනයෙකු හෝ, මේ ස්පර්ශය ස්පර්ශ කරව. තාගේ ප්‍රයෝජනය පිණිස දියයුතු වූ දනවස්තුවෙක. මෙසේ බැණ අගනා පටපිළි ආදීන්ගේ වශයෙන් ස්පර්ශාලම්බනයෙකු හෝ චක්ෂුරාදී පඤ්චද්වාරයෙහි එළවත්. ඒ පුද්ගලයාහට හමුවූ ඒ රූපාදී ආලම්බනයෙහි, පිළිවෙල නොයික්ම උපන් වොට්ඨපන යාගේ අවසානයෙහි මරණයාගේ ළංවීමෙන් මදවූ වේගය ඇති බැවින් ජවන් පස් දෙනෙක්ද, තදාලම්බන සිත් 2 ක්ද උපදිත්. ඉක්බිති භවඞ්ගයාගේ ආලම්බනය අරමුණු කොට එකළාවූ චුති චිත්තයද, ඒ චුති චිත්තයාගේ අනන්ත යෙහි ඒ ආලම්බනයෙහි ප්‍රතිසන්ධිය උපදී. **මේ ප්‍රතිසන්ධිය ද අතීතාලම්බන ඇති චුතියගේ අනතුරුව වූ ප්‍රත්‍යුත් පන්නාලම්බන ඇති ප්‍රතිසන්ධි** නමි.

8. අතික් පුද්ගලයෙකු හට වනාහි පඨවිකසිණ ධ්‍යානාදීන්ගේ වශයෙන් ලබන ලද මහද්ගත ධ්‍යාන ඇත්තා වූ සුගතියෙහි සිටි හෙයින් මරණාසන්න කාලයෙහි කාමාවචර කුසලකර්ම, කර්මනිමිත්ත, ගති නිමිත්තයන් අතුරෙන් එක්තරා නිමිත්තයෙක් හෝ පඨවි කසිණාදි වූ කර්ම නිමිත්තයෙක් හෝ මහග්ගත චිත්තයෙක් හෝ මනොද්වාරයෙහි හමුවීමට පැමිණේ. චක්ෂුද්වාර සොත ද්වාරයන් අතුරෙන් හෝ එක්තරා ද්වාරයෙක්හි කුසලොත්පත්තියට හේතු වූ උතුම් වූ අරමුණෙක් හමුවීමට පැමිණේ. ඒ පුද්ගලයාහට පිළිවෙල නොයික්මවා උපන් වොට්ඨපන චිත්තයාගේ අවශානයෙහි මරණයාගේ ළංවීමෙන් මද වූ වේගය ඇති බැවින් ජවන් සිත් පසක් උපදිත්. මහද්ගත භූමියෙහි සිටිනා සත්තට වනාහි හෙවත් බ්‍රහමලොකයෙන් චුත-වන පුද්ගලයා හට තදාලම්බනයෙක් නැත. එහෙයින්

ජවනයන්ට අනතුරුවම භවාඞ්ගයාගේ ආලම්බනය අරමුණු කොට එකල්හිවූ චුති චිත්තය උපදී. ඒ චුති චිත්තයාගේ අනන්තරයෙහි කාමාවචර මහද්ගත සුගතීන් අතුරෙන් එක්තරා සුගතියක ඇතුළත්වූ ස්වකීය කර්මානුරූපව එළඹ සිටියාවූ ආලම්බනයන් අතුරෙන් එක්තරා අරමුණක් ඇති ප්‍රතිසන්ධි චිත්තය උපදී. **මේ ප්‍රතිසන්ධිය නවත්තබ්බාලම්බන ඇති සුගති චුතියගේ අනතුරුව වූ අතීත, ප්‍රත්‍යුත්පන්න, නවත්තබ්බාලම්බනයන් අතුරෙන් එක්තරා ආලම්බනයක් ඇති ප්‍රතිසන්ධි** නමි.

9. මෙකී නයානුසාරයෙන් අරූප චුතියගේද අනතුරුව වූ ප්‍රතිසන්ධියද දත යුත්තීය. මෙකී නය, **අතීත නවත්තබ්බාලම්බන ඇති සුගති චුතියගේ අනතුරුවවූ අතීත, නවත්තබ්බ, ප්‍රත්‍යුත්පන්නාලම්බන ඇති ප්‍රතිසන්ධියගේ පවත්නා පරිදිය.**

10. දුගතියෙහි සිටියා වූ, පාපකර්ම ඇත්තා වූ පුද්ගලයාහට වහාම යටකී නයින්ම ඒ පාපකර්මය හෝ කර්ම නිමිත්ත හෝ ගතිනිමිත්ත හෝ මනොද්වාරයෙහි හමුවීමට පැමිණේ. පඤ්චද්වාරයෙහි වහාම අකුසලොත්පත්තියට, හේතු වූ අරමුණක් හමුවීමට පැමිණේ. ඉක්බිති ඒ පුද්ගලයාගේ යටකී පිළිවෙල නොසික්ම චුති චිත්තයාගේ අනන්තරයෙහි දුර්ගතිභවයෙහි ඇතුළත් වූ ඒ ආලම්බනයන් අතුරෙන් එක්තරා ආලම්බනයක් ඇති ප්‍රතිසන්ධි චිත්තය උපදී. **මේ ප්‍රතිසන්ධිය අතීතාලම්බන ඇති දුගති චුතියගේ අනතුරුව වූ අතීතපච්චුප්පන්නාලම්බන ඇති පටිසන්ධිය** වේ.

මෙකී නයින් එකුන්විසි (19) වැදෑරුම් වූ විපාක විඥානයාගේ ප්‍රතිසන්ධි වශයෙන් ප්‍රවෘත්තිය දක්වන ලද්දේ වේ.

1. මෙහි **අතීතාලම්බනවත් සුගති චුතීහු එකොළොස් දෙනෙකි**. එනම්:

**නවවිධ කාමාවචර සුගති චුතීහුය.**

**මිඩවූ විඤ්ඤාණඤ්චායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන චුති හු ය.**

2. **නවත්තබ්බාලම්බනවත් සුගති චුතිහු සත් දෙනෙකි.** එනම්:

**ආකාසානඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන චුතිහු දෙදෙනාය, පඤ්චවිධ රූපාවචර චුතිහුය.**

තවද, අරූපාවචර චුතියට අනතුරුව රූපාවචර ප්‍රතිසන්ධියක් නැත.

අරූප තලයෙහිදු යට යට අරූපතල ප්‍රතිසන්ධියක් නැත.

සතර අරූප චුතියෙන් නවත්තබ්බාලම්බනවත් ප්‍රතිසන්ධියක් නැත.

සතර ආරූප්‍ය චුතියෙන් පරව ඒ සතර ආරූප්‍යයෙහිම අතීතාලම්බනවත් වූ ප්‍රතිසන්ධියත්, සතර ආරූප්‍ය චුතියෙන් පරව කාමාවචර භූමියෙහි අතීත, ප්‍රත්‍යුත්පන්නාලම්බනවත් වූ ප්‍රතිසන්ධියත් ලැබේ.

**ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණයට,** ජනක කර්මය තෙම නානාක්ෂණික කර්ම ප්‍රත්‍ය ශක්ති වශයෙන්ද, උපනිශ්‍රය ප්‍රත්‍ය ශක්ති වශයෙන්ද ප්‍රත්‍යය වීම වේ.

**ප්‍රතිසන්ධි විඤ්ඤාණයාගේ එකවිධාදි භෙදය—**

මේ විපාක විඤ්ඤාණය තෙම ප්‍රතිසන්ධි දෘත වශයෙන් **එක්** පරිච්ඡෙදකින් පවත්තේවී නමුදු, රූපය හා සමග මිශ්‍ර අමිශ්‍ර භෙද වශයෙන් විධ වේ.

කාමභව, රූපභව, අරූප භවයන්ගේ භෙද වශයෙන් ත්‍රිවිධ වේ.

අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඖපපාතික යොනි වශයෙන් චතුස්ප්‍රකාර වේ.

නිරය, ප්‍රේත, තිරශ්චීන, දෙව, මනුෂ්‍ය ගති වශයෙන් පඤ්චප්‍රකාර වේ.

විඤ්ඤාණස්ථිති වශයෙන් සප්තවිධ වේ.

තවද, නිශ්‍රය ප්‍රත්‍යයවූ රූපය හා මිශ්‍රවූ ප්‍රතිසන්ධි විඤ්ඤාණය තෙම

1. භාවරූප සහිත ප්‍රතිසන්ධි විඤ්ඤාණය

2. භාවරූප රහිත ප්‍රතිසන්ධි විඤ්ඤාණය යන භෙද වශයෙන් ද්විධ වේ.

**එයින් භාවරූප සහිත ප්‍රතිසන්ධි විඤ්ඤාණය**

1 **ස්ත්‍රීභාව**

2 **පුරුෂභාව** වශයෙන් ද්විධ වේ.

**මිශ්‍රාමිශ්‍ර භෙදයෙහි** වනාහි පළමු **දක්වූ** රූප මිශ්‍ර ප්‍රතිසන්ධි විඥනය හා සමග යටත් පිරිසෙයින් දශක දෙදෙනෙක් හෝ දශක තිදෙනෙක් හෝ වෙත්.

අරූප භවය හැර **කාම, රූප** භවයන්හි රූපය හා මිශ්‍රවූ ප්‍රතිසන්ධි විඥනය, රූප භවයෙහි ස්ත්‍රී පුරුෂ භාව රූපයෙන් තොරව උපදී. කාම සුගති භවයෙහි ජාති නපුංසක ප්‍රතිසන්ධිය හැර භාවරූපය හා සමග උපදී.

**නරකයෙහිද,** භූමාට දෙවියන් හැර **දෙව ගතියෙහිද,** අණ්ඩජ, ජලාබුජ, සංසේදජ වශයෙන් යොනීහු නොවෙත්.

**මනුෂ්‍ය, ප්‍රෙත, තිරශ්චීන** සඞ්ඛ්‍යාතවූ ත්‍රිවිධ ගතීන්හි අණ්ඩජ ආදීවූ ත්‍රිවිධවූම යොනිහු වෙත්.

**නිජ්ඣාමතණ්හික ප්‍රේතයෝ** ඕපපාතිකම වෙත්.

රූපී බ්‍රහමයන් කෙරෙහි පටිසන්ධි විඥනය හා සමග චක්ඛු දසක, සොතදසක, වත්ථුදසක, ජීවිත නවක යන කර්මජ රූපයෝ පහළ වෙත්.

සංසේදජ යෝනියෙහිද, රූපී බ්‍රහ්මයන් හැර අනිකුත් ඕපපාතික යෝනීන්හිද උඩත් පිරිසෙයින් චක්ඛු. සෝත, ඝාණ, ජිව්හා, කාය, වත්ථු, භාව දසක වශයෙන් සැත්තෑවක් (70) රූපයෝද, යටත් පිරිසෙයින් ජිව්හා, කාය, වත්ථු දශක වශයෙන් තිසක්වූ කර්මජ රූපයෝද පහළ වෙත්.

**චුති ප්‍රතිසන්ධීන්ගේ භෙද, අභෙද විශෙෂය** - අනතුරුව ඉක්මගිය චුතියගේද, ඊට අනතුරුවූ මිශ්‍රාමිශ්‍ර භෙදය ඇති ප්‍රතිසන්ධියගේද, **ස්කන්ධ, ආලම්බන, ගති, හෙතු, වෙදනා, ප්‍රීති, විතර්ක, විචාර** යන්ගේ වශයෙන් ඔවුනොවුන් සමවන බැව් **අභෙද නම්.** ඔවුනොවුන් හා නොසමවන බැව් **භෙද නම්.**

**අරූප භූමියෙහි,** චතුස්කන්ධයක් ඇති අරූප චුතියගේ අනතුරුවවූ චතුස්කන්ධයක් ඇත්තාවූ, අරමුණු වශයෙන් නොවෙනස්වූ ප්‍රතිසන්ධියක්ද වේ. මෙය අරූතලයෙන් සැව අරූතලයෙහිම පිළිසිඳ ගැනීමය.

කිසිකලෙක මහද්ගත නොවූ බහිද්ධාලම්බන සඞ්ඛ්‍යාතවූ ප්‍රඥප්තිය අරමුණුකොට ඇති චුතියගේ අනතුරුව මහද්ගතවූ අධ්‍යාත්මාලම්බනය අරමුණු කොට ඇති ප්‍රතිසන්ධියක්ද වේ. මෙය ප්‍රථම අරූප භූමියෙන් සැව විඤ්ඤාණඤ්චායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහිද, ආකිඤ්චඤ්ඤායතන භූමියෙන් සැව නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහිද පිළිසිඳ ගැනීමය.

කිසි කලෙක සතර ස්කන්ධයක් ඇති අරූප චුතියට අනතුරුව පංචස්කන්ධයක් ඇති කාමාවචරවූ ප්‍රතිසන්ධියක්ද වේ.

කිසිකලෙක පඤ්චස්කන්ධයක් ඇති කාමාවචර චුතියගේ හෝ රූපාවචර චුතියගේ හෝ අනතුරුව සතර ස්කන්ධයක් ඇති අරූපාවචර ප්‍රතිසන්ධියක්ද වේ.

මෙකී නයින් අතීතාලම්බනය ඇති චුතියගේ අනතුරුව අතීතාලම්බන, නවත්තබ්බාලම්බන ප්‍රත්‍යුත්පන්නාලම්බන ඇති ප්‍රතිසන්ධිය වේ.

ඇතැම් කාම සුගතියක්හුගේ අනතුරුව ඇතැම් දුගති ප්‍රතිසන්ධිය වේ.

අහේතුක චුතියගේ අනතුරුව සහෙතුක ප්‍රතිසන්ධියක්ද වේ.

අහේතුක චුතියගේ අනතුරුව ත්‍රිහෙතුක ප්‍රතිසන්ධියක්ද වේ.

උපෙක්ඛාසහගත චුතියගේ අනතුරුව සොම්නස් සහගත ප්‍රතිසන්ධියක්ද වේ.

අප්‍රීතික චුතියගේ අනතුරුව සප්‍රීතික ප්‍රතිසන්ධියක්ද වේ.

අවිතර්‍ක චුතියගේ අනතුරුව සවිතර්‍ක ප්‍රතිසන්ධියක්දවේ.

අවිචාර චුතියගේ අනතුරුව සවිචාර ප්‍රතිසන්ධියක්ද වේ.

අවිතර්‍ක අවිචාර චුතියගේ අනතුරුව සවිතර්‍කක සවිචාර ප්‍රතිසන්ධියක්ද වේ.

ඒ චුතිප්‍රතිසන්ධි විඥානයෝ තුමූ පළමු අත්බැවෙන් පැසුළු අත්බැවට නික්ම එද්ද? පූර්‍ව හේතු ආදීන් තොරව පිහිටද්ද? යන මේ ප්‍රශ්නයන්ට පිළිතුරු දතයුතු.

පරමාර්‍ථ වශයෙන් සත්ත්වයෙක් නැත. ජීව සඞ්ඛ්‍යාත ආත්මයෙක්ද නැත. ඒ විඥනය, ලබනලද අවිද්‍යාදී ප්‍රත්‍ය ශක්ති ඇත්තේව උපදී. නාමරූප ධර්‍ම මාත්‍රයක්ම අන්‍ය භවයෙක්හි පිහිටයි. ඒ විඥනයාගේ ඉකුත්වනිය අත්බැවෙන් මේ අත්බැව්හි සැරීමකුදු නැත්තේය. පූර්‍වභව යෙන් භවාන්තරයට වදනා බවෙක්ද නොවේ. ඒ ඉකුත්ව ගිය අත්බැව්හි අවිද්‍යා සංස්කාරාදී හෙතුවක් නැතිව මේ අත්බැව්හි පහළවීමකුදු නැත්තේය.

ඉකුත්ව ගිය අත්බැව්හි ස්වභාවයෙන් හෝ තමාගේ උපක්‍රමයෙන් හෝ, මෙරමාගේ උපක්‍රමයෙන් හෝ ඉතා ළංවූ මරණය ඇති, නොඉවසිය හැකි සියළු අඞ්ග ප්‍රත්‍යඞ්ග යන් සම්බන්ධවූ සන්ධින්ගේ ඝටනස්ථානයෝ සිඳපියන්නාවූ මරණයම අවසන්කොට පවත්නා මරණ වේදනාවන්ගෙන් පීඩිතවූ සිරුර, අව්වෙහි බහාලූ අමු තල්කොළයක් මෙන් ක්‍රමයෙන් වියළෙන කල්හි, චක්ෂුරාදීවූ ඉන්ද්‍රියයන් නිරුද්ධව ගිය කල්හි, වැඩියෙන් බෙලහීන බවට ගිය කල්හි, කායෙන්ද්‍රිය, මනෙන්ද්‍රිය, ජීවිතෙන්ද්‍රියයන් හදයවත් පම-ණෙක්හි පිහිටි කල්හි එකෙනෙහි ඉතිරිවූ හදවත ඇසුරු කළාවූ විඥානය තෙම, **මාතෘඝාතාදී ගරුකර්මය**, නැවත නැවත අසෙවනය කරණලද **ආචීර්ණ කර්මය**, මරණාසන්න කාලයෙහි කරණලද **ආසන්න කර්මය**, පූර්වභවයන්හි කරණලද **අපරාපර්‍ය්‍යවේද්‍ය කර්මය** යන මොවුන් අතුරෙන් එක්තරාවූද, ලබනලද අවශෙෂ **අභිද්‍යාදි වූ ද**, විඥානයට ප්‍රත්‍ය ශක්ති ඇති **සංස්කාර** යයි කියනලද **කුසලාකුසල කර්මය** හෝ කුසලාකුසල කර්මය විසින් එළවූ **කර්ම නිමිති, ගති නිමිති** සඞ්ඛ්‍යාතවූ අරමුණ හෝ අරමුණු කොට පවතී.

මෙසේ පවත්නාවූ ඒ විඥානය තෙම, තෘෂ්ණා අවිද්‍යාවන් මාර්ගඥානයෙන් ප්‍රහීණ නොකළ බැවින්, අවිද්‍යාව විසින් මුවාකළ දෙස් ඇති ඒ අරමුණෙහි, තෘෂ්ණාතොමෝ නැමී පවතී. මරණාසන්නවූ ජවන් සිත් සමග උපන් චේතනා ස්පර්ශාදිවූ සහජාත සංස්කාරයෝ තුමූ ඒ අරමුණෙහි ප්‍රතිසන්ධි විඥානය බහන්නවුන්මෙන් පවතී. ඒ ප්‍රතිසන්ධි විඥානය තෙම චුති ප්‍රතිසන්ධි තදාසන්න විඥානයන්ගේ පෙළගැසීම් වශයෙන් තෘෂ්ණාව විසින් නමනු ලබන්නේව, මරණාසන්න ජවන විඥානයන් හා සහජාතවූ සංස්කාරයන් විසින් බහනු ලබන්නේව, මෙගොඩ ඉවුර සිටි රුක බැඳී රැහැන ආධාර කොටගෙන ඇල ඉක්මවා යන්නාවූ පුරුෂ-යෙක්හු මෙන්, පළමු භවයෙහිවූ නිශ්‍රය රූපයද හැර, අන්‍යවූ කර්මය විසින් එළවන ලද නිශ්‍රයවූ වස්තුරූපයද ආස්වාදය

කරමින් හෝ නොකරමින් හෝ, ආලම්බන ප්‍රත්‍යය මුල්කොට ඇති ප්‍රත්‍යශක්තීන් හෙවත් ආලම්බන සම්ප්‍රයුක්ත කර්මප්‍රත්‍යාදීන් හේතුකොටගෙනම පවතී.

මෙසින් පළමු වූ සිත, මේ ආත්මභාවයෙන් චුත කරවන හෙයින් **චුති චිත්තය** වේ. පැසුළු සිත අන්‍ය ආත්මභාවයක් හුගේ පූර්වාවධිය ගළපන හෙයින් **ප්‍රතිසන්ධි චිත්තය** නමැයි කියනු ලැබේ. ඒ ප්‍රතිසන්ධි විඥානය තෙම පළමු පැවති අත්බැවේත් මේ හමුවූ අත්බැව්හි නොආයේ යි. ඒ පළමු පැවති අත්බැව්හි, ප්‍රතිසන්ධි ජනක කර්මය, මරණාසන්න ජවන් සිත් සහවගිය සංස්කාර තෘෂ්ණා ශක්තියෙන් නැමුණු බවය, කර්ම, කර්මනිමිති, ගති නිමිති යන ආලම්බනය ගැනීමය යනාදි හෙතු සමූහය නොරකොට පහළවූයේ නොවෙයි. මෙහි දක්වනලද උපමාවෙහි මෙගොඩ ඇල ඉවුර රුක බැඳි රැහැන මෙන් ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති සඞ්ඛ්‍යාත පළමු අත්බැව් බැඳි කර්මාදි ආලම්බනය දතයුතු. එහි පුරුෂයා මෙන් තෘෂ්ණාව දතයුතු. ඉක්මවන ව්‍යාපාරය මෙන් සංස්කාරය දතයුතු. හෙතෙම එතෙර ඉවුරෙහි පිහිටන්නේ එතෙර රුක බැඳි කිසිවක්හු ලබන්නේ හෝ නොලබන්නේ හෝ හුදෙක් පොළොවෙහි නතුවීමට කරුණු වූ සවශක්තීන්ම යම්සේ පිහිටාද, එමෙන්ම මේ ප්‍රතිසන්ධි විඥානය භවාන්තරාත්මභාවය වැළඳ සිටි හදයවස්තු සඞ්ඛ්‍යාත නිශ්‍රයස්ථානය පඤ්චවොකාර භවයෙහි ලබමින් හෝ, චතුවොකාර භවයෙහි නොලබමින් හෝ, ආලම්බන, සම්ප්‍රයුක්ත, කර්ම ප්‍රත්‍යය ශක්තියෙන්ම පවත්නේයි.

**ප්‍රතිරාවය, ප්‍රදීපය, මුද්‍රාය, ප්‍රතිබිම්බය** යන කාරණයෝ නිදර්ශනයෝ වෙත්.

**ප්‍රතිරාවය** තෙම, ශබ්දය **උත්පත්ති** කාරණාකොට ඇත්තේය.

**මුද්‍රා** නම් ලද ඵලභූතවූ පිළිඹිඹුරුව, හෙතුභූතවූ ලාඤ්ඡනය උත්පත්ති කාරණාකොට ඇත්තේය.

කැටපත්තල ආදියෙහි හුණුවගිය පිළිරුව, මුව සටහන් ආදිය උත්පත්ති කාරණාකොට ඇත්තේය.

ඵලය හේතුභූතවූ තැන රැස්ව සිට අන් තැනෙකට නො ගියේ වෙයි. ප්‍රතිසන්ධි විඥානයද, පූර්ව භවයෙහි රැස්ව සිට මේ භවයට ආයේ නොවෙයි. පෙළ සැදී පවත්නා හෙයින් මේ ප්‍රතිසන්ධි විඥානයාගේ සමානත්වයකුදු නැත. නානත්වයකුදු නැත අනුප්‍රබන්ධ වශයෙන් ඇති කල්හි ඒකාන්තයෙන් සමානත්වය වත්තේ නම් කිරි හේතුකොට-ගෙන දී හටගැන්ම නොවන්නේය. ඒකාන්තයෙන් භින්නත්වයකුදු වත්තේ නම් කිරි හා සම්බන්ධිවූ දී නො-වන්නේය. බීජාඞ්කුරාදීහුද මෙබඳු නය ඇතියහු වෙත්.

ඒකාන්ත ඒකත්වය ඇති කල්හි මනුෂ්‍යයෙකුට දෙවියෙක් විය නොහැකි. ඒකාන්ත නානත්වයක් ඇති කල්හි එක් අයෙක් සකස්කළ කර්මය අනෙකෙක්හට යාහැකියි. එබැවින් මේ හේතුඵල ධර්මයන්හි ඒකාන්තයෙන් ඒකමය යන බව හෝ ඒකාන්තයෙන් අනෙකක් වන බව හෝ නුවණැතියන් විසින් නොපිළිගතයුතු. මෙහි ඒකාන්ත ඒකත්වය හැරීමෙන් ශාශ්වත දෘෂ්ටිය වළකයි. ඒකාන්ත නානත්වය හැරීමෙන් උච්ඡෙද දෘෂ්ටිය වළකයි. හෙතු, හෙතුසමුප්පන්නභාවය දක්වීමෙන් නිෂ්කාරණොත්පත්තිය වළකයි.

අඹ ඇටයක් රෝපණය කළ කල්හි පසු කලෙක ලබන-ලද ප්‍රත්‍යයන් ඇතිහෙයින් අඹඵල හටගනී. අන් ඵලයක් හට නොගනී. මෙහි බීජය මෙන් කර්මවත්වූ සත්ත්වයා දතයුතු බීජයාගේ අඞ්කුරාදී පටිපාටිය මෙන් සත්ත්වයාගේ ප්‍රතිසන්ධි විඥානාදී පරිපාටිය දතයුතු. එහි අඹ රස ආදිය අඹඵලයාගේ හේතුවෙන් සකස් කළාක්මෙන් කර්මය කළාවූ සත්ත්වයාහටම ඒ කර්ම හේතුවෙන්ම විපාකයෝ වීම දතයුතු.

බාල දරුවෙකුට ශාස්ත්‍ර පුහුණු කිරීම්ද, ශිල්ප අභ්‍යාස කිරීමද, රෝගනාශක ඖෂධ ප්‍රයොග කිරීමද, වෘද්ධ අවස්ථා-වෙහිවූ ශරීරයට නොවදිති. නමුත් ඒ හේතුවෙන්, ශාස්ත්‍ර පටුත්වයද, ශිල්ප දැනීමද, නිරාතඞ්කභාවයද, වෘද්ධ අවස්ථාවට

පැමිණි සිරුරෙහි පිහිටන්නේය. ඒ ශාස්ත්‍රාදිය බාල අවස්ථාවන්හිදී ප්‍රගුණ කළ අයගෙන් පිටත කෙනෙකුට නොපිහිටයි. එසේම මේ නාමරූප, සන්තති වශයෙන් පැවැත්මෙන් යම් ප්‍රතිසන්ධි ඵලයෙක් ඇත්නම්, ඒ ඵලය තෙම කර්ම සකස් කළ පුද්ගලයා හට මුත් අන් පුද්ගලයෙකු හට නොවේ. සකස් කළ හේතුවෙන්ම මුත් අන්‍ය හේතුවකින් හෝ අන්‍ය සන්තානගත කර්ම හෙතුවකින් හෝ නොවේ.

කර්ම වීපාකය ඉපැද්මෙන්ම විපාකය විඳින්නෙක යන ප්‍රඥප්ති තොමෝ සිද්ධය. ගෙඩි හටගැන්මෙන් වෘක්ෂයාගේ ඵල දරයි යන සම්මුතිය මෙනි. වෘක්ෂ නාම ප්‍රඥප්තිය නිසා පවත්නාවූ රූප ධර්මයන්ගේ එක් අවයවයක් වූ වෘක්ෂ ඵල මාත්‍රයාගේ ඉපැදීමෙන්ම වෘක්ෂතෙමේ ඵලගනී යයි කියනු ලැබේ.

එසේම දෙව මනුෂ්‍ය නාම ප්‍රඥප්තීන් නිසා පවත්නා වූ ස්කන්ධයන්ගේ එක් අවයවයෙක්වූ, අනුභව කිරීම යයි කියන ලද සුඛ දුක්ඛ විපාකයාගේ ඉපැදීමෙන්ම, දෙවියෙක් හෝ මිනිසෙක් හෝ සුවදුක් විඳි යනාදිය කියනු ලැබේ. මෙහි ස්කන්ධයන් කෙරෙන් අන්‍යවූ විඳින්නෙක් නැත්තේය කළ බැවින්ම සංස්කාරයෝ තුමූ තමාගේ විපාකයට හේතු හු වෙති. කාමාවචර කුසල කර්මය කළ බැවින් ඵලභූත වූ චක්ෂුර් විඥානය උපන්නේ වේ. වරක් ඵල දුන් කල නැවත විපාක දීමෙක් නැත.

කාමාවචර අෂ්ටවිධ කුසල චේතනා නම් වූ **කාමාවචර පුණ්‍යාභි සංස්කාරයෝ** තුමූ එකොළොස් කාම භවයෙහි දෙව් මිනිස් සුගතියෙහි—

**කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණය, අට මහා විපාකය**

යන නවවිධ විපාක විඥානයන්ට ප්‍රතිසන්ධික්ෂණයෙහිම **නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය** ශක්තියෙන් ද, **පකතූපනිශ්‍රය ප්‍රත්‍යය** ශක්තියෙන්ද, යන දෙපරිද්දෙන් ප්‍රත්‍යය වේ.

Free Distribution www.aathaapi.org

**රූපාවචර පුණ්‍යාභිසංස්කාරය** තෙම, රූප භවයෙහි ප්‍රතිසන්ධික්ෂණයෙහිම පඤ්චවිධ වූ රූපාවචර විපාක විඥානයන්ට, **නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය ශක්තියෙන්ද, උපනිශ්‍රය ප්‍රත්‍යය** ශක්තියෙන්ද යන දෙපරිද්දෙන් ප්‍රත්‍යය වේ.

**කාමාවචර පුණ්‍යාභිසංස්කාරය** තෙම කාම භවයෙහි සප්තකාම සුගතියෙහි **උපෙක්ඛා සහගත අහෙතුක මනොවිඤ්ඤාණ ධාතු** නම් වූ චක්ඛු විඤ්ඤාණාදි වූ සප්තවිධ කාමාවචර විපාක විඥානයන්ට, ප්‍රවෘත්තික්ෂණයෙහිම යට කියන ලද දෙපරිද්දෙන්ම ප්‍රත්‍යය වේ ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රත්‍ය නොවේ.

කාමාවචර පුණ්‍යාභිසංස්කාරය තෙමේ රූප භවයෙහි පඤ්චවිධ වූ කුසල විපාක **චක්ඛුවිඥාන, ශොත්‍රවිඥාන, සම්පටිච්ඡන, උභය සන්තීරණ** සඞ්ඛ්‍යාත කාමාවචර විපාක විඥානයන්ට එපරිද්දෙන්ම හෙවත් **කර්මප්‍රත්‍යය, උපනිශ්‍රය ප්‍රත්‍යය** යන දෙපරිද්දෙන්ම ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධික්ෂණයෙහිදී ප්‍රත්‍ය නොවේ.

කාම භවයෙහි, චතුර්විධ දුර්ගතියෙහි අෂ්ටවිධ වූ කාමාවචර වූ අහෙතුක කුසල විපාක විඥානයන්ට **කර්ම ප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය** යන දෙපරිද්දෙන්ම ප්‍රවෘත්තික්ෂණයෙහිදී ප්‍රත්‍යය වේ ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රත්‍ය නොවේ.

ඒ දුර්ගති භූමින් අතුරෙහි, නරකයෙහි මහමුගලන් තෙර නුවන්, නිරයට වැඩමවන අවස්ථාවෙහිදී ඉෂ්ටාලම්බනයන් හා එක්වීම නිමිතිකොට කාමාවචර **පුණ්‍යාභි සංස්කාරය තෙම,** කාමාවචර වූ අහෙතුක කුසල විපාක විඥානයන්ට ප්‍රත්‍යය වේ. තිරශ්චීනාදීන් අතුරෙන් මහත් ආනුභාව ඇති නාගය, ගරුඬය, ප්‍රේතය යන සත්ත්වයන් කෙරෙහි ද, ඉෂ්ටාලම්බනයක් ලැබෙමය.

ඒ කාමාවචර පු**ණ්‍යා**භිසංසකාරය තෙම, කාම භවයෙහි සප්තකාම **සුගතියෙහි** සොළොස්විධ වූ කුසල

විපාක විඥානයන්ට **කර්ම ප්‍රත්‍යය, උපනිශ්‍රය ප්‍රත්‍යය** යන දෙපරිද්දෙන් ප්‍රවෘත්තික්ෂණයෙහි ද, ප්‍රතිසන්ධික්ෂණයෙහි ද ප්‍රත්‍යය වේ.

සාමාන්‍ය වශයෙන් තෙළෙස් පුණ්‍යාභිසංස්කාරය තෙම රූප භවයෙහි දශවිධ වූ කාමාවචර රූපාවචර විපාක විඥානයන්ට **කර්ම ප්‍රත්‍යය, උපනිශ්‍රය ප්‍රත්‍යය** යන දෙපරිද්දෙන්ම ප්‍රවෘත්තික්ෂණයෙහිද ප්‍රතිසන්ධික්ෂණයෙහිද ප්‍රත්‍යය වේ.

**දොළොස්විධ වූ අපුණ්‍යාභිසංස්කාරය** තෙම, කාම භවයෙහි දුර්ගතියෙහි අකුසල විපාක සන්තීරණ නම්වූ ප්‍රතිසන්ධි විඥානයට එපරිද්දෙන්ම ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රත්‍යය වේ. ප්‍රවෘත්තික්ෂණයෙහි ප්‍රත්‍යය නොවේ.

ඉතිරි ෂඩ්විධ අකුසල විපාක විඥානයන්ට ප්‍රවෘත්තික්ෂණයෙහි ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රත්‍යය නොවේ,

සප්තවිධ වූ අකුසල විපාක විඥානයන්ට ප්‍රවෘත්තික්ෂණයෙහිද, පටිසන්ධික්ෂණයෙහි ද ප්‍රත්‍යය වේ.

කාම භවයෙහි සප්තකාම සුගතියෙහි ඒ අකුසල විපාක යන් සත්දෙනාටම **කර්ම ප්‍රත්‍යය, උපනිශ්‍රය ප්‍රත්‍යය** යන දෙපරිද්දෙන්ම ප්‍රවෘත්තික්ෂණයෙහි ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධි-ක්ෂණයෙහි ප්‍රත්‍යය නොවේ.

රූප භවයෙහි චතුර්විධ වූ අකුසල විපාක විඥානයන්ට ඒ දෙපරිද්දෙන්ම ප්‍රවෘත්තික්ෂණයෙහි ප්‍රත්‍යය වේ පටිසන්ධි-ක්ෂණයෙහි ප්‍රත්‍යය නොවේ.

ඒ **අපුණ්‍යාභිසංස්කාරය** තෙම, කාමාවචර භූමියෙහි අනිෂ්ට රූපාලම්බන දර්ශන, අනිෂ්ට ශබ්දාලම්බන ශ්‍රවණයන්ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. බඹලොව වනාහි අනිෂ්ටවූ රූපාදී ආලම්බන කෙනෙක් නම් නැත්තාහ. ෂට් කාමාවචර දෙව ලොකයෙහිද, අනිෂ්ටාලම්බනයෝ නැත්තාහ.

**ආනෙඤ්ජාභිසංස්කාරය තෙම,** අරූප භවයෙහි චතුර්විධවූ අරූපාවචර විපාක විඥානයන්ට **කර්‍ම ප්‍රත්‍යය උපනිශ්‍රය ප්‍රත්‍යය** යන දෙපරිද්දෙන්ම ප්‍රවෘත්තික්‍ෂණයෙහිද, ප්‍රතිසන්ධික්‍ෂණයෙහිද ප්‍රත්‍යය වේ.

කාමාවචර කුසලාකුසල වශයෙන් විසිවැදෑරුම්වූ චෙතනා සඞ්ඛ්‍යාත **කාය සංස්කාරය** තෙම, **එකොළොස්** කාම භූමි යෙහි, අෂ්ට මහා විපාක, **උපෙක්ඛා** සන්තීරණවයාගේ වශයෙන් දසවිධවූ විපාක විඥානයන්ට ප්‍රතිසන්ධික්‍ෂණයෙහි **නානාක්‍ෂණික කර්‍ම ප්‍රත්‍යය** ශක්තියෙන්ද, **උපනිශ්‍රය ප්‍රත්‍යය** ශක්තියෙන්ද යන දෙපරිද්දෙන් ප්‍රත්‍යය වේ.

ඒ විසි වැදෑරුම් වූ **කාය සංස්කාරය** තෙමේ, එකොළොස් කාම භවයෙහි ෂඩ්විධ අකුසල විපාක **චක්‍ෂු, සොත, ඝාණ, ජිව්හා, කාය, සම්පටිච්ඡන,** සප්තවිධ කුසල විපාක **චක්‍ෂු, සොත, ඝාණ, ජිව්හා, කාය විඥාන, සම්පටිච්ඡන, සොමනස් සන්තීරණ** යන තෙළෙස් විපාක විඥානයන්ටද

රූප භවයෙහි චතුර්විධ අකුසල විපාක, පඤ්චවිධ කුසල විපාකයන්ගේ වශයෙන් නවවිධවූ විපාක විඥානයන්ටද ඒ දෙපරිද්දෙන්ම ප්‍රවෘත්තික්‍ෂණයෙහි ප්‍රත්‍යය වේ ප්‍රතිසන්ධි-ක්‍ෂණයෙහි ප්‍රත්‍යය නොවේ.

ඒ **විසිවැදෑරුම්වූ කාය සංස්කාරය තෙමේ,** එකොළොස් කාම භවයෙහි සියළුම අහෙතුක විපාක, මහා විපාකයන්ගේ වශයෙන් තෙවිසි වැදෑරුම්වූ විපාක විඥානයන්ට ඒ දෙපරිද්දෙන්ම ප්‍රවෘත්තික්‍ෂණයෙහි ද ප්‍රතිසන්ධික්‍ෂණයෙහිද ප්‍රත්‍යය වේ.

**වචී සංස්කාරයෙහිදු** එබඳුම නය ඇත්තේය.

**කාමාවචර** කුසලාකුසල චෙතනා විසිදෙනා හා චතුෂ්කන සින් රූපාරූප විපාක අටදෙනාද **එකතුව එසේම** පඤ්චක නයින් රූපාරූප නවදෙනා **එකතුවද,** අටවිසි (28) වැදෑරුම්, **එකුන්තිස් (29)** වැදෑරුම් චෙතනාවන්ගේ වශයෙන් ප්‍රභෙදවත් වූ **චිත්ත සංස්කාරය** තෙම, කාම, රූප අරූප භවයන්හි

උපෙක්ඛාසහගත සන්තීරණ යුග්මය, මහා විපාක අට දෙනාය, රූපාරූප විපාක නවදෙනාය, යන මොවුන්ගේ වශයෙන් එකුන් විසි (19) විපාක විඥනයන්ට ඒ දෙපරිද්දෙන්ම ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රත්‍යය වේ. ප්‍රවෘත්තික්ෂණයෙහි ප්‍රත්‍ය නොවේ.

**එකී චිත්ත සංස්කාරය** තෙම කාම, රූප යන උභය භවයන්හි යට කියනලද **උපෙක්ඛා සන්තීරණ** යුග්මය හැර ඉතිරි අහෙතුක තෙළෙස් (13) විපාකයන්ටද, නවවිධවූ රූපාරූප විපාකයන්ටද යන මේ දෙවිසි (22) විපාක විඥන යන්ට ඒ දෙපරිද්දෙන්ම ප්‍රවෘත්තික්ෂණයෙහි ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රත්‍යය නොවේ.

කාම, රූප, අරූප යන ත්‍රිවිධ භවයන්හි අහෙතුක විපාක, මහා විපාක, රූපාරූප විපාකයන්ගේ වශයෙන් දෙතිස් වැදෑරුම්වූ විපාක විඥනයන්ට ඒ දෙපරිද්දෙන්ම ප්‍රවෘත්තික්ෂණයෙහිත්, ප්‍රතිසන්ධික්ෂණයෙහිත් ප්‍රත්‍යය වේ,

පළමුකොට කාම, රූප, අරූප භවයන්හි ප්‍රතිසන්ධි, ප්‍රවෘත්තීන්ගේ ශක්ති වශයෙන් ඒ සංස්කාරයෝ තුමූ යම් විපාක විඥන කෙනෙකුන්ට ප්‍රත්‍යයෝ වෙද්ද යම් පරිද්දෙකින් ප්‍රත්‍යයයෝ නොවෙද්ද, එපරිද්දෙන් දත යුත්තාහ.

මෙකී නයින්ම යොනි ආදීන්හිද විභාගය දත යුත්තාහ.

## විඤ්ඤාණ පච්චයා නාමරූපං

**විඤ්ඤාණ** ප්‍රත්‍යයෙන් **නාමරූපයෝ** හටගනිත්. මෙහි **රූපයෝ** නම් විඥන ප්‍රත්‍යයෙන් හටගන්නා අටවිසි රූපයන්ට ඇතුළත් රූප සමූහය හෙවත් **රූපස්කන්ධයයි.**

**නාමය** වනාහි අභිධර්ම ක්‍රමයෙන් ත්‍රිවිධ වේ. එනම් **වේදනා ස්කන්ධය, සංඥස්කන්ධය, සංස්කාරස්කන්ධයයි.** සූත්‍රාන්ත දෙශනායෙහි මේ **සංස්කාරස්කන්ධය, චේතනා, ඵස්ස, මනසිකාර** වශයෙන් ත්‍රිවිධකොට ගන්නා ලදී.

**නාමය** තෙම සියලුම භව, **යෝනි, ගති. විඤ්ඤාණස්ථිති** අසංඥසත්ත්වය හැර ඉතිරි **සත්ත්වාවාසයන්හි** පවත්නේයි.

**රූපය** තෙම **කාම, රූප** යන විධ භවයන්හිද, චතුර් විධ යෝනීන්හිද, පඤ්චවිධ ගතීන්හිද, චතුර්විධවූ විඥානස්ථිතීන්හිද, පඤ්චවිධවූ සත්ත්වාවාසයන්හිද පවත්නේයි.

මෙසේ විඥාන ප්‍රත්‍යයෙන් ලැබෙන්නාවූ නාමරූප ධර්මයෝ ප්‍රතිසන්ධික්ෂණයේදී ද ප්‍රවෘත්ති කාලයෙහිද ලැබෙන්නාහ.

පටිසන්ධික්ෂණයෙහි වනාහි **භාවරූප නැති** හෙවත් නපුංසකවූ **ගර්භශය්‍යක සත්ත්වයන්ටද,** භාවරූප නැති **අණ්ඩජ සත්ත්වයන්ටද, වස්තුදශක, කාය දශක** වශයෙන් රූප සන්තති ශීර්ෂයෝ දෙදෙනෙක් පහළ වෙත්. එමෙන්ම **වේදනා, සඥා, සංඛාර** නම්වූ නාමස්කන්ධයෝද පහළවෙත්. එවිට සත්ත්වයෙකුට පටිසන්ධික්ෂණයේදී ලැබෙන්නාවූ නාම රූපයන්ගේ අඩුම සංඛ්‍යාව තෙවිස්සකි (23).

| | |
|---|---|
| **රූප ධර්මයෝ** ... | **20** |
| **නාම ධර්මයෝ** (වේදනා සංඥා, සංඛාර) | **3** |
| | **23** |

භාව රූප ඇතිව පටිසන්ධිය **ලබන්නාවූ** සත්ත්වයන්ට පටිසන්ධික්ෂණයේදී නාමරූප ධර්මයන් තෙතිසක් ලැබෙන්නාහ.

එනම්:

| | |
|---|---|
| **කාය දසක, භාවදසක, වස්තු දසක** | **30** |
| **නාම ධර්මයෝ** (වේදනා, සංඥා, සඛාර) | **3** |
| | **33** |

ඕපපාතික ප්‍රතිසන්ධිය ලබන්නාවූ සත්ත්වයන් අතුරෙන් ප්‍රථම ධ්‍යාන භූමි ආදීන්හි පිළිසිඳ ගන්නාවුන්ට යටත්පිරිසෙයින් නාමරූප ධර්මයෝ දෙසාළිසක් (42) ලැබෙන්නාහ.

එනම්:

| | |
|---|---|
| චක්ඛු දසක, සොතදසක, වස්තු දසක | 30 |
| ජීවිත නවකය | 9 |
| නාම ධර්මයෝ | 3 |
| | 42 |

කාම භවයෙහි පරිපූර්ණායතන ඇති ඕපපාතික සත්වයන්ටද, සංසෙදජ සත්වයන්ටද නාමරූප ධර්මයෝ තෙසැත්තෑවක් (73) ලැබෙත්නාහ.

එනම්:

| | |
|---|---|
| චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, වත්‍ථු, භාව දශක වශයෙන් | 70 |
| නාම ධර්මයෝ | 3 |
| | 73 |

**අරූපාවචර** ප්‍රතිසන්ධිය ලබන්නාවූ සත්වයන්ට නාම ධර්මයෝ තිදෙන පමණක් ලැබේ.

**අසංඥසත්ව** භූමියෙහි ප්‍රතිසන්ධිය ලබන කල්හි ජීවිත නවකය නම්වූ රූප නවය පමණක් ලැබේ.

**ප්‍රවෘත්ති ක්‍ෂණයෙහිදී** ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිතික්‍ෂණයෙහි පැවැති කර්මජ තෙජෝ ධාතුවෙන් ඍතුසමුට්ඨාන ශුද්ධාෂ්ටක කලාපයෙක් පහළවේ.

ප්‍රතිසන්ධි චිත්තය, ප්‍රපාතයෙහි හුණු පුරුෂයෙක් අනිකෙකු හට පිටිවහලෙක් වන්නට නොසමත් වන්නාක් මෙන් වස්තු දුබල භාවය කරණකොට ගෙන චිත්තජ රූප නූපදවයි.

පළමුවෙනි භවාඞ්ග චිත්තයාගේ පටන් චිත්තජ ශුද්ධාෂ්ටක රූප කලාපයෝ පහළ වෙත්. පසුව සෘතු චිත්තයන් හෙතුකොට ගෙන ශබ්ද නවක රූප කලාප පහළ වෙත්.

ගබ්භසෙය්‍යක **ජලාබුජ** සත්ත්වයෝ කබලීකාරාහාරය නිසා දිවි පවත්වත්ද, මව් විසින් අනුභව කළාවූ ආහාරයන් සිරුරෙහි පැතිර පවත්නා කල්හිද, ඖපපාතිකයන්ට තමාගේ කෙළ අනුභව කරන කාලයෙහිද, ආහාරජ හෙවත් ආහාර හෙතුවෙන් හටගන්නාවූ ශුද්ධාෂ්ටක රූප කලාපයෙක් පහළ වෙයි. මෙසේ උඩත් පිරිසෙයින් ආහාර සමුට්ඨාන ශුද්ධාෂ්ටක වශයෙන් රූප අටක් (8)ද, උතුසමුට්ඨාන ශුද්ධාෂ්ටකය ශබ්ද රූපයත් සමග රූප නවයක්(9)ද, චිත්තසමුට්ඨාන ශුද්ධාෂ්ටකය ශබ්ද රූපයත් සමග රූප (9) දැයි විසිහය (26) වදූරුම් රූපයෝ පහළ වෙත්. මෙය හැර වස්තු කාය දසක වශයෙන් සන්තති ශීර්ෂයෝ දෙදෙනෙක්ද එක් එක් චිත්තක්ෂණයෙක්හි තුන්වර බැගින් පහළ වෙත්.

| | |
|---|---|
| මෙසේ, **කාය**, **භාව**, **වස්තු**, **චක්ඛු**, | |
| **සොත**, **ඝාණ**, **ජිව්හා** දසක වශයෙන් රූප | 70 |
| චිත්ත, ඍතු, ආහාර සමුට්ඨාන රූප | 26 |
| ත්‍රිවිධ නාමස්කන්ධයෝය | 3 |
| | 99 |

මෙයින් ශබ්ද රූප දෙක ඉවත් කළ කල්හි රූප 97 කි. ඒ ඒ සත්ත්වයන්ට නිදා සිටියදීත්, පමාව සිටියදීත්, හැසිරෙද්දීත්, කෑම අනුභව කරද්දීත්, පැන් ආදිය බොද්දීත්, දවාලෙහිත්, රාත්‍රියෙහිත් ඒ අනූහතක් (97) නාමරූප ධර්මයෝ විඥාන ප්‍රත්‍යයෙන් හටගනිත්. මෙය **විඤ්ඤාණ පච්චයා නාම රූපං** යයි දතයුතු.

මේ අනූහතක් (97) නාමරූප ධර්මයන් අතුරෙන්, **කර්මජ** රූපය තෙම, භව, යොනි, ගති, විඥානස්ථිති, **සත්ත්වාවාස** යන්හි සියලු ත්‍රිසමුට්ඨාන රූපයන්ට පළමු පිහිටන්නේ වීනමුත්, ඍතු චිත්ත, ආහාර රූපයන් විසින් අනුබල නොදෙන ලද්දේ පිහිටන්නට හෙවත් චිරස්ථායි භාවයෙන් පවත්නට නොහැකිවේ. තමා පිළිබඳවූ සප්ත දසායුෂ්ක (17) ක්ෂණ මාත්‍රයම පවත්නට හැකි නමුත් චිරස්ථායි භාවයෙන් පෙළ නොසිඳ පැවැත්මට නොහැකිවේ.

Free Distribution www.aathaapi.org

ඒ ත්‍රිසමුට්ඨාන රූපය තෙමේද, ඒ කර්මජ රූපය විසින් අනුබල නොදෙන ලද්දේ චිරස්ථායි භාවයෙන් පිහිටන්නට නොහැකි වේ.

රළ වේගයෙන් පහළ නමුත් මහ මුහුදෙහි කිසි තැනක ලන් පිහිට ඇති බුන් නැවක් මෙන්, ඔවුනොවුන් ගෙන් රුකුල් ලැබ, ඒ කර්මාදී චතුසමුට්ඨාන රූප කලාපයෝ පෙළ නොසිඳ පවත්නාහු ය. මෙසේ පිහිටා එක් අවුරුද්දක්, දෑවුරද්දක්, තුන් අවුරුද්දක්, සියක් අවුරුද්දක් නමුත් යම්තාක් කලෙකින් ඒ සත්ත්වයන්ගේ ආයුක්‍ෂය මරණය හෝ කර්මක්‍ෂය මරණය හෝ වේද්ද එතෙක් කල් පවතිත්. මෙසේ සියලු භවයොනි ගති ආදීන්හි පවතිත්.

නාම රූපයට හෙතුභූතවූ විඥානය විධ වේ. එනම්:

1. **විපාක විඥානය**
2. **අවිපාක විඥානය** (අභිසංස්කාර විඥානය) කියා යි

අසංඥ සත්ත්වයන්ගේ රූපයද, අසංඥ සත්ත්ව භූමියෙහි, කර්මයෙන් හටගන්නා බැවින්, එය පංචවොකාර භවයෙහි පැවති අභිසංස්කාර විඥාන ප්‍රත්‍යයයෙන් හටගත් රූප නම්.

එපරිද්දෙන්ම, පංචවොකාර භවයෙහි ප්‍රවෘත්ති කාලයෙහි කුසලාදි චිත්තක්‍ෂණයෙහි කර්ම සමුට්ඨාන රූපය තෙම, පංචවොකාර භවයෙහි ප්‍රවෘත්ති අභිසංස්කාර විඥාන ප්‍රත්‍යයයෙන් නිපන් රූප නම්. එහෙයින් **විඥාන පච්චයා නාමරූපං** කියා වේ.

## ප්‍රත්‍යයවීම

**විපාක විඥානය, නාමයට** නව පරිද්දෙකින්ද, ප්‍රතිසන්ධික්‍ෂණයෙහි **වස්තු රූපයට** නව පරිද්දෙකින්ද, වස්තු රූපය හැර **අනිකුත් රූපයන්ට** අට පරිද්දෙකින්ද

ප්‍රත්‍යය වේ. **අභිසංස්කාර විඥානය, කර්මජරූපයට එක් පරිද්දෙකින් ප්‍රත්‍යය වේ ප්‍රථම භවාඞ්ගාදි විඥානය,** ඒ **නාමරූපයන්ට සුදුසු** පරිද්දෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රතිසන්ධික්ෂණයෙහි හෝ ප්‍රවෘත්තික්ෂණයෙහි හෝ විපාක සංඛ්‍යාතවූ යම් නාමයෙක් රූපය හා මුසුවූ හෝ නුමුසුවූ හෝ වේද, ඒ නාමයට ප්‍රතිසන්ධිකෘත්‍යයෙහි නියුක්ත වූ හෝ අන්‍යවූ විපාක විඥානය තෙම (1) **සහජාත** (2) **අන්‍යොන්‍ය** (3) **නිශ්‍රය,** (4) **සම්ප්‍රයුක්ත,** (5) **විපාක,** (6) **ආහාර** (7) **ඉන්ද්‍රිය,** (8) **අස්ති,** (9) **අවිගත** යන ප්‍රත්‍යය ශක්තීන්ගේ වශයෙන් නව පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

වස්තු රූපයට, ප්‍රතිසන්ධික්ෂණයෙහිවූ විපාක විඥානය තෙම (1) **සහජාත,** (2) **අන්‍යොන්‍ය,** (3) **නිශ්‍රය,** (4) **විපාක,** (5) **ආහාරය,** (6) **ඉන්ද්‍රිය,** (7) **විප්‍රයුක්ත,** (8) **අස්ති,** (9) **අවිගත** යන ප්‍රත්‍ය ශක්තීන්ගේ වශයෙන් නව පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

වස්තු රූපය හැර අන්‍ය රූපයන්ට ඉහතකී **අන්‍යොන්‍ය** ප්‍රත්‍යය හැර ඉතිරි අටවිධවූ ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

පුණ්‍යාභිසංස්කාර, අපුණ්‍යාභිසංස්කාර විඥානය තෙම, අසංඥ සත්ත්වයන්ගේ කර්මජ රූපයට හෝ, පංචවොකාර භවයෙහි කර්මජ රූපයට හෝ සූත්‍රාන්තික පර්‍යායෙන් **උපනිශ්‍රය ප්‍රත්‍යය** වශයෙන් එක් පරිද්දෙකින් ප්‍රත්‍යයවේ.

ප්‍රතිසන්ධි විඥානය හා අභිසංස්කාර විඥානයන් හැර ඉතිරි විඥානය තෙම, ප්‍රථම භවාඞ්ග චිත්තයෙන් පටන් ගෙන ඒ ඒ නාම රූපයට සුදුසු පරිද්දෙන් ප්‍රත්‍යය වේ.

## නාම රූප පච්චයා සළායතනං

මෙහි වෙදනාදීවූ ස්කන්ධයන් තුන්දෙනාගේ අවයව සමුදාය ස **නාම** නම්.

තමාගේ සන්තානයෙහි ඇතුළත්වූ ඒකාන්ත වශයෙන් **සතර විධ වූ භූතයන්ද, චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය හදය** යන වස්තුහුද, **ජීවිතෙන්ද්‍රිය** යද යන **භූත රූප වස්තු රූපාදිය රූප නම්.**

**නාමයත්, රූපයත්** එක්කොට ගත් කල්හි **නාමරූප** නම්. ඒ **නාම රූපය** තෙම ෂඩ් ආයතනයන්ටම ප්‍රත්‍යය වේ. ඒ ෂඩ් ආයතනයෝ නම් **චක්ඛායතනය, සොතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය** යන ආයතනයෝයි.

අරූප භූමියෙහි **නාමය** තෙම, සවැනිවූ මනායතනයටම ප්‍රත්‍යය වේ. අනික් ආයතනයන්ට ප්‍රත්‍යය නොවේ.

ඒ ඒ නාම රූපයාගේ වීමක් ඇතිකල්හිම ඒ ඒ ආයතන තෙමේ වේ. එසේ නොවන කල ආයතන ඇති නොවේ.

**අරූප භූමියෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්තික්ෂණයන්හි නාමයම** ඒ සවැනිවූ **මනායතනයට** යටත්පිරිසෙයින් **සත් පරිද්දෙකින්** ප්‍රත්‍යය **වේ**. **එනම්:**

**ප්‍රතිසන්ධික්ෂණයෙහි,** නාමය තෙම, මනායතනයට (1) **සහජාත,** (2) **අන්‍යොන්‍ය,** (3) **නිශ්‍රය,** (4) **සම්ප්‍රයුක්ත,** (5) **විපාක,** (6) **අස්ති** (7) **අවිගත** යන සත් පරිද්දෙන් ප්‍රත්‍යය වේ

මේ හැර කිසි නාම ධර්මයෙක් **හෙතුප්‍රත්‍යයෙයෙන්** හා **ආහාර ප්‍රත්‍යයෙන්ද** ප්‍රත්‍යය වේ.

**ප්‍රවෘත්තික්ෂණයෙහි, විපාකනාමය** තෙම, එම සත් පරිද්දෙන්ම ප්‍රත්‍යය වේ **අවිපාක නාමය** තෙම විපාක ප්‍රත්‍යය හැර ඉතිරි සය ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

මේ අවිපාක නාමයන් අතුරෙන්, **අලොභ, අදොස, අමොහ** සඞ්ඛ්‍යාතවූ කිසි නාමයෙක්, **හෙතුප්‍රත්‍යයෙන්ද** ස්පර්ශ චෙතනාදි සඞ්ඛ්‍යාතවූ කිසි නාමයෙක් **ආහාර ප්‍රත්‍යයෙන්ද ප්‍රත්‍යය වේ.**

Free Distribution www.aathaapi.org

**පංචවොකාර** භවයෙහි, **විපාක නාමය** තෙම **ප්‍රතිසන්ධික්ෂණයෙහි,** සවැනි **මනායතනයට** ඒ සත් ප්‍රකාර යෙන්ම ප්‍රත්‍යය වේ අන්‍යවූ **පඤ්චායතනයට (1) සහජාත (2) නිශ්‍රය, (3) විපාක, (4) විප්‍රයුක්ත, (5) අස්ති, (6) අවිගත,** යන ෂඩ් ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

මේ විපාක නාමයන් අතුරෙන් කිසි විපාක නාමයෙක් **හෙතු ප්‍රත්‍යය** වශයෙන්ද, කිසි විපාක නාමයෙක් **ආහාර ප්‍රත්‍යය** වශයෙන්ද, ප්‍රත්‍යය වේ.

**ප්‍රවෘත්ති කාලයෙහිද, විපාක නාමය** තෙම, විපාකවූ ෂඩායතනයට, ප්‍රතිසන්ධික්ෂයෙහි මෙන් සත් පරිද්දෙකින්ම ප්‍රත්‍යය වේ.

**අවිපාක නාමය** තෙම විපාක නොවූ සවැනි **මනායතනයට** විපාක ප්‍රත්‍යය හැර ඉතිරි ෂඩ් ආකාරයෙන් ම ප්‍රත්‍යය වේ. මනායතනය හැර සෙසු **චක්ඛායතනාදිවූ පඤ්චායතනයන්ට, විපාක නාමය** තෙම, **(1) පච්ඡාජාත, (2) විප්‍රයුක්ත (3) අස්ති, (4) අවිගත** යන සිව් පරිද්දෙන් ප්‍රත්‍යය වේ. **අවිපාක නාමය** තෙමේද, ඒ සිව් පරිද්දෙන් ම ප්‍රත්‍යය වේ.

මෙහි **රූපය** තෙම, අරූප භූමියෙහි එක් ආයතනයකට වත් ප්‍රත්‍යය නොවේ.

**පංචවොකාර** භවයෙහි, රූපයන් අතුරෙන් **හදයවස්තු රූපය** තෙම, ප්‍රතිසන්ධික්ෂණ යෙහිදී, සවැනි **මනායතනයට (1) සහජාත, (2) අන්‍යොන්‍ය, (3) නිශ්‍රය, (4) විප්‍රයුක්ත, (5) අස්ති, (6) අවිගත** යන ෂඩ් ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

**සතර මහා භූතයෝ** තුමූ, ප්‍රතිසන්ධි, ප්‍රවෘත්තික්ෂණ යන්හි විශෙෂයක් නැතිවම චක්ඛායතනාදී පඤ්චවිධ ආයතනයන්ට, **(1) සහජාත, (2) නිශ්‍රය, (3) අස්ති, (4) අවිගත** යන සතර ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

**රූප ජීවිතෙන්ද්‍රිය** තෙමේ, ඒ චක්ඛායතනාදී ප්‍රසාද ආයතන පස්දෙනාට, ප්‍රතිසන්ධික්ෂණයෙහි සහ ප්‍රවෘත්ති-ක්ෂණයෙහිද, (1) **අත්ථි**, (2) **අවිගත**, (3) **ඉන්ද්‍රිය** යන තුන් පරිද්දෙන් ප්‍රත්‍යය වේ.

**ආහාර රූපය** තෙමේද, ප්‍රවෘත්තික්ෂණයෙහිදී තුන් පරිද්දෙකින් ප්‍රත්‍යය වේ. එනම් (1) **අත්ථි**, (2) **අවිගත** (3) **ආහාර** යන තුන් ආකාරයෙන්ය.

ඒ චක්ෂුරාදී ප්‍රසාද රූපයෝ පස්දෙනාම **චක්ඛු, සොත ඝාණ, ජිව්හා, කාය විඥාන** සඞ්ඛ්‍යාතවූ මනායතනයට, ප්‍රවෘත්තික්ෂණයෙහි, (1) **නිශ්‍රය**, (2) **පුරෙජාත**, (3) **ඉන්ද්‍රිය**, (4) **විප්‍රයුක්ත**, (5) **අත්ථි**, (6) **අවිගත** යන ෂඩ් ආකාර යෙන් ප්‍රත්‍යය වේ.

පඤ්ච විඥානයන් හැර අවශෙෂවූ **මනායතනයට, වස්තුරූපය** තෙම, ප්‍රවෘත්තික්ෂණයෙහි (1) **නිශ්‍රය**, (2) **පුරෙජාත**, (3) **විප්‍රයුක්ත**, (4) **අත්ථි**, (5) **අවිගත** යන පස් ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

**ප්‍රතිසන්ධික්ෂණයෙහි** පංචවොකාර භවයෙහි; **වෙදනා සංඥා, සංඛාර** යන **ස්කන්ධත්‍රයද, හෘදයවස්තුරූපයද**, යන **නාමරූපය** තෙම සවැනිවූ **මනායතනයට**, (1) **සහජාත**, (2) **අඤ්ඤමඤ්ඤ**, (3) **නිශ්‍රය**, (4) **විපාක**, (5) **සම්ප්‍රයුක්ත**, (6) **විප්‍රයුක්ත**, (7) **අත්ථි**, (8) **අවිගත** යන අට ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

## සළායතන පච්චයා ඵස්සො

ෂඩ් ආයතන ප්‍රත්‍යයෙන් ඇතිවන **ස්පර්ශයෝ** නම් දෙතිස් (32) විපාක විඥානයන් හා සම්ප්‍රයුක්තවූ දෙතිස් (32) ස්පර්ශයෝ යි මේ සළායතනයෝ ස්පර්ශයාගේ පැවැත්මට උපකාර වේ.

මෙහි ස්පර්ශය සවැදෑරුම් වේ. එනම්:

1. **චක්ඛු සම්ඵස්සය**
2. **සෝත සම්ඵස්සය**
3. **ඝාණ සම්ඵස්සය**
4. **ජිව්හා සම්ඵස්සය**
5. **කාය සම්ඵස්සය**
6. **මනෝ සම්ඵස්සය**

**චක්ඛු සම්ඵස්සය** තෙම **චක්ඛායතනය, රූපායතනය,** චක්ෂුර් විඥාන නම්වූ **මනායතනය**, ස්පර්ශයා කෙරෙන් අවශෙෂවූ **සම්ප්‍රයුක්ත** සංඛ්‍යාත **ධම්මායතනය**, හෙතුකොට ගෙන වේ. **සෝත සම්ඵස්සාදිය** ද මේ නයින්ම දතයුතු. මෙසේ මේ ස්පර්ශය තෙම එකම ස්පර්ශයක්වූයේ වී **නමුත්** නොයෙක් ආයතනයන් හෙතුකොට ගෙන වන්නේය. ආයතනයන් නැති කල්හි ස්පර්ශය ඇති නොවේ. එහෙයින් ආයතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වන බව කියනලදී.

චක්ඛායතන, සෝතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන යන පඤ්චවිධ ආයතනයන් චක්ඛුසම්ඵස්ස, සෝතසම්ඵස්ස, ඝාණසම්ඵස්ස, ජිව්හා සම්ඵස්ස, කාය සම්ඵස්සය යන පඤ්චවිධ ස්පර්ශයට ෂට් (6) ප්‍රකාරයකින් ප්‍රත්‍යය වේ. එනම්: 1. **නිස්සය ප්‍රත්‍යය,** 2. **පුරෙජාත ප්‍රත්‍යය,** 3. **ඉන්ද්‍රිය ප්‍රත්‍යය,** 4. **විප්‍රයුක්ත ප්‍රත්‍යය,** 5. **අත්ථි ප්‍රත්‍යය,** 6. **අවිගත ප්‍රත්‍යය** යන ප්‍රත්‍ය සයයි.

ඒ පඤ්චවිධ ආයතනයන් ගෙන් අන්‍යවූ හෘදකලාවූ **විපාක මනායතනය** තෙම, කුසල විපාකාදී පඤ්චචාරිකාදී වශයෙන් නොයෙක් ප්‍රභෙද ඇති විපඤ්ච විඥානයන් හා සම්ප්‍රයුක්තවූ **ස්පර්ශයට** නවාකාරයකින් ප්‍රත්‍යය වේ. එනම්: 1. **සහජාත ප්‍රත්‍යය,** 2. **අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය,** 3. **නිස්සය ප්‍රත්‍යය,** 4 **විපාක ප්‍රත්‍යය,** 5 **ආහාර ප්‍රත්‍යය,** 6. **ඉන්ද්‍රිය ප්‍රත්‍යය,** 7. **සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය,** 8. **අත්ථි ප්‍රත්‍යය,** 9. **අවිගත ප්‍රත්‍යය** යන නවයයි.

**රූපායතනය තෙම, චක්ඛු සම්ඵස්සයට 1. ආරම්මණ ප්‍රත්‍යය, 2. පුරෙජාත ප්‍රත්‍යය, 3. අත්‍ථි ප්‍රත්‍යය, 4 අවිගත ප්‍රත්‍යය** වශයෙන් සතර පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

**ශබ්දායතනාදීහුද, සොතසම්ඵස්සාදීන්ට** එමෙන්ම සතර පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

**මනො සම්ඵස්සයට** ඒ රූපාදි ආයතනද, ධම්මා යතනයද ඒ සතර පරිද්දෙන්ම ප්‍රත්‍යය වේ. එසේම ආලම්බන ප්‍රත්‍යය මාත්‍රයෙනුත් ප්‍රත්‍යය **වේ.**

## ඵස්ස පච්චයා වේදනා

ස්පර්ශය ඇති කල්හිම වේදනාවෝ වෙත්. ස්පර්ශය නැති කල්හි නොවෙති එහෙයින් **ඵස්ස පච්චයා වේදනා** යයි දක්වන ලදී.

ද්වාරවශයෙන් ගත් කල්හි මේ වේදනාවෝ ෂඩ්විධ වේ.

එනම්: **1. චක්ඛු සම්ඵස්සජා වේදනා**
**2. සොත සම්ඵස්සජා වේදනා**
**3. ඝාණ සම්ඵස්සජා වේදනා**
**4. ජිව්හා සම්ඵස්සජා වේදනා**
**5. කාය සම්ඵස්සජා වේදනා**
**6. මනොසම්ඵස්සජා වේදනා** යනුයි.

මෙසේ ද්වාරවශයෙන් ෂඩ්විධවූ මේ වේදනාවෝ ප්‍රභේද වශයෙන් එකුන් අනූවක් (89) වේ එනම්, එකුන් අනූවක් සිත් හා සම්ප්‍රයුක්ත එකුන් අනූවක් වේදනාවෝයි. ඒ එකුන් අනූවක්වූ වේදනාවන් අතුරෙන් **ඵස්ස පච්චයා වේදනා** යන පදයෙහි දෙතිස් විපාක විඥානයන්හි සම්ප්‍රයුක්තවූ දෙතිස් (32) වේදනාවෝම ගතයුතු.

වේදනාවට ප්‍රත්‍යය වන ස්පර්ශයන් අතුරෙන්, චක්ඛු සම්ඵස්ස, සොතසම්ඵස්ස, ඝාණ සම්ඵස්ස ජිව්හාසම්ඵස්ස, කාය සම්ඵස්ස යන පඤ්ච ද්වාරයෙහි පවත්නා ස්පර්ශය

තෙම, චක්ඛුසම්ඵස්සජා වේදනා, සෝතසම්ඵස්සජා වේදනා, ඝාණ සම්ඵස්සජා වේදනා, ජිව්හා සම්ඵස්සජා වේදනා කායසම්ඵස්සජා වේදනාවන්ට අට පරිද්දෙකින් ප්‍රත්‍යයවේ. එනම්: 1. **සහජාත ප්‍රත්‍යය**, 2. **අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය**, 3. **නිස්සය ප්‍රත්‍යය**, 4. **විපාක ප්‍රත්‍යය**, 5. **ආහාර ප්‍රත්‍යය**, 6 **සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය**, 7. අත්ථි **ප්‍රත්‍යය**, 8 **අවිගත ප්‍රත්‍යය**, යන අෂ්ටවිධ ප්‍රත්‍යයෝයි.

මෙකී ප්‍රසාද වස්තුක පඤ්ච වේදනාවන් කෙරෙන් අවශෙෂවූ චක්ඛුද්වාරාදිවූ එක් එක් ද්වාරයෙක්හි **සම්පටිච්ඡන සන්තීරණ, තදාරම්මණ** වශයෙන් ප්‍රවෘත්තවූ කාමාවචර විපාක වේදනාවන්ට, චක්ඛු සම්ඵස්සය මුල්කොට ඇති ස්පර්ශය තෙම, **උපනිශ්‍රය ප්‍රත්‍යය** වශයෙන් එක් පරිද්දෙකින් ප්‍රත්‍යය වේ. මනොද්වාරයෙහි වනාහි, **තදාලම්බන** වශයෙන් ප්‍රවෘත්තවූ කාමාවචර විපාක වේදනාවන්ට සහජාත මනො සම්ඵස්සය යයි කියන ලද ඒ ස්පර්ශය තෙම, එම අට පරිද්දෙන්ම ප්‍රත්‍යය වේ. **ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති** වශයෙන්ද ප්‍රවෘත්තවූ ත්‍රෛභූමික විපාක වේදනාවන්ටද ඒ ස්පර්ශය තෙම එම අට පරිද්දෙකින්ම ප්‍රත්‍යය වේ. මනොද්වාරයෙහි **තදාරම්මණ** වශයෙන් ප්‍රවෘත්තවූ යම් කාමාවචර විපාක වේදනාවෝ වෙත්ද, ඒ කාමාවචර විපාක වේදනාවන්ට, මනොද්වාරයෙහි මනොද්වාරාවජ්ජන චිත්තය හා සම්ප්‍රයුක්තවූ **මනොසම්ඵස්සය** තෙම **උපනිශ්‍රය ප්‍රත්‍යය** වශයෙන් එක් ප්‍රකාරයකින් ප්‍රත්‍යය වේ.

## වේදනා පච්චයා තණ්හා

වේදනාව ඇති කල්හිම තෘෂ්ණාව වේ. වේදනාව නැති කල්හි නොවේ.

වේදනා ප්‍රත්‍යයෙන් වන තණ්හාවෝ ආරම්මණයන්ගේ වශයෙන් ෂඩ්විධ වේ.

Free Distribution www.aathaapi.org

එනම්: **1. රූප තණ්හා**
**2. සද්ද තණ්හා**
**3. ගන්ධ තණ්හා**
**4. රස තණ්හා**
**5. පොට්ඨබ්බ තණ්හා**
**6. ධම්ම තණ්හා** යන සසයි.

රූපාලම්බනයෙහි තෘෂ්ණාව, රූප තණ්හා යයි ද, ශබ්දාලම්බනයෙහි තෘෂ්ණාව සද්ද තණ්හා යයි ද, ගන්ධාලම්බනයෙහි තෘෂ්ණාව, ගන්ධ තණ්හා යයි ද, රසාලම්බනයෙහි තෘෂ්ණාව රස තණ්හා යයි ද, පොට්ඨබ්බාලම්බනයෙහි තෘෂ්ණාව පොට්ඨබ්බ තණ්හා යයි ද, ධම්මාලම්බනයෙහි තෘෂ්ණාව ධම්ම තණ්හා යයිද දතයුතු.

මේ තණ්හාව, **කාම තණ්හා, භව තණ්හා,** විභව තණ්හාවගේ වශයෙන් ත්‍රිවිධ වේ.

**රූප තණ්හාවම** යම් කලෙක චක්ෂුසට හමුවූ රූපාලම්බනය කාම ගුණාස්වාද වශයෙන් ආස්වාදනය කරන්නීව පවතීද්ද, **එකල්හි කාම තණ්හාව** වේ.

යම් කලෙක්හි ඒ රූපාලම්බනයම නිත්‍යය යයි ද ශාස්වත යයි ද කියා මෙසේ ප්‍රවෘත්තවූ ශාස්වත දෘෂ්ටිය හා සමග පවතීද, **එකල්හි භව තණ්හාව** වේ. **එනම්:** ශාස්වත දෘෂ්ටිය හා එක්ව පැවති රාගය තෙම **භව තෘෂ්ණාව** නමැයි කියනු ලැබේ.

යම් කලෙක්හි ඒ රූපාලම්බනයම සුන්වන්නේය, විනාශ වන්නේය යි මෙසේ ප්‍රවෘත්ත වූ උච්ඡෙද දෘෂ්ටිය හා සමග පැවති කල්හි **විභව තණ්හා** නම් වේ උච්ඡෙද දෘෂ්ටිය හා සමග පැවැති රාගය තෙම **විභව තණ්හාය** යි කියනු ලැබේ.

සද්ද තණ්හාදිය ද මේ නයින්ම දතයුතු.

මෙසේ මේ ෂඩ්විධ තණ්හාවෝ කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා වශයෙන් තුන් ආකාරයෙන් ගත් කල්හි තෘෂ්ණාවෝ අටළොසක් වෙති. (6 × 3=18) එයද අධ්‍යාත්ම, බාහිර සන්තාන වශයෙන් සතිසකි. (18 × 2=36) තවද, අතීත, අනාගත, පච්චුප්පන්න වශයෙන් අටතුරාශියක් වේ. (36 × 3=108).

මේ වෙදනා පච්චයා තණ්හා නිර්දේශයෙහි එකලාවූම **විපාක සුඛ වෙදනා** තොමෝ අදහස් **කරණ** ලදී. ඒ විපාක සුඛ වෙදනා තොමෝ තෘෂ්ණාවට **උපනිශ්‍රය ප්‍රත්‍යය** වශයෙන් එක් අයුරෙකින්ම ප්‍රත්‍යය වේ.

දුකට පත්වූ පුද්ගලයෙක් සුඛය ප්‍රාර්ථනා කෙරේද, සුවපත්වූ පුද්ගලයෙක් සුඛය වැඩියක්ම ප්‍රාර්ථනා කෙරේද, උපෙක්ෂාතොමෝ සන්හුන් වන බැවින් සුඛ වෙදනාවට ඇතුළත්කොට වදාරනලද බැවින්ද, සුඛ, දුක්ඛ, උපෙක්ඛා යන ත්‍රිවිධ වෙදනාවෝම තෘෂ්ණාවට ප්‍රත්‍යය වූවාහු වෙති.

ඒ තෘෂ්ණාව වෙදනාව ප්‍රත්‍යය කොට ඇත්තී නමුත් අනුශය කෙලශයන් දුරුකළ, වැස නිමවූ බ්‍රහමචය්‍ය්‍යාව ඇති, බාහිතපාපිවූ, ක්ෂීණාශ්‍රවයන් වහන්සේට ඇති නොවේ.

## තණ්හාපච්චයා උපාදානං.

තණ්හාව ඇති කල්හිම උපාදානයෝ ඇතිවෙත්. තණ්හාව නැති කල්හි ඇති නොවෙත්.

අරමුණ දැඩිකොට අල්වා ගැනීම **උපාදාන** නම්. තෘෂ්ණාවෙන් මඩනාලද පුද්ගලතෙමේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම යන සයාකාර අරමුණු තදින් අල්වා ගනී. **උපාදාන** යන්නෙන් දැඩි **ලොභ දිට්ඨි** දෙදෙනා ගනු ලැබේ.

මේ උපාදානයෝ සතර දෙනෙකි. එනම්:

1. **කාමූපාදාන**
2. **දිට්ඨූපාදාන**
3. **සීලබ්බතූපාදාන**
4. **අත්තවාදූපාදාන** යන සතර ය.

1. **කාමූපාදානය**- යම් ධර්මයක් වස්තුකාම සංඛ්‍යාත කාමය දැඩිකොට ගනීද, එය **කාමූපාදාන** නම් ඒ ධර්ම ස්වභාවය තෙම කාමයත් වේ, උපාදානයත් වේ. තවද, පඤ්චවිධවූ කාමගුණයන්හි යම් **කාමච්ඡන්දයක්** වේද, යම් **කාම රාගයක්** වේද, යම් **කාමනන්දි** නම්ලද ලොභයක් වේද, යම් **කාම තෘෂ්ණාවක්** වේද, යම් **කාමස්නෙහ** නම් ලද ලොභයෙක් වේද, යම් **කාම මූර්ඡා** නම් ලද ලොභයෙක් වේද, යම් **කාම පරිනිෂ්ඨා** නම් ලද ලොභයෙක් වේද, මේ ධර්ම ජාති තොමෝ **කාමූපාදාන** නම් වේ. මෙසේ තෘෂ්ණාවගේ දැඩි බවම උපාදාන යයි වදාරන ලදී. පූර්වතෘෂ්ණා සංඛ්‍යාත උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් දැඩිව, පසුව ඇතිවූ තෘෂ්ණාතොමෝයි.

2. **දිට්ඨූපාදානය**- යම් ධර්මයක් මිථ්‍යාදර්ශන නම්වූ මිථ්‍යා දෘෂ්ටියක් වේද, එයම දැඩිකොට අල්වාගන්න අර්ථයෙන් උපාදානයත් වේද, එය **දිට්ඨූපාදාන** නම් එය දසවස්තුක මිථ්‍යාදෘෂ්ටියටද නමෙකි. එනම්:

1. දානයාගේ ඵලයෙක් නැත.

2. මහා දානයාගේ ඵලයෙක් නැත.

3. ආමන්ත්‍රණය කොට දෙන්නාවූද, ආගතතුගයාට දෙන්නාවූද, ආවාහාදීන්හිද, මඞ්ගල්‍යය පිණිසද දෙන්නාවූ දානයාගේද ඵලයෙක් නැත.

4. දස කුසල කර්මපථ, දස අකුසල කර්මපථ යයි කියනු ලද්දාවූ කුසලාකුසල කර්මයන්ගේ ඵලයෙක් විපාකයෙක් නැත.

5. මෙලොව නැත.

6. පරලොවක් නැත.

7. මව් කෙරෙහි මිථ්‍යා ප්‍රතිපන්න, සම්‍යග් ප්‍රතිපන්න-යන්ට කර්ම ඵලයෙක්, විපාකයෙක් නැත.

8. පියා කෙරෙහි මිථ්‍යා ප්‍රතිපන්න, සම්‍යග් ප්‍රතිපන්න යන්ට කර්ම ඵලයෙක්, විපාකයෙක් නැත.

9. පූර්ව භවයෙන් චුතව පශ්චිම භවයෙහි ඕපපාතිකව උපදනාසුලුවූ සත්ත්ව කෙනෙක් නැත.

10. යම් මහණ බමුණෙක් මෙලොවත් පරලොවත් තුමූම විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්‍ෂකොට දැන ප්‍රකාශකිරීමට සමත් වේද එබඳුවූ, සත්හුන් බවට පැමිණියාවූ අනුලොම පිළිවෙත මනාව පිළිපන්නාවූ, ධාර්මිකවූ මහණ බමුණු කෙනෙක් ලෙව්හි නැත්තාහ යනාදි වශයෙන් ගන්නාලද මිථ්‍යාදෘෂ්ටිය වේ.

තවද, දිට්ඨිගතවූ හෙවත් දෙසැටක් මිථ්‍යාදෘෂ්ටීන්හි පර්‍යාපන්නවූ යම් මිථ්‍යාදෘෂ්ටියක් වේද, දිට්ඨිගහණ නම් වූ, ඉක්මයානොහැකි අර්ථයෙන් වනදුර්ග, ගිරිදුර්ගාදීන් බඳුවූ යම් දෘෂ්ටි ගැනීමක් වේද, දිට්ඨි කාන්තාර හෙවත් චෞර කාන්තාර, ව්‍යාල කාන්තාර, මරු කාන්තාර, නිරුදක කාන්තාර, දුර්භික්‍ෂ කාන්තාරයන් බඳුවූ යම් දෘෂ්ටි කාන්තාරයෙක් වේද, දිට්ඨි විසූකායික නම් ලද සම්‍යග්දෘෂ්ටිය විනිවිදලන අර්ථයෙන්ද, සම්‍යග් දෘෂ්ටියට විලොම්වන අර්ථයෙන්ද යම් දිට්ඨි නම්ලද යවුලෙක් වේද, දිට්ඨිවිප්ඵන්දිත හෙවත් ශාස්වත උච්ඡෙද වශයෙන් සැලෙන අර්ථයෙන් යම් දෘෂ්ටි විෂ්ඵන්දනයෙක් වේද, දිට්ඨිසංයොජන හෙවත් දිට්ඨියෙන් බන්ධනයෙක් වේද, ග්‍රාහ හෙවත් ආලම්බනය දැඩිකොට ගන්නා අර්ථයෙන් යම් දැඩිකොට ගැනීමක් වේද, පතිට්ඨාගාහ හෙවත් බලවත්ව පවත්නා බැවින් මොනවට පිහිටා ගන්නා අර්ථයෙන් දෘෂ්ටි නම්ලද ප්‍රතිෂ්ඨා ග්‍රාහයෙක් වේද, අභිනිවෙස හෙවත් නිත්‍යාදි වශයෙන්

Free Distribution www.aathaapi.org

පවත්නා යම් දෘෂ්ට්‍යාභිනිවෙසයක් වේද, **පරාමාස** හෙවත් අනිත්‍යාදි ධර්මස්වභාවය ඉක්මපියා නිත්‍යාදි වශයෙන් අන් පරිද්දෙකින් ආමර්ශනය කරන්නා වූ යම් දෘෂ්ටියක් පරාමර්ශනයක් වේද, **කුම්මග්ග** හෙවත් යම් දෘෂ්ටිසඞ්ඛ්‍යාත දුර්මාර්ගයක්, දුගතීන්ට මාර්ගවූ යම් දෘෂ්ටියක් වේද, **මිථ්‍යාපථ** හෙවත් දිග් මූලා වූවකු විසින් මේ අසුවල් ගමට යන මගැයි ගත්මග තෙමේ ඒ ගමට නොපමුණුවන්නාසේ දෘෂ්ටිගතිකයා විසින් සුගතිපථ යයි ගත් දෘෂ්ටි තොමෝ තමා සුගතියට නොපමුණුවානුයි අසත්පථ වන අර්ථයෙන් දෘෂ්ටි **නම් ලද** යම් මිථ්‍යා පථයෙක් වේද, **මිච්ඡත්ත** හෙවත් දෘෂ්ටි නම්ලද මිථ්‍යා ස්වභාවයෙක් වේද, **තිත්ථායතන** හෙවත් බාල පෘථග්ජනයෝ එහිම පරිභ්‍රමණ වශයෙන් බැසගතිත්තුයි තීර්ථවූද, අනර්ථයන්ගේ උත්පත්තියට කාරණානුයි **ආයතනවූද,** යම් තීර්ථායතනයෙක් වේද, **විපරියෙසග්ගාහ** හෙවත් දෘෂ්ටි නම් ලද යම් විපර්‍ය්‍යාස වූ ග්‍රාහයෙක් වේද, වරදවා අරමුණු ගැනීමක් වේද යන මේ ආදිය **දිට්ඨුපාදානය** යයි කියනු ලැබේ.

3. **සීලබ්බතුපාදානය**— යම් මිථ්‍යා දර්ශනයක් ගෝසීල ගෝව්‍රත ආදී ශීලව්‍රතය දැඩිකොට ගනීද, එහෙයින් ඒ මිථ්‍යා දර්ශනය තෙම **ශීලව්‍රත** නමි. මෙවැනි ගෝසීලාදි යෙන් සංසාර ශුද්ධිය වේයයි කියා වරදවා ලබ්ධි ගන්නා හට තුමූම **උපාදානද** වේත්. මෙසේ වරදවා ගත් මෙබඳු ස්වභාවය ඇත්තාවූ යම් දෘෂ්ටියක්, දිට්ඨි ගත බවක්, දිට්ඨිගහණාදි බවෙක් වේද, ඒ මිථ්‍යා දෘෂ්ටිය **සීලබ්බතුපාදාන** යයි කියනු ලැබේ.

4. **අත්තවාදුපාදානය** - යම් ධර්ම ස්වභාවයක් කරණ කොට ගෙන සත්ත්වයෝ කියද්ද, ඒ ධර්ම ස්වභාවයෝ **වාද** නමි. එයම කරණකොට ගෙන දැඩිව ගනීද, එහෙයින් **උපාදාන** නමුදු වේ. ආත්මයාගේ ප්‍රකාශයට කාරණා වූවක්හු දැඩිකොට ගැනීම **ආත්මවාදෙපාදාන**



Free Distribution www.aathaapi.org

නම් වේ. ආත්මය යන වචන මාත්‍රයම හෝ ආත්මය යයි සත්ත්වයෝ මේ ධර්ම ජාතිය කාරණකොට ගෙන දැඩිකොට ගනිත්නුයි **අත්තවාදුපාදාන** නම්. තවද, විසි ආකාර සක්කාය දෘෂ්ටියටද අත්තවාදුපාදානය යයි කියනු ලැබේ.

එනම්, හෙතෙම

1. රූපය ආත්මයකැයි මොනවට දක්නේයි.
2. ආත්මය රූපවත් වූවක් කොට මොනවට දක්නේයි.
3. ආත්මය කෙරෙහි රූපය මොනවට දක්නේයි.
4. රූපය කෙරෙහි ආත්මය මොනවට දක්නේයි.

එමෙන්ම වේදනාවද, සංඥාවද, සංස්කාරයද, විඥානයද මෙසේ සතර සතර ආකාරයෙන් දක්නේය වරදවාගත් මෙබඳු ස්වභාවය ඇත්තාවූ යම් දෘෂ්ටියක්, දිට්ඨිගත බවක්, දිට්ඨිගහණාදි බවෙක් වේද, එය **අත්තවාදුපාදාන** නම්.

මෙහි කියනලද සතරාකාරවූ උපාදානයෝ තණ්හා ප්‍රත්‍යයෙන් ලත් උපාදානයෝ යි. තණ්හාව නැති කල්හි මේ උපාදානයෝ ඇති නොවෙත්.

තවද, උපාදානය පිළිබඳව, **උත්පත්ති ක්‍රම, ප්‍රහාණ ක්‍රම, දේශනා ක්‍රම** යන ත්‍රිවිධ ක්‍රමයන් අතුරෙන්, නුවණින් නොදත හැකි පූර්වාවධිය ඇති සසරෙහි මෙනම් කෙලශයාගේ පළමුකොට ඉපදීම වේයයි අවිද්‍යමාන වන හෙයින් **උත්පත්ති ක්‍රමය** නො වදාරනලදි. එක් අත්-බැවෙක්හි ආත්මදෘෂ්ටි ග්‍රහණය මුල්කොට ඇති **ශාස්වත, උච්ඡේද** දෘෂ්ටි වශයෙන් මිථ්‍යාභිනිවේශය කිරීම උපදී, හෙවත් **ආත්මවාදුපාදානය** පළමුකොට හටගනී. ඉක්බිති ඒ ආත්මය තෙම ශාස්වත යයි ලබ්ධි ගන්නා පුද්ගලයාහට ආත්මයාගේ විශුද්ධි භාවය මුල්කොට ඇති **සීලබ්බතුපා-දානය** උපදී. මේ ආත්මය විනාශවේයයි උච්ඡේද වශයෙන් ලබ්ධි ගන්නාවූ පරලෙව්හි අපේක්ෂා රහිත පුද්ගලයාහට **කාමුපාදානය** තෙම උපදී. මෙසේ නයින්

Free Distribution www.aathaapi.org

පළමුකොට **ආත්මවාදූපාදානයද,** ඊට ඉක්බිතිව දිට්ඨුපාදාන, සීලබ්බතුපාදාන, කාමුපාදානයන්ද පිළිවෙළින් උපදින්. මෙය උපාදානයන්ගේ එක් අත් බැවෙක්හි **උත්පත්ති ක්‍රමය** වේ.

**ප්‍රහාණ ක්‍රමය.** සෝවාන් මගින් නැසියයුතු හෙයින් **දිට්ඨුපාදානය, සීලබ්බතුපාදානය** සහ **අත්තවාදූපාදානයද** පළමුකොට ප්‍රහාණය කරනු ලැබේ. රහත් මගින් නැසිය යුතු හෙයින් **කාමූපාදානය** පසුව ප්‍රහාණය කරණු ලැබේ.

**දේශනා ක්‍රමය.** වහා විෂය වන බැවින්ද, ප්‍රකට වන බැවින්ද, කාමූපාදානය පළමුකොට වදාරන ලදී. ඒ **කාමෝපාදානය** අෂ්ටවිධ ලෝභමූල චිත්තයන් හා සමග යෙදෙන හෙයින් මහත්වූ උත්පත්තිස්ථාන ඇත්තේය. අනික් උපාදානයෝ තිදෙන දිට්ඨිගත සම්ප්‍රයුක්ත ලෝභචිත්තයන් හා සමග යෙදෙන හෙයින් අල්පවූ උත්පත්ති ස්ථාන ඇත්තාහ.

බෙහෙවින්, **ආලයරාමතාය** හෙවත් ආලය සඞ්ඛ්‍යාත පඤ්චොපාදානස්කන්ධයන්හි රමණය කරණ හෙයින් ආලයරාමතායවූ ප්‍රජාව කෙරෙහි කාමූපාදානය ප්‍රකට වේ. අනිත් උපාදානයෝ තිදෙන ප්‍රකට නොවෙත්.

කාමූපාදානය ඇති පුරුෂ පුද්ගලතෙම වස්තුකාමයන්ගේ ප්‍රතිලාභය පිණිස **දිට්ඨ, සුත,** මුත ආදී වශයෙන් පැවති කුතුහල මගුල් ආදිය බහුලකොට ඇත්තේ වේ. ඒ බව කාමෝපාදානය ඇති පුරුෂ පුද්ගලයාගේ **දිට්ඨුපාදානය** වේද, එහෙයින් කාමෝපාදානයට අනතුරුව දිට්ඨුපාදානය වදාළ සේක.

ඒ දිට්ඨුපාදානය තෙම ප්‍රභෙද වනුයේ **සීලබ්බතුපාදාන, අත්තවාදූපාදානයන්ගේ** වශයෙන් විප්‍රකාර වේ. ඒ දෙක අතුරෙන් ගෝක්‍රියා, කුක්කුට ක්‍රියාවන්ගේ වශයෙන් දතයුතු වන හෙයින් ඖදාරික වේද, එහෙයින් **සීලබ්බතුපාදානය** තෙම අත්තවාදූපාදානයට පළමු වදාළ සේක. සියුම් වන බැවින් අවසාන වශයෙන් **අත්තවාදූපාදානය** වදාළ සේක. මෙය උපාදානයන්ගේ දේශනා ක්‍රමයයි.

**ප්‍රත්‍යය වීම. කාමූපාදානයට තෘෂ්ණාතොමෝ උප-නිශ්‍රය ප්‍රත්‍යය** වශයෙන් **එක්** අයුරෙකින් ප්‍රත්‍යය වේ. තෘෂ්ණාව විසින් ඇලී බැඳී ගන්නාලද්දාවූ ආලම්බනයන්හි උපදනා හෙයිනි.

**සෙසු උපාදානත්‍රයට. 1. සහජාත, 2. අඤ්ඤමඤ්ඤ, 3. නිශ්‍රය, 4. සම්ප්‍රයුක්ත, 5. අස්ති, 6. අවිගත, 7. හෙතු** යන මොවුන්ගේ වශයෙන් සත් (7) අයුරෙකින් හෝ **උපනිශ්‍රය ප්‍රත්‍යය** හා සමග අට අයුරෙකින් හෝ ප්‍රත්‍යය වේ.

## උපාදාන පච්චයා භවො

බලවත් ලොභ දිට්ඨි සඞ්ඛ්‍යාතවූ උපාදානය හෙතු කොට ගෙන භවය ඇතිවේ. උපාදානය නැති කල්හි භවය ඇති නොවේ.

අර්ථ වශයෙන් වනාහි යම් ධර්ම සවභාවයෙක් තෙම වේද එහෙයින් ඒ ධර්මසවභාවයට **භව** යයි කියනු ලැබේ. ඒ භවය ද්විධ වේ. එනම්:

1. **කර්ම** භවය
2. **උපපත්ති භවය**

කර්මයම භවය වේනුයි **කර්මභව නම්** කර්මය හෙතුකොට පවත්නා විපාකසකන්ධ, කටත්තාරූප, භවය වේනුයි **උපපත්ති** භව **නම්**. එය එලොපචාර හෙවත් ඵලයාගේ නාම වශයෙනි.

භවයට පමුණුවන හෙයින් සියලු භවගාමි කර්ම **කර්ම** භව **නම්** වේත්. එය:

1. **පුණ්‍යාභිසංස්කාරය**
2. **අපුණ්‍යාභිසංස්කාරය**
3. **ආනෙඤ්ජාභිසංඛාරය** යයි ත්‍රිවිධ වේ.

**ධර්ම වශයෙන්**

**පුණ්‍යාභිසංස්කාරය—**

| | | |
|---|---|---|
| කාමාවචර කුසල චේතනා | 8 | 13 |
| රූපාවචර කුසල චේතනා | 5 | |

**අපුණ්‍යාභිසංස්කාරය—**

| | |
|---|---|
| අකුසල චේතනා | 12 |

**ආනෙඤ්ජාභිසංස්කාරය—**

| | |
|---|---|
| අරූප කුසල චේතනා | 4 |
| | 29 |

මේ එකුන්තිස් චේතනා ගත් කල්හි ඒ චේතනා හා සම්ප්‍රයුක්ත ධර්මයන්ද එයටම ඇතුළත්කොට **කර්මභව** යයි වදාරන ලදී.

**උපපත්ති භවය**

1. **ලෞකික විපාක**- කාමාවචර විපාක 23 } 32
මහග්ගත විපාක 9
2. **එම විපාක සිත්හි සම්ප්‍රයුක්ත චෛතසික** 35
3. **කර්මජ රූපයෝ** 20

යන මේ ධර්මයෝ **උපපත්ති භව** නම් වෙත්.

මේ උපපත්ති භවය **නවසත්ත්වාවාසයන්** ගේ වශයෙන් නව වැදෑරුම් වේ.

එනම්:

1. **කාම භවය**- කාම නම් ලද භවයයි. එනම් කාම භූමි එකොළොස ය. (11)

2. **රූප භවය**- රූප ලොක සොළොස ය (16)

3. **අරූප භවය**- අරූපතල සතර ය (4)

4. **සඤ්ඤි භවය**- සංඥා ඇති පුද්ගලයන්ගේ භවය හෝ හොත් සංඥාතොමෝ මේ භවයෙහි ඇත්තේනුයි සංඥා භව නම්.

එනම්:

| | |
|---|---|
| කාමභූමි එකොළොසය | 11 |
| අසංඥතලය හැර රූප තල පසළොසය | 15 |
| ආකාශානඤ්චායතනය | 1 |
| විඤ්ඤාණඤ්චායතනය | 1 |
| ආකිඤ්චඤ්ඤායතනය | 1 |
| | **29** |

5. **අසඤ්ඤි භවය**- අසංඥතලය යි.

6. **නෙවසඤ්ඤානාසඤ්ඤි භවය**- ඖදාරිකවූ සංඥාව ගේ නැති හෙයින් ද, සූක්ෂම වූ සංඥාවක් ඇති හෙයින් ද නෙවසඤ්ඤානාසඤ්ඤා නම් වූ භවයයි.

7. **එකවෝකාර භවය**- හුදු රූපස්කන්ධයෙන් ගැවසී ගත්තාවූ භවය තෙම **එකවෝකාර** භව නම් වේ. නොහොත් එක් රූපස්කන්ධයෙක් මේ භවයට ඇත්තේනුයි **එකවෝකාර** භව නමි. (අසංඥතලයයි)

8. **චතුවෝකාර භවය**- සතර නාමස්කන්ධයෙන් ගැවසී ගත්තාවූ භවය **චතුවෝකාර භවය** නම් වේ. (අරූප තල සතරය.)

9. **පඤ්චවෝකාර භවය**- පඤ්චස්කන්ධයෙන් ගැවසී ගත්තාවූ භවය **පඤ්චවෝකාර භවය** නම් වේ.

එනම්: අසංඥ තලය හැර රූපී බ්‍රහ්මලොක 15 } 26
කාම භූමි 11 }

යන භූමි 26 ය.

මෙය උපාදාන ප්‍රත්‍යයෙන් වන්නාවූ භවය වේ.

තවද, මේ උපාදාන ප්‍රත්‍යයෙන් සම්භව වන භවයාගේ ධර්ම කාය වශයෙන් වනාහී

1. **කාම භවය** - පඤ්චවිධවූ උපාදින්නස්කන්ධයෝයි.

2. **රූප භවය** - එසේම පඤ්චවිධවූ උපාදින්නස්කන්ධයෝයි.

3. **අරූප භවය** - චතුර්විධවූ උපාදින්නසකන්ධයෝයි.
4. **සඤ්ඤි භවය** - චතුර්විධවූ පඤ්චවිධවූ උපාදින්නසකන්ධයෝයි.
5. **අසඤ්ඤි භවය** - එක් උපාදින්නසකන්ධයකි.
6. **නෙවසඤ්ඤා නාසඤ්ඤා භවය** - චතුර්විධවූ උපාදින්නසකන්ධයෝයි.
7. **එකවෝකාර භවය** - එක් උපාදින්නසකන්ධයකි.
8. **චතුවෝකාර භවය** - චතුර්විධවූ උපාදින්නසකන්ධයෝයි.
9. **පඤ්චවෝකාර භවය** - පඤ්චවිධවූ උපාදින්නසකන්ධයෝයි.

උපාදාන ප්‍රත්‍යයෙන් වන්නාවූ කර්ම භවය පුණ්‍යාභිසංස්කාරාදි වශයෙන් ත්‍රිවිධ සංස්කාරයන් බව යට දක්වන ලදි. **එසේම** ප්‍රතිසන්ධි විඤ්ඤාණයට ප්‍රත්‍යවන ත්‍රිවිධ සංස්කාරයන් ද **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** යන්නෙන් දක්වා ඇති හෙයින් මෙහි වෙනස දතයුතු. **සංඛාර පච්චයා විඤ්ඤාණං** යයි කී තැන ඒ සංස්කාරයෝ **නම්** ප්‍රත්‍යුත්පන්න භවයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වන අතීත කර්මයෝයි. මේ භවනිර්දෙශයෙහි දක්වන ලද සංස්කාරයෝ නම් අනාගත භවයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වන කර්මයෝයි. **එසේම සංඛාර පච්චයා විඤ්ඤාණං** යයි කී තැන චේතනාවම සංස්කාර යයි දක්වන ලදී. මේ භව නිර්දෙශයෙහි චේතනාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ ද සංස්කාර යයි වදාරන ලදී.

තවද **සංඛාර පච්චයා විඤ්ඤාණං** යන්නෙන් විඤ්ඤාණය ප්‍රත්‍යයකොට ඇත්තාවූ කර්මය සංස්කාරයයි වදාළසේක. මේ නිර්දේශයෙහි අසංඥසත්ත්ව භවය උපදවන්නා වූ කර්මය ද සංස්කාරය යයි වදාරන ලදි.

**එමෙන්ම අවිජ්ජා පච්චයා සංඛාරා** යන තන්හි පුණ්‍යාභි සංස්කාරාදිවූ කුසලාකුසල ධර්ම වදාළහ. **උපාදාන**

පච්චයා භවො යථා තත්‍ථ උපපත්ති භවයත් ඇතුළත් කළ හෙයින් කුසලාකුසල අව්‍යාකෘත ධර්මයෝ සංස්කාරයෝ යයි වදළහ.

ප්‍රභෙද වශයෙන් වනාහි, කාමොපාදානය හේතු කොට ගෙන කාම භවය උපදවන්නාවූ යම් කර්මයෙක් කරනු ලැබේද, ඒ කර්ම සඞ්ඛ්‍යාතවූ භවය තෙම කර්ම භවය නම්. ඒ කර්ම භවය විසින් උපදවන ලද සකන්ධයෝ උපපත්ති භව නම්. එසේම කාමොපාදානය හෙතුකොට ගෙන රූප භවය උපදවන්නාවූ යම් කර්මයෙක් කරනු ලැබේද එය කර්ම භවය නම්. එයින් උපදවන ලද සකන්ධයෝ උපපත්ති භවය නම් කාමොපාදානය හෙතු කොට ගෙන අරූප භවය උපදවන්නාවූ යම් කර්මයෙක් කරනු ලැබේද, එය කර්ම භවය නම් එයින් උපදවන ලද සකන්ධයෝ උපපත්ති භවය නම්. මෙසේ කාමොපාදානය හෙතුකොට ගෙන ෂඩ් (6) විධවූ භව කෙනෙක් වෙති.

මෙපරිද්දෙන්ම දිට්ඨුපාදාන ප්‍රත්‍යයෙන් ෂඩ්විධවූ භව කෙනෙක්ද, සීලබ්බතුපාදාන ප්‍රත්‍යයෙන් ෂඩ්විධවූ භව කෙනෙක්ද, අත්තවාදුපාදාන ප්‍රත්‍යයෙන් ෂඩ්විධවූ භව කෙනෙක්දැයි උපාදාන ප්‍රත්‍යයෙන් වන්නාවූ භවයෝ සූවිසි කෙනෙක් වෙති. මෙයම, කර්ම භවයත් උපපත්ති භවයත් එක්කොට ගත් කල්හි එක් එක් උපාදාන ප්‍රත්‍යයයෙන් ත්‍රිවිධ ත්‍රිවිධ වූ භව කෙනෙක් වේ. එකල්හි සංක්‍ෂෙප වශයෙන් භවයෝ දොළොස් කෙනෙක් වෙති.

එසේම කාම භවයට පමුණුවන්නාවූ කර්මය කර්ම භවය වශයෙන්ද, ඒ කර්මයෙන් නිපන් සකන්ධයෝ උපපත්ති භව වශයෙන්ද ගත් කල්හි කාම භවයෝ දෙදෙනෙකි. රූප-භවයෝද දෙදෙනෙකි. අරූප භවයෝද දෙදෙනෙකි. මෙපරිද්දෙන් ෂඩ්විධවූ භව කෙනෙක් වෙති. කර්මභව, උපපත්ති භව වශයෙන් ප්‍රභෙදය නොසලකා කාම භව, රූප භව, අරූප භව වශයෙන් ගත් කල්හි භවයෝ තිදෙනෙකි. කාමභවාදී භෙදයද කර්මභව උපපත්තිභව

යන භෙදයද නොසලකා උපාදාන පච්චයා භවො යයි තත් කල්හි එක් භවයෙක් වේ. මෙසේ උපාදාන ප්‍රත්‍යයෙන් වන්නාවූ භවයාගේ ප්‍රභෙදය දතයුතු.

**ප්‍රත්‍යයවිම—** පෘථග්ජන තෙමේ උමතු අයකු වැනිය. හෙතෙම මේ කටයුත්ත යුතුය, මේ කටයුත්ත අයුතුය යි නො විමසා යම්කිසි උපාදානයක්හුගේ වශයෙන් යම්කිසි භවයක් ප්‍රාර්ථනා කොට යම්කිසි කර්මයක් කරන්නේමය. මෙසේ චතුර්විධවූ උපාදානය හෙතුකොට ගෙන ත්‍රිවිධවූ භවයම වේයයි දතයුතුයි.

මේ මිනිස් ලෙව්හි ඇතැම් පෘථග්ජනයෙක්, ඇසූ දුටු අනුසාරයෙන්, මේ කාමගුණයෝ නම් මිනිස් ලෙව්හි ක්‍ෂත්‍රිය මහාසාරාදී කුලයන්හිද, ෂට් කාමාවචර දෙවලොකයන්හිද සමෘද්ධයහ යයි සිතා ඒ කාම සම්පත් ලැබීම පිණිස පුරාණ භාරත ගීතාභරණ පශුඝාතන විධි ආදිකොට ඇති අසද්ධර්මශ්‍රවණාදියෙන් මුළාවී මේ කර්මය හෙතුකොට ගෙන කාම ගුණයෝ සමෘද්ධවෙත් යයි හඟිමින් කාමූපාදානයාගේ වශයෙන් කාය දුශ්චරිතාදීන්ද කෙරෙයි. ඒ හේතුවෙන් හෙතෙමේ අපායෙහි උපදී. ඒ අපාය භූමියෙහි ඒ පුද්ගලයාගේ උත්පත්තියට හෙතුවවූ කර්මය, **කර්ම** භව නමි. කර්මයෙන් ජනිතවූ ස්කන්ධයෝ **උපපත්ති** භව නමි.

අන්‍යවූ පෘථග්ජනයෙක් සද්ධර්මශ්‍රවණාදියෙන් වැඩියෙන් වඩාගත් නුවණ ඇත්තේව මේ කර්මය හේතුකොට ගෙන කාම ගුණයෝ සමෘද්ධවෙත් යයි හඟිමින් කාමොපාදාන වශයෙන් කාය සුචරිතාදීන් කෙරෙයි, හෙතෙමේ ඒ හේතුවෙන් දෙවියන් කෙරෙහි හෝ මිනිසුන් කෙරෙහි හෝ උපදී. ඒ දෙව් මිනිස් දෙගතීන්හි උත්පත්තියට හෙතුව වූ කුසල කර්මය, **කර්ම** භව නමි. ඒ කුසල කර්මයෙන් නිපන් ස්කන්ධයෝ **උපපත්ති** භව නමි.

අන්‍යවූ පෘථග්ජනයෙක් රූපාරූප භවයන්හි කාම ගුණයෝ ඒ දෙව් මිනිස් ලෙව්හි කාමගුණයන්ට වඩා-

අතිශයින් සමෘද්ධයහයි අසා හෝ පරිවිතර්කනය කොට හෝ කාමූපාදානයාගේ වශයෙන් රූපාරූප සමාපත්තීන් උපදවා සමාපත්ති බලයෙන් රූපාරූප බඹලෙව්හි උපදී. ඔහුගේ බඹලෙව්හි උත්පත්තියට හෙතුව වූ මහද්ගත කර්මය **කර්ම භව** නමි. එයින් නිපන් ස්කන්ධයෝ **උපපත්ති භව** නමි.

මෙසේ **කාමෝපාදානය** තෙම ත්‍රිවිධ භවයන්ටම ප්‍රත්‍යය වේ.

අන්‍යවූ පෘථග්ජනයෙක්, මේ ආත්මය තෙමේ කාමාවචර සම්පත්ති භවයෙහි හෝ, රූපාරූප භවයන් අතුරෙන් එක්තරා භවයෙක්හි හෝ විනාශවනුයේ සකලවෘත්තදුක්ඛය සමූලඝාතනය කිරීම් වශයෙන් මනාකොට අභාවප්‍රාප්ත වූයේ වේ යයි සිතා උච්ඡෙද දෘෂ්ටිය දැඩිකොටගෙන ඒ කාමභව, රූපභව, අරූපභවයන්ට පමුණුවන්නාවූ කාමාවචර, මහද්ගත කර්ම කෙරෙයි. ඔහුගේ ඒ කර්මය **කර්ම භව** නමි. එයින් ජනිතවූ ස්කන්ධයෝ **උපපත්ති භව** නමි. මෙසේ **දිට්ඨුපාදානය** තුන්වැදෑරුම් වූ කාම, රූප, අරූප භවයන්ට ප්‍රත්‍යය වේ.

අන්‍යවූ පෘථග්ජනයෙක් මේ ශීලව්‍රතය නම් කාමාවචර රූපාවචර, අරූපාවචර භවයන් අතුරෙන් එක්තරා භවයක හෝ සම්පූර්ණ කරන්නාහට, සුඛය සම්පූර්ණ වේ යයි සිතා සීලබ්බතුපාදාන වශයෙන් ඒ කාම, රූප, අරූප භවයන්ට පමුණුවන්නාවූ කාමාවචර, මහද්ගත කර්මය කෙරෙයි. ඔහුගේ ඒ කර්මය **කර්ම භව** නමි එයින් නිපන් ස්කන්ධයෝ **උපපත්ති භව** නමි. මෙසේ සීලබ්බතුපාදානයද ත්‍රිවිධවූ භවයන්ට ප්‍රත්‍යය වේ.

අන්‍යවූ පෘථග්ජනයෙක් මේ ආත්මය නම් කාම. රූප, අරූප භවයන් අතුරෙන් එක්තරා භවයෙක හෝ සැප ඇත්තේ වේ, පහවූ රාග පරිතාප ඇත්තේ වේ යනාදී වශයෙන් සිතා **අත්තවාදූපාදානය** කරණකොටගෙන ඒ කාම, රූප, අරූප භවයන්ට පමුණුවන්නාවූ කාමාවචර

මහද්ගත කර්මය කෙරෙයි. ඔහුගේ ඒ කර්මය, **කර්ම** භව නම්. එයින් නිපන් **ස්කන්ධයෝ උපපත්ති** භව නම්. මෙසේ අත්තවාදූපාදානය තෙම ත්‍රිවිධවූ භවයන්ට ප්‍රත්‍යය වේ.

චතුර්විධවූ මේ **උපාදානය** තෙම, රූපාරූප භවයන්ටද කාම භවයෙහි ඇතුළත්වූ කර්මභවය අතුරෙන් කුසල කර්ම භවයටද, උපපත්ති භවයටද **උපනිශ්‍රය** ප්‍රත්‍යය වශයෙන් **එක්** අයුරෙකින් ප්‍රත්‍යය වේ.

**කර්ම** භවය අතුරෙන් තමා හා සම්ප්‍රයුක්තවූ අකුසල කර්මභවයට **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්ප්‍රයුක්ත, අත්ථි, අවිගත, හෙතු** ප්‍රත්‍යයයන්ගේ වශයෙන් සත් (7) පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

විප්‍රයුක්තවූ අකුසල කර්ම භවයට වනාහි **උපනිශ්‍රය ප්‍රත්‍යය** වශයෙන්ම ප්‍රත්‍යය වේ.

## භව පච්චයා ජාති

**භවය** ප්‍රත්‍යය කොටගෙන **ජාතිය** වන්නේය. මෙහි **භවය** යන්නෙන් **කර්ම භවයම** අදහස් කරන ලදී. මේ **කර්ම** භව සඞ්ඛ්‍යාතවූ එකුන්තිස් (29) චෙතනාවන්ගේ උපකාරයෙන් **එක්** භවයෙක්හි ඇතුළත්වූ ස්කන්ධ පරම්පරාවගේ පළමුවන හටගැනීම නම්වූ **ජාතිය** පහළවේ. ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්ව සමූහයෙහි යම් ඉපදීමක් හෙවත් පළමුව පටිසන්ධි විඤ්ඤාණයත් සහිතවූ පඤ්චස්කන්ධයන්ගේ පහළවීම නම්වූ **ජාතියක්** වේද, සංජාත හෙවත් සම්පූර්ණ ආයතනයන් ඇතිව මොනවට ඉපදීමක් වේද, බැසගැන්මක් හෙවත් අණ්ඩජ ජලාබුජ වශයෙන් සත්ත්වයෝ අණ්ඩකොෂයෙහිද, වස්තිකොෂයෙහිද පිළිසිඳ ගැනීම් වශයෙන් බැසගැනීම ප්‍රවෙශවීම නම්වූ **අවක්‍රාන්තියක්** වේද, **අභිනිබ්බත්තියක්** හෙවත් සංසේදජ, ඕපපාතික වශයෙන් සත්ත්වයන් ගේ යම් ප්‍රකටවූ පහළවීමක්, විශෙෂ ඉපදීමක් වේද, එකවොකාර, චතුවොකාර පඤ්චවොකාර-

යන්ගේ වශයෙන් **ස්කන්ධයන්ගේ** යම් **පහළවීමක්** වේද; **ආයතනයන්ගේ ප්‍රතිලාභයක්** වේද මෙයට **ජාතිය** යයි කියනු ලැබේ.

ජාතියගේ පහළවීමට **කර්ම** භවය තෙමේ **නානාක්‍ෂණික කර්ම ප්‍රත්‍යය, ප්‍රකෘතෘපනිශ්‍රය ප්‍රත්‍යය** වශයෙන් දෙපරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

ජාතියගේ පහළවීමට **කර්ම** භවය මුත් අන් **ප්‍රත්‍යයක්** නොමැති හෙයින් **භව පච්චයා ජාති** යයි වදාරන ලදී.

## ජාති පච්චයා ජරාමරණං

**ජාතිය** විද්‍යමාන කල්හිම ජරා මරණාදි දුක්ඛ ධර්ම-යන්ගේ පහළවීම වන හෙයින් ද, ජාතිය අවිද්‍යමාන කල්හි ඒ දුක්ඛ ධර්මයන්ගේ පහළවීමක් නොවන හෙයින් ද, **ජාති පච්චයා ජරා මරණං** යයි වදාළසේක.

ඒ ඒ සත්ත්වනිකායයෙහි උපන්නාවූ ඒ ඒ සත්ත්ව-යන්ගේ යම් දිරීමක් දිරණ බවක්, කැඩුනු බිඳුනු බවක්, පැසුණු බවක්, වියලි බවක්, ආයුෂයාගේ පිරිහීමක්, ඉන්ද්‍රියයන්ගේ මිහි කිරීම් බවක් වේද එයට ජරාව යයි කියනු ලැබේ.

ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායයෙන් යම් චුතියක්, චුතවන බවක්, බිඳීමක්, අන්තර්ධානයක්, මිය-යාමක්, කාලක්‍රියාවක්, ස්කන්ධයන්ගේ බිඳීමක්, ශරීරයාගේ බහා තැබීමක්, ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීමක් වේද එය මරණ නම්.

එක් භවයක ජාතියත් මරණයත් අතර මේ ජාතිය නිසාම පහළවන්නාවූ **ශෝක, පරිදෙව, දුක්ඛ, දෞර්මනස්‍ය, උපායාස** යන දුක්ඛ ධර්මයන්ද මෙයටම ඇතුළත් වේ·

ඥාතිව්‍යසන, භෝග ව්‍යසන, රෝගව්‍යසන, සීලව්‍යසන, දිට්ඨිව්‍යසන යනාදි ව්‍යසනයන් අතුරෙන් එක්තරා

ව්‍යසනයකින් යුත් පුද්ගලයාගේ යම් ශෝකයක්, ශෝකයාගේ අකාරයක්, ශෝක කරන්නහුගේ ස්වභාවයක්, අභ්‍යන්තරයෙහිවූ ශෝකයක්, අභ්‍යන්තරයෙහි වියලවන්නාක්හු මෙන් ඇතිවන ශෝකයක්, චිත්තයාගේ දවන ආකාරයක්, දුකට පත්සිතක් හෙවත් දෞර්මනස්සක් ශෝක නමැති හුලක් වේද එයට **ශෝක** යයි කියනු ලැබේ.

ඥාතිව්‍යසනාදියෙන් මඩනලද පුද්ගලයාගේ යම් නම් කියා හැඬීමක්, ගුණ කියා හැඬීමක්, නම් කියා හඬන ස්වභාවයක්, ගුණ කියා හඬන ස්වභාවයක්, නම් කියා හඬන බවක්, ගුණ කියා හඬන බවක්, නිශ්ඵල වචනබිණීමක්, නැවත නැවත තෙපලීමක්, නැවත නැවත තෙපලන බවක් වේද, එයට **පරිදේව** යයි කියනු ලැබේ.

යම් කායික දුකක්, කායික අපහසුවක්, කය හා ස්පර්ශ වීමෙන් උපන්නා වූ අපහසු වූ වේදනා ආකාර වූ දුකක් වේද කය හා ස්පර්ශ වීමෙන් හටගත් ඒ දුක් වූ අපහසු වූ වේදනාවනට **දුක්ඛය** යයි කියනු ලැබේ.

දුක් වූ, අමධුර වූ යම් චෛතසික දුකක් වේද, දුක් වූ අමධුර වූ විඳියයුතු වූ සිත හා සපර්ශයෙක් වේද, සිත හා සපර්ශ වූ අමධුර වූ දුක් වූ වේදනාවක් වේද, එය **දෞර්මනස්ස** නමි.

ඥාති ව්‍යසනාදියෙන් මඩනාලද පුද්ගලයාගේ යම් සිත්හි වෙහෙසීමක්, කලානත බවක්, බලවත් කලානත බවක් දැඩි කලානත බවක් වේද එය **උපායාස** නමි.

මෙසේ මේ ජාති තොමෝ, ජරා මරණ දුක්ඛයට ද, ශෝක, පරිදේව, දුක්, දෞර්මනස්, උපායාසයන්ට ද ප්‍රත්‍යය වෙත්. ජාතිය නැති කල්හි ජරාමරණාදීහු නැත්තාහුමය.

මේ ජාතිතොමෝ ජරා මරණ ශෝක පරිදේව දුක්ඛ, දෞර්මනස්ස, උපායාසාදීන්ට **උපනිශ්‍රය** ප්‍රත්‍ය ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

මෙසේ, මේ අංග දොළොසකින් යුත් මේ භව චක්‍රය සියලු දුක් සමූහයාගේ ඇතිවීමට ප්‍රත්‍ය වේ මය.

තව ද, මේ භව චක්‍රයෙහි ශොකාදි ධර්ම සමූහයක් අනතයෙහි වදාළාහු ද, ඒ ශොකාදීහු හෙතුකොට ගෙනම ආදියෙහි දක්වන ලද, අවිද්‍යා තොමෝ සිද්ධවේමය. එසේම, මේ භව චක්‍රය තෙමේ නොබුදු බූවන් විසින් නොදත් පූර්වමයඝාද්‍යව ඇත්තේ ය. කාරක වේදක රහිතය හෙවත් කරන්නා වූ, විඳින්නා වූ පුද්ගලානතරයන් කෙරෙන් විරහිතය. වාදශප්‍රකාර වූ ශූන්‍යතායෙන් ශූන්‍යය. නිත්‍යයෙන් සම්බන්ධයට පැමිණියේව පවතී.

මේ ජරා මරණාදීන් අතුරෙන් ශොක, දුක්ඛ, දෞමනස්ස, උපායාස යන මොවුහු අවිද්‍යාව හා වෙන් නොවූවාහු වෙත්. පරිදෙවය නමුදු මොහයෙන් මූළා වූ සත්ත්වයාහටම වේ. එහෙයින් ඒ ශොකාදීන් පළමුව සිද්ධ වූ කල්හි අවිද්‍යා තොමෝ සිද්ධවූවාම වේ.

ආශ්‍රවයන්ගේ හටගැනීම් හෙතුවෙන් ද ඒ ශොකාදීහු වෙත්. වස්තුකාමයන් හා වෙන්වීම ඇති කල්හි ශොකය තෙම කාමාශ්‍රවය හෙතුකොට ගෙන වේ. වස්තු කාමයන්හි ඇලුනා වූ සිත් ඇති නොහොත් කෙලශකාම සංඛ්‍යාත වූ යානය ඇති, උපන් ඡන්දරාගය ඇති, ඒ සත්ත්වයාහට ඒ වස්තුකාමයෝ යම් හෙයකින් වියෝව, පිරිහෙද්ද, ඒ සත්ත්වතෙම හෙල්ලෙන් විදුනා ලද මුවකු මෙන් ශොක පරිදෙවාදී දුක්ඛයෙන් පෙළෙයි.

ඒ ශොකාදීහු දිට්ඨාශ්‍රවය හෙතුකොට ගෙනද වෙත්. රූපය තෙමේ මම වෙමි, මාගේ රූපය වේ, යනාදි වූ දෘෂ්ටිය හෙතුකොට ගෙන මතුවී සිටිනාසිලි වූ පුද්ගලයා-හට, රූපයාගේ ප්‍රකෘති සවභාවය හැර අන් අයුරෙකින් වීමය යන හෙතුවෙන් ශොක පරිදෙව, දුක්, දෞම්නස් උපායාස යන මොවුහු උපදිති.

එසේම භවාශ්‍රවය හේතුකොට ගෙන ද ශෝකාදීහු වෙත්. දීර්ඝායුෂ්ක වූ, වර්ණවත් වූ, සැප බහුල වූ යම් දෙවිකෙනෙකුත් උස් වූ දෙව් විමන්හි අතිදීර්ඝ කාලයක් මුළුල්ලෙහි සිටිද්දී, ඒ දෙවියෝ ද තථාගතයන් වහන්සේගේ ධර්මදේශනාව අසා භීතියට, තැතිගැන්මට, සංවේගයට පැමිණෙත්. පඤ්ච ප්‍රකාර වූ පූර්වනිමිත්තයන් දැක මරණ බියෙන් තැතිගත්වන ලද දෙවියන්ට භයෙක්, සන්ත්‍රාස-යෙක්, සංවෙගයෙක් උපදනා මෙති. ඒ පඤ්ච පූර්වනිමිත්හු නම් මල්දම් මැලවීම, දිවසළු කෙලෙසීම, කිසිලිවලින් ඩා මිදීම, කයෙහි පැහැ වෙනස්බවට පැමිණීම, දෙවාසනයෙහි නො ඇලීම යන මොව්හුය. ඒ නිමිති දැක කම්ම සමුට්ඨාන සඞ්ඛ සඞ්ඛ්‍යාත වූ උපපත්ති භවයෙහි භව තෘෂ්ණා බලයෙන් දෙවියනට අධික වූ ශෝක දුක්ඛයන් උපදී.

එමෙන් ම අවිද්‍යාශ්‍රවය හේතුකොට ගෙන ද ශෝකාදීහු වෙත් ඒ අඥාන පුද්ගලතෙම මේ ආත්මභාවයෙහිම ශෝක, පරිදෙව, දුක්, දෞර්මනස් විඳියි. මෙසේ ආශ්‍රව සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය වීම ඇති කල්හි අවිද්‍යා සඞ්ඛ්‍යාත ඵලය වේ. මේ නයින් ශෝකාදීන් හේතුකොට ගෙන අවිද්‍යාව ඇතිවීමෙන් භව චක්‍රය නොසිඳී පවත්නේ ය. හේතුඵල පරම්පරාවගේ අවසානයක් ද නැත.

**දොළොස් අඞ්ගයකින් යුක්** මේ භව චක්‍රය **නොදත් පූර්වාවධිය ඇත්තේ ද** වේ. මෙසේ භව චක්‍රයාගේ අනාදිමත් භාවය ඇති කල්හි, **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** යනාදි වශයෙන් අවිද්‍යාව ආදිකොට දක්වන ලදුයේ එය ප්‍රධාන ධර්මයක් බැවිනි ත්‍රිවිධ වූ වෘත්ත දුක්ඛයන්ට අවිද්‍යා තෝමෝ ප්‍රධාන ධර්මයක් වන්නේ ය. ත්‍රිවිධ වෘත්තයෝ නම්, **ක්ලේශවෘත්ත, කර්මවෘත්ත, විපාකවෘත්ත** යන මොව්හු ය. අවිද්‍යාව ඇති කල්හිම අවිද්‍යාව කෙරෙන් අන්‍ය වූ ක්ලේශවෘත්තය ද, කර්මවෘත්ත, විපාකවෘත්තයෝ ද අඥාන ජනයා අනෙක දුක්ඛයන්ගෙන් වැඩුණු සංසාර නමැති බන්ධනාගාරයෙහි හාත්පසින්ම වෙළෙත්. සර්ප-යෙකුගේ හිස අල්වා ගැනීම නිසා එයින් අන්‍ය වූ සර්

ශරීරය අත වෙළුන්නාක් මෙනි. අවිද්‍යාව මුලින් සිඳලූ කල්හි, ඒ ක්ලෙශ, කම්ම, විපාක යන ත්‍රිවිධ වෘත්තයන්ගෙන් මිදුනේ වේ. සර්ප හිස සිඳ දැමූ කල්හි අත වෙළාගත් සර්ප ශරීරය කෙරෙන් මිදෙන්නාක් මෙනි. මේ බව **අවිජ්ජා යත්වෙව අසෙස විරාග නිරොධා සඞ්ඛාර නිරොධො** යනාදී පාඨයෙන් දක්වා වදාළසේක. ආර්‍ය-මාර්ගඥානයෙන් අවිද්‍යාව සහමුලින් නිරුද්ධ කිරීම හෙතු-කොටගෙන සඞ්ඛාරයන්ගේ නිරුද්ධවීම වේ. මෙසේ අවිද්‍යාව ගන්නා වූ තොහොත් උපදනා පුද්ගලයාගේ ත්‍රිවිධ වෘත්තයෙහි බැඳීමත්, අවිද්‍යාව මුදන්නා වූ තොහොත් නිරුද්ධකළ පුද්ගලයාගේ ත්‍රිවිධ වෘත්තයෙන් මිදීමත් වේ. මෙසේ හෙයින් අවිද්‍යාව ප්‍රධාන ධර්මයක් වශයෙන් මිස ආදි ධර්මයක් වශයෙන් දෙශනා නොකළ බව දතයුතු.

මේ භව චක්‍රයෙහි අවිද්‍යාව ආදිකොට ඇති කාරණා වලින් සඞ්ඛාරාදීන්ගේ පැවැත්ම වේද, එහෙයින් ඒ අවිද්‍යාදී කාරණා වලින් අන්‍ය වූ සංසාරය නිර්මාණය කරන්නා වූ පරමෙශ්වර මහා බ්‍රහ්මාදී කෙනෙක් නැත්තේ ය. කාරක-යෙක් නැත්තේම ය. එමෙන්ම මාගේ ආත්මය ඒ ඒ වැඩ අවැඩ පවසන්නේය, සුව දුක් ආදිය විඳින්නේය, සියලු අරමුණු දන්නේය යනාදියක් නොමැති හෙයින් ආත්මය කෙරෙන් තොරවේ. වෙදකයෙක් හෙවත් විඳින්නෙක් ද නැත්තේම ය. මෙසේ මේ භව චක්‍රය කාරක වෙදක පුද්ගලාන්තරයන් කෙරෙන් තොරවේ යයි දත යුතු.

භව චක්‍රයෙහි දෙළොස් අඞ්ගයෝ තුමූ **නිත්‍ය, සුඛ, සුභ, ආත්ම** තාවයන්ගෙන් ද ශූන්‍යයහ.

**අවිද්‍යාව,** උදයව්‍යය ධර්ම ස්වභාවයෙන් හෙවත් ඉපදීම බිඳීම ස්වභාව කොට ඇති බැවින් **නිත්‍යතාවයෙන්** ශූන්‍යහ. සත්ත්වයාහට බාධක, තාපන ආදිය කරන හෙයින් ද, ඒ තැවීම් ආදිය කරන්නා වූ ක්ලෙශ ධර්මයන්ට අරමුණු වන හෙයින් ද **සුඛත්වයෙන්** ශූන්‍යහ. ඉපදීම් බිඳීම්

සවභාවයෙන් නැවත නැවත වැඩියක් පෙළන බැවින් **සුඛත්වයෙන්** ද ශූන්‍යහ. ප්‍රත්‍යයන් අයත් පැවතුම් ඇති බැවින් සිය කැමැත්ත සේ පවත්නා වූ **ආත්ම සවභාව**-යෙන් ද ශූන්‍යහ. සංසකාරාදීහුද මෙසේම **නිත්‍ය, සුභ, සුඛ, ආත්ම** සවභාවයෙන් ශූන්‍යහ. යම් හෙයකින් අවිද්‍යාව ආත්මයක් නොවේ ද, තමා සතුවූවක් නොවේ ද, තමා කෙරෙහි නොවේ ද, ආත්මවත් වූවක් නොවේ ද, එසේම සංසකාරය ආදි කොට ඇති අඞගයෝ ද ආත්මයෝ නොවෙති. තමා සතුවූවහු ද නොවෙති. ආත්මයන් කෙරෙහි නොවෙති. ආත්මවත් වූවාහු නොවෙති. එහෙයින් මේ භව චක්‍රය දොළොස් විධ වූ අවිද්‍යාදී ධර්මයන්ගේ ධ්‍රුව, සුභ, සුඛ ආත්මභාව ශූන්‍යත්වයෙන් ශූන්‍ය වේ යයි දතයුතු.

මේ භව චක්‍රයාගේ මූල දෙකෙකි. **කාලයෝ** තිදෙ-නෙකි. එහි දොළොස් අඞගයන් අතුරෙන් අඞග දෙකක් අතීත කාලිකය. අඞග අටක් පච්චුප්පන්නය. අඞග දෙකක් අනාගතය.

භව චක්‍රයාගේ අඞග දොළොස අතුරෙන් මූලධර්ම වශයෙන්

1. අවිද්‍යාව
2. තණ්හාව

යන අඞග දෙක වදුරා තිබේ.

අතීත සකන්ධ කොට්ඨාසය කෙරෙන් වර්තමාන විපාකය එළවන හෙයින් **අවිද්‍යාව** මුල්කොට ඇති **වේදනාව** අවසන් කොට ඇති **එක්** භව චක්‍රයකි.

අනාගත සකන්ධ කොට්ඨාසය හා ගළපන හෙයින් **තණ්හාව** මුල්කොට ඇති, **ජරා මරණය** අවසන් කොට ඇති **එක්** භව චක්‍රයකි. මෙසේ භවචක්‍රය ව්ධ වේ.

ව්ප්‍රකාරවූ මේ භව චක්‍රයන් අතුරෙන් **අවිද්‍යාමූලක** භව චක්‍රය **දෘෂ්ටි චරිත** පුද්ගලයාගේ වශයෙන් ද, **තණ්හාමූලක** භව චක්‍රය **තෘෂ්ණා චරිත** පුද්ගලයාගේ වශයෙන්ද දෙශනා

කරන ලදී. දෘෂ්ටි චරිතයාගේ අවිද්‍යා තොමෝ ඔහුගේ සසර පැවැත්ම කරන්නීය තෘෂ්ණා චරිතයාගේ තෘෂ්ණා තොමෝ ඔහුගේ සසර පැවැත්ම කරන්නීය.

තවද, උච්ඡේද දෘෂ්ටිය නිරවශෙෂ කොට ප්‍රහීන කිරීම සඳහා පළමුවන **අවිද්‍යාමූලක** භවචක්‍රය දෙශනා කරනලදී. විඥානාදී වර්තමාන ඵල ධර්මයන්ගේ ඉපැද්ම නොහොත් ඒ ඵල ධර්මයන්ගේ හට ගැන්මෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන් නොදත හැකිවූ පූර්ව භවයෙහි එයට කාරණා වූ අවිද්‍යා, සංස්කාරයන්-ගේ නොසිඳ පැවැත්ම දක්වා උච්ඡේද දෘෂ්ටිය වළක්වයි.

ශාස්වත දෘෂ්ටිය නිරවශෙෂකොට ප්‍රහීන කිරීම සඳහා දෙවන **තෘෂ්ණා මූලක** භව චක්‍රය විදාරණ ලදී. උපන්නා වූම විඥාන, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වෙදනා-වන්ගේම දිරීම, බිඳීම හෙවත් ජරා මරණ වන බව දක්වීමෙන් ශාස්වත දෘෂ්ටිය වළක්වයි.

පළමුවන භව චක්‍රයෙහි වෙදනා තොමෝ තෘෂ්ණාව හා සම්බන්ධය ඇති අවිද්‍යාවට ප්‍රත්‍යය වේ එහෙයින් වෙදනාව හෙතුකොට ගෙන අවිද්‍යාව වන්නීයයි දතයුතු. අවිද්‍යාවගේ ගැනීමෙන් තෘෂ්ණා උපාදාන යන දෙදෙනාද ගන්නා ලද්දේවේ. අවිද්‍යාව හෙතුකොට ගෙන සංසකාරයෝ වන්නාහ. මෙහි සංසකාර ග්‍රහණයෙන් කර්ම භවය ගන්නා ලද්දේ වේ. විඥානාදීන්ගේ ග්‍රහණයෙන් ජාති ජරා මරණ යෝද, ශොකාදීහුද ගෘහිතයහ. මෙසේ සම්බන්ධවන හෙයින් හෙවත් වෙදනාදීවූ ඵලයන්ගේ අවිද්‍යාදීවූ හේතූන් හා නැවත සම්බන්ධවන හෙයින් වෙදනාව අවසන් කොට ඇති පළමු වන භව චක්‍රය දක්වා විදාරණ ලදී.

දෙවන භව චක්‍රයෙහි ජරා මරණාදී ප්‍රත්‍යයයෙන් තෘෂ්ණාව ද, තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් උපාදානයද යනාදි වශයෙන් ලැබේ. මෙහි තෘෂ්ණා උපාදානයන්ගේ ගැනීමෙන් අවිද්‍යාවද, භවය ගැනීමෙන් සංස්කාරයෝ ද ගන්නා ලද්දේ වේ. ජාති ජරා මරණාදීය ගැනීමෙන් විඥානාදී විපාකයෝ ද ගන්නා ලදහ.

තවද, ගර්‍භසෙය්‍යක සත්ත්වයන්ගේ වශයෙන් පළමුවන අවිද්‍යා මූලක භව චක්‍රය වදාරන ලදී. එහි සංස්කාර ප්‍රත්‍යය යෙන් විඥානයද, විඥාන ප්‍රත්‍යයයෙන් නාමරූපද යනාදී වශයෙන් ධර්මයන්ගේ පිළිවෙල නොසිඳ පැවැත්ම දක්වන ලදී මෙයින් ගර්භසෙය්‍යක සත්ත්වයන්ගේ අපරිපූර්ණවූ ආයතන ඇති කලල රූපය වදාරා ඉක්බිති ඒ නාමරූපයන් ප්‍රත්‍යය කොට ඇති ෂඩායතනයන්ගේ ප්‍රවෘත්ති තොමෝ වදාරන ලදී.

එමෙන්ම, ඕපපාතිකවූ සත්ත්වයන්ගේ වශයෙන් දෙවන තෘෂ්ණා මූලක වූ භව චක්‍රය වදාරන ලදී. එහි උපාදාන ප්‍රත්‍යයයෙන් භවයද, භව ප්‍රත්‍යයයෙන් ජාතියද යනාදී වශයෙන් උපපත්ති සකන්ධයන්ගේ එක්ව පහළවීම දක්වන ලදී.

ඒ භව චක්‍රයාගේ **කාල** තුනෙක් වෙත්.

එනම්: **1. අතීත කාලය**
**2. වර්තමාන කාලය**
**3. අනාගත කාලය** යන ත්‍රිවිධ කාලයෝය.

ඒ ත්‍රිවිධ කාලයන් අතුරෙන් **අවිද්‍යාව** සහ **සංඛාර** යන අඞ්ග දෙක අතීත කාලයට අයත් අඞ්ගයෝය. **විඥාන, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන** භව යන අඞ්ග අට වර්තමාන කාලයට අයත් අඞ්ගයෝය. **ජාති ජරා මරණ** යන අඞ්ගයෝ දෙදෙන අනාගත කාලයට අයත් අඞ්ගයෝය.

තවද, ඒ භව චක්‍රයාගේ **සන්ධි තුනෙක්ද, සංක්ෂෙප සතරෙක්ද, අර විස්සෙක්ද, වට්ට තුනෙක්ද** වෙති.

## ත්‍රිසන්ධිය

භව චක්‍රයාගේ සන්ධි තුනෙක් වේ.

එනම්: **1. පළමුවන හෙතුඵල සන්ධිය**
**2. දෙවන ඵලහෙතු සන්ධිය**
**3. තුන්වන හෙතුඵල සන්ධිය** යනුයි.

ඒ ත්‍රිසන්ධීන් අතුරෙන්, සංස්කාරයන්ගේද, ප්‍රතිසන්ධි විඥානයාගේද අතර හෙතුව හා ඵලය ගැලපීම නම්වූ පළමුවන හෙතුඵල සන්ධිය වේ. වෙදනාවගේද, තෘෂ්ණාවගේද අතර ඵලය හා හෙතුව ගැලපීම නම්වූ දෙවන ඵලහෙතු සන්ධිය වේ. භවයාගේද, ජාතියගේද අතර හෙතුව හා ඵලය ගැලපීම නම්වූ තුන්වන හෙතුඵල සන්ධිය වේ.

## චතුර්විධ සංක්ෂෙපය

1. **පළමුවන සංක්ෂෙපය**- අවිද්‍යාව සහ සංඛාර යන අඞ්ගයෝ දෙදෙන **පළමුවන සංක්ෂෙපය** වේ.

2. **දෙවන සංක්ෂෙපය**- විඥාන, නාමරූප, සළායතන ඵස්ස, වෙදනා යන අඞ්ගයෝ පස්දෙනා **දෙවන සංක්ෂෙපය** වේ.

3. **තුන්වන සංක්ෂෙපය**- තණ්හා, උපාදාන, භව යන අඞ්ගයෝ තිදෙන **තුන්වන සංක්ෂෙපය** වේ.

4. **සතරවන සංක්ෂෙපය**- ජාති, ජරාමරණ, යන අඞ්ගයෝ දෙදෙන **සතරවන සංක්ෂෙපය** වේ.

## විසි ආකාර අර

මේ **අරයෝ විසිදෙන** සතර කොටසකට බෙදා දක්වනු ලැබේ.

එනම්:

1. අතීත හෙතු පඤ්චකය
2. වර්තමාන ඵලපඤ්චකය
3. වර්තමාන හෙතුපඤ්චකය
4. අනාගත ඵලපඤ්චකය

යන පඤ්චක සතරය.

**අතීත හෙතු පඤ්චකය** - අවිද්‍යා, සංඛාර, තණ්හා, උපාදාන, භව යන අඞ්ග පස අතීත හෙතු පඤ්චකය වේ.

මෙහි පළමුකොට අවිද්‍යා, සංඛාර දෙදෙන දක්වන ලදී. විදර්ශනාඥානයෙන් පහවූ, අඥානවූ පෘථග්ජන තෙමේ යම් හෙයකින් තෘෂ්ණා වශයෙන් ආලම්බණ ග්‍රහණය කෙරේද, තෘෂ්ණා වශයෙන් ආලම්බන ග්‍රහණයට පැමිණි අඥාන පෘථග්ජන තෙමේ දෘඪබවට පත් තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ආලම්බනය දෘඪකොට ගැනීම කෙරෙයි. ඒ අඥාන පෘථග්ජනයා හට උපාදාන ප්‍රත්‍යයෙන් භවය තෙම ලැබේද, එහෙයින් **තෘෂ්ණා, උපාදාන, කර්ම** භවයෝද ගන්නා ලද්දාහු වෙත්.

**අවිද්‍යාව**- පූර්වාත්මභාවයෙහිවූ කර්ම භවය ඇති කල්හි දුක්ඛ සත්‍යාදීන්ගේ ස්වභාවය වැටහිය නොදී මුවා කොට සිටියාවූ මෝහය තෙම මෙහි අවිද්‍යාව නම්.

**සංඛාර**- ආයූහනය හෙවත් දානාදි ක්‍රියාවන් සකස් කොට කරන්නාවූ චේතනාවෝ තුමූ සංස්කාරයෝ නම්හු වෙත්.

**තණ්හා**- ආලම්බනයෙහි පැවති අභිරතිය තණ්හා නම්.

**උපාදාන**- උපගමන හෙවත් අරමුණු දෘඪකොට ගන්නා ස්වභාව ධර්මය තෙම උපාදාන නම්.

**භව**- පරිත්‍යාගාදි වශයෙන් දානාදි ක්‍රියාවන්හි ව්‍යාපාර වත්වූ චේතනා තොමෝ භව නම්.

මෙසේ පූර්වාත්මභාවයෙහිවූ කර්මභවය ඇති කල්හි මේ ධර්මයෝ පස්දෙන මේ වර්තමාන භවයෙහි ප්‍රතිසන්ධියට ප්‍රත්‍යයෝ වෙත්.

මෙහි **ආයූහන සංස්කාරයෝ** නම්, ඒ කුසලාකුසල කර්මය කරන්නහුගේ යම් පූර්ව පූර්වවූ චේතනා කෙනෙක් ඇද්ද නොහොත් දාන වස්තුව දෙන්නෙමියි සිත උපදවා මසක් මුළුල්লෙහිත් අවුරුද්දක් මුළුල්ලෙහිත් දානොප-කරණයන් පිළියෙළ කරන්නාවූ පුද්ගලයාට උපන්නාවූ

පූර්වවූ චේතනාවෝයි. ප්‍රතිග්‍රාහක පුද්ගලයන්ගේ අත්හි දන වස්තුව පිහිටුවන්නාවූ පුද්ගලයාගේ චේතනා තොමෝ **කර්මභව** නම්.

තවද, එක් ආවර්ජන චිත්තයක් ඇති ෂඩ්විධවූ ජවන් සිත්හි පැවති චේතනාවෝ තුමූ **ආයූහන සංස්කාරයෝ** යයිද, සත්වැනිවූ චේතනා තොමෝ **කර්මභව** යයිද, පූර්ව පශ්චිම වශයෙන් නියමයක් නැතියෙන් සියළුම චේතනා තොමෝ **කර්මභව** යයිද, ඒ චේතනාව හා සම්ප්‍රයුක්තවූ ස්පර්ශාදී ධර්මයෝ තුමූ **ආයූහන සංස්කාර** යයිද දක්වා තිබේ.

**නිකාන්තිය** හෙවත් කර්මය කරන්නාවූ පුද්ගලයා හට, ඒ කර්මයාගේ අනාගත ඵලයවූ, උපපත්ති භවයෙහි යම් ආසාවක් යම් ප්‍රාර්ථනාවක් ඇද්ද, ඒ උපපත්ති භව ප්‍රාර්ථනා තොමෝ **තෘෂ්ණා** නම්. භවයාගේ ප්‍රත්‍යභූතවූ, මෙනම් කර්මයක් කොට අසවල් තන්හි කාම ගුණයන් සේවනය කරන්නෙමි, සසර දුක සිඳින්නෙමි. මේ ආදී වශයෙන් පැවති යම් උපගමනයක් හෙවත් අරමුණ වෙත දැඩිකොට එළඹ සිටිනා බවෙක්, යම් අරමුණ දැඩිකොට ගන්නා බවෙක්, යම් දෘෂ්ටි වශයෙන් පරාමර්ශනය කිරීමක්, වරදවා ලබ්ධි ගැනීමක් ඇද්ද, මේ උපගමනග්‍රහණ පරාමර්ශනය තෙමේ **උපාදාන** නම්.

## 2. වර්තමාන ඵලපඤ්චකය

1. **විඤ්ඤාණ**- මේ ප්‍රත්‍යුත්පන්න භවයෙහි ප්‍රතිසන්ධි තොමෝ හෙවත් අතීත වූ භව විශෙෂය ප්‍රත්‍යුත්පන්න භවය හා එකට ගළපන ධර්මජාති තොමෝ විඥාන නම්.

2 **නාමරූප**- මව් කුසට වදනාක් මෙන් රූපාරූප ධර්මයන්ගේ පහළවීම් සවභාවය නාමරූප නම්.

3. **සළායතන**- චක්ෂුප්‍රසාදාදි ප්‍රසාදය තෙම ආයතන නම්.

4. **ඵස්ස** - අරමුණු පහස්නා බව හෝ අරමුණෙහි හැපෙමින් උපදනා බව ස්පර්ශ නම්.

5. **වෙදනා** - අරමුණු රස විඳින බව නොහොත් අරමුණු රස විඳීම් වශයෙන් පවත්නා ධර්මස්වභාවය තෙම වෙදනා නමි.

මේ ප්‍රත්‍යුත්පන්න වූ උපපත්ති භවයෙහි නොහොත් මේ අත්බැව්හි උපපත්ති භවය ඇති කල්හි පහළවූ මේ ධර්මයෝ පස්දෙන පූර්වභවයෙහි කරන ලද්දා වූ කර්මයට ප්‍රත්‍යය වූවාහු වෙත් නොහොත් කර්මයාගේ ප්‍රත්‍යයවීම් හෙතුවෙන් වෙත්.

## 3. වර්තමාන හෙතුපඤ්චකය

**තණ්හා, උපාදාන, භව** යන අඞ්ගයෝ තිදෙන වර්තමාන හෙතුහු වෙත්. **කර්මභවය** ගත් කල්හි ඒ කර්මභාවයාගේ පූර්වභාග වූ **සංස්කාරයෝ** නොහොත් තත් සම්ප්‍රයුක්ත වූ යම් **සංස්කාරයෝ** ද ගත්නා ලද්දාහුම වෙත්. **තෘෂ්ණා, උපාදාන**යන්ගේ ගැනීමෙන් ඒ තෘෂ්ණා උපාදානයන් හා සම්ප්‍රයුක්ත වූ යම් අවිද්‍යාවකින් මූළා වූ පුද්ගලතෙමේ කුසලාකුසල කර්මය කෙරේද, එහෙයින් ඒ **අවිද්‍යා** තොමෝ ගත්නා ලද්දීම වේ. මෙසේ **තණ්හා, උපාදාන, භව, අවිජ්ජා, සඞ්ඛාර** යන අඞ්ග පස වර්තමාන හෙතු පඤ්චකය වේ.

1. **අවිද්‍යාව** - මේ ප්‍රත්‍යුත්පන්න **භවයෙහි** ආයතනයන්ගේ මුහුකුරා ගිය බැවින් මූළාවීම හෝ සසර දුක මුවහ කරවන මෝහය අවිද්‍යා නමි.

2. **සඞ්ඛාර** - ආයූහන හෙවත් පූර්වභාග වූ චෙතනා තුමූ සංස්කාර **නමි**.

3. **තණ්හා** - නිකාන්තිය **හෙවත්** ආලම්බනයෙහි පැවති අභිලාෂී තොමෝ **තෘෂ්ණා නමි**.

4. **උපාදාන** - උපගමන හෙවත් අරමුණ දැඩිකොට ගත්නා ස්වභාවය තෙම උපාදාන නමි.

5. භව – පරිත්‍යාගාදි වශයෙන් දානාදි ක්‍රියාවන්හි ව්‍යාපාරවත් වූ චේතනාතොමෝ භව නම්.

මෙසේ මේ ධර්මයෝ පස්දෙන මේ ප්‍රත්‍යක්ෂ වූ කර්ම භවය ඇති කල්හි අනාගතයෙහි ප්‍රතිසන්ධියගේ ප්‍රත්‍යයයෝ වෙත්.

## 4. අනාගත ඵලපඤ්චකය

වර්තමාන හෙතූන්ගේ ඵලය වශයෙන් අනාගතයෙහි ජාති ජරා මරණාදිය ලබන්නාහ. මෙහි ජාති ශබ්දයාගේ ගැනීමෙන්, **විඤ්ඤාන, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනාදී** වූ ඵල ධර්මයෝ පස්දෙන ගන්නා ලද්දී වේ. ඒ විඤ්ඤානාදී ඵල ධර්මයන්ගේම දිරීම් බිඳීම් දෙක ජරා මරණ නම්. එබැවින් අනාගත ඵල පඤ්චකය වශයෙන් **විඤ්ඤාන, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා** යන අඞ්ගයෝ පස්දෙන ගන්නා ලදී.

1. **විඤ්ඤාන** – අනාගත භවයෙහි ප්‍රතිසන්ධි තොම විඤ්ඤාන නම්.

2. **නාමරූප** – මව් කුසට වදනාක් මෙන් රූපාරූප ධර්මයන්ගේ පහළවීම් සවභාවය නාමරූප නම්.

3. **සළායතන** – චක්ෂු ප්‍රසාදාදී ප්‍රසාදය තෙම ආයතන නම්.

4. **ඵස්ස** – අරමුණු පහස්නා බව හෝ අරමුණෙහි හැපෙමින් උපදිනා බව ස්පර්ශ නම්.

5. **වෙදනා** – අරමුණු රස විඳින බව නොහොත් අරමුණු රස විඳීම් වශයෙන් පවත්නා ධර්ම සවභාවය තෙම වෙදනා නම්.

මෙසේ අනාගතයෙහි උපපත්ති භවය ඇති කල්හි මේ ධර්මයෝ පස්දෙන මේ අත්බැව්හි කරන ලද්දා වූ කර්මයට ප්‍රත්‍යය වූවාහු වෙත්. නොහොත් කර්මයාගේ ප්‍රත්‍යවීම් හෙතුවෙන් වෙත්. යථොක්ත නයින් මේ භව චක්‍රය තෙමේ විසි ආකාර අර ඇත්තේ වේ.

ඒ විසි ආකාර භේදයන් අතුරෙහි පූර්ව කර්මභවය ඇති කල්හි පඤ්චවිධවූ **කර්ම** සම්භාරයෝද, මේ වර්තමාන භවයෙහි පඤ්චවිධවූ විපාක ධර්මයෝද, මේ වර්තමාන භවයෙහි පඤ්චවිධවූ කර්ම සම්භාරයෝද, අනාගත භවයෙහි පඤ්චවිධවූ විපාක කර්මයෝදැයි මෙපරිද්දෙන් ධර්මයෝ දස දෙනෙක් **කර්ම** නම්. දස ධර්ම කෙනෙක් **විපාක** නම්. මෙසේ දෙතන්හි කර්මය තෙම **කර්ම** නම්. **දෙතන්හි** විපාකය තෙම **විපාක** නම්. මෙසේ හෙයින් සියළුම ප්‍රත්‍යාකාර වෘත්ත නම් ලද ඒ භව චක්‍රය තෙම **කර්ම** නමුදු වේ, **කර්ම විපාක** නමුදු වේ.

එමෙත්ම දෙතන්හි කර්මය තෙම **කර්ම සංක්‍ෂෙප** නම්. දෙතන්හි විපාකය තෙම **විපාක සංක්‍ෂෙප** නම්. මෙසෙයින් සියළුම භවචක්‍රය තෙම **කර්ම සංක්‍ෂෙප** නමුදු වේ. **විපාක සංක්‍ෂෙප** නමුදු වේ.

දෙතන්හි කර්මය තෙම **කර්මවට්ට** නම්. දෙතන්හි විපාකය තෙම **විපාක වට්ට** නම්. මෙසෙයින් සියළුම භව චක්‍රය තෙම **කර්මවෘත්ත** නමුදු වේ. **විපාක වෘත්ත** නමුදු වේ.

එමෙත්ම දෙතන්හි කර්මය තෙම **කර්ම භව** නම්. **දෙතන්හි** විපාකය තෙම **විපාක භව** නම්. මෙසෙයින් සියළුම **ඒ** භව චක්‍රය තෙම **කර්ම**භව නමුදු වේ. **විපාක** භව නමුදු වේ.

දෙතන්හි **කර්මය** තෙම **කර්ම ප්‍රවෘත්ත** නම්. දෙතන්හි විපාකය තෙම **විපාක ප්‍රවෘත්ත** නම්. මෙසෙයින් සියලුම **ඒ** භව චක්‍රය තෙම **කර්ම ප්‍රවෘත්ත** නමුදු වේ. විපාක ප්‍රවෘත්ත නමුදු වේ.

එමෙත්ම දෙතන්හි කර්මය තෙම **කර්ම සන්තති** නම්. **දෙතන්හි** විපාකය තෙම **විපාක සන්තති** නම්. මෙසෙයින් සියළුම ඒ භව චක්‍රය තෙම **කර්ම සන්තති** නමුදු වේ. **විපාක සන්තති** නමුදු වේ.

දෙතන්හි කර්මය තෙම **ක්‍රියා** නම්. දෙතන්හි විපාකය තෙම **ක්‍රියාඵල** නම්. මෙසෙයින් සියළුම ඒ භව චක්‍රය තෙම **ක්‍රියා** නමුදු වේ; **ක්‍රියාඵල** නමුදු වේ.

මෙසේ මේ භව චක්‍රය තෙම හෙතුව හා සමග පැවතුම් ඇත්තේය, දුක්වත්තේය, අනිත්‍ය ස්වභාවය ඇත්තේය, සැලෙන සුළුය, භවාඬගාවස්ථාවට පැමිණෙන ස්වභාව ඇත්තේය, තහවුරු බැව් නොහොත් හර නැත්තේය, නිසරු හෙතුභූතවූ ධර්මයන් කෙරෙන් නොහොත් ධර්මයන් හෙතුකොට ගෙන ඵලභූතවූ ධර්මයෝ හටගනිත්.

මේ භව චක්‍රයෙහි තෙමේ කියා හෝ අනෙකෙක කියා හෝ නැත්තේය. හෙතුභූම සම්භාර ප්‍රත්‍යය වූ ප්‍රතිත්‍ය සමුත්පාද ධර්මයෝ, විපාකභූතවූ ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයන් සම්බන්ධකොට උපදවත්. හෙතුන්ගේම නිරොධය පිණිස සර්වඥයන්වහන්සේ විසින් පයර්‍යාප්ති ධර්මය දෙසූ සේක. හෙතු ධර්මයන් නැසූ කල්හි හෝ නිරුඬව ගිය කල්හි මාර්ගයෙන් සිඳිනලද ත්‍රිවිධ වෘත්තය තෙමේ නොපවතී. මෙසේ හෙතු ධර්මයෙන් ඵල ධර්ම මාත්‍රයක්-හුගේ සම්භවය ඇති කල්හි හෙතු නිරොධයෙන් ත්‍රිවිධ වෘත්තය සිඳීම ඇති කල්හි හෙතුනිරොධය පිණිස වදහළ ධර්මයද ඇති කල්හි, දුක් කෙළවර කිරීම පිණිස නිරුපදි-ශෙෂ නිර්වාණ ධාතුව පිණිස මේ බුදු සස්නෙහි ශාසන බ්‍රහමචය්‍යාවත් නොහොත් මාර්ග බ්‍රහමචය්‍යාවත් විද්‍යමාන වේ. සත්ත්වයෙකු නොලැබෙන කල්හි උච්ඡෙද දෘෂ්ටියකුත් නොමැත්තේමය, ශාස්වත දෘෂ්ටියකුත් නොමැත්තේමය.

## ත්‍රිවිධ වට්ට

1. **කම්ම වට්ට**
2. **කිලෙස වට්ට**
3. **විපාක වට්ට**

ය යි මේ භව චක්‍රයෙහි වෘත්ත තුනෙකි.

එයින්:

1. **කර්ම වෘත්තය** නම් **සංස්කාර**, භව යන දෙදෙනාය,
2. **ක්ලේශ වෘත්ත** නම් **අවිද්‍යා**, **තෘෂ්ණා**, **උපාදාන** යන තිදෙනාය,
3. **විපාක වෘත්තය** නම් **විඤ්ඤාණ**, **නාමරූප**, **සළායතන**, **ඵස්ස**, **වේදනා** යන පස්දෙනය.

මෙසේ ත්‍රිවෘත්තයක් ඇති භව චක්‍රය තෙමේ යම්තාක් කලෙකින් කෙලෙස්වට නොසිඳේද, ඒ කෙලෙස්වට නොසිඳ පවත්නාතාක් කල්, නොසිඳ පියකලද ප්‍රත්‍යය ඇති බැවින්, පිරිසිඳීමක් නැතිව, නැවැත්මෙක් නැතිව, නැවත නැවත පරිවර්තනය වන හෙයින් භ්‍රමණය වේමැයි දතයුතු.

මෙපරිද්දෙන් භ්‍රමණය **වන්නාවූ ඒ** භව චක්‍රයතෙම:

1. **සත්‍ය** වශයෙන්ද, සත්‍යයන්ගේ හෝ ප්‍රභව වශයෙන්ද,
2. **කෘත්‍ය** වශයෙන්ද,
3. **මිථ්‍යාදර්ශන නිවාරණ** වශයෙන්ද,
4. **උපමා** වශයෙන්ද,
5. **ගම්භීර** වශයෙන්ද,
6. **නය ප්‍රභේද** වශයෙන්ද දතයුත්තේය.

1. **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** යන තන්හි **අවිද්‍යාවත්**, අවිද්‍යාව ප්‍රත්‍යය කොට ගෙන වූ **සංස්කාරයෝද** විතීය සමුදය ප්‍රභවකොට ඇති **සමුදය සත්‍යය** වේ.

සංස්කාරයන් ප්‍රත්‍යය කොටගෙන වූ ලෞකික **විපාක විඥානය** තෙමේ, විතීයවූ සමුදය සත්‍යය ප්‍රභව කොට ඇති **දුක්ඛ සත්‍යය** වේ.

විඥානාදීන් ප්‍රත්‍යය කොට ගෙන වූ **නාමරූප**, **සළායතන**, **ඵස්ස**, **වේදනා** යන අවයවයෝ ප්‍රථම වූ දුක්ඛ සත්‍යය ප්‍රභවකොට ඇති **දුක්ඛ සත්‍යය** වේ.

විපාක වෙදනාව ප්‍රත්‍යය කොටගෙන වූ **තෘෂ්ණා** තොමෝ ප්‍රථම වූ දුක්ඛ සත්‍යය ප්‍රභවකොට ඇති **සමුදය සත්‍යය** වේ.

තෘෂ්ණාව ප්‍රත්‍යය කොට ගෙන වූ **උපාදානය** තෙම ද්විතීය වූ සමුදය සත්‍යය ප්‍රභව කොට ඇති **සමුදය සත්‍යය** වේ.

උපාදානය ප්‍රත්‍යයකොට ගෙන වූ භවය තෙම ද්විතීය වූ සමුදය සත්‍යය ප්‍රභව කොට ඇති **දුක්ඛ සමුදය සත්‍යමය** වේ.

භවය ප්‍රත්‍යය කොට ගෙන වූ **ජාති** තොමෝ ද්විතීයවූ සමුදය සත්‍යය ප්‍රභවකොට ඇති **දුක්ඛ සත්‍යය** වේ.

ජාතිය ප්‍රත්‍යයකොට ගෙන වූ **ජරා මරණය** තෙමේ, ප්‍රථමවූ දුක්ඛ සත්‍යය ප්‍රභවකොට ඇති **දුක්ඛ සත්‍යය** වේ.

**කෘත්‍යය** වශයෙන් වනාහි

**අවිද්‍යාව** – ආලම්බනයන්හිත්, නොහොත් චක්ෂුරාදීවූ වස්තු රූපයන්හිත් නොහොත්, දුක්ඛාදීවූ වස්තුන්හිත් සත්ත්වයන් වැඩියක් මුළා කෙරෙයි, නොහොත් මුළා කරවයි. සංස්කාරයන්ගේ පහළවීම පිණිස ප්‍රත්‍යයයත් වේ.

**සංස්කාරයෝ** – සඞ්ඛත ධර්මයන් මොනවට පිළියෙළ කෙරෙත්. විපාකාදි විඥානයට ප්‍රත්‍යයයෝ ද වෙත්.

**විඥානය** – ආලම්බනයත් විජානනය කෙරෙයි. නාම රූපයනට ප්‍රත්‍යය ද වේ.

**නාම රූපය** – ඔවුනොවුනුත් අනුබල දෙයි. සළා-යතනයට ප්‍රත්‍යය ද වේ.

**සළායතනය** – තමතමන් විෂයවූ රූපාලම්බනයෙහිත් පවති, ස්පර්ශයට ප්‍රත්‍යයත් වේ.

**ස්පර්ශය** – ආලම්බනයත් ස්පර්ශ කෙරෙයි, වෙදනාවට ප්‍රත්‍යයත් වේ.

**වේදනාව** – ආලම්බන රසයන් ආස්වාදය කරයි හෙවත් විඳී, **තෘෂ්ණාවට** ප්‍රත්‍යයත් වේ.

**තෘෂ්ණාව** – රජ්ජනය කටහැකිවූ ආලම්බනයෙහිත් රජ්ජනය කරයි, උපාදනයට ප්‍රත්‍යයත් වෙයි.

**උපාදානය** – උපාදානයන්ට ගොචර වූ ධර්මයනුත් දැඩි කොට ගනී, භවයට ප්‍රත්‍යයත් වෙයි.

**භවය** – නොයෙක් ප්‍රභෙදවත් වූ පඤ්චප්‍රකාර ගතීන්හිත් විසුරුවා දමයි, ජාතියට ප්‍රත්‍යයත් වෙයි.

**ජාතිය** – සකන්ධයනුත් උපදවයි. ඒ සකන්ධයන්ගේ අලුත හට ගැනුම්හුගේ වශයෙන් පැවැත්ම කෙරෙයි, ජරා මරණයට ප්‍රත්‍යයත් වේ.

**ජරා මරණය** – සකන්ධයන්ගේ දිරීම් බිඳීම් බවත් නිසා පවති. භවාන්තරයෙහි පහළවීම්හුගේ නොහොත් අභිනව ප්‍රතිසන්ධි ග්‍රහණය සඳහා ප්‍රත්‍යයත් වේ, සොකාදීන්ටද කරුණු වෙත්.

**මිථ්‍යාදර්ශන නිවාරණ** – වශයෙන් වනාහි

**අවිජ්ජා පච්චයා සංඛාර** යන පදය ඊශ්වරාදී කාරක යෙක් ඇතැයි යන මිථ්‍යා දර්ශනය වළක්වයි.

**සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** යන පදය ආත්මයාගේ භවාන්තරයට සඞ්ක්‍රමණය ඇතැයි යන මිථ්‍යා දර්ශනය වළක්වයි.

**විඤ්ඤාණ පච්චයා නාමරූපං** යන පදය ආත්මයයයි කල්පනාකොට ගන්නා ලද පඤ්චසකන්ධ සඞ්ඛ්‍යාත වස්තූන් ගේ චෙතස දක්වන හෙයින් එක් සත්වයෙකැයි ගන්නා ඝණ බහල සංඥාව දුරුකරයි.

**නාමරූප පච්චයා සළායතනං** යන පදය ආත්මය තෙම අරමුණු දකී, අසයි යනාදී වූ මිථ්‍යා සංඥාය දුරුකරයි.

**සළායතන පච්චයා ඵස්සො** යන පදය ආත්ම තෙම අරමුණු ස්පර්ශ කරයි යන මිථ්‍යා සංඥාව දුරුකරයි.

**ඵස්ස පච්චයා වෙදනා** යන පදය ආත්මය තෙම අරමුණු රස විඳියි යන මිථ්‍යා සංඥාව දුරුකරයි.

**වෙදනා පච්චයා තණ්හා** යන පදය ආත්මය තෙම අරමුණට ආලය කෙරෙයි යන මිථ්‍යා සංඥාව දුරුකරයි.

**තණ්හා පච්චයා උපාදානං** යන පදය ආත්මය අරමුණ දැඩිකොට ගනී යන මිථ්‍යා සංඥාව දුරුකරයි.

**උපාදාන පච්චයා භවො** යන පදය ආත්මය කර්මභව උප්පත්ති භව වේයයි යන මිථ්‍යා සංඥාව දුරුකරයි.

**භව පච්චයා ජාති** යන පදය ආත්මය ප්‍රතිසන්ධි වශයෙන් උපදී යන මිථ්‍යා දර්ශනය වළක්වයි.

**ජාති පච්චයා ජරා මරණං** යන පදය ආත්මය දිරයි, බිඳෙයි යන ආදි මිථ්‍යා දර්ශනයන් දුරුකරයි.

**උපමා** – වශයෙන් වනාහි,

**අවිද්‍යාව** – කර්කශ ස්පර්ශනාදිවූ තම තමන් සතු විශෙෂ ලක්ෂණ හා අනිත්‍යාදිවූ සාධාරණ ලක්ෂණයන්ගේ වශයෙන් ස්වභාව ධර්මයන් නොදක්නා හෙයින් අවිද්‍යා තොමෝ දෑස් නැති අන්ධයක්හුමෙන් දතයුතු.

**සංස්කාරයෝ** – අවිද්‍යා ප්‍රත්‍යයයෙන් පවත්නාවූ සංස්කාරයෝ දෑස් නැති අන්ධයාගේ පා පැකිලීමක් මෙන් දතයුතු.

**විඤ්ඤාණය** – සංස්කාර ප්‍රත්‍යයයෙන් පවත්නාවූ විඥානය තෙමේ පා පැකිල ගිය අන්ධයාගේ හීමක් මෙන් දතයුතු.

**නාමරූපය** – විඥාන ප්‍රත්‍යයයෙන් පවත්නාවූ නාම රූපය පා පැකිලහුණුවාවූ අන්ධයාගේ ගඩ හටගැන්මක් මෙන් දතයුතු.

**සළායතනය** - නාමරූප ප්‍රත්‍යයයෙන් පවත්නාවූ ෂඩායතනය ගඩ ගැහෙනු සඳහා අටගත් පොළක් මෙන් හෝ ගණ්ඩයාගේ අනෙක් පරිද්දෙකින් භෙදයෙහි ලා මතුවූ බිබිලි මෙන් දතයුතු.

**ඵස්සය** - සළායතන ප්‍රත්‍යයයෙන් පවත්නාවූ ස්පර්ශය ගඩ මත්තෙහි නැගි පොළ ගැහැගීමක් මෙන් හෝ ගණ්ඩයාගේ අනෙක් පරිද්දෙකින් භෙදයෙහි මතුවූ බිබිලි පැරීමක් මෙන් දතයුතු.

**වෙදනාව** - ස්පර්ශයෙන් පවත්නාවූ වේදනාව ගැටුමෙන් හෝ පැරීමෙන් හටගත් දුක මෙන් දතයුතු.

**තණ්හාව** - වේදනා ප්‍රත්‍යයයෙන් පවත්නාවූ තෘෂ්ණා තොමෝ ගඩ පැරීමෙන් හටගත් දුකට පිළියම් කරනු කැමැත්තක් මෙන් දතයුත්තීය.

**උපාදානය** - තෘෂ්ණා ප්‍රත්‍යයයෙන් පවත්නා වූ උපාදානය තෙම පිළියම් කරනු කැමැත්තෙන් අසත්ප්‍රාය දෑය ගැනීමක් මෙන් දතයුතු.

**භවය** - උපාදාන ප්‍රත්‍යයයෙන් පවත්නා වූ භවය තෙම වැරදි දුඛ කොටගත් නොසැපවූ ඖෂධ ආලෙප කිරීමක් මෙන් දතයුතු.

**ජාති** - භව ප්‍රත්‍යයයෙන් පවත්නාවූ ජාති තොමෝ අසත්ප්‍රාය බෙහෙත් ආලෙප කිරීමෙන් ගඩයාගේ ඉදිමීම් ලේ මිශ්‍ර සැරව දුඛිබැව් ආදී විකෘතින් පහළවීමක් මෙන් දතයුතු.

**ජරා මරණය** - ජාති ප්‍රත්‍යයයෙන් පවත්නාවූ ජරා මරණය ඉදිමුම්, ලේ සැරව දුඛි බැව් ආදී විකෘති හෙතු වෙන් ගණ්ඩයාගේ බිඳීමක් මෙන් දතයුතු.

තවද,

**අවිද්‍යාව** - පටලයක් මෙන් දතයුතු, සුදු නිල් ආදි කාච පටලයෙන් මඩනාලද ඇස් ඇති පුද්ගල තෙමේ රූපයන්

නොදකී. ඉදිරිත් දක්නේ වී නමුත් ඇති සැටි නොව වරදවා දකී. එපරිද්දෙන් අවිද්‍යාවෙන් මඩනාලද අන්ධ පෘථග්ජන තෙම දුක්ඛාදී සත්‍යයන් නොදකී. දක්නට නොපිළිපදියි. වරදවා හෝ පිළිපදියි. එහෙයින් අවිද්‍යා තොමෝ පටලයක් මෙනැයි දක්වන ලදී.

**සංස්කාරයෝ** – කොශ ප්‍රදෙශයන් මෙන් දනායුතු කීටයා විසින් කෘමි කොශය කරනලද මෙන් අවිද්‍යාවගේම පරිභ්‍රමණයට කරුණු වන බැවින්ද, සංස්කාරයෝ කොශ ප්‍රදෙශයන් මෙනැයි දක්වන ලදී.

**විඥානය** – පරිණායක මහ ඇමතියක්හු විසින් ආරක්ෂා කරනලද රාජ කුමාරයෙක් තෙම, රජ සැපත්හි පිහිට ලබන්නාක් මෙන් සංස්කාරයන් විසින් උපස්ථම්භනය කරන ලද විඥානය තෙම කර්ම, කර්ම නිමිති, ගති නිමිති සඞ්ඛ්‍යාතවූ ප්‍රතිසන්ධි විඥානයාගේ ආලම්බනය අරමුණු කරන හෙයින් පඤ්චවිධ ගතීන්හි පිහිට ලබයි.

**නාමරූපය** – මායාකරු තෙමේ හෙවත් ඉන්ද්‍රජාලික තෙමේ, මායාවෙන් නොයෙක් දූය මවා අරගන්නාක් මෙන් විඥානය තෙමේ ප්‍රතිසන්ධික්ෂණයෙහි අනෙක ප්‍රකාරවූ නාම රූපය සහජාතාදි ප්‍රත්‍යය වශයෙන් උපදවයි.

**සළායතන** – මනා බිම් පියෙස්හි පිහිටියාවූ වන ලැහැබ වෘද්ධියට, සාතිශය රෝහණයට, විපුලත්වයට පැමිණෙන්නාක් මෙන් නාම රූපයෙහි පිහිටියාවූ සළායතනය තෙමේ වෘද්ධියට සාතිශය රෝහණයට විපුලත්වයට පැමිණේ.

**ස්පර්ශය** – ගිනිගානා උඩ යට දඬු දෙක එකට ගැටීම් හෙතුවෙන් ගින්න උපදනාක් මෙන් අධ්‍යාත්ම බාහිර ආයතනයන්ගේ ඔවුනොවුන් හමුවන බවයයි කියන ලද ගැටීම් හෙතුවෙන් ස්පර්ශය උපදී.

**වෙදනාව** – ගින්නෙන් පහර ලත් පුද්ගලයා හට දැවිල්ල හටගන්නාක් මෙන් ස්පර්ශයෙන් පහළාවූ පුද්ගලයා හට වෙදනාවෝ හටගනිත්.

**තණ්හාව** – ලුණු දිය බොන්නාවූ පුද්ගලයාහට පිපාසය වැඩෙන්නාක් මෙන් අරමුණු රස විඳින්නාහට තෘෂ්ණාව වැඩෙයි.

**උපාදානය** – පිපාසයෙන් පීඩිත පුද්ගල තෙමේ පැන්-පානය කිරීමට ආසා කරන්නාක් මෙන් ආලම්බන තෘෂ්ණා නම් වූ පිපාසයෙන් පීඩිතවූ පුද්ගල තෙමේ භවයන්හි ආශාව කෙරෙයි. ඒ භවයන්හි අභිලාෂය කිරීම තොහොත් තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ප්‍රාර්ථනය ඒ පුද්ගලයාගේ උපාදානය වේ.

**භවය** – ඇම ගසාකන ලොබින් මත්ස්‍ය තෙම බිළිය දැඩිකොට ගන්නාක් මෙන් හෙවත් බිළිය ගිලින්නාක් මෙන් උපාදානය හෙතුකොට ගෙන භවය දැඩිකොට ගනී.

**ජාතිය** – බීජය ඇති කල්හි අඩකුරය වන්නාක් මෙන් භවය ඇති කල්හි ජාතිය වේ.

**ජරා මරණය** – උපන්නාවූ වෘක්ෂයාගේ පතනය මෙන් උපන් සත්වයාගේ තොහොත් පහළ වූ පඤ්චස්කන්ධ-යාගේ නියතයෙන් ජරා මරණය වේ.

**ගම්භීර** – වශයෙන් වනාහි

1. අර්ථ ගම්භීරය
2. ධර්ම ගම්භීරය
3. දෙශනා ගම්භීරය
4. ප්‍රතිවෙධ ගම්භීරය

වශයෙන් මේ පටිච්ච සමුප්පාද ධර්මය සතරාකාරයකින් ගම්භීරය.

එයින්:–

1. **අර්ථ ගම්භීරය** – යම් හෙයකින් ජාති ප්‍රත්‍යය ශක්තියෙන් ජරා මරණය තෙම නොවන්නේ නොවේද, වන්නේම වේද, ජාති ප්‍රත්‍යය හැර අන්‍ය ශක්තියකින්



Free Distribution www.aathaapi.org

නොමවේද, මේ අර්ථය අවබොධයට **දුෂ්කර** වන හෙයින් **නොහොත්** දුකසේ අවබොධ කළයුතු හෙයින් **අර්ථ ගම්භීරය.** මෙසේම ජාතියගේ භව ප්‍රත්‍යය හෙතුකොට ගෙනම වීමය, භවයාගේ උපාදාන ප්‍රත්‍යය හෙතුකොටගෙන වීමය, උපාදානයාගේ තෘෂ්ණාව ප්‍රත්‍යය කොට ගෙන වීමය, තෘෂ්ණාවගේ වෙදනාව හෙතුකොට ගෙන වීමය, වෙදනාවගේ ස්පර්ශය හෙතුකොටගෙන වීමය, ස්පර්ශයාගේ සළායතනය හෙතුකොටගෙන වීමය, සළායතනයාගේ නාමරූප හෙතුකොටගෙන වීමය, නාමරූපයාගේ විඥානය හෙතුකොට්ගෙන වීමය, විඥානයාගේ සංඛාරයන් හෙතු කොටගෙන වීමය, සංඛාරයන්ගේ අවිද්‍යාව හෙතුකොට ගෙන වීමය යන මේ අර්ථයෝද ගම්භීරය. එහෙයින් මේ භව චක්‍රය තෙම අර්ථ වශයෙන් හෙවත් ඵල වශයෙන් ගැඹුරු වන්නේය; නොහොත් ගැඹුරුවූ අර්ථ හෝ ගැඹුරුවූ ඵල ඇත්තේය. හේතුහුගේ ඵලයෙහි පැවති **නුවණ අර්ථ පටිසම්භිදා** නම්.

2. **ධර්ම ගම්භීරය** - යම් හෙයකින්, යම් ආකාරයකින්, යම් යම් අවස්ථාවන්හිද නොහොත් යම් යම් අවස්ථා වශයෙනුදු අවිද්‍යා තොමෝ ඒ ඒ සංස්කාරයනට ප්‍රත්‍යය වේද, ඒ ආකාරය නොහොත් ඒ අවස්ථා විශෙෂ අවබොධයට දුෂ්කර වන හෙයින් නොහොත් දුකසේ අවබොධ කළයුතු හෙයින් අවිද්‍යාවගේ සංස්කාරයනට ප්‍රත්‍යවීම් සංඛ්‍යාත අර්ථය ගැඹුරු වේමය. ඒ හා සමානවම සංස්කාරයන්ගේ විඥානයට ප්‍රත්‍යය වීමද, විඥානයාගේ නාම රූපයට ප්‍රත්‍යය වීමද, නාමරූපයාගේ සළායතනයට ප්‍රත්‍යය වීමද, සළායතනයාගේ ඵස්සයට ප්‍රත්‍යය වීමද, ඵස්සයාගේ වෙදනාවට ප්‍රත්‍යය වීමද, වෙදනාවගේ තණ්හාවට ප්‍රත්‍යය වීමද, තණ්හාවගේ උපාදානයට ප්‍රත්‍යය වීමද, උපාදානයාගේ භවයට ප්‍රත්‍යය වීමද, භවයාගේ ජාතියට ප්‍රත්‍යය වීමද, ජාතියගේ ජරා මරණයට ප්‍රත්‍යය වීම් සංඛ්‍යාත අර්ථයද ගැඹුරු වේමය. එහෙයින්ම මේ භව චක්‍රය තෙම ධර්ම වශයෙන් හෝ හෙතු වශයෙන්

ගැඹුරු වන්නේය, නොහොත් ගැඹුරු වූ ධර්ම හෝ ගැඹුරුවූ හේතු ඇත්තේය. හෙතුවෙහි පැවති ඥානය **ධර්ම ප්‍රතිසම්භිදා** නම් වේ.

3. **දෙශනා ගම්භීරය** - යම් හෙයකින් ඒ භව චක්‍රය තමා වෛනෙය ජනයාගේ චතුස්සත්‍යාවබොධයට අනුරූප වූ ඒ ඒ කරුණෙන් අනුලොම ප්‍රතිලොමාදි වූ ඒ ඒ ප්‍රකාරයෙන් පැවැත්විය යුතු වන හෙයින් හෙවත් වදාළ යුතු වන හෙයින් දෙශනා තොමෝද ගැඹුරු වන්නීය. ඒ දෙශනා ප්‍රකාරයෙහි සර්වඥතාඥානය කෙරෙන් අන්‍යවූ ඥානයකින් පිහිට නොලැබේමය. එහෙයින්ම පෙළෙහි කිසි තැනෙක්හි අනුලොම වශයෙන්ද, කිසි තැනෙක්හි ප්‍රතිලොම වශයෙන්ද, කිසි තැනෙක අනුලොම ප්‍රතිලොම වශයෙන්ද; කිසි තැනෙක මැදින් පටන් ගෙන අනුලොම් වශයෙන්ද, ප්‍රතිලොම් වශයෙන්ද, කිසිතැනෙක ත්‍රිසන්ධි, චතු සංක්‍ෂෙප වශයෙන්ද, කිසි තැනෙක ද්විසන්ධි ත්‍රි සංක්‍ෂෙප කොටද, කිසි තැනෙක එක සන්ධි ද්වි සංක්‍ෂෙප කොටද වදාළ සේක. එහෙයින් මේ භව චක්‍රය තෙම දෙශනා වශයෙන් ගැඹුරු වේ, නොහොත් ගැඹුරු වූ දෙශනා ඇත්තේ වේ.

4. **ප්‍රතිවෙධ ගම්භීරය** - අවිද්‍යාදීන්ගේ යම් අඥාන අදර්ශනාදී ස්වභාවය යම් ප්‍රතිවෙධඥානයකින් පිළිවිද දතයුතු වේද, ඒ අවිද්‍යාදීවූ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් ස්වලක්‍ෂණ වශයෙන් ප්‍රතිවෙධය කරන ලද්දාහු වෙද්ද, ඒ අවිද්‍යාදීන්ගේ ප්‍රතිවෙධය නුබුදු වූවන්ගේ නුවණින් බැසගැනීමට නොහැකි වන බැවින් ගැඹුරු වේද, එහෙයින් මේ භව චක්‍රය ප්‍රතිවෙධඥාන වශයෙන් නොහොත් පිළිවිද දතයුතු වූ ස්වභාව වශයෙන් ගැඹුරු වේ.

1. අවිද්‍යාවගේ **අඥාන** හෙවත් ඥානයට ප්‍රතිපක්‍ෂ භාවය යයි කියනලද අනුවණ බවය, **අදස්සන** හෙවත් ප්‍රත්‍යක්‍ෂ කිරීම් වශයෙන් අරමුණු දක්නා නුවණට

ප්‍රතිපක්ෂ භාවය යයි කියනලද නොදක්නා බවය, **සච්ච-සංපටිවෙධය** හෙවත් චතුස්සත්‍යයන් මොනවට පිළිවිද දැනීමට නොදී වසා සිටිනා බවය යන ත්‍රිවිධ වූ අර්ථය ගැඹුරු වේ.

2. **සංඛාරයන්ගේ අභිසංඛරණය** හෙවත් දාන සීලාදී වශයෙන් කර්මයන් සකස්කොට පිළියෙළ කරන බවය. **ආයූහන** හෙවත් දාන වස්තු සම්පාදනාදි වශයෙන් පූර්ව පූර්ව භාගයෙහි කර්මයන් රැස්කරන බවය, **සරාග** හෙවත් රාගය හා සම්ප්‍රයොග වශයෙන් වන බවය, නොහොත් රාගයාගේ හෝ අකුසලයන්ට ප්‍රතිපක්ෂ නොවන බවය, **විරාග** හෙවත් රාගය හා සම්ප්‍රයොග වශයෙන් නොවන බවය, නොහොත් රාගයාගේ හෝ කුසලයන්ට ප්‍රතිපක්ෂ වන බවය යන චතුර්විධවූ අර්ථය ගැඹුරු ය.

3. **විඥානයාගේ සුඤ්ඤත** හෙවත් ආත්මයෙන් ශූන්‍යය වන බවය, **අව්‍යාපාර** හෙවත් ව්‍යාපාර රහිත වන බවය, **අසඞ්කන්ති** හෙවත් භවයෙන් භවයට සක්මන් නොකරන බවය, **පටිසන්ධි හෙතු භාවය** හෙවත් ප්‍රතිසන්ධි වශයෙන් පහළවන බවය යන චතුර්විධවූ අර්ථය ගැඹුරු ය.

4. **නාමරූපයාගේ ඒකුප්පාද** හෙවත් සමාන උත්පත්ති ඇති බවය, **විනිබ්භොග** හෙවත් නාමයාගේ රූපය හා රූපයාගේ නාමය හා ද අසම්ප්‍රයොග වශයෙන් වෙන්ව පවත්නා බවය, **අවිනිබ්භොග** හෙවත් නාමයාගේ නාමය හා සම්ප්‍රයොග වශයෙන් නොවෙන්ව පවත්නා බවය, **නමන** හෙවත් අරමුණෙහි නැමෙන බවය, **රුප්පන** හෙවත් විකාරයට පැමිණෙන බවය යන පඤ්චවිධ අර්ථය ගැඹුරු වේ.

5. **සළායතනයාගේ අධිපති** හෙවත් ඉන්ද්‍රිය ප්‍රත්‍යය භාවය, **ලොක** හෙවත් ලොක බවය, **ද්වාර** හෙවත් ද්වාර බවය, **ඛෙත්ත** හෙවත් ක්ෂෙත්‍ර භාවය, **විසය** හෙවත් විෂය භාවය, **විසයීභාව** හෙවත් විෂයී භාවය යන ෂඩ්විධ වූ අර්ථය ගැඹුරු ය.

6. **ඵස්සයාගේ** – **ඵුසන** හෙවත් අරමුණු පහස්නා බවය, **සඞ්ඝට්ටන** හෙවත් වෙසෙසින් අරමුණු ගටන බවය, **සඞ්ගති** හෙවත් වස්තු, ආලම්බන, විඥානයන්ගේ සාමාග්‍රිය යයි කියන ලද සමඟම් වන බවය, **සන්නිපාත** හෙවත් වස්තු ආලම්බන විඥානයන්ගේ එළඹ සිටිනා බවය යන චතුර්විධවූ අර්ථය ගම්භීර ය.

7. **වෙදනාවගේ** – **අරම්මණ රසානුභවන** හෙවත් අරමුණු රස විඳින බවය, **සුඛ** හෙවත් සුව බවය, **දුක්ඛ** හෙවත් දුක් බවය, **මජ්ඣත්තභාව** හෙවත් සුව දුක් දෙක අතර පැවති මැදහත්වූ විඳින බවය, **නිජ්ජීව** හෙවත් නිර්ජීවාර්ථය, **වෙදයිත** හෙවත් අනුභව ලක්ෂණය යන මේ ෂඩ්විධවූ අර්ථයෝ ගැඹුරු ය.

8. **තෘෂ්ණාවගේ** **අභිනන්දිත** හෙවත් අරමුණෙහි ඇලෙන බවය, **අජ්ඣොසාන** හෙවත් අරමුණෙහි ගිල ගන්නාක් මෙන් සම්පූර්ණ වශයෙන් ලොල්වන බවය, **සරිතා** හෙවත් සරිත් සදෘශ බවය. **ලතා** හෙවත් ලතා සදෘශ බවය, **නදී** හෙවත් නදී සදෘශ බවය, **තණ්හා** හෙවත් පවස් බවය, **සමුද්ද** හෙවත් සමුද්‍ර බවය, **දුප්පූරණ** හෙවත් තෘප්තියට පමුණුවාලිය නොහැකි බවය යන අෂ්ටවිධ අර්ථය ගැඹුරු ය.

9. **උපාදානයාගේ** – **ආදාන** හෙවත් අරමුණු දැඩිකොට ගන්නා බවය, **ගහණ** හෙවත් කාමොපාදානයාගේ වශයෙන් අරමුණු ගන්නා බවය, **අභිනිවෙසය** හෙවත් දිට්ඨුපාදාන-යාගේ වශයෙන් අරමුණු වරදවා වටහා ගන්නා බවය, **පරාමාස** හෙවත් සීලබ්බතොපාදානයාගේ වශයෙන් අරමුණු අන් අයුරෙකින් ආමර්ශනය කිරීමය **දුරතික්කමන** හෙවත් අත්තවාදෙපාදානයාගේ වශයෙන් ගත් අරමුණු ඉක්මවාලිය නොහැකි බවය යන පඤ්චවිධ අර්ථය ගැඹුරු වේ.

10. **භවයාගේ ආයූහන** හෙවත් පූර්ව පූර්ව භාගයෙහි දාන වස්තු සම්පාදනාදි වශයෙන් කර්ම රැස්කිරීමය, **අභි-සඞ්ඛරණ** හෙවත් දාන වස්තු පරිත්‍යාගාදි වශයෙන් කර්ම

රැස්කිරීමය, **යොනි ගති ඨිති නිවාසෙසු බිපනට්ඨ** හෙවත් චතුර්විධ **යොනි**, පඤ්චවිධ **ගති**, සප්තවිධ විඥානස්ථිති නවවිධ සත්ත්වාවාසයන්හි බහාලන බවය යන ත්‍රිවිධවූ අර්ථය ගැඹුරු වේ.

11. **ජාතියගේ ජාති** හෙවත් ස්කන්ධයන්ගේ පළමු හටගන්නා බවය, **සඤ්ජාති** හෙවත් ආයතනයන්ගේ පරිපූර්ණව පහළවන බවය, **ඔක්කන්ති** හෙවත් මව් කුසට වදනාක්මෙන් හටගන්නා බවය, **නිබ්බත්ති** හෙවත් ස්කන්ධාදීන්ගේ නව නවාකාරයෙන් මතු මත්තෙහි පහළවීමය, **පාතුභාව** හෙවත් ස්කන්ධාදීන්ගේ පහළවීමය යන මේ පඤ්චවිධවූ අර්ථය ගැඹුරු ය.

12. **ජරා මරණයාගේ ඛය** හෙවත් ක්ෂය භාවය, **වය** හෙවත් ව්‍යය භාවය, **භෙද** හෙවත් බිඳෙන බවය, **විපරිණාම** හෙවත් වෙනස්වන බවය යන චතුර්විධ වූ අර්ථය ගැඹුරු වේ.

මේ කියනලද්දේ භව චක්‍රයාගේ ප්‍රතිවේද ගම්භීරාර්ථයයි.

**නය ප්‍රභෙද** වශයෙන් වනාහි මේ භව චක්‍රයෙහි නය සතරෙකි. එනම්:-

1. **එකත්තනය** හෙවත් සමාන භාව සඞ්ඛ්‍යාතවූ එකත්වනය.
2. **නානත්තනය** හෙවත් අසමාන භාව සඞ්ඛ්‍යාතවූ නානත්වනය.
3. **අව්‍යාපාරනය** හෙවත් ස්වභාව ධර්මයන්ගේ නිරුත්සාහ භාව සඞ්ඛ්‍යාතවූ අව්‍යාපාරනය.
4. **එවං ධම්මතානය** හෙවත් අවිද්‍යාදීන්ගේ මෙබඳුවූ ධර්මතාවෙක් ඇති බව යයි කියනලද **එවං ධර්මතා නය** යන සතර නය වෙති.

1. **එකත්තනය**— මේ භව චක්‍රයෙහි අවිද්‍යා ප්‍රත්‍යය හෙතුකොට සංස්කාරයෝ හටගනිත්, සංස්කාර ප්‍රත්‍යය හෙතුකොට විඥානය හටගනී යනාදී වශයෙන් බීජයාගේ

අඞ්කුර පත්‍ර නාලස්කන්ධ ශාඛාපල්ලව පලාසාදී භාවයෙන් වෘක්ෂ භාවයට පත්වන්නාක් මෙන් සන්තති වශයෙන් නොසිඳ පැවැත්ම නොහොත් සන්තතියගේ නොසිඳ පැවැත්ම **ඒකත්වනය** නම් වේ, ඒ ඒකත්වනය නොහොත් යම් සන්තතියගේ නොසිඳ පැවැත්මක් **අවිපරීතකොට** දක්නාවූ පුද්ගල තෙම, හෙතුඵල ධර්මයන්ගේ ගැළපීම් වශයෙන් නොහොත් හෙතුඵල ධර්මයන්ගේ ගැළපීම් හෙතු කොටගෙන, හෙතුඵල පරම්පරාවගේ නොසිඳ පැවැත්ම පිරිසිඳ හෝ ඇති සැටියෙන් අවබොධ කරන හෙයින් **උච්ඡෙද දෘෂ්ටිය** අත්හරින්නේය. ඒ ඒකත්වනය නොහොත් සන්තතියගේ නොසිඳ පැවැත්ම **විපරීතකොට** දක්නාවූ පුද්ගලතෙම හෙතු ඵල ධර්මයන්ගේ ගැළපීම් වශයෙන් හෝ ගැළපීම හෙතුකොටගෙන පවත්නාවූ හෙතුඵල පරම්පරාවගේ නොසිඳ පැවැත්ම හෙතුඵල හෙදයක් නොකොට සමානභාව සඞ්ඛ්‍යාත ඒකත්වය යයි සිතාගන්නා හෙයින් ශාස්වත දෘෂ්ටිය දැඩිකොට ගනී.

2. **නානත්වනය**— අවිද්‍යාදීන්ගේ ස්වකීය ස්වකීයවූ ලක්ෂණයන් විනිශ්චයකොට දැනීම අසමානභාව සඞ්ඛ්‍යාත **නානත්වනය** නම් වේ. යම් ලක්ෂණාදීහු **අවිපරීතකොට** දක්නාවූ පුද්ගලතෙම අභිනව අභිනව වූ ධර්මයන්ගේ ඉපැද්ම දක්නා හෙයින් **ශාස්වතදෘෂ්ටිය** අත්හරින්නේය. එය **විපරීතකොට** දක්නාවූ පුද්ගලතෙම එකම සන්තතියෙක්හි පතිතවූ හෙතු ඵල ධර්මයාගේ, ප්‍රභෙදවත්වූ සන්තානයෙහි පැවති හෙතු ඵල ධර්ම සමූහයක්හු මෙන් නොහොත් එකම සත්ත්වයෙකුගේ සන්තානයෙහි පැවති ධර්ම සමූහය නොයෙක් සත්ත්වයන්ගේ සන්තානයෙහි පවත්නා ධර්ම ජාතයක්හු මෙන් නානත්වයක් යයි ගන්නා හෙයින් **උච්ඡෙද දෘෂ්ටිය** දැඩිකොට ගනී.

3 **අව්‍යාපාරනය**— අවිද්‍යාවගේ, සංස්කාරයෝ තුමූ මා විසින් ඉපැද්දවිය යුක්තාහ. සංස්කාරයන්ගේ විඥානය තෙම සංස්කාර නම් ලත් අප විසින් ඉපැද්දවිය යුතුය යනාදී වශයෙන් ව්‍යාපාර රහිත බව හෙවත් නිරුත්සාහ බව

**අව්‍යාපාරනය** නම් වේ. ඒ අව්‍යාපාරනය **අවිපරීතකොට** දක්නාවූ පුද්ගලතෙම ඊශ්වරාදීවූ කාරකයක්හුගේ අවිද්‍ය-මානත්වය අවබෝධ කිරීම හෙතුකොටගෙන **ආත්මදෘෂ්ටිය** අත්හරින්නේය. ඒ **අව්‍යාපාරනය** විපරිතකොට දක්නාවූ පුද්ගලතෙම උත්සාහය අවිද්‍යමාන කල්හිදු අවිද්‍යාදීන්ගේ ස්වභාවයම වූ නියම වශයෙන් සිද්ධවූ යම් හෙතු භාවයෙක් ඇද්ද, ඒ හෙතු භාවය වටහා නොගන්නා හෙයින් **අක්‍රිය දෘෂ්ටිය** දැඩිකොට ගනී.

4. **එවං ධම්මතානය** — කිරි ආදීන් හෙතුකොට-ගෙන දී ආදි ඵලයන්ගේ ලැබීම වන්නාක් මෙන් අවිද්‍යාදී වූ ප්‍රත්‍යයන් හෙතුකොටගෙන සංස්කාරාදී ඵලයන්ගේම ලැබීම වේ. අන්‍ය ඵලයක් නොලැබේ. මෙසේ වූ නය **එවං ධම්මතානය** නම් වේ. ඒ ධර්මතානය **අවිපරීත කොට** දක්නා වූ පුද්ගල තෙමේ ප්‍රත්‍යයනට අනුරූප වූ පරිද්දෙන් ඵලය පිරිසිඳ හෝ ඇති සැටි අවබෝධ කරන හෙයින් **අහෙතුක දෘෂ්ටියත්, අක්‍රිය දෘෂ්ටියත්** අත්-හරින්නේ ය. ඒ ධර්මතානය **විපරිත කොට** දක්නා වූ පුද්ගලතෙමේ ප්‍රත්‍යයනට අනුරූප පරිද්දෙන් ඵලයන්ගේ පැවැත්ම වටහා නොගෙන අනියම් හෙතුවකින් අනියම් ඵලයක්හුගේ අසද්භාවය වටහාගන්නා හෙයින් **අහෙතුක දෘෂ්ටියත් නියත වාදයත්** දැඩිකොට ගනී.

මේ භව චක්‍රය තෙම ඉතා ගැඹුරු වන හෙයින් නුවණින් බැසගත නොහැක්කේ ය. නානාවිධ නයින් ගහණ වූ හෙයින් නුවණින් අතික්‍රමයට දුෂ්කර වන්නේ ය. සමාධි නමැති උතුම් හණගල් පෝරුවෙහි මොනවට මුවහත් තුබූ මාර්ග ඥාන සඞ්ඛ්‍යාත කඩුවෙන් භව චක්‍රය නොපලා හෙණසක්මඩලක් මෙන් නිත්‍යයෙන් මැඩපියන සුළු වූ සසර භය ස්වප්නාන්තරයෙක්හිදු ඉක්මවිය හැකි කිසි පුද්ගලයෙක් නැත්තේ ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාරා තිබේ. මේ ප්‍රතීත්‍ය සමුප්පාදය තෙම ගැඹුරුය. ගැඹුරුවම ප්‍රකාශද වනුය. ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයාගේ නොදැනීම් හෙතුවෙන් පිරිසිඳ

නොවටහා ගැනීම් හෙතුවෙන්, ප්‍රතිවේධය නොකිරීම් හෙතුවෙන් මෙබඳු වූ මේ සත්ව සමූහ සඞ්ඛ්‍යාත ප්‍රජා තොමෝ හූ කැටියක්හුගේ අවුල් බවක් මෙන් ක්ලෙශ කර්ම විපාකයන් කරණකොටගෙන වැඩියක්ම වෙළුනී. ගුණ නම් ලද වඩු කිරිල්ලකගේ කැදූල්ලෙක ගෙත්තමක් මෙන් ක්ලෙශ කර්ම විපාකයන් කරණකොටගෙන වැඩියක්ම ගෙතුනී. මුදුතණ, බබුස්තණ පඳුරු එතීමක් මෙන් ක්ලෙශ කර්ම විපාකයන් කරණකොටගෙන එතුනී. අපාය නම් වූ, දුර්ගති නම් වූ, විනිපාත නම් වූ සතර අපාය ද, සංසාරය ද නොඉක්මවයි. එහෙයින් තමාගේ හෝ මෙරමාගේ හිත පිණිස, සැප පිණිස පිළිපන් පුද්ගලතෙම ප්‍රතීත්‍ය සමුප්පාද ධර්ම ඥානයෙහි වැර කිරීම මුත් අන්‍ය කෘත්‍යයන් අත්හරී.

මේ බුදුසස්නෙහි නුවණැත්තේව, සිහි ඇත්තේව, ගැඹුරු වූ පටිච්ච සමුප්පාදයාගේ භෙදයෙහි යම් පරිද්දෙ-කින් පිහිට ලබන්නේ ද, එපරිද්දෙන් සැමකල්හි වැර-කරන්නේයි.

# පට්ඨාන නය

හෙතු ඵල ධර්මය වදාරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ සංක්‍ෂෙපයෙන් පඤ්චුපාදානස්කන්ධ සඞ්ඛ්‍යාත වූ දුක්ඛස්කන්ධයාගේ හෙවත් **දුක්ඛාර්‍ය්‍යසත්‍යයා** ගේ ප්‍රත්‍යය හෙවත් හේතුව වශයෙන් කාමතෘෂ්ණා, භවතෘෂ්ණා, විභවතෘෂ්ණා සඞ්ඛ්‍යාත වූ ත්‍රිවිධ තෘෂ්ණාව නම් වූ **සමුදයාර්‍ය්‍යසත්‍යය** වදාළ සේක. මේ සමුදය සත්‍යයාගේ පහකිරීමෙන් පැමිණිය යුතු වූ ව්‍යුපසම සුඛ සඞ්ඛ්‍යාත වූ නිර්වාණය හෙවත් දුක්ඛනිරොධාර්‍ය්‍යසත්‍යය සාක්‍ෂාත්කර ගැනීමට එකායන මාර්ගය වූ අඞ්ග අටෙකින් යුත් **දුක්ඛනිරොධගාමිණී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය** වදාළ සේක.

මධ්‍යම ප්‍රමාණයෙන් හේතුඵල ධර්මයන් වදාරන්නා වූ තථාගතයන් වහන්සේ **"අවිජ්ජාපච්චයා සඞ්ඛාරා"** යනාදී වශයෙන් අවිද්‍යා ප්‍රත්‍යයෙන් ත්‍රිවිධ සංස්කාරයන් ඇතිවන බවත් සංස්කාරයන් ප්‍රත්‍යය කොටගෙන **ප්‍රතිසන්ධි විඥානාදිය** පහළවන බවත් මේ ආදී පිළිවෙළින් නොයෙක් හේතූන් අතුරෙන් ප්‍රධාන වූ එක් හේතුවක් හා නොයෙක් ඵලයන් අතුරෙන් එක් ප්‍රධාන ඵලයක් ද ගෙන අඞ්ග දොළොසකින් යුක්තකොට **පටිච්චසමුප්පාද** ධර්මය වදාළසේක.

විස්තර වශයෙන් හේතු ඵල ධර්මය දක්වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ **"හෙතු පච්චයො, ආරම්මණ පච්චයො"** යනාදී වශයෙන් සූවිසි ප්‍රත්‍යයයන් දක්වමින් ඒ ඒ ධර්මයන්ගේ ඇතිවීමටත්, පැවතීමටත් උපකාර වන විශෙෂ ප්‍රත්‍යය ධර්මයන් සර්වඥතාඥානයෙන් දැන අති ගම්භීර වූ මේ **පට්ඨානනය** දෙශනාව වදාළ සේක.

මෙහි **පට්ඨාන** යන්නෙන් නානාප්‍රකාර වූ ප්‍රත්‍යයන් ඇති බවය යන අර්ථය ද, කුසලාදී ධර්මයන් හේතුප්‍රත්‍යාදී වශයෙන් බෙදා දක්වන ලදය යන අර්ථය ද, සර්වඥතාඥානයට කැමැතිසේ ගමන් කළහැකි ධර්මයය යන අර්ථය ද ප්‍රධාන වූ ධර්මය යන අර්ථය ද දක්වේ.

බුද්ධත්වයට පැමිණි සිව්වැනි සතියෙහි රුවන් ගෙයි වැඩහිඳ ත්‍රිපිටක ධර්මය මෙනෙහි කරන්නා වූ සර්ඥයන් වහන්සේ මේ පට්ඨාන ප්‍රකරණයෙහි අනාගත වූ සූවිසි ප්‍රත්‍යයයන් පිළිබඳ වූ නානා නය මෙනෙහි කරන කල්හි බුදු සිරුරෙහි පැතිර ගිය ප්‍රණීත රූප ධර්මයන් කරණකොටගෙන සවණක් ඝණ බුදුරැස් දසදිග්හි විහිදෙන්නට වූ බව දක්වා තිබේ. මේ අති ගම්භීර ධර්මයට **අනන්ත නය සමන්තනාගත සමන්ත පට්ඨානය** යයි ද ව්‍යවහාර කරනු ලැබේ.

## සූවිසි ප්‍රත්‍යය ධර්ම

1. **හෙතු පච්චයො** – හෙතු භාවයෙන් උපකාරක ධර්මය ය.
2. **ආරම්මණ පච්චයො** – ආරම්මණ භාවයෙන් උපකාරක ධර්මය ය.
3. **අධිපති පච්චයො** – අධිපති භාවයෙන් උපකාරක ධර්මය ය.
4. **අනන්තර පච්චයො** – අනන්තර භාවයෙන් උපකාරක ධර්මය ය.
5. **සමනන්තර පච්චයො** – සමනන්තර භාවයෙන් උපකාරක ධර්මය ය.
6. **සහජාත පච්චයො** – සහජාත භාවයෙන් උපකාරක ධර්මය ය.
7. **අඤ්ඤමඤ්ඤ පච්චයො** – අන්‍යොන්‍ය භාවයෙන් උපකාරක ධර්මය ය.
8. **නිස්සය පච්චයො** – නිශ්‍රය භාවයෙන් උපකාරක ධර්මය ය.
9. **උපනිස්සය පච්චයො** – බලවත් හෙතු භාවයෙන් උපකාරක ධර්මය ය.

10. **පුරෙජාත පච්චයො** - පූර්වයෙහි ඉපිද පැවතීම් වශයෙන් උපකාරක ධර්මය ය.

11. **පච්ඡාජාත පච්චයො** - පසුව ඉපිද පූර්වයෙහි උපන් ධර්මයන්ට උපකාරක ධර්මය ය.

12. **ආසෙවන පච්චයො** - තමාගේ සවභාවය ප්‍රදානය කිරීම් වශයෙන් උපකාරක ධර්මය ය.

13. **කම්ම පච්චයො** - චිත්තප්‍රයොග සඞ්ඛ්‍යාත ක්‍රියා භාවයෙන් උපකාරක ධර්මය ය.

14. **විපාක පච්චයො** - නිරුත්සාහ ශාන්තභාව සඞ්ඛ්‍යාත විපාක සවභාවයෙන් උපකාරක ධර්මය ය.

15. **ආහාර පච්චයො** - උපසථම්භක භාවයෙන් උපකාරක ධර්මය ය.

16. **ඉන්ද්‍රිය පච්චයො** - ඊශ්වර භාවයෙන් උපකාරක ධර්මය ය.

17. **ඣාන පච්චයො** - එළඹ බැලීම් වශයෙන් උපකාරක ධර්මය ය.

18. **මග්ග පච්චයො** - එතර කරවීම් වශයෙන් උපකාරක ධර්මය ය.

19. **සම්පයුත්ත පච්චයො** - සම්ප්‍රයුක්ත භාවයෙන් උපකාරක ධර්මය ය.

20. **විප්පයුත්ත පච්චයො** - විප්‍රයුක්ත භාවයෙන් උපකාරක ධර්මය ය.

21. **අත්ථි පච්චයො** - විද්‍යමාන භාවයෙන් උපකාරක ධර්මය ය.

22. **නත්ථි පච්චයො** - අවිද්‍යමාන භාවයෙන් උපකාරක ධර්මය ය.

23. **විගත පච්චයො** - පහවීම් වශයෙන් උපකාරක ධර්මය ය.

24. **අවිගත පච්චයො** - නොපහවීම් වශයෙන් උපකාරක ධර්මය ය.

**ප්‍රත්‍යය** - නූපන් චිත්ත, චෛතසික, රූප ධර්මයන්ගේ ඉපදීමටත් පරම්පරා වශයෙන් පැවතීමටත්, පරම්පරා වශයෙන් වැඩිවීමටත් උපකාරක වන ධර්මයන්ට **ප්‍රත්‍යය ධර්ම** යයි කියනු ලැබේ. ප්‍රත්‍යය නොවන්නා වූ ධර්මයක් නැත. **චිත්ත, චෛතසික රූප, නිර්වාණ, ප්‍රඥප්ති** යන පඤ්චවිධ වූ සියලුම ධර්මයෝ **ප්‍රත්‍යයෝ** වෙත්.

**ප්‍රත්‍යයෝත්පන්නය** - ප්‍රත්‍යය කරණකොටගෙන හට-ගන්නා වූ ද, පවත්නා වූ ද ධර්මයන්ට **ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ** යයි කියති. එනම්:- **චිත්ත, චෛතසික, රූප** යන ත්‍රිවිධ වූ ධර්මයෝ යි.

**නිර්වාණ, ප්‍රඥප්ති** දෙක හටගැනීමක් නැති ධර්ම බැවින් ප්‍රත්‍යයෝත්පන්න ධර්ම නොවෙත්. හටගැනීමක් ඇත්තා වූ **චිත්ත, චෛතසික, රූප** ධර්මයෝ ප්‍රත්‍යයෝ ද වෙත් ප්‍රත්‍යයෝත්පන්නයෝ ද වෙති.

ප්‍රත්‍යයෝත්පන්න හෙවත් ප්‍රත්‍යයෙන් හටගන්නා ධර්මයන්ගේ ඇතිවීමට ප්‍රත්‍ය ධර්ම බොහෝ ගණනකගේ උපකාරය ලැබිය යුතුය. **එක් ප්‍රත්‍යයකින් පමණක්** හට ගන්නා ධර්මයෙක් නැත. එක් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයක් ඇතිවීමට එක් ප්‍රත්‍යයක් එක්ආකාරයකින් හෝ ආකාර කීපයකින් උපකාරක විය හැකිය. එසේ ප්‍රත්‍යය ධර්මයන්ගේ උපකාර වන ආකාරයන්ට **ප්‍රත්‍යය ශක්තීන්** යයි කියනු ලැබේ. එකම ධර්මය එක් ධර්මයකට එක් ආකාරයකින් ද, අන්‍ය ධර්මයන්ට අන්‍ය ආකාරවලින් ද උපකාරක වන්නේය. ලොභාදිවූ එකම ධර්මයක් අන්‍ය ධර්මයකට මූල භාවයෙන් හෝ ආරම්මණ භාවයෙන් හෝ අධිපති භාවයෙන් හෝ අන්‍යෝන්‍ය භාවයෙන් හෝ නිශ්‍රය උපනිශ්‍රය ආදි භාවයෙන් හෝ උපකාර වියහැකි ය. මෙබඳුවූ උපකාරක ශක්තීන් කරණකොටගෙන ඒ එකම ධර්මය නොයෙක් ප්‍රත්‍ය ධර්ම වශයෙන් සලකනු ලැබේ.

මෙසේ යම්කිසි ආකාරයකින් හෙවත් ශක්ති විශෙෂයකින් අන්‍ය ධර්මයකට උපකාරවන ධර්මයට **ප්‍රත්‍යය ධර්ම** යයි ද, ප්‍රත්‍යය ධර්මයක් නිසා ඇතිවූ පවත්නාවූ ධර්මයට **ප්‍රත්‍යොත්පන්න ධර්ම** යයි ද කියනු ලැබේ. යම් ප්‍රත්‍යය ධර්මයක් ප්‍රත්‍යොත්පන්න භාවයට නොපැමිණෙන ධර්මයක් වේ නම් එයට **ප්‍රත්‍යනීක ධර්ම** යයි කියනු ලැබේ. **ත්‍රි රාශිය** යයි කියනු ලබන්නේ මේ **ප්‍රත්‍යය, ප්‍රත්‍යොත්පන්න, ප්‍රත්‍යනීක** යන ත්‍රිවිධ ධර්මයන්ට ය.

## 1. හෙතු ප්‍රත්‍යය

යම්කිසි ධර්මයකගේ ඇතිවීමට හා පැවතීමට මූලභාවයෙන් උපකාර වන ධර්මය **හෙතු ප්‍රත්‍යය** නම්. **හෙතු** යන්නෙන් මූල භාවය ද, **ප්‍රත්‍යය** යන්නෙන් උපකාරක භාවය ද ප්‍රකාශ වේ.

මූල භාවයෙන් අන්‍ය ධර්මයන්ට උපකාර වන **හෙතු ධර්මයෝ** සදෙනෙකි. එනම්:– **ලොභ, ද්වෙෂ, මොහ** යන අකුසල හෙතු තිදෙනා හා **අලොභ, අද්වෙෂ, අමොහ** යන කුසලව්‍යාකෘත හේතු තිදෙනා ය. පොළොව තදින් අල්වා ගන්නා ගස්වල මුල් මෙන් මේ හේතු ධර්මයෝ සදෙන ද අරමුණු තදින් අල්වා ගන්නා චෛතසික ධර්මයෝ ය. මේ හේතුන්ගේ උපකාරයෙන් ඒ ධර්මයෝ ද සම්ප්‍රයුක්ත වූ චිත්ත චෛතසික ධර්මයෝ ද ලොභාදී වූ ඒ ආරම්මණයන්හි මනාකොට සවිරව පිහිටති. මේ ලොභාදියෙහි ඇති ආරම්මණයෙහි නොසැලී සවිරව පිහිටන සවභාවයට හෙතු ශක්තිය යයි කියනු ලැබේ. මේ හේතු ධර්මයන් උපදනා කල්හි එයටම අනුකූලව සම්ප්‍රයුක්ත ධර්මයෝ ද හේතූන් අනුව ආරම්මණය සවිරව ගනිමින් ඔවුන් හා බැඳී උපදිති. එබැවින් හේතුහු සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ ඉපදීමට ද උපකාර වන ධර්මයෝ යයි කියනු ලැබෙත්. හේතු ධර්ම යෙදෙන සිත් වලට සහෙතුක චිත්තයෝ යයි ව්‍යවහාර කෙරෙති. සම්ප්‍රයුක්ත ධර්ම සහිත වූ සහෙතුක සිත්වලින් සහේතුක චිත්තජ රූපයෝ ද, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ

Free Distribution www.aathaapi.org

රූපද උපදවන කල්හි මේ හේතූහු ඒ සහේතුක චිත්තජ රූපවලට සහ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපවලටද මූල භාවයෙන් උපකාර වෙති. එබැවින් මේ ලෝභාදී වූ හේතු ධර්මයෝ සදෙන අන්‍ය ධර්මයන්ගේ ඉපදීමටත්, පැවැත්මටත් උපකාර වන හෙයින් එයට **ජනකොපසථම්භක** ප්‍රත්‍යයයෝ යයි කියනු ලැබෙත්. ජනක ප්‍රත්‍ය ශක්තියෙන් ප්‍රත්‍යොත්පන්න ධර්මයාගේ උත්පාදයටත් උපසථම්භක ප්‍රත්‍ය ශක්ති යෙන් ඒ ධර්මයාගේ ස්ථිතියටත් ප්‍රත්‍යය වේ. මේ හේතු ධර්මයන් ඇති සිත් එනම් සහේතුක සිත් හේතු ශක්තිය නිසා බලවත් වෙති.

**ලොභය** - ප්‍රිය අරමුණ තදින් අල්වාගෙන ස්ථිරව පිහිටා එහි ඇලෙන සවභාවය **ලොභය** නමි. මේ ලොභ චෛත- සිකය හේතු ධර්මයක් වශයෙන් ලොභ මූල අකුසල් සිත් අටෙහි මොහයත් සමග සම්ප්‍රයුක්තව ඇත්තේය. ලොභ මූල සිත් අටෙහි ඇති **ලොභ, මොහ** යන හේතු දෙක ඒ ලොභ මූල චිත්තයට හා හේතූන්ගෙන් අන්‍යවූ චෛත- සිකයන්ට ද, චිත්තජ රූපයන්ට ද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ. එමෙන්ම එහි ඇති ලෝභය මොහයට ද, මොහය ලෝභයට ද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ. එබැවින් ලෝභයත් මොහයත් යන හේතූන් දෙදෙන ප්‍රත්‍යය හා ප්‍රත්‍යොත්පන්න භාවයට ද පැමිණෙති. සිත හා ලොභ මොහ දෙදෙනාගෙන් අන්‍යවූ චෛතසික ධර්මයෝ ප්‍රත්‍යොත්පන්නයෝ පමණක් වෙති.

**ද්වෙෂය** - අප්‍රිය අරමුණ තදින් අල්වාගෙන ස්ථිරව පිහිටා එහි විරුද්ධව ගැටෙන සවභාවය **ද්වෙෂය** නමි. ද්වෙෂ මූල දෙසිතෙහි මේ ද්වෙෂ චෛතසිකය හේතු ධර්මයක් වශයෙන් මොහයත් සමග සම්ප්‍රයුක්තව ඇත්තේය. ඒ ද්වෙෂ මූල දෙසිතෙහි යෙදෙන **ද්වෙෂ, මොහ** යන හේතු දෙදෙන ඒ ද්වෙෂ මූල චිත්තයට හා හේතූන්ගෙන් අන්‍යවූ සම්ප්‍ර- යුක්ත ධර්මයන්ටද චිත්තජ රූපයන්ට ද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ. එමෙන් එහි ඇති ද්වෙෂය මොහයටත්, මොහය ද්වෙෂයටත් හේතු ශක්තියෙන් උපකාර වේ. එබැවින් මේ

ද්වේෂ, මෝහ දෙදෙන ප්‍රත්‍යයෝ ද වෙත්. ප්‍රත්‍යයෝත්පන්න යෝ ද වෙත්. සිත හා ද්වේෂ මෝහ දෙදෙනාගෙන් අන්‍යවූ චෛතසික ධර්මයෝ ප්‍රත්‍යයෝත්පන්නයෝ පමණක් වෙති.

**මෝහය**- අරමුණ තදින් අල්වාගෙන, සපිරව පිහිටා, එහි සත්‍ය ස්වභාවය, ආදීනවාදිය වසා සිටින මුළා කරවන ස්වභාවය **මෝහය** නමි. ප්‍රිය අරමුණට ඇලුම් කරන ලෝභයත්, අප්‍රිය අරමුණට පිළිකුල් කරන ද්වේෂයත් ඇති වන්නේ මේ මෝහය නිසාමය. මේ මෝහ චෛතසිකය හේතු ධර්මයක් වශයෙන් ලෝභ මූල සිත් අටෙහි ලෝභ හේතුවත් සමගද, ද්වේෂ මූල දෙසිතෙහි ද්වේෂ හේතුවත් සමගද, මෝහ මූල දෙසිතෙහි මෝහ හේතුව පමණක් ද ඇත්තේය. මෝහ මූල දෙසිතෙහි යෙදෙන මෝහ හේතුව එහි සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා චිත්තජ රූපයන්ටද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ. ඒ දෙසිතෙහි ඇති මෝහයට හේතු ශක්තියෙන් උපකාර වීමට අන් හේතු ධර්මයක් නැති හෙයින් ඒ මෝහ මූල දෙසිතෙහි ඇති මෝහය, ප්‍රත්‍යය ධර්මයක් පමණක් වේ. ප්‍රත්‍යයෝත්පන්න භාවයට නො පැමිණෙයි.

**අලෝභය**- අරමුණ තදින් අල්වාගෙන සපිරව පිහිටා ලෝභයට ප්‍රතිවිරුද්ධ වන ස්වභාවය **අලෝභය** නමි මේ අලෝභ චෛතසිකය හේතු ධර්මයක් වශයෙන් සියලුම කාමාවචර මහා කුසල් විපාක, ක්‍රියා සිත් සුවිස්සෙහිද, මහග්ගත කුසල විපාක ක්‍රියා සත්විස්සෙහිද ලෝකෝත්තර සිත් අටෙහිද යන එකුන් සැටක් වූ (59) සෝභන සිත්හි සම්ප්‍රයුක්තව, කාම සෝභන සිත් අතුරෙන් ඥානවිප්‍රයුක්ත සිත් දොළොසෙහි අද්වේෂ හේතුවත් සමගද, ඥානසම්ප්‍රයුක්ත සිත් දොළොසෙහි අද්වේෂ, අමෝහ යන හේතූන් දෙදෙනාත් සමගද ඇත්තේය. මහග්ගත ලෝකෝත්තර සිත්හි අලෝභ, අද්වේෂ, අමෝහ යන හේතුහු තිදෙනම ඇත්තාහ.

**අද්වේෂය**- අරමුණ තදින් අල්වාගෙන සපිරව පිහිටා ද්වේෂයට ප්‍රතිවිරුද්ධ වන ස්වභාවය **අද්වේෂ** නමි. එය

මෛත්‍රියට නමෙකි. මේ අද්වේෂ චෛතසිකය, අලෝභ චෛතසිකය යෙදෙන සියලුම සෝභන සිත්හි සම්ප්‍රයුක්තව හේතු ධර්මයක් වශයෙන් ඇත්තේය. ඥානවිප්‍රයුක්ත සිත්හි අලෝභ හේතුවත් සමග ද, ඥානසම්ප්‍රයුක්ත හෙවත් ත්‍රිහේතුක සිත්හි අලෝභ අමෝහ හේතු දෙදෙනාත් සමගද ඇත්තේය.

**අමෝහය**- අරමුණ තදින් අල්වාගෙන සවිරව පිහිටා මෝහයට ප්‍රතිවිරුද්ධ වන සවභාවය **අමෝහ** නමි. එය ප්‍රඥාවට නමෙකි. මේ අමෝහ චෛතසිකය හේතු ධර්මයක් වශයෙන් සියලු ත්‍රිහේතුක චිත්තයන්හි හෙවත් ඥානසම්ප්‍රයුක්ත කාමාවචර, මහග්ගත, ලෝකෝත්තර චිත්තයන්හි සම්ප්‍රයුක්තව අලෝභ, අද්වේෂ යන හේතු දෙදෙනාත් සමග ඇත්තේය. කාමාවචර කුසල් සහ ක්‍රියා සිත් සොළස (16) අතුරෙන් **ඥානවිප්‍රයුක්ත සිත්හි** ඇති අලෝභ හේතුව සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා චිත්තජ රූපයන්ටද හේතු ශක්ති යෙන් ප්‍රත්‍යය වේ. එමෙන්ම අලෝභ හේතුව අද්වේෂ හේතුවට ද, අද්වේෂ හේතුව අලෝභ හේතුවටද හේතු භාවයෙන් උපකාර වේ. කාමාවචර ඥාන සම්ප්‍රයුක්ත කුසල් සහ ක්‍රියා සිත්හි ඇති අලෝභ හේතුව සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා චිත්තජ රූපයන්ටද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ. එමෙන්ම එහි ඇති අලෝභ හේතුව අද්වේෂ අමෝහ යන හේතු දෙකටද, අද්වේෂ හේතුව අලෝභ අමෝහ හේතු දෙකටද අමෝහ හේතුව අලෝභ අද්වේෂ හේතු දෙකටද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වෙත්.

කාමාවචර මහා විපාක සිත් අට අතුරෙන් ඥානවිප්‍රයුක්ත සිත් සතරෙහි යෙදෙන අලෝභ අද්වේෂ හේතු දෙක ඔවුනොවුන්ට හා සම්ප්‍රයුක්ත ධර්මයන්ටද, භවාඞ්ග තදාරම්මණ වශයෙන් හා ශෛක්ෂ පෘථග්ජන වශයෙන්ද චුති වශයෙන්ද උපදින කල්හි චිත්තජ රූපයන්ටද හේතු ශක්තියෙන් ප්‍රත්‍ය වෙති. ප්‍රතිසන්ධි කෘත්‍යයෙන් උපදනා කල්හි ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ටද හේතු ශක්තියෙන් උපකාර වෙත්. ප්‍රතිසන්ධි චිත්තය චිත්තජරූපයන් නූපදවන බැවින් චිත්තජ

රූපයන්ට ප්‍රත්‍යවීමෙක් නැත. ඥානසම්ප්‍රයුක්ත මහා විපාක සිත් සතරෙහි අලෝභ, අද්වේෂ, අමෝහ යන හේතු තුනම යෙදෙන හෙයින් මේ හේතු තිදෙන ඔවුනොවුන්ට හා සම්ප්‍රයුක්ත ධර්මයන්ටද යට කී පරිද්දෙන් භවාඞ්ග, තදාරම්මණ, වශයෙන් හා ශෛක්‍ෂ, පෘථග්ජන චුතිකෘත්‍ය වශයෙන් උපදනා කල්හි චිත්තජ රූපයන්ට ද ප්‍රතිසන්ධිකෘත්‍යයෙන් උපදනා කල්හි ප්‍රතිසන්ධි කර්මජරූපයන්ටද හේතු ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වෙති. අර්හත්චුති චිත්තයෙහි සම්ප්‍රයුක්ත හේතුහු තිදෙන ඔවුනොවුන්ට හා සම්ප්‍රයුක්ත ධර්මයන්ටද ප්‍රත්‍යය වෙත්.

මහද්ගත කුසල, මහද්ගත ක්‍රියා සම්ප්‍රයුක්ත හේතුහුද, ලෝකොත්තර චිත්ත සම්ප්‍රයුක්ත හේතුහුද, ඔවුනොවුන්ට හා සම්ප්‍රයුක්ත ධර්මයන්ටද චිත්තජ රූපයන්ටද ප්‍රත්‍යය වෙති. රූපාවචර විපාක සිත් ප්‍රතිසන්ධි කෘත්‍යයෙන් උපදනා කල්හි ඒ විපාක හේතුහු ඔවුනොවුන්ටද සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා ප්‍රතිසන්ධි කර්මජරූපයන්ටද ප්‍රත්‍යය වෙති. භවාඞ්ග චුති කෘත්‍යයෙන් උපදනා කල්හි ඔවුනොවුන්ටද, සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා චිත්තජ රූපයන්ටද ප්‍රත්‍යය වෙති.

අරූපාවචර විපාක සම්ප්‍රයුක්ත වූ හේතුහු ඔවුනොවුන්ට හා සම්ප්‍රයුක්ත ධර්මයන්ට පමණක් ප්‍රත්‍යය වෙති. අරූප භූමියෙහි රූප ඉපදවිය නොහැකි හෙයින් රූපයන්ට ප්‍රත්‍යය වීමෙක් නැත.

අවලෝස් අහේතුක චිත්තයන්හි එක් හේතුවක්වත් නැත. එබැවින් අහේතුක චිත්ත චෛතසිකයෝද, අහේතුක චිත්තජ රූපයෝද, අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝද හේතු ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයොත්පන්න භාවයට නොපැමිණෙන බැවින් ඉතා දුබල ධර්මයන් වශයෙන් සලකනු ලැබෙත්.

**ත්‍රි රාශිය**- හේතු ප්‍රත්‍යය පිළිබඳ වූ ස්වරූපයෝ ත්‍රිවිධ වෙති.

එනම්:-

1. **හේතුප්‍රත්‍යය වන ධර්මයෝ ය.**
2. **හේතුප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ය.**
3. **හේතුප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය** හෙවත් හේතුප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න භාවයට නොපැමිණෙන ධර්මයෝ ය.

1. **ප්‍රත්‍යය වන ධර්ම-** හේතුප්‍රත්‍යය වන ධර්මයෝ සදෙනෙකි.

එනම්:-

**ලොභ, දෝෂ, මෝහ, අලොභ, අදෝෂ, අමෝහ** යන හේතු ධර්මයෝ යි.

2. **ප්‍රත්‍යයෝත්පන්න ධර්ම-**

සහේතුක සිත් එක් සැත්තෑවය (71)
මෝහමූල දෙසිතෙහි මෝහය හැර චෛතසික 52
සහේතුක චිත්තජ රූපයෝ ය.
සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය.

3. **ප්‍රත්‍යනීක ධර්ම-**

අහේතුක සිත් අටළොසය (18)
ඡන්දය හැර අන්‍ය සමාන චෛතසික දොළොසය(12)
මෝහමූල දෙසිතෙහි මෝහය ය
අහේතුක චිත්තජ රූපයෝ ය
අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය.
බාහිර රූපයෝ ය
ආහාරජ රූපයෝ ය
ඍතුජ රූපයෝ ය
අසංඥසත්ව කර්මජ රූපයෝ ය
ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය

හේතු ප්‍රත්‍යයෙහි විසර්ජනා වාර හෙවත් වීථි සතකි (7)

1. වීථිය -

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස**
**හෙතු පච්චයෙන පච්චයො**

(කුසල ධර්මය හෙවත් නිරවද්‍ය ඉෂ්ට විපාක දෙන ලක්‍ෂණය ඇති නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවය කුසල ධර්මයට හෙවත් නිරවද්‍ය ඉෂ්ට විපාක දෙන ලක්‍ෂණ ඇති නිස්සත්ත්ව නිර්ජීව ස්වභාවයට හෙතුප්‍රත්‍ය ශක්ති යෙන් උපකාරක වේ.)

**කුසලා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං**
**හෙතු පච්චයෙන පච්චයො**

(කුසල් වූ හේතුහු එකොත් පාදදී හංවයෙන් ඔවු- නොවූන්ට හා සම්ප්‍රයුක්ත වූ ස්කන්ධයන්ට හෙවත් කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන ධර්මයන්ට හේතුප්‍රත්‍යය ශක්තියෙන් උපකාරක වේ.) මෙහි **ප්‍රත්‍යය ධර්ම** වශයෙන් කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන මොවුන්ගේ ද්විහේතුක චිත්තයන්හි ඇති **අලොභ අද්වේෂ** දෙකය, ත්‍රිහේතුක චිත්තයන්හි ඇති **අලොභ, අද්වේෂ, අමොහ** තුනය යන හේතු ධර්ම ලැබෙත්.

**ප්‍රත්‍යයොත්පන්න ධර්ම වශයෙන්** කුසල් සිත් එක්විස්සය චෛතසික අටතිසය යන ධර්මයෝ ලැබෙත්.

දන් දීම, සිල් රැකීම, භාවනා කිරීම, තෙරුවන් පිදීම, ධර්මශ්‍රවණය, වතාවත් කිරීම, පින් දීම් යනාදී නිරවද්‍යවූ යහපත්වූ ඉෂ්ට විපාක ගෙන දෙන්නාවූ ක්‍රියාවන්ට කුසල කර්ම යයි කියනු ලැබේ. මෙසේ කාමාවචර කුසල් කරන කල්හි කාමාවචර මහා කුසල් සිත් අටෙන් එකක් ජවන් වශයෙන් උපදී. රූපාවචර අරූපාවචර ධ්‍යාන උපදවන කල්හි මහග්ගත කුසල් නවයෙන් එකක් ජවන් වශයෙන් උපදී. සෝවාන් ආදී මාර්ගයන්ට පැමිණෙන කල්හි ලොකොත්තර කුසල් සිත් සතරෙන් එකක් ජවන් වශයෙන්

උපදී. කාමාවචර ඥානවිප්‍රයුක්ත සිත් සතරෙන් එකක් මෙසේ උපදී නම් එහි හේතු ධර්ම වශයෙන් අලොභ, අද්වෙෂ යන හේතු දෙකද, ඉතිරි කුසල් සිත් සතළොස නම් එහි අලොභ, අද්වෙෂ, අමොහ යන හේතු තුනම ඇත්තාහ. සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හේතුප්‍රත්‍යයෙන් උපකාර වන කුසල ධර්මයෝ නම් මේ කියනලද එක්විසි කුසල් සිත්හි ඇති හේතු ධර්මයෝ යි.

මේ හේතුප්‍රත්‍යය ශක්තියෙන් උපකාර ලබන කුසල ධර්මයෝ නම් එකී කුසල් සිත් එක්විස්ස සහ එහි සම්ප්‍රයුක්ත වූ අටතිස් කුසල චෛතසික ධර්මයෝයි. මේ ධර්මයෝ කුසල හේතු ධර්මයන්ගේ ප්‍රත්‍යයොත්පන්නයෝ යි.

කාමාවචර කුසල ජවන් උපදනා චිත්තවීථියෙහි පිළිවෙලින් භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේද, මනොද්වාරාවර්ජන යන සිත්වලට අනතුරුව කාමාවචර කුසල් සිත් අටෙන් එකක් ජවන් වශයෙන් සත්වරක් පිළිවෙලින් ඉපිද නිරුද්ධවූ පසු විභූතාරම්මණ වීථියක් වීනම් තදාරම්මණ දෙසිතද, අවිභූතාරම්මණ වීථියක් වීනම් භවාඞ්ග සිත් ද ඉපිද නිරුද්ධ වෙත්. මෙහි කුසලකර්ම වශයෙන් ඇතිවන්නේ ජවන් සිත් සතෙහි ඇති චේතනාවය. කුසල හේතුහු නම් ඒ ජවන් සිත්වල ඇති අලොභ, අද්වෙෂ, අමොහ යන හේතුහුය. ඒ හේතුහු ඒ ජවන් සිත්වල පහළවන අන්‍යවූ චෛතසික ධර්මයන්ට හා ඒ කුසල් සිත් වලටද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයට හේතුප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වීම" යයි කියනු ලැබේ. මහග්ගත ලොකොත්තර කුසල් සිත් පහළවීමේදී ද මේ පිළිවෙලමය. මෙහි සම්ප්‍රයුක්ත ස්කන්ධ යයි දක්වන ලද්දේ ඒ කුසල් සිත පිළිබඳවූ වේදනා, සංඥා, සංස්කාර, විඥාන යන සතර නාමස්කන්ධයන්ට ය.

මෙහිදී සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන කුසල හේතු තුනෙහි එක්වර ලැබෙන **හේතු, අධිපති, සහජාත**

**අඤ්ඤමඤ්ඤ, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, සම්පයුත්ත අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති දශයෙන් හේතු ශක්තිය ලැබේ

**2. වීථිය**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතු පච්චයෙන පච්චයො**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට හේතුප්‍රත්‍යය ශක්ති-යෙන් ප්‍රත්‍යය වේ.)

මේ වීථියෙහි අව්‍යාකෘත ධර්මයන්ට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වන කුසල ධර්මයෝ නම් එක්විසි කුසල් සිත් වලින් ද්විහෙතුක සිත්හි ලැබෙන අලෝභ, අද්වේෂ, දෙකද ත්‍රිහෙතුක සිත්හි ලැබෙන අද්වේෂ, අමෝහ යන හේතු තුනද වෙති. ප්‍රත්‍යෝත්පන්න ධර්මයන් වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම් ඒ ඒ කුසල චිත්තයන් විසින් උපදවන චිත්තජ රූපයෝයි. සම්ප්‍රයුක්ත ධර්මයන් සහිතවූ මේ කුසල් සිත් උපදනා කල්හි එහි උත්පාදක්ෂණයේදීම චිත්තජ රූපද උපදවනු ලැබේ. සිතට හා සම්ප්‍රයුක්ත ධර්මයන්ටද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වන හේතු ධර්මයෝ මේ චිත්තජ රූපයන්ටද හේතු ශක්තියෙන්ම ප්‍රත්‍යය වෙත්. මෙය කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට හේතු ශක්තියෙන් ප්‍රත්‍යයවීම යයි කියනු ලැබේ. මෙහිදී චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන කුසල හේතුන්හි සුදුසු පරිදි එක්වර ලැබෙන **හෙතු, අධිපති, සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති නවය අතුරෙන් හේතු ශක්තිය ලැබේ.

**3. වීථිය-**

**කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො**

(කුසල ධර්මය කුසල ධර්මයට හා අව්‍යාකෘත ධර්මයට ද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**කුසලාහෙතූ සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානංච රූපානං හෙතුපච්චයෙන පච්චයො**

(කුසල හේතූහු සම්ප්‍රයුක්ත සකන්ධයන්ට හා චිත්තජ රූපයන්ට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා චිත්තජ රූපයන්ට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වන කුසල ධර්මයෝ නම් පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ එක්විසි කුසල් සිත් අතුරෙන් ද්විහේතුක කුසල් සිත්හි ඇති අලොභ, අදොෂ දෙක හා ත්‍රිහේතුක සිත්හි අලොභ, අදොෂ අමොහ යන හේතු තුනද වෙත්. ඒ හේතු ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යොත්පන්නයෝ නම් කුසල් සිත් එක්විස්සය, (21) චෛතසික අටතිසය (38) යන සම්ප්‍රයුක්ත සකන්ධයන් හා චිත්තජ රූපයෝයි. මේ වීථියෙන් දක්වන ලද්දේ පඤ්චවොකාර භූමියෙහි කුසල ජවන් උපදනා චිත්ත වීථියෙහි ජවන් සිත්වල යෙදෙන කුසල හේතූහු ඒ චිත්තක්ෂණයෙහිම පහළවන සම්ප්‍රයුක්ත ධර්ම සමූහයට සහ චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ආකාරයයි. මෙහිදී සම්ප්‍රයුක්ත සකන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යයවන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල හේතු තුනෙහි සුදුසු පරිදි එක්වර ලැබෙන **හේතු, අධිපති, සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්තීන් අටදෙනා අතුරෙන් හේතු ශක්තිය ලැබේ.

**4. වීථිය**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො**

(අකුසල ධර්මය අකුසල ධර්මයට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

Free Distribution www.aathaapi.org

**අකුසලා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං හෙතුපච්චයෙන පච්චයො**

(අකුසල හේතූහු සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හෙතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙයින් සාවද්‍ය දුක්ඛ විපාක දෙන ලක්ෂණවූ අකුසල ධර්මය සාවද්‍ය දුක්ඛ විපාක දෙන ලක්ෂණවූ අකුසල ධර්මයට හේතු ශක්තියෙන් ප්‍රත්‍යවන සැටි දැක්වේ. මෙහි සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වන අකුසල ධර්මයෝ නම්:

1. ලොභමූල සිත් අටෙහි ඇති ලොභ මොහ යන හේතු දෙකය.
2. වෙෂමූල සිත් දෙකෙහි ඇති වෙෂ, මොහ යන හේතු දෙකය.
3. මොහමූල සිත් දෙකෙහි ඇති මොහ හේතුවය.

මේ අකුසල හේතූන්ගේ ප්‍රත්‍යොත්පන්න භාවයට පැමිණෙන අකුසල ධර්මයෝ නම්:

1. අකුසල් සිත් දොළොසය (12)
2. මොහමූලචයෙහි මොහය හැර චෛතසික සත්විස්සය (27)

ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුණවාච, ඵරුසවාච, සම්ඵප්පලාප, අභිද්‍යා, ව්‍යාපාද, මිථ්‍යාදිට්ඨි යනාදීවූ අකුසල කර්මයක් සිදුකරන කල්හි ඒ චිත්ත වීථියෙහි දොළොස් අකුසල් සිත් අතුරෙන් එක් අකුසල් සිතක් ජවන් වශයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වූ පසු විභූතාරම්මණ වීථියක් වීනම් තදාරම්මණ සිත් දෙකක්ද අවිභූතාරම්මණ වීථියක් වීනම් භවාඞ්ග සිත් ද පිළිවෙළින් ඉපිද නිරුද්ධ වෙත්. මෙහි අකුසල හේතූන් වශයෙන් දක්වන ලද්දේ ඒ අකුසල ජවන් සිත්හි ඇති අකුසල හේතු ධර්මයෝයි. ඒ අකුසල හේතු ප්‍රත්‍යය ධර්මයන්ගේ ප්‍රත්‍යොත්පන්න භාවයට පැමිණෙන අකුසල ධර්මයෝ නම්

ඒ අකුසල ජවන් සිත්හි ඇති සම්ප්‍රයුක්ත ධර්මයෝය. මෙය අකුසල ධර්මය අකුසල ධර්මයට හේතු ශක්තියෙන් ප්‍රත්‍යයවීම යයි කියනු ලැබේ. මෙහිදී සම්ප්‍රයුක්ත සකන්ධයන්ට ප්‍රත්‍යය වන අකුසල හේතූන්හි එක්වර ලැබිය හැකි **හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්ථි, අවිගත** යන ශක්ති සත අතුරෙන් හේතු ශක්තිය ලැබේ.

**5. වීථිය-**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ)

**අකුසලා හෙතු චිත්ත සමුට්ඨානානං රූපානං හෙතු පච්චයෙන පච්චයො**

(අකුසල හේතුහු චිත්තජරූපයන්ට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයන්ට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වන අකුසල ධර්මයෝ නම් පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දොළොස් අකුසල් සිත්හි ඇති ලොභ, දෙෂ, මොහ යන අකුසල හේතුහුය. ප්‍රත්‍යොත්පන්න භාවයට පැමිණෙන අව්‍යාකෘත ධර්මයෝ නම් ඒ ඒ අකුසල ජවනයන් විසින් උපදවනු ලබන චිත්තජ රූපයෝය. මෙය අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට හේතුශක්තියෙන් ප්‍රත්‍යය වීමය. මෙහිදී දොළොස් අකුසල් සිත්හි ඇති ලොභ, දෙෂ, මොහ යන හේතූන්හි එක්වර ලැබිය හැකි **හේතු, සහජාත, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත** ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් හේතු ශක්තිය ලැබේ.

**6. වීථිය**

**අකුසලො ධම්මො අකුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස හෙතු පච්චයෙන පච්චයො**

(අකුසලධර්මය, අකුසල ධර්මයට හා අව්‍යාකෘත ධර්මයට ද හේතුශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**අකුසලා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත-සමුට්ඨානානංච රූපානං හෙතුපච්චයෙන පච්චයො**

(අකුසලහේතූහු, සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද හේතුශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහිදී සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වන අකුසල ධර්මයෝ නම් පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දොළොස් අකුසල චිත්තයන්හි ඇති ලොභාදී හේතූහුය. මේ අකුසල හේතු ප්‍රත්‍යයන්ගේ ප්‍රත්‍යයොත්පන්න භාවයට පැමිණෙන ධර්මයෝ නම් ඒ අකුසල ජවන් සිත්හි ඇති සම්ප්‍රයුක්ත ධර්මයන් හා සසම්ප්‍රයුක්ත වූ ඒ අකුසල ජවනයන් විසින් උපදවනු ලබන චිත්තජ රූපයෝය.

එනම්:

1. අකුසල් සිත් දොළොසය.
2. මොහමූල දෙසිතෙහි මොහය හැර චෛතසික සත්විස්සය.
3. අකුසල චිත්තජ රූපයෝය.

මෙය අකුසල ධර්මය අකුසල ධර්මයට හා අව්‍යාකෘත ධර්මයටද හේතුශක්තියෙන් ප්‍රත්‍යයවීමය. මෙහි සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන අකුසල හේතූන්හි එක්වර ලැබිය හැකි **හෙතු, සහජාත, නිස්සය අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් හේතු ශක්තිය ලැබේ.

**7. වීථිය**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතු පච්චයෙන පච්චයො**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

**විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානංච රූපානං හෙතුපච්චයෙන පච්චයො**

(ප්‍රවෘත්ති කාලයෙහි අව්‍යාකෘත වූ විපාක ක්‍රියා හේතූහු සම්ප්‍රයුක්ත සකන්ධයන්ට හා චිත්තජ රූපයන්ට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයන්ට හේතුශක්තියෙන් ප්‍රත්‍යය වන අව්‍යාකෘත ධර්මයෝ නම් ප්‍රවෘත්ති කාලයෙහි සම්ප්‍රයුක්ත ධර්මයන්ටද, සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා චිත්තජ රූපයන්ටද ප්‍රත්‍යය වන-

1. සහේතුක විපාක සිත් එක් විස්සය (21)
2. සහේතුක ක්‍රියා සිත් සතළොසය (17)
3. චෛතසික අටතිසය (38)

යන මොවුන්ගේ විහේතුක චිත්තයන්හි ලැබෙන අලෝභ, අද්වේෂ දෙකය. ත්‍රිහෙතුක චිත්තයන්හි ලැබෙන අලෝභ, අද්වේෂ, අමොහ යන හේතු තුනය.

මේ අව්‍යාකෘත හේතුන්ගේ ප්‍රත්‍යයොත්පන්න භාවයට පැමිණෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

1. සහේතුක විපාක සිත් එක්විස්සය (21)
2. සහේතුක ක්‍රියා සිත් සතොළොසය (17)
3. චෛතසික අටතිසය (38)

යන සම්ප්‍රයුක්ත නාමසකන්ධයන් සහ චිත්තජ රූපයෝය.

මේ වීථියෙහි ප්‍රත්‍යය ධර්ම වශයෙන් දක්වනලද අව්‍යාකෘත ධර්මයෝ වනාහි විස්තර වශයෙන් මෙසේය:

1. කාමාවචර මහා විපාක සිත් අටය (8)
2. මහග්ගත විපාක සිත් නවය (9)
3. ලොකොත්තර ඵල සිත් සතරය (4)

යන විපාක සිත් එක්විස්සය.

4. කාමාවචර මහා ක්‍රියා සිත් අටය (8)
5. මහග්ගත ක්‍රියා සිත් නවය (9)

Free Distribution www.aathaapi.org

යන ක්‍රියා සිත් සතළොසය (17) යන මොවුන්ගේ ද්විහේතුක සිත්හි අලෝභ අදෝෂ හේතු දෙක සහ ත්‍රිහේතුක සිත්හි අලෝභ අදෝෂ අමෝහ හේතු තුනය මෙයින් ප්‍රවෘත්ති කාලයෙහි මහා විපාක සිත් උපදින්නේ භවාඞ්ග තදාරම්මණ සිත් වශයෙනි මරණාසන්න චිත්ත වීථියෙහි චුති සිත වශයෙන්ද මේ මහා විපාක සිත උපදී ක්‍රියා සිත් උපදින්නේ රහතන් වහන්සේගේ චිත්ත සන්තානයෙහිය. මහග්ගත විපාක සිත් ප්‍රවෘත්ති කාලයෙහි දී රූපාරූප භූමිවලදී භවාඞ්ග සිත් වශයෙන් හා චුති සිත වශයෙන්ද උපදී. ලෝකෝත්තර ඵල සිත් ඇතිවන්නේ මාර්ග සිත් වලට අනතුරුවය.

**පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා හෙතූ සම්පයුත්තකානං ඛන්ධානං කටත්තා ච රූපානං හෙතුපච්චයෙන පච්චයො.**

(**ප්‍රතිසන්ධික්ෂණයෙහි** අව්‍යාකෘතවූ විපාක හේතූහු, සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ද හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වේ)

ප්‍රතිසන්ධික්ෂණයෙහි අව්‍යාකෘත හේතුප්‍රත්‍යයන් වශයෙන් ලැබෙන ධර්මයෝ නම්:

1. සහේතුක ප්‍රතිසන්ධි සිත් සතොළොසය (17)
2. චෛතසික පන්තිසය (35)

යන මොවුන්ගේ ද්විහේතුක සිත්හි ලැබෙන අලෝභ, අදෝෂ, දෙකය, ත්‍රිහේතුක සිත්හි ලැබෙන අලෝභ, අදෝෂ, අමෝහ යන හේතු තුනය.

ප්‍රත්‍යොත්පන්න ධර්ම වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

1. සහේතුක ප්‍රතිසන්ධි සිත් සතොළොසය (17)
2. චෛතසික පන්තිසය (35)
3. ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය.

ප්‍රතිසන්ධික්ෂණයේදී සසම්ප්‍රයුක්තවූ ප්‍රතිසන්ධි චිත්තයාගේ දුබලතාවය හා වස්තු දුබලතාවය නිසා චිත්තජරූප නූපදී. එහි උත්පාදක්ෂණයේදී කර්මජ රූපයෝ පමණක් උපදී. කර්මජ රූපයන්ගේ චිත්තය හා සම්බන්ධය ඇත්තේ මේ ප්‍රතිසන්ධි අවස්ථාවෙහි පමණය. ප්‍රවෘත්ති කර්මජ රූපයෝ සිත් හා සම්බන්ධව නොපවතී.

**ප්‍රවෘත්ති කාලයෙහි,** සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ටද, සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද ප්‍රත්‍යය වන විපාක ක්‍රියා හේතුන්හි එක්වර සුදුසු පරිදි ලැබෙන **හෙතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති දොළොස අතුරෙන් හෙතු ශක්තිය ලැබේ.

**ප්‍රතිසන්ධික්ෂණයෙහි** සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ටද ප්‍රත්‍යය වන සහේතුක ප්‍රතිසන්ධි සතොළොසෙහි ඇති හේතු තුනෙහි සුදුසු පරිදි එක්වර ලැබෙන **හෙතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති දශය අතුරෙන් හේතු ශක්තිය ලැබේ.

ශමය අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට හේතු ශක්තියෙන් ප්‍රත්‍යය වීමය.

මෙසේ මේ හේතු ප්‍රත්‍යය පිළිබඳව-

1. හෙතු ප්‍රත්‍යය ධර්ම සයක්ද (6)
2. විසර්ජනාවාර හෙවත් වීථි සතක්ද (7)
3. එකට ගැටෙන ප්‍රත්‍යය දොළොසක්ද (12) වෙති.

## 2. ආරම්මණ ප්‍රත්‍යය

සිතින් ගතයුතු දෙය හෙවත් සිතක් ඇතිවීමට උපකාර වන දෙය **අරමුණ** නමි. අරමුණක් නැතිව සිතක් නූපදී. චෛතසිකයෝද සිත හා බැඳී සිතට අනුව අරමුණු ගනිමින්ම තම තමන්ට අයත් කෘත්‍යයන් සිදුකරමින්

උපදී. චිත්ත චෛතසිකයෝ අවුත් යමක ඇලේද එහෙයින් **ඒ** ධර්මයන්ට ආරම්මණයෝ යයි කියති. චිත්ත චෛතසික ධර්මයන්ගේ ඉපදීමට මේ ආරම්මණයෝ උපකාරවන බැවින් එයට **ආරම්මණ ප්‍රත්‍යය** යයි කියනු ලැබේ. රූපාදි ආරම්මණයන්හි සිතට ගැනීමට ඉඩ දෙන, සිතට ගැනීමට යෝග්‍ය වන ස්වභාවය **ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය** නම්. ත්‍රෛකාලිකවූ සියලුම චිත්ත, චෛතසික, රූප ධර්මයෝද, කාලමුක්තවූ නිර්වාණය හා ප්‍රඥප්තියද, යන සියල්ලම ආරම්මණ ප්‍රත්‍යය ධර්මයෝය. ආරම්මණ බවට නොපැමිණෙන ධර්මයක් නැත්තේය. අරමුණක් නිසා ඇතිවන සියලුම චිත්ත චෛතසික ධර්මයෝ ආරම්මණ ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යෝත්පන්නයෝ වෙති. එබැවින් චිත්ත චෛතසික ධර්මයෝ ආරම්මණ ප්‍රත්‍යයෝද වෙති. ප්‍රත්‍යෝත්පන්නයෝද වෙති. රූප ධර්මයෝද නිර්වාණය හා ප්‍රඥප්තිහුද ප්‍රත්‍යයයෝ පමණක් වෙති. ප්‍රත්‍යෝත්පන්න භාවයට නො පැමිණෙති.

**ත්‍රිරාශිය** – ආරම්මණ ප්‍රත්‍යයයාගේ **ප්‍රත්‍යය ධර්මය ය, ප්‍රත්‍යෝත්පන්න ධර්මය ය, ප්‍රත්‍යනීක ධර්මය** යයි ධර්මයෝ ත්‍රිවිධ වෙත්.

**ප්‍රත්‍යය ධර්ම** – වර්තමාන වූ ද, අතීත වූ ද, අනාගත වූ ද සියලුම

| | |
|---|---|
| **සිත්** | **89** |
| **චෛතසික** | **52** |
| **රූප** | **28** |

කාලමුක්තවූ **නිර්වාණය** හා **ප්‍රඥප්තිය.**

**ප්‍රත්‍යෝත්පන්න ධර්ම**–

| | |
|---|---|
| **සිත්** | **89** |
| **චෛතසික** | **52** |

**ප්‍රත්‍යනීක ධර්ම**–

**චිත්තජ රූපයෝය**

**ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය**
**බාහිර රූපයෝය**
**ආහාරජ රූපයෝය**
**ඍතුජ රූපයෝය**
**අසංඥසත්ත්ව කර්මජ රූපයෝය**
**ප්‍රවෘත්ති කර්මජ රූපයෝය**

ඒ ඒ ආරම්මණ ප්‍රත්‍යොත්පන්න ධර්මයන්ට ප්‍රත්‍යය වන **ආරම්මණ** ප්‍රත්‍යය ධර්ම හෙවත් අරමුණු මෙසේයි:

| **ප්‍රත්‍යොත්පන්න ධර්ම** | | **ප්‍රත්‍යය ධර්ම හෙවත් අරමුණු** |
|---|---|---|
| චක්ඛුද්වාරික සිත් | 46 | වර්තමාන වර්ණය |
| ශ්‍රොතද්වාරික සිත් | 46 | වර්තමාන ශබ්දය |
| ඝ්‍රාණද්වාරික සිත් | 46 | වර්තමාන ගන්ධය |
| ජිව්හාද්වාරික සිත් | 46 | වර්තමාන රසය |
| කායද්වාරික සිත් | 46 | වර්තමාන පොට්ඨබ්බය (පඨවි, තෙජෝ, වායෝ) |
| මනොද්වාරික සිත් | 67 | වර්තමානවූද, අතීතවූද, අනාගතවූද, කාලත්‍රයට අයත් නොවූද, පරමාර්ථවූද, පරමාර්ථ නොවූද සියළු ධර්මයෝ |
| ද්වාරමුක්ත සිත් (පටිසන්ධි, භවාඞ්ග, චුති) | 19 | අතීත භවයෙහි මරණාසන්නයේදී වැටහුණු කර්ම, කර්ම නිමිති, ගති නිමිති යන තුනෙන් එකෙකි. |
| **අකුසල් සිත්** | **12** | නවලොකොත්තර ධර්ම හැර ඉතිරි සියල්ල |
| **අහේතුක සිත්** | **18** | |
| චක්ඛු විඥාන සිත් | 2 | වර්තමාන වර්ණය |
| සොත විඥාන සිත් | 2 | වර්තමාන ශබ්දය |
| ඝාන විඥාන සිත් | 2 | වර්තමාන ගන්ධය |
| ජිව්හා විඥාන සිත් | 2 | වර්තමාන රසය |

| | | | |
|---|---|---|---|
| කායවිඤ්ඤාන සිත් | 2 | වර්තමාන ස්පර්ශය | |
| සම්පටිච්ඡන සිත් | 2 | වර්තමාන රූපාදිවූ පඤ්චවිධ ආරම්මණයෝ | |
| පඤ්චද්වාරාවර්ජන සිත් | 1 | | |
| සන්තීරණ සිත් | 2 | කාමාවචර ධර්ම සියල්ල | |
| හසිතොත්පාද සිත් | 1 | | |
| මනොද්වාරාවර්ජන සිත් | 1 | සියලුම ධර්ම | |
| ඤාණසම්ප්‍රයුක්ත මහා කුසල් සිත් | 4 | අර්හත් මග හා ඵලය හැර අන් සියල්ල | |
| ඤාණවිප්‍රයුක්ත ,, | 4 | ලෞකික ධර්ම සියල්ල | |
| මහා විපාක සිත් | 8 | කාමාවචර ධර්ම සියල්ල | |
| ඤාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් | 4 | ලෞකික ලොකොත්තර ධර්ම සියල්ල | |
| ඤාණවිප්‍රයුක්ත මහාක්‍රියාසිත් | 4 | ලෞකික ධර්ම සියල්ල | |
| රූපාවචර ප්‍රථමධ්‍යාන සිත් | 3 | කසිණ | 10 |
| | | අසුභ | 10 |
| | | කෙශාදී කොට්ඨාශය | 1 |
| | | ආශ්වාස ප්‍රාශ්වාසය | 1 |
| | | මෛත්‍රියට අරමුණු වන සත්ත්ව ප්‍රඥප්තිය | 1 |
| | | කරුණාවට අරමුණු වන සත්ත්ව ප්‍රඥප්තිය | 1 |
| | | මුදිතාවට අරමුණුවන සත්ත්ව ප්‍රඥප්තිය | 1 |
| | | යන ප්‍රඥප්තීහු | 25 |

| | | | |
|---|---|---|---|
| රූපාවචර දෙවෙනි ධ්‍යාන සිත් 3<br>රූපාවචර තුන්වෙනි ධ්‍යාන සිත් 3<br>රූපාවචර සතරවෙනි ධ්‍යාන සිත් 3 | 9 | කසිණ<br>ආශ්වාස ප්‍රශ්වාසය<br>මෛත්‍රියට අරමුණුවන සත්ත්ව ප්‍රඥප්තිය<br>කරුණාවට අරමුණුවන සත්ත්ව ප්‍රඥප්තිය<br>මුදිතාවට අරමුණුවන සත්ත්ව ප්‍රඥප්තිය<br>යන ප්‍රඥප්තීහු | 10<br>1<br>1<br>1<br>1<br>14 |
| රූපාවචර පස්වෙනි ධ්‍යාන සිත් | 3 | කසිණ<br>ආශ්වාස ප්‍රශ්වාසය<br>උපෙක්ෂා බ්‍රහ්ම විහරණයට අරමුණුවන සත්ත්ව ප්‍රඥප්තිය<br>යන ප්‍රඥප්තීහු | 10<br>1<br>1<br>12 |
| රූපාවචර 5 වෙනි ධ්‍යාන කුසල අභිඥා සිත | 1 | අතීත් මාර්ග සිත හා අතීත් ඵල සිත හැර අන් සියලුම ධර්ම | |
| රූපාවචර 5 වෙනි ධ්‍යාන ක්‍රියා අභිඥා සිත | 1 | සියලුම ධර්ම | |
| **අරූපාවචර සිත්** | | | |
| ආකාසානඤ්චායතන සිත් | 3 | ආකාස කසිණය හැර ඉතිරි කසිණ නවය උද්ඝාටනය කොට ලැබෙන ආකාශ ප්‍රඥප්තිය | |
| විඤ්ඤාණඤ්චායතන කුසල් සිත | 1 | ඒ සන්තානයෙහි වර්තමාන භවයෙහි හෝ අතීත භවයෙහි හෝ ඇතිවූ ආකාසානඤ්චායතන කුසල චිත්තය | |

6

| | | |
|---|---|---|
| විඤ්ඤාණඤ්චායතන විපාක සිත | 1 | අතීත භවයෙහි ඒ සන්තානයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන කුසල චිත්තය |
| විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත | 1 | වර්තමාන භවයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන කුසලය හා වර්තමාන භවයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන ක්‍රියා සිත |
| ආකිඤ්චඤ්ඤායතන සිත් | 3 | ආකාසානඤ්චායතන කුසල ක්‍රියා චිත්තයාගේ නාස්තිභාව ප්‍රඥප්තිය |
| නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිත | 1 | අතීතභවයෙහි හෝ වර්තමාන භවයෙහි ඒ සන්තානයෙහි ඇතිවූ ආකිඤ්චඤ්ඤායතන කුසලය |
| නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිත | 1 | අතීත භවයෙහි ඇතිවූ ආකිඤ්චඤ්ඤායතන කුසලය. |
| නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා සිත | 1 | ආකාසානඤ්චායතන කුසල ක්‍රියා සිත් දෙක |
| ලෝකෝත්තර සිත් | 8 | නිර්වාණය |

**ආරම්මණ ප්‍රත්‍යය** පිළිබඳ විසර්ජනාවාර හෙවත් වීථි නවයෙකි.

## 1. වීථිය

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයක පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවන කුසල ධර්මයෝ නම්:-

1. මහා කුසල ඤාණ විප්පයුත්ත සිත් සතරට ප්‍රත්‍යය වන ලෞකික කුසල් සතළොසය (17)

2. මහා කුසල ඤාණ සම්පයුත්ත සිත් සතරට ප්‍රත්‍යය වන අර්හත් මාර්ග සිත හැර කුසල් සිත් විස්සය (20)

3. විඤ්ඤාණඤ්චායතන කුසලයට ප්‍රත්‍ය වන වර්තමාන භවයෙහි හා අතීත භවයෙහි ස්වසන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන කුසලය.

4. නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසලයට ප්‍රත්‍යවන වර්තමාන භවයෙහි හා අතීත භවයෙහි ස්වසන්තානයෙහි උපන් ආකිඤ්චඤ්ඤායතන කුසලය.

5. ඉද්ධිවිධ කුසලාභිඥාවට ප්‍රත්‍යය වන පාදක රූපා-වචර පඤ්චමධ්‍යාන කුසලය.

6. චේතොපරිය කුසලාභිඥාවට ප්‍රත්‍යය වන අතීතයෙන් සත්දිනක්ද, අනාගතයෙන් සත්දිනක්ද ඇතුළු කාලත්‍රයෙහිවූ අර්හත් මාර්ගයෙන් අන්‍යවූ අන්‍ය සත්වයන්ගේ කුසල් සිත් විස්සය (20)

7. පුබ්බෙනිවාසානුස්සති කුසලාභිඥාවට ප්‍රත්‍ය වන පෙර ජාතිවල උපන්, අර්හත් මාර්ගයෙන් අන්‍ය කුසල් සිත් විස්සය (20)

8. යථා කම්මූපග කුසලාභිඥාවට ප්‍රත්‍ය වන අතීත ලෞකික කුසල ධර්මයෝය.

9. අනාගතාංස කුසලාභිඥාවට ප්‍රත්‍යය වන අර්හත් මාර්ගය හැර කුසල් සිත් විස්සය (20)

10. චෛතසික අටතිසය (38) යන මොව්හුය. **ආරම්මණ** ප්‍රත්‍යයවූ මේ කුසල ධර්මයන්ගේ **ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ** නම්:—

1. මහා කුසල් සිත් අටය (8)
2. විඥ්ඥාණඤ්චායතන කුසල් සිතය.
3. නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිතය
4. ඉද්ධිවිධ කුසලාභිඥාවය
5. චෙතොපරිය කුසලාභිඥාවය.
6. පුබ්බෙනිවාසානුස්සති කුසලාභිඥාවය.
7. යථාකම්මූපග කුසලාභිඥාවය.
8. අනාගතංස කුසලාභිඥාවය.
9. විරති, අප්‍රමාණ්‍යයන් හැර චෛතසික තෙතිසය (33)

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබිය හැකි **ආරම්මණ, ආරම්මණාධිපති, ආරම්මණූපනිස්සය** යන ප්‍රත්‍යය ශක්ති තුන අතුරෙන් **ආරම්මණ** ශක්තිය ලැබේ.

**මේ වීථියේ** අනුවාද වශයෙන්

1. **දානං දත්වා තං පච්චවෙක්ඛති**

(දන් දීමෙහිදී පරිත්‍යාග චේතනා ප්‍රධාන කාමාවචර කුසල චිත්තය එම කුසලය මෙනෙහි කරන්නාවූ කාමාවචර කුසල චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

ආහාර පානාදීවූ දාන වස්තූන් පරිත්‍යාග චේතනාවෙන් දෙන කල්හි, ඔහුගේ සන්තානයෙහි පිළිවෙලින් භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේදයන් ඉපිද නිරුද්ධ වූ පසු එම දාන වස්තුව අරමුණුකොට මනොද්වාරාවජ්ජන චිත්තය ද, එයට අනතුරුව මහා කුසල් සිත් අට අතුරෙන් එක් සිතක් ජවන් වශයෙන් සත් වරක් ඉපිද නිරුද්ධ වෙති. එම චිත්ත වීථිය විභූතාරම්මණ වීථියක් වීනම් ජවනයන්ට අනතුරුව දෙවරක් තදාරම්මණය ඉපිද නිරුද්ධවීමෙන් පසු භවාඞ්ගය වේ. අවිභූතාරම්මණ වීථියක් වේනම් ජවනයට

අනතුරුව භවාඞ්ගය වේ. ඒ චිත්ත වීථියෙන් දන්දීම සිදු වේ. අනතුරුව ඒ දන වස්තුව අරමුණුකොට තදනුවර්තික මනොද්වාර වීථිහු උපදිති. පසුව ඒ දන්දුන් පුද්ගලයා විසින් තමාගේ සන්තානයෙහි උපන් පරිත්‍යාග චේතනාව ප්‍රධාන කොට ඇති කුසල චිත්තය මෙනෙහි කරන කල්හි නැවත පිළිවෙලින් භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡේද මනො-ද්වාරාවර්ජන චිත්තයන් ඉපිද නිරුද්ධවූ පසු, ඒ දන චේතනාව ප්‍රධාන කොට උපන් කාමාවචර කුසල චිත්තය අරමුණු කොට මහා කුසල් සිත් අට අතුරෙන් එක් කුසල් සිතක් ජවන් වශයෙන් සත් වරක් ඉපිද, විභූතාරම්මණ වීථියක් වීනම් තදාරම්මණ සිත් දෙකක්ද, අවිභූතාරම්මණ වීථියක් වීනම් භවාඞ්ගයෙන්ද වීථිය අවසන් වේ එයට අනතුරුව ඒ පරිත්‍යාග චේතනාව ප්‍රධාන කොට උපන් කුසල චිත්තය අරමුණු කොට තදනුවර්තික මනොද්වාර වීථිහු බොහෝ ගණනක් උපදිති එසේ උපදනා කාමාවචර කුසල ජවනයන් අතුරෙන් පරිත්‍යාග චේතනාව ප්‍රධාන කොට ඇති කාමාවචර කුසලයන් ඒවා අරමුණු කොට ප්‍රත්‍යවෙක්ෂා කිරීම් වශයෙන් හෙවත් මෙනෙහි කිරීම් වශයෙන් පසුව උපදනා කාමාවචර කුසලචිත්තයට ආරම්මණ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම" යයි කියනු ලැබේ.

### 2. සීලං සමාදියිත්වා තං පච්චවෙක්ඛති

(පඤ්චාඞ්ග සීල, දශසීලාදී වශයෙන් ඇතිවන සීල චේතනාව ප්‍රධාන කාමාවචර කුසල චිත්තය ඒ සීලමය කුසලය ප්‍රත්‍යවෙක්ෂා කරන හෙවත් මෙනෙහි කරන කාමාවචර කුසල චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

පන්සිල් සමාදන්ව, පඤ්ච දුශ්චරිතයෙන් වළක්නා පුද්ගලයාහට ඔහුගේ විඥාන සන්තානයෙහි පිළිවෙළින් භවාඞ්ග චලන භවඞ්ගුපච්ඡේද සිත් ඉපිද නිරුද්ධවූ කල්හි

**ප්‍රාණඝාතයෙන්** වළක්නේ වේ නම් රූපජීවිතෙන්ද්‍රිය ය හෝ, රූපජීවිතෙන්ද්‍රියය අරමුණු කරන අකුසල චෙතනාව ප්‍රධාන කොට ඇති දෙසමූල මොහමූල චිත්තය හෝ, ඒ දෙසමූල මොහමූල චිත්තයන් විසින් උපදවන කාය විඥප්තිය හෝ අරමුණු කොට හෝ මනොවාරාවජ්ජන චිත්තය හා මහා කුසල් සිත් අට අතුරෙන් එක් සිතක් ජවන් වශයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වෙති. ඉක්බිති තදාරම්මණ දෙසිත හා භවාඞ්ගය හෝ තදාරම්මණය නැතිව භවාඞ්ගය හෝ ඉපිද චිත්ත වීථිය අවසන්වේ. මේ වීථියෙන් **ප්‍රාණඝාතයෙන්** වැළකීම සිද්ධවේ.

මේ පුද්ගලතෙමේ අදත්තාදානයෙන් වළක්නා කල්හි අන්සතු වස්තුව හෝ, එය අරමුණු කොට උපදනා අකුසල චෙතනාව ප්‍රධාන කොට ඇති දෙලොස් අකුසල චිත්තයන් හෝ, ඒ සිත්වලින් උපදවන කාය විඥප්තිය හෝ අරමුණු කොට මනොවාරාවජ්ජන, ජවනයෝ උපදිති. මේ වීථියෙන් අදත්තාදානයෙන් වැළකීම සිද්ධවේ.

කාමමිථ්‍යාචාරයෙන් වළක්නා කල්හි පරස්ත්‍රී, පරපුරුෂයන් හෝ ඔවුන් අරමුණු කොට උපදනා චෙතනාව ප්‍රධාන කොට ඇති ලොභමූල මොහමූල චිත්තයන් හෝ, ඒ සිත් වලින් උපදවන කාය විඥප්තිය හෝ අරමුණු කොට මනොවාරාවජ්ජන ජවනයෝ උපදිති. මේ වීථියෙන් කාමමිථ්‍යාචාරයෙන් වැළකීම සිද්ධවේ.

මුසාවාදයෙන් වළක්නා කල්හි අසත්‍ය වස්තුව හෝ, එය අරමුණු කොට උපදනා අකුසල චෙතනාව ප්‍රධාන කොට ඇති දෙලොස් අකුසල චිත්තයන් හෝ ඒවායින් උපදවන කාය වාග් විඥප්තීන් හෝ, අරමුණු කොට මනොවාරාවජ්ජන, ජවනයෝ උපදිති. මේ වීථියෙන් මුසාවාදයෙන් වැළකීම සිද්ධවේ.

සුරාපානයෙන් වළක්නා කල්හි සුරාව හෝ එය අරමුණු කරන අකුසල චෙතනාව ප්‍රධාන කොට ඇති

ලොභමූල මොහමූල චිත්තයන් හෝ, ඒ සිත්වලින් උපදවන කාය විඥප්තිය හෝ, අරමුණු කොට මනොද්වාරාවජ්ජන ජවනයෝ උපදිති. මේ වීථියෙන් සුරාපානයෙන් වැළකීම සිදුවේ.

මෙසේ ප්‍රාණඝාතාදියෙන් වළක්නා චිත්තවීථින්ට අනතුරුව සුදුසු පරිදි තදනුවර්තක මනොද්වාරවීථිහු උපදනාහ. ප්‍රාණඝාතාදියෙන් වැළකුණාවූ පුද්ගලයා විසින් පසුව එය ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි හෙවත් මෙනෙහි කරන කල්හි පිළිවෙලින් භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේදයන් ඉපිද නිරුද්ධ වූ පසු පඤ්චාඞ්ග සීල චෙතනා ප්‍රධාන කාමාවචර කුසල චිත්තයන් අරමුණු කොට මනොද්වාරා-වජ්ජනයද, මහා කුසල් සිත් අට අතුරෙන් එක් සිතක් ජවන් වශයෙන් සත්වරක් ඉපිද අනතුරුව තදාරම්මණ ඇතිව හෝ නැතිව හෝ භවාඞ්ගය වීමෙන් ප්‍රත්‍යවෙක්ෂා ජවන චිත්තවීථිය අවසන්වේ. එයට අනතුරුව සුදුසු පරිදි තදනුවර්තක මනොද්වාර වීථිහු උපදිති. මෙසේ පඤ්චාඞ්ග සීල චෙතනා ප්‍රධාන කාමාවචර කුසල චිත්තය, එය ප්‍රත්‍යවෙක්ෂා කරන කුසල චිත්තයට ආරම්මණ ශක්ති-යෙන් ප්‍රත්‍යයවීම කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම යයි කියනු ලැබේ.

දසසිල් සමාදන්ව ප්‍රාණඝාතාදි අකුසල කර්ම දසයෙන් වළක්නා කල්හි යටකී පිළිවෙළට කුසල ජවනයන් උපදිති. ප්‍රාණඝාත අදත්තාදානාදිය යට දක්වන ලදි අබ්‍රහමචර්‍ය්‍යා-වෙන් වළක්නා කල්හි නුවණැතියන් පිළිකුල් කරන මෛථුන සෙවනය හෝ එය අරමුණු කරන අකුසල චෙතනාව ප්‍රධාන ලොභමූල චිත්තයන් හෝ අරමුණු කොට මනොද්වාරජ්ජන කුසල ජවනයන් සහිතවූ චිත්ත වීථි ඉපිද අබ්‍රහමචර්‍ය්‍යාවෙන් වැළකීම සිදුවේ.

මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච, සම්ඵප්පලාපයන් ගෙන් වළක්නා කල්හි ඒ ඒ කර්මයන් සිදුකරන අකුසල චෙතනාවන් ප්‍රධාන කොට ඇති ලොභමූල, ද්වෙෂමූල, මොහ

මූල චිත්තයන් හෝ ඒවායින් උපදවන වාග් විඥප්තිය හෝ අරමුණු කොට මනොවාරාවජ්ජන, කුසල ජවන සහිතවූ චිත්තවීථි ඉපිද ඒ මුසාවාදාදියෙන් වැලකීම සිදුවේ.

විකාල භොජනයෙන් වළක්නා කල්හි භොජනයන්හි ඇති වර්ණ ගන්ධාදී අවයවයන් හෝ සියලු භොජනයම හෝ ඒ භොජනයට ආශා කරන ලොභය ප්‍රධාන කොට ඇති අකුසල චිත්තයන් හෝ අරමුණු කොට මනොවාරාවජ්ජන කුසල ජවනයන් ඉපිද විකාල භොජනයෙන් වැලකීම සිදුවේ.

නච්ච ගීත විසූක දස්සනයෙන් වළක්නා කල්හි නෘත්‍යය ගීතාදිය පිළිබඳ රූප ශබ්දයන් හෝ එයට ඇලුම් කරන ලොභය ප්‍රධාන අකුසල චිත්තයන් හෝ අරමුණු කොට මනොවාරාවජ්ජන, කුසලජවනයන් ඉපිද නච්ච ගීත විසූක දස්සනාදියෙන් වැලකීම සිදුවේ.

මාලාගන්ධ විලෙපන ධාරණාදියෙන් වළක්නා කල්හි මාලාගන්ධාදියේ වර්ණ ගන්ධාදිය හෝ එයට ඇලුම් කරන ලොභමූල චිත්තයන් හෝ අරමුණු කොට මනොවාරාවජ්ජන කුසල ජවනයන් ඉපිද මාලාගන්ධ විලෙපන ධාරණාදියෙන් වැලකීම සිදුවේ.

ජාත රූප රජත පටිග්ගහනයෙන් වළක්නා කල්හි ඒ රන්රිදී ආදිය හෝ එයට ඇලුම් කරන ලොභමූල චිත්තයන් හෝ අරමුණු කොට මනොවාරාවජ්ජන, කුසල ජවනයන් ඉපිද ජාතරූප රජත පටිග්ගහනාදියෙන් වැලකීම සිදුවේ.

උච්චාසයන මහාසයනයන් ගෙන් වළක්නා කල්හි, උස් අසුන් මහ අසුන් හෝ ඒවායේ රූපාරම්මණ, ඵොට්ඨබ්බා-රම්මණයන් හෝ ඒවා අරමුණු කරන ලොභමූල චිත්තයන් හෝ අරමුණු කොට මනොවාරාවජ්ජන, කුසල ජවනයන් ඉපිද උච්චාසයන, මහාසයනයන්ගෙන් වැලකීම සිදුවේ.

මේ චිත්ත වීථිවලට අනතුරුව සුදුසු පරිදි තදනුවර්තික මනොවාර වීථිහුද බොහෝ ගණනක් උපදිති. එසේ

ප්‍රාණඝාතාදියෙන් වැළකුණු පුද්ගලයා විසින් සීල චේතනාව ප්‍රධාන කාමාවචර කුසලය ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි හෙවත් මෙනෙහි කරන කල්හි භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡේදයන් ඉපිද නිරුද්ධවූ පසු සීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය අරමුණු කොට මනොද්වාරාවජ්ජනය ද, මහා කුසල් සිත් අටෙන් එකක් ජවන් වශයෙන් සත් වරක් ද ඉපිද තදාරම්මණයන් ඇතිව හෝ නැතිව හෝ භවාඞ්ග වී චිත්ත වීථිය අවසන් වේ. එයට අනතුරුව සුදුසු පරිදි තදනුවර්තික මනොද්වාර වීථිහු පහළ වෙති. එසේ උපදනා චිත්ත වීථින්ගේ සීල චේතනා ප්‍රධාන කාමාවචර කුසල චිත්තයන් ඒවා අරමුණු කොට උපදනා කාමාවචර කුසල චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම" යයි කියනු ලැබේ. මේ සීල සමාදාන යන පදයෙන් ගිහියන්ගේ නිත්‍ය සීලය වූ පඤ්චාඞ්ග සීලය ද සාමණේරයන්ගේ නිත්‍ය සීලය වූ දශ සීලය ද, භික්ෂූන්ගේ චතුපාරිශුද්ධ සීලය හා වත් පිළිවෙත් කිරීම ද ගතයුතු.

### 3. උපොසථ කම්මං කත්වා තං පච්චවෙක්ඛති.

(පෙහෙවස් ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය එය ප්‍රත්‍යවේක්ෂා කරන කුසල චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍ය වේ.)

මේ පදයෙන් ගිහියන් විසින් පොහෝ දවස්හි රක්නා අෂ්ටාඞ්ගශීලය ගතයුතු. ප්‍රාණඝාතාදි වූ ඒ අකුසල් අටෙන් වළක්නා කල්හි ද පෙර කී පරිද්දෙන් ඒ ඒ කරුණු අරමුණු කොට උපදනා ශීලමය චේතනා ප්‍රධාන කුසල චිත්තය, ඒවා අරමුණු කොට උපදනා කුසල ප්‍රත්‍යවේක්ෂා ජවනයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම" යයි කියනු ලැබේ.

**4. පුබ්බෙ සුචිණ්ණානි පච්චවෙක්ඛති.**

(පෙර පවත්වන ලද දාන, ශීල, පොහොය ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය ඒවා ප්‍රත්‍යවෙක්ෂා කරන්නා වූ කාමාවචර කුසලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

පූර්වයෙහි දෙනලද දානයක් හෝ සමාදන් වූ පඤ්චාඞ්ග ශීල දශාඞ්ග ශීලයක් හෝ රක්නාලද පොහොය ශීලයක් හෝ ප්‍රත්‍යවෙක්ෂා කරනු කැමැති කල්හි පිළිවෙළින් භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡේදයන් ඉපිද අනතුරුව පෙර ස්වසන්තානයෙහි ඇතිවූ දාන, ශීල, පොහොය ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය අරමුණු කොට මනොද්වාරාවජ්ජනයද, කාමාවචර කුසල් සිත් අට අතුරෙන් එක් සිතක් ජවන් වශයෙන් සත් වරක්ද ඉපිද නිරුද්ධ වෙති. අනතුරුව තදාරම්මණ ඇතිව හෝ නැතිව හෝ භවාඞ්ග වීමෙන් චිත්ත වීථිය අවසන් වේ. මේ චිත්ත වීථියෙන් පෙර පවත්වන ලද දාන, ශීල, පොහොය ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය ප්‍රත්‍යවෙක්ෂා කෙරේ. අනතුරුව සුදුසු පරිදි තදනුවර්තික මනොද්වාර වීථීහු පහළ වෙති. එසේ උපදනා කාමාවචර කුසල චිත්තයන්ට පෙර පවත්වන ලද දාන, ශීල, පොහොය ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම" යයි කියනු ලැබේ.

**5. ඣානා වුට්ඨහිත්වා ඣානං පච්චවෙක්ඛති.**

(ධ්‍යානයෙන් නැගීසිට ඒ මහද්ගත කුසලය, ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ කාමාවචර කුසලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මේ අනුවාදයෙන් මහද්ගත කුසල් සිත් නවය එය ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ කාමාවචර කුසල චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම දැක්වේ.

ප්‍රථම ධ්‍යානය ලැබීමේ හේතු සම්පත් ඇත්තාවූ ත්‍රිහේතුක කාමාවචර මහා විපාක සිතකින් ප්‍රතිසන්ධිය ලැබූ කාම ත්‍රිහේතුක පුද්ගලයා විසින් දස කසිණයන් අතුරෙන් යම් කිසි කසිණයක ප්‍රතිභාග නිමිත්ත ගෙන පරිකර්‍ම කොට ඒ ප්‍රථම ධ්‍යානය ඉපදීමට ලංවූ කල්හි තමාගේ ප්‍රතිසන්ධි සිතට සමානවූ සිතක් භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡේද වශයෙන් දෙවරක් ඉපිද නිරුද්ධවූ පසු කසිණ ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොට මනොද්වාරාවජ්ජන චිත්තය ඉපිද නිරුද්ධ වේ. අනතුරුව ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් දෙක අතුරෙන් එක් සිතක්, ඒ පුද්ගල තෙම මන්ද ප්‍රාඥ දන්ධාභිඥ පුද්ගලයෙක් වී නම්, පරිකර්‍ම උපචාර, අනුලොම, ගොත්‍රභූ වශයෙන් සතර වරක්ද, තික්ඛ ප්‍රාඥ ඛිප්පාභිඥ පුද්ගලයෙක් වී නම් උපචාර, අනුලොම ගොත්‍රභූ වශයෙන් තුන්වරක්ද ඉපිද නිරුද්ධ වූ පසු, පස්වනුව හෝ සතරවනුව විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා සඞ්ඛ්‍යාත වූ ධ්‍යානාඞ්ග පසෙන් යුක්ත වූ ප්‍රථමධ්‍යාන කුසල චිත්තය එක් වරක් ඉපිද නිරුද්ධ වේ. අනතුරුව කාම ත්‍රිහෙතුක භවාඞ්ග සිත් සතරෙන් එකක් භවාඞ්ග වශයෙන් උපදී. මෙසේ ප්‍රථමධ්‍යානය ලැබූ ත්‍රිහෙතුක පුද්ගලයා ඒ ප්‍රථමධ්‍යානයට අයත් විතර්කාදි ධ්‍යානාඞ්ගයන් මෙනෙහි කරන කල්හි භවාඞ්ගචලන භවාඞ්ගු-පච්ඡේදයන් ඉපිද නිරුද්ධවූ කල්හි ධ්‍යානාඞ්ගය අරමුණු කොට මනොද්වාරාවජ්ජනයද, එයට අනතුරුවමහා කුසල් සිතක් ප්‍රත්‍යවෙක්ෂා ජවන් වශයෙන් සත්වරක් හෝ සතර වරක් පස්වරක් හෝ ඉපිද නිරුද්ධ වූ පසු සුදුසු පරිදි භවාඞ්ගයෝ වෙති. මෙසේ තමන් ලැබූ ධ්‍යානයෙහි අන්තර්ගත ඒ ඒ අඞ්ගයන් වෙන් වෙන්වූ ප්‍රත්‍යවෙක්ෂා ජවන වීථිවලින් දැනගනී. මේ චිත්ත වීථිවලින් ප්‍රථමධ්‍යාන වීථියෙහි ධ්‍යාන කුසල චිත්ත, ප්‍රත්‍යවෙක්ෂා වීථියෙහි කාමාවචර ජවනයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්‍මය කුසල ධර්‍මයක පහළවීමට ආරම්මණ ප්‍රත්‍ය ශක්ති-යෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

ඒ ප්‍රථමධ්‍යානය ලැබූ පුද්ගල තෙමේ ප්‍රථමධ්‍යාන සමාපත්තියට සමවදිනු කැමති කල්හි යට කී පරිදි භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව කසිණ ප්‍රතිභාග නිමිත්ත අරමුණු කොට මනොද්වාරාවජ්ජන සිතද, මහා කුසල ඥාන සම්ප්‍රයුක්ත සිතක් මන්‍දප්‍රාඥ තීක්ෂප්‍රාඥ පුද්ගලයන්ගේ වශයෙන් සතර වරක් හෝ තුන් වරක් පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ යන නම් වලින්ද ඉපිද නිරුද්ධවූ පසු ධ්‍යානාඞ්ග පසෙන් යුත් රූපාවචර ප්‍රථමධ්‍යාන සිත· බොහෝ වාර ගණනක් උපදී.

ප්‍රථමධ්‍යාන සමාපත්තියට සමවැදුනු හෙතෙමේ ධ්‍යානාඞ්ගයන් මෙනෙහි කරන කල්හි ඒ ඒ ධ්‍යානාඞ්ගයන් අරමුණු කොට වෙන් වෙන්වූ ප්‍රත්‍යවේක්ෂා ජවන චිත්ත වීථි පහළවීමේදී ඒ රූපාවචර ප්‍රථමධ්‍යාන චිත්තය ආවර්ජනා වීථිවල කාමාවචර කුසල ජවනයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

මේ ක්‍රමයෙන්, රූපාවචර ධ්‍යාන පසත් අරූපාවචර ධ්‍යාන සතරත් යන මහද්ගත කුසල නවය, එය ප්‍රත්‍ය-වෙක්ෂා කරන්නාවූ කාමාවචර කුසලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම දතයුතු.

6. සෙක්ඛා ගොත්‍රභුං පච්චවෙක්ඛන්ති.

(සෝවාන් මාර්ග චිත්තයට පූර්වයෙහි උපදනා මහා කුසල ඥාන සම්ප්‍රයුක්ත චිත්තය, ඒ සෝවාන් පුද්ගලයාගේ සන්තානයෙහි උපදනා ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ කාමාවචර කුසල චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

විදර්ශනාව සම්පූර්ණ වූ ත්‍රිහේතුක ප්‍රථග්ජන පුද්ගලයාහට සෝවාන් මාර්ග සිත ඉපදීමට ළං වූ කල්හි, භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව ත්‍රෛභූමික සංස්කාරයන් අරමුණු කොට මනොද්වාරාවජ්ජන චිත්තයද, ඥාන සම්ප්‍රයුක්ත

කාමාවචර කුසල් සිතක් මන්දප්‍රාඥ, තීක්ෂප්‍රාඥයන්ගේ වශයෙන් තුන්වරක් හෝ දෙවරක් පරිකර්ම, උපචාර, අනුලෝම වශයෙන්ද ඉපිද නිරුද්ධවූ පසු ඒ සිතම නිර්වාණය අරමුණු කරමින් ගොත්‍රභූ යන නාමයෙන් ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව සෝවාන් මාර්ග චිත්තය එක්වරක් ඉපිද නිරුද්ධ වූ පසු සෝවාන් ඵල සිත මන්දප්‍රාඥ තීක්ෂප්‍රාඥයන්ගේ වශයෙන් දෙවරක් හෝ තුන්වරක් ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව භවාඞ්ග සිත් පහළ වේ. මෙය සෝවාන් මාර්ග චිත්තය ලැබීමේදී පහළ වන චිත්ත වීථිය වේ.

සෝවාන් පුද්ගලයා විසින් තමාගේ ගොත්‍රභූ සිත මෙනෙහි කරනු කැමති කල්හි සෝවාන් මාර්ග සිතට පූර්වයෙහි ඇතිවූ ගොත්‍රභූ සිත අරමුණුකොට මනොද්වාරාවජ්ජනයද, එයට අනතුරුව ගොත්‍රභූ සිතම අරමුණු කොට කාමාවචර කුසල් සිතක් ජවන කෘත්‍යයෙන් සත්වරක් ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගපාතය වේ. ඒ වීථියෙහි උපදනා මහා කුසල ජවනයට සෝවාන් පුද්ගලයාගේ ගොත්‍රභූ චිත්තය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම කුසල ධර්මය කුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**7. වොදානං පච්චවෙක්ඛන්ති.**

(සකෘදාගාමි අනාගාමි මාර්ග දෙකට පූර්වයෙහි වොදාන කෘත්‍ය සිදුකරමින් උපදනා ඥානසම්ප්‍රයුක්ත මහා කුසල් සිත, එය ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ කාමාවචර කුසල් සිතට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍ය වේ.)

සකෘදාගාමි, අනාගාමි පුද්ගලයන් විසින් තමතමන්ගේ වොදාන චිත්තයන් මෙනෙහි කරනු කැමති කල්හි භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේද චිත්තයන්ට අනතුරුව වොදාන සිත අරමුණුකොට මනොද්වාරාවජ්ජනයද, කාමාවචර මහා කුසල් සිතක් ජවන කෘත්‍යයෙන් සත්වරක්ද ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගය ඇතිවේ. මේ චිත්ත වීථියෙහි

උපදනා කාමාවචර ප්‍රත්‍යවෙක්‍ෂා ජවනයන්ට වොදන කෘත්‍යය සිදුකරමින් උපන් කාමාවචර ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**8. සෙක්ඛා මග්ගාවුට්ඨහිත්වා මග්ගං පච්චවෙක්ඛන්ති.**

(සෝවාන්, සකෘදාගාමි, අනාගාමි මාර්ග චිත්තයන් එය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාවූ ඥානසම්ප්‍රයුක්ත මහා කුසල චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

සෝවාන් මාර්ගයට හා ඵලයට පැමිණි ආර්‍ය්‍ය පුද්ගල තෙමේ තමා පැමිණි සෝවාන් මාර්ගය මෙනෙහි කරනු කැමති කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡෙදයන්ට අනතුරුව සෝවාන් මාර්ග සිත අරමුණු කරමින් මනොද්වාරාවජ්ජනයද, ඥානසම්ප්‍රයුක්ත මහා කුසල් සිතක් ජවන කෘත්‍යයෙන් සත් වරක්ද ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගය වේ. මේ චිත්ත වීථියෙහි සෝවාන් මාර්ගය ප්‍රත්‍යවෙක්‍ෂා කරන ඥානසම්ප්‍ර-යුක්ත මහා කුසල් සිතට සෝවාන් මාර්ග සිත ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය කුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ. මේ පිළිවෙලින් සකෘදාගාමි මාර්ග සිත හා අනාගාමි මාර්ග සිතද ඒවා ප්‍රත්‍යවෙක්‍ෂා කරන මහා කුසල ජවනයන්ට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන සැටි දතයුතු.

**9. සෙක්ඛා වා පුථුජ්ජනා වා කුසලං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො විපස්සන්ති.**

(ශෛක්‍ෂයන් විසින් හෝ පෘථග්ජනයන් විසින් හෝ ත්‍රෛභූමික කුසලය, අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරන කල්හි ඒ කුසල් සිත විදර්ශනා කරන්නාවූ කාමාවචර කුසල් සිතට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

ශෛක්‍ෂයන් විසින් හෝ පෘථග්ජනයන් විසින් හෝ ත්‍රෛභූමික කුසලය අනිත්‍යය, දුක්ඛ ය, අනාත්මය යයි විදර්ශනා වශයෙන් මෙනෙහි කරන කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව ත්‍රෛභූමික කුසලය අරමුණු කොට මනොවාරාවජ්ජනය හා කාමාවචර මහා කුසල් සිතක් ජවන් වශයෙන් සත්වරක් ද ඉපිද නිරුද්ධවීමෙන් පසු භවාඞ්ගය වේ. විදර්ශනා කිරීමේදී මෙවැනි චිත්තවීථි බොහෝ ගණන් ඇතිවෙත්. ඒ වීථිවල කාමාවචර කුසල ජවනයන්ට ත්‍රෛභූමික කුසලයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**10. සෙක්ඛාවා පුථුජ්ජනාවා චෙතොපරියඤාණෙන කුසලචිත්ත සමඞ්ගිස්ස චිත්තං ජානන්ති.**

(ශෛක්‍ෂයන් විසින් හෝ පෘථග්ජනයන් විසින් හෝ චෙතොපරියඤාණයෙන් හෙවත් පරසිත් දන්නා නුවණින් අතීත සත්වන දිනය පටන් අනාගත සත්වන දින දක්වා අන්‍ය පුද්ගලයන්ගේ සන්තානයෙහි කාලත්‍රයට අයත්වූ අර්හත් මාර්ග සිත හැර කුසල් සිත් විස්ස අරමුණු කරන කල්හි ඒ කුසල් සිත් චෙතොපරිය කුසල අභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

ශෛක්‍ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෙක් චෙතොපරිය කුසලාභිඥාව ලබා අතීතයෙන් සත්වන දිනටත් අනාගතයෙන් සත්වන දිනටත් අතර කාලත්‍රයට අයත්වූ අර්හත් මාර්ගයෙන් අන්‍යවූ පරසන්තානගත කුසලයන් දකිනු කැමතිව රූපාවචර පඤ්චමධ්‍යානයට සමවදිනු කැමති කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව ආලොක කසිණය අරමුණු කරමින් මනොවාරාවජ්ජන චිත්තයද, උපෙක්ඛාසහගත ඥාණසම්ප්‍රයුක්ත සිතක් මන්දප්‍රාඥ, තීක්ෂණප්‍රාඥයන්ගේ වශයෙන් සතර වරක් හෝ තුන් වරක් හෝ ඉපිද නිරුද්ධවූ පසු රූපාවචර පඤ්චම

ධ්‍යාන සිත බොහෝ වාර ශණනක් ඉපිද නිරුද්ධ වේ. මෙසේ රූපාවචර පඤ්චමධ්‍යාන සමාපත්තියට සමවැද ඉක්බිති පරචිත්තය දැනගැනීමට අධිෂ්ඨාන කරන කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව අධිෂ්ඨානය ආවර්ජනා කරමින් මනොද්වාරාවජ්ජන සිතද මහා කුසල් සිතක් අසුවල් සිත දැනගනිමියි අධිෂ්ඨාන කිරීම් වශයෙන් ජවන කෘත්‍යයයෙන් සත්වරක් ඉපිද භවාඞ්ග වෙත්. මෙපරිද්දෙන් අධිෂ්ඨානකොට එයට අනතුරුව චෙතොපරිය කුසලාභිඤ්ඤාවට පාදක වන රූපාවචර පඤ්චමධ්‍යානයට නැවත වරක් සමවදී. එයින් නැගිට පරසන්තාන ගත කුසල චිත්තය දක්නා චෙතොපරිය කුසලාභිඤ්ඤා චිත්තය ඉපදීමේදී භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව ඒ පරසන්තානගත කුසල් සිත අරමුණු කරමින් මනො-ද්වාරාවජ්ජන චිත්තයද, උපෙක්ඛාසහගත ඥානසම්ප්‍රයුක්ත සිතක් අනුරූප පරිදි සතර වරක් හෝ තුන්වරක් ජවන වශයෙන් ඉපිද නිරුද්ධවූ පසු චෙතොපරිය කුසලාභිඤ්ඤා භාවයෙන් රූපාවචර පඤ්චමධ්‍යාන සිත එක් වරක් ඉපිද නිරුද්ධවේ. මේ චිත්ත වීථියට අනතුරුව නැවත භවාඞ්ග චලනාදීන් ඉපිද එයට අනතුරුව චෙතොපරිය ඥාණයෙන් දක්නාලද පරසන්තානගත කුසල චිත්තය අරමුණු කරමින් මනොද්වාරාවජ්ජනයද, මහා කුසල් සිතක් ජවන් වශයෙන් සත් වරක් ඉපිද නිරුද්ධවීමෙන් පසු භවාඞ්ග වෙති. ඒ වීථියෙන් පරසන්තානගත චිත්තය දැනගනී. මේ චිත්ත වීථිවලින් අභිඤ්ඤා වීථියේ චෙතොපරියඥාණය ප්‍රධාන රූපාවචර කුසල පඤ්චමධ්‍යාන චිත්තයට හා අනතුරු වීථිවල මහා කුසල ජවනයන්ට පරසන්තානගත කුසල් සිත් විස්ස ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**11. ආකාසානඤ්චායතන කුසලං විඤ්ඤාණඤ්චා-යතන කුසලස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(වර්තමාන අතීත භවයන්හි ස්වසන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන කුසලය, වර්තමාන භවයෙහි විඤ්ඤාණඤ්චායතන කුසලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

ආකාසානඤ්චායතන කුසලධ්‍යානය ලබාගත් කාමත්‍රිහේතුක වූ හෝ, රූපභූමික වූ හෝ, ආකාසානඤ්චායතන භූමිකවූ හෝ පුද්ගලයෙක් තමා ලබාගත් ආකාසානඤ්චායතන ධ්‍යානයෙහි දෝෂයත්, විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයෙහි ශාන්තභාවයත් දැක එය ලබාගැනීම පිණිස ආකාසානඤ්චායතන කුසල් සිත අරමුණු කොට "විඤ්ඤාණය අනන්තය" යනාදී වශයෙන් භාවනා කළ කල්හි, භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේදයන් ඉපිද නිරුද්ධ වූ පසු මේ සන්තානයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන කුසල් සිත අරමුණුකොට මනොවාරාවජ්ජන සිතද, අනතුරුව මහා කුසල උපෙක්ෂාසහගත ඥානසම්ප්‍රයුක්ත සිතක්, පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ වශයෙන් සතර වරක් හෝ තීක්ෂ්ණප්‍රාඥයෙකු වීනම් උපචාර, අනුලෝම, ගොත්‍රභූ වශයෙන් තුන්වරක් හෝ ඉපිද නිරුද්ධ වේ. ඉක්බිතිව විඤ්ඤාණඤ්චායතන කුසලධ්‍යානය ඉපිද නිරුද්ධවීමෙන් පසු භවාඞ්ගය වේ.

මෙසේ විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ලැබූ පුද්ගලයා විසින් එම ධ්‍යානයට සමවදිනු කැමති කල්හි පෙර තම සන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන කුසල චිත්තය අරමුණුකොට මනොවාරාවජ්ජනයද, උපෙක්ඛාසහගත ඤාණසම්ප්‍රයුක්ත කුසල් සිතක් උපචාර ජවන් වශයෙන් සතර වරක් හෝ තුන්වරක් ඉපිද නිරුද්ධවූ පසු විඤ්ඤාණඤ්චායතන කුසලධ්‍යාන සිත බොහෝ වාර ගණනක් උපදී අනතුරුව භවාඞ්ගය වේ. එසේ උපදනා විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තයන්ට අතීත භවයේ හා වර්තමාන භවයේ ඒ සන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන කුසල චිත්තයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**12. ආකිඤ්චඤ්ඤායතනං කුසලං නෙවසඤ්ඤානා-සඤ්ඤායතන කුසලස්ස ආරම්මණපච්චයෙන පච්චයො.**

(වර්තමාන අතීත භවයන්හි ස්වසන්තානයෙහි උපන් ආකිඤ්චඤ්ඤායතන කුසලය වර්තමාන භවයෙහි නෙව-සඤ්ඤානාසඤ්ඤායතන කුසලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි විස්තරය එකොළොස්වන අනුවාදයට අනුව දතයුතු.

**13. කුසලා ඛන්ධා ඉද්ධිවිධ ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(පාදක රූපාවචර කුසල පඤ්චමධ්‍යානය, ඉද්ධිවිධ කුසලාභිඤ්ඤා රූපාවචර කුසල පඤ්චමධ්‍යාන චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

රූපයන් නිර්මාණය කරණු පිණිස රූපාවචර පඤ්චමධ්‍යානයට සමවදිනු කැමති කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡෙදයන් ඉපිද නිරුද්ධ වූ පසු පඨවි කසිණ ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොට මනොද්වාරාවජ්ජනයද, උපෙක්ඛාසහගත ඤාණසම්ප්‍රයුක්ත සිතක් සතර වරක් හෝ තුන් වරක් ඉපිද නිරුද්ධ වීමෙන් පසු රූපාවචර පඤ්චම ධ්‍යාන සිත බොහෝ වාර ගණනක් උපදී. අනතුරුව භවාඞ්ගය වේ. එයට පසුව "සියයක් වෙමි" "දහසක් වෙමි" යනාදී වශයෙන් අධිෂ්ඨානය කරන කල්හි එම අධිෂ්ඨානය අරමුණුකොට මනොද්වාරාවජ්ජනයද, මහා කුසල් සිතක් අධිෂ්ඨාන ජවන් වශයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වීමෙන් පසු භවාඞ්ගය වේ.

මෙසේ අධිෂ්ඨානකොට නැවත ඉද්ධිවිධ කුසලාභිඤ්ඤාවට පාදක වනු පිණිස රූපාවචර කුසල පඤ්චමධ්‍යානයට සමවදිනු කැමති කල්හි පඨවි කසිණ ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොට මනොද්වාරාවජ්ජනයද, උපෙක්ඛාසහගත ඤාණසම්ප්‍රයුක්ත සිතක් සතර වරක් හෝ තුන් වරක් ඉපිද

නිරුද්ධවීමෙන් පසු රූපාවචර කුසල පඤ්චමධ්‍යාන සිත බොහෝ වාර ගණනක් ඉපිද නිරුද්ධ වේ. අනතුරුව භවාඞ්ගය වේ. මෙයට පසුව ඉද්ධිවිධ අභිඥා චිත්තය උපදනා කල්හි රූපාවචර කුසල පඤ්චමධ්‍යානය අරමුණු කොට මනොද්වාරාවජ්ජනයද, උපෙක්ඛාසහගත ඤාණ-සම්ප්‍රයුක්ත මහා කුසල් සිතක් සතර වරක් හෝ තුන් වරක් ඉපිද නිරුද්ධවීමෙන් පසු රූපාවචර පඤ්චමධ්‍යාන සිත පාදක රූපාවචර පඤ්චමධ්‍යානය අරමුණු කරමින් සිය දහස් ගණන් රූපයන් නිර්මාණය කරමින් ඉද්ධිවිධ අභිඥා ඥානයයෙන් එක් වරක් උපදී. අනතුරුව භවාඞ්ගය වේ. මේ චිත්ත වීථියට පසු නිර්මාණය කරනලද රූපයන් අරමුණුකොට තදනුවර්තික මනොද්වාර වීථිහු පහළවෙති.

මේ චිත්ත වීථිවල පාදක රූපාවචර කුසල පඤ්චම ධ්‍යානය ඉද්ධිවිධ අභිඥා රූපාවචර කුසල පඤ්චමධ්‍යාන චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය කුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**14. කුසලා ධම්මා චෙතොපරියඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අතීතයෙන් සත්වන දිනය පටන් අනාගතයෙහි සත් වන දිනය දක්වා කාලයෙහි, කාලත්‍රයට අයත් පරසන්තාන ගත, අර්හත් මාර්ග සිත හැර, කුසල් සිත් විස්ස චෙතොපරිය කුසලාභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

චෙතොපරිය ඤාණයට පාදක වන්නේ ආලෝක කසිණය අරමුණු කරණ පඤ්චමධ්‍යානයයි. අධිෂ්ඨාන වීථියට අරමුණු වන්නේ අර්හත් මාර්ග සිත හැර අන්‍යවූ පර-සන්තානගත කුසල් සිත් විස්සය. අධිෂ්ඨාන කරන කල්හි "අසුවලාගේ කුසල් සිත දැනගනිම්" යි කියා අධිෂ්ඨාන කළයුතු. අභිඥා චිත්තයට අරමුණු වන්නේත් ඒ කුසල් සිත් විස්සමය. සෙස්ස ඉද්ධිවිධ ඤාණයට කියන ලද ක්‍රමය අනුව දතයුතු.

**15. කුසලා ධම්මා පුබ්බෙනිවාසානුස්සති ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අර්හත් මාර්ග සිත හැර කුසල් සිත් විස්ස පුබ්බෙනිවාසානුස්සති කුසලාභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

පුබ්බෙනිවාසානුස්සති ඤාණයට පාදක වන්නේ ආලෝක කසිණ අරමුණු කරණ පඤ්චමධ්‍යානයයි. අධිෂ්ඨාන වීථියට හා අභිඥා වීථියට අරමුණු වන්නේ කුසල් සිත් විස්සය. සෙස්ස ඉද්ධිවිධ ඤාණයට කියන ලද ක්‍රමය අනුව දත යුතු.

**16. කුසලා ධම්මා යථා කම්මූපග ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අතීත ලෞකික කුසල් සිත් සතළොස යථා කම්මූපග කුසලාභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

යථා කම්මූපග ඤාණයට පාදක වන්නේ ආලෝක කසිණය අරමුණු කරන පඤ්චමධ්‍යානයයි. අධිෂ්ඨාන වීථියට හා අභිඥා වීථියට අරමුණු වන්නේ අතීත ලෞකික කුසල් සිත් සතළොසය "අතීත කර්මය දැනගනිමි"යි කියා අධිෂ්ඨානය කළයුතු. සෙස්ස පෙර මෙනි.

**17. කුසලා ධම්මා අනාගතංසඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අර්හත් මාර්ග සිත හැර අන්‍යවූ අනාගත කුසල් සිත් විස්ස අනාගතංසකුසලාභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

අනාගතංස ඤාණයට පාදක වන්නේ ආලෝක කසිණය අරමුණු කරන පඤ්චමධ්‍යානයයි. අධිෂ්ඨාන වීථියට හා අභිඥා වීථියට අරමුණු වන්නේ අනාගත කුසල් සිත් විස්සය. "අනාගත සකන්ධයන් දැනගනිමි"යි අධිෂ්ඨාන කළ යුතු. සෙස්ස පෙර කියන ලද පරිද්දෙන් දතයුතු.

මෙය "කුසල ධර්මය කුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

2. වීථිය:-

**කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය අකුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

මෙහි අකුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවන කුසල ධර්මයෝ නම් ලෞකික කුසල් සිත් සතළොසය.

මේ කුසල ධර්මයන්ගේ ප්‍රත්‍යොත්පන්න ධර්මයෝ නම් අකුසල් සිත් දොළොස සහ චෛතසික සත් විස්සය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබිය හැකි **ආරම්මණ ආරම්මණාධිපති, ආරම්මණූපනිස්සය** යන ප්‍රත්‍යය ශක්ති තුන අතුරෙන් **ආරම්මණ** ශක්තිය ලැබේ

මේ වීථියේ අනුවාද වශයෙන්

**1. දානං දත්වා තං අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(දන්දීමේ ත්‍යාග චේතනා ප්‍රධාන කාමාවචර කුසලය "මා විසින් උසස් පිනක් කරගන්නා ලද්දේ" යයි ලොභ සිතින් ආස්වාදනය කරන කල්හි ලොභ මූල සෞමනස් සහගත සිත් සතරට ද, "මාගේ පින ඉතා හොඳ" යයි ඒ ගැන සතුටුවන කල්හි ප්‍රීතිය ප්‍රධාන ලොභ මූල සිත් සතරට ද, එය කාරණකොට ගෙන පිනට ඇලුම් කරන කල්හි රාගය ප්‍රධාන ලොභ මූල සිත් අටට ද, "මම පිනක් කෙළෙමි" යි වරදවා ගන්නා කල්හි දෘෂ්ටිය ප්‍රධාන ලොභ මූල සිත් සතරට ද, "දන් දී මා කෙළේ පිනක් ද පවක් ද කනාදීත්" සැක ඇතිවන කල්හි මොහ මූල විචිකිච්ඡා සහගත චිත්තයට ද, ඒ ගැන සිත වික්ෂිප්තවන කල්හි මොහ

මූල උද්ධච්ච සම්ප්‍රයුක්ත චිත්තයට ද, දන් දී පසුව ඒ ගැන නොසතුටුවන කල්හි ද්වෙෂ මූල සිත් දෙකට ද ආරම්මණ ශක්තියෙන් උපකාරක වේ.)

දන් දීමෙන් පසු ඒ පරිත්‍යාග චේතනාව ප්‍රධාන කොට ඇති මහා කුසල් සිත් අටෙන් යම් සිතක් අරමුණු කොට ආස්වාදන අභිනන්‍දනාදී වශයෙන් අකුසල ජවන චිත්ත වීථින් උපදනා කල්හි භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව පරිත්‍යාග චේතනාව ප්‍රධාන කාමාවචර කුසලය අරමුණු කොට මනොද්වාරාවජ්ජන චිත්තය ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව කුසලය ආස්වාදනය කරන්නේ නම් සොම්නස් සහගත ලෝභ මූල සිත් සතරෙන් එකක් ද, සතුටු වන්නේ නම් සප්‍රීතික තෘෂ්ණාව ප්‍රධාන කොට ඇති සොම්නස් සහගත සිත් සතරෙන් එකක් ද, ඇලුම් කරන්නේ නම් රාගය ප්‍රධාන ලෝභ මූල සිත් අටෙන් එකක් ද, දෘෂ්ටි වශයෙන් වරදවා ගන්නේ නම් ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙන් එකක් ද, සැක කරන්නේ නම් විචිකිච්ඡා සහගත සිත ද, වික්ෂිප්ත වන්නේ නම් උද්ධච්ච සම්ප්‍රයුක්ත සිත ද, නොසතුටු වන්නේ නම් ද්වෙෂ මූල සිත් දෙකෙන් එකක් ද, ජවන කෘත්‍යයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වේ. අනතුරුව තදාරම්මණයන් ඇතිව හෝ නැතිව හෝ භවාඞ්ගයෝ වෙති. මේ වීථියෙහි අකුසල ජවනයන්ට කාමාවචර කුසලය ආරම්මණ ශක්ති යෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම" යයි කියනු ලැබේ.

**2. සීලං සමාදියිත්වා තං අස්සාදෙති අභිනන්‍දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(සිල් සමාදන්ව, ඒ සීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය මා විසින් උසස් පිනක් කරගන්නා ලද්දේ යයි ලෝභ සිතින් ආස්වාදනය කරන කල්හි ලෝභ මූල සොම්නස් සිත් සතරට ද, ඒ ගැන සතුටුවන කල්හි ප්‍රීතිය ප්‍රධාන

ලොභ මූල සිත් සතරට ද, එය කරණකොටගෙන පිනට ඇලුම් කරන කල්හි රාගය ප්‍රධාන ලොභ මූල සිත් අටට ද, වරදවා ගන්නා කල්හි දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරට ද, සැක ඇතිවන කල්හි විචිකිච්ඡා සහගත සිතට ද, වික්ෂිප්ත වන කල්හි උද්ධච්ච සහගත චිත්තයට ද, සිල් සමාදන්ව පසුව ඒ ගැන නොසතුටුවන කල්හි ද්වේෂ මූල සිත් දෙකට ද ආරම්මණ ශක්තියෙන් උපකාරක වේ.)

සිල් සමාදන්ව ඒ සීල චේතනාව ප්‍රධානකොට ඇති මහා කුසල් සිත් අටෙන් යම් සිතක් අරමුණුකොට ආස්වාදන අභිනන්දනාදී වශයෙන් අකුසල ජවන චිත්ත වීථින් උපදනා කල්හි පළමු කී පරිදි දොළොස් අකුසල චිත්තයන් ජවන කෘත්‍යයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වෙති. මෙසේ සීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය දොළොස් අකුසලයන්ටම ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම" යයි කියනු ලැබේ.

**3. උපොසථ කම්මං කත්වා තං අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(උපොසථ කර්මය නම්වූ අෂ්ටාඞ්ගපෝෂථ ශීල ප්‍රධාන කාමාවචර කුසලය එය ආස්වාදනය කරන කල්හි ද, අභිනන්දනය කරන කල්හි ද, එය කරණකොටගෙන රාගය, දිට්ඨිය, විචිකිච්ඡාව, උද්ධච්චය, දොමනස්සය උපදනා කල්හි ද යට කියනලද පරිද්දෙන් දොළොස් අකුසලයන්ට ආරම්මණ ශක්තියෙන් උපකාරක වේ.)

අෂ්ටාඞ්ගපෝෂථ ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය දොළොස් අකුසලයන්ට ආරම්මණ ශක්තියෙන් උපකාරවන ක්‍රමය යට දක්වන ලද ක්‍රමය අනුව දතයුතු.

**4. පුබ්බෙ සුචිණ්ණානි අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(පෙර පවත්වන ලද දාන, සීල, අෂ්ටාඞ්ග සීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය, එය ආස්වාදනය කරන කල්හි ද, අභිනන්දනය කරන කල්හි ද, එය කරණකොට ගෙන රාගය, දිට්ඨිය, විචිකිච්ඡාව, උද්ධච්චය, දෞමනස්සය උපදනා කල්හි ද, යට දක්වන ලද පරිද්දෙන් දෙළොස් අකුසලයන්ට ආරම්මණ ශක්තියෙන් උපකාරක වේ.)

පෙර පවත්වන ලද දාන, සීල, අෂ්ටාඞ්ග ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය, දෙළොස් අකුසල චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යවන ආකාරය යට කියනලද පරිදි දතයුතු.

**5. ඣානා වුට්ඨහිත්වා ඣානං අස්සාදෙති අභිනන්දති තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචි-කිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති**

(ධ්‍යාන සමවතින් නැගී එම ධ්‍යානය ආස්වාදනය කරන කල්හිද, අභිනන්දය කරන කල්හිද, එය කරණ කොට ගෙන රාගය, දිට්ඨිය, විචිකිච්ඡාව, උද්ධච්චය උපදනා කල්හිද, එම මහද්ගත කුසල් නවය ලොභ මූල, මොහ මූල අකුසල් චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් උපකාරක වේ.

මෙහි ධ්‍යාන නම් ලෞකිකවූ රූපාවචර අරූපාවචර ධ්‍යානයෝය. ධ්‍යාන ලාභී පුද්ගලතෙම ධ්‍යාන සමවතින් නැගී එම ධ්‍යානයම අරමුණු කරමින් ආස්වාදන අභිනන්දනාදිය කරන කල්හි ඇතිවන අකුසල ජවන චිත්ත වීථින්හි උපදනා ලොභ මූල, මොහ මූල අකුසල ජවනයන්ට එකී ධ්‍යාන සිත් නවය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම, "කුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**6. ඣානෙ පරිහීනෙ විප්පටිසාරිස්ස දොමනස්සං උප්පජ්ජති.**

(ධ්‍යානයෙන් පිරිහුණු කල්හි තැවත එය සිහිකරන්නාහට දෙම්නස උපදී. එකල්හි පරිහීනවූ මහද්ගත කුසල ධ්‍යානය එය අරමුණු කරන ද්වේෂ මූලික අකුසල ජවනයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

යම් නුසුදුසු කරුණකින් පිරිහුණාවූ ධ්‍යානය අරමුණු කොට ද්වේෂ මූල ජවනය උපදනා කල්හි, භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව පරිහීන ධ්‍යානය අරමුණු කොට මනොද්වාරා වර්ජනයද, එයට අනතුරුව ද්වේෂ මූල දෙසිතෙන් එක් සිතක් ජවන කෘත්‍යයෙන් සත්වරක් ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගය වේ. මේ පුද්ගල තෙම කාම ත්‍රිහෙතුක උපෙක්ඛා සහගත සිතකින් ප්‍රතිසන්ධිය ලැබූ පුද්ගලයෙක් වීනම්, කාම ත්‍රිහෙතුක උපෙක්ෂා සහගත භවාඞ්ග දෙකින් එක් සිතක් භවාඞ්ග කෘත්‍යයෙන් උපදී. හෙතෙම කාම ත්‍රිහෙතුක සොමනස්ස සහගත චිත්තයකින් ප්‍රතිසන්ධිය ලැබූ පුද්ගලයෙකු වීනම්, කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිත, පෙර පුරුදු අරමුණක් ගනිමින් ආගන්තුක භවාඞ්ග කෘත්‍යයයෙන් ඉපිද නිරුද්ධ වීමෙන් පසු තමන්ට අයත් කාමත්‍රිහේතුක සොමනස්ස භවාඞ්ගයෝ උපදිති. මේ චිත්තවීථියෙහි අකුසල ජවනයන්ට ඒ පිරිහුණු ධ්‍යාන කුසල චිත්තය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

3. වීථිය

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො,**

(කුසල ධර්මය හෙවත් කුසල් සිත් එක් විස්ස අව්‍යාකෘත ධර්මයන්ට හෙවත් විපාක ක්‍රියා චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයන්ට ආරම්මණ ශක්තියෙන් උපකාරවන කුසල ධර්මයෝ නම් කුසල් සිත් එක්විස්සය.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:-

තදාරම්මණ එකොළොසය.

පඤ්චද්වාරාවජ්ජනය හැර අන්‍ය වූ කාම ක්‍රියා දශය.

විඤ්ඤාණඤ්චායතන විපාක ක්‍රියා දෙකය.

නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක ක්‍රියා දෙකය.

චෙතොපරිය, පුබ්බෙනිවාසානුස්සති, යථාකම්මූපග, අනාගතංස අභිඥවෝය.

විරති අප්‍රමාණ්‍යයන් හැර චෛතසික තෙතිසය යන අව්‍යාකෘත ධර්මයෝයි.

මෙහි සුදුසු පරිදි එක්වර ලැබෙන ආරම්මණ, ආරම්මණාධිපති, ආරම්මණූපනිස්සය යන ප්‍රත්‍ය ශක්ති තුනෙන් ආරම්මණ ප්‍රත්‍යය ශක්තියම ලැබේ.

මේ වීථියේ අනුවාද වශයෙන්

**1. අරහා මග්ගාවුට්ඨහිත්වා මග්ගං පච්චවෙක්ඛති.**

(රහතන්වහන්සේ අතීත් මාර්ගයෙන් නැගී එම අතීත් මාර්ගී කුසලය ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි, එම ප්‍රත්‍යවෙක්ෂා ජවනයන්ට අතීත් මාර්ගී සිත ආරම්මණ ශක්තියෙන් උපකාර වේ)

රහතන්වහන්සේ තමා ලත් අතීත් මාර්ගී චිත්තය ප්‍රත්‍ය-වෙක්ෂා කරන කල්හි භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව අතීත් මාර්ගී සිත අරමුණු කොට මනොද්වාරා-වජ්ජනයද, මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරින් එක් සිතක් ප්‍රත්‍යවෙක්ෂා ජවන් වශයෙන් සත්වරක්ද ඉපිද නිරුද්ධවීමෙන් පසු භවාඞ්ගය වේ. මේ චිත්ත වීථිවල අතීත් මාර්ගී චිත්තය එය ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ කාම ක්‍රියා චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම" යයි කියනු ලැබේ.

**2. අරහා පුබ්බෙ සුචිණ්ණානි පච්චවෙක්ඛති.**

(රහතන්වහන්සේ පෙරකළ කුසල් ප්‍රත්‍යවේක්‍ෂා කරන කල්හි එම කුසල් සිත් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාවූ කාමාවචර ක්‍රියා ජවනයන්ට ආරම්මණ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ.)

රහතන් වහන්සේ පෙරකළ කුසල් නැවත සිහිකිරීම් වශයෙන් ප්‍රත්‍යවේක්‍ෂා කරන කල්හි භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව එම කුසල් සිත් අරමුණු කොට මනොවාරාවජ්ජනයද, මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරින් එක් සිතක් ජවන් වශයෙන් සත්වරක් ඉපිද නිරුද්ධවීමෙන් පසු භවාඞ්ගය වේ. මේ චිත්ත වීථිවල පූර්ව කුසල චිත්තය, එය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාවූ කාමාවචර ක්‍රියා චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම"යයි කියනු ලැබේ.

**3. අරහා කුසලං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො විපස්සති.**

(රහතන්වහන්සේ කුසලය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරන කල්හි එම පූර්ව කුසල චිත්තය විදර්ශනා කරන කාම ක්‍රියා ජවනයන්ට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

රහතන්වහන්සේ විසින් පූර්ව කුසල චිත්තය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යනාදි වශයෙන් විදර්ශනා වඩන කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව එම කුසල චිත්තය අරමුණු කරමින් මනොවාරාවජ්ජනය ද, කාම ක්‍රියා සිතක් ජවනකෘත්‍යයෙන් සත්වරක්ද ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගය වේ. මෙහිදී පූර්ව කුසල චිත්තය, එය අරමුණු කොට විදර්ශනා කරන්නාවූ කාමාවචර ක්‍රියා ජවනයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**4. අරහා චෙතොපරිය ඤාණෙන කුසල චිත්ත සමඞ්ගිස්ස චිත්තං ජානාති.**

(රහතන්වහන්සේ කුසල් සිත් ඉපදවූවහුගේ එම කුසල් සිත චෙතොපරිය ඤාණයෙන් හෙවත් පරසිත් දන්නා නුවණින් දැනගන්නා කල්හි එම කුසල් සිත චෙතොපරිය ක්‍රියා අභිඥ චිත්තයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

රහතන්වහන්සේ අනුන්ගේ කුසල් සිත බලනු කැමති කල්හි රූපාවචර ක්‍රියා පඤ්චමධ්‍යානයට සමවැද එයින් නැගී අධිෂ්ඨාන කොට නැවත චෙතොපරිය ක්‍රියා අභිඥවට පාදක වනු පිණිස රූපාවචර ක්‍රියා පඤ්චමධ්‍යානයට සමවැද අනතුරුව චෙතොපරිය ක්‍රියා අභිඥව උපදනා කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව රූපාවචර ක්‍රියා පඤ්චමධ්‍යානය අරමුණු කොට මනොද්වාරාවජ්ජනයද උපෙක්ඛා සහගත මහා ක්‍රියා සිතක් සතරවරක් හෝ තුන්වරක් හෝ ඉපිද නිරුද්ධ වූ පසු පරසන්තානගත කුසල චිත්තය අරමුණු කරමින් චෙතොපරිය ක්‍රියා අභිඥ චිත්තය ඉපිද නිරුද්ධ වේ. එයට පසු භවාඞ්ගය වේ. මේ චිත්ත වීථියෙහි පරසන්තානගත කුසල චිත්තය එය අරමුණු කරන්නා වූ රහතන්වහන්සේගේ චෙතොපරිය ක්‍රියා අභිඥ චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම යයි කියනු ලැබේ.

**5. සෙක්ඛාවා පුථුජ්ජනාවා කුසලං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති, කුසලෙ නිරුද්ධෙ විපාකො තදාලම්බණතා උප්පජ්ජති.**

(ශෛක්ෂවූ හෝ පෘථග්ජනවූ හෝ පුද්ගලයන් විසින් කාමාවචර කුසලය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යනාදී වශයෙන් විදර්ශනා කරන කල්හි එම චිත්තවීථියේ කුසල් ජවන් නැතිවූ පසු උපදනා විපාකවූ තදාරම්මණ සිත් එකොළොසට එම කුසල් සිත ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි යන ආයර්‍ය පුද්ගලයන් විසින් හෝ පෘථග්ජන පුද්ගලයන් විසින් හෝ කාමාවචර කුසලය අරමුණු කොට අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යනාදි වශයෙන් විදර්‍ශනා වඩන කල්හි, භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව එම කාමාවචර කුසලය අරමුණු කොට මනොවාරාවජ්ජනයද, මහා කුසල සිතක් විදර්‍ශනා ජවන කෘත්‍යයෙන් සත්වරක්ද ඉපිද නිරුද්ධවූ පසු එකොළොස් තදාරම්මණයන් අතුරෙන් එක් සිතක් තදාරම්මණ කෘත්‍යයෙන් ඉපිද එයට අනතුරුව භවාඞ්ගයෝ වෙත්. මේ තදාරම්මණ සිත්වලට අරමුණු වන්නේ විදර්‍ශනා කරනු ලබන කාමාවචර කුසලයයි. මෙයද "කුසල ධර්‍මය අව්‍යාකෘත ධර්‍මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**6. කුසලං අස්සාදෙති, අභිනන්දති තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති, අකුසලෙ නිරුද්ධෙ විපාකො තදාරම්මණතා උප්පජ්ජති.**

(කාමාවචර කුසලය, එය ආස්වාදනය කරන සොම්නස් ලොභ ජවනයන්ට අනතුරුව උපදනා තදාරම්මණයටද, එයම අභිනන්දනය කරන සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන සොම්නස් ලොභ ජවනයන්ට අනතුරුව උපදනා තදාරම්මණයටද එය කරණකොටගෙන රාගය උපදනා කල්හි රාග ප්‍රධාන ලොභ මූල ජවනයන් කෙරෙන් වන තදාරම්මණයටද, දිට්ඨිය උපදනා කල්හි දිට්ඨිගත සම්ප්‍රයුක්ත අකුසල ජවනයන් කෙරෙන් වන තදාරම්මණයටද, විචිකිච්ඡාව උපදනා කල්හි මොහමූල විචිකිච්ඡා සහගත ජවනයන් කෙරෙන් වන තදාරම්මණයටද, උද්ධච්චය උපදනා කල්හි මොහමූල උද්ධච්ච සහගත ජවනයන් කෙරෙන් වන තදාරම්මණයටද, දොම්නස උපදනා කල්හි දොෂමූල ජවනයන් කෙරෙන් වන තදාරම්මණයටද ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

කාමාවචර කුසලයක් කොට එය ලොභ සිතින් ආස්වාදනය කරන කල්හි භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡෙද යන්ට අනතුරුව එම කාමාවචර කුසලය අරමුණු කොට මනොද්වාරාවජ්ජනයද, ලොභ මූල සොම්නස් සහගත සිත් සතරෙන් එකක් ජවන කෘත්‍යයෙක් සත්වරක් ද ඉපිද නිරුද්ධවූ පසු එකොළොස් තදාරම්මණයන්ගෙන් එක් සිතක් තදාරම්මණ කෘත්‍යයෙන් දෙවරක් ඉපිද නිරුද්ධවූ කල්හි භවාඞ්ගයෝ වෙත්. මේ චිත්ත වීථියේ උපදනා තදාරම්මණ විපාක චිත්තයට එම කාමාවචර කුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ. එපරිද්දෙන්ම, එම කාම කුසලය අභිනන්දනය කරන කල්හි හෙවත් එයට සතුටු වන කල්හි සප්‍රීතික තෘෂ්ණාව ප්‍රධාන ලොභ මූල සෙම්නස් සහගත සිත් සිතරෙන් එකක් ජවන කෘත්‍යයෙන් සත්වරක් උපදී. එයට ඇලුම් කරන කල්හි රාගය ප්‍රධාන ලොභ මූල සිත් අට අතුරෙන් එකක්ද, වරදවා ගන්නා කල්හි ලොභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙන් එකක්ද, සැක කෙරේනම් විචිකිච්ඡා සහගත සිතද, වික්ෂිප්ත වේ නම් උද්ධච්ච සහගත සිතද, නොසතුටු වේ නම් ද්වෙෂ මූල දෙසිතෙන් එකක්ද ජවන කෘත්‍යයෙන් සත්වරක් උපදී. මෙසේ උපදනා අකුසල ජවනයන්ට අනතුරුව ඇතිවන තදාරම්මණ දෙසිතට කාමාවචර කුසලය ආරම්මණ ශක්ති යෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**7. ආකාසානඤ්චායතන කුසලං විඤ්ඤාණඤ්චා-යතන විපාකස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අතීත භවයෙහි ස්වසන්තානයෙහි ඇතිවූ ආකාසා-නඤ්චායතන කුසලය, ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වශයෙන් පවත්නා විඤ්ඤාණඤ්චායතන විපාකයට ආරම්මණ ශක්ති යෙන් ප්‍රත්‍යය වේ.)

මේ අනුවාදයෙන් දක්වෙන්නේ සප්තකාම සුගතිය, අසංඥසත්තය හැර රූප භූමි පසළොසය, ආකාසානඤ්චායතන භූමිය යන තෙවිසි භූමියෙන් චුතව විඤ්ඤාණඤ්චායතන භූමියෙහි උපදනා පුද්ගලයන්ගේ ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති වශයෙන් පවත්නා විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තයන්ට අතීත භවයෙහි ස්වසන්තානයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන කුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වන සැටිය. එකී තෙවිසි භූමියෙන් චුතවී විඤ්ඤාණඤ්චායතන භූමියෙහි ඉපදීමට ලංවූ කල්හි ඒ පුද්ගලයන්ගේ මරණාසන්න චිත්තවීථියෙහි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව අධ්‍යාත්ම සන්තානයෙහි අතීතයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන කුසලය වූ කර්මනිමිත්ත අරමුණුකොට මනොද්වාරාවජ්ජනයද, කාමාවචර මරණාසන්න ජවන චිත්තයක් පස්වරක්ද ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව භවාඞ්ගය ඇතිව හෝ නැතිව හෝ චුති සිත එක් වරක් ඉපිද නිරුද්ධ වේ. මේ චුති චිත්තයට අනතුරුව මරණාසන්න ජවනයන් විසින් ගන්නාලද පූර්වභවයෙහි අධ්‍යාත්ම සන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන කුසලයවූ කර්ම නිමිත්ත අරමුණුකොට විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තය, විඤ්ඤාණඤ්චායතන භූමියෙහි ප්‍රතිසන්ධි කෘත්‍යයෙන් එක් වරක් උපදී. එයට අනතුරුව ඒ විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තයම භවාඞ්ග කෘත්‍යයෙන් පසළොස් වරක් පමණ ඉපිද නිරුද්ධවූ පසු, අභිනව භවය වූ විඤ්ඤාණඤ්චායතන ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් අරමුණුකොට මනොද්වාරාවජ්ජනයද, භවනිකන්තික ලොභ ජවනය සත්වරක්ද ඉපදීමෙන් පසු විඤ්ඤාණඤ්චායතන භවාඞ්ගය වේ. එම භවයාගේ අවසානයෙහිද එම සිතම චුති කෘත්‍යයෙන් උපදී. මෙසේ ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති වශයෙන් උපදනාවූ විඤ්ඤාණඤ්චායතන විපාකයට ආකාසානඤ්චායතන කුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**8. ආකාසානඤ්චායතන කුසලං විඤ්ඤාණඤ්චායතන කිරියස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(වර්තමාන භවයේ හෝ අතීත භවයෙහි ස්වසන්තානයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන කුසලය විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

කාම භූමියෙහි හෝ, රූප භූමියෙහි හෝ, ආකාසානඤ්චායතන භූමියෙහි හෝ අෂ්ටසමාපත්තිලාභී අනාගාමි පුද්ගලයා රහත් බවට පැමිණ, විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සමාපත්තියට සමවදිනු කැමති කල්හි, භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව වර්තමාන භවයෙහි ස්වසන්තානයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන කුසලය අරමුණු කොට මනොද්වාරාවර්ජනය ඉපිද නිරුද්ධවූ පසු උපෙක්ඛා සහගත ඤාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිතක් සතරවරක් හෝ තුන්වරක් පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ වශයෙන් ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත බොහෝ වාර ගණනක් ඉපිද භවාඞ්ගය වේ.

විඤ්ඤාණඤ්චායතන භූමියෙහිදී අර්හත් බවට පැමිණි ආර්‍ය්‍ය පුද්ගලයා විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සමාපත්තියට සමවදිනු කැමති කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව අතීත භවයෙහි අධ්‍යාත්ම සන්තානයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන කුසලය අරමුණුකොට මනොද්වාරාවර්ජනයද, උපෙක්ඛාසහගත මහා ක්‍රියා සිතක් සතරවරක් හෝ තුන්වරක් ඉපදීමෙන් පසු අතීත භවයෙහි ආකාසානඤ්චායතන කුසලය අරමුණුකොට විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තය බොහෝ වාර ගණනක් ඉපිද භවාඞ්ගය වේ.

මේ වීථිවල විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තයන්ට ආකාසානඤ්චායතන කුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**9. ආකිඤ්චඤ්ඤායතන කුසලං නෙවසඤ්ඤානා-සඤ්ඤායතන විපාකස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(පූර්ව භවයෙහි අධ්‍යාත්මික සන්තානයෙහි හටගත් ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය, ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති වශයෙන් පවත්නා නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

කාම භූමියෙන් හෝ රූප භූමියෙන් හෝ යට අරූප භූමියෙන් හෝ චුතව නෙවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහි ඉපදීමට ළංවූ කල්හි ඒ පුද්ගලයන්ගේ මරණාසන්න චිත්ත වීථියෙහි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව පූර්වයෙහි ඇතිවූ ආකිඤ්චඤ්ඤායතන කුසලය වූ කර්මනිමිත්ත අරමුණුකොට මනොද්වාරාවජ්ජනයද, කාමාවචර මරණා-සන්න ජවන චිත්තයක් පස්වරක්ද ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව භවාඞ්ගය ඇතිව හෝ නැතිව හෝ චුති සිත එක්වරක් උපදී. ඒ චුති චිත්තය ඉපිද නිරුද්ධවූ පසු මරණාසන්න ජවනයන් විසින් ගත්තාලද ආකිඤ්චඤ්ඤා-යතන කුසලය නම්වූ කර්ම නිමිත්ත අරමුණුකොට නෙව සඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තය, නෙවසඤ්ඤානා-සඤ්ඤා භූමියෙහි ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති වශයෙන් උපදී. මෙසේ ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති වශයෙන් උපදනාවූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකයට ආකිඤ්චඤ්ඤායතන කුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**10. ආකිඤ්චඤ්ඤායතන කුසලං නෙවසඤ්ඤානා-සඤ්ඤායතන කිරියස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අතීත භවයෙහි හෝ වර්තමාන භවයෙහි ස්වසන්තාන යෙහි හටගත් ආකිඤ්චඤ්ඤායතන කුසලය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ක්‍රියා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)



Free Distribution www.aathaapi.org

කාම භූමියෙහි හෝ රූප භූමියෙහි හෝ යට අරූප භූමියෙහි හෝ අෂ්ටසමාපත්තිලාභී අනාගාමි පුද්ගලතෙම රහත් බවට පැමිණ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා සමාපත්තියට සමවදින කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡෙදයන්ට අනතුරුව ස්වසන්තානයෙහි පෙර ඇතිවූ ආකිඤ්චඤ්ඤායතන කුසලය අරමුණුකොට මනොද්වාරාවජ්ජනය ඉපිද නිරුද්ධවූ පසු පිළිවෙළින් උපදනා පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ චිත්තයන්ට අනතුරුව නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තය බොහෝ වාර ගණනක් ඉපිද භවාඞ්ගය වේ. මේ ආදී වශයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තයට ආකිඤ්චඤ්ඤායතන කුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**11. කුසලාධම්මා චෙතොපරියඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො**

(පරසන්තානගත කුසල චිත්තය රහතන්වහන්සේගේ චෙතොපරිය ක්‍රියා අභිඤ්ඤා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

රහතන් වහන්සේ, චෙතොපරිය ක්‍රියා අභිඥා චිත්තය උපදවා එයින් පරසන්තානගත කුසල චිත්තයන් දක්නා කල්හි ඒ පරසන්තානගත කුසල චිත්තය, චෙතොපරිය ක්‍රියා අභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**12. කුසලා ධම්මා පුබ්බෙනිවාසානුස්සති ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(පූර්ව භවයන්හි වූ කුසලය රහතන් වහන්සේගේ පුබ්බෙනිවාසානුස්සති ක්‍රියා අභිඤ්ඤා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

රහතන්වහන්සේ පූර්‍ව භවයන්හි ඇතිවූ කුසලය දකිනු පිණිස පුබ්බෙනිවාසානුස්සති ක්‍රියා අභිඥා චිත්තය උපදවා ගන්නා කල්හි එම පුබ්බෙනිවාසානුස්සති ක්‍රියා අභිඥාවට පූර්‍ව භවයන්හි වූ කුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්‍මය අව්‍යාකෘත ධර්‍මයට ආරම්මණ ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**13. කුසලා ධම්මා යථා කම්මූපග ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අතීත ලෞකික කුසලයන් රහතන් වහන්සේගේ යථාකම්මූපග ක්‍රියා අභිඥා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

පෙර ආත්මභාවයන්හි කළ කුසල ධර්‍මයන් දක්නා කැමති රහතන්වහන්සේ යථා කම්මූපග ක්‍රියා අභිඥාව උපදවන කල්හි එම යථා කම්මූපග ක්‍රියා අභිඥා චිත්තයට පූර්‍ව ආත්මභාවයන්හි ඇතිවූ කුසලයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්‍මය අව්‍යාකෘත ධර්‍මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**14. කුසලා ධම්මා අනාගතංස ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අනාගතයෙහි ඇතිවන එක්විසි කුසල චිත්තය රහතන් වහන්සේගේ අනාගතංස ක්‍රියා අභිඥා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

රහතන්වහන්සේ අන්‍යයන්ගේ අනාගත කුසලයන් දකිනු කැමතිව අනාගතංස ක්‍රියා අභිඥා චිත්තය උපදවන කල්හි එම අනාගතංස ක්‍රියා අභිඥා චිත්තයට එක්විසි කුසල චිත්තය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්‍මය අව්‍යාකෘත ධර්‍මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

මේ අනුවාදයන්හි දක්වෙන අභිඥා චිත්තයන් උපදවා ගන්නා පිළිවෙළ යට දක්වනලද හෙයින් ඒ අනුව චිත්ත වීථි යොදගත යුතු.

**15. කුසලා ධම්මා ආවජ්ජනාය ආරම්මණ පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්ස එය අරමුණු කරන මනො-ද්වාරවජ්ජන චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

කුසල් සිත් අරමුණු කරමින් උපදනා චිත්ත වීථින්හි ජවනයන්ට පෙර උපදනා මනොද්වාරාවජ්ජන චිත්තයද එම කුසල චිත්තය අරමුණු කිරීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

4. වීථිය—

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහිදී අකුසල ධර්මයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වන අකුසල ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොසය.
චෛතසික සත් විස්සය.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම් එම දොළොස් අකුසල් සිත් සහ චෛතසික සත් විස්සය.

මෙහි සුදුසු පරිදි එක්වර ලැබෙන **ආරම්මණ ආරම්මණාධිපති, ආරම්මණූපනිස්සය** යන ප්‍රත්‍යය ශක්ති තුනෙන් **ආරම්මණ ප්‍රත්‍යය** ශක්තියම ලැබේ.

මේ වීථියේ අනුවාද වශයෙන්

**1. රාගං අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

ස්වසන්තානයෙහි හෝ පරසන්තානයෙහි හෝ ඇතිවූ රාගය ආස්වාදනය අභිනන්දය කරන කල්හි, එය කරණ කොට්ගෙන රාගය උපදියි. දිට්ඨිය උපදියි, විචිකිච්ඡාව උපදියි, උද්ධච්චය උපදියි, දෞර්මනස උපදියි.)

රාගය ප්‍රධාන ලොභමූල චිත්තය, තවත් ලොභමූල සෞමනස් සිතකින් ආස්වාදනය කරන කල්හිද, සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන ලොභමූල සෞමනස් චිත්තයෙන් අභි-නන්දනය කරන කල්හිද, එය අරබයා හෙවත් එය කරණ කොටගෙන නැවතත් රාගය උපදී. එකල්හි උපදනා චිත්ත වීථියෙහි භවාඞගචලන භවාඞ්ගුපච්ඡේදයනට අනතුරුව රාගය ප්‍රධාන ලොභමූල අකුසල් සිත් අරමුණුකොට මනොවාරාවජ්ජනයද, රාගය ප්‍රධාන ලොභමූල සිතක් ජවනකෘත්‍යයෙන් සත්වරක්ද ඉපිද නිරුද්ධවූ පසු තදා-රම්මණ ඇතිව හෝ නැතිව හෝ භවාඞගයේ. මෙපරිද්-දෙන්ම එම රාගයම අරමුණු කොට ඒ මාගේ අරමුණයයි වරදවාගෙන සතුටු වන කල්හි දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්තයද, එය අකුසලයක්ද? නැතිද? යනාදී වශයෙන් සැකය උපදනා කල්හි මොහමූල විචිකිච්ඡා සහගත චිත්ත-යද, එම රාගය නිසා සිත වික්ෂිප්ත වන කල්හි මොහමූල උද්ධච්ච සම්ප්‍රයුක්ත චිත්තයද, රාගය කරණකොටගෙන දෞර්මනසක් ඇතිවූ කල්හි ද්වෙෂමූල දෞර්මනස්‍ය සහගත සිතක්ද ජවන කෘත්‍යයෙන් සත්වරක් ඉපිද නිරුද්ධවේ. මෙසේ රාගය ප්‍රධාන ලොභමූල අකුසලය අරමුණුකොට දොළොස් අකුසල චිත්තයන් ඇතිවීමේදී ඒ දොළොස් අකුසල චිත්තයන්ට මුලින් සිදුකළ රාගය නම් වූ අකුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අකුසල ධර්මය අකුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම"යයි කියනු ලැබේ.

**2. දිට්ඨිං අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(සව සන්තානයෙහි හෝ පරසන්තානයෙහි හෝ ඇතිවූ මිථ්‍යාදෘෂ්ටිය, ආස්වාදනය, අභිනන්දනය කරන කල්හි එය අරබයා රාගය උපදියි, දිට්ඨිය උපදියි, විචිකිච්ඡාව උපදියි, උද්ධච්චය උපදියි, දෞර්මනස්සය උපදියි.)

මෙහි දිට්ඨිය නම් මම ය මාගේ ය යනාදි වශයෙන් ගන්නා සක්කායදෘෂ්ටිය ආදිකොට ඇති සියළුම මිථ්‍යා-දෘෂ්ටිහුය. ඒ දිට්ඨිය ප්‍රධාන ලොභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත අකුසලය ආස්වාදන, අභිනන්දනාදිය කරන කල්හි, රාග, දිට්ඨි, විචිකිච්ඡා, උද්ධච්ච, දෞර්මනස්සාදී අකුසලයන් ඇති වීමෙදී ඒ දොළොස් අකුසල චිත්තයන්ට දිට්ඨිය ප්‍රධාන ලොභමූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත චිත්තය ආරම්මණ ශක්ති-යෙන් ප්‍රත්‍යයවීම "අකුසල ධර්මයක් අකුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම"යයි කියනු ලැබේ.

3. විචිකිච්ඡං ආරබ්භ විචිකිච්ඡා උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.

(විචිකිච්ඡාව අරබයා විචිකිච්ඡාව උපදියි, දිට්ඨිය උපදියි, උද්ධච්චය උපදියි, දෞර්මනස්සය උපදියි.)

විචිකිච්ඡාව අරමුණුකොට නැවත නැවතත් සැකය උපදනා කල්හි විචිකිච්ඡා සම්ප්‍රයුක්ත අකුසල ජවනයද දිට්ඨිය උපදනා කල්හි ලොභමූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත ජවන් සිතක්ද, උද්ධච්චය උපදනා කල්හි මොහමූල උද්ධච්චසම්ප්‍රයුක්ත ජවනයද, දෞර්මනස උපදනා කල්හි ද්වෙෂමූල පටිඝ සම්ප්‍රයුක්ත ජවනයද ඇතිවේ. එසේ ජවන කෘත්‍යයෙන් උපදනා දිට්ඨිගත සම්ප්‍රයුක්ත ලොභමූල සිත් සතරය, ද්වෙෂමූල දෙසිතය, මොහමූල දෙසිතය යන අකුසල් සිත් අටට විචිකිච්ඡා සම්ප්‍රයුක්ත මොහමූල අකුසල චිත්තය අරමුණුවීම "අකුසල ධර්මය, අකුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**4. උද්ධච්චං ආරබ්භ උද්ධච්චං උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(උද්ධච්චය අරබයා උද්ධච්චය උපදියි, දිට්ඨිය උපදියි, විචිකිච්ඡාව උපදියි, දොමනස්සය උපදියි.)

උද්ධච්චය අරමුණුකොට උද්ධච්චය උපදනාකල්හි, මොහ මූල උද්ධච්ච සම්ප්‍රයුක්ත ජවනයද, දිට්ඨිය උපදනා කල්හි ලොභමූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත ජවනයද, විචිකිච්ඡා උපදනා කල්හි මොහමූල විචිකිච්ඡා සම්ප්‍රයුක්ත ජවනයද දොම්නස උපදනාකල්හි ද්වෙෂ මූල දොම්නස් ජවනයද ඇතිවේ. එසේ ජවනකෘත්‍යයෙන් උපදනා දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරය, දොම්නස් දෙසිතය, මොහමූල දෙසිතය යන අකුසල් සිත් අටට උද්ධච්ච සහගත මොහ මූල අකුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අකුසල ධර්මය අකුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**5. දොමනස්සං ආරබ්භ දොමනස්සං උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති.**

දොම්නස අරබයා දොම්නස උපදියි, දිට්ඨිය උපදියි, විචිකිච්ඡාව උපදියි, උද්ධච්චය උපදියි.)

දොම්නස හෙවත් ද්වෙෂමූල අකුසලය අරමුණුකොට දොම්නස උපදනා කල්හි ද්වෙෂමූල ජවනයද, දිට්ඨිය උපදනාකල්හි ලොභමූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත ජවනයද, විචිකිච්ඡාව උපදනා කල්හි මොහමූල විචිකිච්ඡා සහගත ජවනයද, උද්ධච්චය උපදනා කල්හි මොහමූල උද්ධච්ච සහගත ජවනය ද ඇතිවේ. එසේ ජවනකෘත්‍යයයෙන් උපදනා දිට්ඨිගත සම්ප්‍රයුක්ත ලොභමූල සිත් සතරය, ද්වෙෂමූල දෙසිතය, මොහමූල දෙසිතය යන අකුසල් සිත් අටට දොම්නස ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අකුසල ධර්මය, අකුසල ධර්මයකගේ පහළවීමට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යය කියනු ලැබේ

**5. වීර්ය—**

**අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ)

මෙහි කුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වන අකුසල ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොස ය.
චෛතසික සත්විස්සය.

මේ අකුසල ප්‍රත්‍යය ධර්මයන්ගේ ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්:

මහා කුසල් සිත් අටය
චෙතොපරිය කුසලාභිඥාය
පුබ්බෙනිවාසානුස්සති කුසලාභිඥාය
යථාකම්මූපග කුසලාභිඥාය
අනාගතාංස කුසලාභිඥාය
අප්‍රමාණ්‍යයන් හැර චෛතසික සතිසය

මෙහි ලැබෙන්නේ ආරම්මණ ශක්තිය ය.

මේ වීර්යයෙහි අනුවාද වශයෙන්

**1. සෙක්ඛා පහීනෙ කිලෙසෙ පච්චවෙක්ඛන්ති.**

(ශෛක්ෂ පුද්ගලයෝ මාර්ගයෙන් ප්‍රහීණ කළ කෙලෙස් ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි ඒ ප්‍රත්‍යවෙක්ෂා ජවනයන්ට ප්‍රහාණය කළ කෙලශයෝ ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වෙත්.)

සොවාන් මාර්ගඥානයෙන් ප්‍රහාණය කරනු ලබන කෙලශයෝ නම් දිට්ඨි විචිකිච්ඡා යන දෙකය. සොවාන් පුද්ගලතෙම තමාගේ මාර්ගයෙන් ප්‍රහීණ කෙලශයන්

මෙනෙහි කරන කල්හි, භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේද යන්ට අනතුරුව දිට්ඨි විචිකිච්ඡා යන කෙලශයන් අරමුණු කොට මනොවාරාවජ්ජනයද, කාමාවචර මහා කුසල් සිතක් ප්‍රත්‍යවෙක්‍ෂා ජවන කෘත්‍යයෙන් සත් වරක්ද ඉපිද නිරුද්ධවීමෙන් පසු භවාඞ්ගය වේ. අනතුරුව තදනුවර්තික මනොවාර වීථියකින් තමා විසින් ප්‍රහාණය කරනලද කෙලෙස් මෙනෙකැයි දැන ගන්නේය. මේ චිත්ත වීථිවල ප්‍රත්‍යවෙක්‍ෂාකුසල ජවනයන්ට ප්‍රහීණ ක්ලෙශයෝ ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වෙති.

සකෘදාගාමි මාර්ගයෙන් තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය කරනු ලබන ක්ලෙශයෝ නම් ඖදාරික රාග, ද්වෙෂ, මොහයෝ යි

අනාගාමි මාර්ගයෙන් ප්‍රහාණය කරනුලබන ක්ලෙශයෝ නම් කාමරාග ව්‍යාපාද යන දෙකය.

සකෘදාගාමි අනාගාමි ආර්‍ය්‍යයන් වහන්සේලා විසින් තම තමන්ගේ මාර්ගයෙන් ප්‍රහීණ කෙලෙස් ප්‍රත්‍යවෙක්‍ෂා කරන කලහි ඒ චිත්ත වීථිවල උපදනා මනොවාරාවජ්ජනයට හා ප්‍රත්‍යවෙක්‍ෂා ජවනයන්ට අරමුණු වන්නේ ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණ කළ කෙලෙස්ය. මෙසේ සෝවාන් සකෘදාගාමි අනාගාමි ආර්‍ය්‍ය පුද්ගලයන් විසින් තම තමන්ගේ මාර්ග ඥානයෙන් ප්‍රහීණ කළ කෙලෙස් ප්‍රත්‍යවෙක්‍ෂා කරන කල්හි ඒ කාමාවචර ප්‍රත්‍යවෙක්‍ෂා කුසල ජවනයන්ට ඒ ඒ ක්ලෙශයෝ ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අකුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම ය යි" කියනු ලැබේ.

**2. සෙක්ඛා වික්ඛම්භිතෙ කිලෙසෙ පච්චවෙක්ඛන්ති.**

(ශෛක්‍ෂ පුද්ගලයෝ මාර්ගයෙන් විෂ්කම්භිත කෙලෙස් තොහොත් අප්‍රහීණ කෙලෙස් ප්‍රත්‍යවෙක්‍ෂා කරන කල්හි ඒ ප්‍රත්‍යවෙක්‍ෂා ජවනයන්ට අප්‍රහීණ ක්ලෙශයෝ ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වෙති.)

සෝවාන් මාර්ගයෙන් අප්‍රහීණ කෙලශයෝ නම් ලෝභ, ද්වේෂ, මෝහ, මාන, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන අට දෙනය.

සකෘදාගාමි මාර්ගයෙන් අප්‍රහීණ කෙලශයෝ නම්, සූක්ෂමවූ රාග, ද්වේෂ, මෝහ, මාන, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන අට දෙනාය.

අනාගාමි මාර්ගයෙන් අප්‍රහීණ ක්ලේශයෝ නම් රූප රාග, අරූප රාග, මෝහ, මාන, ථීන, උද්ධච්ච, අහිරික, අනොත්තප්ප යන අට දෙනය.

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි ආර්යයන් වහන්සේලා තම තමන්ගේ මාර්ගයෙන් අප්‍රහීණ කෙලෙස් මෙනෙහි කරනු කැමති කල්හි භවාඞ්ගචලන භවඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව අප්‍රහීණ කෙලෙස් අරමුණුකොට මනොද්වාරා-වජ්ජනයද, කාමාවචර මහා කුසල් සිතක් ජවන කෘත්‍ය යෙන් සත් වරක්ද ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. මේ චිත්ත වීථියට අනතුරුව තදනුවර්තක මනොද්වාර වීථියෙන් අප්‍රහීණ කෙලෙස් මෙතෙකැයි දැනගනී. මෙසේ ශෛක්ෂ පුද්ගලයන් විසින් තමන්ගේ මාර්ගයෙන් අප්‍රහීණ කෙලෙස් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි අප්‍රහීණ ක්ලේශයෝ ප්‍රත්‍යවේක්ෂා කරන කාම කුසල ජවනයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අකුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

### 3. පුබ්බෙ සමුදාචිණ්ණෙ කිලෙසෙ ජානන්ති.

(ශෛක්ෂ පුද්ගලයෝ පෙර පැවති ක්ලේශයන් දැනගනු කැමති කල්හි, එය දැනගන්නා කාමාවචර කුසල ජවනයන්ට පෙර පැවති ක්ලේශයෝ ආරම්මණ ශක්ති යෙන් උපකාර වේ.)

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි පුද්ගලයෝ, පෙර තම සන්තානයන්හි බලපැවැත්වූ ක්ලේශයෝ මේ මේ යයි

දැන ගන්නා කල්හි භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව, පෙර පැවති කෙලෙස් අරමුණු කොට මනොද්වාරාවජ්ජනයද මහා කුසල් සිතක් ජවන කෘත්‍ය යෙන් සත්වරක් ද ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. මේ චිත්ත වීථින්හි උපදනා කාමාවචර කුසල ජවනයන්ට පෙර පැවති කෙලෙස් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අකුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**4. සෙක්ඛාවා පුථුජ්ජනාවා, අකුසලං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො විපස්සන්ති.**

(ශෛක්‍ෂවූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයා විසින් අකුසලය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරන කල්හි එම අකුසලය විදර්ශනා කරන කාමාවචර කුසලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

ශෛක්‍ෂ පුද්ගලයෙක් හෝ පෘථග්ජන පුද්ගලයෙක් හෝ රාගාදී වූ යම් අකුසලයක් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරන කල්හි භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව රාගාදී වූ අකුසල ප්‍රධාන අකුසල චිත්තය අරමුණු කොට මනොද්වාරාවජ්ජනයද, කාමාවචර මහා කුසල් සිතක් විදර්ශනා ජවන් වශයෙන් සත්වරක්ද ඉපිද නිරුද්ධ වීමෙන් පසු භවාඞ්ගය වේ. මේ චිත්ත වීථියෙහි උපදනා කාමාවචර කුසල ජවනයන්ට විදර්ශනාවට අරමුණු වූ අකුසල චිත්තය ආරම්මණ ශක්ති යෙන් ප්‍රත්‍යවීම "අකුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**5. චෙතොපරිය ඤාණෙන අකුසල චිත්ත සමඞ්ගිස්ස චිත්තං ජානන්ති.**

(ශෛක්‍ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෙක් චෙතොපරිය ඥාණයෙන් හෙවත් පරසිත් දන්නා නුවණින්

පරසන්තාන ගත අකුසල චිත්තය දැනගන්නා කල්හි එම පරසන්තානගත අකුසලය චේතොපරිය කුසලාභිඥ චිත්තයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අෂ්ටසමාපත්තිලාභි ශෛක්‍ෂ පුද්ගලයෙක් හෝ පෘථග්ජන පුද්ගලයෙක් හෝ අතීත සත්වන දිනය සිට අනාගත සත්වන දිනය ඇතුළත පරසන්තානයෙහි පහළවූ අකුසලය දකිනු කැමති කල්හි රූපාවචර පඤ්චමධ්‍යාන සමාපත්තියට සමවැද, එම පාදක රූපාවචර පඤ්චමධ්‍යානයෙන් නැගිට අධිෂ්ඨාන කොට චේතොපරිය කුසලාභිඥ චිත්තය උපදවා ගනී. එම චේතොපරිය කුසලාභිඤ්ඤ චිත්තයට අරමුණු වන්නේ පරසන්තානගත අකුසල චිත්තයයි. එයට අනතුරුව චේතොපරිය ඤාණයෙන් දක්නාලද පරසන්තානගත අකුසලය අරමුණු කොට කාමාවචර කුසල ජවනයන් පහළවන මනොද්වාර වීථිවලින් අකුසලය මෙතෙකැයි දැනගනී. මේ චිත්ත වීථිවල උපදනා කුසල ජවනයන්ට පරසන්තානගත අකුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අකුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**6 අකුසලා ධම්මා චේතොපරිය ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල් සිත් හා චෛතසික සත්විස්ස ශෛක්‍ෂවූ හෝ පෘථග්ජනවූ හෝ පුද්ගලයාගේ චේතොපරිය කුසලාභිඤ්ඤ චිත්තයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේත්.)

ශෛක්‍ෂ පුද්ගලයෙක් හෝ පෘථග්ජන පුද්ගලයෙක් හෝ පරසන්තානගත අකුසලය, චේතොපරිය ඤාණයෙන් දකිනු කැමති කල්හි යට දක්වන ලද පරිද්දෙන් චේතොපරිය ඤාණය උපදවාගෙන එයින් පරසන්තානගත අකුසල වූ වේදනා, සංඥා, සඞ්ඛාර, විඤ්ඤාණ යන නාමස්කන්ධයන් දැනගනී.

මෙසේ උපදනා චේතොපරිය කුසලාභිඥාවට පරසන්තානගත අකුසලස්කන්ධයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම අකුසල ධර්මය කුසලධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම යයි කියනු ලැබේ.

**7. අකුසලා ඛන්ධා පුබ්බෙනිවාසානුස්සති ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අකුසල ස්කන්ධයෝ පෙර විසූ කඳ පිළිවෙල දන්නා පුබ්බෙනිවාසානුස්සති කුසලාභිඥාවට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

ශෛක්ෂවූ හෝ පෘථග්ජනවූ හෝ පුද්ගලයන් විසින් පෙර ජාතිවල පැවති අකුසලයන් අරමුණු කොට පුබ්බෙ-නිවාසානුස්සති කුසලාභිඥා චිත්තය උපදවාගෙන එසින් පෙර ජාතිවල පැවති අකුසලයන් බලන කල්හි පුබ්බෙනිවා-සානුස්සති කුසලාභිඥා චිත්තයට එම අකුසල ස්කන්ධයන් අරමුණුවීම "අකුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**8. අකුසලා ඛන්ධා යථාකම්මූපග ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අකුසලස්කන්ධයෝ අතීත අකුසල කර්මයන් දක්නා යථාකම්මූපග කුසලාභිඥාවට ආරම්මණ ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

අතීත අකුසලය දක්නා කැමති ශෛක්ෂ පෘථග්ජන පුද්ගලයන් විසින් අතීත අකුසලය අරමුණු කොට යථාකම්මූපග කුසලාභිඥා චිත්තය උපදවා ගත් කල්හි එම යථාකම්මූපග ඤාණයට අකුසල් සිත් දොළොස සහ චෛතසික ධර්ම සත්විස්ස ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අකුශල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**9. අකුසලා ඛන්ධා අනාගතංස ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අනාගත අකුසලස්කන්ධයන් අනාගතාංස කුසලාභිඥාවට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අනාගත අකුසලයන් දක්නා කැමැත්ව එම අනාගත අකුසල් සිත් දොළොස සහ චෛතසික සත්විස්ස අරමුණු කොට උපදනා අනාගතාංස කුසලාභිඥාවන්ට එම අකුසල ස්කන්ධයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අකුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**3. විපීය—**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොස හා චෛතසික සත්විස්ස අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වන ධර්මයෝ නම්

අකුසල් සිත් දොළොස සහ චෛතසික සත්විස්සය

ප්‍රත්‍යයොත්පන්න ධර්ම වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්

තදාරම්මණ එකොළොසය

පඤ්චද්වාරාවර්ජනය හැර කාමක්‍රියා දශය ය

චේතොපරිය ක්‍රියා අභිඥාවය

පුබ්බෙනිවාසානුස්සති ක්‍රියා අභිඥාවය

යථාකම්මූපග ක්‍රියා අභිඥාවය

අනාගතාංස ක්‍රියා අභිඥාවය

විරති හා අප්‍රමාණ්‍යයන් හැර චෛතසික තෙතිසය.

මෙහි ආරම්මණ ශක්තිය පමණක් ලැබේ.

මේ වීථියේ අනුවාද වශයෙන්

**1. අරහා පහීනෙ කිලෙසෙ පච්චවෙක්ඛති.**

(රහතන් වහන්සේ අර්හත් මාර්ගඥානයෙන් ප්‍රහීණ කළ කෙලෙස් ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි ඒ ප්‍රත්‍යවෙක්ෂා ක්‍රියා ජවනයන්ට ප්‍රහීණ කළ ක්ලෙශයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

රහත් මගින් ප්‍රහීණ කරනු ලබන ක්ලෙශයෝ නම් රූප රාග, අරූප රාග, මොහ, මාන, ථින. උද්ධච්ච, අහිරික අනොත්තප්ප යන මොව්හු ය.

අර්හත් බවට පැමිණි ආර්‍ය්‍යයන් වහන්සේ රහත් මග නැණින් පහකළ කෙලෙස් මෙනෙහි කරනු කැමති කල්හි භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡේදයන් ඉපිද නිරුද්ධවූ පසු පහකළ ඒ රාගාදි කෙලෙස් අරමුණු කොට මනොද්වාරාවර්ජනය ද, කාමාවචර මහා ක්‍රියා සිතක් ජවන් වශයෙන් සත්වරක් ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගය වේ. මේ චිත්ත වීථියෙහි කාමාවචර මහා ක්‍රියා ජවනයන්ට රාගාදීවූ පහකළ කෙලෙස් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අකුසල ධර්‍මය අව්‍යාකෘත ධර්‍මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**2. අරහා පුබ්බෙ සමුදාචිණ්ණෙ කිලෙසෙ ජානාති.**

(පූර්වයෙහි කරණලද අකුසලයන් දැනගන්නා කල්හි රහතන් වහන්සේගේ සන්තානයෙහි උපදනා කාමාවචර ක්‍රියා ජවනයන්ට පෙර කළ අකුසල් ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

රහත් බවට පැමිණීමට පෙර කරනලද අකුසලයන් මෙනෙහි කරන කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව ඒ අකුසලයන් අරමුණුකොට මනොද්වාරාවර්ජනය ද, කාමාවචර මහා ක්‍රියා සිතක් ජවන කෘත්‍යයෙන් සත්වරක් ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගය වේ. අනතුරුව තදනුවර්තක මනොද්වාර කාමක්‍රියා ජවන් සහිත වූ චිත්ත වීථි

පහළවීමෙන් ඒ පෙර කළ අකුසලයන් දුනගනී. මේ චිත්ත වීථිවල කාමාවචර ක්‍රියා ජවනයන්ට පෙර රැස්කළ කෙලශ ධර්මයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**3. අරහා අකුසලං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො විපස්සති.**

(රහතන් වහන්සේ අකුසලය අනිත්‍යය, දුක්ඛය ය, අනාත්මය යයි විදර්ශනා කරන කල්හි උපදනා කාමාවචර ක්‍රියා ජවනයන්ට ඒ අකුසල ධර්මය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

පූර්වයෙහිදී ස්වසන්තානයෙහි හෝ පරසන්තානයෙහි හෝ හටගත් අකුසලයන් අනිත්‍යය, දුක්ඛය ය, අනාත්මය යයි විදර්ශනා කරන කල්හි උපදනා චිත්ත වීථියෙහි කාම ක්‍රියා ජවනයන්ට ඒ අකුසල ධර්මයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**4. අරහා චෙතොපරිය ඤාණෙන අකුසල චිත්ත සමඞ්ගිස්ස චිත්තං ජානාති.**

(රහතන්වහන්සේ පරසිත් දන්නා නුවණින් හෙවත් චෙතොපරිය ක්‍රියා අභිඥා සිතින් අකුසල් සිත් ඇතියහුගේ එම අකුසල් සිත් දක්නා කල්හි ඒ චෙතොපරිය ක්‍රියා අභිඥා චිත්තයට අකුසල ධර්මය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

පරසන්තානගත අකුසල චිත්තය බලනු කැමති රහතන් වහන්සේ රූපාවචර පඤ්චමධ්‍යාන ක්‍රියා සමාපත්තියට සමවැද එයින් නැගිට චෙතොපරිය ක්‍රියා අභිඥාවට පාදක වන රූපාවචර පඤ්චමධ්‍යානයට සමවැද, එයට අනතුරුව පරසන්තානගත අකුසලය දක්නාවූ චෙතොපරිය ක්‍රියා අභිඥා චිත්තය ඉපදීමේදී භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡෙද-යන්ට අනතුරුව එම අකුසලය අරමුණුකොට මනොද්වාරා

වජ්ජනයද, උපෙක්ඛා සහගත ඤාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිතක් ජවනකෘත්‍යයෙන් පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූ වශයෙන්ද, පඤ්චමධ්‍යාන ක්‍රියා චිත්තය පරසිත් දත්තා චෙතොපරිය ක්‍රියා අභිඤ්ඤා භාවයෙන්ද, එක්වරක් උපදී. එයට පසු භවාඞ්ගය වේ. මෙයට අනතුරුව චෙතොපරිය ඤාණයෙන් දක්නා ලද පරචිත්තය අරමුණු කොට කාම ක්‍රියා ජවන චිත්තවීථි ඉපදීමෙන් පරසන්තාන ගත අකුසලය දැනගනී. මේ චිත්ත වීථි වලින් අභිඤ්ඤා වීථියේ චෙතොපරිය ඤාණය ප්‍රධාන රූපාවචර ක්‍රියා පඤ්චමධ්‍යානයට හා එයට අනතුරුව ඇතිවන වීථියේ මහා ක්‍රියා ජවනයන්ටද පරසන්තානගත අකුසල් සිත් දෙළොස ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යවීම "අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**5. සෙක්ඛාවා පුථුජ්ජනාවා අකුසලං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති, කුසලෙනිරුද්ධෙ විපාකො තදාරම්මණතා උප්පජ්ජති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ අකුසලය අනිත්‍යය, දුක්ඛය ය, අනාත්මය යයි විදර්ශනා කරන කල්හි, ඒ විදර්ශනා කුසල ජවනයන් නිරුද්ධ වූ කල්හි ඇතිවන තදාරම්මණ විපාක චිත්තයන්ට, අකුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

ශෛක්ෂ වූ පුද්ගලයෙක් හෝ පෘථග්ජන පුද්ගලයෙක් හෝ ස්වසන්තානගත හෝ පරසන්තානගත අකුසලය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කිරීමේදී භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව, අකුසලය අරමුණු කොටගෙන මනොද්වාරාවජ්ජනයද මහා කුසල් සිතක් ජවන කෘත්‍යයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වෙත්. එයට අනතුරුව තදාලම්බන විපාක චිත්තයක් ඒ අකුසලයම අරමුණුකොට දෙවරක් ඉපිද නිරුද්ධ වීමෙන් පසු භවාඞ්ගයෝ වෙත්. මේ විපාක වූ තදාරම්මණ චිත්තයන්ට

Free Distribution www.aathaapi.org

අකුසල චිත්තය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යවීම "අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**6. අකුසලං අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ-රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති, අකුසලෙ නිරුද්ධෙ විපාකො තදාරම්මණතා උප්පජ්ජති.**

(අකුසලය ආස්වාදනය, අභිනන්දනය කරන කල්හි එය අරබයා රාගය උපදී, දිට්ඨිය උපදී, විචිකිච්ඡාව උපදී, උද්ධච්චය උපදී, දෞර්මනස්සය උපදී. ඒ අකුසල ජවනයන් නිරුද්ධ වූ කල්හි එම අකුසලයම අරමුණුකොට උපදනා විපාක වූ තදාරම්මණ චිත්තයන්ට අකුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි ආස්වාදනයෙහිදී ලොභමූල සිත් සතරද, අභි-නන්දනයෙහිදී ප්‍රීතිය ප්‍රධාන ලොභමූල සිත් සතරද, රාගය උපදනා කල්හි රාගය ප්‍රධාන ලොභමූල සිත් අටද, දිට්ඨිය උපදනා කල්හි ලොභමූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරද, විචිකිච්ඡාව උපදනාකල්හි මොහමූල විචිකිච්ඡා සහගත චිත්තයද, උද්ධච්චය උපදනා කල්හි මොහමූල උද්ධච්ච සහගත චිත්තයද, දෞර්මනස උපදනා කල්හි ද්වෙෂමූල පටිඝ සම්ප්‍රයුක්ත දෙසිතද යන මේ දොළොස් අකුසල ජවනයන් එකී අකුසලය අරමුණු කරමින් උපදී. මේ අකුසල ජවනයන් නිරුද්ධ වූ කල්හි එම අකුසල අරමුණම ගෙන විපාක වූ තදාරම්මණ දෙසිත පහළ වෙත්. අනතුරුව භවාඞගය වේ මේ විපාක වූ තදාරම්මණ සිතට එම අකුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යවීම "අකසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**7. අකුසලා ඛන්ධා චෙතොපරිය ඤාණස්ස, පුබ්බෙ-නිවාසානුස්සති ඤාණස්ස, යථා කම්මූපග ඤාණස්ස, අනාගතංස ඤාණස්ස ආවජ්ජනාය ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අකුසලස්කන්ධයෝ රහතන් වහන්සේගේ චේතොපරිය ක්‍රියා අභිඥාවටද, පූර්වේනිවාසානුස්සති ක්‍රියා අභිඥාවටද, යථා කම්මූපග ක්‍රියා අභිඥාවටද, අනාගතාංස ක්‍රියා අභිඥාවටද, මනොද්වාරාවජ්ජන චිත්තයටද ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

රහතන් වහන්සේ පරසන්තානගත අකුසලය දක්නා කල්හි චේතොපරිය ක්‍රියා අභිඥාචිත්තය උපදී. පෙරවිසූ කඳ පිළිවෙල දක්නා කල්හි පුබ්බේනිවාසානුස්සති ක්‍රියා අභිඥාචිත්තය උපදී. ඒ ඒ සත්ත්වයන්ගේ උත්පත්තියට හේතුවන කර්මයන් දක්නා කල්හි යථාකම්මූපග ක්‍රියා අභිඥාචිත්තය උපදී. අනාගතය දක්නා කල්හි අනාගතාංස ක්‍රියා අභිඥාව උපදී. මේ ක්‍රියා අභිඥා චිත්තයන්ට අරමුණුවන්නේ එයින් දක්නා අකුසල ධර්මයයි. එපරිද්දෙන්ම අකුසලය අරමුණුකොට ඇතිවන චිත්තවීථීන්හි, ජවන් සිත්වලට පූර්වයෙහි උපදනා මනොද්වාරාවජ්ජන චිත්තයද එම අකුසලය අරමුණු කරන්නේය. මෙහි ක්‍රියා චිත්තයන්ට අකුසල ස්කන්ධයෝ ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**7. වීථිය—**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයන්ට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **ප්‍රත්‍යය ධර්මයෝ** නම්:

විපාක සිත් සතිසය
ක්‍රියා සිත් විස්සය
චෛතසික අටතිසය
රූප අටවිස්සය
නිවනය යන ධර්මයෝයි

**ප්‍රත්‍යයෝත්පන්න ධර්‍ම** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්‍මයෝ නම්:

කාම විපාක තෙවිස්සය
කාම ක්‍රියා එකොළොසය
විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිතය
නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා සිතය
දිබ්බචක්ඛු ක්‍රියා අභිඤ්ඤාය
දිබ්බසොත ක්‍රියා අභිඤ්ඤාය
ඉද්ධිවිධ ක්‍රියා අභිඤ්ඤාය
චෙතොපරිය ක්‍රියා අභිඤ්ඤාය
පුබ්බෙනිවාසානුස්සති ක්‍රියා අභිඤ්ඤාය
යථාකම්මූපග ක්‍රියා අභිඤ්ඤාය
අනාගතංස ක්‍රියා අභිඤ්ඤාය
ලොකොත්තර ඵල සිත් සතරය
අප්‍රමාණ්‍යයන් හැර චෛතසික සතිසය
යන ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයෝ යි.

මෙහි **ආරම්මණ, ආරම්මණාධිපති, වත්ථාරම්මණ-නිස්සය, ආරම්මණූපනිස්සය, ආරම්මණ පුරෙජාත, වත්ථාරම්මණ විප්පයුත්ත, ආරම්මණ පුරෙජාතාත්ථි, ආරම්මණ පුරෙජාත, අවිගත** යන ශක්ති අටෙන් **ආරම්මණ ශක්තියම** ලැබේ.

මෙහි අනුවාද වශයෙන්

**1. අරහා ඵලං පච්චවෙක්ඛති.**

(රහතන් වහන්සේ අර්හත් ඵලය ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි උපදනා ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා චිත්තයන්ට අර්හත් ඵල සිත ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

රහතන්වහන්සේ තමාගේ අර්හත් ඵලය ප්‍රත්‍යවෙක්ෂා කරනු කැමති කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව අර්හත්ඵලය අරමුණුකොට මනොවාරාවජ්ජනයද,

ඤාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතරෙන් එකක් ප්‍රත්‍යවේක්ෂා ජවන කෘත්‍යයෙන් සත්වරක් ද ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගය වේ. අනතුරුව තදනුවර්තික මනොද්වාර විථිහු වෙති. ඒ චිත්ත වීථින්හි මනොද්වාරාවජ්ජනයට හා මහා ක්‍රියා ජවනයන්ට අර්හත් ඵල සිත ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. අරහා නිබ්බානං පච්චවෙක්ඛති.**

(රහතන් වහන්සේ නිර්වාණය ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි උපදනා ඤාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා චිත්තයන්ට නිර්වාණය ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

යට කියනලද පරිද්දෙන් රහතන් වහන්සේ නිර්වාණය ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි උපදනා චිත්තවීථින්හි මනොද්වාරාවජ්ජනයට සහ ඤාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා ජවනයන්ට නිර්වාණය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම, අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් "උපකාර වීම" යයි කියනු ලැබේ.

**3. නිබ්බානං ඵලස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(නිර්වාණය, එය අරමුණුකොට උපදනා ලොකොත්තර ඵල සිත් සතරට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

සොවාන් පුද්ගලතෙම තමාගේ සෝවාන් ඵලයට සමවදිනු කැමති කල්හි, භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව ත්‍රෛභූමික සංස්කාරයන් අරමුණුකොට මනොද්වාරාවජ්ජනයද ඤාණසම්ප්‍රයුක්ත සොමනස්ස මහා කුසල් සිත දෙකෙන් එකක් අනුලොම ජවන් වශයෙන් සතර වරක් හෝ තුන් වරක් ඉපදීමෙන් පසු ප්‍රථමධ්‍යාන සහගතවූ හෝ, ද්විතීයධ්‍යාන සහගත වූ හෝ, තෘතීයධ්‍යාන සහගත වූ හෝ, චතුර්ථධ්‍යාන සහගත වූ හෝ, සොතාපත්ති

ඵල චිත්තයෙද, ඤාණ සම්ප්‍රයුක්ත උපෙක්ඛා සහගත මහා කුසල් සිත් දෙකෙන් එකක් අනුලොම ජවන් වීතම් පඤ්ච ධ්‍යාන සහගත වූ හෝ සොතාපත්තිඵල චිත්තයෙද, බොහෝ වාර ගණනක් උපදනේය.

සකෘදාගාමි, අනාගාමි ඵල සමාපත්ති වීථිහුද මෙසේමය. අතීත් ඵල සමාපත්ති වීථීන්හි අනුලොම ජවන් වශයෙන් උපදින්නේ ඤාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා චිත්තයෝය.

මේ චිත්ත වීථිවල ලොකොත්තර ඵල චිත්තයන්ට නිර්වාණය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**4. නිබ්බානං ආවජ්ජනාය ආරම්මණ පච්චයෙන පච්චයො.**

(නිර්වාණය මනොද්වාරාවර්ජන චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

සොවාන්, සකෘදාගාමි, අනාගාමි ආර්‍යයන් වහන්සේලා නිවන ප්‍රත්‍යවෙක්‍ෂා කරනු කැමති කල්හි භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡෙදයන්ට අනතුරුව නිර්වාණය අරමුණුකොට මනොද්වාරාවර්ජනයද ඤාණසම්ප්‍රයුක්ත මහා කුසල් සිතක් ජවන් වශයෙන් සත්වරක්ද ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. රහතන් වහන්සේගේ වනාහි ජවනයෝ මහා ක්‍රියා ඤාණ සම්ප්‍රයුක්ත සිත් සතරින් එකකි. මේ වීථිවල මනොද්වාරාවර්ජන චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම යයි කියනු ලැබේ.

**5. අරහා චක්ඛුං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො විපස්සති.**

(රහතන් වහන්සේ චක්‍ෂුප්‍රසාදය අනිත්‍යය, දුක්ඛය ය, අනාත්මය ය යි විදර්ශනා ඥානයෙන් දක්නා කල්හි, විදර්ශනා කරන ඥාණ සම්ප්‍රයුක්ත මහා ක්‍රියා ජවනයන්ට චක්‍ෂුප්‍රසාදය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

Free Distribution www.aathaapi.org

චක්ෂුප්‍රසාදය විදර්ශනා කරන රහතන් වහන්සේට උපදනා චිත්තවීථියෙහි ඤාණසම්ප්‍රයුක්ත කාම ක්‍රියා ජවනයන්ට චක්ෂුප්‍රසාදය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**6 අරහා සොතං අනිච්චතො, දුක්ඛතො, අනත්ත-තො විපස්සති.**

(රහතන් වහන්සේ ශ්‍රොත ප්‍රසාදය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි )

**7. අරහා ඝාණං අනිච්චතො, දුක්ඛතො, අනත්ත-තො විපස්සති.**

(රහතන් වහන්සේ ඝාණ ප්‍රසාදය අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

**8. අරහා ජිව්හං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො විපස්සති.**

(රහතන්වහන්සේ ජිව්හා ප්‍රසාදය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි )

**9. අරහා කායං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො විපස්සති**

(රහතන්වහන්සේ කාය ප්‍රසාදය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි )

**10. අරහා රූපෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති.**

(රහතන්වහන්සේ චතුසමුට්ඨානික රූපයන්ගේ වර්ණයද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

**11. අරහා සද්දෙ අනිච්චතො දුක්ඛතො, අනත්ත-තො විපස්සති.**

(රහතන්වහන්සේ ද්වි සමුට්ඨානික ශබ්දයන් අනිත්‍ය දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

Free Distribution www.aathaapi.org

**12. අරහා ගන්ධං අනිච්චතො, දුක්ඛතො, අනත්ත-තො විපස්සති.**

(රහතන්වහන්සේ චතුසමුට්ඨානික ගන්ධයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

**13. අරහා රසං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො විපස්සති.**

(රහතන්වහන්සේ චතුසමුට්ඨානික රසයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

**14. අරහා ඵොට්ඨබ්බං අනිච්චතො දුක්ඛතො, අනත්තතො විපස්සති.**

(රහතන්වහන්සේ චතුසමුට්ඨානික ඵොට්ඨබ්බයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

**15. අරහා වත්ථුං අනිච්චතො, දුක්ඛතො අනත්තතො විපස්සති.**

(රහතන්වහන්සේ කර්මජ හදය වස්තු රූපය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

**16. අරහා විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති.**

(රහතන්වහන්සේ විපාක සිත් දෙතිස හා චෛතසික ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

**17. අරහා කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ අනිච්චතො, දුක්ඛතො අනත්තතො විපස්සති.**

(රහතන්වහන්සේ ක්‍රියා සිත් විස්ස හා චෛතසික ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

**18. අරහා දිබ්බෙන චක්ඛුනා රූපං පස්සති.**

(රහතන් වහන්සේ දුරවූ ද, ප්‍රතිච්ඡන්නවූ ද, සූක්ෂමවූ ද, රූපාරම්මණය දිබ්බචක්ඛු ක්‍රියා අභිඥාද චිත්තයෙන් දකියි.)

**19. අරහා දිබ්බාය සොත ධාතුයා සද්දං සුණාති.**

(රහතන් වහන්සේ දුරවූ ද, ප්‍රතිච්ඡන්නවූ ද, සූක්ෂමවූ ද, ශබ්දාරම්මණය දිබ්බසොත ක්‍රියා අභිඥා චිත්තයෙන් අසයි.)

**20. අරහා චෙතොපරිය ඤාණෙන විපාකාබ්‍යාකත කිරියාබ්‍යාකත චිත්තසමඞ්ගිස්ස චිත්තං ජානාති.**

(රහතන් වහන්සේ පරසන්තානගත විපාක ක්‍රියා චිත්තයන් චෙතොපරිය ක්‍රියා අභිඥා චිත්තයෙන් දැන ගන්නේය.)

යට දක්වනලද අනුවාදයන්හි රහතන් වහන්සේ සොත, ඝාණ, ජිව්හා, කායප්‍රසාදයන් ද, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, හෘදයවත්ථු විපාක ක්‍රියා චිත්තයන් ද අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විදර්ශනා කරන කල්හි උපදනා ඤාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියාජවනයන්ට ඒ සොතාදී අව්‍යාකෘතධර්මයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" ය යි කියනු ලැබේ.

එසේම රහතන් වහන්සේ දිබ්බචක්ඛු ක්‍රියා අභිඥා චිත්තයෙන් රූප දක්නා කල්හිද, දිබ්බසොත ක්‍රියා අභිඥා චිත්තයෙන් ශබ්ද අසන කල්හිද, චෙතොපරිය ක්‍රියා අභිඥා චිත්තයෙන් පරසන්තානගත විපාක ක්‍රියා චිත්තයන් දැනගන්නා කල්හිද උපදනා ක්‍රියා අභිඥා චිත්තයන්ට ඒ රූප ශබ්දාදිය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" ය යි කියනු ලැබේ.

**21. ආකාසානඤ්චායතනං කිරියං විඤ්ඤාණඤ්චායතන කිරියස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(රහතන් වහන්සේගේ ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තය විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**22. ආකිඤ්චඤ්ඤායතන කිරියං නෙවසඤ්ඤා-නාසඤ්ඤායතන කිරියස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(රහතන් වහන්සේගේ ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තය නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මේ අනුවාද දෙකෙහි රහතන් වහන්සේගේ විඤ්ඤා-ණඤ්චායතන ක්‍රියා චිත්තයට ආකාශානඤ්චායතන ක්‍රියා චිත්තයද, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා චිත්තයට ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තයද, ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවීම" ය යි කියනු ලැබේ.

**23. රූපායතනං චක්ඛුවිඤ්ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(රූපායතනය, චක්ඛු විඤ්ඤාණ චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**24. සද්දායතනං සොතවිඤ්ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(ශබ්දායතනය, සෝතවිඤ්ඤාණ චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**25. ගන්ධායතනං ඝාණ විඤ්ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(ගන්ධායතනය, ඝාණ විඤ්ඤාණ චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**26. රසායතනං ජිව්හා විඤ්ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(රසායතනය ජිව්හා විඤ්ඤාණ චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**27. ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(ඵොට්ඨබ්බායතනය, කායවිඤ්ඤාණ චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

මේ අනුවාද පසෙහි රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන අව්‍යාකෘතවූ කාම ධර්මයන් අරමුණුකොට උපදනා පඤ්චවාර චිත්තවීථින්හි පිළිවෙලින් භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව රූපායතනාදී වූ ආරම්මණයන් අතුරෙන් එක් ආරම්මණයක් අරමුණුකොට පඤ්චවාරාවජ්ජනයද, කුසලාකුසල අහේතුක විපාක ද්විපඤ්චවිඤ්ඤාණයන් අතුරෙන් එක් සිතක්ද, සම්පටිච්ඡනයද, සන්තීරණයද, වොට්ඨපනයද, කාමාවචර ජවන් සිතක් ජවන කෘත්‍යයෙන් සත්වරක්ද ඉපිද නිරුද්ධ වූ පසු තදාරම්මණයන් ඇතිව හෝ නැතිව හෝ භවාඞ්ගය වේ. මේ චිත්ත වීථින්හි දෙපස් විඤ්ඤාණ විපාක චිත්තයන්ට රූපායතනාදීන් අතුරෙන් එක් ආරම්මණයක් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**28. අබ්‍යාකතා ධම්මා ඉද්ධිවිධ ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(පාදක රූපාවචර පඤ්චමධ්‍යානය හා නිර්මිත රූපයන් රහතන් වහන්සේගේ ඉද්ධිවිධ ක්‍රියා අභිඤ්ඤා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**29. අබ්‍යාකතා ධම්මා චෙතොපරිය ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

පරසන්තානගත විපාක ක්‍රියා චිත්තයන් රහතන් වහන්සේගේ චෙතොපරිය ක්‍රියා අභිඤ්ඤා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**30. අබ්‍යාකතා ධම්මා පුබ්බෙනිවාසානුස්සති ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(පෙර ජාතිවලට අයත් විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය, රූප අටවිස්සය යන අව්‍යාකෘත ධර්මයන් රහතන් වහන්සේගේ පුබ්බෙනිවාසානුස්සති ක්‍රියා අභිඤ්ඤා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**31. අබ්‍යාකතා ධම්මා අනාගතංස ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො**

(අනාගත විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය, රූප අටවිස්සය යන අව්‍යාකෘත ධර්මයන් රහතන් වහන්සේගේ අනාගතංස ක්‍රියා අභිඤ්ඤා චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ)

මේ අනුවාද සතරෙහි රහතන් වහන්සේගේ ඉද්ධිවිධ චෙතොපරිය, පුබ්බෙනිවාසානුස්සති අනාගතංස ක්‍රියා අභිඤ්ඤා චිත්තයන්ට විපාක ක්‍රියා චිත්තයන් හා රූපයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**32. අබ්‍යාකතා ධම්මා ආවජ්ජනාය ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ස්කන්ධයන් අරමුණුකොට උපදනා චිත්ත වීථීන්හි මනොද්වාරාවජ්ජන චිත්තයට ඒ අව්‍යාකෘත ස්කන්ධයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

එසේ උපදනා චිත්තවීථීන්හි ආවජ්ජනා චිත්තයට අව්‍යාකෘත ධර්මයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" සයි කියනු ලැබේ.

8. විපිය—

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි කුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් උපකාරවන ප්‍රත්‍යය ධර්මයෝ නම්:

අභිඥා ඵලය හැර විපාක සිත් පන්තිසය
ක්‍රියා සිත් විස්සය
චෛතසික අටතිසය
රූප අටවිස්සය
නිවන යන ප්‍රත්‍යය ධර්මයෝ යි.

මේ ප්‍රත්‍යය ධර්මයන්ගේ ප්‍රත්‍යෝත්පන්න භාවයට පැමිණෙන කුසල ධර්මයෝ නම්:

මහා කුසල් සිත් අටය
දිබ්බ චක්ඛු කුසලාභිඥාවය
දිබ්බසෝත කුසලාභිඥාවය
ඉද්ධිවිධ කුසලාභිඥාවය
චේතොපරිය කුසලාභිඥාවය
පුබ්බෙනිවාසානුස්සති කුසලාභිඥාවය
අනාගතංස කුසලාභිඥාවය
අප්‍රමාණ්‍යයන් හැර චෛතසික සතිසය

යන ප්‍රත්‍යොත්පන්න ධර්මයෝ යි.

මෙහි එක්වර ලැබෙන ආරම්මණ, ආරම්මණාධිපති, වත්ථාරම්මණ නිස්සය, ආරම්මනූපනිස්සය, ආරම්මණ පුරෙජාත, වත්ථාරම්මණ විප්පයුත්ත, ආරම්මණ පුරෙජාතාත්ථි, ආරම්මණ පුරෙජාතාවිගත යන ප්‍රත්‍යය ශක්ති අටෙන් ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

මේ වීථියෙහි අනුවාද වශයෙන්

**1. සෙක්ඛා ඵලං පච්චවෙක්ඛන්ති.**

(ශෛක්‍ෂයන් වහන්සේලා තම තමන් විසින් ලබන ලද ඵල සිත් ප්‍රත්‍යවෙක්‍ෂා කිරිමේ දී ප්‍රත්‍යවෙක්‍ෂා කරන කුසල ජවනයන්ට ඵල සිත් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි ආර්යයන් වහන්සේලා තම තමන් විසින් ලබන ලද ඵල සිත ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡේද යන චිත්ත යන්ට අනතුරුව එම ඵලසිත අරමුණු කොට මනොද්වාරාවර්ජන චිත්තයද, කාමාවචර මහා කුසල් සිතක් ජවන කෘත්‍යයෙන් සත්වරක්ද ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගයවේ. මේ චිත්තවීථියෙහි ප්‍රත්‍යවෙක්ෂා ජවන් වශයෙන් උපදනා කාමාවචර මහා කුසල් සිත් වලට සෝවාන් සකෘදාගාමි, අනාගාමි ඵලසිත් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. සෙඛා නිබ්බානං පච්චවෙක්ඛන්ති.**

(ශෛක්ෂයන් වහන්සේලා නිර්වාණය ප්‍රත්‍යය වෙක්ෂා කරන කල්හි උපදනා කාමාවචර මහා කුසල ජවනයන්ට නිර්වාණය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙය යට දක්වන ලද පළමුවන අනුවාදය මෙන් දත යුතු.

**3. නිබ්බානං ගොත්‍රභුස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(නිර්වාණය ගොත්‍රභූ චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

පෘථග්ජන තෙම විදසුන් වඩා සම්පූර්ණකොට සෝවාන් මගට පැමිණීමට ලංවූ කල්හි උපදනා මාර්ග චිත්ත වීථියෙහි භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව විදර්ශනා කළ සංස්කාර ධර්මය අරමුණු කොට මනොද්වාරාවර්ජන චිත්තය ද ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිතක් පරිකර්ම උපචාර අනුලොම වශයෙන් ද ඉපිද නිරුද්ධ වෙත්. අනතුරුව නිවන අරමුණු කරමින් එම ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිතම ගොත්‍රභූ චිත්තය වශයෙන් ඉපිද නිරුද්ධ වූ පසු සෝවාන් මාර්ග සිත හා ඵලසිත් දෙක ද

පිළිවෙලින් ඉපිද නිරුද්ධ වෙත්. මේ සෝවාන් මාර්ගය උපදනා චිත්ත වීථියෙහි පෘථග්ජන ගෝත්‍රයෙන් එතර කරවන ගෝත්‍රභූ සිතට නිවන ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**4. නිබ්බානං වොදානස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(නිර්වාණය වොදාන චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ) සෝවාන් ඵලසථ පුද්ගලතෙම නැවත විදසුන් වඩා සකෘදාගාමි මාර්ග ඵලයත් හා අනාගාමි අර්හත් මාර්ග ඵලයත් උපදවා ගන්නා කල්හි භවාඞ්ගචලන, භවාංගුපච්ඡේදයන්ට අනතුරුව පරිකර්ම, උපචාර, අනුලොම, සිත් ඉපිද නිරුද්ධ වූ පසු නිවන අරමුණු කරමින් ඉතා පිරිසිදු වූ ඵම ඥාණසම්ප්‍රයුක්ත චිත්තයම, වොදාන නමින් ඉපිද නිරුද්ධ වේ. අනතුරුව සකෘදාගාමි මාර්ග සිත හා ඵල සිත් දෙක ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. අනාගාමි මාර්ගය හා අර්හත් මාර්ගය ලැබෙන චිත්ත විථියද මෙසේමය. මේ චිත්ත වීථින්හි වොදාන සිතට නිර්වාණය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**5. නිබ්බානං මග්ගස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(නිර්වාණය මාර්ග චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ)

සෝවාන් සකෘදාගාමී, අනාගාමි, අර්හත් යන ලොකොත්තර මාර්ග කුසල් සිත් විසින් අරමුණු කරනු ලබන්නේ නිර්වාණයයි. මෙසේ මාර්ග කුසල් සිතට නිර්වාණය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**6. සෙක්ඛාවා පුථුජ්ජනවා චක්ඛුං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ පුද්ගලයන් විසින් චක්ෂුප්‍රසාදය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා වඩන කල්හි, විදර්ශනා කරන කාමාවචර ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් වලට චක්ෂුප්‍රසාදය ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි පුද්ගලයන් විසින් හෝ පෘථග්ජන පුද්ගලයන් විසින් හෝ චක්ෂුප්‍රසාදය අනිත්‍යය දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා වඩන කල්හි භවාඞ්ගචලන, භවාංගුපච්ඡේදයන්ට අනතුරුව චක්ෂු ප්‍රසාදය අරමුණු කරමින් මනොද්වාරාවජ්ජනයද, ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල් සිතක් විදර්ශනා ජවන් වශයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. මේ චිත්ත වීථිත්හි විදර්ශනා කරන කාමාවචර ඥාණ සම්ප්‍රයුක්ත මහා කුසල චිත්තයන්ට චක්ෂු ප්‍රසාදය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම, "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**7. සෙක්ඛාවා පුථුජ්ජනාවා සොතං අනිච්චතො, දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂවූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ ශ්‍රොත්‍රය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්.)

**8. සෙක්ඛාවා පුථුජ්ජනාවා ඝාණං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ ඝාණය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්.)

**9. සෙක්ඛාවා පුථුජ්ජනාවා ජිව්හං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ ජිව්හය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්.)

**10. සෙක්ඛා වා පුථුජ්ජනා වා කායං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ කය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්)

**11. සෙක්ඛා වා පුථුජ්ජනා වා රූපෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ රූපයන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්)

**12. සෙක්ඛා වා පුථුජ්ජනා වා සද්දෙ අනිච්චතො, දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ ශබ්දයන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්.)

**13. සෙක්ඛා වා පුථුජ්ජනා වා ගන්ධෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ ගන්ධයන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්.)

**14. සෙක්ඛා වා පුථුජ්ජනා වා රසෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ රසයන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්.)

**15. සෙක්ඛා වා පුථුජ්ජනා වා ඵොට්ඨබ්බෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ ස්පර්ශයන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්.)

**16. සෙක්ඛා වා පුථුජ්ජනා වා චක්ඛුං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**



Free Distribution www.aathaapi.org

(ශෛක්‍ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ හදය වස්තු රූපය අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්.)

**17. සෙක්ඛාවා පුථුජ්ජනාවා විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්‍ෂ වූ හෝ පෘථග්ජනවූ හෝ පුද්ගලයෝ විපාක ක්‍රියා නාමස්කන්ධයන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරත්.)

මේ අනුවාදයන්හි ශෛක්‍ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයන් විසින් ශ්‍රොත, ඝ්‍රාණ, ජිව්හා, කාය, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය, හදයවස්තු, විපාක ක්‍රියා චිත්තයන් විදර්ශනා කරන කල්හි ඒ විදර්ශනා කුසල ජවනයන්ට ශ්‍රොතාදී වූ අව්‍යාකෘත ධර්මයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම"යයි කියනු ලැබේ.

**18. දිබ්බෙන චක්ඛුනා රූපං පස්සන්ති.**

(ශෛක්‍ෂවූ හෝ පෘථග්ජනවූ හෝ පුද්ගලයන් විසින් දිව්‍යසින් රූපයන් දක්නා කල්හි ඒ දිබ්බචක්ඛු කුසලාභිඥාව චිත්තයට දූර ප්‍රතිච්ඡන්නාදීවූ රූපාරම්මණය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

අභිඥා බවට නොපැමිණි අෂ්ටසමාපත්තිලාභී පුද්ගල තෙම දිව්‍යචක්ෂුරභිඥා උපදවා දූරප්‍රතිච්ඡන්න ස්නිග්ධ සූක්‍ෂමාදීවූ රූපාරම්මණය දක්නා කල්හි ඒ චිත්ත වීථියෙහි උපදනා දිබ්බචක්ඛු කුසලාභිඥා චිත්තයට හා තදනුවර්තික මනොද්වාරික චිත්ත වීථින්හි උපදනා කාමාවචර කුසල ජවනයන්ටද ඒ සූක්‍ෂම රූපාරම්මණය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යවීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**19. දිබ්බාය සොතධාතුයා සද්දං සුණාති.**

(ශෛක්ෂවූ හෝ පෘථග්ජනවූ හෝ පුද්ගලයන් විසින් දිව කණින් ශබ්ද අසන කල්හි ඒ දිබ්බසොත කුසලාභිඥා චිත්තයට දූර ප්‍රතිච්ඡන්න ස්නිග්ධ සූක්ෂම ශබ්දාරම්මණය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ )

**20. චෙතොපරිය ඤාණෙන විපාකාබ්‍යාකත කිරියා-බ්‍යාකත චිත්තසමඞ්ගිස්ස චිත්තං ජානාති.**

(ශෛක්ෂවූ හෝ පෘථග්ජනවූ හෝ පුද්ගලයන් විසින් පර සිත් දත්නා නුවණින් හෙවත් චෙතොපරියඥාණයෙන් පරසන්තානගත විපාක ක්‍රියා සිත් දැනගන්නා කල්හි ඒ චෙතොපරිය කුසලාභිඥා චිත්තයට පරසන්තානගත විපාක ක්‍රියා චිත්තයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**21. අබ්‍යාකතො ඛන්ධො ඉද්ධිවිධ ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(නිර්මිත රූප සඞ්ඛ්‍යාත ෂඩාරම්මණය ඉද්ධිවිධ කුසලා-භිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**22. අබ්‍යාකතො ඛන්ධො චෙතොපරිය ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අතීත සත්වන දිනයට හා අනාගත සත්වන දිනයට අතරෙහි කාලත්‍රයට අයත් පරසන්තානගත අර්හත් ඵලය හැර විපාක සිත් පන්තිසය, ක්‍රියා සිත් විස්සය යන ධම්මා-රම්මණය චෙතොපරිය කුලභිඥාවට ආරම්මණ ශක්ති-යෙන් ප්‍රත්‍යය වේ.)

**23. අබ්‍යාකතො ඛන්ධො පුබ්බෙනිවාසානුස්සති ඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(පෙර ජාතියෙහි වූ අර්හත් ඵලය හැර විපාක සිත් පන්තිසය ක්‍රියා සිත් විස්සය, රූප අටවිස්සය යන සකන්ධ පඤ්චකයය, ඒ සකන්ධානුසාරයෙන් දතයුතුවූ නිර්වාණය යන ෂඩාරම්මණය පුබ්බෙනිවාසානුස්සති කුසලාභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**24. අබ්‍යාකතාධම්මා අනාගතංසඤාණස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අනාගතවූ අතීත් ඵලය හැර විපාක සිත් පන්තිසය, ක්‍රියා සිත් විස්සය, රූප අටවිස්සය යන සකන්ධ පඤ්චකය ඒ සකන්ධානුසාරයෙන් දතයුතුවූ නිර්වාණය යන ෂඩාරම්මණය අනාගතංස කුසලාභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ )

මේ කුසල අභිඥා චිත්තයන්ට අව්‍යාකෘත ධර්මයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම යයි කියනු ලැබේ."

9. වීථිය—

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ )

මෙහි අකුසල ධර්මයට ආරම්මණ ශක්තියෙන් උපකාර වන ප්‍රත්‍යය ධර්මයෝ නම්:

ලෞකික විපාක දෙතිසය,
ක්‍රියා සිත් විස්සය,
චෛතසික පන්තිසය,
රූප අටවිස්සය
යන ප්‍රත්‍යය ධර්මයෝයි.

මේ ප්‍රත්‍යය ධර්මයන්ගේ ප්‍රත්‍යොත්පන්න භාවයට පැමිණෙන අකුසල ධර්මයෝ නම්

අකුසල් සිත් දොළොසය
චෛතසික සත් විස්සය
යන ප්‍රත්‍යොත්පන්න ධර්මයෝ යි.

මෙහි එක්වර ලැබෙන ආරම්මණ සභාග ප්‍රත්‍යයන් අතුරෙන් ආරම්මණ ශක්තිය ලැබේ.

මේ වීථියෙහි අනුවාද වශයෙන්

**1. චක්ඛුං අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(චක්ෂුප්‍රසාදය ආස්වාදනය අභිනන්දනය කිරීමේදී චක්ෂුව අරමුණුකොට රාගය, දිට්ඨිය, විචිකිච්ඡාව, උද්ධච්චය, දෞමනස්සය උපදී.)

චක්ෂුප්‍රසාදය ආස්වාදනය කරන කල්හි ලොභමූල සොමනස්ස සහගත සිත් සතරටද, මගේ ඇස ඉතා හොඳය යි සතුටුවන කල්හි ප්‍රීති සහගත ලොභමූල චිත්තයට ද, ඇසට ඇලුම් කරන කල්හි රාගය ප්‍රධාන ලොභමූල සිත් අටට ද, මගේ ඇස යයි වරදවා ගන්නා කල්හි දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරටද, සැකයක් උපදනා කල්හි මොහමූල විචිකිච්ඡා සහගත සිතටද, වික්ෂිප්ත වන කල්හි උද්ධච්ච සහගත චිත්තයටද, නො-සතුටු වන කල්හි දොමනස්ස සහගත සිත් දෙකට ද, චක්ෂු ප්‍රසාදය නම් වූ ඒ අව්‍යාකෘත ධර්මය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**2. සොතං, ඝානං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, වත්ථුං, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(ශ්‍රොත්‍රය, ඝ්‍රාණය, ජිව්හාව, කායය, රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, හදය වස්තු, විපාක ක්‍රියා නාමස්කන්ධයන් ආස්වාදනය අභිනන්දනය කරන කල්හි එකී අව්‍යාකෘත ධර්මයන් අරමුණුකොට රාගය, දිට්ඨිය, විචිකිච්ඡාව, උද්ධච්චය, දෞමනස්සය උපදී.)

චක්ෂුප්‍රසාදය මෙන්ම, ශ්‍රොත්‍රප්‍රසාදය, ඝ්‍රාණප්‍රසාදය, ජිව්හාප්‍රසාදය, කායප්‍රසාදය, රූප, ශබ්ද, ගන්ධ, රස,

ෆොට්ඨබ්බය, හදය වස්තුව, විපාක ක්‍රියා නාමස්කන්ධයන් අරමුණුකොට ආස්වාදනය, අභිනන්දනය කරන කල්හි එය අරබයා රාගය, දිට්ඨිය, විචිකිච්ඡාව, උද්ධච්චය, දෞර්මනස්‍ය උපදී. එසේ එකී අව්‍යාකෘත ධර්මයන් අරමුණු කොට දෙලොස් අකුසල චිත්තයන් උපදනා කල්හි දෙලොස් අකුසල චිත්තයන්ට එකී අව්‍යාකෘත ධර්මයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම, "අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම යයි" කියනු ලැබේ.

## 3. අධිපති ප්‍රත්‍යය

තමා පිළිබඳව පවත්නා ධර්මයන්ගේ ස්වාමිතෙම **අධිපති** නම්. නාමරූප ධර්මයන් අතරද, ස්වාමිභාවය හෙවත් අන්‍ය නාමරූප ධර්මයන් ස්වවශයෙහි පැවැත්වීමේ ශක්තිය හෙවත් බලය ඇති නාමරූප ධර්මයෝ ඇත්තාහ. ඒ ධර්මයන්ගේ අධිපති ශක්තිය නිසා එයට අනුකූලව උපදනා ධර්මයෝද ඇත. එබැවින් ඒ අධිපති ශක්තිය ඇති ධර්මයන්ට **අධිපති ප්‍රත්‍යයෝ** යයි කියනු ලැබේ. **අධිපති ප්‍රත්‍යය** දෙවැදෑරුම් වේ.

එනම්:

1. **ආරම්මණාධිපති ප්‍රත්‍යය**
2. **සහජාතාධිපති ප්‍රත්‍යය**

යන ප්‍රත්‍යය ධර්මයෝ දෙකොටසකි.

### 1. ආරම්මණාධිපති ප්‍රත්‍යය

නොයෙක් ද්‍රව්‍යයන් අතුරෙන් මැණික සිත් ඇද ගන්නා, ගරුකළ යුතු වස්තුවකි. වරක් එය දුටුවිට නැවත නැවත සිහි කරවන ශක්තියක් එහි ඇති බැවින් අන්‍ය ද්‍රව්‍යයන්ට වඩා එය ගරු කළයුතු වස්තුවක් වශයෙන් සළකනු ලැබේ. නාමරූප ධර්මයන් අතරද විශෙෂයෙන් සිත් ඇදගන්නාවූ ශක්තිය ඇති ධර්මයෝ

ඇත්තාහ. ඒ නාමරූප ධර්මයන් අරමුණු කොට බොහෝ චිත්ත චෛතසික ධර්මයෝ උපදිති. අන්‍ය චිත්ත චෛතසික ධර්මයන් තමාට අනුකූල කරවන ශක්තිය ඇති ගරුකළ යුතු ධර්මයන්ට **ආරම්මණාධිපති ප්‍රත්‍යය** යයි කියනු ලැබේ.

## ආරම්මණාධිපති ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය

### ආරම්මණාධිපති ප්‍රත්‍යය ධර්ම

**ගරු කළයුතුවූ වර්තමානවූ ද, අතීතවූ ද, අනාගතවූ ද, ඉෂ්ටනිෂ්පන්න ධර්ම අටළොසය** (18) (භූතරූප 4, ප්‍රසාද රූප 5, ගෝචර රූප 4, භාව රූප 2, හදයවත්ථු රූපය, ජීවිතෙන්ද්‍රිය රූපය, ආහාර රූපය.)

**ද්වේෂමූල, මෝහමූල දුක්ඛසහගත කායවිඥාන යන සිත් පස හැර ඉතිරි සිත් සූ අසූවය (84).**

**ද්වේෂ, ඊර්ෂ්‍යා මාත්සර්යය, කුක්කුච්ච, විචිකිච්ඡා යන පස හැර ඉතිරි චෛතසික සත්සාළිස (47)**

**කාලමුක්තවූ නිර්වාණය**

යන ෂඩාරම්මණ ධර්මයෝ ආරම්මණාධිපති ප්‍රත්‍යය වන ධර්මයෝ යි.

### ප්‍රත්‍යයෝත්පන්න ධර්ම

**ගරු කළයුතු ධර්මයන් ගරුකොට අරමුණු කරන්නාවූ ලෝභමූල සිත් අටය (8),**

**මහා කුසල් සිත් අටය (8),**

**මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරය (4)**

**ලෝකෝත්තර සිත් අටය (8)**

**ද්වේෂ, ඊර්ෂ්‍යා, මාත්සර්යය, කුක්කුච්ච, විචිකිච්ඡා, අප්‍රමාණ්‍යයන් හැර ඉතිරි චෛතසික පන්සාළිසය (45).**

යන මේ ධර්මයෝ ආරම්මණාධිපති ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝය.

**ප්‍රත්‍යනීක ධර්ම**

**යම්කිසි ධර්මයක් ගරුකොට අරමුණු නොකරන්නා වූ,**

**ලෞකික සිත් එක් අසූවය (81)**
**චෛතසික දෙපනසය (52)**
**චිත්තජ රූපයෝය**
**ප්‍රතිසන්ධි කර්මජරූපයෝය**
**බාහිර රූපයෝය**
**ආහාරජ රූපයෝය**
**ඍතුජ රූපයෝය**
**අසංඥ සත්ත්ව කර්මජ රූපයෝය**
**ප්‍රවෘත්ති කර්මජ රූපයෝය**

යන මේ ධර්මයෝ ආරම්මණාධිපති ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝය.

මෙහි ඒ ඒ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ට ආරම්මණාධිපති භාවයෙන් ප්‍රත්‍යය වන ධර්මයෝ මෙසේයි:

| ප්‍රත්‍යයෝත්පන්න ධර්ම | | ප්‍රත්‍යය ධර්ම | |
|---|---|---|---|
| ලොභමූල සිත් අට | 8 | ලෞකික කුසල් සිත් | 17 |
| | | දුක්ඛ සහගත කායවිඤ්ඤාණය හැර ලෞකික විපාක සිත් | 31 |
| | | ලොභමූල සිත් | 8 |
| | | ඉෂ්ටනිෂ්පන්න රූප | 18 |
| ඥාන විප්‍රයුක්ත මහා කුසල් සිත් | 4 | ලෞකික කුසල් සිත් | 17 |
| ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් | 4 | ලෞකික කුසල් සිත් | 17 |
| | | පට ලොකොත්තර සිත් | 6 |
| | | නිර්වාණය | |
| මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් | 4 | අර්හත්මාර්ග සිතය | 1 |
| | | අර්හත් ඵල සිතය | 1 |
| | | නිර්වාණය | |
| ලොකොත්තර සිත් | 8 | නිර්වාණය | |

ආරම්මණාධිපති ප්‍රත්‍යොත්පන්න වශයෙන් දක්වන ලද සිත්වලින් සෑම කල්හිම ආරම්මණාධිපති ප්‍රත්‍යොත්පන්න වන්නේ ලොකොත්තර සිත් අට පමණකි. ඒ සිත් සෑම කල්හිම නිර්වාණය ගරුකොට අරමුණු කරති. ඉතිරි සිත් වනාහි ගරු කළයුතු ධර්මයන් ගරු කොට අරමුණු කරන අවස්ථාවෙහි ආරම්මණාධිපති ප්‍රත්‍යොත්පන්න වේ. ගරුකොට අරමුණු නොකරන අවස්ථාවෙහි ආරම්මණාධිපති ප්‍රත්‍යොත්පන්න නොවේ. රහතන් වහන්සේගේ සන්තානයෙහි උපදනා මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත චිත්තයන් විසින් ගරුකොට අරමුණු කරනු ලබන්නේ ලොකොත්තර ධර්ම පමණකි. රහතන්වහන්සේ ලෞකික ධර්මයන් ගරුකොට අරමුණු නොකරති. මහා ක්‍රියා ඥාන විප්‍රයුක්ත සිත් ලොකොත්තර ධර්ම අරමුණු කිරීමට සමත් නොවන බැවින් ඒ චිත්තයෝ ආරම්මණාධිපති ප්‍රත්‍යොත්පන්නයෝ නොවෙති

ඒ ඒ ධර්මයන්හි ඇති උසස් බව නිසා කාමාවචර කුසල් සිත්ද, මහා ක්‍රියා සිත් හා ලොකොත්තර සිත්ද ඒවා ගරු කොට අරමුණු කරති. නමුත් ලොභමූල චිත්තය එසේ නොව ඒ ඒ දෙය ගරුකොට අරමුණු කරන්නේ එහි ආස්වාදනීය භාවය නිසා ය. සුනඛයෝ, ඔවුන්ට, අසූචියෙහි ඇති ආස්වාදනීය භාවය නිසා එය ගරුකොට අරමුණු කරති.

දන්දීම, සිල් රැකීම, පෙහෙවස් විසීම, භාවනා කිරීම, දහම් ඇසීම ආදී පින්කම් කොට ඒ පින්කම් උසස් කොට සිතීමෙහිද, අනුන් විසින් කරනලද පින්කම් උසස්කොට සිතන කල්හිද කාමාවචර කුසලය, කාමාවචර කුසලයට ආරම්මණාධිපති ප්‍රත්‍යය වේ. එපරිද්දෙන්ම ධ්‍යානයෙන් නැගිට ධ්‍යානය උසස් කොට සිතීමෙහිදී ද, ශෛක්‍ෂ පුද්ගලයන් විසින් තම තමන්ගේ මාර්ගයන් උසස් කොට සිතීමෙහිදී ද, රූපාවචර, අරූපාවචර, ලොකොත්තර කුසලයෝ කාමාවචර කුසලයට ආරම්මණාධිපති ප්‍රත්‍යය වෙති. කුසලය ගරුකොට ලොභ සහගත සිතින්

ආස්වාදනය කරන කල්හිද, එයට සතුටු වන කල්හිද, මගේ කුසලය යනාදී වශයෙන් දෘෂ්ටිය උපදනා කල්හිද, කුසලය ලෝභ මෝහ චිත්තයන්ට ආරම්මණාධිපති ප්‍රත්‍යය වේ. රාග දිට්ඨි ආදියද උසස්කොට සලකා එයට සතුටු වන කල්හිද ලෝභ මූල චිත්තය ලෝභ මූල චිත්තයට ආරම්මණාධිපති ප්‍රත්‍යය වේ.

**සහජාතාධිපති ප්‍රත්‍යය—**

සහජාත හෙවත් එක්ව උපදනා ධර්මයන්ට අධිපති වන ධර්මයෝ සතර දෙනෙකි.

එනම්:

1. **ඡන්දය**
2. **චිත්තය**
3. **විරියය**
4. **විමංසය** යන ධර්ම සතරය.

මේ ධර්මයන්ට **සහජාතාධිපති ප්‍රත්‍යය** ධර්මයයි කියනු ලැබේ. මේ ධර්මයෝද බලවත්වූ කල්හිම අධිපති වෙති. දුර්වලවූ ඡන්දාදී ධර්මයෝ සහජාත ධර්මයන්ට අධිපති නොවෙති. දන්දීමට බලවත් කැමැත්තක් හෙවත් ඡන්දයක් උපන් කල්හි ඒ කැමැත්තට අනුකූලව ඒ දන්දීමේ කෘත්‍යය සිදු කිරීමට උවමනා චේතනාදී අනිකුත් චෛතසික ධර්මයෝද ඒ සමගම සහජාතව උපදිති. එයින් දන්දීම සිදුවේ. මෙහිදී ඡන්දය අනිකුත් ධර්මයන්ට අධිපති භාවයෙන් ප්‍රත්‍යය වේ. චිත්ත විරිය වීමංසාද මෙසේමය. ඇතැම් සිත්වල මේ ධර්ම සතරම එකවර උපදින්නේ වී නමුත් එයින් එක් ධර්මයක් පමණක් එකවර අධිපති ප්‍රත්‍යය භාවයට පැමිණේ. එක් සිතක උපදනා අධිපති නොවන ධර්ම සියල්ලම ඒ අධිපති ධර්මයට අනුකූලවම ප්‍රත්‍යෝත්පන්න ධර්ම වශයෙන් පවතී.

**සහජාතාධිපති ප්‍රත්‍යය පිළිබඳ නිරාශිය—**

**සහජාතාධිපති ප්‍රත්‍යය** වන ධර්මයෝ නම්, තමතමන් අධිපති වන අවස්ථාවෙහි මෝහමූල චිත්තයන් හා හසිතොත්පාදය හැර දෙපනස් සාධිපති ජවන නාම-ස්කන්ධයන්හි ඇත්තාවූ

1. **ඡන්දය**
2. **වීර්‍ය්‍යය**
3. **වීමංසය**
4. **සාධිපති ජවන දෙපනසය**

යන මේ ධර්මයෝයි.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම් තම තමා අධිපතිවන අවස්ථාවෙහි අධිපතිවන ධර්මය හැර

**දෙපනස් සාධිපති ජවනයෝය**
**විචිකිච්ඡා හැර එක්පනස් චෛතසිකයෝය**
**සාධිපති චිත්තජරූපයෝය**

සහජාතාධිපති ප්‍රත්‍යයාගේ **ප්‍රත්‍යනීක ධර්මයෝ** නම් සහජාතාධිපති ප්‍රත්‍යය නො ලබන්නාවූද, නොලබන අවස්ථාවෙහි වූ ද,

**කාම සිත් සිව්පනසය**
**මහද්ගත විපාක නවය**
**චෛතසික දෙපනසය**
**ඒ ඒ අවස්ථාවෙහි අධිපතිවන ධර්මයෝය**
**නිරාධිපති චිත්තජ රූපයෝය**
**ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය**
**බාහිර රූපයෝය**
**ආහාරජ රූපයෝය**
**ඍතුජ රූපයෝය**
**අසංඥසත්ත්ව කර්මජ රූපයෝය**
**ප්‍රවෘත්ති කර්මජ රූපයෝය**

**අධිපති ප්‍රත්‍යය** පිළිබඳ **විසර්ජනාවාර** හෙවත් **විග්‍රහ** දසයකි.

**1. විපිය**

**කුසලා ධම්මා කුසලස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො – ආරම්මණාධිපති සහජාතාධිපති**

(කුසල ධර්ම කුසල ධර්මයට අධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ, මේ ප්‍රත්‍යවීම ආරම්මණාධිපති, සහජාතාධිපති යන දෙයාකාරයෙන් සිදුවේ )

මෙහි **ආරම්මණාධිපති ප්‍රත්‍යය** වන කුසල ධර්මයෝ නම්:

1. අර්හත් මාර්ග හැර ගරු කළ යුතුවූ කුසල් සිත් විස්සය.
2. චෛතසික අටතිසය.

විස්තර වශයෙන් වනාහි—

ගරුකොට අරමුණු **කරන්නාවූ** මහා කුසල ඥාන විප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යයවන ගරු කළ යුතුවූ ලෞකික කුසල් සතොළොසය.

ගරුකොට අරමුණු කරන මහා කුසල ඥාන සම්ප්‍රයුක්ත චිත්තයන්ට ප්‍රත්‍යවන ගරු කළ යුතුවූ අර්හත් මාර්ගය හැර කුසල් සිත් විස්සය.

චෛතසික අටතිසය

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම් ගරුකොට අරමුණු කරන මහා කුසල් සිත් අට, විරති අප්‍රමාණ්‍ය හැර චෛතසික තෙවිස්සය.

මෙහිදී එකවර ලැබිය හැකි **ආරම්මණාධිපති, ආරම්මණ ආරම්මණූපනිස්සය** යන ප්‍රත්‍ය ශක්ති තුනෙන් **ආරම්මණාධිපති** ශක්තිය ලැබේ.

මේ වීථියෙහි අනුවාද වශයෙන්—

**ආරම්මණාධිපති ප්‍රත්‍යය—**

**1 දානං දත්වා සීලං සමාදියිත්වා, උපොසථකම්මං කත්වා තං ගරුං කත්වා පච්චවෙක්ඛති.**

(දන්දී, සිල් සමාදන්ව, පෙහෙවස් රැක, එය ගරු කොට ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි ඒ කුසල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය එය ගරුකොට ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ කාමාවචර කුසල චිත්තයට ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

දන්දීම, සිල් සමාදන්වීම, පෙහෙවස් රැකීම යනාදී කුසලයන් උසස් අන්දමින් සිදුකොට, නැවත ඒ කුසලයන් ගරු කොට මෙනෙහි කරන කල්හි භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව ඒ කාමාවචර කුසලය අරමුණු කොට මනොද්වාරාවජ්ජනයද, මහා කුසල් සිතක් ප්‍රතිවෙක්ෂා ජවන කෘත්‍යයෙන් සත් වරක් ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගය වීමෙන් චිත්තවීථිය කෙළවර වේ. මෙහිදී ගරුකොට අරමුණු කරන්නාවූ ඒ ප්‍රත්‍යවෙක්ෂා කුසල චිත්තයන්ට ගරුකළ යුතු දානාදී පුණ්‍ය කර්මයන් ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යවීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා පච්චවෙක්ඛති.**

පෙර උසස් වශයෙන් කරන ලද දානාදී කුසලයන් නැවත ගරුකොට මෙනෙහි කරන කල්හි ඒ ප්‍රත්‍යවෙක්ෂා ජවනයන්ට පෙර පවත්වනලද ගරු කළයුතු කුසලය ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මේ අනුවාදයෙන් පූර්වයෙහි කරනලද ගරු කළයුතු පින්කම් පසුව ගරුකොට ප්‍රත්‍යවෙක්ෂා කිරීමේදී උපදනා මහා කුසල ජවනයන්ට ආරම්මණාධිපති ශක්තියෙන් උපකාරවීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

Free Distribution www.aathaapi.org

**3. ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා පච්චවෙක්ඛති.**

(ධ්‍යාන සමාපත්තියෙන් නැගී නැවත එම ධ්‍යානය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි උපදනා කාමාවචර කුසල ජවනයන්ට ඒ ධ්‍යානය ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

ධ්‍යානය හෙවත් මහද්ගත කුසලය ගරු කළයුතු, මහත් බවට පැමිණි කුසලයකි. එය උපදවා නැවත එයම ගරු කොට මෙනෙහි කිරීමේදී, ඒ ප්‍රත්‍යවේක්ෂා මහා කුසල ජවනයන්ට ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම, "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

මහද්ගත කුසලය තමා මහත් බවට පැමිණ සිටින බැවින් අනෙකක් ගරුකොට අරමුණු නොකරයි.

**4. සෙක්ඛා ගොත්‍රභුං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

(සෝවාන් පුද්ගලයෝ තම තමන්ගේ මාර්ග චිත්ත වීථියෙහි උපන් ගොත්‍රභූ සිත ගරු කොට ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි ඒ ප්‍රත්‍යවේක්ෂා ජවනයන්ට ඒ ගොත්‍රභූ සිත ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

සෝවාන් මාර්ගයට පැමිණීමේදී භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව මනොද්වාරාවජ්ජනයද ඥානසම්ප්‍රයුක්ත මහා කුසල් සිතක් පරිකර්ම, උපචාර, අනුලෝම, ගොත්‍රභූ වශයෙන් සතර වරක් හෝ උපචාර, අනුලෝම, ගොත්‍රභූ වශයෙන් තුන් වරක් හෝ ඉපිද නිරුද්ධවූ පසු සෝවාන් මාර්ග සිත සහ සෝවාන් ඵල සිත් දෙකක් හෝ තුනක් පිළිවෙලින් ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. එයට අනතුරුව ප්‍රත්‍යවේක්ෂා ජවන් උපදනා චිත්ත වීථි පිළිවෙලින් ඉපිද නිරුද්ධ වෙති. සෝවාන් පුද්ගලතෙම තමන්ට පෘථග්ජන ගොත්‍රයෙන් එතරවීමට උපකාර වූ ගොත්‍රභූ චිත්තය ප්‍රත්‍යවේක්ෂා

කරන කල්හි භවාඞ්ග චලන, භවාංගුපච්ඡේදයන්ට අනතුරුව ගොත්‍රභූ චිත්තය ගරු වශයෙන් අරමුණුකොට මනොද්වාරාවජ්ජන චිත්තයද, ඥානසම්ප්‍රයුක්ත මහා කුසල් සිතක් ප්‍රත්‍යවෙක්ෂා ජවන් වශයෙන් සත්වරක් ඉපිද නිරුද්ධවූ පසු භවාඞ්ගය වේ. මේ චිත්ත වීථියෙහි ප්‍රත්‍යවෙක්ෂා කරන කාමාවචර කුසල ජවනයන්ට ගොත්‍රභූ සිත ගරුකොට අරමුණුවීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**5. සෙක්ඛා වොදානං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

සකෘදාගාමි අනාගාමි ආර්‍ය්‍ය පුද්ගලයෝ වොදාන සිත ගරුකොට අරමුණු කරන කල්හි ඒ ප්‍රත්‍යවෙක්ෂා කුසල ජවනයන්ට වොදාන සිත ආරම්මණාධිපති ශක්ති යෙන් ප්‍රත්‍යය වේ.)

**6. සෙක්ඛා මග්ගාවුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

(සෝවාන්, සකෘදාගාමි, අනාගාමි ආර්‍ය්‍ය පුද්ගලයෝ තම තමන් විසින් පැමිණි මාර්ගයෙන් නැගී එය ගරු කොට ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි, ප්‍රත්‍යවෙක්ෂා ජවනයන්ට මාර්ග සිත ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මේ අනුවාදයන්හි වොදාන සිතත්, මාර්ග සිතත් ගරුකොට ප්‍රත්‍යවෙක්ෂා කරන කාමාවචර කුසල ජවනයන්ට ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**සහජාතාධිපති ප්‍රත්‍යය—**

**කුසලා අධිපති සම්පයුත්තකානං ඛන්ධානං අධිපති පච්චයෙන පච්චයො**

(කුසලාධිපති ධර්මය සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන්ට සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට සහජාතාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන කුසලාධිපති ධර්මයෝ නම්:-

අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහා කුසල් අටය,

සෑම කල්හි අධිපති ප්‍රත්‍යය ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුසල් සතළොසය,

චෛතසික අටතිසය.

යන මොවුන්ගේ එක් එක් චිත්තයක ඇති අධිපති තුන හා සතර අතුරෙන් එක එකක් වූ ප්‍රත්‍ය ධර්මයෝයි.

මේ සහජාතාධිපති ප්‍රත්‍ය ධර්මයන්ගේ ප්‍රත්‍යයෝත්පන්න භාවයට පැමිණෙන ධර්මයෝ නම් අධිපතිවන ධර්මය හා සම්ප්‍රයුක්ත ධර්මයෝයි.

ඡන්ද, චිත්ත, විරිය, වීමංසා යන අධිපති ධර්මයන් අතුරෙන් එක් කුසල් සිතක එකවර අධිපති ප්‍රත්‍යය වන්නේ එක් ධර්මයකි. ඒ අධිපතිවන ධර්මය එම සිතෙහි ඒ හා සම්ප්‍රයුක්තවූ නාමස්කන්ධයන්ට සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය කුසල ධර්මයට සහජාතාධිපති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. විධිය—**

**කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො ආරම්මණාධිපති**

(කුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාද වශයෙන්

**1. දානං දත්වා, සීලං සමාදියිත්වා, උපොසථකම්මං කත්වා තං ගරුං කත්වා අස්සාදෙති, අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(දන්දී, සිල් සමාදන්ව, පෙහෙවස් රැක ඒ කුසලය ගරුකොට ආස්වාදනය අභිනන්දනය කරන කල්හි එයම ගරුකොට රාගය උපදියි. දිට්ඨිය උපදියි.)

දාන වස්තූන් පරිත්‍යාගකොට ඒ පරිත්‍යාග චේතනා ප්‍රධාන කාමාවචර කුසලය ගරුකොට ආස්වාදනය කරන කල්හි ලොභ මූල සෞමනස්‍ය සහගත සිත් සතරෙන් එකක් ජවන කෘත්‍යයෙන් උපදියි. එයට සතුටුවන කල්හි සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන ලොභමූල සිත් සතරෙන් එකක් ජවන කෘත්‍යයෙන් උපදියි. එසේම එයට ඇලුම් කරන කලහි රාග ප්‍රධාන ලොභමූල සිත් අටෙන් එකක්ද, වරදවා ගන්නා කල්හි ලොභමූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙන් එකක්ද ජවන කෘත්‍යයෙන් උපදියි, සීලාදි කුසල් පිළිබඳවද මේ පිළිවෙලම වේ.

මෙහිදී ආරම්මණාධිපති ප්‍රත්‍යය ධර්ම වශයෙන් ලැබෙන්නේ ලෞකික කුසල් සතොළොසය. එහි ප්‍රත්‍යොත්පන්නයෝ නම් ගරුකොට අරමුණු කරන ලොභමූල අකුසල් සිත් අටය.

**2. පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා අස්සාදෙති, අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති' දිට්ඨි උප්පජ්ජති.**

(පූර්වයෙහි කරන ලද දානාදි කුසලයන් ගරුකොට ආස්වාදනය, අභිනන්දනය කරන කල්හි එයම ගරුකොට රාගය උපදියි. දිට්ඨිය උපදියි.)

මෙහිදී ආරම්මණාධිපති ප්‍රත්‍යය ධර්ම වශයෙන් ලැබෙන්නේ පෙර පවත්වන ලද දාන, ශීල, අෂ්ටාඞ්ගශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලයෝයි ප්‍රත්‍යොත්පන්න ධර්ම වශයෙන් ලොභමූල සිත් අට ලැබේ.

**3. ඣානං වුට්ඨහිත්වා ඣානං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති දිට්ඨි උප්පජ්ජති.**

(ධ්‍යානයෙන් නැගී එම ධ්‍යානය ගරුකොට ආස්වාදනය කරන කල්හිද, අභිනන්‍දන වශයෙන් එයට සතුටුවන කල්හිද, එයම ගරුකොට රාගය උපදියි. දිට්ඨිය උපදියි.)

මෙහිදී ආරම්මණාධිපති ප්‍රත්‍යය ධර්ම වශයෙන් ලැබෙන්නේ මහද්ගත කුසල් සිත් නවයයි. ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලොභ මූල සිත් අට ලැබේ.

මේ කුසල ධර්මයන් අරමුණු කරන කල්හි එක්වර ලැබෙන **ආරම්මණ, ආරම්මණාධිපති, ආරම්මණූපනිස්සය** යන ප්‍රත්‍යය ශක්ති තුන අතුරෙන් මෙහිදී **ආරම්මණාධිපති** ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

3. **විපිය**—

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො, ආරම්මණාධිපති, සහජාතාධිපති**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණාධිපති, සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට **ආරම්මණාධිපති ප්‍රත්‍යය** ශක්තියෙන් උපකාරවන ප්‍රත්‍යය ධර්මය නම් අර්හත් මාර්ග චිත්තයයි.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම් ගරුකොට අරමුණු කරන මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරය. විරති අප්‍රමාණ්‍යයන් හැර චෛතසික තෙතිසය.

මෙහිදී එක්වර ලැබෙන **ආරම්මණ, ආරම්මණාධිපති ආරම්මණූපනිස්සය** යන ශක්ති තුනෙන් **ආරම්මණාධිපති** ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

තවද අව්‍යාකෘත ධර්මයට **සහජාතාධිපති ප්‍රත්‍යය** ශක්තියෙන් උපකාර වන ප්‍රත්‍යය ධර්මයෝ නම් පඤ්චවොකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහා කුසල් අටෙහි හා මහද්ගත ලොකොත්තර කුසලයන්හිද ඇති අධිපති ධර්මයෝයි.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම් චිත්තජ රූපයෝයි.

මහාක්‍රියා ඥානවිප්‍රයුක්ත චිත්තයෝ ලොකොත්තර ධර්මයන් අරමුණු කිරීමට සමත් නොවන බැවින් ආරම්මණාධිපති ප්‍රත්‍යය ධර්මයන්ගේ ප්‍රත්‍යොත්පන්න භාවයට නො-ගැණෙත්. එසේම රහතන් වහන්සේ ලෞකික ධර්මයන් ගරු නොකරන බැවින් ලෞකික ධර්මයන්ගේ වශයෙන්ද ඒවා ආරම්මණාධිපති ප්‍රත්‍යොත්පන්නයෝ නොවෙති.

මේ වීථියේ අනුවාද වශයෙන්,

**1. අරහා මග්ගාවුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛති.**

(රහතන් වහන්සේ අර්හත් මාර්ගයෙන් නැගිට එය ගරුකොට ප්‍රත්‍යවෙක්ෂා කිරීමේදී අර්හත් මාර්ගය, එය ප්‍රත්‍යවෙක්ෂා කරන ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතරට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

රහතන් වහන්සේ අර්හත් මාර්ගය උපදවා ගැන්මෙන් පසුව එම අර්හත් මාර්ගය ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි, භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව අර්හත් මාර්ගය ගරුකොට අරමුණු කරමින් මනොද්වාරාවජ්ජනයද, ඥාණසම්ප්‍රයුක්ත මහා ක්‍රියා ජවන් සතරෙන් එක් සිතක් ජවන කෘත්‍යයෙන්ද සත්වරක් ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. මෙහිදී ලොකොත්තර කුසලය වූ අතීත් මාර්ග චිත්තය ගරුකොට අරමුණු කරමින් උපදනා ඥානසම්ප්‍රයුක්ත ප්‍රත්‍යවෙක්ෂා මහා ක්‍රියා ජවනයන්ට ඒ මාර්ග කුසලය ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. කුසලාධිපති චිත්ත සමුට්ඨානානං රූපානං අධිපති පච්චයෙන පච්චයො.**

(පඤ්චවොකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහා කුසල් අටෙහි හා මහද්ගත ලොකොත්තර කුසලයන්හිද ඇති අධිපති ධර්මයෝ චිත්තජරූපයන්ට සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වෙත්.)

පඤ්චවොකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහා කුසල් සිත් අටෙහි හා මහද්ගත ලොකොත්තර කුසල චිත්තයන්හිද ඇති ඡන්දාදී අධිපති ධර්මයෝ ඒ කුසල චිත්තයන් හා සහජාතව උපදනා චිත්තජ රූපයන්ට සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාතාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

4. වීථිය—

**කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො - සහජාතාධිපති**

(කුසල ධර්මය සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට සහ චිත්තජ රූපයන්ටද සහජාතාධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි කුසලාව්‍යාකෘත ධර්මයන්ට සහජාතාධිපති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවන කුසල ධර්මය නම් පඤ්චවොකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහිවූ මහා කුසල් අටෙහිද මහද්ගත කුසල් නවයෙහිද, මාර්ගසිත් සතරෙහිද ඇති අධිපති ධර්ම තුන හෝ සතර අතුරෙන් එක එකක්වූ ප්‍රත්‍ය ධර්මය ය.

ප්‍රත්‍යයොත්පන්න වශයෙන් ලැබෙන ධර්මයෝ නම් අධිපතිවන ධර්මයෙන් අන්‍යවූ සම්ප්‍රයුක්ත ස්කන්ධයන් හා චිත්තජ රූපයෝය.

මෙහි අනුවාද වශයෙන්—

**කුසලාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානංච රූපානං අධිපතිපච්චයෙන පච්චයො.**

(අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහිවූ මහා කුසල් සිත් අටය, මහද්ගත කුසල් නවය, මාර්ග සිත් සතරය යන කුසල් සිත්හි අධිපතිවන ධර්මය, සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ)

එක් විසි කුසල් සිත්හි අධිපතිප්‍රත්‍ය ලැබෙන කල්හි එහි ඡන්ද, චිත්ත, විරිය, වීමංසා යන සතර අධිපති ධර්මයන් අතුරෙන් එක් ධර්මයක් එක් වරක අධිපති වශයෙන් යෙදෙන කල්හි එම අධිපතිවන ධර්මය ඉතිරි සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය කුසලාව්‍යාකෘත ධර්මයන්ට සහජාතාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

5. විපිය

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො - ආරම්මණාධිපති - සහජාතාධිපති.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණාධිපති සහජාතාධිපති යන අධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**ආරම්මණාධිපති ප්‍රත්‍ය** ශක්තියෙන් අකුසල ධර්මයට ප්‍රත්‍යය වන අකුසල ධර්මයෝ නම්:

ගරුකොට අරමුණු කරන ලොභ මූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළයුතු ලොභ මූල සිත් අටය.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම් ගරුකොට අරමුණු කරන ලොභ මූල සිත් අටය, චෛතසික දෙවිස්සය යන අකුසල ධර්මයෝ යි.

මෙහිදී එක්වර ලැබෙන **ආරම්මණ, ආරම්මණාධිපති ආරම්මණූපනිස්සය** යන ශක්ති තුනෙන් **ආරම්මණාධිපති** ශක්තිය ලැබේ.

**සහජාතාධිපති ප්‍රත්‍යය** ශක්තියෙන් අකුසල ධර්මයට ප්‍රත්‍යය වන අකුසල ධර්මය නම්·

අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ලෝභ මූල සිත් අටය, ද්වේෂ මූල සිත් දෙකය, විචිකිච්ඡා හැර චෛතසික සවිස්සය යන මොවුන්ගේ එක් එක් චිත්තක්ෂණයක ලැබෙන අධිපති ධර්ම තුනෙන් එක එකක් වූ ප්‍රත්‍යය ධර්මය ය.

ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් ලැබෙන අකුශල ධර්ම නම් අධිපති වන ධර්මයෙන් අන්‍ය වූ සම්ප්‍රයුක්ත ධර්මයෝ යි.

මෙහි අනුවාද වශයෙන්—

**ආරම්මණාධිපති**—

**1. රාගං ගරුංකත්වා අස්සාදෙති, අභිනන්දති, තං ගරුංකත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(රාගය ප්‍රධාන ලෝභ මූල චිත්තය ගරුකොට ආස්වාදනය කරන කල්හිද, සතුටු වන කල්හිද, රාගය ගරු කොට අරමුණු කරමින් රාගය උපදියි. දිට්ඨිය උපදියි.)

රාගය ප්‍රධාන ලෝභ මූල චිත්තය ගරුකොට ආස්වාදනය කරන කල්හි භවාඞ්ග චලන, භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව රාගය ප්‍රධාන ලෝභ මූල සිත ගරුකොට අරමුණු කරමින් මනොද්වාරාවජ්ජනයද, ලෝභ මූල සෞමනස්‍ය සිත් සතරෙන් එකක් ජවන කෘත්‍යයෙන් සත්වරක් ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. එසේම රාගය ප්‍රධාන ලෝභ මූල චිත්තය ගරුකොට අරමුණු කරමින් සතුටු වන කල්හි සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන ලෝභ මූල සෞමනස්‍ය සිත් සතරෙන් එකක් ජවන් වශයෙන් උපදී. එය ගරුකොට ඇලුම් කරන කල්හි රාග ප්‍රධාන ලෝභ මූල සිත් අටෙන් එකක්ද, වරදවා ගන්නා කල්හි ලෝභ මූල දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරෙන් එකක්ද ජවන් වශයෙන් උපදී. එකල්හි

රාගය ප්‍රධාන ලොභ මූල චිත්තය ගරුකොට අරමුණු කරමින් උපදනා ලොභමූල අකුසල ජවනයන්ට ඒ රාගය ප්‍රධාන ලොභමූල චිත්තය අධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අකුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යයෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. දිට්ඨිං ගරුංකත්වා අස්සාදෙති අභිනන්දති, තං ගරුංකත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(දිට්ඨිය ප්‍රධාන ලොභමූල චිත්තය ගරුකොට ආස්වාදනය කරන කල්හිද, සතුටුවන කල්හිද, දිට්ඨිය ගරුකොට අරමුණු කරමින් රාගය උපදියි, දිට්ඨිය උපදියි.)

මෙයද යට දක්වනලද අනුවාදය මෙන් දතයුතු.

**සහජාතාධිපති**

**අකුසලාධිපති සම්පයුත්තකානං ඛන්ධානං අධිපති පච්චයෙන පච්චයො.**

(අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ අකුසල් සිත්හි යෙදෙන ඡන්ද, චිත්ත, විරිය යන අධිපති තුනෙන් එකක් එම චිත්තක්ෂණයෙහි වූ සම්ප්‍රයුක්තස්කන්ධයන්ට සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි ප්‍රත්‍යය ධර්ම වශයෙන් ගතයුත්තේ අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ලොභ මූල සිත් අටය, ද්වෙෂ මූල සිත් දෙකය, විචිකිච්ඡාව හැර චෛතසික සවිස්සය යන මොවුන්ගේ එක් එක් චිත්තක්ෂණයක ලැබෙන අධිපති ධර්ම තුනෙන් එකෙකි. ප්‍රත්‍යොත්පන්න වශයෙන් අධිපති වන ධර්මයෙන් අන්‍ය වූ සම්ප්‍රයුක්ත ධර්මයෝ ලැබෙත්.

6. විපිය—

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො සහජාතාධිපති.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාතාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අව්‍යාකෘත ධර්මයන්ට සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වන අකුසල ධර්මය නම්, පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලොභ මූල සිත් අටය, ද්වෙෂ මූල සිත් දෙකය. විචිකිච්ඡාව හැර චෛතසික සවිස්සය යන මොවුන්ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති ඡන්ද, චිත්ත, විරිය යන අධිපති ධර්ම තුනෙන් එක් ධර්මයෙකි.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් සාධිපති චිත්තජ රූපයෝ ලැබෙත්.

මෙහි අනුවාදය වශයෙන්—

**අකුසලාධිපති චිත්තසමුට්ඨානානං රූපානං අධිපති පච්චයෙන පච්චයො.**

(අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ අකුසල චිත්තයන්හි ඇති ඡන්ද, චිත්ත, විරිය යන මොවුන්ගේ අධිපතිවන එක් ධර්මයක් චිත්ත සමුට්ඨාන රූපයනට සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙය ද "අකුසල ධර්මය චිත්තසමුට්ඨාන රූපය නම් වූ අව්‍යාකෘත ධර්මයට සහජාතාධිපති ප්‍රත්‍යයෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**7. වීථිය—**

**අකුසලො ධම්මො අකුසලස්ස ච, අබ්‍යාකතස්ස ච ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො සහජාතාධිපති.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට හා අව්‍යාකෘත ධර්මයට ද සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි ප්‍රත්‍යය ධර්ම වශයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ ලොභ මූල සිත් අටය, ද්වෙෂ මූල සිත් දෙකය, චෛතසික සවිස්සය යන මොවුන්ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අධිපති ධර්ම තුනෙන් එක එකක් වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ.

ප්‍රත්‍යොත්පන්න ධර්ම වශයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන් හා සාධිපති චිත්තජ රූපයෝ ලැබෙත්.

මෙහි අනුවාදය වශයෙන්—

**අකුසලාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානංච රූපානං අධිපති පච්චයෙන පච්චයො.**

(අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ අකුසල චිත්තයන්හි ඇති ඡන්ද, චිත්ත, විරිය යන මොවුන් ගේ අධිපති වන එක් ධර්මයක් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තසමුට්ඨාන රූපයන්ට ද සහජාතාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මේ අධිපති ධර්මය සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වීම "අකුසල ධර්මය අකුසල ධර්මයට හා අව්‍යාකෘත ධර්මයට ද සහජාතාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

8. **විපිය**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො ආරම්මණාධිපති, සහජාතාධිපති.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණාධිපති සහජාතාධිපති යන අධිපතිප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

මෙහි ප්‍රත්‍යය ධර්ම වශයෙන - **ආරම්මණාධිපතියෙහි**

ගරුකොට අරමුණු කරන මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත චිත්තයන්ට ප්‍රත්‍යය වන ගරු කළයුතු අග්‍රී ඵලය හා නිර්වාණය;

ගරුකොට අරමුණු කරන ඵල සිත් සතරට ප්‍රත්‍යය වන නිර්වාණය - යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්.

**ප්‍රත්‍යොත්පන්න ධර්ම වශයෙන්**

මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරය,
ඵල සිත් සතරය,
චෛතසික සතිසය

යන ප්‍රත්‍යොත්පන්න ධර්මයෝ ලැබෙත්.

**සහජාතාධිපතියෙහි ප්‍රත්‍යය ධර්ම වශයෙන්—**

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි

මහා ක්‍රියා අටය,

මහද්ගත ක්‍රියා නවය,

ඵල සිත් සතරය.

චෛතසික අටතිසය

යන මොවුන්ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අධිපති ධර්ම තුන සතර අතුරෙන් එක එකක් වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ

**ප්‍රත්‍යොත්පන්න ධර්ම වශයෙන්**

සම්ප්‍රයුක්තස්කන්ධයන් හා

සාධිපති චිත්තජ රූපයෝ ද ලැබෙත්.

මෙහි අනුවාද වශයෙන්—

**ආරම්මණාධිපති—**

**1. අරහා ඵලං ගරුංකත්වා පච්චවෙක්ඛති.**

(රහතන් වහන්සේ අතීත් ඵල සිත ගරුකොට ප්‍රත්‍යවෙක්ෂා කරන සේක.)

අතීත් මාර්ග ඵලයන්ට පැමිණි රහතන් වහන්සේ අතීත් ඵල සිත ගරුකොට ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡෙදයන්ට අනතුරුව අතීත් ඵල සිත ගරුකොට අරමුණු කරමින් මනොවාරාවජ්ජනයද, ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතරෙන් එකක් ජවන කෘත්‍යයෙන් සත්වරක් ද ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. මෙහිදී ප්‍රත්‍යවෙක්ෂා කරන මහා ක්‍රියා ජවනයන්ට අතීත් ඵල සිත අධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. අරහා නිබ්බානං ගරුං කත්වා පච්චවෙක්ඛති.**

(රහතන් වහන්සේ නිර්වාණය ගරුකොට ප්‍රත්‍යවෙක්ෂා කරන සේක.

මෙහිදී රහතන් වහන්සේ නිර්වාණය ගරුකොට ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි උපදනා මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත ජවනයන්ට නිර්වාණය අධිපති ශක්තියෙන් ප්‍රත්‍යවීම "අව්‍යාකෘත ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**3. නිබ්බානං ඵලස්ස අධිපති පච්චයෙන පච්චයො**

(නිර්වාණය ඵල සිතට ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යවේ.)

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන ඵලසිත් සතර අව්‍යාකෘත ධර්මයෝයි. ඒ ඵලසිත් විසින් අරමුණු කරනු ලබන්නේ නිර්වාණය යි. එහෙයින් නිර්වාණය ලෝකොත්තරඵල සිතට ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යවීම "අව්‍යාකෘත ධර්මය, අව්‍යාකෘත ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**සහජාතාධිපති,**

**4. විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා අධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානංච රූපානං අධිපති පච්චයෙන පච්චයො.**

(විපාකව්‍යාකෘත කිරියාව්‍යාකෘත ධර්මයන් අතුරෙන් අධිපති ප්‍රත්‍යය වන ධර්මය සම්ප්‍රයුක්ත සකන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද සහජාතාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහා ක්‍රියා සිත් අටය, නියමයෙන් අධිපති ලැබෙන මහද්ගත ක්‍රියා සිත් නවය, ඵලසිත් සතරය යන මොවුන්ගේ එක් එක්

චිත්තක්ෂණයක ඇති අධිපතිධර්ම තුන හා හතර අතුරෙන් එක එකක් වූ අධිපති ධර්මය, අධිපති වන ධර්මයෙන් අන්‍ය වූ සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ද සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාතාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**9. විපිය—**

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො ආරම්මණාධිපති.**

(අව්‍යාකෘත ධර්ය කුසල ධර්මයට ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි ආරම්මණාධිපති ප්‍රත්‍යය වන අව්‍යාකෘත ධර්මයෝ නම්:

ගරුකොට අරමුණු කරන මහ කුසල ඥාන සම්ප්‍රයුක්ත චිත්තයන්ට ප්‍රත්‍යය වන,

සෝවාන් ඵලසිත
සකෘදාගාමි ඵලසිත
අනාගාමි ඵලසිත සහ
නිර්වාණය,

මාර්ග සිත් සතරට ප්‍රත්‍යය වන නිර්වාණය යන ධර්මයෝයි

ප්‍රත්‍යයෝත්පන්න ධර්ම වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම් මහා කුසල ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරය, මාර්ග සිත් සතරය යන ධර්මයෝයි.

මෙහිදී එක්වර ලැබෙන **ආරම්මණ, ආරම්මණාධිපති, ප්‍රත්‍යය** ශක්තියම ලැබේ.

මෙහි **අනුවාද** වශයෙන්—

**1. සෙක්ඛා ඵලං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

(සෝවාන් සකෘදාගාමි, අනාගාමි යන ආර්‍ය පුද්ගලයෝ තම තමන්ගේ ඵලසිත ගරුකොට ප්‍රත්‍යවෙක්ෂා කරත්.)

සෝවාන් ආයඩී පුද්ගලතෙම සෝවාන් ඵලසිත ගරු කොට ප්‍රත්‍යවෙක්‍ෂා කරන කල්හි භවාඞ්ගචලන, භවාඞ්ගු පච්ඡේදයන්ට අනතුරුව සෝවාන් ඵලසිත ගරුකොට අරමුණු කරමින් මනොවාරාවජ්ජනයද, මහා කුසල ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරෙන් එකක් ජවනකෘත්‍යයෙන් සත්වරක්ද ඉපිද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. මෙහිදී සෝවාන් ඵලය ගරුකොට අරමුණු කරන ඥාන සම්ප්‍රයුක්ත කුසල ජවනයන්ට සෝවාන් ඵලසිත ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි ලැබේ.

මෙපරිද්දෙන්ම සකෘදාගාමි පුද්ගලතෙමේද, අනාගාමි පුද්ගලතෙමේද තම තමන්ගේ ඵලසිත ප්‍රත්‍යවෙක්‍ෂා කරන කල්හි උපදනා ඥානසම්ප්‍රයුක්ත මහා කුසල ජවනයන්ට තම තමන්ගේ ඵලසිත අධිපති ශක්තියෙන් ප්‍රත්‍යවීම අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2 සෙක්ඛා නිබ්බානං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

(සෝවාන්, සකෘදාගාමි, අනාගාමි යන ශෛක්‍ෂයන් වහන්සේලා නිර්වාණය ගරුකොට ප්‍රත්‍යවෙක්‍ෂා කරත්.)

ශෛක්‍ෂයන් වහන්සේලා නිර්වාණය ගරුකොට ප්‍රත්‍යය වෙක්‍ෂා කරන කල්හි එම චිත්ත වීථියෙහි උපදනා ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල ජවනයන්ට නිර්වාණය අධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**3. නිබ්බානං ගොත්‍රභුස්ස අධිපති පච්චයෙන පච්චයො.**

(නිර්වාණය ගොත්‍රභූ සිතට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**4. නිබ්බානං මග්ගස්ස අධිපති පච්චයෙන පච්චයො.**

(නිර්වාණය මාර්ග චිත්තයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

සොවාන් මාර්ග සිත උපදනා චිත්තවීථියෙහි මාර්ග සිතට පූර්වයෙහි උපදනා ගෝත්‍රභූ සිත විසින් අරමුණු කරනු ලබන්නේ නිර්වාණයයි. එසේම සකෘදාගාමි අනාගාමි අර්හත් යන මාර්ග චිත්තයන්ට පූර්වයෙහි උපදනා වොදාන සිතද නිවණ අරමුණු කරමින් උපදී. සෝවාන් සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මාර්ග චිත්තයන් විසින්ද අරමුණු කරනු ලබන්නේ නිර්වාණයයි. මෙසේ ගොත්‍රභූ වොදාන, මාර්ග යන චිත්තයන් විසින් නිවණ ගරුකොට අරමුණු කරනු ලබන කල්හි ඒ කාමාවචර ලොකොත්තර චිත්තයන්ට නිර්වාණය ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යවීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**10. විභංගය—**

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස අධිපති පච්චයෙන පච්චයො—ආරම්මණාධිපති.**

(අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

ගරුකොට අරමුණු කරන ලොභ මූල සිත් අටට ප්‍රත්‍යය වන ඉෂට නිෂ්පන්න රූප අටොළොසය,

දුක්ඛ සහගත කාය විඥානය හැර ලෞකික විපාක සිත් එක්තිසය,

ක්‍රියා සිත් විස්සය,

චෛතසික පන්තිසය

යන ප්‍රත්‍යය ධර්මයෝයි.

ප්‍රත්‍යයොත්පන්න වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

ලොභ මූල සිත් අටය,
චෛතසික දෙවිස්සය,

මෙහි අනුවාද වශයෙන්—

**1. චක්ඛුං ගරුංකත්වා අස්සාදෙති, අභිනන්‍දති, තං ගරුංකත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(ගරු කළයුතු වූ ඉෂ්ට චක්ෂුප්‍රසාදය ගරුකොට අස්වාදනය කරන ලොභ මූල සොමනස්ස සහගත සිත් සතරටද, ගරු කොට අභිනන්‍දනය කරන හෙවත් සතුටුවීම් වශයෙන් අරමුණු කරන සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන ලොභ මූල සොමනස්ස සහගත සිත් සතරටද, එය ගරුකොට අරමුණු කරමින් රාගය උපදනා කල්හි රාග ප්‍රධාන ලොභ මූල සිත් අටටද, එය වරදවා ගැනීමේදී දිට්ඨිය උපදනා කල්හි දිට්ඨිගත සම්ප්‍රයුක්ත ලොභ මූල සිත් සතරටද ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යයවීම,, අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**2. සොතං ගරුංකත්වා අස්සාදෙති, අභිනන්‍දති, තං ගරුංකත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(ගරු කළයුතු වූ සොතප්‍රසාදය ගරුකොට අස්වාදනය අභිනන්‍දනය කරන කල්හිද, එය අරමුණුකොට රාගය හා දිට්ඨිය උපදනා කල්හිද, සොතප්‍රසාද නම් වූ අව්‍යාකෘත ධර්මය අකුසල ජවනයන් වූ ලොභ මූල සිත් අටට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**3. ඝාණං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, වත්ථුං, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ ගරුං කත්වා අස්සාදෙති, අභිනන්‍දති, තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(ඝාණප්‍රසාදය, ජිව්හාප්‍රසාදය, කායප්‍රසාදය; රූප ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, හදයවස්තු රූපය, විපාකාව්‍යාකෘතස්කන්ධ, කිරියාව්‍යාකෘතස්කන්ධ යන මේය ගරු කොට ආස්වාදනය අභිනන්දනය කරන කල්හිද, එය ගරුකොට අරමුණු කිරීමේදී රාගය, දිට්ඨිය උපදනා කල්හිද, ලෝභ මූල සිත් අටට ඒ ඝාණප්‍රසාදදී වූ අව්‍යාකෘත ධර්මයන් ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

## 4. අනන්තර ප්‍රත්‍යය

ප්‍රත්‍යෝත්පන්න ධර්මය තමාගෙන් වෙන්කරන අන්තර් ධර්මයක් ඇතිනොවන ලෙස උපකාරකවන ධර්මය **අනන්තර ප්‍රත්‍යය** නම් වේ. චිත්ත පරම්පරාව නොසිඳෙන පරිද්දෙන් ක්‍රමානුකූලව පසු පසු චිත්තයන්ගේ උත්පත්තියට පූර්ව පූර්වවූ චිත්තය උපකාර වේ. චිත්ත නියාමය අනුව ක්‍රමානුකූලව ඒ ඒ ක්‍රියා සිදුකළ හැකි ලෙස චිත්ත සන්තතිය ඇති නුවූවහොත් අන්‍යෝන්‍ය සම්බන්ධය නැතිවීමෙන් කිසිදු ක්‍රියාවක් කිරීමට අසමත් වේ. එවැනි තත්ත්වයක් වළක්වා අන්‍යෝන්‍ය සම්බන්ධය ඇතිකොට ක්‍රමානුකූලව චිත්ත පරම්පරාව ඇතිවන්නේ පූර්ව පූර්ව චිත්තයාගේ විශෙෂ ශක්තියක් නිසාය. ඒ ශක්ති විශෙෂයට අනන්තර ප්‍රත්‍යය යයි කියනු ලැබේ. එබැවින් රහතන් වහන්සේගේ චුති චිත්තය හැර අන්‍යවූ හැම සිතක්ම නිරුද්ධවන කල්හි ඒ නිරුද්ධවන සිතට අනතුරුව තැනට සුදුසුවූ සිත, පූර්ව චිත්තය නිරුද්ධවනු සමගම පූර්ව චිත්තයාගේ ස්ථානය ගනිමින් පූර්ව චිත්තය හා ඒකත්වයට පැමිණෙන්නාක් මෙන් උපදී. චිත්ත වීථියක් ගෙන පරීක්ෂාකර බැලීමේදී මේ අනන්තර ප්‍රත්‍යයවීමේ පිළිවෙල අවබෝධ කරගත හැකි වේ.

චක්ඛුද්වාරික චිත්ත වීථියක පිළිවෙළින් අතීත භවාඞ්ග, භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේද, පඤ්චද්වාරාවජ්ජන, චක්ඛු විඤ්ඤාන, සම්පටිච්ඡන, සන්තීරණ, වොට්ඨපන, ජවන, තදා-රම්මණ යන සිත් ඉපිද භවාඞ්ගය වේ භවාඞ්ග සිතක් ඇති නූවූයේ නම් භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේදයක් ඇතිවීමට නුපුළුවන. එසේම භවාඞ්ගුපච්ඡේදයක් ඇතිවීම නිසා පඤ්චද්වාරාවජ්ජනයද, පඤ්චද්වාරාවජ්ජනය සාලින් උපන් නිසා චක්ඛුවිඤ්ඤාණයද උපදී. චක්ඛුවිඤ්ඤාණයක් නූපදීත්තේ නම් සම්පටිච්ඡන සිතක් නූපදී. සම්පටිච්ඡන සිත නූපදින්නේ නම් සන්තීරණ සිත නූපදී. සන්තීරණ චිත්තය නූපදින්නේ නම් වොට්ඨපන සිත නූපදී. වොට්ඨපන සිත නූපදින්නේ නම් ජවනයෝ නූපදී. ජවන් සිත් නූපදින්නේ නම් තදාරම්ම-ණයෝ නූපදිත් මෙසේ පූර්ව පූර්ව චිත්තය පසු පසු චිත්තය පහළවීමට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මේ අනන්තර ප්‍රත්‍යය නාම ධර්මයන්ට පමණක් සීමා වූවකි. නිරොධ සමාපත්තියට සමවදනා පුද්ගලයාගේ අන්තිම චිත්තය වූ නෛවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තය, නිරොධ සමාපත්තියෙන් නැගිටිනා අවස්ථාවෙහි ඇතිවන පළමුවන චිත්තයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. එපරිද්දෙන්ම දෙවන ජාතියෙහි අසංඥ භවයෙහි උපදනා පුද්ගලයාගේ චුති චිත්තය, මහා කල්ප පන්සියයකින් පසු අසංඥ භවයෙන් චුතව අන් භවයක ඇතිවන්නාවූ ප්‍රතිසන්ධි චිත්තයටද අනන්තර ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාර වේ. කාලයෙන් හෝ රූපයන්ගෙන් හෝ අනන්තර ප්‍රත්‍ය භාවයට බාධාවක් නම් නොවන්නේය.

**අනන්තර ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය.**

**අනන්තර ප්‍රත්‍යය** වන ධර්මයෝ නම්:

රහතන් වහන්සේගේ චුති චිත්තය හැර පූර්ව පූර්ව වූ එකූන්අනූ චිත්තය ය.

චෛතසික දෙපනසය.



Free Distribution www.aathaapi.org

**ප්‍රත්‍යොත්පන්න ධර්මයෝ** නම්:

රහතන් වහන්සේගේ චුති චිත්තය සහිතවූ පශ්චිම පශ්චිම වූ එකුන් අනූ චිත්තය.

චෛතසික දෙපනසය.

අනන්තර ප්‍රත්‍යයාගේ **ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්:

චිත්තජ රූපයෝ ය,

ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය,

බාහිර රූපයෝය,

ආහාරජ රූපයෝය,

ඍතුජ රූපයෝය,

අසංඥසත්ත්ව කර්මජ රූපයෝය,

යන රූප ධර්මයෝ ය.

අනන්තර ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනාවාර හෙවත් වීථි සතකි.

**1. වීථිය—**

(**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

කුසල ධර්මය කුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

කුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

අන්තිම ජවනය හැර පූර්ව පූර්ව ලෞකික කුසල් සතළොසය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්:

ප්‍රථම ජවනය හැර පශ්චිම පශ්චිම කුසල් සිත් එක් විස්සය.

කුසල් ජවන් උපදනා චිත්ත වීථියෙහි ප්‍රථම කුසල ජවනය දෙවන ජවනයටද, දෙවන ජවනය තුන්වන

ජවනයටද, තුන්වන ජවනය සතරවන ජවනයටද, සතර වන ජවනය පස්වන ජවනයටද, පස්වන ජවනය සවෙනි ජවනයටද, සවෙනි ජවනය සත්වන ජවනයටද අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

සෞමනස්‍ය සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් දෙක, ධ්‍යාන අර්පණා චිත්ත වීථියෙහි මහග්ගත සෞමනස්‍ය සහගත ප්‍රථම ධ්‍යාන, ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන යන ධ්‍යාන සිත් සතරට පූර්ව වූ ගෝත්‍රභූ චිත්තය වශයෙන් ද, සෝවාන් මාර්ග සිත උපදනා කල්හි ඒ සෝවාන් මග සිතට පූර්වයෙහි උපදින ගෝත්‍රභූ චිත්තය වශයෙන් ද අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. එසේම එම සෞමනස්‍ය ඥානසම්ප්‍රයුක්ත මහා කුසල් සිත් දෙක වොදාන චිත්තය වශයෙන් සකෘදාගාමි මාර්ග, අනාගාමි මාර්ග, අර්හත් මාර්ග යන සිත් තුනට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

උපෙක්ඛා සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් දෙක, ගෝත්‍රභූ චිත්තය වශයෙන්, රූපාවචර පඤ්චමධ්‍යාන චිත්තයට සහ අරූපාවචර සිත් සතරටය යන උපෙක්ඛා සහගත සිත් පසට ද, ඒ කුසල් සිත් දෙකම ගෝත්‍රභූ වොදාන භාවයෙන් උපෙක්ඛා සහගත පඤ්චමධ්‍යාන මාර්ග සිත් සතරටද අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ

සමාපත්ති වීථීන්හි පශ්චිම පශ්චිම මහද්ගත කුසලයන්ට පූර්ව පූර්ව වූද සමාන වූද මහද්ගත කුසලයෝ අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

අනන්තර ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යෝත්පන්න ධර්ම වශයෙන් ලැබෙන ධර්මයෝ නම්:

මහා කුසල, දෙවන, තුන්වන, සතරවන, පස්වන, සවන, සත්වන ජවනයෝ ය.

මහද්ගත කුසල් නවය ය,

මාර්ග සිත් සතරය යන ධර්මයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසෙවන, නත්‍ථි, විගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **අනන්තර** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්

**1. පුරිමා පුරිමා කුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං අනන්තර පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ කුසලස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ කුසල ස්කන්ධයන්ට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

මෙහි පශ්චිම පශ්චිම කුසලස්කන්ධයන්ට අනන්තර ප්‍රත්‍යය වන **පූර්ව පූර්ව වූ කුසලස්කන්ධයෝ නම්:**

මහා කුසල විතියාදී ජවනයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව වූ මහා කුසල ජවනයෝය,

මහග්ගත කුසල සෞමනස්ස සහගත සිත් සතරට හා මාර්ග සෞමනස්ස සහගත සිත් සොළොසට ප්‍රත්‍යයවන ගොත්‍රභූ වොදාන කෘත්‍යවත් සෞමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් දෙකය,

මහග්ගත කුසල උපෙක්‍ෂා සහගත සිත් පසට හා මාර්ග උපෙක්‍ෂා සහගත සිත් සතරට ප්‍රත්‍යය වන ගොත්‍රභූ වොදාන කෘත්‍යයවත් උපෙක්‍ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත මහා කුසල් සිත් දෙකය,

සමාපත්ති වීථියෙහි පශ්චිම පශ්චිම මහද්ගත කුසලයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව මහද්ගත ජවනයෝය.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන පශ්චිම පශ්චිම වූ කුසල ස්කන්ධයෝ නම්:

මහද්ගත කුසල නවය,

මාර්ග සිත් සතරය යන ධර්මයෝය.

**2. අනුලොමං ගොත්‍රභුස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(අනුලෝම චිත්තය ගෝත්‍රභූ චිත්තයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

විදසුන් වඩා සම්පූර්ණකොට සෝවාන් මග උපදනා කල්හි, භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡේදයන්ට අනතුරුව සංස්කාර ධර්මයන් අරමුණු කරමින් මනොද්වාරාවජ්ජනයද, මහා කුසල ඥානසම්ප්‍රයුක්ත කුසල් සිතක් පරිකර්ම, උපචාර, අනුලොම වශයෙන් ඉපිද නිරුද්ධවූ පසු එම චිත්තයම නිර්වාණය අරමුණු කරමින් ගොත්‍රභූ චිත්තය වශයෙන් ඉපිද නිරුද්ධවේ. ඉක්බිතිව පිළිවෙළින් සෝවාන් මාර්ග චිත්තය හා ඵල සිත්ද ඉපිද භවාඞ්ගය වේ. මෙහිදී සංස්කාරාරම්මණිකව අනුලොම කෘත්‍යය සිද්ධ කරමින් උපදනා ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත, නිර්වාණා-රම්මණිකවූ ගොත්‍රභූ චිත්තයට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය කුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**3. අනුලොමං වොදානස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(අනුලොම සිත වොදාන සිතට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ )

සකෘදාගාමි, අනාගාමි, අර්හත් මාර්ගයට පූර්වයෙහි උපදනා වොදාන චිත්තය ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතරෙන් එකෙකි. වොදාන සිත නිර්වාණය අරමුණු කරයි ඒ වොදාන සිතට පූර්වයෙහි උපදනා අනුලොම සිතද, සංස්කාරයන් අරමුණු කොට ඇති ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත් සතරෙන් එකෙකි. පූර්වයෙහි උපදනා අනුලොම සිත පසුව උපදනා වොදාන සිතට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යයවීම, "කුසල ධර්මය කුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**4. ගොත්‍රභූ මග්ගස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(ගොත්‍රභූ චිත්තය සෝවාන් මාර්ග චිත්තයට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

සෝවාන් මාර්ගය උපදනා චිත්ත වීථියෙහි එයට පූර්වයෙහි උපදනා ගොත්‍රභූ ඥානයවත් කාමාවචර ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල් සිත, එයට අනතුරුව උපදනා ලෝකෝත්තර කුසල සෝවාන් මාර්ග සිතට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**5. වොදානං මග්ගස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(වොදාන සිත, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන මාර්ග චිත්තයට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

සකෘදාගාමි, අනාගාමි, අර්හත් මාර්ග චිත්තයන්ට පූර්වයෙහි නිර්වාණාරම්මණිකව උපදනා වොදාන සිත ඒ මාර්ගයන්ට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**2. විපාක—**

**කුසලා ධම්මා අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

මෙහි අව්‍යාකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **ප්‍රත්‍යය ධර්මයෝ** නම්:

සතොළොස් ලෞකික කුසලයන්ගේ අන්තිම ජවනයෝය, මාර්ග ජවන් සතරය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

සන්තීරණ සිත් තුනය,

මහා විපාක සිත් අටය,

මහද්ගත විපාක සිත් නවය,

ලෝකෝත්තර ඵල සිත් සතරය යන ධර්මයෝ යි

**විස්තර වශයෙන්** වනාහි අනන්තර ප්‍රත්‍යය ශක්තිය ඇති කුසල ධර්මයෝ නම්:

මහා කුසල ජවනය කෙරෙන් තදාරම්මණය වන කල්හි තදාරම්මණ එකොළොසය,

මහා කුසල ජවනය කෙරෙන් තදාරම්මණය නොවන කල්හි භවාඞ්ග එකුන් විස්සය.

යන මොවුන්ට ප්‍රත්‍යය වන **මහා කුසල් අන්තිම ජවනය,**

පඤ්චවොකාර ත්‍රිහෙතුක භවාඞ්ග නවයට ප්‍රත්‍යය වන **රූපාවචර කුසල අන්තිම ජවනය,**

පඤ්චවොකාර ත්‍රිහෙතුක භවාඞ්ග නවයට හා ආකාසානඤ්චායතන භවාඞ්ගයට ප්‍රත්‍යය වන **ආකාසානඤ්චායතන කුසල අන්තිම ජවනය,**

විඤ්ඤාණඤ්චායතන භවාඞ්ගයට ප්‍රත්‍යය වන **විඤ්ඤාණඤ්චායතන කුසල අන්තිම ජවනය,**

ආකිඤ්චඤ්ඤායතන භවාඞ්ගයට ප්‍රත්‍යය වන **ආකිඤ්චඤ්ඤායතන කුසල අන්තිම ජවනය,**

නෙවසඤ්ඤානාසඤ්ඤායතන භවාඞ්ගයට ප්‍රත්‍යය වන **නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල අන්තිම ජවනය,**

ත්‍රිහෙතුක භවාඞ්ග තෙළෙසට හා නිරෝධ සමාපත්තියෙන් නැගිට කල්හි අනාගාමි ඵල චිත්තයට ද ප්‍රත්‍යය වන **නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල අන්තිම ජවනය,**

සෝවාන් ඵලයට ප්‍රත්‍යය වන **සෝවාන් මාර්ග චිත්තය,**

සකෘදාගාමි ඵලයට ප්‍රත්‍යය වන **සකෘදාගාමි මාර්ග චිත්තය,**

අනාගාමි ඵලයට ප්‍රත්‍යය වන **අනාගාමි මාර්ග චිත්තය,**

අර්හත් ඵලයට ප්‍රත්‍යය වන **අර්හත් මාර්ග චිත්තය,**

යන මේකී කුසල ධර්මයෝ යි.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් යට දක්වනලද ලෞකික කුසල විපාක සිත් විස්ස සහ ලොකොත්තර ඵල සිත් සතරද ලැබෙත්.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන, **අනන්තර, සමනන්තර, උපනිස්සය, කම්ම, නත්‍ථි, විගත** යන ප්‍රත්‍යය ශක්ති සයෙන් **අනන්තර** ශක්ති විශෙෂය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්

**1. කුසලං වුට්ඨානස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(සතළොස් ලෞකික කුසලයන්ගේ අන්තිම ජවනය එයට අනතුරුව තදාරම්මණය උපදනා කල්හි ඒ තදාරම්මණයටද, භවාඞ්ගය උපදනා කල්හි භවාඞ්ගයටද අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි අනන්තර ප්‍රත්‍යය වන කුසල ධර්ම වශයෙන් සතළොස් ලෞකික කුසලයන්ගේ අන්තිම ජවනය ගතයුතු.

ප්‍රත්‍යොත්පන්න ධර්ම වශයෙන් ජවනයට අනතුරුව තදාරම්මණ උපදනා කල්හි තදාරම්මණ එකොළොසද,

තදාරම්මණ නොවන කල්හි භවාඞ්ග එකුන් විස්සද ගතයුතු.

මෙසේ සතලොස් ලෞකික කුසලයන්ගේ අන්තිම ජවනය අව්‍යාකෘත ධර්ම වූ තදාරම්මණ එකොළොස හා භවාඞ්ග එකුන් විස්සට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. මග්ගො ඵලස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(මාර්ග සිත් සතර ඵල සිත් සතරට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

සෝවාන් මාර්ග සිත එයට අනතුරුව උපදනා සෝවාන් ඵල සිතටද, එමෙන්ම සකෘදාගාමි මාර්ග සිත සකෘදාගාමි ඵල සිතටද, අනාගාමි මාර්ග සිත අනාගාමි ඵල සිතටද අර්හත් මාර්ග සිත අර්හත් ඵල සිතටද අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**3. අනුලොමං සෙක්ඛාය ඵල සමාපත්තියා අනන්තර පච්චයෙන පච්චයො.**

(සංස්කාර ධර්මයන් අරමුණු කරමින් අනුලොම කෘත්‍යයෙන් උපදනා මහා කුසල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ශෛක්‍ෂ පුද්ගලයාගේ ඵල සමාපත්තියට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ)

සෝවාන්, සකෘදාගාමි, අනාගාමි නම් වූ ආර්යයන් වහන්සේලා තම තමන්ගේ ඵලයට සමවදනා කල්හි, ඒ ඵල චිත්තයට පූර්වයෙහි උපදනා අනුලොම් සිත එයට අනතුරුව උපදනා ඵල චිත්තයට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**4. නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤා-යතන කුසලං ඵල සමාපත්තියා අනන්තර පච්චයෙන පච්චයො.**

(නිරෝධ සමාපත්තියෙන් නැගිත්තාවූ අනාගාමි පුද්ගලයාගේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලය, අනාගාමි ඵල සමාපත්තියට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

නිරෝධ සමාපත්තියට සමවදිනු හැකිවන්නේ අෂ්ට-සමාපත්තිලාභි අනාගාමි සහ අෂ්ටසමාපත්තිලාභි රහතන් වහන්සේට පමණය.

අෂ්ටසමාපත්තිලාභි අනාගාමි ආයර්‍යයන් වහන්සේ නිරෝධ සමාපත්තියට සමවදිනු කැමති කල්හි පිළිවෙලින් ප්‍රථම ධ්‍යානය පටන් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයන්ට සමවැද එයින් නැගිට පූර්ව කෘත්‍යයන් කොට අවසාන යෙහි භවාඞ්ග චලන භවාංගුපච්ඡේදයන් ඉපිද නිරුද්ධවූ පසු, අකිඤ්චඤ්ඤායතන කුසලය අරමුණු කොට මනො-ද්වාරාවජ්ජනය හා උපචාර අනුලෝම, වොදාන කෘත්‍යවත් කාමාවචර ඥානසම්ප්‍රයුක්ත මහ කුසල උපෙක්ඛා සහගත චිත්තය ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව නෙවසඤ්ඤා-නාසඤ්ඤායතන කුසල චිත්තය දෙවරක් ඉපිද නිරුද්ධ වූ පසු චිත්ත සන්තතිය බිඳීයාමෙන් නිරෝධ සමාපත්තියට සමවැදුනේ වේ. එතැන් සිට චිත්තයන්ගේ හා චිත්තජ රූපයන්ගේ ඉපැදීමක් නැත. අධිෂ්ඨානය කළ පරිදි නිරෝධ සමාපත්තියට සමවැද එයින් නැගීමේ දී අනාගාමි ඵල සිත එක් වරක් ඉපිද නිරුද්ධවීමෙන් පසු භවාඞ්ගය වේ. නිරෝධ සමාපත්තියට සමවැදීමේදී අවසාන වශයෙන් ඇතිවූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිතටත් එයින් නැගීමේදී පළමුකොට ඇතිවන අනාගාමි ඵලසිතටත් අතර කාලයේදී චිත්තයන්ගේ ඉපදීමක් නැති හෙයින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලය නිරෝධ සමාපත්ති යෙන් නැගීමේ දී ඇතිවන අනාගාමි ඵල සිතට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ යයි කියනු ලැබේ.

3. විපාක

අකුසලා ධම්මා අකුසලස්ස ධම්මස්ස අනන්තර පච්චයෙන පච්චයො,

(අකුසල ධර්මය අකුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අකුසල ධර්මයට **අනන්තර ප්‍රත්‍යය** ශක්තියෙන් උපකාර වන අකුසල ධර්මයෝ නම්—

අන්තිම ජවනය හැර පූර්ව පූර්ව වූ දොළොස් අකුසල ජවනයෝය.

**ප්‍රත්‍යාඛ්‍යාපනක** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

ප්‍රථම ජවනය හැර පශ්චිම පශ්චිම වූ දොළොස් අකුසල ජවනයෝයි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **අනන්තර, සමනන්තර ආසේවන, නත්ථි, විගත** යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් **අනන්තර** ශක්ති විශෙෂය ලැබේ.

මේ විථියට අනුවාද වශයෙන්

**පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ අකුසල ස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ අකුසල ස්කන්ධයන්ට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

දොළොස් අකුසල චිත්තයන් අතුරෙන් යම් අකුසල් සිතක් ජවනකෘත්‍යයෙන් උපදනා කල්හි පළමු අකුසල ජවනය, දෙවන අකුසල ජවනයට ද, දෙවන ජවනය තුන්වන ජවනයටද, තුන්වන ජවනය සතරවන ජවනයටද, සතර වන ජවනය පස්වන ජවනයට ද, පස්වන ජවනය සවෙනි ජවනයට ද, සවෙනි ජවනය සත්වන ජවනයට ද අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. මෙය "අකුසල ධර්මය අකුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

### 4. විපිය

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට **අනන්තර ප්‍රත්‍යය** ශක්තියෙන් උපකාර වේ.

මෙහි දී අව්‍යාකෘත ධර්මයට **අනන්තර ප්‍රත්‍යය** ශක්ති-යෙන් උපකාර වන අකුසල ධර්මයෝ නම්—

දෙලොස් අකුසලයන්ගේ අන්තිම ජවනයෝය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

සන්තීරණ තුනය
මහා විපාක අටය
මහද්ගත විපාක නවය
යන විපාක චිත්තයෝ ය.

මෙහි අනුවාදය වශයෙන්

**අකුසලං වුට්ඨානස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(දෙලොස් අකුසලයන්ගේ අන්තිම ජවනය, එයට අනතුරුව උපදනා තදාරම්මණයට හෝ භවාඞ්ගයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

ලොභමූල මොහමූල ජවනයන් කෙරෙන් තදාරම්මණය වන කල්හි අන්තිම ජවනය, තදාරම්මණ එකොළොසට ද,

තදාරම්මණය නොවන කල්හි අන්තිම ජවනය භවාඞ්ග එකුන් විස්සට ද,

දෙසමූල ජවනය කෙරෙන් තදාරම්මණය වන කල්හි අන්තිම ජවනය උපෙක්ෂා තදාරම්මණ පසට ද,

තදාරම්මණ නොවන කල්හි කාම උපෙක්ෂා භවාඞ්ග සයටද අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**5. වීථිය.**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහිදී අව්‍යාකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **ප්‍රත්‍යය ධර්මයෝ නම්.**

අතීත් චුති චිත්තය හැර පූර්ව පූර්ව වූ විපාක සිත් සතිස හා ක්‍රියා සිත් විස්සය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

අතීත් චුති චිත්තය සහිතවූ පශ්චිම පශ්චිම වූ විපාක සිත් සතිස හා ක්‍රියා සිත් විස්සය.

මෙහිදී සුදුසු පරිදි එක්වර ලැබෙන **අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසේවන, නත්‍ථි, විගත** යන ප්‍රත්‍යය ශක්ති සයෙන් **අනන්තර** ශක්තිය ලැබේ.

විස්තර වශයෙන් ප්‍රත්‍යයවීම මෙසේ යි—

| **අනන්තර ප්‍රත්‍යය ධර්ම** | | **අනන්තර ප්‍රත්‍යයොත්පන්න ධර්ම** |
|---|---|---|
| ප්‍රතිසන්ධි නාමස්කන්ධ | — | ප්‍රථම භවාඞ්ග නාමස්කන්ධ |
| ප්‍රථමාදී පූර්ව පූර්ව භවාඞ්ග නාමස්කන්ධ | } | ද්විතීයාදී පශ්චිම භවාඞ්ග නාමස්කන්ධ |
| පඤ්චවොකාර භවාඞ්ගුපච්ඡේද 15 | } | ආවජ්ජනාවය 2 |
| අරූප භවාංගුපච්ඡේද 4 | — | මනොද්වාරාවජ්ජනය |
| පඤ්චද්වාරාවජ්ජනය | — | පඤ්ච විඥානයෝ |
| සම්පටිච්ඡනයෝ | — | සන්තීරණයෝ |
| සන්තීරණයෝ | — | ව්‍යවස්ථාපනය |

| | | |
|---|---|---|
| ප්‍රථම ව්‍යවස්ථාපනය | } | පරිත්තාරම්මණ වීථියෙහි ද්විතීය ව්‍යවස්ථාපනය |
| ද්විතීය ව්‍යවස්ථාපනය | | පඤ්චවොකාර භවාඞ්ග 15 |
| ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජනයෝ | } | අති මහන්තාරම්මණ, විභූතාරම්මණ, අවිභූතාරම්මණ වීථින්හි හසිතොත්පාද මහා ක්‍රියා ප්‍රථම ජවනයෝ |
| ප්‍රථම ක්‍රියා ජවනය | — | එම ද්විතීය ක්‍රියා ජවනය |
| ද්විතීය ක්‍රියා ජවනය | — | තෘතීය ක්‍රියා ජවනය |
| තෘතීය ක්‍රියා ජවනය | — | චතුර්ථ ක්‍රියා ජවනය |
| චතුර්ථ ක්‍රියා ජවනය | — | පඤ්චම ක්‍රියා ජවනය |
| පඤ්චම ක්‍රියා ජවනය | — | ෂෂ්ඨ ක්‍රියා ජවනය |
| ෂෂ්ඨ ක්‍රියා ජවනය | — | සප්තම ක්‍රියා ජවනය |
| හසිතොත්පාද අන්තිම ජවනය | } | හසිතොත්පාදය කෙරෙන් තදාරම්මණය වන කල්හි සොමනස්ස තදාරම්මණ 5<br>නොවන කල්හි පඤ්චවොකාර ත්‍රිහේතුක භවාඞ්ග 9 |
| සොමනස්ස සහගත මහා ක්‍රියා අන්තිම ජවනය | } | මහා ක්‍රියා සොමනස්ස ජවනයන් කෙරෙන් තදාරම්මණය වන කල්හි සොමනස්ස තදාරම්මණ 5<br>නොවන කල්හි ත්‍රිහේතුක භවාඞ්ග 13 |
| උපෙක්ෂා සහගත මහා ක්‍රියා අන්තිම ජවනය | } | මහා ක්‍රියා උපෙක්ෂා සහගත ජවනය කෙරෙන් තදාරම්මණය වන කල්හි උපෙක්ෂා තදාරම්මණ 6<br>නොවන කල්හි ත්‍රිහේතුක භවාඞ්ග 13 |
| ප්‍රථම තදාරම්මණය | — | ද්විතීය තදාරම්මණය |
| ද්විතීය තදාරම්මණය | — | කාම භවාඞ්ග 10 |

| | |
|---|---|
| අනුලෝම කෘත්‍යවත් මහා ක්‍රියා ප්‍රථමවය 2 | මහද්ගත ක්‍රියා සෞමනස්ස සිත් 4<br>අගීත් ඵල සෞමනස්ස සිත් 4 |
| අනුලෝම කෘත්‍යවත් මහා ක්‍රියා තෘතියවය 2 | මහග්ගත ක්‍රියා උපෙක්ඛාසහගත සිත් 5<br>අගීත්ඵල උපෙක්ඛා සහගත සිත |
| සමාපජ්ජන වීථීන්හි පූර්ව පූර්ව මහද්ගත ක්‍රියා ජවනයෝ | සමාපජ්ජන වීථීන්හි පශ්චිම පශ්චිම මහද්ගත ක්‍රියා ජවනයෝ |
| රූපාවචර ක්‍රියා අන්තිම ජවනයෝ | පඤ්චවොකාර ත්‍රිහේතුක භවාඞ්ග 9 |
| ආකාසානඤ්චායතන ක්‍රියා අන්තිම ජවන | ආකාසානඤ්චායතන භවාංගය හා පඤ්චවොකාර ත්‍රිහේතුක භවාඞ්ග 9 |
| විඤ්ඤාණඤ්චායතන ක්‍රියා අන්තිම ජවනය | පඤ්චවොකාර ත්‍රිහේතුක භවාඞ්ග 9<br>විඤ්ඤාණඤ්චායතන භවාංගය |
| ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා අන්තිම ජවනය | පඤ්චවොකාර ත්‍රිහේතුක භවාඞ්ග 9<br>ආකිඤ්චඤ්ඤායතන භවාඞ්ගය |
| නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා අන්තිම ජවනය | ත්‍රිහෙතුක භවාඞ්ග තෙළෙස හා නිරොධ සමාපත්තියෙන් නගින අවස්ථාවෙහි අර්හත් ඵලය |
| පූර්වපූර්ව ඵලසිත් සතර | — පශ්චිම පශ්චිම ඵලසිත් සතර |
| අන්තිම ඵල ජවනයෝ | — ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙස |
| විතීය තදාරම්මණය | මරණාසන්නයෙහි තදාරම්මණ යට අනතුරුව චුතිය වන කල්හි කාම චුති සිත් දසය |

| | |
|---|---|
| මහා ක්‍රියා පඤ්චම ජවනය | ජවනයට අනතුරුව චුතිය වන කල්හි ත්‍රිහේතුක චුති තෙළෙස |
| භවාඞ්ග එකුන්විස්ස | භවාඞ්ගයට අනතුරුව චුතිය වන කල්හි චුති එකුන්විස්ස |

**ද්විහේතුක අහේතුක චුතීහු** — කාමප්‍රතිසන්ධි දසය (10)

කාමත්‍රිහේතුක චුතීහු සතර — ප්‍රතිසන්ධි එකුන්විස්ස (19)

| | |
|---|---|
| රූපාවචර චුති පස | සහේතුක ප්‍රතිසන්ධි සතළොස (17) |
| ආකාසානඤ්චායතන චුතිය | කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතර (4)<br>අරූප ප්‍රතිසන්ධි සතර (4) |
| විඤ්ඤාණඤ්චායතන චුතිය | කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතර (4)<br>උපරිම අරූපප්‍රතිසන්ධි (3) |
| ආකිඤ්චඤ්ඤායතන චුතිය | ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතර<br>ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධි දෙක (2) |
| නෙවසඤ්ඤානාසඤ්ඤායතන චුතිය | කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධීන් හා නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධිය |

මෙහි අනුවාද වශයෙන්-

**1. පුරිමා පුරිමා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං අනන්තර පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්වවූ විපාක ක්‍රියා අව්‍යාකෘත ස්කන්ධයෝ පශ්චිම පශ්චිමවූ විපාක ක්‍රියා අව්‍යාකෘත ස්කන්ධයන්ට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අතීත් චුතිචිත්තය හැර පූර්ව පූර්වවූ විපාක ක්‍රියා නාමස්කන්ධයෝ අතීත් චුතිය සහිතවූ පශ්චිමවූ විපාක ක්‍රියා නාමස්කන්ධයන්ට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යවීම 'අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. භවඞ්ගං ආවජ්ජනාය අනන්තර පච්චයෙන පච්චයො.**

(පඤ්චවොකාර භවාඞ්ගුපච්ඡේද එකුන්විස්ස ආවර්ජනා සිත් දෙකට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

පඤ්චවාරික විථිත්හි භවඞ්ගුපච්ඡේදය පඤ්චවාරාවජ්ජනයටද මනොවාරික විථිත්හි භවඞ්ගුපච්ඡේදය මනො-වාරාවජ්ජනයටද අරූප භවාඞ්ගුපච්ඡේද සතර මනොවාරා-වජ්ජනයටද, අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යයවීම" අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**3. කිරියං වුට්ඨානස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(ආවජ්ජනාවය හැර ඉතිරි ක්‍රියා සිත් අටළොසෙහි අන්තිම ජවනය හා ව්‍යවස්ථාපන චිත්තය තදාරම්මණ, භවාඞ්ගයන්ට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

හසිතොත්පාදය, මහා ක්‍රියා අටය, මහග්ගත ක්‍රියා නවය යන අටළොස් ක්‍රියා චිත්තයන්ගේ අන්තිම ජවනය එයට අනතුරුව ඇතිවන තදාරම්මණයට හෝ භවාඞ්ගයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. එසේම වොට්ඨපන චිත්තය එයට අනතුරුව භවාඞ්ගය වන කල්හි ද ඒ භවාඞ්ගයට ද අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. මෙයද "අව්‍යකෘත ධර්මය අව්‍යකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**4. අරහතො අනුලොමං ඵලසමාපත්තියා අනන්තර පච්චයෙන පච්චයො.**

(රහතන් වහන්සේගේ අනුලොම කෘත්‍යවත් මහා ක්‍රියා ප්‍රථම වන හා තෘතීයවන අර්හත් ඵල චිත්තයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

රහතන් වහන්සේ ඵලසමාපත්තියට සමවදින කල්හි මහාක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතර අනුලොම කෘත්‍යය යෙන් ඉපිද නිරුද්ධ වූ පසු අර්හත් ඵලසිත් උපදී. එකල්හි ඒ අනුලෝම සිත අර්හත් ඵල සිතට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**5. නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනං කිරියං ඵලසමාපත්තියා අනන්තර පච්චයෙන පච්චයො.**

(රහතන් වහන්සේ නිරොධ සමාපත්තියෙන් නැගීමේදී නෙවසඤ්ඤානාසඤ්ඤායතන අන්තිම ජවනය අර්හත් ඵල සිතට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

රහතන් වහන්සේ නිරොධ සමාපත්තියට සමවැදීමේ දී අන්තිම චිත්තය වශයෙන් ලැබෙන්නේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා ජවනයයි. අධිෂ්ඨානයෙන් පසු නිරොධ සමවතින් නැගීමේදී පළමුව ඇතිවන්නේ අර්හත් ඵල සිතයි. එබැවින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා ජවනය නිරොධ සමවතින් නැගීමේදී අර්හත් ඵල චිත්තයට අනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ. මෙසද "අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ

**6. වීථිය—**

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

කුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මය** නම්—

ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජන චිත්තයයි.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්ම නම්—

මහා කුසල ප්‍රථම ජවනයයි.

**මෙහිදී අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසෙවන, නත්‍ථි, විගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **අනන්තර** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්,

**ආවජ්ජනා කුසලානං ඛන්ධානං අනන්තර පච්චයෙන පච්චයො.**

(මනොද්වාරාවජ්ජන චිත්තය එයට අනතුරුව උපදින ප්‍රථම කුසල ජවනයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

කාමාවචර මහා කුසල් සිත් අටෙන් එකක් ජවන කෘත්‍යයෙන් උපදනා කල්හි එම චිත්තවීථියෙහි ප්‍රථම ජවනයට පෙර උපදනා ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජන චිත්තය ප්‍රථම මහා කුසල ජවනයට අනන්තර ශක්තියෙන් උපකාරවීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

7. **විථිය**—

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස අනන්තර පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අකුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මය** නම්—

ව්‍යවස්ථාපන මනොද්වාරවජ්ජනයයි.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මය නම් දෙළොස් අකුසලයන්ගේ ප්‍රථම ජවනයයි.

**මෙහිදී අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසෙවන, නත්‍ථි, විගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් අනන්තර ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්,

**ආවජ්ජනා අකුසලානං ඛන්ධානං අනන්තර පච්චයෙන පච්චයො**

(මනොවාරාවජ්ජනය එයට අනතුරුව උපදනා ප්‍රථම අකුසල ජවනයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

දෙළොස් අකුසල චිත්තයන් අතුරෙන් යම් සිතක් ජවන කෘත්‍යයෙන් උපදනා කල්හි, එයින් පළමු ජවනයට පූර්වයෙහි ඇතිවන ව්‍යවස්ථාපන මනොවාරාවජ්ජන සිත ඒ ප්‍රථම අකුසල ජවනයට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යවීම "අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට අනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ

## 5. සමනන්තර ප්‍රත්‍යය

මනාකොට, අන්තරයක් ඇතිවීමට අවකාශ නොදී, ප්‍රත්‍යය නිරුද්ධවීමෙන් පසු ඵලය ඇතිවීමට උපකාර වන ප්‍රත්‍යය ධර්මය **සමනන්තර ප්‍රත්‍යය** නම්. චිත්ත පරම්පරාව නොසිඳෙන පරිදි ක්‍රමානුකූලවම මනාකොට පශ්චිම පශ්චිම චිත්තයන්ගේ උත්පත්තියට උපකාර වන පූර්ව පූර්ව චිත්තය සමනන්තර ප්‍රත්‍යයයි. අනන්තර සමනන්තර ප්‍රත්‍යය දෙදෙනාගේ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ගේ කිසිදු වෙනසක් නැත. එහෙයින් සමනන්තර ප්‍රත්‍යය පිළිබඳ නිරාශිය අනන්තර ප්‍රත්‍යයෙහි දක්වන ලද පරිද්දෙන් දත යුතු.

අනන්තර ප්‍රත්‍යය මෙන් සමනන්තර ප්‍රත්‍යයාගේ ද විසර්ජිතාචාර හෙවත් වීථි සතකි.

1. වීථිය—

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

කුසල ධර්මය කුසල ධර්මයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාද වශයෙන්,

**1. පුරිමා පුරිමා කුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං සමනන්තර පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ කුසලස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ කුසල ස්කන්ධයන්ට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. අනුලොමං ගොත්‍රභුස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(අනුලෝම සිත ගොත්‍රභූ චිත්තයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. අනුලොමං වොදානස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(අනුලෝම සිත වොදාන චිත්තයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. ගොත්‍රභු මග්ගස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(ගොත්‍රභූ චිත්තය සෝවාන් මාර්ග සිතට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

**5. වොදානං මග්ගස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(වොදාන සිත සකෘදාගාමි, අනාගාමි, අර්හත් මාර්ග චිත්තයන්ට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

2. විපිය—

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාද වශයෙන්

**1. කුසලං වුට්ඨානස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(අන්තිම කුසල ජවනය, එයට අනතුරුව උපදනා තදාරම්මණයට හෝ භවාඞ්ගයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2 මග්ගො ඵලස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(මාර්ග සිත ඵල චිත්තයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3 අනුලොමං සෙක්ඛාය ඵල සමාපත්තියා සමනන්තර පච්චයෙන පච්චයො.**

(අනුලොම් සිත ශෛක්‍ෂයන් වහන්සේගේ ඵලචිත්තයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. නිරොධා වුට්ඨානස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනං කුසලං ඵලසමාපත්තියා සමනන්තර පච්චයෙන පච්චයො.**

(අෂ්ට සමාපත්තිලාභී අනාගාමි පුද්ගලයාගේ නිරොධ සමාපත්තියෙන් නැගීමේදී, නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිත අනාගාමි ඵලසිතට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

3. විපිය—

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාදය වශයෙන්,

**පුරිමා පුරිමා අකුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ඛන්ධානං සමනන්තර පච්චයෙන පච්චයො.**

පූර්‍ව පූර්‍ව වූ අකුසලස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ අකුසල ස්කන්ධයන්ට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

4 විපිය—

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**අකුසලං වුට්ඨානස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(අන්තිම අකුසල ජවනය එයට අනතුරුව උපදනා තදාරම්මණයට හෝ භවාඞ්ගයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

5. විපිය—

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාද වශයෙන්

1. පුරිමා පුරිමා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං සමනන්තර පච්චයෙන පච්චයො.

(පූර්ව පූර්ව වූ විපාක ක්‍රියා චිත්තයෝ පශ්චිම පශ්චිම වූ අකුසල ස්කන්ධයන්ට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

2. භවඞ්ගං ආවජ්ජනාය සමනන්තර පච්චයෙන පච්චයො

(භවාඞ්ගුපච්ඡේද චිත්තය ආවර්ජනා චිත්තවලට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

3. කිරියං වුට්ඨානස්ස සමනන්තර පච්චයෙන පච්චයො.

(අන්තිම ක්‍රියා ජවනය හා වොට්ඨපනය තදාරම්මණ භවාඞ්ගයන්ට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

4. අරහතො අනුලොමං ඵලසමාපත්තියා සමනන්තර පච්චයෙන පච්චයො.

(රහතන් වහන්සේගේ අනුලොම චිත්තය අර්හත් ඵල චිත්තයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

5. නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතන කිරියං ඵලසමාපත්තියා සමනන්තර පච්චයෙන පච්චයො.

(රහතන් වහන්සේ නිරොධ සමාපත්තියෙන් නැගීමේදී නෙවසඤ්ඤානාසඤ්ඤායතන අන්තිම ජවනය අර්හත් ඵල චිත්තයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

6. විපිය—

අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස සමනන්තර පච්චයෙන පච්චයො.

(අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට සමනන්තර ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාදය වශයෙන්;

**ආවජ්ජනා කුසලානං ඛන්ධානං සමනන්තර පච්චයෙන පච්චයො.**

(මනොද්වාරාවර්ජනය, එයට අනතුරුව උපදනා ප්‍රථම කුසල ජවනයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

7. **වීර්‍ය—**

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස සමනන්තර පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාදය වශයෙන්,

**ආවජ්ජනා අකුසලානං ඛන්ධානං සමනන්තර පච්චයෙන පච්චයො.**

(මනොද්වාරාවර්ජනය, එයට අනතුරුව උපදනා ප්‍රථම අකුසල ජවනයට සමනන්තර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මේ වීථින්හි විස්තරය අනන්තර ප්‍රත්‍යය විස්තරයට සමාන බැවින් එය බලා දතයුතු.

## 6. සහජාත ප්‍රත්‍යය

සියළුම නාම රූප ධර්මයෝ උපදනා කල්හි අන්‍ය ධර්මයන් හා එක්ව, සමූහ වශයෙන් මිස, හුදකලාව නූපදිති. එසේ සමූහ වශයෙන් උපදනා ධර්මයන් අතුරෙන් එක් එක් ධර්මයක් තමා හා උපදනා අන්‍ය ධර්මයන්ගේ ඉපදීමටද උපකාර වේ. මේ උපකාරක ශක්ති විශෙෂයට **සහජාත** ප්‍රත්‍ය ශක්තිය යයි කියනු ලැබේ. එබැවින් එක්ව ඉපදීම්

වශයෙන් අන්‍ය ධර්මයන්ගේ ඉපැද්මටද මේ සහජාත ප්‍රත්‍යය ශක්තිය උපකාර වේ. එක්ව උපදනා ධර්ම රාශියට අයත් සියළුම ධර්ම ඔවුනොවුන්ට සහජාත වශයෙන් ප්‍රත්‍යවන බව දතයුතු. සහජාත ප්‍රත්‍යයවන ආකාරය දැක්වීමේ පහසුව සඳහා අරූප ධර්ම සමූහය ස්කන්ධ වශයෙන් සතර කොටසකට බෙදා දක්වනු ලැබේ. එනම්: **වේදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධය** යන ස්කන්ධ සතරය. මෙයින් එක් ස්කන්ධයක් ඉතිරි ස්කන්ධ තුනටද, ඉතිරි ස්කන්ධ තුන ඒ එක් ස්කන්ධයටද, ස්කන්ධ දෙකක් ඉතිරි ස්කන්ධ දෙකටද, සහජාත ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.

පඤ්චවොකාර භූමියෙහි මේ නාමස්කන්ධයෝ උපදනා කල්හි එය හා සමගම චිත්තජ රූපයෝද උපදිති. එසේ උපදනා චිත්තජ රූපයනට ඒ නාමස්කන්ධයෝ සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වෙති. එබැවින් නාමස්කන්ධයෝ ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බව දතයුතු. එහෙයින් නාම ධර්ම රාශිය සහජාත ප්‍රත්‍යය හා ප්‍රත්‍යොත්පන්නද වෙති. චිත්තජ රූපයෝ ප්‍රත්‍යොත්පන්න පමණක් වෙති. තවද, රූප ධර්මයන් උපදනා කල්හි රූපකලාප වශයෙන් උපදී. එක් එක් රූප කලාපයක මහා භූතයෝ ඔවුනොවුන්ට හා උපාදා රූපයන්ටද සහජාත ශක්තියෙන් ප්‍රත්‍යය වෙති. මේ මහා භූතයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යොත්පන්න දෙකටම අයත් වෙති. උපාදාය රූපයෝ ප්‍රත්‍යොත්පන්න පමණක් වෙති. පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ඔවුනොවුන්ට හා හෘදයවස්තු රූපයෙන් අන්‍යවූ ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය වෙති. එබැවින් ඒ ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යොත්පන්න දෙකටම අයත් වෙති.

හෘදය වස්තුවෙන් අන්‍යවූ කර්මජ රූපයෝ ප්‍රත්‍යොත්-පන්න පමණක් වෙති. ප්‍රතිසන්ධි කර්මජ රූපයන් අතුරෙන් හෘදයවස්තු රූපය පමණක් නාමස්කන්ධයන්ටද සහජාත ශක්තියෙන් ප්‍රත්‍යය වෙති.

# සහජාත ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය

**සහජාත ප්‍රත්‍යයවන ධර්මයෝ නම්:**

ඔවුනොවුන්ට හා චිත්තජ රූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ටද ප්‍රත්‍යයවන සියලු එකුන් අනූ චිත්තය හා චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාම ස්කන්ධයෝය.

ඔවුනොවුන්ට හා උපාදාය රූපයන්ටද ප්‍රත්‍යයවන චිත්තජ, ප්‍රතිසන්ධි කර්මජ, බාහිර, ආහාරජ, ඍතුජ, අසංඥ සත්ත්ව කර්මජ රූපයන්ට අයත් සියලු මහා භූතයෝය.

පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යයවන හෘදයවස්තු රූපය,

හෘදයවස්තු රූපයට ප්‍රත්‍යය වන පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය යන ප්‍රත්‍යය ධර්මයෝයි.

**ප්‍රත්‍යයොත්පන්න වන ධර්මයෝ නම්:**

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන සියලු එකුන් අනූ චිත්තය හා චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය.

නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ රූප හා ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ යි.

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන සකල මහා භූතයෝය. මහාභූතයන්ගෙන් ප්‍රත්‍යය ලබන උපාදාය රූපයෝය.

හෘදයවස්තු රූපයෙන් ප්‍රත්‍යය ලබන පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තු රූපය යන ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝයි.

සියලුම චිත්ත චෛතසික රූපයෝම ප්‍රත්‍යයොත්පන්න-යන් වන බැවින් සහජාත ප්‍රත්‍යයට ප්‍රත්‍යනීක ධර්ම නැත.

**සහජාත ප්‍රත්‍යය** පිළිබඳ විසර්ජනා වාර හෙවත් විභ්ට තවයකි.

**1. විභිඞ—**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

කුසල ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

කුසල් සිත් එක්විස්සය (21)
චෛතසික අටතිසය (38)

යන අවයව නාමස්කන්ධය ප්‍රත්‍යය ධර්මයෝ යි.

**ප්‍රත්‍යයොත්පන්න වශයෙන්** ලැබෙන කුසල ධර්මයෝ නම්:

කුසල් සිත් එක්විස්සය (21)
චෛතසික අටතිසය (38)

යන අවයව නාමස්කන්ධවූ ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝ යි.

මෙහිදී **සහජාත, නිස්සය, අඤ්ඤමඤ්ඤ, සම්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **සහජාත** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්,

**1. එකො ධම්මො තිණ්ණන්නං ධම්මානං සහජාත පච්චයෙන පච්චයො.**

**(එක්විසි කුසල චිත්තයන් පිළිබඳ වූ සතර නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)**

කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන ධර්මයන්හි එක් චිත්තක්ෂණයක පහළවන්නාවූ වේදනා, සංඥා, සඞ්ඛාර, විඤ්ඤාණ යන සතර නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුන ඉපැද්මට සහජාත ශක්තියෙන් ප්‍රත්‍යයවීම" කුසල ධර්මය කුසල ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සහජාත පච්චයෙන පච්චයො.**

එක්විසි කුසල් සිත් පිළිබඳ වූ සතර නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි නාමස්කන්ධයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ද්වෙඛන්ධා ද්වින්නං ඛන්ධානං සහජාත පච්චයෙන පච්චයො.**

(එක්විසි කුසල් සිත් පිළිබඳ වූ සතර නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ කුසල චිත්තයන් පිළිබඳ වූ සතර නාමස්කන්ධ වෙන් වෙන් වශයෙන් එක් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනටද, සමූහ වශයෙන් ස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයටද, ස්කන්ධ දෙකක් ඉතිරි ස්කන්ධ දෙකට ද ඔවුනොවුන් ගේ ඉපදීමට සහජාත ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය කුසල ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. විපිය—**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයන්ට සහජාත ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක් විස්ස ය,

චෛතසික අටතිස ය,

යන අවයව වූද, සමූහ වූද, නාමස්කන්ධයෝ යි.

**ප්‍රත්‍යයෝත්පන්න ධර්ම** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ **නම්:**

කුසල චිත්ත සමුට්ඨාන වූ චිත්තජ රූපයෝ යි

මෙහිදී එක්වර ලැබෙන **සහජාත, නිස්සය සම්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් **සහජාත** ශක්තියම ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්,

**කුසලා ඛන්ධා චිත්ත සමුට්ඨානානං රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(කුසල් වූ, අවයව වූද, සමූහවූද නාමස්කන්ධයෝ සිතින් උපදවන්නා වූ රූපයන්ට හෙවත් චිත්තජ රූපයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය, යන නාමස්කන්ධයන් අතුරෙන් එක එකක් වූද, දෙක බැගින් වූද, තුන බැගින් වූද, සතරදෙනම වූ ද, නාමස්කන්ධයෝ චිත්තජ රූපයන්ට සහජාත ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**3. විධිය—**

**කුසලො ධම්මො කුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසලාව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසලාව්‍යාකෘත ධර්මයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ
කුසල් සිත් එක් විස්ස ය,
චෛතසික අටතිස ය,
යන අවයව නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන කුසලාව්‍යාකෘත ධර්මයෝ නම්:

කුසල් සිත් එක්විස්සය
චෛතසික අටතිසය
චිත්තජ රූපයෝය
යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ යි.

මෙහිදී එක්වර ලැබෙන **සහජාත, නිස්සය, අත්ථි, අවිගත** යන ශක්ති සතරෙන් **සහජාත** ශක්තියම ලැබේ.

මෙහි අනුවාද වශයෙන්,

**1. කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන ධර්ම සමූහය අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාම ස්කන්ධ තුනට හා චිත්තජ රූපයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්තසමුට්ඨානානඤ්ච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන ධර්ම සමූහය අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි නාම-ස්කන්ධයට හා චිත්තජ රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. මෙ ධම්මා චිත්තා ධම්මානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන ධර්ම අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට හා චිත්තජ රූපයන්ටද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන නාමස්කන්ධයන් අතුරෙන් එක එකක් වූද, දෙක බැගින් වූද, තුන බැගින් වූද සතර දෙනම වූද නාමස්කන්ධයෝ ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ට ද සහජාත ශක්තියෙන් ප්‍රත්‍යවීම "කුසල ධර්මය කුසලාව්‍යාකෘත ධර්මයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**4. විපිය—**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

මෙහි අකුසල ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්:

අකුසල් සිත් දොළොසය
චෛතසික සත් විස්සය
යන අවයවනාමස්කන්ධ වූ ප්‍රත්‍යය ධර්මයෝ යි

**ප්‍රත්‍යාත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොසය,
චෛතසික සත් විස්සය,
යන අවයව නාමස්කන්ධ වූ ප්‍රත්‍යෝත්පන්න ධර්මයෝ යි.

මෙහි අනුවාද වශයෙන්:

**1. අකුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සහජාත පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල චිත්තයන් පිළිබඳ වූ සතර නාම-ස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමසකන්ධ තුනට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල චිත්තයන් පිළිබඳ වූ නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ෙව ඛන්ධා ද්වින්නං ඛන්ධානං සහජාත පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල චිත්තයන් පිළිබඳ වූ නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මෙසේ දොළොස් අකුසල චිත්තයන් පිළිබඳ වූ නාම-ස්කන්ධයන් අතුරෙන් එක එකක් වූද, දෙක බැගින් වූද, තුන බැගින් වූද, නාමස්කන්ධයෝ ඔවුනොවුන්ට සහජාත ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අකුසල ධර්මය අකුසල ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**5. විපිය—**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)



Free Distribution www.aathaapi.org

අව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අකුසල ධර්මයෝ** නම් - පඤ්චවොකාර භූමියෙහි උපදින අවස්ථාවෙහි වූ

අකුසල් සිත් දොළොසය

චෛතසික සත්විස්සය

යන අවයව වූ ද, සමූහ වූ ද නාමස්කන්ධයෝයි.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්-

අකුසල චිත්ත - සමුට්ඨාන (චිත්තජ) රූපයෝයි.

මෙහි අනුවාදය වශයෙන්,

**අකුසලාඛන්ධා චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(අකුසල් වූ, අවයව වූ ද, සමූහ වූ ද නාමස්කන්ධයෝ ඒ අකුසල් සිත්වලින් උපදවනු ලබන්නා වූ චිත්තජ රූපයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අකුසල් සිත් දොළොසය චෛතසික සත්විස්සය යන නාමස්කන්ධයන් අතුරෙන් එක එකක් වූ ද, දෙක බැගින් වූ ද, තුන බැගින් වූ ද, සතරදෙනම වූ ද නාමස්කන්ධයෝ චිත්තජ රූපයන්ට සහජාත ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

6. විපිය—

**අකුසලො ධම්මො අකුසලස්ස ච, අබ්‍යාකතස්ස ච ධම්මස්ස සහජාත පච්චයෙන පච්චයො**

(අකුසල ධර්මය අකුසලාව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසලාව්‍යාකෘත ධර්මයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන අකුසල ධර්මයෝ නම්—

පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ

අකුසල් සිත් දොළොසය

චෛතසික සත්විස්සය

යන අවයව නාමස්කන්ධයෝය.

ප්‍රත්‍යයොත්පන්න වශයෙන් ලැබෙන අකුසලාව්‍යාකෘත ධර්මයෝ නම්—

අකුසල් සිත් දොළොසය

චෛතසික සත්විස්සය

චිත්තජ රූපයෝය

යන ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝයි.

මෙහි අනුවාද වශයෙන්,

**1. අකුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන ධර්ම සමූහය අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට හා චිත්තජ රූපයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්තසමුට්ඨානානඤ්ච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන ධර්ම සමූහය අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට හා චිත්තජ රූපයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය චෛතසික සත්විස්සය යන ධර්ම සමූහය අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට හා චිත්තජ රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ අකුසල් සිත් දොළොසය, චෛතසික සත් විස්සය යන නාමස්කන්ධයන් අතුරෙන් එක එකක් වූ ද, දෙක බැගින් වූ ද, තුන බැගින් වූ ද, සතර දෙනම වූ ද නාමස්කන්ධයෝ ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ට ද සහජාත ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අකුසල ධර්මය අකුසලාව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**7. විපිය—**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

ප්‍රවෘත්ති කාලයෙහි අව්‍යාකෘත ධර්මයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්—

ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක සිත් සතිසය,

ක්‍රියා සිත් විස්සය,

චෛතසික අටතිසය

යන අවයව නාමස්කන්ධයෝ යි.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

විපාක සිත් සතිසය

ක්‍රියා සිත් විස්සය

චෛතසික අටතිසය

යන අවයව නාමස්කන්ධයන් හා චිත්තජ රූපයෝ ය.

මෙහිදී **එක්වර** සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් **සහජාත** ශක්තිය ලැබේ.

**ප්‍රතිසන්ධි කාලයෙහි** අව්‍යාකෘත ධර්මයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්—

ඔවුනොවුන්ට ද, ඔවුනොවුන්ට හා **කටත්තා** රූපයන්ට ප්‍රත්‍යය වන

ප්‍රතිසන්ධි පසළොසය,
චෛතසික පන්තිසය

යන අවයව වූ ද, අවයව හා සමූහ වූ ද, නාමස්කන්ධයන් හා හදයවස්තු රූපය යන ප්‍රත්‍යය ධර්මයෝ යි.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

ප්‍රතිසන්ධි සිත් පසළොසය
චෛතසික පන්තිසය

යන අවයව වූ ද, සමූහ වූ ද, නාමස්කන්ධයන් හා කටත්තා රූපයෝ ය.

මෙහිදී යටදක්වන ලද ප්‍රත්‍යය ශක්ති අටෙන් සහජාත ශක්තියම ලැබේ.

ශුද්ධ **රූපයන්ගේ** වශයෙන් අව්‍යාකෘත ධර්මයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන අව්‍යාකෘත ධර්මයෝ නම්—

ඔවුනොවුන්ට හා උපාදාය රූපයන්ට ද ප්‍රත්‍යය වන
චිත්තජ රූපයෝ ය,
ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය,
බාහිර රූපයෝ ය,
ආහාරජ රූපයෝ ය,
ඍතුජ රූපයෝ ය,
අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය,
ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය,

යන **මොවුන්ගේ මහා භූත රූපයෝ යි**

ප්‍රත්‍යයොත්පන්න ධර්ම වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

භූත රූප සහිත වූ උපාදාය රූපයෝ ය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් **සහජාත** ශක්තිය ලැබේ.

**මෙහි** අනුවාද වශයෙන්, **ප්‍රවෘත්ති කාලයෙහි**

**1. විපාකාබ්‍යාකතො කිරියාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානංච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට හා චිත්තජ රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්තසමුට්ඨානා-නංච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට හා චිත්තජ රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්ත සමුට්ඨානානංච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට හා චිත්තජ රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**ප්‍රතිසන්ධික්ෂණයෙහි**

**4. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං කටත්තාච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(පඤ්චවොකාර භූමියෙහි උපදනා කල්හි හෙවත් ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රතිසන්ධි පසළොස්ය, චෛතසික පන්තිස්ය යන නාමස්කන්ධයන් අතුරෙන් එක් නාම ස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට හා කටත්තා රූප-යන්ට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස කටත්තාච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට හා කටත්තා රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං කටත්තාච රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට හා කටත්තා රූපයන්ටද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. ඛන්ධා වත්ථුස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(නාමස්කන්ධයෝ හදය වස්තු රූපයට සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ.)

**8. වත්ථු ඛන්ධානං සහජාත පච්චයෙන පච්චයො.**

(හදය වස්තු රූපය පටිසන්ධික්ෂණයෙහි වූ නාමස්කන්ධ යන්ට සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ.)

පඤ්චවොකාර භූමියෙහි උපදනා කල්හි ඒකක්ෂණිකව උපදනා පටිසන්ධි විපාක නාමස්කන්ධයෝ හා හදය වස්තු රූපය ද ඔවුනොවුන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**ශුද්ධ රූප වාරයෙහි,**

**9. එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං සහජාත පච්චයෙන පච්චයො.**

(එකක්ෂණිකව, කලාපගතව උපදනා රූපයන්ගේ පඨවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූතයන් අතුරෙන් එක් මහාභූත රූපයෙක් ඉතිරි මහාභූත රූප තුනට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**10. තයො මහාභූතා එකස්ස මහා භූතස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(මහාභූත රූප තුනක් ඉතිරි එක් මහාභූත රූපයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**11. ෙව මහාභූතා ද්වින්නං මහාභූතානං සහජාත පච්චයෙන පච්චයො.**

(මහා භූත රූප දෙකක් ඉතිරි මහා භූත රූප දෙකට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

**12. මහාභූතා චිත්ත සමුට්ඨානානං රූපානං උපාදය රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(චිත්ත සමුට්ඨාන එක් මහා භූත රූපයක් ඉතිරි මහා භූත රූප තුනටද, තුනක් එකකටද, දෙකක් දෙකකටද, මහා භූතයෝ ඔවුනොවුන්ට හා උපාදය රූපයන්ටද, ප්‍රතිසන්ධි කර්මජ මහා භූතයෝ ඔවුනොවුන්ට හා උපාදය රූපයන්ටද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**13. බාහිරං එකං මහාභූතං තිණ්ණන්නං මහා භූතානං සහජාත පච්චයෙන පච්චයො.**

(බාහිර රූපයන් අතුරෙන් එක් මහා භූත රූපයක් ඉතිරි මහා භූතරූප තුනට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**14. තයො මහාභූතා එකස්ස මහා භූතස්ස සහජාත පච්චයෙන පච්චයො.**

බාහිර රූපයන් අතුරෙන් මහා භූත රූපයන් තිදෙනෙක් ඉතිරි එක් මහා භූත රූපයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**15. සෙ මහාභූතා ද්වින්නං මහාභූතානං සහජාත පච්චයෙන පච්චයො.**

බාහිර රූපයන් අතුරෙන් මහා භූත රූප දෙකක් ඉතිරි මහාභූත රූප දෙකට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**16. මහාභූතා උපාදාය රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

බාහිර රූපයන් අතුරෙන් මහා භූත රූපයෝ උපාදාය රූපයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**17. ආහාර සමුට්ඨානං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං සහජාත පච්චයෙන පච්චයො.**

ආහාර සමුට්ඨාන වූ රූපයන් අතුරෙන් එක් මහාභූත රූපයක් ඉතිරි මහාභූත රූප තුනට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**18. තයො මහාභූතා එකස්ස මහා භූතස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(ආහාර සමුට්ඨාන රූපයන් අතුරෙන් මහාභූත රූපයෝ තිදෙනෙක් ඉතිරි මහාභූත රූපයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**19. ෙව මහාභූතා ද්වින්නං මහා භූතානං සහජාත පච්චයෙන පච්චයො.**

(ආහාර සමුට්ඨාන මහා භූත රූපයෝ දෙදෙනෙක් ඉතිරි මහා භූත රූප දෙකට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**20. මහාභූතා උපාදාය රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(ආහාර සමුට්ඨාන මහා භූත රූපයෝ උපාදාය රූපයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපාකාර වේ.)

**21. උතුසමුට්ඨානං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං සහජාත පච්චයෙන පච්චයො.**

(සෘතු සමුට්ඨාන එක් මහාභූත් රූපයක් ඉතිරි මහාභූත රූප තුනට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**22 තයො මහාභූතා එකස්ස මහාභූතස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(සෘතු සමුට්ඨාන මහාභූත රූප තුනක් ඉතිරි එක් මහා භූත රූපයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**23. ද්වෙ මහාභූතා ද්වින්නං මහාභූතානං සහජාත පච්චයෙන පච්චයො.**

සෘතු සමුට්ඨාන මහාභූත රූපයෝ දෙදෙනෙක් ඉතිරි මහා භූත රූප දෙකට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**24. මහාභූතා උපාදාය රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

සෘතු සමුට්ඨාන රූපයන් අතුරෙන් මහා භූත රූපයෝ උපාදාය රූපයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**25. අසඤ්ඤසත්තානං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං සහජාත පච්චයෙන පච්චයො.**

(අසංඥසත්ත්ව පුද්ගලයන්ගේ රූපයන් අතුරෙන් එක් මහාභූත රූපයක් ඉතිරි මහාභූත රූප තුනට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**26. තයො මහාභූතා එකස්ස මහා භූතස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(අසංඥසත්ත්ව රූපයන් අතුරෙන් මහාභූත රූප තුනක් ඉතිරි එක් මහා භූත රූපයට සහජාත ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

**27. මෙ මහා භූතා චිත්තං මහා භූතානං සහජාත පච්චයෙන පච්චයො.**

(අසංඥසත්ත්ව රූපයන් අතුරෙන් මහා භූත රූප දෙකක් ඉතිරි මහා භූත රූප දෙකට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

**28. මහාභූතා කටත්තා රූපානං උපාදාය රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(අසංඥසත්ත්ව කර්මජ රූප ප්‍රවෘත්ති කර්මජ රූප අතුරෙන් මහාභූත රූපයෝ කර්මජ රූපයන්ටද උපාදාය රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

8 විපිය—

**කුසලෝච අබ්‍යාකතොච ධම්මා අබ්‍යාකතස්ස ධම්මස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(කුසලාව්‍යාකෘත ධර්මයෝ අව්‍යාකෘත ධර්මයන්ට සහජාත ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ.)

අව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන කුසලාව්‍යාකෘත ධර්මයෝ නම්—

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ

කුසල් සිත් එක්විස්ස ය,
චෛතසික අටතිස ය
යන අවයව වූද, සමූහ වූ ද, නාමස්කන්ධයෝ ය.
අවයව වූ ද, සමූහ වූ ද මහා භූතයෝ ය.
යන මොව්හු ය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

චිත්තජ රූපයෝ ය.

මෙහිදී **එක්වර** ලැබෙන **සහජාත, නිස්සය, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සතරෙන් **සහජාත** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්,

**කුසලා ඛන්ධාච, මහාභූතාච චිත්ත සමුට්ඨානානං රූපානං සහජාත පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්ස ය, චෛතසික අටතිස ය යන නාමස්කන්ධයෝ ද, මහා භූතයෝ ද, චිත්තජ රූපයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

9 **වීපිය—**

**අකුසලොච අබ්‍යාකතොච ධම්මා අබ්‍යාකතස්ස ධම්මස්ස සහජාත පච්චයෙන පච්චයො.**

(අකුසල් වූ ද අව්‍යාකෘත වූ ද ධර්මයෝ අව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අව්‍යාකෘත ධර්මයට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන අකුසලාව්‍යාකෘත ධර්මයෝ නම්—

අකුසල් සිත් දොළොස ය,
චෛතසික සත්විස්ස ය

යන අවයව වූ ද, සමූහ වූ ද නාමස්කන්ධයෝ ය
අවයව වූ ද, සමූහ වූ ද මහා භූතයෝ ය

යන මොව්හු ය.

**ප්‍රත්‍යාත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

චිත්තජ රූපයෝ ය.

මෙහි අනුවාදය වශයෙන්,

**අකුසලා ඛන්ධාච, මහාභූතාච, චිත්තසමුට්ඨානානං රූපානං සහජාත පච්චයෙන පච්චයො—**

(අකුසල් සිත් දොළොස ය, චෛතසික සත්විස්සය යන නාමස්කන්ධයෝ ද, මහා භූතයෝ ද; චිත්තජ රූපයන්ට සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

# 7. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය

එකාබද්ධව හෙවත් එකට බැඳී, එකක්ෂණිකව උපදනා නාමරූප ධර්මයන් ඔවුනොවුන්ගේ ඉපදීමට හා පැවැත්මට අන්‍යෝන්‍ය භාවයෙන් උපකාරවීමේ ශක්තියට **අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්තිය** යයි කියනු ලැබේ. දඬු කීපයක් නොපෙරළී නැඟී සිටුවන්නට ඔවුන්ගේ අගින් එකිනෙකට ගේත්තුවී සිටීමෙන් ඔවුනොවුන්ට උපකාරවන්නාක් මෙන් නාමරූප ධර්මයෝ ද ඔවුනොවුන්ට මේ අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්. නමුත් සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන ධර්ම සියල්ල ඒ ඒ ධර්මයන්ට අන්‍යෝන්‍ය වශයෙන්ද ප්‍රත්‍යය නොවෙති. නාම ධර්මයන් සමග එකක්ෂණිකව උපදනා චිත්තජ රූපයන්ට ඒ නාම ධර්මයෝ සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන්නේවී නමුත් අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් ඔවුනොවුන්ට උපකාර නොවෙති.

**අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය පිළිබඳ ත්‍රිරාශිය**

**අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන ප්‍රත්‍යය ධර්මයෝ නම්:**

ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන
එකූන් අනූ චිත්තයෝ ය
දෙපනස් චෛතසිකයෝ ය,
යන සියලු ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය,
ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන
චිත්තජ
ප්‍රතිසන්ධි කර්මජ
බාහිර
ආහාරජ
ඍතුජ
අසංඥ සත්ව කර්මජ
යන රූපයන්ට අයත් සකල මහා භූතයෝ ය,

පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන හදය වස්තු රූපය

හදය වස්තු රූපයට ප්‍රත්‍යය වන පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහුය.

**අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යොත්පන්න ධර්මයෝ නම්—**

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන එකුන් අනූ චිත්තය දෙපනස් චෛතසිකයෝ ය.

යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමයෝ ය,

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන

චිත්තජ

ප්‍රතිසන්ධි කර්මජ

බාහිර

ආහාරජ

ඍතුජ

අසංඥ සත්ව කර්මජ

ප්‍රවෘත්ති කර්මජ

යන රූපයන්ට අයත්වූ සකල මහා භූතයෝයි.

හදය වස්තුවෙන් ප්‍රත්‍යය ලබන පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය.

පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදය වස්තුවය

යන ප්‍රත්‍යොත්පන්න ධර්මයෝය.

අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යොත්පන්න භාවයට **නොපැමිණෙන ප්‍රත්‍යනීක ධර්මයෝ නම්:**

නාමස්කන්ධ සතරෙන් ප්‍රත්‍ය ලබන චිත්තජ රූපයෝය,

හදය වස්තු රූපයෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය,

මහා භූතයන්ගෙන් ප්‍රත්‍ය ලබන

චිත්තජ,

ප්‍රතිසන්ධි කර්මජ

බාහිර

ආහාරජ

ඍතුජ

අසංඥසත්ත්ව කර්මජ

ප්‍රවෘත්ති කර්මජ රූපයන්ට අයත් වූ සකල උපාදාය රූපයෝය යන මොව්හුය.

**අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය** පිළිබඳ විසර්ජනාවාර හෙවත් විභ්‍රිතුනෙකි.

**1. විභජය.**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට අන්‍යොන්‍ය ප්‍රත්‍යය **ශක්තියෙන්** උපකාර වන **කුසල ධර්මයෝ** නම්;

ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක් විස්සය චෛතසික අටතිසය

යන අවයව නාමස්කන්ධයෝය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම් කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය.

යන අවයව නාමස්කන්ධයෝය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත. නිස්සය, අඤ්ඤමඤ්ඤ, සම්පයුත්ත. අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **අඤ්ඤමඤ්ඤ** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්,

**1. කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

එක්විසි කුසල චිත්තයන් පිළිබඳවූ නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො**

(එක්විසි කුසල චිත්තයන් පිළිබඳවූ නාමසකන්ධයන් අතුරෙන් නාමසකන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(එක්විසි කුසල චිත්තයන් පිළිබඳ වූ නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි විස්තර සහජාත ප්‍රත්‍යයෙහි මෙනි.

2. විපිය—

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්මයට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්:

අකුසල් සිත් දොළොසය
චෛතසික සත්විස්සය

යන අවයව නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යයොත්පන්න වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:**

අකුසල් සිත් දොළොසය
චෛතසික සත්විස්සය
යන අවයව නාමස්කන්ධයෝ ය.

මෙහි අනුවාද වශයෙන්,

**1. අකුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල චිත්තයන් පිළිබඳ වූ සතර නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල චිත්තයන් පිළිබඳ වූ සතර නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල චිත්තයන් පිළිබඳ වූ සතර නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි විස්තරය ද සහජාත ප්‍රත්‍යයෙහි මෙනි.

2. ද්විතීය—

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අව්‍යාකෘත ධර්මයට අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන අව්‍යාකෘත ධර්මයෝ නම්:

**ප්‍රවෘත්ති කාලයෙහි,**

ඔවුනොවුන්ට ප්‍රත්‍ය වන විපාක සිත් සතිසය
ක්‍රියා සිත් විස්සය
චෛතසික අටතිසය

යන අවයව නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යකෘත ධර්මයෝ නම්:

විපාක සිත් සතිසය
ක්‍රියා සිත් විස්සය
චෛතසික අටතිසය

යන අවයව නාමස්කන්ධයෝ ය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අන්‍යෝන්‍ය, නිඃශ්‍රය, විපාක, සම්ප්‍රයුක්ත, අස්ති, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් **අන්‍යෝන්‍ය** ශක්තිය ලැබේ.

**ප්‍රතිසන්ධි කාලයෙහි** ලැබෙන ප්‍රත්‍යය ධර්මයෝ නම්:

අන්‍යෝන්‍ය වශයෙන් නාමස්කන්ධයන්ට හා හදයවස්තු රූපයට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් පසළොස ය.

චෛතසික පන්තිසය

යන අවයව වූ ද, අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හදයවස්තු රූපය

යන ප්‍රත්‍යය ධර්මයෝ යි.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්:

ප්‍රතිසන්ධි සිත් පසළොස ය

චෛතසික පන්තිසය

යන අවයව වූ ද, අවයව හා සමූහ වූ ද, නාමස්කන්ධයන් හා හදයවස්තු රූපය.

යන ප්‍රත්‍යෝත්පන්න ධර්මයෝ ලැබෙත්.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤ-මඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් **අඤ්ඤමඤ්ඤ** ශක්තිය ලැබේ.

**ශුද්ධ රූප වාරයෙහි ප්‍රත්‍යය ධර්ම** වශයෙන් ඔවු-නොවුන්ට ප්‍රත්‍යය වන

චිත්තජ
ප්‍රතිසන්ධි කර්මජ
බාහිර
ආහාරජ
ඍතුජ
අසංඥසත්ත්ව කර්මජ
ප්‍රවෘත්ති කර්මජ මහා භූතයෝ ලැබෙත්.

**ප්‍රත්‍යයොත්පන්න ධර්ම** වශයෙන්—

මහා භූත වූ ප්‍රත්‍යයොත්පන්නයෝ ලැබෙත්.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤ-මඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් **අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්තිය** ලැබේ.

මෙහි අනුවාද වශයෙන්,

**1. විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අව්‍යාකෘත නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(විපාක ක්‍රියා නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(විපාක ක්‍රියා නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං වත්ථුස්සච අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයේදී ප්‍රතිසන්ධි සිත් පසළොසය, චෛතසික පන්තිසය යන අව්‍යාකෘත නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට සහ හදයවස්තු රූපයටද අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස වත්ථුස්සච අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධි චිත්තයන් පිළිබඳ වූ නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට හා හදයවස්තු රූපයටද අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං වත්ථුස්සච අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධි චිත්තයන් පිළිබඳ වූ නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට හා හදයවස්තු රූපයටද අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. ඛන්ධා වත්ථුස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ හදයවස්තු රූපයට අන්‍යොන්‍ය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ.)

**8. වත්ථු ඛන්ධානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයේදී හදයවස්තු රූපය නාමස්කන්ධයන්ට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**9. එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(චිත්තජ, ප්‍රතිසන්ධි කර්මජ, බාහිර, ආහාරජ, ඍතුජ, අසංඥසත්ත්ව කර්මජ, ප්‍රවෘත්ති කර්මජ මහා භූතයන් අතුරෙන් එක් මහා භූතයෙක් ඉතිරි මහා භූත තුනට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**10. තයො මහාභූතා එකස්ස මහාභූතස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(චිත්තජාදී මහා භූතයන් අතුරෙන් මහා භූතයෝ තිදෙනෙක් ඉතිරි එක් මහා භූතයට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**11. ද්වෙ මහාභූතා ද්වින්නං මහාභූතානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(චිත්තජාදි මහා භූතයන් අතුරෙන් මහා භූතයෝ දෙදෙනෙක් ඉතිරි මහා භූත දෙකට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**12. බාහිරං, ආහාර සමුට්ඨානං, උතුසමුට්ඨානං, අසඤ්ඤසත්තානං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(බාහිර වූද, ආහාර සමුට්ඨාන වූද, ඍතු සමුට්ඨාන වූද, අසඤ්ඤසත්ත්ව වූද මහා භූතයන් අතුරෙන් එක් මහා භූතයක් ඉතිරි මහා භූත තුනට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**13. බාහිරං, ආහාර සමුට්ඨානං, උතුසමුට්ඨානං, අසඤ්ඤසත්තානං තයො මහාභූතා එකස්ස මහාභූතස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(බාහිර වූද, ආහාර සමුට්ඨාන වූද, ඍතු සමුට්ඨාන වූද, අසඤ්ඤසත්ත්ව වූද මහා භූතයන් අතුරෙන් මහා භූතයෝ තිදෙනෙක් ඉතිරි එක් මහා භූතයට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**14. බාහිරං, ආහාර සමුට්ඨානං, උතුසමුට්ඨානං, අසඤ්ඤසත්තානං මෙ මහාභූතා ද්වින්නං මහා භූතානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(බාහිර වූද, ආහාර සමුට්ඨාන වූද, ඍතු සමුට්ඨාන වූද, අසඤ්ඤසත්ත්ව වූද මහා භූතයෝ දෙදෙනෙක් ඉතිරි මහා භූත දෙදෙනාට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ අව්‍යාකෘත ධර්මයෝ අව්‍යාකෘත ධර්මයට අන්‍යොන්‍ය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

## 8. නිස්සය ප්‍රත්‍යය

සෑම ධර්මයක්ම උපදනා කල්හි අන්‍ය ධර්මයක් නිශ්‍රය කොට ගෙනම උපදියි. එසේ යම් ධර්මයක් පිහිටීමට ස්ථාන වශයෙන් උපකාර වන ධර්මයට **නිශ්‍රය ප්‍රත්‍යය** යයි කියනු ලැබේ. සහජාතව හෙවත් තමා හා එක්ව උපදනා ධර්මයකට පිහිටීමට උපකාර වන ධර්මයට **සහජාත නිශ්‍රය ප්‍රත්‍යය** යයි ද, පූර්වයෙහි ඉපිද තමාට පසුව හටගන්නා ධර්මයට පිහිටීමට ස්ථාන වශයෙන් උපකාර වන ධර්මයට **පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය** යයි ද කියති. එබැවින් **නිශ්‍රය ප්‍රත්‍යය, සහජාත නිශ්‍රය ප්‍රත්‍යය, පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය** යයි දෙවැදෑරුම් වේ. එක්ව උපදනා චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙති. එසේම එක්ව උපදනා මහාභූතයෝද ඔවුනොවුන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙති. මහාභූතයෝ උපාදාය රූපයන්ටද නිශ්‍රය ප්‍රත්‍යය වෙති. නමුත් උපාදාය රූපයෝ ඔවුනොවුන්ට නිශ්‍රය ප්‍රත්‍යය නොවෙති. සිත චිත්තජ රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන

නමුත් චිත්තජ රූපයෝ චිත්තයට නිශ්‍රය ප්‍රත්‍යය නොවෙති. ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝද ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය වෙති. ප්‍රතිසන්ධික්ෂණයේදී කර්මජ රූපයක්වූ හදය වස්තු රූපය නාමස්කන්ධයන්ට ද; නාමස්කන්ධයෝ හදය වස්තු රූපයට ද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙති. හදය වස්තුවෙන් අන්‍යවූ ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට නිශ්‍රය නොවෙති. මෙය සහජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන ආකාරයයි.

පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය, වස්තුපුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය, වස්ත්වාරම්මණ පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය යයි දෙවැදෑරුම් වේ. පූර්වයෙහි ඉපිද පසුව උපදනා නාමස්කන්ධයන්ට නිශ්‍රය වන චක්ඛු වස්තුවය, ශ්‍රොතවස්තුවය, ඝ්‍රාණ වස්තුවය, ජිව්හා වස්තුවය, කාය වස්තුවය, හදය වස්තුවය යන වස්තු සය වස්තු පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය වන ධර්මයෝය. පූර්වයෙහි ම උපන්නා වූ මේ ෂට්වස්තූන් නිශ්‍රය කොට ගෙන චක්ඛුවිඤ්ඤාණාදී වූ නාමස්කන්ධයෝ ඇතිවෙත්. වස්ත්වාරම්මණ පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය වන ධර්මය නම්, මරණාසන්න කාලයෙහි චුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හදය වස්තු රූපය ය. මරණාසන්න චිත්ත වීථියෙහි උපදනාවූ මනොවාරාවජ්ජනය කාම ජවන යෝය, තදාරම්මණයෝය යනාදී වූ නාමස්කන්ධයෝ කිසි විටෙක චුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හදය වස්තු රූපය අරමුණු කොටද, නිශ්‍රය කොට ගෙනද උපදිති. එසේ උපදනා කල්හි එම හදය වස්තු රූපය, අරමුණු කොටද, නිශ්‍රය කොට ගෙනද උපදිති. එසේ උපදනා කල්හි එම හදය වස්තු රූපය එකී නාමස්කන්ධයන්ට වස්ත්වාරම්මණ පුරෙජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නේ යයි කියයුතු ලැබේ.

එක් භවයකට අයත් කර්මජරූප සන්තතිය චුති චිත්තයාගේ භඞ්ගක්ෂණයේදී අවසන් විය යුතු බැවින්, අවසාන කර්මජ රූපයෝ උපදින්නේ. චුති චිත්තයෙන් සතළොස් වන චිත්තක්ෂණයාගේ උත්පාදක්ෂණයේදී ය.

එබැවින් මරණාසන්න චිත්ත වීථියෙහි උපදනා මනොවාරාවජ්ජනය, කාම ජවනාදී චිත්තයෝ උපදිනු ලබන්නේ අන්තිමට උපදනා හදය වස්තු රූපය නිශ්‍රය කොට ගෙනයි. යම්කිසි විටෙක මරණාසන්න කාලයේදී තමාගේ හදය වස්තු අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කරන කල්හි හෝ එයට ඇලුම් කරන කල්හි හෝ, එය ආත්ම වශයෙන් ගන්නා කල්හි හෝ මරණාසන්න චිත්ත වීථියෙහි උපදනා මනොවාරාවජ්ජනාදී වූ චිත්තයන්ට අරමුණු වන්නේ චුති චිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපදනා හදයවස්තු රූපයයි. එසේ වූ කල්හි ඒ චිත්තයන්ට එකී හදය වස්තු රූපය වස්තුවද වෙයි, අරමුණද වෙයි. ඒ හෘදය වස්තු රූපය, එයට පසුව උපදනා මනොවාරාවජ්ජනාදි වූ වීථි චිත්තයන්ට වස්ත්වාරම්මණ පුරෙජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන බව දතයුතු.

චක්ඛුවිඤ්ඤාණ ධාතු, සොතවිඤ්ඤාණ ධාතු, ඝාණවිඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කායවිඤ්ඤාණ ධාතු යන පඤ්ච විඤ්ඤාණ ධාතූන්ට වස්තු පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නේ මධ්‍යමායුෂ්ක වූ චක්ඛු වස්තු, සොත වස්තු, ඝාණ වස්තු, ජිව්හා වස්තු, කාය වස්තු යන පඤ්චවිධ වූ වස්තූහුය. මධ්‍යමායුෂ්ක වස්තු රූපයෝ නම් ප්‍රථම අතීත භවාඞ්ග චිත්තය හා උපදනා වස්තු රූපයෝය. ඒ රූපයන්ගේ නිරුද්ධවීම සතළොස් චිත්තක්ෂණයකට ආයු ඇති චිත්ත වීථියගේ අන්තිම චිත්තයාගේ නිරොධය හා සමගය. මන්දායුෂ්ක රූපයෝ නම් ප්‍රථම අතීත භවාඞ්ගයට පූර්වයෙහි ඉපිද, චිත්ත වීථිය අවසන් වන්නට පෙර නිරුද්ධ වන රූපයෝයි. අමන්දායුෂ්ක රූපයෝ නම් ප්‍රථම අතීත භවාඞ්ගයට පසුව ඉපිද චිත්ත වීථිය අවසන් වූවායින් පසුත් පැවත නිරුද්ධවන රූපයෝයි. මනො ධාතු, මනොවිඤ්ඤාණ ධාතු යන ධාතූහු හදය වස්තු රූපයම නිශ්‍රය කොට ගෙන පවත්නා හෙයින් එයට ප්‍රතිසන්ධි චිත්තය ආදී වූ පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපය වස්තු පුරෙජාත ප්‍රත්‍යය භාවයෙන් උපකාර වේ. නිරොධ සමාපත්තියෙන්

නැගී සිටින අවස්ථාවෙහි ඵල චිත්තයට වස්තු පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නේ එයට එක් චිත්තක්ෂණයකට පූර්වයෙහි උපදනා හදය වස්තු රූපයයි.

## නිශ්‍රය ප්‍රත්‍යය පිළිබඳ ත්‍රි රාශිය

**1. සහජාත නිශ්‍රය ප්‍රත්‍යය** වන ධර්මයෝ නම්:

ඔවුනොවුන්ට හා චිත්තජ රූප, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ටද ප්‍රත්‍යය වන සියලු එකුන් අනූ චිත්තය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

ඔවුනොවුන්ට හා උපාදාය රූපයන්ට ප්‍රත්‍යය වන චිත්තජ, ප්‍රතිසන්ධි කර්මජ, බාහිර, ආහාරජ, ඍතුජ, අසංඥසත්ත්ව කර්මජ රූපයන්ට අයත්වූ සියළු මහා භූතයෝ ය.

පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන හදයවස්තුවය.

හදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොව්හු ය.

**සහජාත නිශ්‍රය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ නම්:-**

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන සියලු එකුන් අනූ චිත්තය චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය.

නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ රූප හා ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය.

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන සියලු මහා භූතයෝ ය, මහා භූතයන්ගෙන් ප්‍රත්‍යය ලබන උපාදාය රූපයෝ ය.

හදයවස්තුවෙන් ප්‍රත්‍යය ලබන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හදයවස්තුවය යන මොව්හු ය.

සහජාත නිශ්‍රය ප්‍රත්‍යයට ප්‍රත්‍යනීක ධර්මයෝ නැත.

2. **වස්තු පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය** වන ධර්මයෝ නම්:

ප්‍රවෘත්ති කාලයෙහි ෂට්වස්තුහුය.

**විස්තර වශයෙන් විභාගි—**

ප්‍රවෘත්ති කාලයෙහි මධ්‍යමායුෂ්ක චක්ෂුර් වස්තුවය, ශ්‍රොත වස්තුවය, ඝ්‍රාණ වස්තුවය, ජිව්හා වස්තුවය, කාය වස්තුවය.

ප්‍රතිසන්ධි ආදීවූ පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තුවය.

නිරොධ සමාපත්තියෙන් නැගී සිටින අවස්ථාවෙහි පූර්වයෙහි එක් චිත්තක්ෂණයක කාලයේ උපදනා හදය වස්තුවය.

මරණාසන්න කාලයෙහි චුති චිත්තයෙන් සතලොස් වන චිත්තය හා උපදනා හදයවස්තුවය යන ධර්මයෝ ය.

**වස්තු පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යොත්පන්නයෝ** නම්—

ප්‍රවෘත්ති කාලයෙහි පඤ්චවොකාර භූමියෙහි උපදනාවූ සතර අරූප විපාක හැර සප්ත විඥාන ධාතුහුය, චෛතසික දෙපනසය යන ධර්මයෝ ය.

**වස්තුපුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යයයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්—

චතුවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ
ලොභමූල සිත් අටය
මොහමූල සිත් දෙකය
මනොද්වාරාවර්ජනය
මහා කුසල් සිත් අටය

මහා ක්‍රියා සිත් අටය
අරූපාවචර සිත් දොළොසය
සෝවාන් මාර්ග චිත්තය හැර ලෝකෝත්තර සිත් සතය.

චෛෂ, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, අප්‍රමාණ්‍යයන් හැර චෛතසික සතළිස් සය ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා චෛතසික පන්තිස ය,
චිත්තජ රූපයෝය,
ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය,
බාහිර රූපයෝය,
ආහාරජ රූපයෝය,
ඍතුජ රූපයෝය,
අසංඥසත්ත්ව කර්මජ රූපයෝය,
ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන මොව්හුය.

**3. වස්තවාරම්මණ පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය වන ධර්මය නම්—**

මරණාසන්න කාලයෙහි චුති චිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපදනා හදයවස්තු රූපය ය.

**වස්තවාරම්මණ පුරෙජාත ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයොත්පන්නයෝ නම්—**

මරණාසන්න කාලයෙහි උපදනාවූ
මනොද්වාරාවජ්ජනය,
කාමජවන එකුන් තිසය,
තදාරම්මණ එකොළොසය,
අභිඥා දෙසිතය,

ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විරති, අප්‍රමාණ්‍යයන් හැර චෛතසික සතළිස් සතරය යන ධර්මයෝ යි.

**වත්ථාරම්මණ පුරේජාත ප්‍රත්‍යයයාගේ ප්‍රත්‍යනීකයෝ නම්—**

වත්ථාරම්මණ පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය නොලබන්නාවූ එකුන් අනූ චිත්තය, දෙපනස් චෛතසිකය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය,

චිත්තජ රූපයෝය,
ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය,
බාහිර රූපයෝය,
ආහාරජ රූපයෝය,
ඍතුජ රූපයෝය,
අසඥසත්ත්ව කර්මජ රූපයෝය,
ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන ධර්මයෝය.

**නිශ්‍රය ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනාවාර හෙවත් විපි තෙළෙසකි.**

**1. විපිය**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට **නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන කුසල ධර්මයෝ නම්—**

කුසල් සිත් එක්විස්සය,
චෛතසික අටතිසය,
යන අවයව නාමස්කන්ධයෝය.

**ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන ධර්මයෝ නම්—**

කුසල් සිත් එක්විස්සය,
චෛතසික අටතිසය,
යන අවයව නාමස්කන්ධයෝය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, නිස්සය, අඤ්ඤමඤ්ඤ, සම්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **නිශ්‍රය ශක්තිය** ලැබේ.

**මෙහි** අනුවාද වශයෙන්—

**1. කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය චෛතසික අටතිසය යන ධර්මයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො**

(කුසල නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මෙසේ කුසල නාමස්කන්ධයෝ ඔවුනොවුන්ට සහජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.

**2. විපිය—**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට **සහජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන කුසල ධර්මයෝ නම්—**

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන අවයව වූද, සමූහ වූද, නාම-ස්කන්ධයෝයි—

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත** ධර්මයෝ නම් චිත්තජ රූපයෝයි.

මෙහිදී එක්වර ලැබෙන **සහජාත, නිශ්‍රය, සම්ප්‍ර-යුක්ත, අස්ති, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් **නිශ්‍රය ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්

**කුසලා ඛන්ධා චිත්තසමුට්ඨානානං රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන අවයව වූද, සමූහ වූද නාමස්කන්ධයෝ චිත්තජ රූපයන්ට සහජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

කුසල් සිත් උපදනා කල්හි ඒ කුසල චිත්තයෝ සහජාත වූ චිත්තජ රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන සැටි මෙයින් දක්වේ.

3. වීථිය

**කුසලො ධම්මො කුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසලාව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන්. උපකාර වේ.

කුසලාව්‍යාකෘත ධර්මයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්—

ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝය.

**ප්‍රත්‍යාත්පන්න වශයෙන් ලැබෙන කුසලාව්‍යාකෘත ධර්මයෝ නම්—**

කුසල් සිත් **එක්විස්සය,**
චෛතසික අටතිසය,
චිත්තජ රූපයෝය.

මෙහිදී **එක්වර** සුදුසු පරිදි ලැබෙන **සහජාත, නිස්සය, අත්ථි. අවිගත** යන ශක්ති සතරෙන් **නිශ්‍රය ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්—

**1. කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්ත සමුට්ඨානානංච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(**එක්විසි** කුසල චිත්තයෝය, අටතිස් චෛතසිකයෝය යන නාමස්කන්ධයන් අතුරෙන් **එක්** නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට හා **චිත්තජ** රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස, චිත්ත සමුට්ඨානානංච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට සහ චිත්තජ රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ෙව ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්ත සමුට්ඨානානංච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට සහ චිත්තජ රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

4. විපිය.

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අකුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන අකුසල ධර්මයෝ නම්—

අකුසල් සිත් දොළොසය,
චෛතසික සත් විස්සය,
යන අවයව නාමස්කන්ධයෝයි.

**ප්‍රත්‍යෝත්පන්න වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ** නම්—

අකුසල් සිත් දොළොසය,
චෛතසික සත් විස්සය,
යන අවයව නාමස්කන්ධයෝය.

මෙහි අනුවාද වශයෙන්—

1. **අකුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත් විස්සය යන අකුසල නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

2. **තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසල සකන්ධ තුනක් ඉතිරි එක් සකන්ධයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. මෙ ඛන්ධා චිත්තං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසලස්කන්ධ දෙකක් ඉතිරි ස්කන්ධ දෙකට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**5. වීථිය**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අකුසල ධර්මයෝ** නම්—

අකුසල් සිත් දොළොසය
චෛතසික සත් විස්සය

යන අවයව නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ** නම් චිත්තජ රූපයෝයි.

**මෙහි** අනුවාදය වශයෙන්

**අකුසලා ඛන්ධා චිත්ත සමුට්ඨානානං රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසලස්කන්ධයෝ චිත්තජ රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**6. වීථිය—**

**අකුසලො ධම්මො අකුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසලාව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)



Free Distribution www.aathaapi.org

අකුසල අව්‍යාකෘත ධර්මයන්ට **නිශ්‍රය ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාර වන අකුසල ප්‍රත්‍යය ධර්මයෝ** නම්—

ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ

අකුසල් සිත් දොළොසය
චෛතසික සත් විස්සය

යන අවයව නාමස්කන්ධයෝය.

**ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් ලැබෙන අකුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්—

අකුසල් සිත් දොළොසය
චෛතසික සත් විස්සය
චිත්තජ රූපයෝය.

මෙහි අනුවාද වශයෙන්

**1. අකුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත් විස්සය යන අකුසල නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි අකුසල නාමස්කන්ධ තුනට හා චිත්තජ රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසලස්කන්ධයෝ තිදෙනෙක් ඉතිරි එක අකුසල ස්කන්ධයට හා චිත්තජ රූපයන්ටද නිශ්‍රය ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාර වෙත්.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානංච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසලස්කන්ධයෝ දෙදෙනෙක් ඉතිරි අකුසලස්කන්ධ දෙකට හා චිත්තජ රූපයන්ටද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

මෙසේ අකුසලස්කන්ධයෝ අකුසලාව්‍යාකෘත ධර්මයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**7. විපිය**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**මෙහිදී අව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන අව්‍යාකෘත ධර්මයෝ නම්—**

**ප්‍රවෘත්ති කාලයෙහි**

ඔවුනොවුන්ටද, ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ටද ප්‍රත්‍යය වන

විපාක සිත් සතිසය
ක්‍රියා සිත් විස්සය
චෛතසික අටතිසය
යන අවයව නාමස්කන්ධයෝය.

**ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන ධර්මයෝ නම්—**

විපාක සිත් සතිසය
ක්‍රියා සිත් විස්සය
චෛතසික අටතිසය
යන අවයව නාමස්කන්ධයන් හා
චිත්තජ රූපයෝය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් **නිශ්‍රය ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

**ප්‍රතිසන්ධි කාලයෙහි**

ඔවුනොවුන්ටද, ඔවුනොවුන්ට හා කටත්තා රූපයන්ටද ප්‍රත්‍යය වන

ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය
චෛතසික පන්තිසය

යන අවයව වූද, අවයව හා සමූහවූද නාමස්කන්ධයන් හා හදය වස්තු රූපය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්.

**ප්‍රත්‍යොත්පන්න වශයෙන්** ලැබෙන ධර්මයෝ නම්

ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය
චෛතසික පන්තිසය

යන අවයවවූද, සමූහවූද නාමස්කන්ධයන් හා කටත්තා රූපයෝයි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් **නිශ්‍රය ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

**ශුද්ධ රූප ධර්මයන්** අතුරෙන් නිශ්‍රය ශක්තියෙන් උපකාර වන ප්‍රත්‍යය ධර්මයෝ නම්—

ඔවුනොවුන්ට හා උපාදාය රූපයන්ටද ප්‍රත්‍යය වන
චිත්තජ රූප
ප්‍රතිසන්ධි කර්මජ රූප
බාහිර රූප
ආහාරජ රූප
ඍතුජ රූප
අසංඥ සත්ව කර්මජ රූප
ප්‍රවෘත්ති කර්මජ රූප
යන මොවුන්ගේ මහා භූත රූපයෝය.

**ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන රූප ධර්මයෝ නම්—**

භූතරූප සහිත වූ උපාදාය රූපයෝයි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් නිශ්‍රය ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්

**1. විපාකාබ්‍යාකතො කිරියාබ්‍යාකතො එකො ඛන්‍ධො තිණ්ණන්නං ඛන්‍ධානං චිත්ත සමුට්ඨානානංච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට හා චිත්තජ රූපයන්ටද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්‍ධා එකස්ස ඛන්‍ධස්ස චිත්තසමුට්ඨානානංච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(විපාක ක්‍රියා නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට හා චිත්තජ රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. ද්වෙ ඛන්‍ධා ද්වින්නං ඛන්‍ධානං චිත්තසමුට්ඨානානංච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(විපාක ක්‍රියා නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට හා චිත්තජ රූපයන්ටද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**4. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්‍ධො තිණ්ණන්නං ඛන්‍ධානං කටත්තාච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රතිසන්ධි සිත් එකුත් විස්සය චෛතසික පන්තිසය යන නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට හා සහජාත කර්මජ රූපයන්ටද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5 තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස කටත්තා ච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට සහ සහජාත කර්මජ රූපයන්ටද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**6. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං කටත්තාච රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට හා සහජාත කර්මජ රූපයන්ටද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.

**7. ඛන්ධා වත්ථුස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයේදී හදය වස්තු රූපය ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

කර්මජ රූපයන්ට සහජාත නිශ්‍රය ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වන්නේ ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ පමණය. ප්‍රවෘත්ති නාමස්කන්ධයන්ගේ එසේ කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වීමට ශක්තියක් නැත. නිරොධසමාපත්තියට සමවැද සිටිනා කාලයේදී සහ අසංඥසත්ත්ව භූමියෙහි ඉපිද එහි සිටිනාතාක් කල් නාමස්කන්ධයෝ නැතත් කර්මජ රූපයෝ සන්තති වශයෙන් නොබිඳී පවතී.

**9. එකං මහාභූතං තිණ්ණන්නං මහා භූතානං නිස්සය පච්චයෙන පච්චයො.**

(එක් මහාභූත රූපයක් සහජාතව උපදනා ඉතිරි මහා භූත තුනට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

**10. තයො මහාභූතා එකස්ස මහාභූතස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(මහා භූත රූප තුනක් ඉතිරි එක් මහා භූත රූපයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**11. ද්වෙ මහා භූතා ද්වින්නං මහාභූතානං නිස්සය පච්චයෙන පච්චයො.**

(මහාභූත රූපයන් දෙදෙනෙක් ඉතිරි මහා භූතරූප දෙදෙනාට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්)

**12. මහාභූතා චිත්ත සමුට්ඨානානංච රූපානං කටත්තාච රූපානං උපාදාය රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(චිත්තජ මහා භූත රූපයෝ එම මහා භූත රූපයන්ට හා උපාදාය රූපයන්ටද, ප්‍රතිසන්ධි කර්මජ මහා භූත රූපයෝ එම මහා භූත රූපයන්ට හා උපාදාය රූපයන්ටද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**13. බාහිරං එකං මහාභූතං තිණ්ණන්නං මහා භූතානං නිස්සය පච්චයෙන පච්චයො.**

(බාහිර රූපයන් අතුරෙන් එක් මහා භූත රූපයක් ඉතිරි මහා භූත රූප තුනට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**14. තයො මහා භූතා එකස්ස මහා භූතස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(බාහිරවූ මහා භූතරූප තුනක් ඉතිරි එක් මහා භූත රූපයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**15. ද්වෙ මහා භූතා ද්වින්නං මහාභූතානං නිස්සය පච්චයෙන පච්චයො.**

(බාහිරවූ මහා භූත රූප දෙකක් ඉතිරි මහා භූත රූප දෙකට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**16. ආහාර සමුට්ඨානං එකං මහා භූතං තිණ්ණන්නං මහා භූතානං නිස්සය පච්චයෙන පච්චයො.**

(ආහාර සමුට්ඨාන එක් මහා භූත රූපයක් ඉතිරි මහා භූත රූප තුනට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**17. තයො මහා භූතා එකස්ස මහා භූතස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(ආහාර සමුට්ඨාන මහා භූත රූප තුනක් ඉතිරි එක් මහා භූත රූපයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**18. ෙම මහාභූතා ද්වින්නං මහාං භූතාංනං නිස්සය පච්චයෙන පච්චයො.**

(ආහාර සමුට්ඨාන මහා භූත රූප දෙකක් ඉතිරි මහා භූත රූප දෙකට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**19. උතුසමුට්ඨානං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූත රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(ඍතු සමුට්ඨාන එක් මහා භූත රූපයක් ඉතිරි මහා භූත රූප තුනට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**20. තයො මහාභූතා එකස්ස මහාභූතස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(ඍතු සමුට්ඨාන මහා භූත රූප තුනක් ඉතිරි එක් මහා භූත රූපයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**21. ෙම මහාභූතා ද්වින්නං මහාභූතානං නිස්සය පච්චයෙන පච්චයො.**

(ඍතුසමුට්ඨාන මහාභූත රූපයෝ දෙදෙනෙක් ඉතිරි මහාභූත රූප දෙකට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**22. අසඤ්ඤසත්තානං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං නිස්සය පච්චයෙන පච්චයො.**

(අසංඥසත්ත්ව එක් මහා භූත රූපයක් ඉතිරි මහා භූත රූප තුනට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**23 තයො මහාභූතා එකස්ස මහාභූතස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අසංඥසත්ත්ව මහාභූත රූප තුනක් ඉතිරි එක් මහා භූත රූපයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**24. ද්වෙ මහාභූතා ද්වින්නං මහාභූතානං නිස්සය පච්චයෙන පච්චයො.**

(අසංඥසත්ත්ව මහාභූත රූප දෙකක් ඉතිරි මහාභූත රූප දෙකට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**25 මහාභූතා කටත්තාච රූපානං උපාදය රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රවෘත්ති කර්මජ අසඥසත්ත්ව මහා භූත රූපයෝ කර්මජ රූපවලටද උපාදාය රූපවලටද නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්).

**26. චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක චක්ෂුර් වස්තුව චක්ඛුවිඥාන සිත් දෙකට වස්තු පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**27. සොතායතනං සොත විඤ්ඤාණස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක ශ්‍රොත වස්තුව ශ්‍රොත විඥාන සිත් දෙකට වස්තු පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**28. ඝාණායතනං ඝාණවිඤ්ඤාණස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක ඝ්‍රාණ වස්තුව ඝ්‍රාණවිඥාන සිත් දෙකට වත්‍ථු පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

**29. ජිව්හායතනං ජිව්හා විඤ්ඤාණස්ස නිස්සය පච්චයෙන පච්චයෙ.**

(මධ්‍යමායුෂ්ක ජිව්හා වස්තුව ජිව්හා විඥාන සිත් දෙකට වත්‍ථු පුරෙජාත නිශ්‍රය ශක්තියෙන් උපකාරවේ.)

**30. කායායතනං කාය විඤ්ඤාණස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක කාය වස්තු කාය විඥාන සිත් දෙකට වත්‍ථු පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**31. වත්‍ථු විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො.**

(පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ප්‍රතිසන්ධි ආදී පූර්‍ව පූර්‍ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපය, අරූප විපාක, විපඤ්චවිඥාන යන තුදුස් විපාක චිත්තයන් හැර ඉතිරි වූ ප්‍රථම භවඞ්ගාදී පශ්චිම වූ විපාක සිත් දෙවිස්සය, ක්‍රියා සිත් විස්සය යන මේ විපාක ක්‍රියා නාමස්කන්ධයන්ට වත්‍ථු පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මරණාසන්න කාලයේදී වනාහි චුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හදය වස්තුරූපය, එයට අනතුරුව උපදනා භවාඞ්ග සිත් පසළොසය, ආවර්ජනා-ද්වයය සම්පටිච්ඡනද්වයය, සන්තිරණත්‍රයය, ව්‍යවස්ථාපනය, රහතන් වහන්සේගේ කාම ක්‍රියා ජවන් පසය, තදාරම්මණය චුතිය යන මේ විපාක ක්‍රියා නාමස්කන්ධයන්ට වත්‍ථු පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මරණාසන්න කාලයේදී චුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හදය වස්තු රූපය අරමුණු කරන කලෙක් වේ නම්, එයට අනතුරුව උපදනා නාමස්කන්ධයන්ට එම හදය වස්තු රූපය වත්‍ථු ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මෙසේ අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත නිශ්‍රය වස්තු පුරේජාත නිශ්‍රය වස්තුආරම්මණ පුරේජාත නිශ්‍රය යන නිශ්‍රය ප්‍රත්‍යය ශක්ති තුනෙන් උපකාර වන බව දතයුතු.

8. විපිය—

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්—

පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම කුසල් සිත් එක් විස්සට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජනාදී පූර්වපූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපය.

මරණාසන්න කුසල් ජවන පසට ප්‍රත්‍යය වන චුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හදය වස්තුරූපය යන අව්‍යාකෘත ධර්මයෝයි.

**ප්‍රත්‍යෝත්පන්න වශයෙන්** ලැබෙන කුසල ධර්මයෝ නම් පශ්චිම පශ්චිම කුසල් සිත් එක් විස්සය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **නිස්සය, ආරම්මණ, පුරෙජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් නිශ්‍රය **ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්—

**වත්ථු කුසලානං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො.**

(ව්‍යවස්ථාපන, මනොද්වාරාවර්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපය, පශ්චිම පශ්චිම කුසල් සිත් එක් විස්සට වත්‍ථු. පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

මරණාසන්න කාලයේදී චුති චිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපදනා හදය වස්තු රූපය මරණාසන්න කුසල් ජවන් පසටද වත්‍ථු පුරෙජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මෙය අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම යයි කියනු ලැබේ.

9. **විපිය**

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්—

පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම දෙළොස් අකුසල චිත්තයන්ට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනොද්වාරාවර්ජනාදී වූ පූර්ව පූර්ව චිත්ත-යන් හා උපදනා හදය වස්තුවය,

මරණාසන්න අකුසල ජවන් පසට ප්‍රත්‍යයවන චුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හදය වස්තු රූපය යන ප්‍රත්‍යය ධර්මයෝ යි.

**ප්‍රත්‍යයොත්පන්න වශයෙන්** ලැබෙන අකුසල ධර්මයෝ නම් පශ්චිම පශ්චිම අකුසල් ජවන් සිත් දෙළොසය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **නිස්සය, ආරම්මණ, ආරම්මණාධිපති, ආරම්මණූපනිස්සය, පුරෙ-ජාත, විප්පයුත්ත, අත්‍ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් **නිශ්‍රය ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්—

**චක්ඛු අකුසලානං ධම්මානං නිස්සය පච්චයෙන පච්චයො.**

(ව්‍යවස්ථාපන, මනොද්වාරාවජ්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපය පශ්චිම පශ්චිම අකුසල් සිත් දෙලොසට චක්ඛු පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

මරණාසන්න කාලයේදී චුති චිත්තයෙන් සතලොස් වන චිත්තය හා උපදනා හදය වස්තු රූපය මරණාසන්න අකුසල ජවන් පසවද චක්ඛු පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මෙය අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම යයි කියනු ලැබේ.

**10. විපිය.**

**කුසලොච අබ්‍යාකතොච ධම්මා කුසලස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසලාව්‍යාකෘත ධර්මයෝ කුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

මෙහි කුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්—

ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක් විස්සය,

චෛතසික අටතිසය,
යන අවයව නාමස්කන්ධයෝ ය.

ව්‍යවස්ථාපන, මනොද්වාරාවජ්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තුවය යන ධර්මයෝ යි.

**ප්‍රත්‍යයොත්පන්න වශයෙන්** ලැබෙන කුසල ධර්මයෝ නම්—

කුසල් සිත් එක්විස්සය,
චෛතසික අටතිසය,
යන අවයව නාමස්කන්ධයෝ ය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **නිස්සය, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති තුනෙන් **නිශ්‍රය ප්‍රත්‍යය ශක්තිය** ලැබේ.

මෙහි අනුවාද වශයෙන්—

**1. කුසලො එකො ඛන්ධො ච වත්ථු ච තිණ්ණන්නං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් හා ව්‍යවස්ථාපන, මනොද්වාරාවජ්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපයද, ඉතිරි කුසල නාමස්කන්ධ තුනට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේත්.)

**2. තයො ඛන්ධා ච වත්ථු ච එකස්ස ඛන්ධස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසලස්කන්ධයන් තුන්දෙනෙක් හා ව්‍යවස්ථාපන, මනොද්වාරාවජ්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපයද, ඉතිරි එක් කුසල නාමස්කන්ධයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේත්.)

**3. ද්වෙ ඛන්ධා ච වත්ථු ච ද්වින්නං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසලස්කන්ධයන් දෙදෙනෙක් හා ව්‍යවස්ථාපන, මනොද්වාරාවජ්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපයද, ඉතිරි කුසල නාමස්කන්ධ දෙකට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේත්.)

**11. විපිය.**

**කුසලො ච අබ්‍යාකතො ච ධම්මා අබ්‍යාකතස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල නාමස්කන්ධයෝ හා අව්‍යාකෘත ධර්මයෝද, අව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

මෙහි අව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **කුසලාව්‍යාකෘත ප්‍රත්‍යය ධර්මයෝ** නම්—

කුසල් සිත් එක්විස්සය,
චෛතසික අටතිසය,
යන අවයව නාමස්කන්ධයන් හා
සහජාත චිත්තජ මහාභූත රූපයෝ ය.

**ප්‍රත්‍යෝත්පන්න වශයෙන්** ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

චිත්තජ රූපයෝ යි.
මෙහි අනුවාදය වශයෙන්—

**කුසලා ඛන්ධාච මහාභූතාච චිත්ත සමුට්ඨානානං රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ හා චිත්තජ මහාභූත රූපයෝද, චිත්තජ රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**12. විසිය.**

**අකුසලොච අබ්‍යාකතොච ධම්මා අකුසලස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසලාව්‍යාකෘත ධර්මයෝ අකුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්)

මෙහි අකුසල ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්—

ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අවයව නාමස්කන්ධයෝ ය,

ව්‍යවස්ථාපන, මනොද්වාරාවජ්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපය යන ධර්මයෝ ය.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්—

අකුසල් සිත් දොළොසය.
චෛතසික සත් විස්සය.

යන අවයව නාමස්කන්ධයෝ ය.

මෙහි අනුවාද වශයෙන්—

**1. අකුසලො එකො ඛන්ධො ච වත්ථු ච තිණ්ණන්නං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් හා ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපයද, ඉතිරි අකුසල නාමස්කන්ධ තුනට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. තයො ඛන්ධා ච වත්ථු ච එකස්ස ඛන්ධස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධ තුනක් හා ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපයද, ඉතිරි අකුසල නාමස්කන්ධයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. ද්වෙ ඛන්ධා ච වත්ථු ච ද්වින්නං ඛන්ධානං නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධ දෙකක් හා ව්‍යවස්ථාපන, මනොද්වාරාවජ්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපයද, ඉතිරි අකුසල නාමස්කන්ධ දෙකට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**13. විපිය**

**අකුසලො ච අබ්‍යාකතො ච ධම්මා අබ්‍යාකතස්ස ධම්මස්ස නිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසලාව්‍යාකෘත ධර්මයෝ අව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

මෙහි අව්‍යාකෘත ධර්මයට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අකුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්—

අකුසල් සිත් දොළොසය,
චෛතසික සත් විස්සය,
යන අවයව නාමස්කන්ධයන් හා
සහජාත චිත්තජ මහාභූත රූපයෝය

**ප්‍රත්‍යොත්පන්න වශයෙන්** ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

චිත්තජ රූපයෝයි.
මෙහි අනුවාදය වශයෙන්—

**අකුසලා ඛන්ධා ච මහා භූතා ච චිත්ත සමුට්ඨානානං රූපානං නිස්සය පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල් සිත් හා චෛතසික සත්විස්සය යන අවයව නාමස්කන්ධයන් හා චිත්තජ මහා භූත රූපයෝද, චිත්තජ රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

## 9. උපනිශ්‍රය ප්‍රත්‍යය

චිත්ත චෛතසික ධර්මයන් ඇතිවීමට අතිශයින් උපකාර වූ බලවත් වූ හෙතුවට **උපනිශ්‍රය ප්‍රත්‍යය** යි කියනු ලැබේ. හෙතු, ආරම්මණාදී ප්‍රත්‍යය ධර්මයන් ඇතත් උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තිය නොලද හොත් චිත්ත චෛතසිකයන්ගේ පහළවීමක් ඇති නො වේ. එහෙයින් අන් හැම උපකාරක ධර්මයටම වඩා බලවත්වූ උපකාරක ධර්මය **උපනිශ්‍රය ප්‍රත්‍යය** ශක්තිය යි.

ප්‍රභෙද වශයෙන් උපනිශ්‍රය ප්‍රත්‍යය ත්‍රිවිධ වේ. එනම්—

1. ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ය
2. අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය ය
3. පකතූපනිශ්‍රය ප්‍රත්‍යය යන තුනය.

1. **ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය** - ගරුකළ යුතු ධර්මයෝ බොහෝ චිත්ත චෛතසික ධර්මයන්ගේ උත්පත්තියට උපකාර වෙති. එසේ ගරු කරනු ලබන අරමුණු චිත්ත චෛතසිකයන්ගේ ඉපදීමට **ආරම්මණූපනිස්සය ප්‍රත්‍යය** ශක්තියෙන් උපකාර වන්නේ යයි කියනු ලැබේ.

දන් දීම, සිල්සමාදන් වීම, පෙහෙවස් විසීම, බණ ඇසීම, පින් දීම, වතාවත් කිරීම යනාදි නොයෙක් පින්කම් කොට නැවත ඒ පින්කම් ගරු කොට මෙනෙහි කිරීමේදී උපදනා කුසල් සිත් වලට පළමු කුසලය ආරම්මණූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ එසේම ධ්‍යාන වඩා, ධ්‍යාන සමවතින් නැගී, එය ගරු කොට මෙනෙහි කරන කල්හිද, ලොකොත්තර මගඵල ලබා එය ගරු කොට මෙනෙහි කරන කල්හිද උපදනා කුසල චිත්තයන්ට ඒ මහග්ගත ලොකොත්තර කුසලය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

එපරිද්දෙන්ම දානාදි පින්කම් කොට නැවත එය ගරුකොට තෘෂ්ණාවෙන් ආස්වාදනය කරන කල්හිද, තෘෂ්ණා සහගත සිතින් එයට සතුටුවන කල්හිද, වැරදි දෘෂ්ටි උපදවා ගන්නා කල්හිද උපදනා අකුසල් සිත්වලට ඒ කුසලය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

නවද රාගයත්, දෘෂ්ටියත් ගරු කොට ආස්වාදනය කරන කල්හිද එයට සතුටුවන කල්හිද, උපදනා අකුසල චිත්තයන්ට පළමු අකුසලය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**2. අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය** – සෑම සිතක්ම උපදනේ චිත්ත පරම්පරාවකය. ඒ ඒ චිත්ත පරම්පරාවල එක් චිත්තයක් ඉපිද නිරුද්ධ වූ පසු එයට අනතුරුවම අන්‍ය සිතක් උපදී. පූර්ව චිත්තය ඇති නුවූවහොත් පසු චිත්තය ඇතිවීමට ඉඩක් නැත. එබැවින් පූර්ව චිත්තය එයට අනතුරුව උපදනා චිත්තයට බලවත් හෙතුවක් වේ. එහෙයින් අනතුරුව උපදනා චිත්තයට පූර්ව චිත්තය **අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය** ශක්තියෙන් උපකාර වේ. පූර්ව පූර්ව චිත්තයන්හි ඇති, තම තමාට අනතුරුව චිත්ත පරම්පරාව නොසිඳෙනු පිණිස තැනට සුදුසු සිතක් ඉපදවීමේ ශක්තියට **අනන්තර ප්‍රත්‍යය ශක්තිය** යයි කියනු ලැබේ. පශ්චිම චිත්තය ඉපදීමට පූර්ව චිත්තයෙහි ඇති බලවත් හේතු ශක්තියට **අනන්තරූපනිශ්‍රය ශක්තිය** යයි කියනු ලැබේ.

**3. ප්‍රකෘතූපනිශ්‍රය ප්‍රත්‍යය** – ඒ ඒ සත්ත්ව සන්තාන යන්හි ඉපදවීම්, සෙවනය කිරීම් වශයෙන් කරන ලද ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥාදී කුසල ධර්මයෝ දන්දීම, සිල් සමාදන් වීම, පෙහෙවස් විසීම, ධ්‍යාන ඉපදවීම, විදසුන් වැඩීම, මාර්ග ඵලයන්ට පැමිණීම අභිඥා ඉපදවීම, සමාපත්තියට සමවැදීම යනාදි කුසල කර්මයන්ට බලවත් හේතු ශක්තියෙන් උපකාර වන බැවින් ඒ ශ්‍රද්ධාදී ධර්මයන්ට **ප්‍රකෘතූපනිශ්‍රය ප්‍රත්‍යය** යයි කියනු ලැබේ. එසේම ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥාදී කුසලයන් නිසා රාග, ද්වෙෂ, මොහ, මාන, දිට්ඨි ආදී අකුසලයන් ඇතිවන කල්හි ඒවාට එකී ශ්‍රද්ධාදී කුසලයෝ ප්‍රකෘතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්. රාග ද්වෙෂාදීහුද, ප්‍රාණඝාතාදී අකුසල කර්මයෝද නැවත නැවතත් රාගාදීන්ද ප්‍රාණඝාතාදී අකුසල කර්මයන්ද කිරීමට බලවත්ව උපකාර වන හෙයින් ඒවාටද ප්‍රකෘතූපනිශ්‍රය ප්‍රත්‍යය යයි කියනු ලැබේ. මේ ආදී වශයෙන් ස්වසන්තානයෙහි උපදවන ලද සෙවනය කරනලද කුසලාකුසල ධර්මයෝ නැවතත් කුසලාකුසල ධර්මයන්ගේ ඉපැදීමට ප්‍රකෘතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බව දත යුතු.

## උපනිශ්‍රය ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය

### 1. ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය

**ප්‍රත්‍යය ධර්ම**

ගරු කළයුතු වූ වර්තමාන වූ ද, අතීතවූ ද, අනාගතවූ ද, ඉෂ්ටනිෂ්පන්න රූප අටළොසය.

ද්වෙෂමූල, මොහමූල, දුක්ඛ සහගත කාය විඥනයන් හැර සිත් සූ අසූවය.

ද්වෙෂ, ඉස්සා මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා හැර ඉතිරි චෛතසික සත් සාළිසය.

කාලමුක්ත වූ නිර්වාණය

යන ෂඩාරම්මණයෝ ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය වන ධර්මයෝයි.

**ප්‍රත්‍යොත්පන්න ධර්ම**

ගරු කළයුතු ධර්මයන් ගරුකොට අරමුණු කරන්නාවූ
ලොභ මූල සිත් අටය.
මහා කුසල් සිත් අටය,
මහා ක්‍රියා ඥන සම්ප්‍රයුක්ත සිත් සතරය
ලොකොත්තර සිත් අටය,

ද්වෙෂ, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, විචිකිච්ඡා, අප්‍රමාණ්‍ය යන් හැර චෛතසික පන්සාළිසය.

යන මොවුහු ආරම්මණූපනිස්සය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යොත්පන්නයෝයි.

**ප්‍රත්‍යනීක ධර්ම**

යම්කිසි ධර්මයක් ගරුකොට අරමුණු නොකරන අවස්ථාවෙහි වූද කිසි ධර්මයක් ගරුකොට අරමුණු නොකරන්නා වූද,

ලෞකික සිත් එක් අසූවය
චෛතසික දෙ පනසය
චිත්තජ රූපයෝය
ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය
බාහිර රූපයෝය
ආහාරජ රූපයෝය
ඍතුජ රූපයෝය
අසංඥසත්ත්ව කර්මජ රූපයෝය
ප්‍රවෘත්ති කර්මජ රූපයෝය

යන මොව්හු ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක යෝයි.

2. අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය

ප්‍රත්‍යය ධර්ම

අතීත් චුති චිත්තය හැර පූර්ව පූර්ව වූ
එකුන් අනූචිත්තය
චෛතසික දෙ පනසය.

යන මොව්හු අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ධර්මයෝයි.

ප්‍රත්‍යොත්පන්න ධර්ම

අතීතත චුති චිත්තය සහිතවූ පශ්චිම පශ්චිම වූ
එකුන් අනූ චිත්තය
චෛතසික දෙපනසය

යන මොව්හු අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යොත්පන්නයෝයි.

ප්‍රත්‍යනීක ධර්ම

චිත්තජ රූපයෝය
ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය
බාහිර රූපයෝය.
ආහාරජ රූපයෝය
ඍතුජ රූපයෝය

අසංඥසත්ත්ව කර්මජ රූපයෝය
ප්‍රවෘත්ති කර්මජ රූපයෝය

යන මොව්හු අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීකයෝය.

3. පකතූපනිශ්‍රය ප්‍රත්‍යය

ප්‍රත්‍යය ධර්ම

බලවත්වූ එකුන් අනූ චිත්තය
චෛතසික දෙපනසය
රූප අට විස්සය
ඇතැම් ප්‍රඥප්තීහුය

යන මොව්හු ප්‍රකෘතූපනිශ්‍රය වන ධර්මයෝයි.

ප්‍රත්‍යොත්පන්න ධර්ම

ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි වශයෙන් සියලු එකුන් අනූ චිත්තය චෛතසික දෙපනසය.

යන මොව්හු පකතූපනිශ්‍රය ප්‍රත්‍යයයාගේ ප්‍රත්‍යොත්පන්නයෝය.

ප්‍රත්‍යනීක ධර්ම

චිත්තජ රූපයෝය.
ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය.
බාහිර රූපයෝය.
ආහාරජ රූපයෝය.
ඍතුජ රූපයෝය.
අසංඥසත්ත්ව කර්මජ රූපයෝය.
ප්‍රවෘත්ති කර්මජ රූපයෝය.

යන මොව්හු පකතූපනිශ්‍රය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීකයෝය.

උපනිශ්‍රය ප්‍රත්‍යයාගේ විසර්ජනාවාර කෙවත් වීපිනවයකි.

**1. විපිය**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො ආරම්මණූපනිස්සයො, අනන්තරූප නිස්සයො, පකතූපනිස්සයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණූපනිශ්‍රය අනන්ත රූපනිශ්‍රය, පකතූපනිශ්‍රය යන උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්ති තුනෙන් උපකාර වේ.)

මෙහි අනුවාද වශයෙන්

**ආරම්මණූපනිස්සය ප්‍රත්‍යය**

**1. දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථකම්මං කත්වා තං ගරුං කත්වා පච්චවෙක්ඛති.**

(දන් දී සිල් සමාදන්ව පෙහෙවස් රැක, ඒ පුණ්‍යකර්මය ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි ප්‍රත්‍යවේක්ෂා කුසල ජවනයන්ට ඒ දාන චේතනාදිය ප්‍රධාන කොට ඇති කුසල චිත්තය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

දන්දීම, පෙහෙවස් රැකීම, සිල් සමාදන්වීම යනාදිය ගරුකොට සැලකිය යුතු කුසල ධර්මයෝයි. එකී පින්කම් කොට නැවත ඒ පින්කම් ගරුකොට මෙනෙහි කරන කල්හි, භවාඞ්ගචලන, භවාඞ්ගුපච්ඡේද යන චිත්තයන්ට අනතුරුව ඒ දානාදි කුසල කර්මයක් අරමුණුකොට මනොද්වාරාවජ්ජන චිත්තයද එයට අනතුරුව ඒ පුණ්‍යකර්මය අරමුණු කොට කාමාවචර මහා කුසල් සිත් අටෙන් එක් සිතක් ප්‍රත්‍යවේක්ෂා ජවන කෘත්‍යයෙන් සත් වරක් ඉපිද නිරුද්ධවූ පසු තදාරම්මණ භවාඞ්ගයෝ වෙත්. මෙහිදී පළමු කළ කුසලය එය ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යවේක්ෂා කරන කුසල ජවනයන්ට ආරම්මණූපනිස්සය ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණූපනිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම"යයි කියනු ලැබේ.

**2. පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා පච්චවෙක්ඛති.**

(පෙර මනාකොට කරනලද දාන සීලාදි පින්කම් ගරු කොට ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි, ඒ ප්‍රත්‍යවෙක්ෂා ජවනයන්ට පෙර පවත්වන ලද කුසලය ආරම්මණූප නිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුංකත්වා පච්චවෙක්ඛති.**

(ප්‍රථම ධ්‍යානාදී වූ මහද්ගත ධ්‍යාන උපදවා, ඒ ධ්‍යාන යට සමවැද එයින් නැගී, එම ධ්‍යානය ගරුකොට මෙනෙහි කරන කල්හි උපදනා කාමාවචර මහාකුසල ප්‍රත්‍යවෙක්ෂා ජවනයන්ට ඒ ධ්‍යානමය මහද්ගත කුසලය ආරම්මණූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ)

**4. සෙක්ඛා ගොත්‍රභුං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

(සොවාන් ඵලයට පැමිණි ආර්‍යයෝ සෝවාන් මාර්ග චිත්තයට පූර්වයෙහි එම චිත්ත වීථියෙහි උපන්නා වූ ගොත්‍රභූ චිත්තය ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යය වෙක්ෂා කරන කල්හි උපදනාවූ කාමාවචර කුසල ජවනයන්ට ඒ ගොත්‍රභූ චිත්තය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

සෝවාන් මාර්ග චිත්තය උපදනා චිත්ත වීථියෙහි භවාඞ්ග චලන භවාඞ්ගුපච්ඡෙදයන්ට අනතුරුව සංස්කාර ධර්මයන් අරමුණු කරමින් මනොවාරාවජ්ජනයද, එයට අනතුරුව පරිකර්ම, උපචාර, අනුලොම වශයෙන් කාමාවචර මහා කුසල ඥාන සම්ප්‍රයුක්ත සිත ඉපිද නිරුද්ධ වූ පසු එම මහා කුසල චිත්තයම නිර්වාණය අරමුණු කරමින් ගොත්‍රභූ නමින් ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව නිර්වාණය අරමුණු කරමින් සෝවාන් මාර්ග චිත්තයද සෝවාන් ඵල සිත් දෙකක්ද පිළිවෙළින් ඉපිද නිරුද්ධ වීමෙන් ඉක්බිති භවාඞ්ගය වේ. මෙසේ සෝවාන් ඵලයට පැමිණි ආර්‍ය පුද්ගල තෙමේ එයට අනතුරුව මාර්ගයද, ඵලයද,

නිර්වාණයද ප්‍රහීණ කෙලශයන්ද; ඉතිරි කෙලශයන්ද යන මේ අරමුණු ගෙන ප්‍රත්‍යවෙක්ෂා කරන්නේය. එයට අනතුරු ගොත්‍රභූ චිත්තය ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි උපදනා කාමාවචර ඥානසම්ප්‍රයුක්ත මහා කුසල ජවනයට එම ගොත්‍රභූ චිත්තය ආරම්මණූපනිශ්‍රය ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**5. සෙක්ඛා වොදානං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

(සකෘදාගාමි, අනාගාමි ආර්‍ය්‍ය පුද්ගලයෝ තම තමන්ගේ මාර්ග චිත්තයන්ට පූර්වයෙහි උපදනා වොදාන චිත්තය ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි, ඒ වොදාන චිත්තය ප්‍රත්‍යවෙක්ෂා කරන කාමාවචර කුසල ජවනයන්ට ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. සෙක්ඛා මග්ගා වුට්ඨහිත්වා මග්ගං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

(සොවාන් සකෘදාගාමි අනාගාමි ඵලසථ ආර්‍ය්‍ය පුද්ගලයෝ තම තමන් පැමිණි මාර්ගය ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යවෙක්ෂා කරණ කල්හි ඒ ලොකොත්තර කුසලය ප්‍රත්‍යවෙක්ෂා කරන ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර මහා කුසල ජවනයන්ට ආරම්මණූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

මෙසේ පෘථග්ජන වූද ශෛක්ෂවූද පුද්ගලයෝ දානාදී පින්කම් කොට, ධ්‍යාන වඩා, ලොකොත්තර මාර්ග උපදවා, ඒවා ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි උපදනා කාමාවචර මහා කුසල ප්‍රත්‍යවෙක්ෂා ජවනයන්ට එකී ලෞකික ලොකොත්තර කුසලයන් ආරම්මණූපනිස්සය ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසල ධර්මය කුසල ධර්මයට ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**අනන්තරූප නිස්සය ප්‍රත්‍යය**

**1. පුරිමා පුරිමා කුසලාඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ කුසල නාමස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ කුසල නාමස්කන්ධයන්ට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වෙත්.)

කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන කුසල නාමස්කන්ධයන් අතුරෙන් යම් කුසල චිත්තයක් කාමාවචර ජවන කෘත්‍යයෙන් උපදනා කල්හි පළමුවන දෙවන, තුන්වන, සතරවන, පස්වන, සවන, කුසල ජවනයෝ අනතුරුව උපදනා දෙවන, තුන්වන සතරවන පස්වන, සවන, සත්වන ජවනයන්ට අනන්තරූප නිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම "කුසල ධර්මය කුසල ධර්මයට අනන්තරූප නිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර-වීම යයි කියනු ලැබේ.

**2. අනුලොමං ගොත්‍රභුස්ස අනන්තරූප නිස්සය පච්චයෙන පච්චයො.**

(අනුලෝම චිත්තය, එයට අනතුරුව උපදනා ගොත්‍රභූ චිත්තයට අනන්තරූප නිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**3. අනුලොමං වොදානස්ස අනන්තරූප නිස්සය පච්චයෙන පච්චයො.**

(අනුලෝම චිත්තය එයට අනතුරුව උපදනා වෝදාන චිත්තයට අනන්තරූපනිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**4. ගොත්‍රභු මග්ගස්ස අනන්තරූප නිස්සය පච්චයෙන පච්චයො.**

(සෝවාන් මාර්ග උපදනා චිත්ත වීථියෙහි ගොත්‍රභූ චිත්තය, එයට අනතුරුව උපදනා සෝවාන් මාර්ග චිත්තයට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. වොදානං මග්ගස්ස අනන්තරූපනිස්සය පච්චයෙන පච්චයො.**

(සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන මාර්ග චිත්තයන් උපදනා චිත්ත වීථීන්හි වොදාන චිත්තය එයට අනතුරුව උපදනා මාර්ග චිත්තයට අනන්තරූප නිස්සය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

මෙහි අනුලොම, ගොත්‍රභූ වොදාන චිත්තයෝ ලෞකික කුසලයෝ වෙති. මාර්ග චිත්තයෝ ලොකොත්තර කුසලයෝ වෙති. මෙසේ ලෞකික කුසල ධර්මයෝ ලෞකික කුසල ධර්මයන්ට හා ලොකොත්තර කුසල ධර්මයන්ටද අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම 'කුසල ධර්මය කුසල ධර්මයට අනන්තරූපනිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම'' යයි කියනු ලැබේ.

**පකතූපනිස්සය ප්‍රත්‍යය**

**1. සද්ධං උපනිස්සාය දානං දෙති.**

(ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලය දාන චෙතනා ප්‍රධාන කාමාවචර කුසලයට ප්‍රකෘතෝප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

දන් දීමෙන් භවභොග සම්පත් ලැබිය හැකි බව දැන, දන්දෙනු කැමති කල්හි භවාඞ්ග චලන භවාඞ්ගු පච්ඡෙද-යන්ට අනතුරුව ආහාරපාන පරිෂ්කාරාදි දාන වස්තූන් අරමුණුකොට මනොද්වාරාවර්ජනයද, එයට අනතුරුව මහා කුසල් සිත් අටෙන් එක් සිතක් ජවන කෘත්‍යයෙන් සත් වරක්ද ඉපිද නිරුද්ධ වූ පසු විභූතාරම්මණ වීථියක් නම් තදාරම්මණ දෙසිත ඉපිද අනතුරුව කාම භවාඞ්ගයෝ වෙත්. අවිභූතාරම්මණ වීථියක් නම් ජවනයට අනතුරුව භවාඞ්ගයෝ වෙත්. දන් දීමෙන් පසු ශ්‍රද්ධාව ප්‍රධාන ඒ කාමාවචර කුසලය ප්‍රත්‍යවෙක්‍ෂා කරන කල්හි, ඒ ප්‍රත්‍ය-වෙක්‍ෂා ජවනයන්ට ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලය ප්‍රකෘතෝප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

Free Distribution www.aathaapi.org

**2. සද්ධං උපනිස්සාය සීලං සමාදියති.**

(ශ්‍රද්ධාවෙන් සිල් සමාදන් වන කල්හි ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලය පඤ්චාඞ්ගශීල දශාඞ්ගශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලයට ප්‍රකෘතොප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. සද්ධං උපනිස්සාය උපොසථ කම්මං කරොති.**

(ශ්‍රද්ධාවෙන් පෙහෙවස් රක්නා කල්හි ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලය අෂ්ටාඞ්ග පෞෂධ ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලයට ප්‍රකෘතෝපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. සද්ධං උපනිස්සාය ඣානං උප්පාදෙති.**

(ශ්‍රද්ධාවෙන් ධ්‍යානය උපදවන කල්හි ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලය මහද්ගත ධ්‍යාන කුසලයට ප්‍රකෘතෝප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. සද්ධං උපනිස්සාය විපස්සනං උප්පාදෙති.**

(ශ්‍රද්ධාවෙන් විදර්ශනා වඩනා කල්හි ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලය විදර්ශනා කරන කාමාවචර කුසලයට ප්‍රකෘතෝපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. සද්ධං උපනිස්සාය මග්ගං උප්පාදෙති.**

ශ්‍රද්ධාවෙන් මාර්ගය උපදවන කල්හි ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලය ලොකොත්තර මාර්ග කුසලයට ප්‍රකෘතෝප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. සද්ධං උපනිස්සාය අභිඤ්ඤං උප්පාදෙති.**

(ශ්‍රද්ධාවෙන් අභිඥා උපදවන කල්හි ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලය කුසලාභිඥා සිත් පසට ප්‍රකෘතොප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**8. සද්ධං උපනිස්සාය සමාපත්තිං උප්පාදෙති.**

(ශ්‍රද්ධාවෙන් සමාපත්ති උපදවන කල්හි ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලය, කුසල සමාපත්ති අටට ප්‍රකෘතෝපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

දන්දීම, සිල් සමාදන්වීම, පෙහෙවස් රැකීම, ධ්‍යාන උපදවා ගැනීම, විදර්ශනා වැඩීම, ලොකොත්තර මාර්ග උපදවා ගැනීම අභිඥා උපදවා ගැනීම ධ්‍යාන සමාපත්තීන්ට සමවැදීම යනාදි කුසල ධර්මයන් කිරීමට දියුණු කරගත් ශ්‍රද්ධාව බලවත් උපකාරයෙකි. ශ්‍රද්ධාව නැති කල්හි දන්දීම් ආදි කුසල ක්‍රියාවන් කළ නොහැකි වේ. එසේ හෙයින් පූර්වයෙහි උපදවා ගත් ශ්‍රද්ධාව ප්‍රධාන කුසලය මෙකී කුසල චිත්තයන්ගේ උත්පාදයට බලවත් උපකාරයක් වේ යයි කියනු ලැබේ.

තවද,

**9. සීලං උපනිස්සාය දානං දෙති. සීලං සමාදියති, උපොසථකම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

පඤ්චාඞ්ග ශීල, දශාඞ්ග ශීල ප්‍රධාන කාමාවචර කුසලය, දාන චේතනා ප්‍රධාන කාමාවචර කුසලයටද, පඤ්චාඞ්ග ශීල දශාඞ්ගශීල ප්‍රධාන කාමාවචර කුසලයටද, අෂ්ටාඞ්ගාපොෂථ ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලයටද මහද්ගත ධ්‍යාන කුසලයටද, විදර්ශනා කරන කාමාවචර කුසලයටද ලොකොත්තර මාර්ග කුසලයටද, කුසලාභිඥා සිත් පසට ද, කුසල සමාපත්ති අටටද ප්‍රකෘතෝපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

පිරිසිදු ශීලයෙහි පිහිටි පුද්ගල තෙමේ එම ශීලමය කුසලය බලවත් උපකාරයක් කොට ගෙන, දන්දීම, සිල් සමාදන් වීම, පෙහෙවස් රැකීම, ධ්‍යාන උපදවා ගැනිම, විදර්ශනා වැඩීම, ලොකොත්තර මාර්ග උපදවා ගැනීම, අභිඥා උපදවා ගැනීම, ධ්‍යාන සමාපත්තියට සමවැදීම යනාදි කුසලයන් කරන්නේය.

**10. සුතං උපනිස්සාය දානං දෙති, සීලං සමාදියති, උපොසථකම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

(ශ්‍රැතමය ප්‍රඥව ප්‍රධාන කාමාවචර කුසලය, දානචේතනා ප්‍රධාන කාමාවචර කුසලයටද, අෂ්ටාඞ්ග පොෂථ ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලයටද, මහද්ගත ධ්‍යාන කුසලයටද, විදර්ශනා කරන කාමාවචර කුසලයටද, ලොකොත්තර මාර්ග කුසලයටද, කුසලාභිඥ සිත් * පසටද, කුසලසමාපත්ති අටටද ප්‍රකෘතෝපනිශ්‍රය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාරවේ.)

**11. චාගං උපනිස්සාය දානං දෙති, සීලං සමාදියති, උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

(අලොභය ප්‍රධාන කාමාවචර කුසලය, දාන චේතනා ප්‍රධාන කාමාවචර කුසලයටද, පඤ්චාඞ්ග ශීල, දශාඞ්ග ශීල ප්‍රධාන කාමාවචර කුසලයටද, අෂ්ටාඞ්ග පෞෂථ ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලයටද, මහද්ගත ධ්‍යාන කුසලයටද, විදර්ශනා කරන කාමාවචර කුසලයටද, ලොකොත්තර මාර්ග කුසලයටද, කුසලාභිඥ සිත් පසටද, කුසල සමාපත්ති අටටද, ප්‍රකෘතොප නිශ්‍රය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

**12. පඤ්ඤං උපනිස්සාය දානං දෙති, සීලං සමාදියති උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

(ප්‍රඥව ප්‍රධාන ඥාණ සම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතර දාන චේතනා ප්‍රධාන කාමාවචර කුසලයටද, පඤ්චාඞ්ග ශීල දශාඞ්ග ශීල ප්‍රධාන කාමාවචර කුසලයටද, අෂ්ටාඞ්ග පොෂථ ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලයටද,

මහද්ගත ධ්‍යාන කුසලයටද, විදර්ශනා කරන කාමාවචර කුසලයටද, ලොකොත්තර මාර්ග කුසලයටද කුසලාභිඥා සිත් පසටද, කුසල සමාපත්ති අටටද ප්‍රකෘතෝපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

**13. සද්ධා, සීලං, සුතං, චාගො, පඤ්ඤා, සද්ධාය, සීලස්ස, සුතස්ස, චාගස්ස, පඤ්ඤාය, උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලයද, පඤ්චාඞ්ග ශීල, දශාඞ්ගශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලයද, ශ්‍රැතමය ප්‍රඥාව ප්‍රධාන කාමාවචර කුසලයද, අලොභය ප්‍රධාන කාමාවචර කුසලයද, ප්‍රඥාව ප්‍රධාන ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතරද, ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුසලයටද, පඤ්චාඞ්ග ශීල, දශාඞ්ග ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලයටද, ශ්‍රැතමය ප්‍රඥාව ප්‍රධාන කාමාවචර කුසලයටද, අලොභය ප්‍රධාන කාමාවචර කුසලයටද, ප්‍රඥාව ප්‍රධාන ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතරටද ප්‍රකෘතෝපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ කුසල ධර්මය කුසල ධර්මයට ප්‍රකෘතෝපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

තැවතද,

**1 පඨමස්ස ඣානස්ස පරිකම්මං පඨමස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රථම ධ්‍යානය ලබනු සඳහා පඨවිකසිණාදී භාවනා කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට ප්‍රථම ධ්‍යානයට උපනිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. දුතියස්ස ඣානස්ස පරිකම්මං දුතියස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(විතීයධ්‍යානය ලබනු සඳහා භාවනා කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට ද්‍රුතිය ධ්‍යානයට උපනිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. තතියස්ස ඣානස්ස පරිකම්මං තතියස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(තෘතීය ධ්‍යානය ලබනු සඳහා භාවනා කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට තෘතීය ධ්‍යානයට උපනිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

**4. චතුත්ථස්ස ඣානස්ස පරිකම්මං චතුත්ථස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(චතුර්ථධ්‍යානය ලබනු සඳහා භාවනා කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට චතුර්ථ ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. ආකාසානඤ්චායතනස්ස පරිකම්මං ආකාසානඤ්චායතනස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ආකාසානඤ්චායතන ධ්‍යාන ලබනු සඳහා භාවනා කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට ආකාසානඤ්චායතන ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. විඤ්ඤාණඤ්චායතනස්ස පරිකම්මං විඤ්ඤාණඤ්චායතනස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ලබනු සඳහා භාවනා කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. ආකිඤ්චඤ්ඤායතනස්ස පරිකම්මං ආකිඤ්චඤ්ඤායතනස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය ලබනු සඳහා භාවනා කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**8. නෙවසඤ්ඤානාසඤ්ඤායතනස්ස පරිකම්මං නෙවසඤ්ඤානාසඤ්ඤායතනස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය සඳහා භාවනා කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට නෙවසඤ්ඤානා-සඤ්ඤායතන ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**9. පඨමං ඣානං දුතියස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රථම ධ්‍යාන කුසල චිත්තය ද්විතීය ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**10. දුතියං ඣානං තතියස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ද්විතීයධ්‍යාන කුසල චිත්තය තෘතීය ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**11. තතියං ඣානං චතුත්ථස්ස ඣානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(තෘතීයධ්‍යාන කුසල චිත්තය චතුර්ථ ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**12. චතුත්ථං ඣානං ආකාසානඤ්චායතනස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(රූපාවචර චතුර්ථධ්‍යාන කුසල චිත්තය ආකාසානඤ්චායතන ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**13. ආකාසානඤ්චායතනං විඤ්ඤාණඤ්චායතනස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**



Free Distribution www.aathaapi.org

(ආකාසානඤ්චායතන කුසල චිත්තය විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**14. විඤ්ඤාණඤ්චායතනං ආකිඤ්චඤ්ඤායතනස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තය ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**15. ආකිඤ්චඤ්ඤායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙයින් රූපාවචර ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානයටද, ද්විතීය ධ්‍යානය තෘතීය ධ්‍යානයටද, තෘතීය ධ්‍යානය චතුර්ථධ්‍යානයටද, රූපාවචර චතුර්ථධ්‍යානය අරූපාවචරවූ ආකාසානඤ්චායතනයටද, ආකාසානඤ්චායතන ධ්‍යානය විඤ්ඤාණඤ්චායතනයටද, විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයටද, ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයටද, උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන බව දක්වන ලදී. මෙයද "කුසල ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

තවද,

**1. දිබ්බස්ස චක්ඛුස්ස පරිකම්මං දිබ්බස්ස චක්ඛුස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(දිවැස් හෙවත් දිව්‍යචක්ෂුරභිඥනය ලබනු සඳහා භාවනා හෙවත් පරිකර්ම කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට, දිව්‍ය චක්ෂුරභිඥනයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. දිබ්බාය සොත ධාතුයා පරිකම්මං දිබ්බාය සොත ධාතුයා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(දිබ්බසොත අභිඥාව ලබනු සඳහා පරිකර්ම කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට දිබ්බසොත අභිඥාවට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**3. ඉද්ධිවිධඤාණස්ස පරිකම්මං ඉද්ධිවිධඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ඉර්ධිවිධඥානය ලබනු සඳහා පරිකර්ම කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට ඉර්ධිවිධඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. චෙතොපරියඤාණස්ස පරිකම්මං චෙතොපරියඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(පරසිත් දන්නා නුවණ හෙවත් චේතොපරිය ඥානය ලබනු සඳහා පරිකර්ම කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට චේතොපරිය ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. පුබ්බෙනිවාසානුස්සති ඤාණස්ස පරිකම්මං පුබ්බෙනිවාසානුස්සති ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(පූර්වේනිවාසානුස්මෘති ඥානය ලබනු සඳහා පරිකර්ම කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට පූර්වේනිවාසානුස්සති ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. යථා කම්මූපගඤාණස්ස පරිකම්මං යථා කම්මූපග ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(යථා කම්මූපග කුසලාභිඥාව ලබනු සඳහා පරිකර්ම කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට යථා කම්මූපග කුසලාභිඥාවට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. අනාගතංසඤාණස්ස පරිකම්මං අනාගතංස ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

Free Distribution www.aathaapi.org

(අනාගතංස කුසලාභිඥාව ලබනු සඳහා පරිකර්ම කිරීමේදී උපදනා මහා කුසල් සිත් අට අනාගතංස කුසලාභිඥාවට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙයින් දිව්‍ය චක්ෂුරභිඥානය, දිව්‍ය ශ්‍රොතඥානය, ඉද්ධි විධඥානය, චෙතොපරිය ඥානය, පූර්වේනිවාසානුස්සති ඥානය, යථා කම්මූපගඥානය, අනාගතංසඥානය යන අභිඥාවන් උපදවා ගැනීමේදී ඒ සඳහා පරිකර්ම වශයෙන් භාවනා කරන කල්හි උපදනා මහා කුසල චිත්තයෝ එකී අභිඥාවන් උපදවා ගැනීමට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බව දක්වන ලදී.

මෙයද "කුසල ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

තවද,

**1. දිබ්බචක්ඛු දිබ්බාය සොත ධාතුයා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(දිව්‍යචක්ෂුරභිඥානය, දිව්‍යශ්‍රොත අභිඥාව උපදවා ගැනීමට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. දිබ්බසොත ධාතු ඉද්ධිවිධඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(දිව්‍යශ්‍රොත ඥානය, ඉද්ධිවිධ ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ඉද්ධිවිධ ඤාණං චෙතොපරිය ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ඉද්ධිවිධඥානය චෙතොපරිය ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. චෙතොපරිය ඤාණං පුබ්බෙනිවාසානුස්සති ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(චේතොපරිය ඥානය, පූර්වේනිවාසානුස්සති ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. පුබ්බෙනිවාසානුස්සති ඤාණං යථා කම්මූපග ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(පූර්වේනිවාසානුස්මෘති ඥානය යථාකම්මූපග ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. යථා කම්මූපග ඤාණං අනාගතංස ඤාණස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(යථා කම්මූපග ඥානය අනාගතංස ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙයින් දිව්‍යචක්ෂුරභිඥානය උපනිශ්‍රය කොට ගෙන දිව්‍යශ්‍රොතඥානය ඇතිවන සැටිත්, දිව්‍යශ්‍රොතඥානය උප-නිශ්‍රය කොට ගෙන ඉද්ධිවිධඥානය ඇතිවන සැටිත්, ඉද්ධි විධඥානය උපනිශ්‍රය කොට ගෙන චේතොපරිය ඥානය ඇතිවන සැටිත්, චේතොපරිය ඥානය උපනිශ්‍රය කොට ගෙන පූර්වේනිවාසානුස්සති ඥානය ඇතිවන සැටිත්, පූර්වේනිවාසානුස්සති ඥානය උපනිශ්‍රය කොට ගෙන යථා කම්මූපගඥානය ඇතිවන සැටිත්, යථා කම්මූපගඥානය උපනිශ්‍රය කොට ගෙන අනාගතංස ඥානය ඇතිවන සැටිත් දක්වන ලදී.

මෙයද "කුසල ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

තවද,

**1. පඨමස්ස මග්ගස්ස පරිකම්මං පඨමස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රථම මාර්ගය වූ සෝවාන් මාර්ග ඥානය ලබනු සඳහා පරිකර්ම වශයෙන් සමථ විදර්ශනා භාවනා කරන කල්හි උපදනා මහා කුසල් සිත් සොවාන් මාර්ග ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. දුතියස්ස මග්ගස්ස පරිකම්මං දුතියස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ද්‍විතීය මාර්ගය වූ සකෘදාගාමි මාර්ග ඥානය ලබනු සඳහා පරිකර්ම වශයෙන් සමථ විදර්ශනා භාවනා කරන කල්හි උපදනා මහ කුසල් සිත් සකෘදාගාමි මාර්ග ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේත්.)

**3. තතියස්ස මග්ගස්ස පරිකම්මං තතියස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(තෘතීය මාර්ගය වූ අනාගාමි මාර්ග ඥානය ලබනු සඳහා පරිකර්ම වශයෙන් සමථ විදර්ශනා භාවනා කරන කල්හි උපදනා මහා කුසල් සිත් අනාගාමි මාර්ග ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේත්.)

**4. චතුත්ථස්ස මග්ගස්ස පරිකම්මං චතුත්ථස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(චතුර්ථ මාර්ගය වූ අර්හත් මාර්ග ඥානය ලබනු සඳහා පරිකර්ම වශයෙන් සමථ විදර්ශනා භාවනා කරන කල්හි උපදනා මහා කුසල් සිත් අර්හත් මාර්ග ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේත්.)

මෙයින් සොවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර මාර්ග ඥානයන් ලබනු සඳහා පරිකර්ම වශයෙන් සමථ විදර්ශනා භාවනා කිරීමේදී උපදනා මහ කුසල් සිත් අට එකී සතර මාර්ග ඥානයන් ලැබීමට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බව දක්වන ලදි.

මෙයද "කුසල ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

තවද,

**1. පඨමො මග්ගො දුතියස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රථම මාර්ගය වූ සෝවාන් මාර්ග ඥානය, ද්විතීය මාර්ගය වූ සකෘදාගාමි මාර්ග ඥානය ලැබීමට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. දුතියො මග්ගො තතියස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ද්විතීය මාර්ගය වූ සකෘදාගාමි මාර්ග ඥානය, තෘතීය මාර්ගය වූ අනාගාමි මාර්ග ඥානය ලැබීමට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. තතියො මග්ගො චතුත්ථස්ස මග්ගස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

තෘතීය මාර්ගය වූ අනාගාමි මාර්ග ඥානය චතුර්ථ මාර්ගය වූ අර්හත් මාර්ග ඥානයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසින් සෝවාන් මාර්ග ඥානය, සකෘදාගාමි මාර්ග ඥානයටද, සකෘදාගාමි මාර්ග ඥානය, අනාගාමි මාර්ග ඥානයටද, අානාගාමි මාර්ග ඥානය, අර්හත් මාර්ගඥානයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බව දක්වන ලදී.

මෙයද "කුසල ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

තවද,

**1. සෙක්ඛා මග්ගං උපනිස්සාය අනුප්පන්නං සමාපත්තිං උප්පාදෙන්ති, උප්පන්නං සමාපජ්ජන්ති, සඞ්ඛාරෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්‍ෂ වූ සෝවාන්, සකෘදාගාමි, අනාගාමි ආර්‍යයන් වහන්සේලා තම තමන්ගේ මාර්ගය උපනිශ්‍රය කොට ගෙන පෙර නූපදවන ලද ධ්‍යාන සමාපත්තීන් උපදවත්. උපදවා ගත් සමාපත්තීන්ට නැවත නැවත සමවදිත්. සංස්කාර ධර්මයන් අනිත්‍ය වශයෙන්ද, දුක්ඛ වශයෙන්ද, අනාත්ම වශයෙන්ද විදර්ශනා කරත්.)

ශෛක්ෂයන් වහන්සේලා තම තමන්ගේ මාර්ගයෙන් නසන ලද කෙලෙස් ඇති හෙයින්, විවේක සුවය සඳහා රූපාවචර අරූපාවචර ධ්‍යාන උපදවත්. මෙයින් ඒ ආර්යයන් වහන්සේලා විසින් මාර්ග ලැබීමට පෙර කිසිම ධ්‍යාන සමාපත්තියක් උපදවාගෙන නැතැයි අදහස් නොකරන ලදි. රූපාවචර අරූපාවචර අෂ්ට සමාපත්තීන් අතුරෙන් යම් කිසි සමාපත්තියක් එයට පෙර නොලැබුනේ නම්, ඒ සමාපත්තීන් උපදවා ගැනීමේදී මාර්ග කුසලය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බව මේ අනුවාදයෙන් පළවේ. මෙසේ ලොකොත්තර කුසලයන් රූපාවචර අරූපාවචර කුසලයන් උපදවා ගැනීමට බලවත් උපකාරයක් වන බව දක්වන ලදි. මෙසේද "කුසල ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බව දත යුතු.

**2. මග්ගො සෙක්ඛානං අත්ථපටිසම්භිදාය, ධම්ම පටිසම්භිදාය, නිරුත්ති පටිසම්භිදාය, පටිභාන පටිසම්භිදාය, ඨානාඨාන කොසල්ලස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(මාර්ග ඥානය, ශෛක්ෂ පුද්ගලයන්ට අර්ථ ප්‍රතිසම්භිදාව, ධර්මප්‍රතිසම්භිදාව, නිරුක්ති ප්‍රතිසම්භිදාව, ප්‍රතිභාන ප්‍රතිසම්භිදාව යන සතර ප්‍රතිසම්භිදා ඥානයටද, ඨානාඨාන කොසල්ල නම් වූ ඥාණයටද, උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

මෙහි ප්‍රත්‍යයයෙන් හටගත් දෙය, නිවණ කියන ලද දෙයෙහි අර්ථය, විපාකය, ක්‍රියාය යන මේ පඤ්චවිධ කරුණු පිළිබඳ අර්ථයන්ගේ ප්‍රභෙදයට ගිය ඥානය අර්ථ ප්‍රතිසම්භිදා නමි.

ප්‍රත්‍යය ධර්ම, ආර්ය මාර්ගය, කියනලද්ද, කුසල්, අකුසල් යන කරුණු පසෙහි ප්‍රභෙදගත ඥානය ධර්ම ප්‍රතිසම්භිදා නමි.

එම අර්ථ, ධර්මයන් දෙසන ලද භාෂාවන්හි ප්‍රභේදගත ඥානය **නිරුක්ති ප්‍රතිසම්භිදා** නම්.

අර්ථ, ධර්ම, නිරුක්ති යන ත්‍රිවිධ ප්‍රතිසම්භිදාවන්හි ප්‍රභේද ගත ඥානය **ප්‍රතිභාන ප්‍රතිසම්භිදා** නම්.

ස්ථාන අස්ථානයන්හි දක්ෂ බව ලක්ෂණකොට ඇති ඥානය **ඨානාඨාන කොසල්ලඤාණ** නම්.

ලොකොත්තර වූ මාර්ගඥාන ඇතිකල්හිම ප්‍රතිසම්භිදා ඥාන ඇතිවන බැවින් ලොකොත්තර මාර්ග නම්වූ කුසල ධර්මය ප්‍රතිසම්භිදා ඥානාදිවූ කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බව දතයුතු.

මෙසේ නොයෙක් ආකාරයෙන් කුසල ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**2. දුතිය:—**

**කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො - ආරම්මණූපනිස්සයො, පකතූපනිස්සයො.**

(කුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණූපනිශ්‍රය, පකතූපනිශ්‍රය යන උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්ති දෙකෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්මයට **උපනිශ්‍රය ප්‍රත්‍යය** ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම් ලෞකික කුසල් සතළොසය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:-

අකුසල් සිත් දොළොසය.

චෛතසික සත්විස්සය.

යන අකුසල ධර්මයෝ යි.

**ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය-**

**1. දානං දත්වා, සීලං සමාදියිත්වා, උපොසථ කම්මං-කත්වා තං ගරුංකත්වා අස්සාදෙති, අභිනන්දති, තං ගරුංකත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(දන්දී, සිල්සමාදන්ව, පෙහෙවස් රැක, ඒ කුසල කර්මය ගරුකොට ලොභ මූල සොම්නස් සිතින් ආස්වාදනය කරන කල්හිද, ප්‍රීතිය ප්‍රධාන ලොභ මූල සිතින් එයට සතුටුවන කල්හිද, උපදනා රාගය ප්‍රධාන ලොභ මූල සිත් අටවිද, දෘෂ්ටිය ප්‍රධාන ලොභ මූල සිත් සතරටද ඒ කුසලකර්මය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

දානාදීවූ පින්කම් කොට මා විසින් මෙබඳු උසස් පින්කමක් කරගන්නා ලද්දේය යි ඒ කාමාවචර කුසලය ලොභ සිතින් ආස්වාදනය කරන කල්හි ලොභ මූල සොමනස්සසහගත සිත් සතරෙන් එක් සිතක් ජවන කෘත්‍යයෙන් උපදී. එපරිද්දෙන්ම මගේ පින ඉතා හොඳයයි ඒ පින ගැන සතුටුවන කල්හි ප්‍රීතිසහගත වූ ලොභ මූල සිතක් ජවන කෘත්‍යයෙන් උපදී. ඒ පිනට ඇලුම් කරන කල්හි රාගය ප්‍රධාන ලොභ මූල සිත් අටෙන් එකක් ජවන කෘත්‍යයෙන් උපදී. මම පිනක් කෙළෙමියි වරදවා ගන්නා කල්හි ලොභ මූල දෘෂ්ටි-සම්ප්‍රයුක්ත සිත් සතරෙන් එකක් ජවන කෘත්‍යයෙන් උපදී.

මෙසේ දානාදී කුසල් රැස්කොට පසුව ඒ කුසලය ආවජ්ජනා කරමින් නැවත නැවතත් එම කුසල් චිත්තයන් තම සන්තානයෙහි උපදවාගෙන අපරචේතනා වශයෙන් බහුල කර නොගෙන, ඒ කුසලය අරමුණු කරමින් ගරුකොට සලකමින් ලොභ සිතින් ආස්වාදනය අභිනන්ද-නාදිය කොට රාග දිට්ඨි යනාදී අකුසලයන් උපදවා ගැනීමේදී "කුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නේ ය"යි කියනු ලැබේ.

**2. පුබ්බෙ සුචිණ්ණානි ගරුං කත්වා අස්සාදෙති, අභිනන්දති තං ගරුංකත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(පෙර මනාකොට පවත්වන ලද දාන, සීල, අෂ්ටාඞ්ගසීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය ගරුකොට අරමුණු කරමින් ලෝභ මූල සෝමනස් සිතින් ආස්වාදනය කරන කල්හිද, ඒ කුසලය ගරුකොට අරමුණු කරන කල්හි උපදනා රාගය ප්‍රධාන ලෝභ මූල සිත් අටටද දෘෂ්ටිය ප්‍රධාන ලෝභ මූල සිත් සතරටද ඒ කුසලය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ඣානා වුට්ඨහිත්වා ඣානං ගරුංකත්වා අස්සාදෙති, අභිනන්දති, තං ගරුංකත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(රූපාවචර ධ්‍යාන පසය, අරූපාවචර ධ්‍යාන සතරය යන නවවිධ වූ මහද්ගත ධ්‍යාන කුසලයන් උපදවා එයින් නැගී එම ධ්‍යාන චිත්තය ගරුකොට අරමුණු කරමින් ලෝභ මූල සෝමනස් සිතින් ආස්වාදනය කරන කල්හිද, ප්‍රීතිය ප්‍රධාන ලෝභ මූල සිතින් එයට සතුටුවන කල්හිද, ඒ මහද්ගත කුසලය ගරුකොට අරමුණු කරන කල්හි උපදනා රාගය ප්‍රධාන ලෝභ මූල සිත් අටටද, දෘෂ්ටිය ප්‍රධාන ලෝභ මූල සිත් සතරටද, ඒ මහද්ගත කුසලය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**පකතූපනිශ්‍රය ප්‍රත්‍යය.**

**1. සද්ධං උපනිස්සාය මානං ජප්පෙති, දිට්ඨිං ගණ්හාති.**

(ශ්‍රද්ධාව නිසා මානය පවත්වන කල්හිද, දෘෂ්ටිය උපදවන කල්හිද, එම ශ්‍රද්ධාව, මාන දිට්ඨි ආදී අකුසල ධර්මයන්ට ප්‍රකෘතෝපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

"මට ශ්‍රද්ධාව ඇත, මට මෙන් අන්‍යයන්ට මේ ශ්‍රද්ධාව නැත" යනාදි වශයෙන් තමා උසස් කොට ගැනීම් වශයෙන් ශ්‍රද්ධාව නිසා මානය උපදී. ශ්‍රද්ධාව, අර්ථ වශයෙන් මනාකොට තේරුම් නොගෙන, එම කුසලය කරන්නාවූ ද, එහි විපාක විඳින්නාවූ ද, පුද්ගලයෙකු ඇතැයි යනාදි වශයෙන් වැරදි අදහස් උපදනා කල්හි දෘෂ්ටිය උපදී. මෙසේ ඇති කල්හි ශ්‍රද්ධාව නම් වූ කුසල ධර්මය, මාන දිට්ඨි ආදී වූ අකුසලයන්ට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**2. සීලං උපනිස්සාය මානං ජප්පෙති, දිට්ඨිං ගණ්හාති.**

(ශීලය නිසා මානය පවත්වන කල්හිද, දෘෂ්ටිය උපදවන කල්හිද, එම ශීලය, මාන දිට්ඨි ආදී වූ අකුසල ධර්මයන්ට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**3. සුතං උපනිස්සාය මානං ජප්පෙති දිට්ඨිං ගණ්හාති.**

(ශ්‍රැතය නිසා මානය පවත්වන කල්හිද, දෘෂ්ටිය උපදවන කල්හිද, එම ශ්‍රැතමය කුසලය මාන දිට්ඨි ආදී වූ අකුසල ධර්මයන්ට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. චාගං උපනිස්සාය මානං ජප්පෙති දිට්ඨිං ගණ්හාති.**

(ත්‍යාගය නිසා මානය පවත්වන කල්හිද, දෘෂ්ටිය උපදවන කල්හිද, එම ත්‍යාගමය කුසලය, මාන දිට්ඨි ආදී වූ අකුසල ධර්මයන්ට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

**5. පඤ්ඤං උපනිස්සාය මානං ජප්පෙති දිට්ඨිං ගණ්හාති.**

(ප්‍රඥව නිසා මානය පවත්වන කල්හිද, දෘෂ්ටිය උපද-වන කල්හිද, එම ප්‍රඥමය කුසලය, මානදිට්ඨි ආදී වූ අකුසල ධර්මයන්ට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ මම සිල්වතෙක්මි යයි ද, උගතෙක්මි යයි ද, දෙන කෙනෙක්මි යයි ද, නුවණ ඇත්තෙක්මි යයි ද මානය උපදී. මම සිල් රකින්නෙමි යනාදි වශයෙන් වරදවා ගැනීමේදී දෘෂ්ටිය උපදී.

**6. සද්ධා, සීලං, සුතං, චාගො, පඤ්ඤා, රාගස්ස, දොසස්ස, මොහස්ස, මානස්ස, දිට්ඨියා, පත්ථනාය උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ශ්‍රද්ධාව, ශීලය, ශ්‍රැතය, ත්‍යාගය, ප්‍රඥාව, යන මේ කුසල ධර්මයෝ රාගයටද, ද්වේෂයටද, මෝහයටද, මානයටද, දිට්ඨියටද, භවභොග සම්පත්හි පවත්නා වූ ලෝභයටද යන අකුසල ධර්මයන්ට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

ශ්‍රද්ධාදිය නිසා තමා උසස් කොට ගන්නා කල්හි ලෝභය හෙවත් රාගය උපදී. අනුන් පහත්කොට සලකන කල්හි ද්වේෂය උපදී. මේ දෙකම ඇතිකල්හි මෝහය උපදී. තමන්ට මෙන් අන්‍යයන්ට ශ්‍රද්ධාදිය නැතැයි සිතන කල්හි මානය උපදී. එම කුසලයෝ පුද්ගලයන්ගේ වශයෙන් ගන්නා කල්හි දිට්ඨිය උපදී. ඒ කුසලයන් නිසා භවභොග සම්පත් ප්‍රාර්ථනා කිරීමේදී ප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත වූ ලෝභය උපදී. මෙසේ ශ්‍රද්ධාදී වූ කුසල ධර්මයෝ රාගාදී වූ අකුසල ධර්මයන්ට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අකුසල ධර්මයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන කුසල ධර්මයෝ නම් ලෞකික කුසලයෝ පමණෙකි. ලෝකොත්තර වූ කුසලය, ශාන්ත බැවින් ද ප්‍රණීත බැවින් ද, උත්තම බැවින් ද, අකුසල් නසන හෙයින් ද, අකුසල ධර්මයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය නොවේ.

නිවන් පැතීම මෙකී ප්‍රාර්ථනාවට ඇතුළත් නොවේ. නිවනට පැමිණීමේදී තෘෂ්ණාව සහමුලින්ම නැතිවේ. එහි ඇත්තේ නිර්වාණ ධාතුවට පැමිණීමේ කැමැත්ත නම් වූ ඡන්දයයි. එයට ඡන්ද පත්ථනායයි ද කියනු ලැබේ.

Free Distribution www.aathaapi.org

3. වීරිය.

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො, ආරම්මණූපනිස්සයො-අනන්තරූප නිස්සයො-පකතූපනිස්සයො.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණූපනිශ්‍රය, අනන්තරූපනිශ්‍රය, පකතූපනිශ්‍රය යන උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්ති තුනෙන්ම උපකාර වේ.)

**ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය.**

**අරහා මග්ගා වුට්ඨහිත්වා මග්ගං ගරුංකත්වා පච්චවෙක්ඛති.**

(රහතන් වහන්සේ අර්හත් මාර්ගය උපදවාගෙන එය ගරුකොට ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි, ඒ ප්‍රත්‍යවෙක්ෂා ක්‍රියා ජවනයන්ට අර්හත් මාර්ග කුසලය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

රහතන්වහන්සේ තමක් උපදවාගත් අර්හත් මාර්ග කුසලය ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි භවාඞ්ගචලන භවාඞ්ගු-පච්ඡේදයන්ට අනතුරුව අර්හත් මාර්ග කුසලය අරමුණු කරමින් මනොද්වාරාවර්ජන චිත්තය ඉපිද නිරුද්ධ වේ. එයට අනතුරුව කාමාවචර මහා ක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිතක් ප්‍රත්‍යවෙක්ෂා ජවන කෘත්‍යයෙන් අර්හත් මාර්ග කුසලය අරමුණු කරමින් සත්වරක් ඉපිද නිරුද්ධ වේ. එයට පසු භවාඞ්ගය වේ. මෙහිදී උපදනා කාමාවචර ක්‍රියා ජවනයන්ට අර්හත් මාර්ග කුසලය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මෙහි ප්‍රත්‍යය ධර්මය වශයෙන් අර්හත් මාර්ග චිත්තයද, ප්‍රත්‍යයොත්පන්න ධර්ම වශයෙන් කාමාවචර ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා ජවනයෝද දතයුතු.

**අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය.**

**1. කුසලං වුට්ඨානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(සතළොස් ලෞකික කුසලයන්ගේ අන්තිම ජවනය, එයට අනතුරුව උපදනා තදාරම්මණයට හෝ භවාඞ්ගයට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. මග්ගො ඵලස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ලෝකෝත්තර මාර්ග සිත් සතර එයට අනතුරුව උපදනා ලෝකෝත්තර ඵල චිත්තයට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. අනුලොමං සෙක්ඛාය ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(සංස්කාර ධර්මයන් අරමුණු කරමින් අනුලෝම කෘත්‍යයෙන් උපදනා මහා කුසල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ශෛක්‍ෂවූ සෝවාන්, සකෘදාගාමි, අනාගාමි ඵල සමාපත්තියට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලං ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(නිරෝධ සමාපත්තියෙන් නැගිටිනාවූ අනාගාමි පුද්ගලයාගේ නෛවසඤ්ඤානාසඤ්ඤායතන කුසලය අනාගාමි ඵල සමාපත්තියට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**මේ අනුවාදයන්ගෙන් දක්වන ලද පරිදි අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය වන කුසල ධර්මයෝ නම්—**

සතළොස් ලෞකික කුසලයන්ගේ අන්තිම ජවනයෝය
ලෝකෝත්තර මාර්ග ජවන් සතරය

**ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—**

සන්තීරණ සිත් තුනය.
මහා විපාක අටය.
ඵල සිත් සතරය

**යන අව්‍යාකෘත ධර්මයෝය.**

**පකතූපනිශ්‍රය ප්‍රත්‍යය**

**1. සද්ධං උපනිස්සාය අත්තානං ආතාපෙති, පරිතාපෙති, පරියිට්ඨිමූලකං දුක්ඛං පච්චනුභොති.**

ශ්‍රද්ධාව නිසා තමා තවයි. හාත්පසින් තවයි, ප්‍රත්‍යය සෙවීම මුල්කොට ඇති දුක් විඳී.)

බලවත් ශ්‍රද්ධා ගුණයෙන් යුක්ත වූ පුද්ගලතෙමේ, ඒ ශ්‍රද්ධාව නිසා ශීතොෂ්ණාදිය නොසලකා වත් පිළිවෙත් ආදිය කිරීමෙන් තමා තවයි. ශ්‍රද්ධාදියෙන් දානාදී පින්කම් කිරීම සඳහා වස්තු සැපයීම පිණිස නොයෙක් දුක් විඳී.

මෙහිදී ශ්‍රද්ධාව ප්‍රධාන කුසලය දුක්ඛසහගත කායවිඥානය නම් වූ අව්‍යාකෘත ධර්මයට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**2 සීලං උපනිස්සාය අත්තානං ආතාපෙති, පරිතාපෙති, පරියිට්ඨිමූලකං දුක්ඛං පච්චනුභොති.**

(සීලය නිසා තමා තවයි, හාත් පසින් තවයි, ප්‍රත්‍යය සෙවීම මුල්කොට ඇති දුක් විඳී.)

සිල් රකිනු කැමති පුද්ගලතෙමේ හොඳින් සිල් රැකීම පිණිස අභ්‍යවකාශ, වෘක්ෂමූල ආදී තන්හි වාසය කරන්නේ බොහෝ වූ තිරිහැර විඳිමින් තමා තවයි. ඒ සඳහාම ප්‍රත්‍යය සෙවීම පිණිසද නොයෙක් දුක් විඳී.

**3. සුතං උපනිස්සාය අත්තානං ආතාපෙති, පරිතාපෙති, පරියිට්ඨිමූලකං දුක්ඛං පච්චනුභොති.**

(බහුශ්‍රැත භාවය නිසා තමා තවයි, හාත්පසින් තවයි, ප්‍රත්‍යය සෙවීම මුල්කොට ඇති දුක් විඳී.)

බහුශ්‍රැත පුද්ගල තෙමේ තමාගේ බහුශ්‍රැත භාවයෙන් ප්‍රයෝජනය ගැනීම සඳහා බොහෝ වෙහෙස දරා උගැන්වීම්, දහම් දෙසීම් ආදියෙන් තමා තවයි. තමා දැනගත් ධර්මයට අනුව පිළිවෙත් පිරීම සඳහා පිණ්ඩචරණාදියෙන් ජීවත්වෙමින් නොයෙක් දුක් විඳී.

**4. චාගං උපනිස්සාය අත්තානං ආතාපෙති, පරිතාපෙති, පරියිට්ඨිමූලකං දුක්ඛං පච්චනුභොති.**

(ත්‍යාගවත් භාවය නිසා තමා තවයි, හාත්පසින් තවයි. ප්‍රත්‍යය සෙවීම මුල්කොට ඇති දුක් විඳී.)

ත්‍යාගවත් තැනැත්තේ තමාගේ ත්‍යාගවත් භාවය නිසා දිවිරැකීම පිණිසද ප්‍රත්‍යය ඉතිරිකර නොගෙන දන් දීමෙන්ද, අඞ්ගප්‍රත්‍යඞ්ගයන් පරිත්‍යාග කිරීමෙන්ද තමා තවයි. දන්දීම් සඳහා වස්තු සෙවීම් වශයෙන්ද නොයෙක් දුක් විඳී

**5. පඤ්ඤං උපනිස්සාය අත්තානං ආතාපෙති. පරිතාපෙති පරියිට්ඨිමූලකං දුක්ඛං පච්චනුභොති.**

(ප්‍රඥව නිසා තමා තවයි. හාත්පසින් තවයි. ප්‍රත්‍යය සෙවීම මුල් කොට ඇති දුක් විඳී.)

ප්‍රඥවත් තැනැත්තේද තමාගේ ප්‍රඥව වඩාත් දියුණු කරගතයුතු යයි ශීතෝෂ්ණාදිය ගණන් නොගෙන සජ්ඣායන මනසිකාර ආදියෙන් තමා තවයි. මිථ්‍යා ජීවයෙහි ආදීනව හා සම්‍යග්ආජීවයෙහි අනුසස්ද දැක දැහැමින් දිවිපැවැත්ම සඳහා ප්‍රත්‍යය සෙවීම පිණිස නොයෙක් දුක් විඳී.

**6. සද්ධා සීලං සුතං චාගො පඤ්ඤා, කායිකස්ස සුඛස්ස කායිකස්ස දුක්ඛස්ස ඵල සමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ශ්‍රද්ධා, සීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥ යනාදි කුසල ධර්මයෝ ඇති කල්හි එයින් උපදවන ප්‍රණීත රූපයන්ගේ ස්පර්ශයෙන් ඇතිවන කායික සුඛයටද, ඒ ධර්මයන් නිසා තමා තැවීම්, හාත්පස තැවීම්, ප්‍රත්‍යය සෙවීම් ආදියෙන් ඇතිවන කායික දුක්ඛයටද, ඵලසමාපත්තියට සමවැදීමේදී ඵලචිත්තයන්ටද ශ්‍රද්ධාදී කුසල ධර්මයෝ පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. කුසලං කම්මං විපාකස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(කුසල කර්මය එහි විපාකයට උපනිශ්‍රය ප්‍රත්‍යශක්ති-යෙන් උපකාර වේ.)

බලවත් වූ කුසල චේතනා සඞ්ඛ්‍යාත කුසල කර්මය එහි විපාකයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බව මෙයින් දැක්වේ. මෙහි කර්මය නම් චතුර්භූමික කර්මයයි,

**8. අරහා මග්ගං උපනිස්සාය අනුප්පන්නං කිරිය සමාපත්තිං උප්පාදෙති, උප්පන්නං සමාපජ්ජති, සඞ්ඛාරෙ අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති.**

(රහතන් වහන්සේ අර්හත් මාර්ග ඥානය උපනිශ්‍රය කොට ගෙන නූපන් ලෞකික ක්‍රියා සමාපත්තීන් උපදවයි. උපන් ක්‍රියා සමාපත්තීන්ට සමවැදෙයි. සංස්කාර ධර්මයන් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය, වශයෙන් මහා ක්‍රියා සිතින් විදර්ශනා කරයි.)

රහතන් වහන්සේ විවේක සුව විඳිනු පිණිසද මේ අත් බැව්හිම නිවන් සුව විඳිනු පිණිසද නිරොධ සමාපත්තියට සමවදිනු කැමති වී නම්, රූපාවචර, අරූපාවචර ක්‍රියා ධ්‍යාන හෙවත් ක්‍රියා අෂ්ට සමාපත්තීන් උපදවා ගතයුතු. එබැවින් අර්හත්වය ලබාගැනීමට පෙර ක්‍රියා අෂ්ට සමාපත්තීන් උපදවා නොගත් බැවින් ඒ අර්හත් මාර්ග කුසලය උප නිශ්‍රය කොට ගෙන ක්‍රියා අෂ්ටසමාපත්තීන් උපදවාගනී. එහෙයින් අර්හත් මාර්ග කුසලය, රහත්මග නුවණ ලැබීමට පෙර නූපන් රූපාවචර අරූපාවචර ක්‍රියා සමාපත්තීන් උපදවාගැනීමට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ යයි කියනු ලැබේ. තවද, රහතන්වහන්සේ ඒ අර්හත් මාර්ග කුසලය උපනිශ්‍රය කොට ගෙන උපදවනලද ක්‍රියා අෂ්ටසමාපත්තීන්ට නැවත නැවතත් සමවදී. සංස්කාර ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් කාමාවචර මහා ක්‍රියා සිතින් විදර්ශනා කරයි. මෙයින් රහතන්වහන්සේ

Free Distribution www.aathaapi.org

අර්හත්වයට පැමිණීමට පෙර රූපාවචර අරූපාවචර ධ්‍යාන උපදවාගෙන නැතැයි නිශ්චය නොකට යුතුයි. උපදවා නොගත්තේ ක්‍රියා සමාපත්තීන් පමණය. එය අර්හත් මග නුවණ ලබාගත් පසුවම මිස එයට පූර්වයෙහි උපදවාගත නොහැකි වේ.

තවද, රහතන්වහන්සේ අර්හත් මාර්ගය උපනිශ්‍රය කොට ගෙන උපදවා ගත් ක්‍රියා සමාපත්තීන්ට නැවත නැවතත් සමවදී. සංස්කාර ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් විදර්ශනා කරන කල්හි ඥානසම්ප්‍රයුක්ත කාමාවචර මහා ක්‍රියා සිත් සතරෙන් එකක් විදර්ශනා ජවන් වශයෙන් උපදී. ඒ විදර්ශනා ක්‍රියා ජවනයන්ගේ පහළ වීමට අර්හත් මාර්ග ඥානය පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

**9 මග්ගො අරහතො අත්ථ පටිසම්භිදාය, ධම්ම-පටිසම්භිදාය, නිරුත්ති පටිසම්භිදාය, පටිභාණ පටි-සම්භිදාය, ඨානාඨාන කොසල්ලස්ස, උපනිස්සය පච්ච-යෙන පච්චයො.**

(මාර්ග කුසලය, රහතන්වහන්සේගේ අර්ථ ප්‍රතිසම්භිදා, ධර්මප්‍රතිසම්භිදා, නිරුක්ති ප්‍රතිසම්භිදා, ප්‍රතිභාන ප්‍රතිසම්භිදා, යන සිව් පිළිසිඹියාවන්ට හා ඨානාඨාන කොසල්ල ඥානයටද පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**10. මග්ගො ඵල සමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(මාර්ග කුසලය ඵල සමාපත්තියට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

සියලුම සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන ආර්යයන් වහන්සේලාට තමන් වහන්සේලා පැමිණි ලොකොත්තර ඵලයට සමවැදීමට ශක්තිය තිබේ. එසේ ඵලසමාපත්තියට සමවදිනු හැකි වන්නේ මාර්ග කුසලය පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන හෙයිනි.

Free Distribution www.aathaapi.org

ඵලසමාපත්තියට සමවදින කල්හි භවාඞ්ග චලන භවාඞ්ගු පච්ඡේදයන්ට අනතුරුව මනොද්වාරාවජ්ජන චිත්තයද එයට පසු අනුලෝම සිත් සතරක් හෝ තුනක් පිළිවෙලින් ඉපිද නිරුද්ධ වේ. අනුලෝම චිත්තයට අනතුරුව තමන් ගේ ඵලසිත් බොහෝ ගණනක් කැමති තාක් කල් සන්තති වශයෙන් උපදී. මෙයද අර්පණා චිත්ත වීථියකි.

මෙසේ බලවත් වූ කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන ධර්මයෝ විපාකසිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්ම-යන්ට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට උපනිඃසය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

4. වීථිය.

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො. ආරම්මණූපනිස්සයො අනන්තරූප නිස්සයො, පකතූපනිස්සයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට ආරම්මණූපනිස්සය, අනන්තරූප නිස්සය, පකතූපනිස්සය යන උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්ති තුනෙන් උපකාර වේ.)

මෙහි **ප්‍රත්‍යය ධර්ම** වශයෙන් ලැබෙන අකුසලයෝ නම්
අකුසල් සිත් දොළොසය.
චෛතසික සත්විස්සය.

යන අකුසල ධර්මයෝ යි.

ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් ලැබෙන්නේත් මේ අකුසල් සිත් දොළොස හා චෛතසික සත් විස්සය.

**ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය,**

**1. රාගං ගරුං කත්වා අස්සාදෙති, අභිනන්දති. තං ගරුං කත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති,**

(රාගය ගරුකොට ලොභසහගත සිතින් ආස්වාදනය කරන කල්හිද, ප්‍රීතිසහගත සිතින් එයට සතුටුවන කල්හිද, රාගය ප්‍රධාන ලොභමූල අකුසල් සිත්වලටද, වරදවා ගන්නා කල්හි දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරටද ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**2. දිට්ඨිං ගරුංකත්වා අස්සාදෙති, අභිනන්දති තං ගරුංකත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(දිට්ඨිය ගරුකොට ආස්වාදනය කරන කල්හිද, ප්‍රීති සහගත සිතින් එයට සතුටුවන කල්හිද රාගය ප්‍රධාන ලොභ මූල අකුසල සිත්වලටද, වරදවා ගන්නා කල්හි දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරටද, ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසින් රාගයත් දෘෂ්ටියත් අරමුණු කරමින් ආස්වාදන අභිනන්දනාදිය කරන කල්හි රාගයත් දෘෂ්ටියත් උපදනා බවත් පසුව උපදනා රාග, දෘෂ්ටි ආදීන්ට පළමු රාගයත් දෘෂ්ටියත් ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බවත් දක්වන ලදී. මෙය“ අකුසල ධර්මය අකුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම” යයි කියනු ලැබේ.

**අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය**

**පුරිමා පුරිමා අකුසලාඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ අකුසල නාමස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ නාමස්කන්ධයන්ට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

අකුසල ජවනයෝ උපදනා කල්හි එය චිත්ත වීථින්හි පළමුවන, දෙවන, තෙවන, සතරවන, පස්වන අකුසල ජවනයෝ දෙවන, තෙවන, සතරවන, පස්වන, සවන, සත්වන අකුසල ජවනයන්ට පිළිවෙළින් අනන්තරූප නිශ්‍රය

ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. මෙය ද, "අකුසල ධර්මය අකුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

මෙහි ප්‍රත්‍යය ධර්මයෝ නම් දොළොස් අකුසල් සිත් සහ සත්විසි චෛතසික ධර්මයෝ යි. ප්‍රත්‍යයොත්පන්න වශයෙන් ලැබෙන්නේත් ඒ දොළොස් අකුසල් සිත් සහ චෛතසික සත්විස්සමය.

**පකතූපනිශ්‍රය ප්‍රත්‍යය**

1. රාගං උපනිස්සාය පාණං හනති, අදින්නං ආදියති, මුසා භණති, පිසුණං භණති, ඵරුසං භණති, සම්ඵං පලපති, සන්ධිං ඡින්දති, නිල්ලොපං හරති, එකාගාරිකං කරොති, පරිපන්ථෙ තිට්ඨති, පරදාරං ගච්ඡති, ගාමඝාතං කරොති, නිගම ඝාතං කරොති, මාතරං ජීවිතා-වොරොපෙති, පිතරං ජීවිතා වොරොපෙති, අරහන්තං ජීවිතා වොරොපෙති, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙති, සංඝං භින්දති.

(රාගය උපනිශ්‍රයකොට අන්‍යයන්ගේ ප්‍රාණය නසයි, හිමියන් විසින් නුදුන් දෙය පැහැර ගනී, බොරු කියයි, කේලාම් කියයි, රළු වචන කියයි, නිරර්ථක කථා කරයි, ගෙවල් බිඳී, සැඟවී සිට පැහැරගනී, බොහෝදෙනා එක්ව එක් ගෙයක් වටකොට වස්තුව පැහැරගනී, මග රැක සිට අනුන්ගේ වස්තුව උදුරා ගනී, පර භාර්‍යාවන් කරා යෙයි, ගම් කොල්ල කයි, නියම් ගම් කොල්ලකයි, මව ජීවිතයෙන් තොර කරයි, පියා ජීවිතයෙන් තොරකරයි, රහතුන් ජීවිතයෙන් තොර කරයි, දුෂ්ට සිතින් තථාගත ශරීරයෙහි ලේ උපදවයි, සංඝයා බිඳී)

රාගයෙන් මත්වූ පෘථග්ජනතෙම මොහයෙන් ද මුළා-වූයේ පරපණ නසයි. එකල්හි උපදනා ප්‍රාණඝාතක ද්වේෂ මූල චිත්තයට රාගය ප්‍රධාන ලොභමූල චිත්තය පකතූප-නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. එපරද්දෙන්ම

රාගය නිසා අදත්තාදානය හෙවත් හිමියන් විසින් නුදුන් දෙය පැහැර ගන්නා කල්හිද මුසාවාදය හෙවත් බොරු කියන කල්හිද, පිසුණාවාචය හෙවත් කේලාම් කීම කරන කල්හිද දෙලොස් අකුසල චිත්තයන්ටද; පරුෂවචන හෙවත් රළු වචන කියන කල්හි, ද්වේෂමූල චිත්තයටද, සම්ඵප්‍රලාප හෙවත් හිස් වචන කියන කල්හි දෙලොස් අකුසල චිත්තයන්ටද, ගෙවල් බිඳින කල්හිද, සැඟවී සිට අන්සතු වස්තුව පැහැර ගැනීමේදීද බොහෝ දෙන එක්ව එක් ගෙයක් වටකොට වස්තුව පැහැර ගැනීමේදීද, මඟ-රැක සිට අනුන්ගේ වස්තුවලුදුරා ගැනීමේදී ද අදත්තාදාන වශයෙන් දෙලොස් අකුසල චිත්තයන්ටද, පර භාර්‍ය්‍යාවන් කරා යාමෙහිදී කාමමිථ්‍යාචාර වශයෙන් උපදනා ලෝභමූල මෝහමූල චිත්තයන්ටද, ගම් කොල්ල කෑම නියම් ගම් කොල්ල කෑම යනාදිය කරන කල්හි දෙලොස් අකුසල චිත්තයන්ටද, මව ජීවිතයෙන් තොර කිරීම හෙවත් මාතෘ ඝාතක කර්‍මය කරන කල්හිද, පියා ජීවිතයෙන් තොර කිරීම හෙවත් පිතෘ ඝාතක කර්‍මය කරන කල්හිද, රහතුන් ජීවිතයෙන් තොර කිරීම නම් වූ අරහන්තඝාතක කර්‍මය කරන කල්හිද, දුෂ්ට සිතින් තථාගත ශරීරයෙහි ලේ උපදවීම නම් වූ ලෝහිතුප්පාදක කර්‍මය කරන කල්හිද, සංඝභෙද කර්‍මය කරන කල්හිද, ද්වේෂමූල අකුසල චිත්තයටද ඒ රාගය ප්‍රධාන ලෝභමූල චිත්තය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම "අකුසල ධර්‍මය අකුසල ධර්‍මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. දොසං උපනිස්සාය, මොහං උපනිස්සාය, මානං උපනිස්සාය දිට්ඨිං උපනිස්සාය, පත්ථනං උපනිස්සාය පාණං හණති, අදින්නං ආදියති, මුසා භණති, පිසුණං භණති, ඵරුසං භණති, සම්ඵං පලපති, සන්ධිං ඡින්දති, නිල්ලොපං හරති, එකාගාරිකං කරොති, පරිපන්ථෙ**

**තිට්ඨති, පරදාරං ගච්ඡති, ගාමඝාතං කරොති, නිගමඝාතං කරොති, මාතරං ජීවිතා වොරොපෙති, පිතරං ජීවිතා වොරොපෙති, අරහන්තං ජීවිතා වොරොපෙති, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙති, සඞ්ඝං භින්දති.**

(දෝෂය, මෝහය, මානය, දිට්ඨිය, ප්‍රාර්ථනාව යන අකුසල ධර්මයන් උපනිශ්‍රය කොට ගෙන ප්‍රාණඝාතය, අදත්තාදානය, මුසාවාදය, පිසුණාවාචය ඵරුෂා වාචය, සම්ඵප්‍රලාපය, ගෙවල් බිඳීමය, සැඟවී සිට පැහැර ගැනීමය, බොහෝ දෙනා එක්ව එක් ගෙයක් වටකොට වස්තු පැහැර ගැනීමය, මග රැක වස්තු පැහැර ගැනීමය, පරදාර කර්මය, ගාමඝාතක කර්මය, මාතෘඝාතක කර්මය, පිතෘඝාතක කර්මය, අරහන්තඝාතක කර්මය, ලොහිතුප්පාදක කර්මය, සංඝභේද කර්මය යන අකුසල කර්මයන් කරන කල්හි එකී දෝස, මෝහ, මාන, දිට්ඨි, පත්ථනා යන අකුසල ධර්මයෝ පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි **දෝෂය** යන්නෙන් දෝෂය ප්‍රධාන ද්වේෂමූල දෙසිතද, **මෝහය** යන්නෙන් මෝහය ප්‍රධාන අකුසල් දෙළොසද, **මානය** යන්නෙන් මානය ප්‍රධාන දිට්ඨි විප්‍රයුක්ත සිත් සතරද; **දිට්ඨිය** යන්නෙන් මිථ්‍යා දෘෂ්ටිය ප්‍රධාන දිට්ඨි සම්ප්‍රයුක්ත සිත් සතරද, **ප්‍රාර්ථනා** යන්නෙන් භවභෝග සම්පත් පිළිබඳ වූ ලෝභමූල සිත් අටද ගතයුතු.

**3. රාගො, දොසො, මොහො, මානො, දිට්ඨි, පත්ථනා රාගස්ස දොසස්ස, මොහස්ස මානස්ස, දිට්ඨියා, පත්ථනාය, උපනිස්සය පච්චයෙන පච්චයො.**

(රාගය, දෝෂය, මෝහය, මානය, දිට්ඨිය, ප්‍රාර්ථනාව යන මේ අකුසල ධර්මයෝ රාගයටද, දෝෂයටද, මෝහයටද, මානයටද, දිට්ඨියටද, ප්‍රාර්ථනාවටද, උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. පාණාතිපාතො පාණාතිපාතස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රාණඝාතක අකුසල කර්මය, ප්‍රාණඝාතක අකුසල කර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අන්‍ය සත්ත්වයෙකු පිළිබඳ වූ ජීවිතෙන්ද්‍රිය හෙළීම හෙවත් නැතිකර දැමීම **පාණාතිපාත** නම්. මේ අකුසල කර්මය ද්වේෂමූල දෙසිතින් සිදු වේ. වරක් ප්‍රාණඝාත අකුසලය සිදුකරගත් කල්හි ඔහුගේ චිත්තසන්තානය බොහෝ සෙයින් අශාන්ත වේ. අසංවර වේ. ප්‍රාණඝාත අකුසල කර්මයාගේ මේ අසංවර භාවය නැවත නැවතත් ප්‍රාණඝාත අකුසල කර්මය සිදුකිරීමට බලවත් උපකාරයෙක් වන බැවින් ප්‍රාණඝාතක කර්මය ප්‍රාණඝාතක කර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන බව කියන ලදී.

**5. පාණාතිපාතො, අදින්නාදානස්ස, කාමෙසු මිච්ඡාචාරස්ස, මුසාවාදස්ස, පිසුණාය වාචාය, ඵරුසාය වාචාය, සම්ඵප්පලාපස්ස, අභිජ්ඣාය, ब්‍යාපාදස්ස, මිච්ඡා-දිට්ඨියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ප්‍රාණඝාතක අකුසල කර්මය, අදත්තාදාන අකුසල කර්මයටද, කාමමිථ්‍යාචාර අකුසල කර්මයටද, මුසාවාද අකුසල කර්මයටද, පිසුණාවාච අකුසල කර්මයටද, ඵරුසා-වාච අකුසල කර්මයටද, සම්ඵප්පලාප අකුසල කර්මයටද, අභිද්‍යාවටද, ව්‍යාපාදයටද, මිථ්‍යාදෘෂ්ටියටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

ප්‍රාණඝාතක කර්මය කළ තැනැත්තාගේ අසංවර භාවය ප්‍රාණඝාත, අදත්තාදානාදී දස අකුසල කර්මයන් කිරීමට බලවත් උපකාරයෙකි. නොහික්මුණු චිත්ත-සන්තානයක් ඇති කල්හි තමාට නුදුන්, අන්සතු වස්තුව පැහැර ගැනීම ඉතා පහසුය. එමෙන්ම කාමමිච්ඡාචාරයෙහි හැසිරීමද බොරු කීමද, කේලාම් බස් කීමද, ඵරුෂවචන කීමද, හිස් වචන කීමද, දැඩි ලොභයද, ව්‍යාපාදයද

මිසදිටු ගැනීමද ඉතා පහසුය. මෙසේ ප්‍රාණඝාතක කර්මය, අදත්තාදානාදී අකුසල කර්මයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. මෙහිදී ප්‍රත්‍යය ධර්ම වශයෙන් ප්‍රාණඝාතක චේතනා ප්‍රධාන ද්වේෂ මූල දෙසිතද, ප්‍රත්‍යොත්පන්න ධර්ම වශයෙන් දොළොස් අකුසල චිත්තයන්ද ගතයුතු:

**6. අදින්නාදානං, අදින්නාදානස්ස, කාමෙසුමිච්ඡාචාරස්ස, මුසාවාදස්ස, පිසුණාය වාචාය, ඵරුසාය වාචාය, සම්ඵප්පලාපස්ස, අභිජ්ඣාය, බ්‍යාපාදස්ස, මිච්ඡාදිට්ඨියා පාණාතිපාතස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(අදත්තාදාන අකුසල කර්මය, අදත්තාදාන අකුසල කර්මයටද, කාමමිථ්‍යාචාර අකුසල කර්මයටද, මුසාවාද අකුසල කර්මයටද, පිසුණාවාච අකුසල කර්මයටද, ඵරුසාවාච අකුසල කර්මයටද, සම්ඵප්‍රලාප අකුසල කර්මයටද, අභිධ්‍යාවටද, ව්‍යාපාදයටද, මිථ්‍යාදෘෂ්ටියටද, ප්‍රාණඝාත අකුසල කර්මයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහිදී ප්‍රත්‍යය ධර්ම වශයෙන් අදත්තාදාන චේතනා ප්‍රධාන දොළොස් අකුසල චිත්තයන්ද ප්‍රත්‍යොත්පන්න ධර්ම වශයෙන් ඒ ඒ අකුසලයන් ප්‍රධාන දොළොස් අකුසල චිත්තයන්ද ගතයුතු.

**7. කාමෙසු මිච්ඡාචාරො, කාමෙසු මිච්ඡාචාරස්ස, මුසාවාදස්ස පිසුණාය වාචාය, ඵරුසාය වාචාය, සම්ඵප්පලාපස්ස, අභිජ්ඣාය, බ්‍යාපාදස්ස, මිච්ඡාදිට්ඨියා, පාණාතිපාතස්ස, අදින්නාදානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(කාම මිථ්‍යාචාර අකුසල කර්මය, කාමමිථ්‍යාචාර අකුසල කර්මයටද, මුසාවාද අකුසල කර්මයටද, පිසුණාවාචා අකුසල කර්මයටද, ඵරුසාවාචා අකුසල කර්මයටද, සම්ඵප්‍රලාප අකුසල කර්මයටද, අභිධ්‍යාවටද, ව්‍යාපාදයටද, මිථ්‍යාදෘෂ්ටියටද, ප්‍රාණඝාත අකුසල කර්මයටද, අදත්තාදාන අකුසල කර්මයටද, උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

8. මුසාවාදො, මුසාවාදස්ස, පිසුණාය වාචාය, ඵරුසාය වචාය, සම්ඵප්පලාපස්ස, අභිජ්ඣාය, බ්‍යාපාදස්ස, මිච්ඡාදිට්ඨියා, පාණාතිපාතස්ස, අදින්නාදානස්ස, කාමෙසුමිච්ඡාචාරස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.

(මුසාවාද අකුසල කර්මය, මුසාවාද අකුසල කර්මයටද, පිසුණාවාචා අකුසල කර්මයටද, ඵරුසාවාචා අකුසල කර්මයටද සම්ඵප්‍රලාප අකුසල කර්මයටද, අභිද්‍යාවටද, ව්‍යාපායටද, මිථ්‍යාදෘෂ්ටියටද, ප්‍රාණඝාත අකුසල කර්මයටද, අදත්තාදාන අකුසල කර්මයටද, කාමමිථ්‍යාචාර අකුසල කර්මයටද, උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

9. පිසුණාවාචා, පිසුණාය වාචාය, ඵරුසාය වාචාය, සම්ඵප්පලාපස්ස, අභිජ්ඣාය, බ්‍යාපාදස්ස, මිච්ඡා දිට්ඨියා, පාණාතිපාතස්ස, අදින්නාදානස්ස, කාමෙසු මිච්ඡාචාරස්ස මුසාවාදස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.

(පිසුණු බස් බිණීම හෙවත් පිසුණා වාචා අකුසල කර්මය, පිසුණාවාචා අකුසල කර්මයටද, ඵරුසාවාචා අකුසල කර්මයටද, සම්ඵප්‍රලාප අකුසල කර්මයටද, අභිද්‍යාවටද, ව්‍යාපාදයටද, මිථ්‍යාදෘෂ්ටියටද, ප්‍රාණඝාත අකුසල කර්මයටද, අදත්තාදාන අකුසල කර්මයටද, කාමමිථ්‍යාචාර අකුසල කර්මයටද, මුසාවාද අකුසල කර්මයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

10. ඵරුසාවාචා, ඵරුසායවාචාය, සම්ඵප්පලාපස්ස අභිජ්ඣාය, ව්‍යාපාදස්ස, මිච්ඡාදිට්ඨියා, පාණාතිපාතස්ස, අදින්නාදානස්ස, කාමෙසුමිච්ඡාචාරස්ස, මුසාවාදස්ස, පිසුණායවාචාය, උපනිස්සය පච්චයෙන පච්චයො.

(ඵරුසාවාචා අකුසල කර්මය, ඵරුසාවාචා අකුසල කර්මයටද, සම්ඵප්‍රලාප අකුසල කර්මයටද, අභිද්‍යාවටද, ව්‍යාපාදයටද, මිථ්‍යාදෘෂ්ටියටද, ප්‍රාණඝාත අකුසල කර්මයටද, අදත්තාදාන අකුසල කර්මයටද, කාමමිථ්‍යාචාර අකුසල

Free Distribution www.aathaapi.org

කර්මයටද, මුසාවාද අකුසල කර්මයටද, පිසුණාවාච, අකුසල කර්මයටද, උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**11. සම්ඵප්පලාපො, සම්ඵප්පලාපස්ස, අභිජ්ඣාය, බ්‍යාපාදස්ස, මිච්ඡාදිට්ඨියා, පාණාතිපාතස්ස, අදින්නාදානස්ස, කාමෙසු මිච්ඡාචාරස්ස, මුසාවාදස්ස, පිසුණාය වාචාය, ඵරුසාය වාචාය, උපනිස්සය පච්චයෙන පච්චයො.**

(සම්ඵප්‍රලාප අකුසල කර්මය, සම්ඵප්‍රලාප අකුසල කර්මයටද, අභිධ්‍යාවටද, ව්‍යාපාදයටද, මිථ්‍යාදෘෂ්ටියටද, ප්‍රාණඝාත අකුසල කර්මයටද, අදත්තාදාන අකුසල කර්මයටද, කාමමිථ්‍යාචාර අකුසල කර්මයටද, මුසාවාද අකුසල කර්මයටද, පිසුණාවාචා අකුසල කර්මයටද, ඵරුසාවාචා අකුසල කර්මයටද, උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**12. අභිජ්ඣා, අභිජ්ඣාය, බ්‍යාපාදස්ස, මිච්ඡාදිට්ඨියා, පාණාතිපාතස්ස, අදින්නාදානස්ස, කාමෙසුමිච්ඡාචාරස්ස, මුසාවාදස්ස, පිසුණායවාචාය, ඵරුසාය වාචාය, සම්ඵප්පලාපස්ස, උපනිස්සය පච්චයෙන පච්චයො.**

(අභිධ්‍යාව, අභිධ්‍යාවටද, ව්‍යාපාදයටද, මිථ්‍යාදෘෂ්ටියටද, ප්‍රාණඝාත අකුසල කර්මයටද. අදත්තාදාන අකුසල කර්මයටද, කාමමිථ්‍යාචාර අකුසල කර්මයටද, මුසාවාද අකුසල කර්මයටද, පිසුණාවාචා අකුසල කර්මයටද, ඵරුසාවාචා අකුසල කර්මයටද, සම්ඵප්‍රලාප අකුසල කර්මයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**13. බ්‍යාපාදො, බ්‍යාපාදස්ස, මිච්ඡාදිට්ඨියා, පාණාතිපාතස්ස, අදින්නාදානස්ස, කාමෙසුමිච්ඡාචාරස්ස, මුසාවාදස්ස, පිසුණායවාචාය, ඵරුසායවාචාය, සම්ඵප්පලාපස්ස, අභිජ්ඣාය උපනිස්සය පච්චයෙන පච්චයො**

(ව්‍යාපාදය, ව්‍යාපාදයටද, මිථ්‍යාදෘෂ්ටියටද, ප්‍රාණඝාත අකුසල කර්මයටද, අදත්තාදාන අකුසල කර්මයටද, කාම-

මිථ්‍යාචාර අකුසල කර්මයටද, මුසාවාද අකුසල කර්මයටද, පිසුණාවාචා අකුසල කර්මයටද, ඵරුසාවාචා අකුසල කර්මයටද, සම්ඵප්‍රලාප අකුසල කර්මයටද, අභිධ්‍යාවටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**14. මිච්ඡාදිට්ඨි, මිච්ඡාදිට්ඨියා, පාණාතිපාතස්ස, අදින්නාදානස්ස, කාමෙසුමිච්ඡාචාරස්ස, මුසාවාදස්ස, පිසුණායවාචාය, ඵරුසායවාචාය, සම්ඵප්පලාපස්ස, අභිජ්ඣාය, බ්‍යාපාදස්ස, උපනිස්සය පච්චයෙන පච්චයො.**

(මිථ්‍යාදෘෂ්ටිය, මිථ්‍යාදෘෂ්ටියටද, ප්‍රාණඝාත අකුසල කර්මයටද, අදත්තාදාන අකුසල කර්මයටද, කාමමිථ්‍යාචාර අකුසල කර්මයටද, මුසාවාද අකුසල කර්මයටද, පිසුණාවාචා අකුසල කර්මයටද, ඵරුසාවාචා අකුසල කර්මයටද, සම්ඵප්‍රලාප අකුසල කර්මයටද, අභිධ්‍යාවටද, ව්‍යාපාදයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ දස මහා අකුසලයෝ ඒ දස අකුසලයන්ගේ පහළවීමට බලවත් උපකාරයක් වන බැව් දක්වනලදි.

මෙහිදී පකතූපනිශ්‍රය ප්‍රත්‍යය වන අකුසල ධර්මයෝ නම් දෙලොව් අකුසල් සිත් සහ චෛතසික සත්විස්සය, ප්‍රත්‍යෝත්පන්න වන්නේත් ඒ ධර්මයෝ මැයි.

**15. මාතුඝාතිකම්මං මාතුඝාතිකම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(මාතෘඝාතක අකුසල කර්මය, මාතෘඝාතක අකුසල කර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මාතෘඝාතක කර්මය, මාතෘඝාතක කර්මයට සතරාකාරයකින් උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. එනම්:-

1. අනිකෙකු විසින් ඔහුගේ මව මරණු දැක හෝ අසා හෝ එසේ කිරීම නිවැරැදිය, එසේ කරන්නට වටනේය යනාදී වශයෙන් වරදවාගෙන එපරිද්දෙන්ම

තමන්ගේ මව් මරණු ලබන කල්හි, තමාගේ මාතෘඝාතක කර්මයට අනුන්ගේ මාතෘඝාතක කර්මය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

2. එක් භවයකදී මාතෘඝාතක කර්මය කළ තැනැත්තාට නැවත භවයකදී එසේම මාතෘඝාතක කර්මය කිරීමට අතීත මාතෘඝාතක කර්මය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

3. නැවත නැවත අණකිරීම් වශයෙන් මව මරන්නාවූ තැනැත්තාහට පළමු පළමු අණකිරීම් වූ මාතෘඝාතක කර්මය පසුව අණකිරීම වූ මාතෘඝාතක කර්මයට උපනිශ්‍රය වේ.

4. දෙපහරකින් මැරෙන්නා වූ මවට පළමු පහරදීම වූ මාතෘඝාතක කර්මය දෙවන පහරදීම වූ මාතෘඝාතක කර්මයට උපනිශ්‍රය වේ. මෙසේ මාතෘඝාතක කර්මය මාතෘඝාතක කර්මයට සතරාකාරයකින් උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**16. මාතුඝාතිකම්මං පිතුඝාතිකම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(මාතෘඝාතක කර්මය පිතෘඝාතක කර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**17. මාතුඝාතිකම්මං අරහන්තඝාතිකම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(මාතෘඝාතක කර්මය අර්හන්තඝාතක කර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**18. මාතුඝාතිකම්මං රුහිරුප්පාදකම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(මාතෘඝාතක කර්මය බුදු සිරුරින් ලේ සෙලවීම නම්වූ ලොහිතුප්පාදක කර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**19. මාතුඝාතිකම්මං සංඝභෙද කම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(මාතෘඝාතක කර්මය සංඝ භෙද කර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**20. මාතුඝාතිකම්මං නියත මිච්ඡාදිට්ඨියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(මාතෘඝාතක කර්මය නියත මිථ්‍යාදෘෂ්ටි කර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**21. පිතුඝාතිකම්මං පිතුඝාතිකම්මස්ස, අරහන්ත-ඝාතිකම්මස්ස, රුහිතුප්පාද කම්මස්ස, සංඝභෙද කම්මස්ස, නියත මිච්ඡාදිට්ඨියා, මාතුඝාතිකම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(පිතෘඝාතක කර්මය, පිතෘඝාතක කර්මයටද, අරහන්ත ඝාතක කර්මයටද, ලොහිතුප්පාද කර්මයටද, සංඝභෙද කර්මයටද, නියත මිථ්‍යාදෘෂ්ටියටද, මාතෘඝාතක කර්මයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**22. අරහන්තඝාතිකම්මං අරහන්තඝාතිකම්මස්ස, රුහිතුප්පාදකම්මස්ස, සංඝභෙදකම්මස්ස, නියත මිච්ඡා-දිට්ඨියා, මාතුඝාතිකම්මස්ස, පිතුඝාතිකම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(අරහන්තඝාතක කර්මය, අරහන්තඝාතක කර්මයටද. ලොහිතුප්පාද කර්මයටද, සංඝ භෙද කර්මයටද, නියත මිථ්‍යාදෘෂ්ටියටද, මාතෘඝාතක කර්මයටද, පිතෘඝාතක කර්මයටද, උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**23. රුහිතුප්පාදකම්මං රුහිතුප්පාදකම්මස්ස, සඞ්ඝ භෙදකම්මස්ස, නියත මිච්ඡාදිට්ඨියා, මාතුඝාතිකම්මස්ස, පිතුඝාතිකම්මස්ස, අරහන්තඝාතිකම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ලොහිතුප්පාදක කර්මය, ලොහිතුප්පාදක කර්මයට ද, සංඝභෙද කර්මයටද, නියත මිථ්‍යා දෘෂ්ටියටද, මාතෘඝාතක කර්මයටද, පිතෘඝාතක කර්මයටද, අරහන්තඝාතක කර්මයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**24. සඞ්ඝභෙද කම්මං සංඝභෙද කම්මස්ස, නියත-මිච්ඡාදිට්ඨියා, මාතුඝාතිකම්මස්ස, පිතුඝාතිකම්මස්ස, අරහන්තඝාතිකම්මස්ස, රුහිතුප්පාද කම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(සංඝභෙද කර්මය, සංඝභෙද කර්මයටද, නියත මිථ්‍යා දෘෂ්ටියටද, මාතෘඝාතක කර්මයටද, පිතෘඝාතක කර්මයටද, අරහන්තඝාත කර්මයටද, ලොහිතුප්පාද කර්මයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**25. නියත මිච්ඡාදිට්ඨි නියත මිච්ඡාදිට්ඨියා, මාතු-ඝාතිකම්මස්ස, පිතුඝාති කම්මස්ස, අරහන්ත ඝාතිකම්මස්ස රුහිතුප්පාද කම්මස්ස, සංඝභෙද කම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො**

(නියත මිථ්‍යාදෘෂ්ටිය, නියත මිථ්‍යාදෘෂ්ටියටද, මාතෘ-ඝාතක කර්මයටද, පිතෘඝාතක කර්මයටද, අරහන්තඝාතක කර්මයටද, ලොහිතුප්පාද කර්මයටද, සංඝභෙද කර්මයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මාතෘඝාතක කර්මය, පිතෘඝාතක කර්මය, අරහන්ත ඝාතක කර්මය, ලොහිතුප්පාදක කර්මය, සංඝභෙදය, යන මේ පස් මහා අකුසලයන්ට පඤ්චානන්තරිය අකුසල කර්මයෝ යයි කියනු ලැබේ. මේ කර්ම සිදුකිරීමේදී ඇතිවන මහා අකුසල ජවනයන් අතුරෙන් සත්වන ජවනයාගේ විපාකය මරණින් මතු ඒකාන්තයෙන්ම දෙවන භවයෙහි නිරයොත්පත්තිය පිණිස උපකාර වෙත්.

නියත මිථ්‍යාදෘෂ්ටිය යයි කියන ලද අහෙතුක වාදය, අකිරිය වාදය, නාස්තික වාදය යනාදී වූ අකුසලය පඤ්චානන්තරිය කර්මයන්ට වඩා බලවත් වූ අකුසලයකි. නියත මිථ්‍යා දෘෂ්ටියෙන් තොමිදී කාලක්‍රියා කළේ පී නම් මරණින් මතු ඒකාන්තයෙන්ම දෙවන ආත්ම භාවය නිරයෙහි වන්නේය.

මෙසේ මේ දස අකුසල, ආනන්තරිය කර්ම, නියත මිථ්‍යාදෘෂ්ටි ආදීහු බවුනොවුන්ටම උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම "අකුසල ධර්මය අකුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ. මෙහි දී ලැබෙන ප්‍රත්‍යය ධර්මයෝ නම් දොළොස් අකුසල් සිත් හා චෛතසික සත් විස්සය. ප්‍රත්‍යයෝත්පන්න ධර්ම වශයෙන් ලැබෙන්නේත් එම අකුසල ධර්මයෝ මැයි.

**5. විචිය—**

**අකුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො. පකතූපනිස්සයො.**

(අකුසල ධර්මය, කුසල ධර්මයට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්

අකුසල් සිත් දොළොසය

චෛතසික සත් විස්සය යන අකුසල ධර්මයෝ ය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්:

එක් විසි කුසල චිත්තයෝය

චෛතසික අටතිසය, යන කුසල ධර්මයෝයි.

මෙහි අනුවාද වශයෙන්—

**1. රාගං උපනිස්සාය දානං දෙති, සීලං සමාදියති, උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

(රාගය ප්‍රධාන ලොභමූල චිත්තය උපනිශ්‍රය ප්‍රත්‍යය කොට ගෙන, දන්දෙයි, සිල් සමාදන් වෙයි, පෙහෙවස් රකියි, ධ්‍යාන උපදවයි, විදර්ශනා උපදවයි, මාර්ග උපදවයි, අභිඥා උපදවයි, සමාපත්ති උපදවයි.)

(රාගයෙන් මත්වූ පුද්ගල තෙමේ, වඩවඩාත්, කම්සැප විඳිනු කැමතිව, දන්දීම්, සිල් සමාදන් වීම්, පෙහෙවස් රැකීම් ආදී පුණ්‍යකර්මයන්ගේ විපාක වශයෙන් දෙව් මිනිස් දෙගතියෙහි මහත්වූ භවභොග සම්පත් ආදිය ලැබෙන්නේ යයි අසා, ඒ භවභොග සම්පත් ලබනු සඳහා දානාදී සුගතිගාමි කුසල කර්මයන් කරන කල්හි, ඒ කාමාවචර කුසලයන්ට රාගය ප්‍රධාන අකුසලය පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

එමෙන්ම, රාගය, සත්ත්වයා කාම භවයෙහි බැඳ තබන අකුසලයක, එයින් මිදී බ්‍රහ්මලොකාදීන්හි උත්පත්ති ලබන්නේ නම් යෙහෙකැයි සිතා, ඒ රාගය විෂ්කම්භනය කරනු සඳහා ධ්‍යාන උපදවත්. එකල්හි මහද්ගත කුසලයන්ට රාගය ප්‍රධාන අකුසලය පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. රාගය ප්‍රහාණය කරනු පිණිස විදර්ශනා වඩන කල්හි ඒ විදර්ශනා කරන ඥානසම්ප්‍රයුක්ත කාමාවචර මහා කුසලයන්ට රාගය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. තවද රාගය නසනු පිණිස මාර්ගයන් උපදනා කල්හි ලොකොත්තර මාර්ග කුසලයන්ටද, අභිඥා උපදවන කල්හි අභිඥා චිත්තයන්ටද ධ්‍යාන සමාපත්තින්ට සමවදනා කල්හි ඒ සමාපත්ති චිත්තයන්ටද ඒ රාගය ප්‍රධාන ලොභමූල චිත්තය පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**2 දොසං, මොහං, මානං, දිට්ඨිං, පත්ථනං උපනිස්සාය දානං දෙති, සීලං සමාදියති, උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති**

(ද්වේෂය, මෝහය, මානය, දිට්ඨිය, ප්‍රාර්ථනාව උපනිශ්‍රය කොට ගෙන දන් දෙයි, සිල් සමාදන් වෙයි, පෙහෙවස් රකියි, ධ්‍යාන උපදවයි, විදර්ශනා උපදවයි, මාර්ග උපදවයි, අභිඥා උපදවයි, සමාපත්ති උපදවයි.)

ද්වේෂය බහුලකොට ඇති පුද්ගලතෙමේ එය නපුරකැයි දැන එය දුරුකර ගැනීමේ උපායක් වශයෙන් දන්දෙයි, සිල් රකියි, පෙහෙවස් රකියි, ධ්‍යාන උපදවයි, විදර්ශනා වඩා මාර්ග උපදවයි, අභිඥා සහ සමාපත්ති උපදවයි. එමෙන් ම මෝහය දුරු කිරීම පිණිසද, මානය දුරුකිරීම පිණිසද. දිට්ඨිය දුරු කිරීම පිණිසද, භවභොග සම්පත් ප්‍රාර්ථනා කිරීම් වශයෙන්ද දනාදි කුසලයන් රැස් කරයි. මෙහිදී රාග, ද්වේෂ, මෝහ, මාන, දිට්ඨි, ප්‍රාර්ථනාදී අකුසල ධර්මයෝ දනාදී කුසල ධර්මයන් කිරීමේදී එක්විසි කුසල චිත්තයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**3. රාගො, දොසො, මොහො, මානො, දිට්ඨි, පත්ථනා, සද්ධාය, සීලස්ස, සුතස්ස, චාගස්ස, පඤ්ඤාය උපනිස්සය පච්චයෙන පච්චයො.**

(රාගය, ද්වේෂය, මෝහය, මානය, දිට්ඨිය, ප්‍රාර්ථනාව, යන අකුසල ධර්මයෝ ශ්‍රද්ධා, සීල, ශ්‍රැත,ත්‍යාග, ප්‍රඥා යන කුසල ධර්මයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

රාග, ද්වේෂ, මෝහ, මාන, දිට්ඨි, ප්‍රාර්ථනා නම් වූ අකුසලයන් දුරු කිරීම පිණිස කුසල ධර්මයන් කරන කල්හි උපදනා ශ්‍රද්ධා, ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥාදී කුසල ධර්මයන්ට ඒ අකුසල ධර්මයෝ උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**4. පාණං හන්ත්වා තස්ස පටිඝාතත්ථාය දානං දෙති, සීලං සමාදියති, උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

(ප්‍රාණය නසා ඒ පව නැසීම පිණිස දන් දෙයි; සිල් සමාදන් වෙයි, පෙහෙවස් රකී, ධ්‍යාන උපදවයි, විදර්ශනා උපදවයි, මාර්ග උපදවයි, අභිඥ උපදවයි සමාපත්ති උපදවයි.

ප්‍රාණඝාතය කළ තැනැත්තේ, ඒ අකුසලයෙන් මතු සතර අපා දුක්ඛාදිය විඳින්නට සිදුවන්නේ යයි අසා ඒ අකුසල විපාක මගහරවා ගැණීම පිණිස දානාදී කුසල කර්මයන් කරන කල්හි, ඒ එක්විසි කුසල චිත්තයන්ට ප්‍රාණඝාත අකුසල කර්මය පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. අදින්නං ආදියිත්වා, මුසාභණිත්වා, පිසුණං භණිත්වා, ඵරුසං භණිත්වා, සම්ඵංපලපිත්වා, සන්ධිං ඡින්දිත්වා, නිල්ලොපං හරිත්වා, එකාගාරිකං කරිත්වා, පරිපන්ථෙ ඨත්වා, පරදාරං ගන්ත්වා, ගාමඝාතං කරිත්වා, නිගමඝාතංකරිත්වා, තස්සපටිඝාතත්ථාය දානංදෙති. සීලං සමාදියති, උපොසථකම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

(හිමියන් විසින් නුදුන් දෙය පැහැරගෙන, බොරු කියා, කේලාම් කියා, රළු වචන කියා, නිරර්ථක කථාකර, ගෙවල්බිඳ, සැඟවී සිට පැහැරගෙන, බොහෝ දෙනා එක්ව එක් ගෙයක් වටකොට වස්තුව පැහැරගෙන, මග රැක සිට අනුන්ගේ වස්තුව උදුරාගෙන, පරභාර්‍යාවන් කරා ගොස්, ගම් කොල්ලකා, නියම්ගම් කොල්ලකා, ඒ පව් නසනු පිණිස දන් දෙයි, සිල් සමාදන් වෙයි, පෙහෙවස් රකී, ධ්‍යාන උපදවයි, විදර්ශනා උපදවයි, මාර්ග උපදවයි, අභිඥ උපදවයි, සමාපත්ති උපදවයි.)

මෙකී අදත්තාදානාදී අකුසල කර්මයන් කළ තැනැත්තේ, ඒ පවින් මිදෙනු කැමතිව, දානාදී කුසල කර්මයන් කරන කල්හි ඒ දොළොස් අකුසල චිත්තයෝ එක්විසි කුසල

චිත්තයන්ට පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම "අකුසල ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**6. මාතරං ජීවිතා වොරොපෙත්වා, තස්ස පටිඝාතත්ථාය දානං දෙති, සීලං සමාදියති, උපොසථකම්මං කරොති.**

(මව ජීවිතයෙන් තොරකොට, ඒ අකුසලය නසනු පිණිස දන් දෙයි. සිල් සමාදන් වෙයි, පෙහෙවස් රකියි.)

**7. පිතරං ජීවිතා වොරොපෙත්වා, අරහන්තං ජීවිතා වොරොපෙත්වා, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙත්වා, සංඝං භින්දිත්වා, තස්සපටිඝාතත්ථාය දානං දෙති, සීලංසමාදියති, උපොසථ කම්මං කරොති.**

(පියා ජීවිතයෙන් තොරකොට, රහතන්වහන්සේ ජීවිතයෙන් තොරකොට, දූෂ්‍යවූ සිතින් තථාගතයන් වහන්සේගේ සිරුරෙහි රුධිරය උපදවා, සංඝයා භෙදකොට, ඒ අකුසල කර්මයන්ගේ විපාකයන්ගෙන් බේරීම පිණිස දන් දෙයි, සිල්සමාදන් වෙයි, පෙහෙවස් රකියි)

මව මැරීම, පියා මැරීම, රහතන්වහන්සේ මැරීම, බුදු සිරුරින් ලේ සෙලවීම, සංඝ භෙදය යන පඤ්චානන්තරිය කර්මයන් කළ තැනැත්තාට, දන් දීම, සිල්සමාදන් වීම, පෙහෙවස් රැකීම යන පින්කම් හැර, ධ්‍යාන උපදවා ගැනීම, මාර්ගය උපදවා ගැනීම, අභිඥා උපදවා ගැනීම, සමාපත්ති උපදවා ගැනීම ආදි උසස් කුසල කර්මයන් ඒ භවයේදී කළ නොහැකි වේ කර්මාවරණය හෙවත් ආනන්තරිය කර්මයෙන් වළක්වනු ලබන හෙයිනී. එබැවින් පඤ්චානන්තරිය කර්මයන් අතුරෙන් යම්කිසි කර්මයක් කළ තැනැත්තේ, මතු කාලයේදී එයින් බේරීම් සඳහා දන් දීම, සිල්සමාදන්වීම, පෙහෙවස් රැකීම යන පින්කම් කිරීමේදී ඒ කාමාවචර කුසලයන්ට ආනන්තරිය කර්මය පකතූපනිශ්‍රය ප්‍රත්‍යයෙන් උපකාරවීම "අකුසල ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**6. වීථිය—**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො, අනන්තරූප නිස්සයො, පකතූප-නිස්සයො.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට අනන්තරූප නිශ්‍රය, පකතූපනිශ්‍රය යන උපනිශ්‍රය ශක්ති දෙකෙන් ප්‍රත්‍යය වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අකුසල ධර්මයෝ** නම්:

අකුසල් සිත් දොළොසය
චෛතසික සත්විස්සය යන ධර්මයෝ යි.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

විපාක සිත් සතිසය
ක්‍රියා සිත් විස්සය
චෛතසික අටතිසය යන ධර්මයෝ යි.

**අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය**

**අකුසලං වුට්ඨානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල ජවනයන් අතුරෙන් අන්තිම ජවනය, එයට අනතුරුව උපදනා තදාරම්මණයට හෝ භවාඞ්ගයට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අකුසල ජවනයන් උපදනා චිත්ත වීථියේ සත්වන අකුසල ජවනයට අනතුරුව තදාරම්මණ උපදනා කල්හි, එකොළොස් තදාරම්මණයටද, තදාරම්මණ නොයෙදෙන කල්හි එකුන් විසි භවාඞ්ගයටද; ඒ අකුසලය අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**පකතූපනිශ්‍රය ප්‍රත්‍යය.**

**1. රාගං උපනිස්සාය අත්තානං ආතාපෙති, පරිතාපෙති, පරියිට්ඨිමූලකං දුක්ඛං පච්චනුභොති.**

රාගය උපනිශ්‍රය කොට තමා තවයි, හාත්පසින් තවයි, ප්‍රත්‍යය සෙවීම මුල්කොට ඇති දුක් විඳී.)

රාගය ප්‍රධාන ලොභමූල සිත උපනිශ්‍රය කොට ගෙන කායික දුක්ඛාදිය ඇතිවන සැටි මෙයින් දැක්වේ. ශාස්වත දෘෂ්ටි සඞ්ඛ්‍යාත වූ භවරාගයද, උච්ඡේද දෘෂ්ටි සංඛ්‍යාත වූ විභවරාගයද මෙයට ඇතුළත් වේ. මේ රාගය නිසා තමා තවන කල්හිද, හාත්පසින් තවන කල්හිද, භව සම්පත් ආදිය පිණිස ප්‍රත්‍යය සෙවීමේදී ද දුක්ඛ විපාකයෝ ඇතිවෙත්.

**2. දොසං, මොහං, මානං, දිට්ඨිං, පත්ථනං උපනිස්සාය අත්තානං ආතාපෙති, පරිතාපෙති, පරියිට්ඨිමූලකං දුක්ඛං පච්චනුභොති.**

(ද්වේෂය, මෝහය, මානය, දිට්ඨිය, ප්‍රාර්ථනාව උපනිශ්‍රය කොට ගෙන තමා තවයි, හාත්පසින් තවයි, ප්‍රත්‍යය සෙවීම මුල්කොට ඇති දුක් විඳී.)

තව ආඝාත වස්තු ආදිය කරණ කොට ගෙන ද්වේෂය ඇති කල්හි ද, මුළාවීම නම් වූ මෝහය ඇති කල්හි ද, මානය ඇති කල්හිද, විපරීත දර්ශන සංඛ්‍යාත වූ මිථ්‍යා දෘෂ්ටිය ඇති කල්හිද, භව සම්පත් ආදිය පැතීම ඇති කල්හිද, තමා තවයි, හාත්පසින් තවයි. ඒ සඳහා ප්‍රත්‍යය සෙවීමේදී වැඩියක් තවයි. මෙහිදී ඇතිවන දුක්ඛ විපාකයට ද්වේෂාදී වූ අකුසලයෝ උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**3. රාගො, දොසො, මොහො, මානො, දිට්ඨි, පත්ථනා, කායිකස්ස සුඛස්ස, කායිකස්ස දුක්ඛස්ස, ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(රාගය, ද්වෙෂය, මොහය, මානය, දිට්ඨිය, ප්‍රාර්ථනාව කායික සුඛයටද, කායික දුක්ඛයටද, ඵලසමාපත්තියටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

රාගය ඇති කල්හි ප්‍රීති සහගත සිතින් උපදනා ප්‍රණීත රූපයන්ගේ ස්පර්ශයෙන් කායික සුඛය ඇතිවේ. නැවීම ඇති කල්හි කායික දුක්ඛය ඇතිවේ. රාගාදියෙන් මිදී වාසය කිරීම පිණිස ඵලයට සමවදී. මෙසේ රාගය ද්වෙෂය, මොහය, මානය, දිට්ඨිය, ප්‍රාර්ථනාව යනාදී අකුසල ධර්මයන් උපනිශ්‍රය කොට ගෙන, කායික සුඛය, කායික දුක්ඛය, ඵලසමාපත්තිය උපදනා කල්හි අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.

**4. අකුසලං කම්මං විපාකස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(අකුසල චේතනා සංඛ්‍යාත අකුසල කර්මය අකුසල විපාක සතට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි ප්‍රත්‍යය වශයෙන් දොළොස් අකුසල් සිත්ද ප්‍රත්‍යොත්පන්න ධර්ම වශයෙන් අකුසල විපාක සිත් සතද ගතයුතු.

මෙසේ අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**7. විපිය—**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො. ආරම්මණූපනිස්සයො, අනන්තරූපනිස්සයො, පකතූපනිස්සයො.**

අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණූප නිශ්‍රය අනන්තරූප නිශ්‍රය පකතූපනිශ්‍රය යන උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්ති තුනෙන් උපකාර වේ.)

**මෙම අව්‍යාකෘත ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාරවන අව්‍යාකෘත ධර්මයෝ නම්:**

විපාක සිත් සතිසය

ක්‍රියා සිත් විස්සය

චෛතසික අටතිසය යන ප්‍රත්‍යය ධර්මයෝයි

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන්නේත් එම ධර්මයෝ මැයි.

**ආරම්මණූපනිස්සයො**

**1. අරහා ඵලං ගරුංකත්වා පච්චවෙක්ඛති.**

(රහතන් වහන්සේ අර්හත් ඵල චිත්තය ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි ඒ ප්‍රත්‍යවෙක්ෂා කාමාවචර මහා ක්‍රියා ජවනයන්ට අර්හත් ඵල චිත්තය ආරම්මණූපනිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. අරහා නිබ්බානං ගරුංකත්වා පච්චවෙක්ඛති.**

(රහතන් වහන්සේ නිර්වාණය ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි ඒ ප්‍රත්‍යවෙක්ෂා කාමාවචර මහා ක්‍රියා ජවනයන්ට නිර්වාණය ආරම්මණූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

**3. නිබ්බානං ඵලස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(නිර්වාණය අරමුණු කරමින් ලොකොත්තර ඵල චිත්තය උපදනා කල්හි ඒ ඵලසිතට නිර්වාණය ආරම්මණූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මෙහිදී අර්හත් ඵලචිත්තයත්, නිර්වාණයත් ගරුකොට අරමුණු කරන රහතන්වහන්සේගේ කාමාවචර වූ ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතරට අර්හත් ඵල චිත්තයත් නිවණත් ආරම්මණූපනිස්සය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.

සොවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත්ඵල චිත්තයන් විසින් අරමුණු කරනු ලබන්නේ නිර්වාණය යි. ඵල චිත්තයන් නිර්වාණ ධර්මයන් අව්‍යාකෘත ධර්මයෝයි.

මෙසේ අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**අනන්තරූප නිස්සයො.**

**1. පුරිමා පුරිමා විපාකාබ්‍යාකතා, කිරියාබ්‍යාකතා ඛන්ධා, පච්ඡිමානං පච්ඡිමානං විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.**

(අතීත් චුති චිත්තය හැර පූර්වපූර්ව විපාක ක්‍රියා නාමස්කන්ධයෝ අතීත් චුති චිත්තය සහිත වූ පශ්චිම විපාක ක්‍රියා නාමස්කන්ධයන්ට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

**2. භවඞ්ගං ආවජ්ජනාය උපනිස්සය පච්චයෙන පච්චයො.**

(පඤ්චවොකාර භවාඞ්ගුපච්ඡේද පසළොස, ආවර්ජනා දෙසිතටද අරූප භවාඞ්ගුපච්ඡේද සතර මනොද්වාරාවජ්ජන-යටද, අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. කිරියං වුට්ඨානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ආවර්ජන චිත්තවය හැර ඉතිරි ක්‍රියා සිත් අටළොසෙහි අන්තිම ජවනය හා ව්‍යවස්ථාපන චිත්තය එයට අනතුරුව උපදනා තදාරම්මණයට හෝ භවාඞ්ගයට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. අරහතො අනුලොමං ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(රහතන් වහන්සේගේ අනුලොම ඥානයවත් මහාක්‍රිය ප්‍රථමවය හා තෘතියවය, අතීත් ඵල චිත්තයට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤා-යතන කිරියං ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(නිරෝධ සමාපත්තියෙන් නැගීමේදී රහතන් වහන්-සේගේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන අන්තිම ක්‍රියා ජවනය අගීත් ඵලචිත්තයට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාරවේ.

මෙසේ අව්‍යාකෘත ධර්මයෝ අව්‍යාකෘත ධර්මයට අනන්ත රූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**පකතූපනිස්සයො.**

**1. කායිකං සුඛං කායිකස්ස සුඛස්ස කායිකස්ස දුක්ඛස්ස ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(කායික සුඛය, කායික සුඛයටද, කායික දුක්ඛයටද ඵල සමාපත්තියටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ)

කායික සුඛය විඳීමේදී කුසලවිපාක සුඛ සහගත කාය විඥනය උපදී. ඒ කායික සුඛය කැමති නැවතත් කායික සුඛය විඳීමට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. එසේම ඒ කායික සුඛය නැතිව යාමෙන් හෝ කායික සුඛය විඳිනු සඳහා තැවීම් ආදිය ඇතිවන කල්හි කායික සුඛය, කායික දුක්ඛයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ. එකල්හි කායික දුක්ඛය වශයෙන් අකුසල විපාක කාය විඥනය උපදී. ආයුෂ්මත්වහන්සේ කායික සුඛය නිසා ඵලසමාපත්තියට සමවදනා කල්හි ඒ කායික සුඛය, ඵලචිත්තයට ද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

**2. කායිකං දුක්ඛං කායිකස්ස සුඛස්ස, කායිකස්ස දුක්ඛස්ස ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(කායික දුක්ඛය කායික සුඛයටද, කායික දුක්ඛ-යටද, ඵලසමාපත්තියටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

කායික දුක්ඛය ඇතිකල්හි එය දුරුකර ගැනීමට උපකාර වන ඉරියව් වෙනස් කිරීම් ආදි ක්‍රියාවන් නිසා කායික සුඛය ඇතිවන කල්හිද, සිරුර තැවීම් ආදියෙන් නැවත නැවත දුක් ඇතිවන කල්හිද, කායික දුක්ඛය නැතිකර ගැනීම සඳහා ආර්යයන්වහන්සේ ඵලසමාපත්ති-යට සමවදනා කල්හිද, කායික දුක්ඛය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**3. උතු, කායිකස්ස සුඛස්ස, කායිකස්ස දුක්ඛස්ස, ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ඍතු ගුණය, කායික සුඛයටද, කායික දුක්ඛ-යටද, ඵලසමාපත්තියටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

සැපවත් ඍතු ගුණය ඇතිකල්හි කායික සුඛයටද කටුකවූ ඍතු ගුණය ඇතිකල්හි කායික දුක්ඛයටද, ඍතු ගුණයෙන් වන්නා වූ ශරීර පීඩාදිය වලක්වා ගැනීම සඳහා ඵලසමාපත්තියට සමවදනා කල්හි, ඒ ඵලසමාපත්තියටද ඍතු ගුණය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

**4. භොජනං, කායිකස්ස සුඛස්ස, කායිකස්ස දුක්ඛස්ස ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(භොජනය නම් වූ ආහාරය කායික සුඛයටද, කායික දුක්ඛයටද ඵලසමාපත්තියටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

හිතවත් භොජනය ලැබුනු කල්හි කායික සුඛයටද, නොසැප භොජනය ඇතිකල්හි කායික දුක්ඛයටද භෝජන යෙන් පීඩා සන්හිඳුවා ඵලසමාපත්තියට සමාවදනා කල්හි ඒ ඵලචිත්තයටද භොජනය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

**5. සෙනාසනං කායිකස්ස සුඛස්ස, කායිකස්ස දුක්ඛස්ස ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(සේනාසනය, කායික සුඛයටද, කායික දුක්ඛයටද, ඵලසමාපත්තියටද, උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

සැපවත් සෙනසුන් ලද කල්හි කායික සුඛයටද, නොසැප සෙනසුන් ලද කල්හි කායික දුක්ඛයටද, සුදුසු සෙනසුන් ලැබ ඵලසමාපත්තියට සම්වදනා කල්හි ඵල චිත්තයට ද, සේනාසනය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**6. කායිකං සුඛං, කායිකං දුක්ඛං, උතු, භොජනං, සෙනාසනං, කායිකස්ස සුඛස්ස, කායිකස්ස දුක්ඛස්ස, ඵලසමාපත්තියා උපනිස්සය පච්චයෙන පච්චයො.**

(කායික සුඛය, කායික දුක්ඛය, ඍතු ගුණය, භෝජනය සේනාසනය යන මේ අව්‍යාකෘත ධර්මයෝ කායික සුඛයටද, කායික දුක්ඛයටද, ඵලසමාපත්තියටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. ඵලසමාපත්ති, කායිකස්ස සුඛස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ඵලසමාපත්ති කායික සුඛයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

ඵල සමාපත්තියට සමවදනා ආර්‍ය්‍ය පුද්ගලයාහට කායික සුඛය මිස කායික දුක්ඛයක් ඇති නොවේ.

**8. අරහා කායිකං සුඛං උපනිස්සාය අනුප්පන්නං කිරිය සමාපත්තිං උප්පාදෙති, උප්පන්නං සමාපජ්ජති, සඞ්ඛාරෙ අනිච්චතො, දුක්ඛතො අනත්තතො විපස්සති.**

(රහතන් වහන්සේ කායික සුඛය උපනිශ්‍රය කොට පූර්වයෙහි නූපදවන ලද ක්‍රියා සමාපත්ති උපදවයි. උපදවා ගත් ක්‍රියා සමාපත්තියට සමවදියි. සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් කාමාවචර ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිතින් විදර්ශනා කරයි.)

ක්‍රියා සමාපත්ති උපදවාගත හැකිවන්නේ අගීත්ඵලයට පැමිණීමෙන් පසුවය. එසේ ක්‍රියා සමාපත්ති උපදවා ගැනීමේදී කායික සුඛය එයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. එපරිද්දෙන්ම උපදවාගත් සමාපත්තීන්ට සමවැදීමේදී ද කායික සුඛය එයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කිරීමේදී ද රහතන් වහන්සේට කායික සුඛය උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ

**9. කායිකං දුක්ඛං, උතු, භොජනං, සෙනාසනං, උපනිස්සාය අනුප්පන්නං කිරිය සමාපත්තිං උප්පාදෙති, උප්පන්නං සමාපජ්ජති, සංඛාරෙ අනිච්චතො දුක්ඛතො, අනත්තතො විපස්සති.**

(රහතන් වහන්සේ, කායික දුක්ඛයද, ඍතු ගුණයද, භොජනයද, සෙනාසනයද උපනිශ්‍රය කොට පෙර නූපදවන ලද ක්‍රියා සමාපත්තීන් උපදවයි, උපදවන ලද ක්‍රියා සමාපත්තීන්ට සමවදියි, සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

කායික සුඛය මෙන්ම, කායික දුක්ඛයද, ඍතු ගුණයද, භොජනයද, සෙනාසනයද රහතන් වහන්සේට පෙර උපදවා නොගත් ක්‍රියා සමාපත්තීන් උපදවා ගැනීමටද, උපදවාගත් ක්‍රියා සමාපත්තීන්ට සමවැදීමටද සංස්කාර ධර්ම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කිරීමටද පකතූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

මෙසේ අව්‍යාකෘත ධර්මය, අව්‍යාකෘත ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**8. වීපිය.**

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො. ආරම්මණූපනිස්සයො, අනන්තරූපනිස්සයො, පකතූපනිස්සයො.**

(අව්‍යාකෘත ධර්මය, කුසලධර්මයට ආරම්මණූපනිශ්‍රය, අනන්තරූපනිශ්‍රය, පකතූපනිශ්‍රය යන උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්ති තුනෙන් උපකාර වේ.)

මෙහි කුසලධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන අව්‍යාකෘත ධර්මයෝ නම්—

අර්හත් ඵලයෙන් අන්‍ය වූ විපාකසිත් පන්තිසය,

ක්‍රියා සිත් විස්සය,
චෛතසික අටතිසය,
රූප අටවිස්සය යන ප්‍රත්‍යය ධර්මයෝ යි.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන කුසලධර්මයෝ නම්—

කුසල් සිත් එක් විස්සය
චෛතසික අටතිසය

යන කුසල ධර්මයෝයි

මෙහි අනුවාද වශයෙන්,

**ආරම්මණූපනිස්සයො**

**1. සෙක්ඛා ඵලං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

(සෝවාන්, සකෘදාගාමි, අනාගාමි යන ආර්‍යයන් වහන්සේලා තම තමන්ගේ ඵල සිත ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යවෙක්ෂා කරන කල්හි ඒ කාමාවචර ඥානසම්ප්‍රයුක්ත මහා කුසල ප්‍රත්‍යවෙක්ෂා ජවනයන්ට ලොකොත්තරවූ ඵලසිත ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

මෙහිදී අව්‍යාකෘත ධර්මයන් වූ සෝවාන්, සකෘදාගාමි, අනාගාමි ලොකොත්තර ඵල සිත් කාමාවචර ප්‍රත්‍යවෙක්ෂා කුසල ජවනයන්ට ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**2. සෙක්ඛා නිබ්බාණං ගරුං කත්වා පච්චවෙක්ඛන්ති.**

(ශෛක්‍ෂයන් වහන්සේලා නිර්වාණය ගරුකොට අරමුණු කරමින් ප්‍රත්‍යවේක්‍ෂා කරත්.)

මෙහි නිර්වාණය අව්‍යාකෘත ධර්මයකි. නිර්වාණය ගරු-කොට අරමුණු කරමින් ප්‍රත්‍යවේක්‍ෂා කරන ශෛක්‍ෂයන් වහන්සේගේ ඥානසම්ප්‍රයුක්ත මහා කුසල් සිත කුසල ධර්මයකි:

**3. නිබ්බානං ගොත්‍රභුස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(නිර්වාණය ගොත්‍රභූ චිත්තයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

ගොත්‍රභූ චිත්තයට අරමුණු වන්නේ නිර්වාණයයි. නිර්වාණය සෑම කල්හිම ගරුකොට අරමුණු කළයුතු අව්‍යාකෘත ධර්මයකි. ගොත්‍රභූ සිත, සෝවාන් මාර්ග සිතට පූර්වයෙහි නිර්වාණය අරමුණු කරමින් උපදනා කාමාවචර ඥානසම්ප්‍රයුක්ත මහා කුසල චිත්තයකි.

**4. නිබ්බානං වොදානස්ස උපනිස්සය පච්චයෙන පච්චයො.**

(නිර්වාණ ධර්මය, සකෘදාගාමි, අනාගාමි අර්හත් යන මාර්ග සිත් තුනට පූර්වයෙහි නිර්වාණ ගරුකොට අරමුණු කරමින් උපදනා ඥානසම්ප්‍රයුක්ත කාමාවචර මහා කුසල චිත්තය වූ වොදාන චිත්තයට ආරම්මණ උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙය "අව්‍යාකෘත ධර්මය, කුසල ධර්මයට ආරම්මණූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**අනන්තරූප නිස්සයො.**

**ආවජ්ජනා කුසලානං ඛන්ධානං උපනිස්සය පච්ච-යෙන පච්චයො.**

(ආවර්ජනා චිත්තය කුසල නාමස්කන්ධයන්ට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

කුසල් ජවන් උපදනා පඤ්චද්වාරික චිත්ත වීථින්හි අව්‍යාකෘත ධර්මයක් වූ වොට්ඨපන චිත්තය, එයට අනතුරුව උපදනා ප්‍රථම කුසල ජවනයට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ. මනොද්වාරික වීථින්හි මනො-ද්වාරාවජ්ජන චිත්තය, එයට අනතුරුව උපදනා ප්‍රථම කුසල ජවනයට අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**පකතූපනිස්සයො.**

**1. කායිකං සුඛං උපනිස්සාය දානං දෙති, සීලං සමාදියති, උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

(කායික සුඛය උපනිශ්‍රය කොටගෙන දන් දෙයි, සිල් සමාදන් වෙයි, පෙහෙවස් රකියි, ධ්‍යාන උපදවයි, විදර්ශනා උපදවයි, මාර්ග උපදවයි, අභිඥා උපදවයි, සමා-පත්ති උපදවයි.)

**2. කායිකං දුක්ඛං, උතු, භොජනං, සෙනාසනං උපනිස්සාය දානං දෙති, සීලං සමාදියති, උපොසථ කම්මං කරොති, ඣානං උප්පාදෙති, විපස්සනං උප්පා-දෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං, උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති.**

(කායික දුක්ඛය, සෘතු ගුණය, භොජනය, සෙනාසනය උපනිශ්‍රය කොටගෙන දන් දෙයි, සිල්සමාදන් වෙයි, පෙහෙවස් රකී, ධ්‍යාන උපදවයි, මාර්ගය උපදවයි, අභිඥා උපදවයි.)

මේ අනුවාද දෙකෙන් කායික සුඛය, කායික දුක්ඛය, සෘතු ගුණය, භොජනය, සෙනාසනය යන මේ අව්‍යාකෘත ධර්මයන් උපනිශ්‍රය ප්‍රත්‍යය වීමෙන් දන් දෙන කල්හි දන

චේතනා ප්‍රධාන කාමාවචර මහ කුසල් සිත්ද, සිල් සමාදන් වන කල්හිද, පෙහෙවස් රකින කල්හිද, ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසල් සිත්ද, ධ්‍යාන උපදනා කල්හි මහග්ගත ධ්‍යාන කුසල් සිත්ද, විදර්ශනා වඩන කල්හි කාමාවචර ඥාන සම්ප්‍රයුක්ත මහා කුසල චිත්ත-යෝද, මාර්ගය ලබන කල්හි ලෝකෝත්තර මාර්ග කුසල චිත්තයෝද, අභිඥා උපදවන කල්හි කුසල අභිඥා චිත්ත යෝද, සමාපත්ති උපදවන කල්හි කුසල සමාපත්ති චිත්තයෝද ඇතිවෙත්

මෙයද ''අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම'' යයි කියනු ලැබේ.

**8. කායිකං සුඛං, කායිකං දුක්ඛං, උතු, භොජනං, සෙනාසනං, සද්ධාය, සීලස්ස, සුතස්ස, චාගස්ස, පඤ්ඤාය, උපනිස්සය පච්චයෙන පච්චයො.**

(කායික සුඛය, කායික දුක්ඛය, ඍතු ගුණය, භොජනය, සෙනාසනය යන මේ අව්‍යාකෘත ධර්මයෝ ශ්‍රද්ධාව, සීලය, සුඛය, ත්‍යාගය, ප්‍රඥාව යන කුසල ධර්මයන්ට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

කායික සුඛය, ශ්‍රද්ධාදී කුසල ධර්මයන්ගේ වැඩීමට බලවත් උපකාරයෙකි. කායික දුකින් මිදෙනු කැමති පුද්ගලතෙම එයින් මිදෙනු සඳහා කුසල ධර්මයන් කිරීමේදී ශ්‍රද්ධාදී ධර්මයෝ වැඩෙත්. එමෙන්ම සැපවත් ඍතු, භොජන, සෙනාසනාදිය ලත් කල්හිද, ශ්‍රද්ධා ශීල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥා යන කුසල ධර්මයන්ගේ වර්ධනයට ඒ අව්‍යාකෘත ධර්මයෝ බලවත්ව උපකාර වෙත්. මෙසේ අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**9. විභිය**

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස උප-නිස්සය පච්චයෙන පච්චයො, ආරම්මණූපනිස්සයො, අනන්තරූපනිස්සයො, පකතූපනිස්සයො,**

(අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට ආරම්මණූපනිශ්‍රය අනන්තරූපනිශ්‍රය, පකතූපනිශ්‍රය යන ප්‍රත්‍යය ශක්ති තුනෙන් උපකාර වේ.

මෙහි අකුසල ධර්මයට උපකාරවන **අව්‍යාකෘත ප්‍රත්‍යය ධර්මයෝ** නම්:

ලෞකික විපාක දෙතිසය,
ක්‍රියා සිත් විස්සය,
චෛතසික පන්තිසය,
රූප අටවිස්සය යන ප්‍රත්‍යය ධර්මයෝ යි.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම් අකුසල් සිත් දොළොසය,

චෛතසික සත්විස්සය යන ප්‍රත්‍යොත්පන්න ධර්මයෝ යි.

මෙහි අනුවාද වශයෙන්,

**ආරම්මණූපනිස්සයො**

**1. චක්ඛුං ගරුංකත්වා අස්සාදෙති, අභිනන්දති, තං ගරුංකත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(චක්ෂුප්‍රසාදය ගරුකොට ආස්වාදනය කරන කල්හි සොම්නස් සහගත ලොභමූල සිත් සතරටද, අභිනන්දනය හෙවත් ප්‍රීතියෙන් සතුටුවන කල්හි, ප්‍රීතිය ප්‍රධාන ලොභ මූල සිත් සතරටද, රාගය උපදනා කල්හි ලොභ මූල සිත් අටටද, මගේ ඇසය යනාදී වශයෙන් වරදවා ගන්නා කල්හි දිට්ඨි සම්ප්‍රයුක්ත ලොභ මූල සිත් සතරටද, ඒ චක්ෂුප්‍රසාදය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. සොතං, ඝාණං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, වත්ථුං, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ ගරුංකත්වා අස්සාදෙති, අභිනන්දති, තං ගරුංකත්වා රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති.**

(ශ්‍රොතප්‍රසාදය, ඝ්‍රාණප්‍රසාදය, ජිව්හාප්‍රසාදය, කායප්‍රසාදය, රූපය, ශබ්දය, ගන්ධය, රසය, ස්පර්ශය, හදය වස්තුවය, විපාක ක්‍රියා සිත්ද, ගරුකොට ආස්වාදනය, අභිනන්දනය කරන කල්හි රාගයත් දිට්ඨියත් උපදී.)

මෙහිදී ශ්‍රොතප්‍රසාදදිය ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය ධර්ම වශයෙන්ද, ලොභ මූල සිත් අට ප්‍රත්‍යොත්පන්න ධර්ම වශයෙන්ද ගතයුතු.

**අනන්තරූප නිස්සයො.**

**ආවජ්ජනා අකුසලානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො.**

(ආවජ්ජනා චිත්තය අකුසලස්කන්ධයන්ට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අකුසල ජවනයන් උපදනා මනොද්වාරික චිත්ත වීථියෙහි මනොද්වාරාවජ්ජන චිත්තයට අනතුරුව ප්‍රථම අකුසල ජවනය උපදී. මෙහිදී මනොද්වාරාවජ්ජන චිත්තය ප්‍රථම අකුසල ජවනයට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

පඤ්චද්වාරික චිත්ත වීථින්හි වොට්ඨපන චිත්තයට අනතුරුව ප්‍රථම අකුසල ජවනය උපදී මෙහිදී ඒ වොට්ඨපන චිත්තය ප්‍රථම අකුසල ජවනයට අනන්තරූප නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මෙසේ ආවජ්ජන වොට්ඨපන කෘත්‍යයෙන් උපදනා මනොද්වාරාවජ්ජන චිත්තය, එයට අනතුරුව උපදනා ප්‍රථම අකුසල ජවනයට අනන්තරූපනිශ්‍රය ශක්තියෙන් ප්‍රත්‍යයවීම "අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

**පකතූපනිස්සයො.**

**1. කායිකං සුඛං උපනිස්සාය පාණංහනති, අදින්නං ආදියති, මුසා භණති, පිසුණං භණති, ඵරුසං භණති, සම්ඵංපලපති, සන්ධිං ඡින්දති, නිල්ලොපං හරති,**

**ඒකාගාරිකං කරොති, පරිපන්ථෙ තිට්ඨති, පරදාරං ගච්ඡති, ගාමඝාතං කරොති, නිගමඝාතං කරොති, මාතරං ජීවිතා වොරොපෙති, පිතරං ජීවිතා වොරොපෙති, අරහන්තං ජීවිතා වොරොපෙති, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙති, සංඝං භින්දති.**

(කායික සැපය උපනිශ්‍රය කොටගෙන අන්‍යයන්ගේ ප්‍රාණය නසයි හිමියන් විසින් නුදුන් දෙය පැහැර ගනී, බොරු කියයි, කේලාම් කියයි, රළු වචන කියයි, නිරර්ථක කථා කරයි, ගෙවල් බිඳී, සැඟවී සිට පැහැරගනී, බොහෝ දෙනා එක්ව එක් ගෙයක් වටකොට වස්තුව පැහැරගනී; මග රැක සිට අනුන්ගේ වස්තුව පැහැරගනී, පරභාර්‍ය්‍යාවන් කරා යෙයි, ගම් කොල්ලකයි, නියම්ගම් කොල්ලකයි, මව ජීවිතයෙන් තොර කරයි, පියා ජීවිතයෙන් තොර කරයි, රහතුන් ජීවිතයෙන් තොර කරයි, දුෂ්ට සිතින් තථාගත සිරුරෙහි ලේ උපදවයි, සංඝයා බිඳී.)

මෙහිදී අව්‍යාකෘත ධර්මයක් වූ කායික සුඛය, පකතූප-නිශ්‍රය ප්‍රත්‍යය වන ධර්මයයි: පරපණ නැසීම් ආදියෙහිදී උපදනා දෙළොස් අකුසල් සිත් හා සත්විසි චෛත-සිකයෝද ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝ යි.

**2. කායිකං දුක්ඛං, උතු, භොජනං, සෙනාසනං උපනිස්සාය පාණං හනති, අදින්නං ආදියති, මුසා භණති, පිසුණං භණති, ඵරුසං භණති, සම්ඵං පලපති, සන්ධිං ඡින්දති, නිල්ලොපං හරති, ඒකාගාරිකං කරොති, පරිපන්ථෙ තිට්ඨති, පරදාරං ගච්ඡති, ගාමඝාතං කරොති, නිගමඝාතං කරොති, මාතරං ජීවිතා වොරොපෙති, පිතරං ජීවිතා වොරොපෙති, අරහන්තං ජීවිතා වොරොපෙති, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙති, සංඝං භින්දති.**

(කායික දුක්ඛය, ඍතුවය, භොජනය, සෙනාසනය යන අව්‍යාකෘත ධර්මයන් උපනිශ්‍රය කොටගෙන අන්‍යයන්ගේ

ප්‍රාණය නසයි, හිමියන් විසින් නුදුන් දෙය පැහැර ගනී, බොරු කියයි, කේලාම් කියයි, රළු වචන කියයි, නිරර්ථක කථා කරයි, ගෙවල් බිඳී, සැඟවී සිට පැහැරගනී, බොහෝ දෙනා එක්ව එක් ගෙයක් වටකොට වස්තුව පැහැර ගනී, මගරැක සිට අනුන්ගේ වස්තුව පැහැර ගනී, පරභාර්‍යාවන් කරා යයි, ගම් කොල්ලකයි, නියම්ගම් කොල්ලකයි, මව ජීවිතයෙන් තොරකරයි, පියා ජීවිතයෙන් තොරකරයි, රහතුන් ජීවිතයෙන් තොරකරයි, දුෂ්ට සිතින් තථාගත සිරුරෙහි ලේ උපදවයි, සංඝයා බිඳී.)

**3 කායිකං සුඛං, කායිකං දුක්ඛං, උතු, භොජනං, සෙනාසනං රාගස්ස, දොසස්ස, මොහස්ස, මානස්ස, දිට්ඨියා, පත්ථනාය උපනිස්සය පච්චයෙන පච්චයො.**

(කායික සුඛය, කායික දුක්ඛය, ඍතුවය, භොජනය, සෙනාසනය යන අව්‍යාකෘත ධර්මයෝ රාගයට ද, ද්වේෂයට ද, මෝහයට ද, මානයට ද, දිට්ඨියට ද, ප්‍රාර්ථනාවට ද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ කායික සුඛය, කායික දුක්ඛය, ඍතුව, භොජනය, සෙනාසනය යන ධර්මයන්ගේ උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තිය ලැබීමෙන් රාග, ද්වේෂ, මෝහ මාන, දිට්ඨි, ප්‍රාර්ථනාදිය උපදනා කල්හි ඒ කායික සුඛ ආදිය රාගාදීන් ප්‍රධාන දොළොස් අකුසල චිත්තයන්ට පකතූප-නිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම "අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

## 10. පුරේජාත ප්‍රත්‍යය

පූර්වයෙහි හටගෙන පසුව හටගන්නා නාම ධර්මයන්ට උපකාර වන ධර්මය, **පුරේජාත ප්‍රත්‍යය ධර්මය වේ.** කලින් හටගන්නා ගසෙහි පසුව මල්ඵල ආදිය හට-ගැනීමේදී ඒ මල්ඵල හටගැනීමට කලින් උපන් ගස

උපකාර වන්නාක් මෙනි පුරේජාත ප්‍රත්‍යය වන්නේ වර්තමාන නිෂ්පන්න රූප ධර්මයෝයි. එහි ප්‍රත්‍යයොත්පන්න වශයෙන් ලැබෙන්නේ අරූප ධර්මයෝ පමණය.

**පුරේජාත ප්‍රත්‍යය, ආරම්මණ පුරේජාතය, වත්ථුපුරේජාතය** යයි දෙවැදෑරුම් වේ.

**ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය** - රූප ධර්මයක් අරමුණු කරමින් චිත්ත වීථියක් උපදනා කල්හි ඒ නාම ධර්මයන්ට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන්නේ වර්තමාන රූප ධර්මයෝයි. චක්ඛුද්වාරික චිත්ත වීථියක් උපදින විට එහි චක්ඛුවිඤ්ඤාණ චිත්තය විසින් අරමුණු කරනු ලබන්නේ පළමු අතීත භවාඞ්ගය හා එකක්ෂණිකව උපන් රූප ධර්මයකි. ඒ රූප ධර්මය චක්ඛුවිඤ්ඤාණ චිත්තය ඉපදීමට පෙර ඉපිද, ස්ථිතියට පැමිණ සිටිය යුතු. එසේ අරමුණු කිරීමට පෙර ඉපිද පසුව උපදනා චක්ෂුර්විඥානයට උපකාර වන්නේ ඒ රූපයාගේ පුරේජාත ශක්තිය ඇති කෙයිනි. මෙසේ ඒ වර්තමාන රූප ධර්මයාගේ ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තිය දතයුතු. මෙපරිද්දෙන්ම වර්තමාන අටළොස් නිෂ්පන්න රූපධර්මයෝ ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් නාම ධර්මයන්ට උපකාර වෙත්.

**වත්ථුපුරේජාත ප්‍රත්‍යය,** චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය, හදය යන ෂට් වස්තුහුම වස්තුපුරේජාත ප්‍රත්‍යය වන ධර්මයෝයි. පූර්වයෙහි උපදනා චක්ෂුර් වස්තුව ආදිය පසුව උපදනා චක්ඛුවිඤ්ඤාණාදීන්ගේ ඉපදීමට වත්ථු පුරේජාත ශක්තියෙන් ප්‍රත්‍යය වේ. මේ ෂට් වස්තූන් අතුරෙන් වත්ථු පුරේජාත ප්‍රත්‍යය වන චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය යන වස්තූහු, මධ්‍යමායුෂ්ක ප්‍රසාද වස්තූහුය. එනම් ප්‍රථම අතීත භවාඞ්ගය හා ඒකක්ෂණිකව උපන් ප්‍රසාද රූපයෝය. ඉතිරි නාමස්කන්ධයන්ට වත්ථු පුරේජාත ශක්තියෙන් උපකාර වන හදය වත්ථු රූපය නම් ප්‍රතිසන්ධි ආදී පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය

වස්තුභූය. මරණාසන්න කාලයේදී අන්තිම චිත්ත වීථියේ උපදනා මනොද්වාරික චිත්තයන්ට පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන්නේ චුති චිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපදනා හදය වස්තු රූපය ය. ඉන්පසු කර්මජ රූපයෝ නූපදිත හෙයිනි.

ඇතැම් විටෙක චුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා මේ අන්තිම කර්මසමුට්ඨාන හදයවත්ථු රූපය අරමුණු කරමින් මනොද්වාරාවජ්ජන, කාමජවන, තදාරම්මණ ආදි චිත්තයන් උපදනා කල්හි ඒ මරණාසන්න නාම-ස්කන්ධයන්ට එකී හදය වත්ථු රූපය වස්ත්වාරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් ද උපකාර වේ.

**ත්‍රිරාශිය**

**ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය**

**ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය** වන ධර්මයෝ නම්

වර්තමාන නිෂ්පන්න රූපයෝ අටළොස් දෙනය.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන නාම ධර්මයෝ නම්-

පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කාමාවචර සිත් සිව් පනසය,

අභිඥා සිත් දෙකය,
අප්‍රමාණ්‍ය දෙක හැර ඉතිරි චෛතසික පනසය,

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්—

ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය නොලබන අවස්ථාවෙහි වූ, පඤ්ච විඥානයන් හා මනොධාතු ත්‍රිකය යන තෙළෙස් චිත්තයන් හැර ඉතිරි සිත් සසැත්තෑවය (76)

චෛතසික දෙපනසය,
චිත්තජ රූපයෝය,
ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය,
බාහිර රූපයෝය,
ආහාරජ රූපයෝය,

ඍතුජ රූපයෝය,
අසංඥසත්ත්ව කර්මජ රූපයෝය,
ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන මොව්හුය.

**වස්තුපුරේජාත ප්‍රත්‍යය.**

**වස්තුපුරේජාත ප්‍රත්‍යය ධර්මයෝ නම්:-**

**ප්‍රවෘත්ති කාලයෙහි**- මධ්‍යමායුෂ්ක චක්‍ෂු, ශ්‍රෝත, ඝ්‍රාන, ජිව්හා, කාය වස්තුය.

ප්‍රතිසන්ධි ආදී පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තුවය, නිරෝධ සමාපත්තියෙන් නැගී සිටින අවස්ථා-වෙහි පූර්වයෙහි එක් චිත්තක්‍ෂණයක කාලයේ උපදනා හදයවස්තු රූපය, මරණාසන්න කාලයෙහි චුති චිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපදනා හදයවස්තුවය, යන ධර්මයෝයි.

**ප්‍රත්‍යෝත්පන්න වශයෙන් ලැබෙන ධර්මයෝ නම්—**

ප්‍රවෘත්ති කාලයෙහි පඤ්චවොකාර භූමියෙහි උපදනාවූ විඥාන ධාතු සතය, චෛතසික දෙපනසය.

**ප්‍රත්‍යනීක ධර්මයෝ නම්—**

චතුවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහිවූ ලොභමූල සිත් අටය,

මොහමූල සිත් දෙකය,

මනොවාරාවජ්ජනය,

මහා කුසල් සිත් අටය,

මහා ක්‍රියා සිත් අටය,

අරූපාවචර සිත් දොළොසය,

සොවාන් මාර්ග චිත්තය හැර ලොකොත්තර සිත් සතය,

චෙෂ, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, අප්‍රමාණ්‍යය හැර

චෛතසික සසාළිසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාම-ස්කන්ධයෝය, පඤ්චවොකාර ප්‍රතිසන්ධි පසළොස හා චෛතසික පන්තිසය, චිත්තජරූප, ප්‍රතිසන්ධි කර්මජරූප, බාහිරරූප, අහාරජ රූප, ඍතුජ රූප, අසංඥසත්ත්ව කර්මජ රූප, ප්‍රවෘත්ති කර්මජ රූප යන මේ ධර්මයෝය.

**පුරේජාත ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනාචාර හෙවත් විපි තුනෙකි.**

## 1. **විපිය.**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස පුරෙජාත පච්චයෙන පච්චයො, ආරම්මණ පුරේජාතං, වත්ථු පුරේජාතං.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආරම්මණ පුරෙ ජාත වත්ථු පුරෙජාත යන පුරේජාත ප්‍රත්‍යය ශක්ති දෙකෙන් ප්‍රත්‍යය වේ )

මෙහි අව්‍යාකෘත ධර්මයට පුරේජාත ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වන අව්‍යාකෘත ධර්මයෝ නම්—

චක්ෂුර්විඥානයට ප්‍රත්‍යය වන වර්තමාන රූපාරම්මණය,

ශ්‍රොත විඥානයට ප්‍රත්‍යය වන වර්තමාන ශබ්දාරම්මණය,

ඝ්‍රාණ විඥානයට ප්‍රත්‍යය වන වර්තමාන ගන්ධාරම්මණය,

ජිව්හා විඥානයට ප්‍රත්‍යය වන වර්තමාන රසාරම්මණය,

කාය විඥානයට ප්‍රත්‍යය වන වර්තමාන පොට්ඨබ්බා-රම්මණය,

මනොධාතු ත්‍රයට ප්‍රත්‍යය වන වර්තමාන පඤ්චාරම්මණය, මනොද්වාරාවර්ජනය, කාමක්‍රියා ජවන නවය, තදාරම්මණ එකොළොසය යන මේ ධර්මයන්ට ප්‍රත්‍යය වන වර්තමාන නිෂ්පන්න රූප අටළොසය,

දිබ්බචක්ඛු ක්‍රියා අභිඥාවට ප්‍රත්‍යය වන දූර, ප්‍රතිච්ඡන්න, ස්නිග්ධ සූක්ෂම වර්තමාන රූපාරම්මණය,

දිබ්බ සෝත ක්‍රියා අභිඥාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්නාදී වූ වර්තමාන ශබ්දාරම්මණය යන ධර්මයෝ යි.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

කාම විපාක තෙවිස්සය,

කාමක්‍රියා එකොළොසය,

දිබ්බචක්ඛු, දිබ්බසෝත ක්‍රියා අභිඥා දෙකය,

විරති ත්‍රය හා අප්‍රමාණ්‍යවය හැර චෛතසික තෙතිසය,

යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **ආරම්මණ, නිස්සය, පුරෙජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍ය ශක්ති සය අතුරෙන් **පුරේජාත** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්:

**ආරම්මණ පුරෙජාතං**

**1. අරහා චක්ඛුං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො, විපස්සති.**

(රහතන් වහන්සේ ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා කාමාවචර චිත්තයෙන්, ඒ චිත්තයට පූර්වයෙහි හටගත් කර්මජවූ වර්තමාන චක්ෂුප්‍රසාද රූපය අරමුණු කරමින් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරන කල්හි, ඒ කාමාවචර විදර්ශනා ක්‍රියා චිත්තයන්ට චක්ෂුප්‍රසාද රූපය ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. සොතං, ඝාණං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, වත්ථුං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො, විපස්සති.**

(රහතන් වහන්සේ කාමාවචර ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා චිත්තයෙන් එයට පූර්වයෙහි හටගත් කර්මජවූ වර්තමාන සෝතප්‍රසාද රූපය, ඝාණප්‍රසාද රූපය, ජිව්හා ප්‍රසාද රූපය, කායප්‍රසාද රූපය යන රූපයෝද, චතුසමුට්ඨානික වූ වර්තමාන රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ යන රූපයෝද, කම්මසමුට්ඨාන හදයවත්‍ථු රූපයද අරමුණු කරමින් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යයි විදර්ශනා කරන කල්හි ඒ කාමාවචර විදර්ශනා ක්‍රියා චිත්තයන්ට ශ්‍රෝත්‍රප්‍රසාදාදීවූ ඒ රූපයෝ ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3 දිබ්බෙන චක්ඛුනා රූපං පස්සති.**

(රහතන් වහන්සේ දිබ්බචක්ඛු ක්‍රියා අභිඥා චිත්තයෙන් දූර, ප්‍රතිච්ඡන්න, ස්නිග්ධ, සූක්ෂ්ම රූපාරම්මණය දක්නා කල්හි, පුරේජාතවූ ඒ රූපාරම්මණය, දිබ්බචක්ඛු ක්‍රියා අභිඥා චිත්තයට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. දිබ්බාය සොත ධාතුයා සද්දං සුණාති.**

(රහතන් වහන්සේ දිබ්බසොත ක්‍රියා අභිඥා චිත්තයෙන් දූර, ප්‍රතිච්ඡන්න, ස්නිග්ධ, සූක්ෂ්ම ශබ්දාරම්මණය දක්නා කල්හි පුරේජාතවූ ඒ ශබ්දාරම්මණය, දිබ්බසොත ක්‍රියා අභිඥා චිත්තයට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. රූපායතනං චක්ඛු විඤ්ඤාණස්ස පුරේජාත පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ වර්තමාන රූපාරම්මණය අරමුණු කරමින් චක්ෂුර්විඥානය උපදනා කල්හි ඒ රූපායතනය චක්ෂුර් විඥානයට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. සද්දායතනං, සොතවිඤ්ඤාණස්ස පුරෙජාත පච්චයෙන පච්චයො.**

පුරේජාතවූ වර්තමාන ශබ්දාරම්මය අරමුණු කරමින් ශ්‍රොත විඤ්ඤාණය උපදනා කල්හි ඒ ශබ්දායතනය ශ්‍රොත විඥානයට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ

**7. ගන්ධායතනං ඝාණ විඤ්ඤාණස්ස පුරෙජාත පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ වර්තමාන ගන්ධාරම්මණය අරමුණු කරමින් ඝාන විඤ්ඤාණය උපදනා කල්හි ඒ ගන්ධායතනය ඝාන විඥානයට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**8. රසායතනං ජිව්හා විඤ්ඤාණස්ස පුරෙජාත පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ වර්තමාන රසාරම්මණය අරමුණු කරමින් ජිව්හා විඤ්ඤාණය උපදනා කල්හි ඒ රසායතනය ජිව්හා විඥානයට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**9. ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණස්ස පුරෙජාත පච්චයෙන පච්චයො.**

(පුරෙජාතවූ වර්තමාන පඨවි, තෙජො, වායො සඞ්ඛ්‍යා-තවූ ඵොට්ඨබ්බාරම්මණය අරමුණු කරමින් කාය විඥානය උපදනා කල්හි ඒ ඵොට්ඨබ්බායතනය කායවිඥානයට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ රහතන්වහන්සේගේ විදර්ශනා ක්‍රියා චිත්තයෝද, ඒ විදර්ශනාවට අරමුණුවන පුරේජාත චක්ඛුප්‍රසාදාදී රූපයෝද, ක්‍රියා අභිඥ චිත්තවයද, එයට අරමුණු වන රූප ධර්මයෝද, චක්ඛුවිඤ්ඤාණාදී පඤ්ච විඤ්ඤාණයෝද එයට අරමුණු වන රූපායතනාදී රූපධර්මයෝද අව්‍යාකෘත ධර්මයෝයි. මෙය "අව්‍යාකෘත ධර්මයට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

වත්ථු පුරෙජාතං.

**1. චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණස්ස පුරෙජාත පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ චක්ෂුර් වස්තුව හෙවත් චක්ඛායතනය චක්ෂුර්විඥානයාගේ ඉපැද්මට වත්ථුපුරේජාත ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ )

**2. සොතායතනං සොතවිඤ්ඤාණස්ස පුරේජාත පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ ශ්‍රොත වස්තුව හෙවත් සොතායතනය, ශ්‍රොත විඥානයාගේ ඉපැද්මට වත්ථුපුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

**3 ඝාණායතනං ඝාණ විඤ්ඤාණස්ස පුරෙජාත පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ ඝාන වස්තුව හෙවත් ඝානායතනය, ඝාන විඥානයාගේ ඉපැද්මට වත්ථු පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

**4. ජිව්හායතනං ජිව්හා විඤ්ඤාණස්ස පුරේජාත පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ ජිව්හා වස්තුව හෙවත් ජිව්හායතනය, ජිව්හා විඥානයාගේ ඉපැද්මට වත්ථු පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. කායායතනං කායවිඤ්ඤාණස්ස පුරේජාත පචචයෙන පචචයො.**

(පුරේජාතවූ කායවස්තුව හෙවත් කායායතනය, කාය විඥානයාගේ ඉපැද්මට වත්ථු පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. වත්ථු විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං පුරෙජාත පච්චයෙන පච්චයො**

Free Distribution www.aathaapi.org

(පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හෘදයවස්තු රූපය, පශ්චිමවූ පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ, අරූප විපාක සතරය, ද්විපඤ්ච විඥානය යන තුදුස් විපාක නාමස්කන්ධයන් හැර ඉතිරි දෙවිසි විපාක නාමස්කන්ධයන්ට හා විසි ක්‍රියා නාමස්කන්ධයන්ට පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අරූප විපාක චිත්තයෝ අවස්තුකව හටගන්නාහ. ද්විපඤ්ච විඥානයෝ චක්ෂුප්‍රසාදාදී වස්තූන් නිශ්‍රය කොටගෙන උපදිති.

මෙසේ චක්ඛායතනාදීවූ වස්තූහු චක්ඛු විඥානාදීවූ අව්‍යාකෘත නාමස්කන්ධයන්ට වත්ථුපුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම "අව්‍යාකෘත ධර්මයට පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

2 විථිය

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස පුරෙජාත පච්චයෙන පච්චයො-ආරම්මණ පුරෙජාතං, වත්ථුපුරෙජාතං**

(අව්‍යාකෘත ධර්ම කුසල ධර්මයට ආරම්මණ පුරේජාත වත්ථු පුරේජාත යන පුරේජාත ප්‍රත්‍යය ශක්ති දෙකෙන් උපකාර වේ.)

**ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය-**

මෙහි කුසල ධර්මයට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **ප්‍රත්‍යය ධර්මයෝ** නම්:

මහා කුසල් අටට ප්‍රත්‍යය වන වර්තමාන නිෂ්පන්න රූප අට්ඨාරසය, දිබ්බචක්ඛු කුසලාභිඥාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්නාදීවූ වර්තමාන රූපාරම්මණය,

දිබ්බසොත කුසලාභිඤ්ඤාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්නාදිවූ වර්තමාන ශබ්දාරම්මණය යන ධර්මයෝ යි.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්- මහා කුසල් සිත් අටය,

දිබ්බචක්ඛු, දිබ්බසොත කුසලාභිඤ්ඤද්වය,
විරති අප්‍රමාණ්‍යයන් හැර චෛතසික තෙතිසය,

යන ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝයි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **ආරම්මණ, නිස්සය, පුරෙජාත විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ශක්ති සය අතුරෙන් **පුරෙජාත** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්:

**1. සෙක්ඛාවා පුථුජ්ජනාවා චක්ඛුං අනිච්චතො දුක්ඛතො, අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂයන් වහන්සේ හෝ පෘථග්ජනයෝ හෝ වර්තමානවූ චක්ෂුප්‍රසාද රූපය අරමුණු කරමින් අනිත්‍යය, දුක්ඛය ය, අනාත්මය යයි මහා කුසල චිත්තයෙන් විදර්ශනා කරන කල්හි, විදර්ශනා කරන ඒ මහා කාමාවචර කුසල යන්ට පුරේජාතවූ ඒ චක්ෂුප්‍රසාද රූපය ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. සොතං, ඝාණං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, වත්ථුං, අනිච්චතො, දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂයන් වහන්සේ හෝ පෘථග්ජනයෝ හෝ වර්තමානවූ ශ්‍රොතප්‍රසාදය, ඝානප්‍රසාදය, ජිව්හාප්‍රසාදය, කායප්‍රසාදය චතුසමුට්ඨානික රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, කම්මසමුට්ඨාන හදයවත්ථු රූපය අරමුණු කරමින් අනිත්‍යය, දුක්ඛය ය, අනාත්මය යයි කාමාවචර කුසල් සිතින් විදර්ශනා කරන කල්හි ඒ විදර්ශනා කුසල චිත්තයන්ට ශ්‍රොතප්‍රසාදාදී වූ අව්‍යාකෘත ධර්මයෝ අරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. දිබ්බෙන චක්ඛුනා රූපං පස්සන්ති.**

(ශෛක්ෂ, පෘථග්ජන පුද්ගලයෝ දිබ්බචක්ඛු කුසලාභිඥාඥ චිත්තයෙන් දූර ප්‍රතිච්ඡන්නාදිවූ වර්තමාන රූපාරම්මණය දක්නා කල්හි, ඒ කුසලාභිඥාඥ චිත්තයන්ට වර්තමාන රූපාරම්මණය ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. දිබ්බාය සොත ධාතුයා සද්දං සුණන්ති.**

(ශෛක්ෂ, පෘථග්ජන පුද්ගලයෝ දිබ්බසොත කුසලාභිඥාඥ චිත්තයෙන් දූර ප්‍රතිච්ඡන්නාදිවූ වර්තමාන ශබ්දාරම්මණය අසන කල්හි ඒ කුසලාභිඥාඥ චිත්තයන්ට වර්තමාන ශබ්දාරම්මණය පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ චක්ඛුප්‍රසාදාදිවූ අව්‍යාකෘත ධර්මයෝ කාමාවචර මහා කුසලාභිඥාඥ චිත්තයන්ට ආරම්මණ පුරේජාත ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වීම" යයි කියනු ලැබේ.

**වත්ථු පුරේජාත.**

**වත්ථු කුසලානං ඛන්ධානං පුරේජාත පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ හදයවත්ථු රූපය, පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ, කුසල නාමස්කන්ධයන්ගේ ඉපදීමට වත්ථු පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

මෙසේ අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

**3. වීථිය**

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස පුරෙජාත පච්චයෙන පච්චයො— ආරම්මණ පුරෙජාතං, වත්ථු පුරෙජාතං.**



Free Distribution www.aathaapi.org

(අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට ආරම්මණ පුරේජාත, වත්ථු පුරේජාත යන පුරේජාත ප්‍රත්‍යය ශක්ති දෙකෙන් උපකාර වේ.)

**ආරම්මණ පුරෙජාත.**

මෙහි අකුසල ධර්මයට ආරම්මණ පුරේජාත ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ප්‍රත්‍යය ධර්මයෝ** නම්:

වර්තමාන නිෂ්පන්න රූප අටළොසය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොසය,
චෛතසික සත්විස්සය යන ධර්මයෝයි.

මෙහි එක්වර සුදුසු පරිදි ලැබෙන ආරම්මණාදීවූ ප්‍රත්‍යය ශක්ති අටෙන් ආරම්මණ පුරේජාත ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්:

**1. චක්ඛුං අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(චක්ෂුප්‍රසාදය අරමුණුකොට ලෝභමූල සෝමනස්ස සහගත සිතින් ආස්වාදනය කරන කල්හිද, සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන ලෝභමූල සෝමනස්ස සහගත චිත්තයෙන් සතුටු වන කල්හිද, ඒ චක්ෂුප්‍රසාදය අරමුණු කරමින් රාගය උපදනා කල්හි රාගය ප්‍රධාන ලෝභමූල චිත්තයටද, දිට්ඨිය උපදනා කල්හි දිට්ඨිගත සම්ප්‍රයුක්ත ලෝභමූල චිත්තයටද, විචිකිච්ඡා උපදනා කල්හි විචිකිච්ඡා සම්ප්‍රයුක්ත මෝහමූල චිත්තයටද, උද්ධච්චය උපදනා කල්හි උද්ධච්ච සම්ප්‍රයුක්ත මෝහමූල චිත්තයටද, දොම්නස උපදනා කල්හි පටිඝසම්ප්‍රයුක්ත ද්වේෂ මූල චිත්තයටද ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. සොතං, ඝාණං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, වත්ථුං අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(සොතප්‍රසාදය, ඝාණප්‍රසාදය, ජිව්හාප්‍රසාදය, කායප්‍රසාදය, රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, හදයවස්තුව අරමුණු කොටගෙන ආස්වාදනය, අභිනන්දනය කරන කල්හිද, එය අරභයා රාගය, දිට්ඨිය, විචිකිච්ඡාව, උද්ධච්චය, දෞමනස්සය උපදනා කල්හි ඒ සෝතප්‍රසාදාදී අව්‍යාකෘත ධර්මයෝ දොළොස් අකුසල චිත්තයන්ට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ දොළොස් අකුසල චිත්තයන් විසින් අරමුණු කරනු ලබන්නාවූ කම්මසමුට්ඨානවූ චක්ඛුප්‍රසාදය, සෝතප්‍රසාදය, ඝානප්‍රසාදය, ජිව්හාප්‍රසාදය, කායප්‍රසාදයද, චතුසමුට්ඨානික රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ යන රූපයෝද, කම්මසමුට්ඨාන හදයවත්ථු රූපයද ඒ අකුසල චිත්තයට පූර්වයෙහි ඉපිද ස්ථිතිප්‍රාප්තවූ වර්තමාන අව්‍යාකෘත ධර්මයෝයි. එසේහෙයින් "අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ" යයි කියනු ලැබේ.

**වත්ථු පුරෙජාතං.**

**වත්ථු අකුසලානං ඛන්ධානං පුරෙජාත පච්චයෙන පච්චයො.**

(හදයවත්ථු රූපය අකුසලස්කන්ධයන්ට පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසල නාමස්කන්ධයන්ට වත්ථු පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **හදයවත්ථු රූපය** නම්:

පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහිවූ පශ්චිම පශ්චිම දොළොස් අකුසල චිත්තයන්ට ප්‍රත්‍යය වන වොට්ඨපන මනොද්වාරාවජ්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් සහ උපදනා හදය වස්තුවය,

Free Distribution www.aathaapi.org

මරණාසන්න අකුසල ජවන් පසට ප්‍රත්‍යයවන චුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හදය-වස්තුවය යන ප්‍රත්‍යය ධර්මයෝ යි.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන අකුසල නාමස්කන්ධයෝ නම් පශ්චිම පශ්චිම වූ දොළොස් අකුසල චිත්තයෝයි.

මෙහිදී සුදුසු පරිදි එක්වර ලැබෙන **නිස්සය, ආරම්මණ, ආරම්මණාධිපති, ආරම්මණූපනිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් පුරේජාත ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්,

**වත්ථු අකුසලානං ඛන්ධානං පුරෙජාත පච්චයෙන පච්චයො.**

(යට දක්වනලද හදයවත්ථු රූපය, දොළොස් අකුසල නාමස්කන්ධයන්ට පුරේජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙසේ අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට **ආරම්මණ පුරේජාත, වත්ථු පුරේජාත** යන ප්‍රත්‍යය ශක්තිදෙකෙන් උපකාර වන බව දතයුතු.

## 11. පච්ඡාජාත ප්‍රත්‍යය

තමා පසුව ඉපිද තමාට පෙර උපන් ධර්මයට අනුබල දීමේ ශක්තියට **පච්ඡාජාත ශක්තිය** යයි කියනු ලැබේ. එහෙයින් නාම ධර්මයන් වූ චිත්ත චෛතසික ධර්මයෝ තමන්ට පෙර උපන් රූප ධර්මයන්ගේ පැවැත්මට අනුබල දෙන හෙවත් උපකාර වන ශක්තියට **පච්ඡාජාත ප්‍රත්‍යය** යයි කියති. කලින් හටගත් ගසේ නොනැසී පැවැත්මට පසුව ඇතිවන ජලය, ධාතුව ආදිය උපකාර වන්නාක් මෙනි. පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තිය ඇති ධර්මයෝ නම් නාම ධර්මයෝයි. එනම්: චිත්ත චෛතසික ධර්මයෝයි.

ප්‍රත්‍යුත්පන්න ධර්ම වශයෙන් ලැබෙන්නේ රූප ධර්ම-යෝයි. සතර අරූප තලයන්හි රූප හට නොගන්නා හෙයින් එහි පවත්නා නාම ධර්මයන්ගේ පශ්චාජ්ජාත ප්‍රත්‍යය ශක්තිය නොලැබේ. එසේම අසංඥසත්ත්ව භූමියේද සිත් නූපදනා හෙයින් පශ්චාජ්ජාත ප්‍රත්‍යය ශක්තිය ලැබීමට නාම ධර්මයෝ නැත. එබැවින් පශ්චාජ්ජාත ප්‍රත්‍යය ශක්තිය ලැබෙන්නේ පඤ්චවොකාර භවයෙහි පමණය.

මව් කුසෙහි පිළිසිඳ ගන්නා සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධි චිත්තය උපදනා කල්හි, එහි උත්පාදක්ෂණයෙහිදී ඇති වන්නේ කර්මජ රූප පමණය. එහෙයින් ඒ අවස්ථාවෙහි පවත්නා කය **ඒකජ කාය** නම් වේ. ප්‍රතිසන්ධි චිත්තයාගේ ස්ථිතික්ෂණයේදී, එහි උත්පාදක්ෂණයේදී ඇතිවූ කර්මජ රූප කලාපයන්ට ඇතුළත්වූ තේජෝ ධාතුව ස්ථිතිප්‍රාප්තවූ බැවින් එයින් ඍතුජ රූප කලාපයෝද උපදවත්. එවිට පටිසන්ධි චිත්තයාගේ ස්ථිතික්ෂණයේදී කර්මජ රූප හා ඍතුජ රූප පවත්නා බැවින් එකල්හි පවත්නා කය **ද්විජ කාය** නම් වේ ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව ප්‍රථම භවාඞ්ග චිත්තයාගේ පහළවීම සමගම චිත්තජ රූපයෝද පහළවෙත්. එකල්හි පවත්නා කය, **කර්මජ, ඍතුජ, චිත්තජ** යන තෙවැදෑරුම් රූපකලාපයන්ගෙන් යුක්ත බැවින් එයට **ත්‍රිජ කාය** යයි කියනු ලැබේ. යම් කලෙක මේ සිරුරෙහි ආහාරජ රූප කලාපයෝ හටගන්නේද එකල්හි **කම්ම, චිත්ත, ඍතු, ආහාර** යන සතර සමුට්ඨාන රූප කලාපයෝ ඇතිවන හෙයින් ඒ කය **චතුජ කාය** නමි. රූපාවචර බ්‍රහ්ම ලොකයන්හි ආහරජ රූප නොලැබෙන හෙයින්, රූපී බ්‍රහ්මයින්ට ඇත්තේ **ත්‍රිජ කායයෙකි.** අසංඥසත්ත්වයෙහි ඇත්තේ **කර්මජ රූප** හා **ඍතුජ රූප** පමණක් බැවින් එහි ලැබෙන්නේ **ද්විජ කායයෙකි.**

රූපස්කන්ධයත් හා නාමස්කන්ධයත් පවත්නා පඤ්ච වොකාර භවයෙහි පළමුව උපදනා රූපස්කන්ධයන්ට පසුව උපදනා නාමස්කන්ධයෝ මේ පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්. එබැවින් පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තිය ඇති නාම ධර්මයෝ නම් අරූප විපාක සතර හැර ප්‍රථම භවාඞ්ගාදිවූ පශ්චිම පශ්චිම වූ සිත් පස් අසූවය (85) එහි ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන්නේ ප්‍රතිසන්ධි චිත්තය ආදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි රූපයෝයි. මේ නාම ධර්මයන්ගේ පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තිය ලැබීමෙන් රූපසන්තතිය නොබිඳී පවතී.

**පච්ඡාජාත ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය.**

**පච්ඡාජාත ප්‍රත්‍යය** වන **ධර්මයෝ** නම්:

අරූප විපාක සතර හැර ප්‍රථම භවඞ්ගාදී පශ්චිම පශ්චිමවූ සිත් පස් අසූවය.

චෛතසික දෙපනසය - යන නාම ධර්මයෝයි.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ **නම්**

ප්‍රතිසන්ධි ආදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණියාවූ **එකජකාය, ද්විජකාය, ත්‍රිජකාය, චතුජකාය** යන රූප ධර්මයෝයි.

**ප්‍රත්‍යනීක ධර්මයෝ නම්-**

එකුන් අනූ චිත්තය,

චෛතසික දෙපනසය,

පශ්චිම පශ්චිම චිත්තයන් හා උපදනා චිත්තජ රූපයෝය,

බාහිර රූපයෝය,

ආහාරජ රූපයෝය,

ඍතුජ රූපයෝය,

අසංඥසත්ත්ව කර්මජ රූපයෝය,

ප්‍රවෘත්ති කර්මජ රූපයෝය.

යන මේ නාමරූප ධර්මයෝයි.

Free Distribution www.aathaapi.org

**පශ්චාජ්ජාත** ප්‍රත්‍යය පිළිබඳ **විසර්ජන** වාර හෙවත් **වීථි** තුනෙකි.

**1. විපිය.**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස පච්ඡාජාත පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාත ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම් පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්සද, චෛතසික අටතිසය යන කුසල නාමස්කන්ධයෝය.

**ප්‍රත්‍යාක්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්: වොට්ඨපන, මනොවාරාවජ්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණෙන තිජකාය, චතුජ කායයන්ට ඇතුළත් රූප ධර්මයෝයි.

මෙහි අනුවාද වශයෙන්,

**පච්ඡාජාතා කුසලාඛන්ධා පුරේජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත පච්චයෙන පච්චයො.**

(පසුව පසුව උපදනා එක්විසි කුසල් සිත් හා අටතිස් චෛතසිකයෝ පූර්ව පූර්ව වූ වොට්ඨපන මනොවාරාවජ්ජනාදී චිත්තයන් හා ඉපිද ස්ථිතිප්‍රාප්තවූ තිජ, චතුජ ආදී ප්‍රභෙද වත්වූ මේ කයට පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

කුසල් සිත් උපදනේ ජවන් සිත් වශයෙනි. පඤ්චවාර චිත්ත වීථියක් වේ නම් කුසල ජවනයට පූර්වයෙහි උපදින්නේ වොට්ඨපන චිත්තයයි. මනොවාර වීථියෙහි නම් කුසල ජවනයට පූර්වයෙහි මනොවාරාවජ්ජන චිත්තය උපදී. ඒ ක්‍රියා චිත්තය සමග ඉපිද ස්ථිතිප්‍රාප්තවූ රූපයනට කුසල

නාමස්කන්ධයෝ පච්ඡාජාත ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම" යයි කියනු ලැබේ.

2. විපිය.

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස පච්ඡාජාත පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධයෝ අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අකුසල ධර්මයෝ** නම්, අකුසල් සිත් දොළොස සහ චෛතසික සත්විස්සය **ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම් වොට්ඨපන මනොද්වාරාවර්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණෙන තිජකාය, චතුජ කායයන්ට ඇතුළත් රූප ධර්මයෝයි.

මෙහි අනුවාද වශයෙන්,

**පච්ඡාජාතා කුසලාඛන්ධා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාත පච්චයෙන පච්චයො**

(පසුව පසුව උපදනා දොළොස් අකුසල් සිත් හා සත්විසි චෛතසිකයෝ, පූර්ව පූර්ව වූ වොට්ඨපන මනොද්වාරාවර්ජනාදී චිත්තයන් හා ඉපිද ස්ථිතිප්‍රාප්ත වූ තිජ චතුජ ආදීවූ මේ කයට පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

3. විපිය.

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස පච්ඡාජාත පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මෙහි අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

ප්‍රතිසන්ධි ආදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද සථිතිප්‍රාප්තවූ **ඒකජ**, ද්විජ, ත්‍රිජ, චතුජ **කායයන්ට** ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ප්‍රථම භවඞ්ගාදී පශ්චිම පශ්චිම වූ විපාක සිත් දෙතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අව්‍යාකෘත ධර්මයෝයි.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

ප්‍රතිසන්ධි ආදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද සථිතියට පැමිණි ඒකජ, ද්විජ, ත්‍රිජ, චතුජ කායයන් වූ රූප ධර්මයෝ යි.

මෙහිදී එක්වර ලැබෙන **පච්ඡාජාත, විප්‍රයුක්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සතරෙන් **පච්ඡාජාත** ශක්තියම ලැබේ.

## 12. ආසෙවන ප්‍රත්‍යය

ප්‍රත්‍යයෝත්පන්න ධර්මය නැවත නැවත සේවනය කරන්නේය යන අර්ථයෙන්ද, ප්‍රත්‍යයෝත්පන්නයා විසින් නැවත නැවත සේවනය කරනු ලබන්නේය යන අර්ථයෙන්ද **ආසේවන** නම් වේ. අනතුරුව උපදනා තමාගේ ජාතියට අයත් චිත්තය වඩා බලවත් කිරීමටත් තමාගේ සවභාවය ගැන්වීමටත් සමත් බව **ආසෙවන ශක්තිය** වේ. මෙසේ අනතුරු චිත්තය බලවත් කිරීමට ශක්තිය ඇත්තේ ජවන් සිත්වලට පමණය. විපාක සිත් සවභාවයෙන්ම දුර්වල හෙයින් එහි ආසෙවන ශක්තියක් නැත. ජවන් සිත්වලද, සමාන ජාතික වුවද, සමාන වෙදනා ඇති සිතක්ම විය යුතු. අන් වේදනාවකින් යුක්ත සිතකට ආසේවන ප්‍රත්‍යය නොවේ.

කාමාවචර කුසල චිත්තය තමාට අනතුරුව උපදනා වූ වේදනා වශයෙන් නොවෙනස්වූ කාමාවචර කුසල චිත්තයට ආසෙවන ප්‍රත්‍යය වේ.

කාමාවචර ඥානසම්ප්‍රයුක්ත කුසල චිත්තයෝ වේදනා වශයෙන් තමන් හා සමාන වූ රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර කුසල චිත්තයන්ට ආසෙවන ශක්තියෙන් ප්‍රත්‍යය වෙති.

රූපාවචර කුසලයෝ තමන් හා සමාන රූපාවචර කුසලයන්ටද, අරූපාවචර කුසලයෝ තමන් හා සමාන අරූපාවචර කුසලයන්ටද ආසේවන ප්‍රත්‍යය වෙති.

ලෝකෝත්තර කුසල චිත්තයට අනතුරුව නැවත ලෝකෝත්තර කුසල චිත්තයක් නූපදනා හෙයින් එහි ආසෙවන ප්‍රත්‍යයක් නැත.

අකුසල චිත්තයෝ වේදනාදී වශයෙන් තමන් හා සමාන වූ අකුසල චිත්තයන්ටම ආසේවන ප්‍රත්‍යය වෙති.

කාමාවචර ක්‍රියා චිත්තයෝ වේදනාදී වශයෙන් තමන් හා සමාන වූ කාමාවචර ක්‍රියා චිත්තයන්ට ආසේවන ප්‍රත්‍යය වෙති.

ඥානසම්ප්‍රයුක්ත ක්‍රියා චිත්තයෝ වේදනාදී වශයෙන් තමන් හා සමාන වූ රූපාවචර අරූපාවචර ක්‍රියා චිත්ත-යන්ටද ආසේවන ප්‍රත්‍යය වෙති.

රූපාවචර ක්‍රියා චිත්තයෝ තමන් හා සමාන වූ රූපාවචර ක්‍රියා චිත්තයන්ට ආසේවන ප්‍රත්‍යය වෙති.

අරූපාවචර ක්‍රියා චිත්තයෝ තමන් හා සමාන අරූපා-වචර ක්‍රියා චිත්තයන්ට ආසේවන ප්‍රත්‍යය වෙති.

කුසලාදී චිත්තයන් අතුරෙන් ආසේවන ප්‍රත්‍යය ලැබූ චිත්තයෝ එය නොලැබූ චිත්තයන්ට වඩා බලවත් වෙති.

**ආසේවන ප්‍රත්‍යය පිළිබඳ නිරාශිය.**

**ආසේවන ප්‍රත්‍යය** වන ධර්මයෝ නම්—

මාර්ග ජවන, ඵල ජවන හැර පූර්ව පූර්ව වූ ලෞකික ජවනයෝ සත්සාළිස් දෙන සහ චෛතසික දෙපනසය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්:

ප්‍රථම ජවන, ඵල ජවන හැර පශ්චිම පශ්චිම වූ ජවනයෝ එක්පනස් දෙන සහ චෛතසික දෙපනසය. **ප්‍රත්‍යනීක ධර්‍මයෝ** නම්–

ප්‍රථම ජවන වශයෙන් උපදනා එකුන් තිස් (29) කාම ජවනයෝ ය,

ආවර්ජනා චිත්තවය ය.

විපාක සිත් සතිසය.

චෛතසික දෙපනසය.

චිත්තජ රූපයෝය.

ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය.

බාහිර රූපයෝය.

ආහාරජ රූපයෝය.

ඍතුජ රූපයෝය.

අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය.

යන ධර්මයෝ යි.

**ආසේවන ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනා වාර හෙවත් විධි තුනෙකි.**

**1. විධිය.**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආසෙවන පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට ආසේවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

මෙහි කුසල ධර්මයට ආසේවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්‍මයෝ** නම්:

මහා කුසල විතීය ජවනයට ප්‍රත්‍යය වන ප්‍රථම ජවනය ය.

Free Distribution www.aathaapi.org

මහා කුසල තෘතීය ජවනයට ප්‍රත්‍යය වන ද්විතීය ජවනය ය.

මහා කුසල චතුර්ථ ජවනයට ප්‍රත්‍යය වන තෘතීය ජවනය ය.

මහා කුසල පස්වන ජවනයට ප්‍රත්‍යය වන සතරවන ජවනය ය.

මහා කුසල සවන ජවනයට ප්‍රත්‍යය වන පස්වන ජවනය ය.

මහා කුසල සත්වන ජවනයට ප්‍රත්‍යය වන සවන ජවනය ය.

මහද්ගත සෝමනස්ස සහගත සිත් සතරට හා මාර්ග සෝමනස්ස සිත් සොළොසට ප්‍රත්‍යය වන ගෝත්‍රභූ, වෝදාන කෘත්‍යයවත් මහා කුසල ප්‍රථමවය ය.

මහද්ගත කුසල උපේක්ෂා සහගත සිත් පසට හා මාර්ග උපේක්ෂා සහගත සිත් සතරට ප්‍රත්‍යය වන ගෝත්‍රභූ වෝදාන කෘත්‍යයවත් මහා කුසල තෘතීයවය ය.

සමාපත්ති චිත්ත වීථින්හි පශ්චිම පශ්චිම මහද්ගත කුසලයන්ට ප්‍රත්‍යයවන පූර්ව පූර්ව සමාන වූ මහද්ගත කුසලයෝය යන ප්‍රත්‍යය ධර්මයෝ යි.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම් —

ප්‍රථම ජවනය හැර පශ්චිම පශ්චිම වූ මහා කුසල් අටය, මහග්ගත කුසල් නවය ය, මාර්ග කුසල් සතරය යන එක්විසි කුසලයෝ ය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසේවන, නත්ථි, විගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **ආසේවන ශක්තිය** ලැබේ.

මෙහි අනුවාද වශයෙන්,

**1. පුරිමා පුරිමා කුසලා ධම්මා, පච්ඡිමානං, පච්ඡිමානං කුසලානං ධම්මානං ආසේවන පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ අන්තිම ජවනය හැර සතළොස් ලෞකික කුසල නාමස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ ප්‍රථම ජවනය හැර එක්විසි කුසල ජවන නාමස්කන්ධයන්ට ආසේවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. අනුලොමං ගොත්‍රභුස්ස ආසෙවන පච්චයෙන පච්චයො.**

(සංස්කාරාරම්මණික අනුලොම ක්‍ෂාන්‍යවත් ඥානසම්ප්‍රයුක්ත මහා කුසල චිත්තය, නිර්වාණාරම්මණික ගොත්‍රභූ ක්‍ෂාන්‍යවත් මහා කුසල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට ආසෙවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. අනුලොමං වොදානස්ස ආසෙවන පච්චයෙන පච්චයො.**

(සංස්කාරාරම්මණික අනුලොම ක්‍ෂාන්‍යවත් ඥානසම්ප්‍රයුක්ත මහා කුසල චිත්තය නිර්වාණාරම්මණික ව්‍යොදාන ක්‍ෂාන්‍යවත් මහා කුසල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට ආසෙවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. ගොත්‍රභු මග්ගස්ස ආසෙවන පච්චයෙන පච්චයො.**

(නිර්වාණාරම්මණික ගොත්‍රභූ ක්‍ෂාන්‍යවත් මහා කුසල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර සෝවාන් මාර්ග චිත්තයට ආසේවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**5. වොදානං මග්ගස්ස ආසෙවන පච්චයෙන පච්චයො.**

(නිර්වාණාරම්මණික වොදාන ක්‍ෂාන්‍යවත් මහා කුසල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර උපරිම මාර්ගත්‍රයට ආසෙවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්)

මෙසේ කුසල ධර්මය කුසල ධර්මයට ආසෙවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

2. විපිය.

**අකුසලා ධම්මා අකුසලස්ස ධම්මස්ස ආසෙවන පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට ආසෙවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්මයට ආසෙවන ප්‍රත්‍ය ශක්තියෙන් උපකාරවන අකුසල ධර්මයෝ නම්:

අන්තිම ජවනය හැර පූර්ව පූර්ව වූ දොළොස් අකුසල ජවනයෝ යි.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

ප්‍රථම ජවනය හැර පශ්චිම පශ්චිම වූ දොළොස් අකුසල ජවනයෝ යි.

මෙහි අනුවාද වශයෙන්-

**පුරිමා පුරිමා අකුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ඛන්ධානං ආසෙවන පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ අන්තිම ජවනය හැර දොළොස් අකුසල ජවන නාමස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ ප්‍රථම ජවනය හැර දොළොස් අකුසල ජවන නාමස්කන්ධයන්ට ආසෙවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

3. **විපිය.**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආසෙවන පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ආසෙවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට ආසෙවන ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

පශ්චිම පශ්චිම වූ අටළොස් ක්‍රියා ජවනයන්ට ප්‍රත්‍යය වන අන්තිම ජවනය හැර පූර්ව පූර්ව වූ අටළොස් ක්‍රියා ජවනයෝය. නොහොත්—

හසිතොත්පාද මහා ක්‍රියා ද්විතීය ජවනයට ප්‍රත්‍යය වන ප්‍රථම ජවනය.

එම තුන්වන ජවනයට ප්‍රත්‍යය වන ද්විතීය ජවනය.

එම සතරවන ජවනයට ප්‍රත්‍යය වන තුන්වන ජවනය.

එම පස්වන ජවනයට ප්‍රත්‍යය වන සතරවන ජවනය.

එම සවන ජවනයට ප්‍රත්‍යය වන පස්වන ජවනය.

එම සත්වන ජවනයට ප්‍රත්‍යය වන සවන ජවනය.

මහග්ගත ක්‍රියා සොමනස්ස සහගත සිත් සතරට ප්‍රත්‍යය වන ගොත්‍රභූ කෘත්‍යවත් මහා ක්‍රියා ප්‍රථමවය ය.

මහග්ගත ක්‍රියා උපෙක්ඛා සහගත සිත් පසට ප්‍රත්‍යය වන ගොත්‍රභූ කෘත්‍යයවත් මහා ක්‍රියා තෘතීයවය ය.

සමාපජ්ජන වීථින්හි පශ්චිම පශ්චිම මහග්ගත ක්‍රියා ජවනයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව වූ මහග්ගත ක්‍රියා ජවනයෝ ය.

**ප්‍රත්‍යෝත්පන්න වශයෙන්** ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

ප්‍රථම ජවනය හැර පශ්චිම පශ්චිම ක්‍රියා ජවන අටලොසය, නොහොත් –

හසිතොත්පාද මහා ක්‍රියා ද්විතීයාදී ජවනයෝ ය.

මහද්ගත ක්‍රියා නවය යන අව්‍යාකෘත ධර්මයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසෙවන, නත්ථි, විගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **ආසේවන** ප්‍රත්‍යය ශක්තිය ලැබේ

මෙහි අනුවාදය වශයෙන්,

**පුරිමා පුරිමා කිරියාබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කිරියාබ්‍යාකතානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ අටළොස් ක්‍රියා ජවන නාමස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ අටළොස් ක්‍රියා ජවන නාමස්කන්ධයන්ට ආසෙවන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

කුසලාකුසල ක්‍රියා ජවනයන් උපදනා චිත්ත වීථීන් බැලීමෙන් මෙය පහසුවෙන් තේරුම් ගත හැකි වේ.

## 13. කර්ම ප්‍රත්‍යය

**කර්මය** යනු චෙතනාවට නමෙකි. සියලුම එකුන් අනූ චිත්තයන්හි යෙදෙන, සබ්බචිත්ත සාධාරණ චෛතසිකයකි. යම්කිසි අරමුණක් ගෙන සිතක් උපදනා කල්හි, ඒ චිත්තයෙන් කරනු ලබන යම් කිසි ක්‍රියාවෙක් වේ නම් ඒ ක්‍රියාව සිදුකිරීමට උපකාර වන පරිද්දෙන් අනිකුදු චෛතසික ධර්මයන් උපදවා ගෙන මේ චෙතනා චෛතසිකය ඒ සිතත් හා සමගම උපදී. එපමණක් නොව ඇතැම් විටෙක රූප ධර්මයෝද උපදවයි. එහෙයින්, සහජාත රූපාරූප ධර්මයනුත් උපදවාගෙන නොයෙක් ක්‍රියාවන් කිරීමෙහි ශක්තියක් මේ කර්ම නම්වූ චෙතනා චෛතසිකයට ඇති බව කියන ලදී.

තවද, නොයෙක් කුසලාකුසල කර්ම සිදුකිරීමෙදී, ඒ චිත්තය හා සමග උපදනා චෙතනාව තමා උපදනා අවස්ථාවෙන් අන්‍යවූ අවස්ථාවක අනාගතයෙහි රූපාරූප ධර්ම යන් උපදවයි. දානමය පුණ්‍යකර්මයක් සිදුකිරීමේදී කාමාවචර මහා කුසල් සිතක් උපදී. ඒ සිත හා සම්ගම ඒ දානමය පින්කම කිරීමට චිත්තප්‍රයොගය හෙවත් උත්සාහ වත් කිරීම් වශයෙන් චෙතනා චෛතසිකය අනිකුදු චෛතසික ධර්මයන් හා රූප ධර්මයන්ද උපදවාගෙන උපදියි. එයින් දානමය පින්කම සිදුවේ. මෙහිදී ඒ සිත උපදින ක්ෂණයෙහි සහජාතව උපදනා අනිකුදු රූපාරූප ධර්මයන්ට කර්ම නම් වූ මේ චෙතනාව **සහජාත කර්ම ප්‍රත්‍යයෙන්** උපකාර වේ. තවද, මේ කුසල චෙතනාව බලවත් වේ නම් අනාගතයේදී විපාක වශයෙන් නොයෙක්

රූපාරූප ධර්මයන් ඉපදවීමේ ශක්තියක් ද ඉතිරි කොට ඒ චේතනාව නිරුද්ධ වේ. ඒ හේතුවෙන් මරණින් මතු දෙව් මිනිස් සුගතියෙහි උපදනා කල්හි මේ චේතනාවගේ අනාගත විපාක ශක්තිය වශයෙන් පටිසන්ධි චිත්තයද, කර්මජ රූප කලාපයෝද, ප්‍රවෘත්ති විපාකයෝ ද ඇතිවෙත්. මෙයට **නානා ක්‍ෂණික කර්‍ම ප්‍රත්‍යය** යයි කියනු ලැබේ.

මෙසේ කර්ම ප්‍රත්‍යය **සහජාත කර්‍ම ප්‍රත්‍යය, නානා ක්‍ෂණික කර්‍ම ප්‍රත්‍යය** යයි විධ වේ.

තමා උපදනා කෙණෙහිම රූපාරූප ධර්මයන් උපදවන චේතනාව **සහජාත කර්‍ම ප්‍රත්‍යය වේ.**

තමා උපදනා අවස්ථාවෙන් අන්‍යවූ අවස්ථාවක අනාගතයෙහි රූපාරූප ධර්මයන් උපදවන චේතනාව **නානා ක්‍ෂණික කර්‍ම ප්‍රත්‍යය වේ.** නානා ක්‍ෂණික කර්මය නම්වූ මේ අතීත චේතනාව, ප්‍රතිසන්ධි භවාඞ්ගාදී චිත්තයන් හා කර්මජ රූපයන් හටගැනීමට හේතු වන බව දතයුතු.

**කර්‍ම ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය.**

**සහජාත කර්‍ම ප්‍රත්‍යය වන ධර්‍මයෝ නම්-**

එකුන් අනූ චිත්තයෙහි ඇති චේතනා එකුන් අනූවය.

**සහජාත කර්‍ම ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යොත්පන්නයෝ නම්-**

එකුන් අනූ චිත්තය.
චේතනාව හැර චෛතසික එක්පනසය
චිත්තජ රූපයෝ ය
ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, යන ධර්මයෝ යි.

**සහජාත කර්‍ම ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්‍මයෝ නම්-**

එකුන් අනූ චිත්තයෙහි ඇති චේතනා එකුන් අනූවය.
බාහිර රූපයෝය
ආහාරජ රූපයෝය
ඍතුජ රූපයෝය

අසංඥසත්ත්ව කර්මජ රූපයෝය
ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන මේ ධර්මයෝයි.

**නානා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යය වන ධර්මයෝ නම්-**

අතීතවූ කුසලාකුසල චේතනාවෝ තෙතිස් දෙනය

**නානා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ නම්–**

විපාක සිත් සතිසය
චෛතසික අටතිසය
ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය
අසංඥසත්ත්ව කර්මජ රූපයෝය
ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන මේ ධර්මයෝයි.

**නානා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීක ධර්මයෝ නම්-**

කුසල් සිත් එක්විස්සය
අකුසල් සිත් දොළොසය
ක්‍රියා සිත් විස්සය
චෛතසික දෙපනසය
චිත්තජ රූපයෝය
බාහිර රූපයෝය
ආහාරජ රූපයෝය
ඍතුජ රූපයෝය යන මේ ධර්මයෝයි.

**කර්ම ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනා වාර හෙවත් වීපිසතකි.**

**1.** වීපිය.

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස කම්ම පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට **කර්ම** ප්‍රත්‍යයෙන් උපකාර වේ.)

මෙහි **කුසල ධර්‍මයට කර්‍ම ප්‍රත්‍යයෙන් උපකාර වන කුසල ධර්‍මයෝ** නම්—

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන **එක්විසි** කුසල චිත්තයන්හි ඇති චේතනා **එකුන්** විස්සය.

**ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් ලැබෙන කුසල ධර්‍මයෝ** නම්—

කුසල් සිත් **එක්විස්සය.**

චේතනාව හැර චෛතසික සත්තිසය යන ධර්‍මයෝයි.

මෙහිදී එක්වර සුදුසු පරිදී ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, ආහාර, සම්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් **කර්‍ම ප්‍රත්‍ය ශක්තිය** ලැබේ.

මෙහි අනුවාද වශයෙන්—

**කුසලා චේතනා සම්පයුත්තකානං ඛන්ධානං කම්ම පච්චයෙන පච්චයො.**

(එක්විසි කුසල චිත්තයන්හි ඇති චේතනා එකුන්විස්ස, කුසල් සිත් එක්විස්සට හා චේතනාව හැර සත්තිස් චෛතසික ධර්‍ම නම් වූ සම්ප්‍රයුක්තස්කන්ධයන්ට කර්‍ම ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙය සහජාත කර්‍ම ප්‍රත්‍යය වේ.

**2. විජිය.**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්ම පච්චයෙන පච්චයො, සහජාතා නානාක්ඛණිකා.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත කර්ම ප්‍රත්‍යය නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය යන කර්ම ප්‍රත්‍යය ශක්ති දෙකෙන් උපකාර වේ.)

**සහජාත කර්‍ම ප්‍රත්‍යය.**

මෙහි අව්‍යාකෘත ධර්මයට සහජාත **කර්ම** ප්‍රත්‍යයෙන් උපකාර වන **කුසල ධර්‍මයෝ** නම්—

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ එක්විසි කුසල චිත්තයෙහි චෙතනා එක්විස්සය.

**ප්‍රත්‍යාත්පන්න වශයෙන්** ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

කුසල චිත්තජ රූපයෝයි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, නිස්සය, කම්ම, ආහාර, විප්පයුත්ත, අත්‍ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් **කර්ම ප්‍රත්‍යය ශක්තිය** ලැබේ.

මෙහි අනුවාද වශයෙන්—

**කුසලා චෙතනා චිත්ත සමුට්ඨානානං රූපානං කම්ම පච්චයෙන පච්චයො.**

එක්විසි කුසල චිත්තයන්හි ඇති **එක්විසි** චෙතනාවෝ ඒ එක්විසි කුසල චිත්තයන් හා සහජාත වූ චිත්තජ රූපයන්ට සහජාත කර්ම ප්‍රත්‍යයෙන් උපකාර වේ.)

**නානා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යය.**

මෙහි අව්‍යාකෘත ධර්මයට නානා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යය යෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්—

එකුන් තිස් කුසල විපාකයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන අතීත වූ එක්විසි කුසල චෙතනාවෝ යි.

එනම්:

අහේතුක කුසල විපාක, මහා විපාක නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන ත්‍රිහේතුක උත්කෘෂ්ට මහා කුසල චෙතනාවෝය.

අහේතුක කුසල විපාක ඥාන විප්‍රයුක්ත මහා විපාක නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන ත්‍රිහේතුක ඔමක, ද්විහේතුක උත්කෘෂ්ට මහා කුසල චෙතනාවෝය.

අහේතුක කුසල විපාක නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන ද්විහේතුක ඕමක මහා කුසල චේතනාවෝය.

ප්‍රථම ධ්‍යාන විපාක නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන ප්‍රථමධ්‍යාන කුසල චේතනාවය.

ද්විතීය ධ්‍යාන විපාක නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන ද්විතීය ධ්‍යාන කුසල චේතනාවය.

තෘතීය ධ්‍යාන විපාක නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන තෘතීයධ්‍යාන කුසල චේතනාවය.

චතුර්ථධ්‍යාන විපාක නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන චතුර්ථධ්‍යාන කුසල චේතනාවය.

පඤ්චමධ්‍යාන විපාක නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චමධ්‍යාන කුසල චේතනාවය.

ආකාසානඤ්චායතන විපාක නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන කුසල චේතනාවය.

විඤ්ඤාණඤ්චායතන විපාක නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන විඤ්ඤාණඤ්චායතන කුසල චේතනාවය.

ආකිඤ්චඤ්ඤායතන විපාක නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ආකිඤ්චඤ්ඤායතන කුසල චේතනාවය.

නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චේතනාවය.

සෝතාපත්ති ඵල නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන සෝතාපත්තිමග්ග චේතනාවය.

සකෘදාගාමි ඵල නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන සකෘදාගාමි මග්ග චේතනාවය.

අනාගාමි ඵල නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අනාගාමි මග්ග චේතනාවය.

Free Distribution www.aathaapi.org

අර්හත් ඵල නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අර්හත් මග්ග චේතනාවය යන ප්‍රත්‍යය ධර්මයෝයි.

**ප්‍රත්‍යයොත්පන්න වශයෙන්** ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්-

එකුන්තිස් කුසල විපාක **නාමස්කන්ධයන්** හා **කර්මජ** රූපයෝය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **කම්ම උපනිස්සය** යන ප්‍රත්‍යය ශක්ති දෙකෙන් **නානාක්ෂණික කර්ම** ප්‍රත්‍යය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්,

**කුසලා චේතනා විපාකානං ඛන්ධානං කටත්තාච රූපානං කම්ම පච්චයෙන පච්චයො.**

(අතීතවූ **එක්විසි** කුසල චේතනාවෝ **එකුන්තිස්** කුසල විපාක නාමස්කන්ධයන්ට **හා** කර්මජ රූපයන්ටද නානාක්ෂණික **කර්ම** ප්‍රත්‍යයෙන් උපකාර වේ.)

**8. විපිය.**

**කුසලො ධම්මො කුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස කම්ම පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසලාව්‍යාකෘත **ධර්මයට** කර්ම ප්‍රත්‍යය-යෙන් උපකාර වේ.)

මෙහි කුසලාව්‍යාකෘත ධර්මයට කර්ම ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **කුසල ධර්මය** නම්:

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ **එක්විසි** කුසල චිත්තයන්හි චේතනාවය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්:

සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජ රූපයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, නිස්සය, කම්ම, ආහාර, අත්‍ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **කර්‍ම ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්,

**කුසලා චෙතනා සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං කම්ම පච්චයෙන පච්චයො.**

(පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහිවූ එක්විසි කුසල චිත්තයන්හි ඇති චෙතනාවෝ සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද කම්ම ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

4. **විපිය.**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස කම්ම පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්‍මය අකුසල ධර්‍මයට කර්‍ම ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්‍මයට **කර්‍ම** ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්‍මයෝ** නම්-

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන දොළොස් අකුසල චෙතනාවෝය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්‍මයෝ නම්-

අකුසල් සිත් දොළොසය,

චෙතනාව හැර චෛතසික සවිස්සය,

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, ආහාර, සම්පයුත්ත, අත්‍ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් **කර්‍ම ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්-

**අකුසලා චෙතනා සම්පයුත්තකානං ඛන්ධානං කම්ම පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල් සිත්හි චෙතනාවෝ දොළොස් අකුසල චිත්තයන්ට හා චෙතනාව හැර ඉතිරි චෛතසික සවිස්සට කර්ම ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5.** වීථිය.

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස කම්ම පච්චයෙන පච්චයො. සහජාතා නානාක්ඛණිකා.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත කර්ම ප්‍රත්‍යය නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය යන ප්‍රත්‍යය ශක්ති දෙකෙන් උපකාර වේ.)

අව්‍යාකෘත ධර්මයට සහජාත කම්ම ප්‍රත්‍යය ශක්තියෙන් **උපකාරවන අකුසල ධර්මයෝ** නම්:

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දොළොස් අකුසල චෙතනාවෝ යි.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ **නම්** අකුසල චිත්තජ රූපයෝ යි.

මෙහිදී එක්වර ලැබෙන **සහජාත, නිස්සය, කම්ම, ආහාර, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් **සහජාත කර්ම** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලා චෙතනා චිත්තසමුට්ඨානානං රූපානං කම්ම පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල චිත්තයන්හි ඇති චෙතනාවෝ අකුසල චිත්තජ රූපයන්ට සහජාත කර්ම ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

අව්‍යාකෘත ධර්මයන්ට නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්:

අකුසල විපාක නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන දොළොස් අකුසල චේතනාවෝය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

අකුසල විපාක **නාමස්කන්ධයන්** හා කර්මජ රූපයෝයි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **කර්ම, උපනිශ්‍රය** ප්‍රත්‍යය ශක්ති දෙකින් **නානාක්ෂණික කර්ම** ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලා චෙතනා විපාකානං ඛන්ධානං කටත්තාච රූපානං කම්ම පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල චේතනාවෝ අකුසල විපාක නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.)

6. **විපිය.**

**අකුසලො ධම්මො අකුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස කම්ම පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසලාව්‍යාකෘත ධර්මයට කර්ම ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

මෙහිදී අකුසලාව්‍යාකෘත ධර්මයට කර්ම ප්‍රත්‍යයෙන් උපකාර වන **අකුසල ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දොළොස් අකුසල චේතනාවෝ ය.

**ප්‍රත්‍යාත්පන්න** වශයෙන් ලැබෙන අකුසලාව්‍යාකෘත ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොසය,
චේතනාව හැර චෛතසික සවිස්සය,
චිත්තජ රූපයෝය,

මෙහිදී එක්වර ලැබෙන **සහජාත, නිස්සය, කම්ම, ආහාර, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සයෙන් **කර්ම ප්‍රත්‍යය ශක්තිය** ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලා චේතනා සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානංච රූපානං කම්ම පච්චයෙන පච්චයො.**

(පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දොළොස් අකුසල චේතනාවෝ අකුසල් සිත් දොළොසය, චේතනාව හැර චෛතසික සවිස්සය යන සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන්ට හා අකුසල චිත්තජ රූපයන්ටද කර්ම ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

7. **විපිය.**

**අබ්‍යාකතො ධම්මො, අබ්‍යාකතස්ස ධම්මස්ස කම්ම පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට **කර්ම** ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**1. ප්‍රවෘත්ති කාලයෙහි**

ප්‍රවෘත්ති කාලයෙහි අව්‍යාකෘත ධර්මයට කර්ම ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්—

සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද ප්‍රත්‍යය වන විපාක සිත් සතිසය, ක්‍රියාසිත් විස්සය, යන මේ ධර්මයන්ගේ චේතනාවෝය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

විපාකසිත් සතිසය,

ක්‍රියාසිත් විස්සය,

චේතනාව හැර චෛතසික සත්තිසය,

යන සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන් හා චිත්තජ රූපයෝයි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, විපාක, ආහාර, සම්පයුක්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය නවය අතුරෙන් **කර්ම ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

**2. ප්‍රතිසන්ධි කාලයෙහි**

ප්‍රතිසන්ධි කාලයෙහි අව්‍යාකෘත ධර්මයට කර්ම ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ටද, සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ටද ප්‍රත්‍යයවන ප්‍රතිසන්ධි චේතනා එකුන් විස්සය (19)

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය.

චේතනාව හැර චෛතසික සූතිසය යන සම්ප්‍රයුක්ත ස්කන්ධයන් හා කර්මජ රූපයෝයි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ නිස්සය, කම්ම, විපාක, ආහාර, සම්ප්‍රයුක්ත, විප්‍රයුක්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති දසය අතුරෙන් **කර්ම ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්—

**1. විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා චෙතනා සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානංච රූපානං කම්ම පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, ක්‍රියාසිත් විස්සය යන අව්‍යාකෘත ධර්මයන් ගේ චෙතනාවෝ, විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය චෙතනාව සහිතවූ චෛතසික සත්තිසය යන සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද කර්ම ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා චෙතනා සම්පයුත්තකානං ඛන්ධානං කටත්තාච රූපානං කම්ම පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයෙහිදී ප්‍රතිසන්ධි චෙතනා එකුන් විසස, එම ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය, චෙතනාව හැර චෛතසික සූතිසය යන සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ටද, කර්ම ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ.)

**3. චෙතනා වත්ථුස්ස කම්ම පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධිචිත්තක්ෂණයේදී ප්‍රතිසන්ධි විපාක චිත්තයෙහි ඇති චෙතනාව හදය වත්ථු රූපයට කර්ම ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

## 14. විපාක ප්‍රත්‍යය

**විපාකයෝ** නම් පැසීමට පැමිණියාවූ ධර්මයෝයි. මේ විපාක ධර්මයෝ ඉතා ශාන්තය. දානාදීවූ කුසල ක්‍රියාවක් හෝ ප්‍රාණඝාතාදීවූ අකුසල ක්‍රියාවක් හෝ සිදුකිරීමට අසමර්ථය. මේ විපාක චිත්ත චෛතසිකයෝ අතීත කුසලාකුසල කර්මයන්ගේ විපාක වශයෙන් උපදනා ධර්මයෝය. එහෙයින්ම නිරුත්සාහ භාවයෙන් යුක්තය. නිරුත්සාහ භාවය නිසාම ශාන්තද වෙති. රහතන් වහන්සේ ගේ සිත කෙලෙශ ප්‍රහාණය කරණකොටගෙන ශාන්තවේ.

Free Distribution www.aathaapi.org

නමුත් විපාක චිත්තයන්ගේ ශාන්ත භාවය නිරුත්සාහ භාවයෙන්ම සිදුවන්නකි. ශාන්තවූ ඒ විපාක චිත්තයන් නිසා උපදනා චෛතසික ධර්මයෝද ශාන්ත වෙති. සිත චෛතසිකයනට තමාගේ නිරුත්සාහ ශාන්ත භාවය දෙන්නාක් මෙන් චෛතසිකයෝද, චිත්තයට තමන්ගේ නිරුත්සාහ ශාන්ත භාවය දෙති. ශාන්තවූ මේ විපාක චිත්තය නිසා උපදනාවූ රූපයෝද ශාන්ත වෙති. එහෙයින් ඒ චිත්තජ රූපයන්ට ශරීරය සෙලවීම් ආදි ක්‍රියාවන් සිදු කිරීමට ශක්තියක් නැත. එබැවින් විපාක ධර්මයෝ ඔවුනොවුන්ට හා සහජාත ධර්මයන්ටද ශාන්ත භාවය ගැන්වීම් වශයෙන් උපකාර වන හෙයින් **විපාක ප්‍රත්‍යය ධර්මයෝ** යයි කියනු ලැබේ.

**විපාක ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය**

**විපාක ප්‍රත්‍යය** වන ධර්මයෝ නම්—

ඔවුනොවුන්ටද, ඔවුනොවුන්ට හා චිත්තජරූප, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ටද ප්‍රත්‍යය වන විපාක සිත් සතිසය චෛතසික අටතිසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝයි.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්—

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන විපාක සිත් සතිසය,

චෛතසික අටතිසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය

ඒ නාමස්කන්ධයන් නිසා උපදනාවූ විඥප්ති රූප හැර චිත්තජ රූපයෝය.

ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය

යන ධර්මයෝය

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්

කුසල්සිත් එක් විස්සය

අකුසල් සිත් දොළොසය,

ක්‍රියා සිත් විස්සය,

චෛතසික දෙපනසය, යන නාමස්කන්ධයෝය.

ඒ නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝය.

බාහිර රූපයෝය.

ආහාරජ රූපයෝය.

සෘතුජ රූපයෝය.

අසංඥසත්ත්ව කර්මජ රූපයෝය.

ප්‍රවෘත්ති කර්මජ රූපයෝය. යන ධර්මයෝය.

විපාක ප්‍රත්‍යය පිළිබඳ **විසර්ජනාවාර** හෙවත් **විපි එකකි.**

එනම්:

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස විපාක පච්චයෙන පච්චයො**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට විපාක ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට විපාක ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්—

ඔවුනොවුන්ටද, ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ටද ප්‍රත්‍යවන විපාක සිත් සතිසය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝයි.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්—

විපාක සිත් සතිසය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් හා චිත්තජ රූපයෝයි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුක්ත, විප්පයුක්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් **විපාක ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්—

**1. විපාකාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං විපාක පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය චෛතසික අටතිසය යන අව්‍යාකෘත ධර්මයන්හි ඇති සතර නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට හා චිත්තජ රූපයන්ටද විපාක ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං විපාක පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, චෛතසික අටතිසය යන අව්‍යාකෘත ධර්මයන්හි ඇති සතර නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට හා චිත්තජ රූපයන්ටද විපාක ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං විපාක පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, චෛතසික අටතිසය යන අව්‍යාකෘත ධර්මයන්හි ඇති සතර නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට හා චිත්තජ රූපයන්ටද විපාක ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**ප්‍රතිසන්ධි කාලයෙහි** වනාහි අව්‍යාකෘත ධර්මයට විපාක ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්—

ඔවුනොවුන්ටද, ඔවුනොවුන්ට හා කර්මජ රූපයන්ටද ප්‍රත්‍යයවන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය.

චෛතසික පන්තිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝයි.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්—

ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය

චෛතසික පන්තිසය යන අවයව නාමස්කන්ධයන් හා කර්මජ රූපයෝද වෙත්.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් **විපාක ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

**4. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං කටත්තා ච රූපානං විපාක පච්චයෙන පච්චයො**

(ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රතිසන්ධි විපාක සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන අව්‍යාකෘත ධර්මයන්හි ඇති සතර නාමස්කන්ධයන් අතුරෙන් එක් නමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනටද ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ටද විපාක ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස කටත්තා ච රූපානං විපාක පච්චයෙන පච්චයො**

ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රතිසන්ධි විපාක සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන අව්‍යාකෘත ධර්මයන්හි ඇති සතර නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකටද, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ටද විපාක ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**6. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං කටත්තාච රූපානං විපාක පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධි කාලයෙහි ප්‍රතිසන්ධි විපාක සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන අව්‍යාකෘත ධර්මයන්හි ඇති සතර නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකටද, ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ටද විපාක ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්)

### 7. ඛන්ධා වත්ථුස්ස විපාක පච්චයෙන පච්චයො

(ප්‍රතිසන්ධික්ෂණයෙහිදී ප්‍රතිසන්ධි විපාක චිත්තයත් පිළිබඳ වූ සතර නාමස්කන්ධයෝ හදය වත්ථු රූපයට විපාක ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

ද්විපඤ්ච විඤ්ඤාණයෝය, ප්‍රතිසන්ධි විපාක චිත්තයෝය, අර්හත් චුති චිත්තය, සතර අරූපාවචර චිත්තයෝය යන විපාක චිත්තයෝ චිත්තජ රූප නූපදවත්.

අරූප විපාක චිත්තයෝ පහළවන අරූප භූමියෙහි කිසිදු රූපයක් නැත.

## 15. ආහාර ප්‍රත්‍යය

සත්ත්වයා පිළිබඳ වූ නාමරූප ධර්මයන්ගේ නැවත නැවත ඇතිවීමටද, පරම්පරා වශයෙන් වැඩීමටද, නොසිඳී පැවැත්මටද උපකාර වන ධර්මයන්ට **ආහාර ප්‍රත්‍යයෝයි** කියනු ලැබේ. උපන් සත්ත්වයන්ගේ පැවැත්මටද උපදින්නට සිටින සත්ත්වයන්ට අනුග්‍රහය පිණිසද මේ ආහාරයෝ බොහෝ සෙයින් උපකාර වෙත්. මෙසේ ආහාර ප්‍රත්‍යයෙන් උපකාර වන ආහාර නාමයෙන් හැඳින්වෙන ධර්මයෝ සතර දෙනෙකි.

එනම්:

1. **කබලීකාරාහාරය**
2. **ඵස්සාහාරය**
3. **මනෝසඤ්චේතනාහාරය**
4. **විඤ්ඤාණාහාරය** යන ධර්ම සතරය.

එයින් **කබලීකාරාහාරය** සංඛ්‍යාතවූ ඕජාරූපය ඕජාෂ්ටමක රූපකලාප උපදවමින් සම්පූර්ණ රූපකායටද උපස්ථම්භක භාවයෙන් උපකාර වේ. චතුජකායද පාලනය කෙරේ.



Free Distribution www.aathaapi.org

**ඵස්සාහාරය** සුඛ, දුක්ඛ, උපෙක්ඛා යන වෙදනාත්‍රය උපදවයි.

**මනොසඤ්චෙතනාහාරය** කාම, රූප, අරූප යන ත්‍රිවිධ භවය ඇති කරයි.

**විඤ්ඤාණාහාරය** ප්‍රතිසන්ධි නාමරූපයන් උපදවයි.

මෙයින් **කබලිඞ්කාරාහාරය, රූපාහාරයකි**.

**ඵස්සාහාරය, මනොසඤ්චෙතනාහාරය විඤ්ඤාණාහාරය** යන ත්‍රිවිධ ආහාරයෝ **නාමාහාරයෝයි**.

මේ ත්‍රිවිධ නාමාහාරයෝ වේදනාදිය ඇති කරමින් සත්ත්වයා පිළිබඳ වූ සියලු නාමරූප ධර්මයන්ගේ පරම්පරා වශයෙන් පැවැත්මට උපස්ථම්භක වේ. කර්මයෙන් ඇති කරන ලද කර්මජ රූපයන්ගේ පරම්පරාව බොහෝ කලක් නොසිඳී පැවැත්මට සෘතු ආහාර යන දෙදෙනාගේ අනුග්‍රහය ලැබිය යුතු— ඒ අනුග්‍රහය නොලදහොත් සත්ත්වයා මිය යන්නේය.

**ඕජාරූපය** සංඛ්‍යාත වූ රූපාහාරය **අධ්‍යාත්මික ඕජාරූපය, බාහිර ඕජාරූපය** යයි විවිධ වේ. කබලීකාරාහාරයෙහි හෙවත් අනුභව කළ ආහාරයෙහි ඕජා රූපය වශයෙන් ගතයුත්තේ බාහිර සෘතුජ රූප කලාපයන්හි ඇති ඕජා රූපයයි. අධ්‍යාත්මික ඕජාරූපය නම් සත්ත්ව ශරීරය පිළිබඳ වූ කර්ම චිත්ත, සෘතු, ආහාර යන සතර සමුට්ඨානික රූප කලාපයන්හි ඇති ඕජා රූපයයි. මේ සියලු ඕජාරූපයෝම ශාරීරික වූ සියලු රූපයන්ටම උපස්ථම්භනය කිරීම වශයෙන් ප්‍රත්‍යය වෙති. බාහිර ඕජාව සත්ත්ව ශරීරයට පැමිණෙන්නට පෙර කර්මාදි ප්‍රත්‍යය තුනෙන් හටගත් ඕජා රූපයන්ගෙන් සත්ත්ව ශරීරය පාලනය කරනු ලැබේ. බාහිර ඕජාව ශරීරගතවූ තැන් පටන්, ඒ බාහිර ඕජාවය, චතුසමුට්ඨානික අධ්‍යාත්මික ඕජාවය යන සියල්ලෙන්ම ශරීරය පාලනය වේ ශාරීරිකවූ රූප කලාපයන්ගෙන් එක් එක් රූප කලාපයක

ඇති ඕජාරූපය ඒ කලාපයේ ඉතිරි රූපයන්ට හා අන්‍ය සියලු ශාරීරික රූපයන්ටද ප්‍රත්‍යය වේ. රූපාහාර ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යොත්පන්නයන් වශයෙන් ගතයුත්තේ චතුසමුට්ඨානික රූප කලාපයන්හි ඇති ඕජා රූපයෙන් අන්‍ය රූපයෝ පමණය.

**ඵස්සාහාරය** - සත්ත්වයෝ සපශී හේතුයෙන් ආරම්මණ රසය විඳ, ඒ වේදනා නමැති උපභොග පරිභොග රසය ආස්වාදනය කරමින් එයට සතුටු වෙමින් සසරෙහි නොකලකිරී සිටී. එබැවින් සසර පැවැත්මට හෙවත් ස්කන්ධයන්ගේ නොසිඳී පැවැත්මට මේ **ඵස්සාහාරය** මහත්වූ උපකාරයෙකි.

**මනොසඤ්චෙතනාහාරය** - චෙතනා සංඛ්‍යාත කර්ම යෙන් භවයෙන් භවයට යමින් සත්ත්වයෝ සසර සැරි සරති. චෙතනා නම් වූ කර්මය නැති කල්හි නැවත නැවත ඉපදීමක් ඇති නොවේ. එබැවින් තම තමන් පිළිබඳ වූ අධ්‍යාත්මික ස්කන්ධ සන්තතියේ නොසිඳී පැවැත්මට මනොසඤ්චෙතනාහාරය මහත් වූ උපකාර යෙකි

**විඤ්ඤාණාහාරය** - විඤ්ඤාණයාගේ උපකාරයෙන් අරමුණු දැන, ඒ අරමුණුවල සපශී, වේදනා, චෙතනාදීන් උපදවාගෙන සසර සැරිසරමින් ස්කන්ධයන්ගේ පරම්පරාව නොසිඳ පැවැත්මට මේ විඤ්ඤාණාහාරය මහත් වූ උපකාරයෙකි.

**ආහාර ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය**-

**1. රූපාහාරය.**

**රූපාහාර ප්‍රත්‍යය** වශයෙන් ගනු ලබන්නේ කබලී-කාරාහාරය නම්වූ ආහාර පානයන්හි ඇත්තාවූ බාහිර ඕජාවය.

එහි **ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන්නේ ආහාර සමුට්ඨානික රූපයෝයි.

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්- එකුන් අනූ චිත්තය, චෛතසික දෙපනසය, චිත්තජ රූපයෝය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, බාහිර රූපයෝය, ඍතුජ රූපයෝය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන මොව්හුය.

තවත් ක්‍රමයකින්

**රූපාහාර ප්‍රත්‍යය ධර්මයෝ** නම්:

අධ්‍යාත්ම සන්තානයෙහි වූ චතුසමුට්ඨානික ඕජාවය,

බාහිර ඍතුජ ඕජාවය යන ඕජා ධර්මයෝ ය,

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්-

ප්‍රත්‍යයවන ඕජාවෙන් අන්‍ය වූ චතුසමුට්ඨානික රූපයෝය යන මේ ධර්මයෝයි.

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්- එකුන් අනූ චිත්තය, චෛතසික දෙපනසය, බාහිර රූපයෝය යන මේ ධර්මයෝ ය.

**2. නාමාහාරය.**

**නාමාහාර ප්‍රත්‍යය** වන ධර්මයෝ නම්-

**ස්පර්ශය, චේතනාවය, විඥානය** යන ධර්මයෝ තිදෙනය,

**නාමාහාර ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යොත්පන්නයෝ** නම්-

එකුන් අනූ චිත්තයෝය,

චෛතසික දෙපනසය,

චිත්තජ රූපයෝය,

ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය යන ධර්මයෝයි.

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්-

බාහිර රූපයෝය, ආහාරජ රූපයෝය, ඍතුජ රූපයෝය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන ධර්මයෝය.

**ආහාර ප්‍රත්‍යය පිළිබඳ විසජ්ජනාවාර හෙවත් වීථි සතකි.**

**1. වීථිය.**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආහාර පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

කුසල ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන මොවුන් කෙරෙහි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන නාමාහාර තිදෙනාය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්:

කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්ත ස්කන්ධයෝයි

මෙහිදී සම්ප්‍රයුකත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන නාමාහාර තුනෙන් එක්වර සුදුසු පරිදි ලැබිය හැකි **අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, ආහාර, ඉන්ද්‍රිය, සම්ප්‍රයුක්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති දසය අතුරෙන් ආහාර ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**කුසලා ආහාරා සම්පයුත්තකානං ඛන්ධානං ආහාර පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන මේ කුසල ධර්මයන්හි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන කුසලාහාරයෝ තිදෙන, එම කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන්ට ආහාර ප්‍රත්‍යය ශකතියෙන් උපකාර වෙත්.)

**2. විපිය.**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආහාර පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **කුසල ධර්‍මයෝ** නම්:

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන මේ ධර්මයන් කෙරෙහි ඇති **ඵස්ස, චෙතනා, විඤ්ඤාණ** යන නාමාහාර තිදෙනාය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම් කුසල චිත්තජ රූපයෝය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **අධිපති, සහජාත, නිස්සය, කම්ම,** ආහාර, **ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති නවය අතුරෙන් ආහාර ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**කුසලා ආහාරා චිත්ත සමුට්ඨානානං රූපානං ආහාර පච්චයෙන පච්චයො.**

(කුසල් **සිත් එක්**විස්සය, චෛතසික අටතිසය යන කුසල ධර්මයන්හි ඇති **ඵස්ස, චෙතනා, විඤ්ඤාණ** යන කුසලාහාරයෝ තිදෙන, ඒ කුසල චිත්ත සමුට්ඨාන රූපයන්ට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙති.

**3. විපිය**

**කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස ආහාර පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසලාව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

Free Distribution www.aathaapi.org

මෙහි කුසලාව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්ත සක්ඛන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි කුසල් සිත් එක්වීස්සය, චෛතසික අටතිසය යන මේ ධර්මයන්ගේ ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන නාමාහාර තුනය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම් කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන සම්ප්‍ර-යුක්ත සක්ඛන්ධයන් හා චිත්තජ රූපයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **අධිපති, සහජාත නිස්සය, කම්ම, ආහාර, අත්ථි අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් **ආහාර ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**කුසලා ආහාරා සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං ආහාර පච්චයෙන පච්චයො.**

(පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන මොවුන්ගේ ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන කුසලාහාරයෝ තුන් දෙන සම්ප්‍රයුක්ත නාමසක්ඛන්ධයන්ට හා කුසල චිත්තජ රූපයන්ටද ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**4. විපිය**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආහාර පච්ච-යෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්ත සක්ඛන්ධයන්ට ප්‍රත්‍යය වන අකුසල් සිත් දොළොස චෛතසික සත්විස්ස යන මොවුන් කෙරෙහි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන නාමාහාරයෝ තිදෙනාය.

**ප්‍රත්‍යාත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්ස යන සම්ප්‍රයුක්ත ස්කන්ධයෝය.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලා ආහාරා සම්පයුත්තකානං ඛන්ධානං ආහාර පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය චෛතසික සත්විස්සය යන මොවුන් කෙරෙහි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන අකුසල නාමාහාරයෝ තිදෙන, සම්ප්‍රයුක්ත අකුසල නාම ස්කන්ධයන්ට ආහාර ප්‍රත්‍යය **ශක්තියෙන්** උපකාර වෙත්)

**5. වීථිය.**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආහාර පච්චයෙන පච්චයො.**

(අකුසල **ධර්මය** අව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය **ශක්තියෙන්** උපකාර වේ.

මෙහි අව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය **ශක්තියෙන්** උපකාර වන **අකුසල ධර්මයෝ** නම්:

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අකුසල නාමස්කන්ධයන්හි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන අකුසල නාමාහාරයෝ තිදෙනාය.

**ප්‍රත්‍යාත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ **නම්:**

අකුසල චිත්තජ රූපයෝ යි.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලා ආහාරා චිත්තසමුට්ඨානානං රූපානං ආහාර පච්චයෙන පච්චයො.**

Free Distribution www.aathaapi.org

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අකුසල නාමස්කන්ධයන්හි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ,** යන අකුසල නාමාහාරයෝ තිදෙනා අකුසල චිත්තජ රූපයන්ට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**6. විපිය.**

**අකුසලො ධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස ආහාර පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසලාව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසලාව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන අකුසල ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අකුසල නාමස්කන්ධයන්හි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන අකුසල නාමාහාරයෝ තිදෙනාය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන අකුසලාව්‍යාකෘත ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා අකුසල චිත්තජ රූපයෝයි.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලා ආහාරා සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං ආහාර පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අකුසලස්කන්ධයන්හි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන ආහාරයෝ තිදෙන සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන්ට හා අකුසල චිත්තජ රූපයන්ටද ආහාර ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වෙත්)

**8. විපිය.**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආහාර පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය, අව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

**රූපාහාරයෙහි**- අව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මය** නම්:

ඒක කලාපගතවූද, නානා කලාපගතවූද, චතුසමුට්ඨාන රූපයන්ට ප්‍රත්‍යය වන ඕජා රූපයයි.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

චතුසමුට්ඨානික රූපයෝයි.

මෙහිදී එක්වර ලැබෙන **ආහාර, අත්ථි, අවිගත,** යන ප්‍රත්‍යය ශක්ති තුනෙන් **ආහාර ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

**නාමාහාරයෙහි**-

**ප්‍රවෘත්ති කාලයෙහි** අව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්තස්කන්ධයන්ටද, සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද ප්‍රත්‍යය වන විපාක සිත් සතිසය, ක්‍රියාසිත් විස්සය, චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්හි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන නාමාහාරයෝ තිදෙනාය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

විපාක සිත්, සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජ රූපයෝය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, විපාක, ආහාර, ඉන්ද්‍රිය: සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති දොළොස අතුරෙන් **ආහාර ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

**ප්‍රතිසන්ධි කාලයෙහි:**

අව්‍යාකෘත ධර්මයට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්තස්කන්ධයන්ටද, සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා කර්මජ රූපයන්ටද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සෙහි හා චෛතසික පන්තිසෙහි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ,** යන නාමාහාරයෝ තිදෙනාය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

ප්‍රතිසන්ධි සිත් එකුන්විස්සය, චෛතසික පන්තිසය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා කර්මජ රූපයෝයි.

මෙහිදි එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, අඤ්ඤ-මඤ්ඤ, නිස්සය, කම්ම, විපාක, ආහාර, ඉන්ද්‍රිය, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති එකොළොස අතුරෙන් **ආහාර ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්:

**1. විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ආහාරා සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං ආහාර පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අව්‍යාකෘත නාමස්කන්ධයන් කෙරෙහි ඇති **ඵස්ස, චේතනා, විඤ්ඤාණ** යන ආහාරයෝ තිදෙන සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද, ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා ආහාරා සම්පයුත්තකානං ඛන්ධානං කටත්තාච රූපානං ආහාර පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයෙහි, ප්‍රතිසන්ධි විපාක සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන අව්‍යාකෘත නාමස්කන්ධ යන්හි ඇති **ස්පර්ශ, චේතනා, විඥාන** යන නාමාහාරයෝ තිදෙන සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ටද ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. කබලිංකාරො ආහාරො ඉමස්ස කායස්ස ආහාර පච්චයෙන පච්චයො.**

(එක කලාපගතවූ ද, නානා කලාපගතවූ ද, චතුසමුට්ඨානික රූපකලාපයන්හි ඕජා රූපය එයින් අන්‍යවූ චතුසමුට්ඨානික රූපයන්ට ආහාර ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

## 16. ඉන්ද්‍රිය ප්‍රත්‍යය

තමන් හා සම්බන්ධ ධර්මයන්ට තමන් අයත් කෘත්‍යයෙහි තමන්ගේ ස්වභාවය ඉක්මවන්නට නොදී තමන්ට අනුකූල කරවන්නාවූ ධර්මයෝ **ඉන්ද්‍රිය ධර්මයෝයි. ඉන්ද** යනු කුසලාකුසලයන්ට නමෙකි ඉන්ද නම්වූ කුසලාකුසල කර්මය ප්‍රකාශ කරන අර්ථයෙන් ඉන්ද්‍රිය නම් වේ එසේම ඉන්ද නම්වූ කුසලාකුසල කර්මයෙන් නිපදවන ලද්දාහුය යන අර්ථයෙන්ද ඉන්ද්‍රිය නම් වේ. මෙයින් ප්‍රධාන වශයෙන් කර්මජ ඉන්ද්‍රියයෝ ගැනෙති. තවද, ඉන්ද යනු බුදුන් වහන්සේට නමෙකි. ඉන්ද නම් වූ බුදුන්වහන්සේ විසින් දේශනය කරන ලද්දාහුය යන අර්ථයෙන්ද ඉන්ද්‍රිය නම් වේ. ඉන්ද නම් වූ තථාගතයන් වහන්සේ විසින් දක්නා ලද්දාහුය යන අර්ථයෙන්ද තථාගතයන් වහන්සේ විසින් සේවනය කරන ලද්දාහුය යන අර්ථයෙන්ද ඉන්ද්‍රියයෝ නම් වෙති. ඉන්ද්‍රිය නාමයෙන් හැඳින්වෙන ධර්මයෝ දෙවිස්සෙකි. මේ ධර්මයෝ තමන් ඇසුරුකරන නාම ධර්මයන්ද, තමන් හා එක්ව උපදනා නාමරූප ධර්මයන්ද තමන්ට අනුකූල කරවමින් තමන්ගේ ඊශ්වරත්වය දක්වති. ඉන්ද්‍රිය ධර්මයන්ගේ මේ ඊශ්වරත්වය ඒ හා සම්බන්ධ ධර්මයන්ගේ ඉපදීමටද

උපකාර වේ. එසේ ඊශ්වරත්වයෙන් උපකාරවන ධර්මයන්ට **ඉන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ** යයි කියනු ලැබේ. මේ දෙවිසි ඉන්ද්‍රිය ධර්මයන් අතුරෙන් **ස්ත්‍රීන්ද්‍රිය, පුරුෂෙන්ද්‍රිය** යන ධර්ම දෙක හැර ඉතිරි විසි ඉන්ද්‍රිය ධර්මයෝ **ඉන්ද්‍රිය ප්‍රත්‍යය ධර්ම** වශයෙන් සලකනු ලැබේ. මෙකී භාවරූපයන්ගේ ඊශ්වරත්වය ඇත්තේ ස්ත්‍රීලිඞ්ග පුරුෂලිඞ්ගාදියට පමණය. අන්‍ය හේතූන්ගෙන් උපදනා රූපයන්ට ස්ත්‍රී ආකාර, පුරුෂ ආකාරයන් ගැන්වීමට මේ භාවරූපයෝ සමත්ය අන්‍ය හේතූන්ගෙන් හටගන්නා රූපයෝ ඒ භාවරූපයන්ට අනුකූලව ස්ත්‍රී පුරුෂ ආකාරයන් ගන්නා බැවින් ඒ ධර්ම දෙක ඉන්ද්‍රියයෝ නම් වෙති. නමුත් මේ ඉත්ථින්ද්‍රිය පුරුෂෙන්ද්‍රිය යන භාවරූප දෙකෙහි ප්‍රත්‍යය ධර්මයන්ට තිබියයුතු ජනක ශක්තිය හෝ, උපස්ථම්භක ශක්තිය හෝ අනුපාලක ශක්තිය හෝ නැති හෙයින් ඒ ධර්ම දෙක ප්‍රත්‍යය ධර්ම වශයෙන් සලකනු නොලැබේ.

**ඉන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ, සහජාතින්ද්‍රිය ප්‍රත්‍යය ධර්මය, පුරෙජාතින්ද්‍රිය ප්‍රත්‍යය ධර්මය, රූප ජීවිතෙන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මය** යයි තෙවැදෑරුම් වේ තමන් හා එක්වර උපදනා ධර්මයන්ට ප්‍රත්‍යයවන අරූප ඉන්ද්‍රිය ධර්මයෝ **සහජාතින්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝයි.** තමන් පළමු ඉපිද, පසුව උපදනා පඤ්ච විඥානයන්ට ප්‍රත්‍යය වන ප්‍රසාදරූප ධර්මයෝ **පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝයි.** ජීවිතෙන්ද්‍රිය රූපය, **රූප ජීවිතෙන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයයි.** මේ රූප ජීවිතෙන්ද්‍රි ය, ඉන්ද්‍රිය භාවයෙන් ප්‍රත්‍යය වන්නේ සහජාත රූපයන්ටය.

**ඉන්ද්‍රිය ප්‍රත්‍යය පිළිබඳ නිරාශිය:**

**1. සහජාතින්ද්‍රිය ප්‍රත්‍යය වන ධර්මයෝ** නම්: ජීවිතෙන්ද්‍රි ය ය, චිත්තය ය, වෙදනාවය, ශ්‍රද්ධාවය, වීර්‍ය්‍ය ය, සමෘතිය ය, ඒකාග්‍රතාවය, ප්‍රඥාවය යන නාමෙන්ද්‍රිය ධර්මයෝ අටදෙනය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්: එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස්ය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන ධර්මයෝය.

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්: බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන ධර්මයෝය.

**2. පුරෙජාතින්ද්‍රිය ප්‍රත්‍යය වන ධර්මයෝ** නම්: මධ්‍යමායුෂ්ක හෙවත් ප්‍රථම අතීත භවාඞ්ගය හා උපදිනා චක්ෂුර් වස්තුවය, ශ්‍රොත වස්තුවය, ඝ්‍රාණ වස්තුවය, ජිව්හා වස්තුවය, කාය වස්තුවය යන ප්‍රසාද වස්තු පසය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්: ද්විපඤ්ච විඥනයෝ ය, සබ්බචිත්ත සාධාරණ චෛතසික සතය යන ධර්මයෝ ය.

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්: ද්විපඤ්චවිඥනයන් හැර ඉතිරි එකුන් අසූ චිත්තය ය, චෛතසික දෙපනසය, චිත්තජ රූපයෝය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, බාහිර රූපයෝය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන ධර්මයෝ ය.

**3. රූප ජීවිතින්ද්‍රිය ප්‍රත්‍යය වන ධර්මයෝ** නම්: ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි වශයෙන් සියලු රූප ජීවිතෙන්ද්‍රිය ධර්මයෝය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්: රූප ජීවිතෙන්ද්‍රියයෙන් අන්‍යවූ කර්මජ කලාපගත රූපයෝය.

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්: එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය, චිත්තජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූප, අසංඥසත්ත්ව කර්මජ රූප, ප්‍රවෘත්ති කර්මජ රූප යන රූපයන්ට අයත්වූ ජීවිතෙන්ද්‍රිය රූපයෝය යන මේ ධර්මයෝය.

**ඉන්ද්‍රිය ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනා වාර හෙවත් විසි සතකි.**

1. විපිය.

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්: සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන **එක්විසි** කුසල් සිත්හි ඇති, **ජීවිත, චිත්ත, වේදනා, සද්ධා, විරිය, සති, එකග්ගතා, පඤ්ඤා** යන නාමේන්ද්‍රිය ධර්මයෝ අට දෙනය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම් කුසල නාමස්කන්ධයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **හේතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, ඣාන මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති දොළොස අතුරෙන් **ඉන්ද්‍රිය ශක්තිය** ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**කුසලා ඉන්ද්‍රියා සම්පයුත්තකානං ඛන්ධානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(**එක්විසි** කුසල චිත්තයන්හි ඇති **ජීවිත**, **චිත්ත**, වේදනා, සද්ධා, විරිය, සති, එකග්ගතා, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්මයෝ අටදෙන සම්ප්‍රයුක්ත කුසල නාමස්කන්ධයන්ට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

2. විපිය.

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

**කුසල** ධර්මය අව්‍යාකෘත ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමි-යෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්සෙහි වූ **ජීවිත, චිත්ත, වෙදනා, සද්ධා, වීරිය, සති, එකග්ගතා, පඤ්ඤා** යන නාමෙන්ද්‍රිය ධර්මයෝ අට දෙනය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්: කුසල චිත්තජ රූපයෝ ය.

මෙහිදී **හේතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති දොළොස අතුරෙන් **ඉන්ද්‍රිය ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**කුසලා ඉන්ද්‍රියා චිත්ත සමුට්ඨානානං රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(එක්විසි කුසල් සිත්හි ඇති ජීවිත, චිත්ත ආදී වූ කුසල ඉන්ද්‍රිය ධර්මයෝ අටදෙන කුසල චිත්තජ රූපයන්ට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. වීරිය**

**කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසලාව්‍යාකෘත ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසලාව්‍යාකෘත ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාරවන **කුසල ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන එක්විසි කුසල චිත්තයන්හි ඇති ජීවිත චිත්තාදීවූ කුසල ඉන්ද්‍රිය ධර්මයෝ අටදෙනය,

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන කුසලාව්‍යාකෘත ධර්මයෝ නම්:

සම්ප්‍රයුක්ත ස්කන්ධයන් හා කුසල චිත්තජ රූපයෝ ය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **හේතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්තීන් අතුරෙන් **ඉන්ද්‍රිය ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**කුසලා ඉන්ද්‍රියා සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො**

(එක්විසි කුසල් සිත්හි ඇති ජීවිත චිත්ත, ආදීවූ කුසල ඉන්ද්‍රිය ධර්මයෝ අටශදන සම්ප්‍රයුක්ත කුසල නාමස්කන්ධයන්ට හා කුසල චිත්තජ රූපයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙති.

**4 වීථිය**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ඉන්ද්‍රිය පච්ච-යෙන පච්චයො**

(අකුසල ධර්මය අකුසල ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාර වේ )

මෙහි අකුසල ධර්මයන්ට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්: සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන්ට ප්‍රත්‍යයවන දොළොස් අකුසල් සිත්හි ඇති, **ජීවිත, චිත්ත,** වෙදනා, **විරිය, එකග්ගතා** යන අකුසල ඉන්ද්‍රිය ධර්මයෝ පස්දෙනය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම් සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයෝයි.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලා ඉන්ද්‍රියා සම්පයුත්තකානං ඛන්ධානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(දෙළොස් අකුසල් සිත්හි ඇති **ජීවිත, චිත්ත, වෙදනා, විරිය, එකග්ගතා** යන අකුසල ඉන්ද්‍රිය ධර්මයෝ පස්දෙන සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන්ට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**5. වීථිය**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්:

දෙළොස් අකුසල් සිත්හි ඇති **ජීවිත, චිත්ත, වෙදනා, විරිය, එකග්ගතා** යන අකුසල ඉන්ද්‍රිය ධර්මයෝයි.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ **නම්:**

අකුසල චිත්තජ රූපයෝයි.

මෙහි අනුමාදය වශයෙන්:

**අකුසලා ඉන්ද්‍රියා චිත්ත සමුට්ඨානානං රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(දෙළොස් අකුසල් සිත්හි ඇති **ජීවිත, චිත්ත, වෙදනා, විරිය, එකග්ගතා,** යන අකුසල ඉන්ද්‍රිය ධර්ම පස අකුසල චිත්තජ රූපයන්ට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වෙත්.)

**6. වීථිය**

**අකුසලො ධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසලාව්‍යාකෘත ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

Free Distribution www.aathaapi.org

මෙහි අකුසලාව්‍යාකෘත ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන අකුසල ධර්මයෝ නම්:

දොළොස් අකුසල් සිත්හි ඇති **ජීවිත, චිත්ත, වේදනා, විරිය, ඒකාග්‍රතා** යන අකුසල ඉන්ද්‍රිය ධර්මයෝ පස්දෙනය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන අකුසලාව්‍යාකෘත ධර්මයෝ නම්:

සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන් හා චිත්තජ රූපයෝයි.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලා ඉන්ද්‍රියා සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල් සිත්හි ඇති, ජීවිත, චිත්ත, වේදනා, විරිය, ඒකාග්‍රතා යන අකුසල ඉන්ද්‍රිය ධර්මයෝ පස්දෙන සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන්ට හා අකුසල චිත්තජ රූපයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. විපිය.**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

අව්‍යාකෘත ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ද, සම්ප්‍රයුක්තස්කන්ධ හා චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන ධර්මයන්හි ඇති නාමෙන්ද්‍රිය ධර්ම අටදෙකය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන නාමස්කන්ධයන් හා චිත්තජ රූපයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **හේතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, විපාක, සම්පයුත්ත, විප්පයුත්ත, ඣාන, මග්ග, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති තුදුස අතුරෙන් **ඉන්ද්‍රිය ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

**ප්‍රතිසන්ධි කාලයෙහි**

අව්‍යාකෘත ධර්මයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද, සම්ප්‍රයුක්තස්කන්ධයන්ට සහ කර්මජ රූපයන්ටද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන මොවුන් කෙරෙහි ඇති නාමෙන්ද්‍රිය අටදෙනය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

ප්‍රතිසන්ධි සිත් එකුන්විස්සය, චෛතසික පන්තිසය යන නාමස්කන්ධයන් හා කර්මජ රූපයෝද වෙත්.

**පුරෙජාතින්ද්‍රිය ප්‍රත්‍යය ධර්ම** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

චක්ෂුර්විඥනවයයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක චක්ෂුප්‍රසාද රූපයය, ශ්‍රොතවිඥනවයයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක ශ්‍රොතප්‍රසාද රූපයය, ඝ්‍රාණවිඥනවයයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක ඝ්‍රාණප්‍රසාද රූපයය, ජිව්හා විඥනවයයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක ජිව්හා ප්‍රසාද රූපයය, කායවිඥනවයයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක කායප්‍රසාද රූපයය යන ධර්මයෝ යි.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

විපක්ඛව විඥනයෝය, සබ්බචිත්ත සාධාරණ චෛතසික සතය යන ධර්මයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **නිස්සය, පුරෙජාත, ඉන්ද්‍රිය, විප්‍රයුක්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **ඉන්ද්‍රිය ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

**රූප ජීවිතෙන්ද්‍රියයෙහි** ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

කර්මජ රූප කලාපයන්හි ඉතිරි රූපයන්ට ප්‍රත්‍යය වන **රූප ජීවිතෙන්ද්‍රිය** ලැබේ.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

කර්මජ කලාපයන්හි ජීවිතෙන්ද්‍රිය රූපයෙන් අන්‍ය රූපයෝය.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **ඉන්ද්‍රිය, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති තුන අතුරෙන් **ඉන්ද්‍රිය ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාද වශයෙන්:

**1. විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඉන්ද්‍රියා සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අව්‍යාකෘත ධර්මයන්හි ඇති නාමෙන්ද්‍රියයෝ අටදෙන සම්ප්‍රයුක්ත අව්‍යාකෘත නාමස්කන්ධයන්ට සහ අව්‍යාකෘත චිත්තසමුට්ඨාන රූපයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා ඉන්ද්‍රියා සම්පයුත්තකානං ඛන්ධානං කටත්තාච රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයෙහිදී ප්‍රතිසන්ධි සිත් එකුන්විස්සය, චෛතසික පන්තිසය යන මේ ධර්මයන් කෙරෙහි ඇති

නාමෙන්ද්‍රියයෝ අටදෙන, සම්ප්‍රයුක්ත අව්‍යාකෘත නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. චක්ඛින්ද්‍රියං චක්ඛු විඤ්ඤාණස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො**

(මධ්‍යමායුෂ්ක චක්ෂුර්ප්‍රසාද රූපය චක්ඛු විඥානයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

**4. සොතින්ද්‍රියං සොතවිඤ්ඤාණස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක ශ්‍රොතප්‍රසාද රූපය ශ්‍රොත විඥානයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. ඝාණින්ද්‍රියං ඝාණ විඤ්ඤාණස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක ඝ්‍රාණප්‍රසාද රූපය ඝානවිඥානයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. ජිව්හින්ද්‍රියං ජිව්හා විඤ්ඤාණස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක ජිව්හාප්‍රසාද රූපය ජිව්හා විඥානයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. කායින්ද්‍රියං කායවිඤ්ඤාණස්ස ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක කායප්‍රසාද රූපය කාය විඥානයට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

**8. රූප ජීවිතින්ද්‍රියං කටත්තා රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.**

(කර්මජ රූප කලාපයන්හි ජීවිතින්ද්‍රිය රූපය, එයින් අන්‍යවූ කර්මජ රූපයන්ට ඉන්ද්‍රිය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

Free Distribution www.aathaapi.org

## 17. ධ්‍යාන ප්‍රත්‍යය

සියලුම චිත්ත චෛතසික ධර්මයෝ අරමුණක් ගෙනම උපදිති. ඒ ධර්මයන් අතුරෙන් අරමුණු ගැනීමෙහි අධිකොත්සාහයක් ඇත්තාවූද, අරමුණු ගැනීමෙහි ප්‍රමුඛත්වය දරන්නාවූද ධර්මයෝ සත්දෙනෙක් වෙති. එනම්: **විතර්කය, විචාරය, ප්‍රීතිය, එකාග්‍රතාය, සෞමනස්‍යය, දෞර්මනස්‍යය, උපේක්ෂාය** යන ධර්මයෝයි. මේ ධර්මයෝ අරමුණ කරා යන්නාක් මෙන්ද, අරමුණට පිවිසෙන්නාක් මෙන්ද, අරමුණ දෙස බලන්නාක් මෙන්ද, අරමුණ පිරිමදින්නාක් මෙන්ද, විශේෂයෙන් අරමුණ ගැනීම කෙරෙති. එහෙයින් ආරම්මණය එළඹ බලන්නේය යන අර්ථයෙන් ඒ ධර්මයන්ට **ධ්‍යාන ධර්මයෝ** යයි කියනු ලැබේ. තවද රූපාවචර අරූපාවචර ධ්‍යාන සිත්හිද, ලොකොත්තර සිත්හිද ප්‍රතිපක්ෂ ධර්මයන් දවන අර්ථයෙන්ද මේ ධර්මයන්ට **ධ්‍යාන** යන නාමය ව්‍යවහාර වේ.

විපාක්ව විඥානයන් හැර සියලුම කුසලාකුසල අව්‍යාකෘත ධර්මයන්ගේ අරමුණට යොමුවීම, අරමුණ දෙස බැලීම, අරමුණ ගනිමින් ඉපදීම ආදී කෘත්‍යයන් සිදුවන්නේ මේ ධ්‍යාන ධර්මයන්ගේ උපකාරයෙනි. ඒ ධ්‍යාන ධර්මයන්ට අනුව ඒ සිත හා ඒ සිත්වල යෙදෙන අන්‍ය චෛතසිකයෝද අරමුණ ගනිමින් උපදිති. මෙසේ සම්ප්‍රයුක්ත ධර්මයන්ට අරමුණ ගැනීම් වශයෙන් උපකාර වන්නාවූ ඒ ධ්‍යාන ධර්මයන්ට **ධ්‍යාන ප්‍රත්‍යය** යයි කියනු ලැබේ. මේ ධ්‍යාන ධර්මයෝ සම්ප්‍රයුක්ත ධර්මයන්ට පමණක් නොව ඒ සිත හා එක්ව උපදනා චිත්තජ රූපයන්ටද ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ටද ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පෘෂ්ටව්‍ය යන ආරම්මණයෝ චක්ඛු, සොත, ඝාන, ජිව්හා, කාය ප්‍රසාද වස්තූන්හි ස්පර්ශවීම නිසා, ඒ ආයතනයන්හි උපදනා චක්ෂුර් විඥානාදි විපාක්ව විඥානයෝ, අරමුණ ගැනීමෙහිදී උත්සාහයක් නො දරති.

එබැවින් ඒ විපඤ්ච විඥාන චිත්තයන්හි ඇති **එකග්ගතා**, **සුඛ, දුක්ඛ, උපෙක්ඛාවෝ** ධ්‍යාන ප්‍රත්‍යය ධර්මයන් වශයෙන් සලකනු නොලැබෙත්.

**ධ්‍යාන ප්‍රත්‍යය පිළිබඳ ත්‍රි රාශිය.**

**ධ්‍යාන ප්‍රත්‍යය** වන ධර්මයෝ නම්:

විපඤ්ච විඥානයෙන් අන්‍යවූ එකුන් අසූ චිත්තයෙහි ඇත්තාවූ **විතක්ක, විචාර, පීති, වෙදනා, එකග්ගතා** යන ධර්මයෝයි.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්:

විපඤ්ච විඥානයෙන් අන්‍යවූ සිත් එකුන් අසූවය, චෛතසික දෙපනසය, චිත්තජ රූපයෝය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය යන ධර්මයෝ යි.

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්:

විපඤ්ච විඥානයෝ ය, සබ්බචිත්ත සාධාරණ චෛතසික සතය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන ධර්මයෝ යි.

**ධ්‍යාන ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනාවාර හෙවත් විභංගය.**

**1. විභංගය.**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ඣාන පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුශල ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය, යන මොවුන් කෙරෙහි ඇති **විතක්ක, විචාර, පීති, එකග්ගතා, වෙදනා** යන කුසල ධ්‍යානාඞ්ග ධර්මයෝ යි.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්:

කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්ත කුසල නාමස්කන්ධයෝ ය.

මෙහි එක්වර ලැබෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිශ්‍රය, ඉන්ද්‍රිය, ධ්‍යාන, මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති නවය අතුරෙන් **ධ්‍යාන ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**කුසලානි ඣානඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං ඣානපච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන මේ කුසල නාමස්කන්ධයන්හි ඇති **විතක්ක, විචාර, පීති, එකග්ගතා, වේදනා** යන ධ්‍යානාඞ්ගයෝ සම්ප්‍රයුක්ත කුසල නාමස්කන්ධයන්ට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. ඩිටිය.**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ඣාන පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහිදී අව්‍යකෘත ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **කුසල ධර්මයෝ** නම්:

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහිවූ කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන මේ ධර්මයන්හි ඇති **විතක්ක, විචාර, පීති, එකග්ගතා, වේදනා** යන ධ්‍යානාඞ්ග පසය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම් කුසල චිත්තජ රූපයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් ධ්‍යාන ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

**මෙහි** අනුවාද වශයෙන්:

**කුසලානි ඣානඞ්ගානි චිත්ත සමුට්ඨානානං රූපානං ඣානපච්චයෙන පච්චයො.**

(කුසල් සිත් **එක්විස්සය**, චෛතසික අටතිසය යන කුසල නාමස්කන්ධයන්හි ඇති විතක්ක, විචාර, පීති, **එකග්ගතා**, වේදනා යන කුසල ධ්‍යානාඞ්ගයෝ පස්දෙන කුසල චිත්තජ රූපයන්ට ඣාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2 වීථිය.**

**කුසලො ධම්මො කුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස ඣාන පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසලාව්‍යාකෘත ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසලාව්‍යාකෘත ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාරවන **කුශල ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහිවූ කුසල් **සිත්** එක්විස්සය, චෛතසික අටතිසය යන ධර්මයන් කෙරෙහි ඇති **විතක්ක, විචාර, පීති, එකග්ගතා, වේදනා** යන ධ්‍යානාඞ්ග පසය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන **කුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්:

කුසල් **සිත්** එක්විස්සය, චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන් හා කුසල චිත්තජ රූපයෝ යි.

මෙහිදී එක්වර ලැබෙන **සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් ධ්‍යාන ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

**මෙහි අනුවාදය වශයෙන්:**

**කුසලානි ඣානඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං ඣාන පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන මොවුන් කෙරෙහි ඇති විතක්ක, විචාර, පීති, ඒකග්ගතා, වෙදනා යන කුසලධ්‍යානාංගයන් පස්දෙන සම්ප්‍රයුක්ත කුසල නාමස්කන්ධයන්ට හා කුසල චිත්තජ රූපයන්ටද ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.

4. **විභය.**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ඣාන පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්:

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්ස යන අකුසල ධර්මයන්හි ඇති **විතක්ක, විචාර, පීති, ඒකග්ගතා, වෙදනා** යන අකුසල ධ්‍යානාංගයෝ පස්දෙනාය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයෝ යි.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලානි ඣානඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං ඣාන පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන ධර්මයන්හි ඇති විතක්ක, විචාර, පීති, ඒකග්ගතා, වේදනා යන ධ්‍යානාංගයෝ පස්දෙන සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන්ට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**5. වීථිය.**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ඣාන-පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්:

දොළොස් අකුසල් සිත්ය, සත්විසි චෛතසිකය යන ධර්මයන්හි ඇති **විතක්ක, විචාර, පීති, ඒකග්ගතා, වේදනා** යන අකුසල ධ්‍යානාඞ්ගයෝ පස්දෙනය.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම් අකුසල චිත්තජ රූපයෝ යි.

මෙහි අනුවාදය **වශයෙන්:**

**අකුසලාති ඣානඞ්ගානි චිත්තසමුට්ඨානානං රූපානං ඣාන පච්චයෙන පච්චයො.**

(දොළොස් අකුසල් සිත්ය, චෛතසික සත්විස්සය යන අකුසල ධර්මයන්හි ඇති විතක්ක, විචාර, පීති, ඒකග්ගතා, වේදනා යන අකුසල ධ්‍යානාඞ්ගයෝ පස්දෙන අකුසල චිත්තජ රූපයන්ට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**6. වීථිය.**

**අකුසලො ධම්මො අකුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස ඣාන පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසලාව්‍යාකෘත ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසලාව්‍යාකෘත ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්:

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අකුසල ධර්මයන්හි ඇති **විතක්ක, විචාර, පීති, එකග්ගතා, වෙදනා** යන අකුසල ධ්‍යානාඞ්ගයෝ පස්දෙනය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන අකුසලාව්‍යාකෘත ධර්මයෝ නම්:

සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන් හා අකුසල චිත්තජ රූපයෝ යි.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලානි ඣානඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං ඣාන පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අකුසල ධර්මයන්හි ඇති විතක්ක, විචාර, පීති, එකග්ගතා, වෙදනා යන අකුසල ධ්‍යානාඞ්ගයෝ පස්දෙන සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන්ට හා අකුසල චිත්තජ රූපයන්ටද ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**7. විපිය.**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ඣාන පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

මෙහි **ප්‍රවෘත්ති කාලයෙහි**

අව්‍යාකෘත ධර්මයට ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්තසකන්ධයන්ටද, සම්ප්‍රයුක්තසකන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද ප්‍රත්‍යය වන ද්විපඤ්ච විඤ්ඤාණයන් හැර විපාක සිත් සවිස්සය, ක්‍රියාසිත් විස්සය, චෛතසික අටතිසය යන මොවුන් කෙරෙහි ඇති **විතක්ක, විචාර, පීති, එකග්ගතා, වෙදනා** යන ධ්‍යානාඞ්ග පසය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

විපඤ්ච විඤ්ඤාණයන් හැර විපාක සිත් සවිස්සය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්ත නාමසකන්ධයන් හා චිත්තජ රූපයෝද වෙත්.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන **සහජාත, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති දසය අතුරෙන් **ඣාන ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

**ප්‍රතිසන්ධි කාලයෙහි**

අව්‍යාකෘත ධර්මයට ඣාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්ත සකන්ධයන්ටද, සම්ප්‍රයුක්තස්කන්ධයන් හා කර්මජ රූපයන්ටද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන මෙ ධර්මයන් කෙරෙහි ඇති **විතක්ක, විචාර, පීති, එකග්ගතා, වෙදනා** යන ධ්‍යානාඞ්ග පසය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

ප්‍රතිසන්ධි සිත් එකුන්විස්සය, චෛතසික පන්තිසය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා කර්මජ රූපද වෙත්.

මෙහි අනුවාදය වශයෙන්:

1. **විපාකාබ්‍යාකතානි කිරියාබ්‍යාකතානි ඣානඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං ඣාන පච්චයෙන පච්චයො.**

Free Distribution www.aathaapi.org

(පඤ්ච විඥානයන් හැර විපාක සිත් සවිස්සය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන මොවුන් කෙරෙහි ඇති විතක්ක, විචාර, පීති, එකග්ගතා, වේදනා යන අව්‍යාකෘත ධ්‍යානාඞ්ග ධර්ම පස සම්ප්‍රයුක්ත අව්‍යාකෘත නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත් )

**2. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතානි ඣානංගානි සම්පයුත්තකානං ඛන්ධානං කටත්තාච රූපානං ඣාන පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයෙහිදී එකුන්විසි ප්‍රතිසන්ධි විපාක සිත්ය, චෛතසික පන්තිසය යන මේ ධර්මයන් කෙරෙහි ඇති විතක්ක, විචාර, පීති, එකග්ගතා, වේදනා යන ධ්‍යානාඞ්ග පස සම්ප්‍රයුක්ත අව්‍යාකෘත නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ටද ධ්‍යාන ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

## 18. මාර්ග ප්‍රත්‍යය

සිතට, ඒ ඒ දිසාවට ඒ ඒ මගට පැමිණවීමට උපකාර වන ධර්මයන්ට **මාර්ග ධර්මයෝ** යයි කියනු ලැබේ. ඇතැම් ධර්මයෝ කුසල් කිරීමට උපායක් හෙවත් මාර්ගයක් වශයෙන් උපකාර වෙති. ඔවුනට **කුසල මාර්ගාඞ්ගයෝ** යයි කියති. ඇතැම් ධර්මයෝ අකුසල් කිරීමට මාර්ගය වශයෙන් පවතී. එයට අකුසල මාර්ගාඞ්ගයෝ යයි කියති. කුසල මාර්ගාඞ්ගයෝ කුසල් කිරීමටත් ඒ හේතුවෙන් සුගතියටත් නිවණටත් පැමිණීමට උපකාර වෙති. අකුසල මාර්ගාඞ්ගයෝ අකුසල් කිරීමටත් දුගතියට පැමිණවීමටත් උපකාර වෙති. මෙසේ මාර්ගභාවයෙන් උපකාරවන ධර්මයනට **මාර්ග ප්‍රත්‍යය ධර්මයෝ** යයි කියනු ලැබේ.

මාර්ග ප්‍රත්‍යය වන ධර්මයෝ දොළොසකි.

එනම්:

| | |
|---|---|
| 1. සම්මා දිට්ඨි | 2. සම්මා සඞ්කප්ප |
| 3. සම්මා වාචා | 4. සම්මා කම්මන්ත |
| 5. සම්මා ආජීව | 6. සම්මා වායාම |
| 7. සම්මා සති | 8. සම්මා සමාධි |
| 9. මිච්ඡා දිට්ඨි | 10 මිච්ඡා සඞ්කප්ප |
| 11. මිච්ඡා වායාම | 12. මිච්ඡා සමාධි |

මෙයින් **සම්මා දිට්ඨි** ආදිවූ මාර්ගාඞ්ගයෝ අටදෙන කුසල මාර්ගාඞ්ගයෝ යි. මිච්ඡාදිට්ඨි ආදිවූ සතරදෙන අකුසල මාර්ගාඞ්ගයෝ යි.

මෙසේ මාර්ගාඞ්ග වශයෙන් දොළොසක් වන නමුත් චෛතසික ධර්ම වශයෙන් නවයකි.

ඒ මෙසේයි:

1. **සම්මා දිට්ඨිය** — අමෝහ සංඛ්‍යාත **ප්‍රඥා චෛතසිකය**
2. **සම්මා සඞ්කප්ප** — සෝභන සිතෙහි යෙදෙන **විතර්ක චෛතසිකය**
3. **සම්මා වාචා** — **සම්මා වාචා** නම්වූ විරති චෛතසිකය
4. **සම්මා කම්මන්ත** — **සම්මා කම්මන්ත** නම්වූ විරති චෛතසිකය
5. **සම්මා ආජීව** — **සම්මා ආජීව** නම්වූ විරති චෛතසිකය
6. **සම්මා වායාම** — සෝභන සිතෙහි යෙදෙන **විරිය චෛතසිකය**
7. **සම්මා සති** — සෝභන සිතෙහි යෙදෙන **සති චෛතසිකය**

8. **සම්මා සමාධි** — සෝභන සිතෙහි යෙදෙන **ඒකග්ගතා චෛතසිකය**

9. **මිච්ඡා දිට්ඨි** — ලෝභමූල අකුසල් සිතෙහි යෙදෙන **දිට්ඨි චෛතසිකය**

10. **මිච්ඡා සඞ්කප්ප** — අකුසල් සිතෙහි යෙදෙන **විතර්ක චෛතසිකය**

11. **මිච්ඡා වායාම** — අකුසල් සිතෙහි යෙදෙන **විරිය චෛතසිකය**

12. **මිච්ඡා සමාධි** — අකුසල් සිතෙහි යෙදෙන **ඒකග්ගතා චෛතසිකය**

අහේතුක සිත් අටළොසෙහි හේතු ධර්ම නොයෙදෙන හෙයින් දුබලවූ ඒ සිත්හි මෙකී චෛතසිකයන්ගෙන් ඇතැම් චෛතසිකයෝ යෙදෙන නමුත් ඒ ධර්මයන්ට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර විය නොහැකි වේ. එබැවින් මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීමට සමත්වන්නේ සහේතුක සිත් එක් සැත්තෑවෙහි ඇති මාර්ගාඞ්ග ධර්මයන්ට පමණය. මාර්ග ප්‍රත්‍යය වන ධර්මයන්ට සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන්ගේද සහාය ලැබෙන්නාහ.

**මාර්ග ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය**

**මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන ධර්මයෝ නම්:**

සහෙතුක සිත් එක්සැත්තෑවෙහි ඇති ප්‍රඥා, විතර්ක, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, වීර්ය, සති, ඒකග්ගතා, දිට්ඨි යන ධර්මයෝ නවදෙනය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්:

සහේතුක සිත් එක්සැත්තෑවය, චෛතසික දෙපනසය, සහේතුක චිත්තජ රූපයෝය, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය යන ධර්මයෝය.



Free Distribution www.aathaapi.org

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්:

අහේතුක සිත් අටළොසය, ඡන්දය හැර අන්‍ය සමාන චෛතසික දොළොසය, අහේතුක චිත්තජ රූපයෝය, අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, බාහිර රූපයෝය, ආහාරජ රූපයෝය, ඍතුජ රූපයෝය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන ධර්මයෝය.

**මාර්ග ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනාවාර හෙවත් විපි සතකි.**

**1. විපිය.**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස මග්ග පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

කුසල ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

**සම්ප්‍රයුක්තස්කන්ධයන්ට** ප්‍රත්‍යය වන කුසල් සිත් එක්විස්සෙහි ඇති **ප්‍රඥා, විතර්ක, සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, වීර්ය, සති, එකග්ගතා** යන කුසල මාර්ගාංගයෝ අටදෙනය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්:

කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්ත නාමස්කන්ධයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි යෙදෙන හේතු, **අධිපති සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති එකොළොස අතුරෙන් **මග්ග ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**කුසලානි මග්ගඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං මග්ග පච්චයෙන පච්චයො.**

(එක්විසි කුසල් චිත්තයන්හි ඇති ප්‍රඥා ආදී වූ කුසල මාර්ගාඞ්ගයෝ අටදෙන සම්ප්‍රයුක්ත වූ කුසල නාමස්කන්ධයන්ට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2 වීථිය.**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස මග්ග පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත **ධර්මයට** මාර්ග ප්‍රත්‍යය **ශක්තියෙන්** උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන කුසල **මාර්ගාඞ්ගයෝ** අටදෙනය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්- කුසල චිත්තජ රූපයෝ යි.

මෙහි **එක්වර** සුදුසු පරිදි ලැබෙන **හේතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති **එකොළොස** අතුරෙන් **මාර්ග ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්-

**කුසලානි මග්ගඞ්ගානි චිත්ත සමුට්ඨානානං රූපානං මග්ග පච්චයෙන පච්චයො.**

(එක්විසි කුසල චිත්තයන්හි ඇති කුසල මාර්ගාඞ්ගයෝ අටදෙන කුසල චිත්තජ රූපයන්ට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. විපිය.**

**කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස මග්ග පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසලාව්‍යාකෘත ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසලාව්‍යාකෘත ධර්මයන්ට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **කුසල ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන කුසල මාර්ගාඞ්ගයෝ අටදෙනය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන කුසලාව්‍යාකෘත ධර්මයෝ නම්:

**සම්ප්‍රයුක්ත** කුසල නාමස්කන්ධයන් හා කුසල චිත්තජ රූපයෝයි.

**මෙහි** අනුවාදය වශයෙන්-

**කුසලානි මග්ගඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං මග්ග පච්චයෙන පච්චයො.**

(එක්විසි කුසල් සිත්හි ඇති කුසල මාර්ගාඞ්ගයෝ අට දෙන සම්ප්‍රයුක්ත කුසල නාමස්කන්ධයන්ට හා කුසල චිත්තජ රූපයන්ටද මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**4. විපිය**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස මග්ග පච්චයෙන පච්චයො**

(අකුසල ධර්මය අකුසල ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අකුශල ධර්මයෝ** නම්:

දොළොස් අකුසල් සිත්හි ඇති **විතක්ක, විරිය, ඒකග්ගතා, දිට්ඨි,** යන මාර්ගාඞ්ගයෝ සතරදෙනය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

(අකුසල් සිත් දෙළොසය, චෛතසික සත්විස්සය යන සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයෝයි.

මෙහි අනුවාදය වශයෙන්-

**අකුසලානි මග්ගඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං මග්ග පච්චයෙන පච්චයො.**

(දෙළොස් අකුසල් සිත්හි ඇති අකුසල මාර්ගාඞ්ගයෝ සතර දෙන සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන්ට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත් )

**5.** වීථිය.

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස මග්ග පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාරවේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්:

දෙළොස් අකුසල් සිත්හි ඇති අකුසල මාර්ගාඞ්ගයෝ සතරදෙනය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම් අකුසල චිත්තජ රූපයෝ යි.

මෙහි අනුවාදය වශයෙන්-

**අකුසලානි මග්ගඞ්ගානි චිත්ත සමුට්ඨානානං රූපානං මග්ග පච්චයෙන පච්චයො.**

(දෙළොස් අකුසල් සිත්හි ඇති අකුසල මාර්ගාඞ්ගයෝ සතර දෙන අකුසල චිත්තජ රූපයන්ට මාර්ග ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වෙත්.)

**6.. විධිය.**

**අකුසලො ධම්මො අකුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස මග්ග පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසලාව්‍යාකෘත ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසලාව්‍යාකෘත ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වන **අකුසල ධර්මයෝ** නම්:

දෙලොස් අකුසල් සිත්හි ඇති අකුසල මාර්ගාඞ්ගයෝ සතරදෙනය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන අකුසලාව්‍යාකෘත ධර්මයෝ නම්:

සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන් හා අකුසල චිත්තජ රූපයෝ යි.

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලානි මග්ගඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං මග්ග පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දෙලොසෙහි ඇති අකුසල මාර්ගාඞ්ගයෝ සතරදෙන සම්ප්‍රයුක්ත අකුසල නාමස්කන්ධයන්ට හා අකුසල චිත්තජ රූපයන්ටද මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**7. විධිය.**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස මග්ග පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**මෙහි ප්‍රවෘත්ති කාලයෙහි**

අව්‍යාකෘත ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද, සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වන, සහේතුක විපාක එක් විස්සෙහි හා සහේතුක ක්‍රියා සතළොසෙහි ඇති කුසල මාර්ගාඞ්ගයෝ අටදෙනය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

සහේතුක විපාක එක්විස්සය, සහේතුක ක්‍රියා සතළොසය, චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්ත ධර්මයන් හා චිත්තජ රූපයෝය.

මෙහිදී එක්වර යෙදෙන **හේතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති දොළොස අතුරෙන් **මාර්ග ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

**ප්‍රතිසන්ධි කාලයෙහි**

අව්‍යාකෘත ධර්මයට මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද, සම්ප්‍රයුක්තස්කන්ධයන් හා කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන සහේතුක ප්‍රතිසන්ධි සතළොසෙහි ඇති **ප්‍රඥා, විතක්ක, විරිය, සති, එකග්ගතා** යන මාර්ගාඞ්ග ධර්ම පසය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

සහේතුක ප්‍රතිසන්ධි සතළොසය, චෛතසික පන්තිසය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා කර්මජ රූපයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි ලැබෙන හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දෙළොස අතුරෙන් මාර්ග ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**1. විපාකාබ්‍යාකතානි කිරියාබ්‍යාකතානි මග්ගඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං මග්ග පච්චයෙන පච්චයො.**

(සහේතුක විපාක එක්විස්සෙහි හා සහේතුක ක්‍රියා සතළොසෙහි ඇති කුසල මාර්ගාඞ්ගයෝ අටදෙන සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ටද මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතානි මග්ගඞ්ගානි සම්පයුත්තකානං ඛන්ධානං කටත්තාච රූපානං මග්ග පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයෙහි සහේතුක ප්‍රතිසන්ධි සතළොසෙහි ප්‍රඥා, විතක්ක, විරිය, සති, එකග්ගතා යන මාර්ගාඞ්ගයෝ පස්දෙන සම්ප්‍රයුක්ත නාමස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ටද මාර්ග ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

## 19. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය

එකුප්පාද, එකනිරොධ, එකාලම්බන, එකවත්ථුක යන සතර ලක්ෂණයෙන් එකිනෙකට සම්බන්ධවීමෙන්, අන්‍යෝන්‍ය මිශ්‍රභාවයෙන් උපදනා චිත්ත චෛතසික ධර්මයන්ගේ ඒ මිශ්‍රභාවයට පැමිණෙන ස්වභාවයට සම්ප්‍රයුක්තතාවය යයි කියනු ලැබේ. චිත්ත චෛතසික ධර්මයන් උපදනා කල්හි ධර්මයන් බොහෝ ගණනක් මෙසේ එකටම සම්ප්‍රයුක්තවම උපදී. එසේ උපදනා ධර්මයන් අතුරෙන් එක් එක් ධර්මයක් අන්‍ය ධර්මයන්ගේ ඉපදීමට සම්ප්‍රයුක්ත භාවයෙන් උපකාර වේ. මෙසේ සම්ප්‍රයුක්ත භාවයෙන් ඔවුනොවුන්ගේ ඉපදීමට

උපකාරවන ධර්මයන්ට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෝ යයි කියනු ලැබේ. එහෙයින් එක්ව උපදනා සියලු චිත්ත චෛතසික ධර්මයෝම සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්මයෝද වෙති. එසේම ඒ ධර්මයෝම ප්‍රත්‍යයොත්පන්නයෝද වෙති.

**සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය**

**සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය වන ධර්මයෝ** නම්-

ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන එකුන් අනූ චිත්තය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන **ධර්මයෝ** නම්-

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන එකුන් අනූ චිත්තය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්-

චිත්තජ රූප, ප්‍රතිසන්ධි කර්මජ රූප, බාහිර රූප, ආහාරජ රූප, ඍතුජ රූප, අසංඥසත්ත්ව කර්මජ රූප, ප්‍රවෘත්ති කර්මජ රූප යන රූප ධර්මයෝ ය.

**සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනා වාර හෙවත් විපි තුනෙකි.**

**1. විපිය.**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **කුසල ධර්මයෝ** නම්-

ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්-

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන කුසල් සිත් **එක්** විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ ය.

මෙහිදී එක්වර ලැබෙන **සහජාත, නිස්සය, අඤ්ඤ-මඤ්ඤ, සම්පයුත්ත,** අත්ථි, **අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය** ශක්තිය ලැබේ

මෙහි අනුවාදය වශයෙන්-

**1. කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්ත, පච්ච-යෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. ඩීපිය.**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්මයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්ති- යෙන් උපකාර වන **අකුසල ධර්මයෝ** නම්:

ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්ස යන අවයව නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්-

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය, යන අවයව නාම- ස්කන්ධයෝ ය.

මෙහිදී එක්වර ලැබෙන **සහජාත, නිස්සය, අඤ්ඤ- මඤ්ඤ, සම්පයුත්ත, අත්ථි, අවිගත** යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් **සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය** ශක්තිය ලැබේ.

මෙහි අනුවාදය වශයෙන්:

**1. අකුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්ත පච්ච- යෙන පච්චයො.**

(අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

3. වීර්ය.

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**ප්‍රවෘත්ති කාලයෙහි**

අව්‍යාකෘත ධර්මයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්-

ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්-

විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ යි.

මෙහිදී එක්වර සුදුසු පරිදි යෙදෙන **සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්ප්‍රයුක්ත, අත්ථි,** යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් **සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තිය** ලැබේ.

**ප්‍රතිසන්ධි කාලයෙහි:**

අව්‍යාකෘත ධර්මයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්-

ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන්විස්සය, චෛතසික පන්තිසය යන අවයව නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්-

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන අවයව නාමස්කන්ධයෝය.

මෙහි අනුවාද වශයෙන්:

**1. විපාකාබ්‍යාකතො කිරියාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අවයව නාම-ස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**4. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයෙහි ප්‍රතිසන්ධි විපාක සිත් එකුන්විස්සය, චෛතසික පන්තිසය යන නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. නාමො ධම්මො එකස්ස ඛන්ධස්ස සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධි විපාක සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**6. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං සම්පයුත්ත පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධි විපාක සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

## 20. විප්‍රයුක්ත ප්‍රත්‍යය

මිශ්‍ර නොවන සවභාවයට **විප්‍රයුක්ත භාවය** යයි කියති. **එසේ විප්‍රයුක්ත භාවයෙන් ප්‍රත්‍යොත්පන්න ධර්‍මයන්ට උපකාර වන ධර්මයෝ විප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්මයෝ ය.** චිත්ත චෛතසික ධර්මයෝ උපදනා කල්හි ඔවුනොවුන්ට සම්ප්‍රයොග භාවයෙන් උපකාර වෙති නමුත් ඒ චිත්ත චෛතසික ධර්මයන් හා සහජාතව උපදනා චිත්තජ රූපයන් සමග එවැනි සම්ප්‍රයොග භාවයක් නැත. චිත්ත චෛතසික ධර්මයෝ චිත්තජ රූපයන්ට උපකාර වන්නේ විප්‍රයුක්ත භාවයෙනි.

චක්ෂුප්‍රසාදාදී වස්තු රූපයන් නිශ්‍රය කොටගෙන චක්ෂුර් විඥානාදී නාම ධර්මයන් උපදනා කල්හි, ඒ චක්ෂුප්‍රසාද වස්තුහුද චිත්ත චෛතසික ධර්මයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙති. එමෙන්ම පසුව පසුව උපදනා හෙවත් පච්ඡාජාත චිත්ත චෛතසික ධර්මයෝ පූර්වයෙහි උපන් කායික රූපයන්ටද උපකාර වන්නේ විප්‍රයුක්ත භාවයෙනි.

මේ විප්‍රයුක්ත ප්‍රත්‍යය කාමලොක, රූපලොක දෙක්හි පමණක් ලැබේ. අරූප ලෝකයෙහි නොලැබේ. චිත්තයන්

අතුරෙන් පඤ්චවෝකාර භවයෙහිදී අරූප විපාක සිත් සතර නොලැබෙන හෙයින් ඒ සිත් සතර විප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්ම නොවේ. රූප ධර්මයන් අතුරෙන් විප්‍රයුක්ත ප්‍රත්‍යය වන්නේ වස්තුරූප සය පමණෙකි.

**විප්‍රයුක්ත ප්‍රත්‍යය පිළිබඳ ත්‍රි රාශිය**

**විප්‍රයුක්ත ප්‍රත්‍යය** සිව්වැදෑරුම් වේ.

1. **සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**
2. **වස්තු පුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**
3. **වස්තු ආරම්මණ පුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**
4. **පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**

1. **සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය** වන ධර්මයෝ නම්-

පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ, අරූප විපාක සතරය, විපක්ඛ විඤ්ඤාණයෝය, අතීත් චුති චිත්තය යන චිත්තයන් හැර ඉතිරි පන්සැත්තෑ චිත්තයෝය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති **ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය,** පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන **හදය වස්තු රූපය** සහ හදය වස්තු රූපයට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන ධර්මයෝ නම්-

චිත්තජ රූපයෝය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, හදය වස්තුවෙන් ප්‍රත්‍යය ලබන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හදයවස්තු රූපය ය යන ධර්මයෝයි.

**ප්‍රත්‍යනීක ධර්මයෝ** නම්:

චතුවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභ මූල සිත් අටය, මෝහමූල දෙසිතය, මනොවාරාවජ්ජනය, මහා කුසල් සිත් අටය, මහා ක්‍රියා සිත් අටය, අරූපාවචර

සිත් දෙළොසය, සොතාපත්ති මග්ග චිත්තයෙන් අන්‍ය වූ ලෝකොත්තර සිත් සතය, ද්වේෂ, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච, අප්‍රමාණ්‍ය යන ධර්මයන් හැර චෛතසික සසාළිසය, බාහිර රූපයෝය, ආහාරජ රූපයෝය, ඍතුජ රූපයෝය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝය යන ධර්මයෝ ය.

**2. වස්තු පුරේජාත විප්‍රයුක්ත** ප්‍රත්‍යය පිළිබඳ ප්‍රත්‍යය ධර්ම, ප්‍රත්‍යොත්පන්න ධර්ම, ප්‍රත්‍යනීක ධර්ම වස්තු පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යයෙහි සවරූපයන් මෙනි.

**3. වස්තු ආරම්මණ පුරේජාත විප්‍රයුක්ත** ප්‍රත්‍යයාගේ සවරූපයෝ වස්තු ආරම්මණ පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යයෙහි මෙන් දතයුතු.

**4. පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයේ** සවරූපයෝ පච්ඡාජාත ප්‍රත්‍යයෙහි මෙන් දතයුතු.

**විප්පයුත්ත ප්‍රත්‍යය** පිළිබඳ විසර්ජනාවාර හෙවත් **වීසි පසෙකි.**

**1. වීසිය.**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො. සහජාතං, පච්ඡාජාතං.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත විප්‍රයුක්ත, පච්ඡාජාත විප්‍රයුක්ත යන විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්ති දෙකින් උපකාර වේ.)

**සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**

මෙහි අව්‍යාකෘත ධර්මයට සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම් - පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්සය චෛතසික අටතිසය යන අවයව වූ ද, සමූහ වූ ද නාමස්කන්ධයෝ යි.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම් කුසල චිත්තජ රූපයෝ යි.

**පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය.**

මෙහි අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **කුසල ධර්මයෝ** නම් - පඤ්චවොකාර භූමියෙහි උපදිනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්සය චෛතසික අටතිසය යන නාමස්කන්ධයෝ ය.

ප්‍රත්‍යොත්පන්න වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම් ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජනාදී පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණෙන තිජ චතුජ කායයෝ ය.

මෙහි අනුවාද වශයෙන්:

**සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**

**කුසලාඛන්ධා චිත්තසමුට්ඨානානං රූපානං විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(එක් විසි කුසල චිත්තයෝ ය, චෛතසික අටතිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ කුසල චිත්තජ රූපයනට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයෝ**

**කුසලඛන්ධා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(එක්විසි කුසල චිත්තයෝය, අටතිස් චෛතසිකයෝය යන පච්ඡාජාත කුසල නාමස්කන්ධයෝ පුරේජාත වූ හෙවත් පූර්වයෙහි ඉපිද ස්ථිතිප්‍රාප්ත වූ තිජ චතුජ කාය යන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.

**2. විඨිය.**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො - සහජාතං පච්ඡාජාතං.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය, පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය යන ප්‍රත්‍යය ශක්ති දෙකින් උපකාර වේ.)

**සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**

මෙහි අව්‍යාකෘත ධර්මයට සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අකුසල ධර්මයෝ** නම්:

**දෙළොස් අකුසල චිත්තයෝය සත්විසි චෛතසිකයෝය** යන අවයව වූ ද සමූහ වූ නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම් අකුසල චිත්තජ රූපයෝ ය.

**පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**

මෙහි අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අකුසල ධර්මයෝ** නම්-

අකුසල් සිත් දෙළොසය, චෛතසික සත්විස්සය යන පච්ඡාජාත අකුසල නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්-

ව්‍යවස්ථාපන, මනොද්වාරාවර්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද සිටියට පැමිණෙන තිජ චතුජ කායයෝ ය.

මෙහි අනුවාද වශයෙන්-

**සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**

**අකුසලා ඛන්ධා චිත්ත සමුට්ඨානානං රූපානං විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(අකුසල් සිත් දෙළොසය චෛතසික සත්විස්සය **යන** අවයව වූ ද සමූහ වූ ද අකුසල නාමස්කන්ධයෝ සහජාත අකුසල චිත්තජ රූපයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**

**අකුසලා ඛන්ධා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

දොළොස් අකුසල චිත්තයෝ ය සත්විසි චෛතසිකයෝ ය යන පච්ඡාජාත අකුසල නාමස්කන්ධයෝ පූර්වයෙහි ඉපිද සිටිති ප්‍රාප්ත තිජ චතුජ කායයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

3\. විථිය.

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො, සහජාතං, පුරෙජාතං පච්ඡාජාතං.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාත විප්‍රයුක්ත පුරෙජාත විප්‍රයුක්ත පච්ඡාජාත විප්‍රයුක්ත යන විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්ති තුනෙන් උපකාර වේ.)

**සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය**

**ප්‍රවෘත්ති කාලයෙහි** - අව්‍යාකෘත ධර්මයට සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදින අවස්ථාවෙහි වූ අරූප විපාක සතරය, විපඤ්ච විඥානයෝ ය අර්හත් චුති චිත්තය යන සිත් හැර ඉතිරි විපාක සිත් දෙවිස්සය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අවයව වූ ද, සමූහ වූ ද නාමස්කන්ධයෝ ය:

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්-

විපාක ක්‍රියා චිත්තජ රූපයෝ ය.

**ප්‍රතිසන්ධි කාලයෙහි** - අව්‍යාකෘත ධර්මයට සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්-

කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර ප්‍රතිසන්ධි පසළොසය චෛතසික පන්තිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් හා හදය වස්තු රූපය ය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්-

පඤ්චවොකාර ප්‍රතිසන්ධි පසළොසය, චෛතසික පන්තිසය යන අවයව වූ ද, සමූහ වූ ද නාමස්කන්ධයන් හා උපදින කර්මජ රූපයෝ ය.

## පුරෙජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය

මෙහි අව්‍යාකෘත ධර්මයට පුරෙජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්-

චක්ෂුර් විඥනාදී පඤ්ච විඥනයන්ට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක චක්ෂුරාදි වස්තුහුය, පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක හා විපඤ්චවිඥනයන් හැර ප්‍රථම භවාඞ්ගාදී පශ්චිම පශ්චිම වූ විපාක සිත් දෙවිස්සය ක්‍රියා සිත් විස්සය යන මොවුන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධ්‍යාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හදය වස්තුවය මරණාසන්න කාලයෙහි, පඤ්චවොකාර භවාඞ්ග පසළොසය, ආවර්ජනාවය ය, සම්පටිච්ඡනවය ය, සන්තීරණත්‍රය ය, ව්‍යවස්ථාපනය, මරණාසන්න ජවන් පසය, තදාරම්මණය, චුතිය යන මොවුන්ට ප්‍රත්‍යය වන චුති චිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපන් හදය වස්තු රූපය යන ධර්මයෝ යි.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්-

පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක හැර ප්‍රථම භවාඞ්ගාදී පශ්චිම පශ්චිම විපාක සිත් දෙතිසය, ක්‍රියා සිත් විස්සය යන ධර්මයෝ යි.

## පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය

මෙහි අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්-

ප්‍රතිසන්ධි ආදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණෙන එකජ, විජ, තිජ, චතුජ, කායයන්ට ප්‍රත්‍යය වන

Free Distribution www.aathaapi.org

පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක හැර ප්‍රථම භවඞ්ගාදී පශ්චිම පශ්චිම විපාක සිත් දෙතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන ධර්මයෝ යි.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම් ප්‍රතිසන්ධි ආදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි එකජ, විජ, ත්‍රිජ, චතුජ, කායයෝ ය.

මෙහි අනුවාද වශයෙන්-

**සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය.**

**1. විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා චිත්තසමුට්ඨානානං රූපානං විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ, අරූප විපාක සතරය, විපඤ්ච විඥානයෝ ය, අර්හත් චුති චිත්තය යන සිත් හැර ඉතිරි විපාකසිත් දෙවිස්සය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අවයව වූද, සමූහ වූද, නාමස්කන්ධයෝ සහජාත වූ විපාක ක්‍රියා චිත්තජ රූපයන්ට සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්)

**2. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා ඛන්ධා කටත්තා රූපානං විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයෙහි දී පඤ්චවොකාර ප්‍රතිසන්ධි පසළොසය චෛතසික පන්තිසය යන අවයවවූද, සමූහවූද, නාමස්කන්ධයෝ කර්මජ රූපයන්ට විප්‍රයුක්ත ශක්තියෙන් ප්‍රත්‍යය වේ.)

**3. ඛන්ධා වත්ථුස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධි විපාක සිත් පසළොසය චෛතසික පන් තිසය යන නාමස්කන්ධයෝ හදය වස්තු රූපයට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**4. වත්ථු ඛන්ධානං විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(හදය වස්තු රූපය ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**පුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය.**

**5. චක්ඛායතනං චක්ඛු විඤ්ඤාණස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක චක්ෂුර් වස්තුව චක්ෂුර් විඥනයට විප්‍ර-යුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**6. සොතායතනං සොත විඤ්ඤාණස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක ශ්‍රොත වස්තුව ශ්‍රොත විඥනයට විප්‍ර-යුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. ඝාණායතනං ඝාණ විඤ්ඤාණස්ස විප්පයුක්ත පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක ඝාණ වස්තුව ඝ්‍රාණ විඥනයට විප්‍ර-යුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.)

**8. ජිව්හායතනං ජිව්හා විඤ්ඤාණස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක ජිව්හා වස්තුව ජිව්හා විඥනයට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**9. කායායතනං කාය විඤ්ඤාණස්ස විප්පයුක්ත පච්චයෙන පච්චයො.**

(මධ්‍යමායුෂ්ක කාය වස්තුව කාය විඥනයට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**10. වත්ථු විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධි ආදී පූර්‍ව පූර්‍ව චිත්තයන් හා උපදනා හදය වස්තු රූපය, අරූප විපාක සතර සහ විපස්සක විඥනයන් හැර ප්‍රථම භවඞ්ගාදී පශ්චිම පශ්චිම වූ විපාක සිත් දෙවිස්සය යන විපාක ක්‍රියා නාමස්කන්ධයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**පච්ඡාජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය.**

**11. විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක හැර ප්‍රථම භවඞ්ගාදී පශ්චිම වූ විපාක සිත් දෙතිසය ක්‍රියා සිත් විස්සය චෛතසික අටතිසය යන අව්‍යාකෘත නාමස්කන්ධයෝ ප්‍රතිසන්ධි ආදී පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි ඒකජ, ද්විජ, ත්‍රිජ, චතුජ කායයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

4. **විථිය—**

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්‍මය කුසල ධර්මයට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්‍මයෝ** නම්:

කුසල ධර්මස්කන්ධයන්ට ප්‍රත්‍යය වන පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි හදය වස්තු රූපයයි.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්‍මයෝ නම්:-

කුසල් සිත් එක්විස්සය චෛතසික අටතිසය යන නාමස්කන්ධයෝ යි.

මෙහි අනුවාදය වශයෙන්-

**පුරෙජාතං වත්ථු කුසලානං ඛන්ධානං විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි හදය වත්‍ථු රූපය, එක්විසි කුසල චිත්තයෝ ය, අටතිස් චෛතසිකයෝ ය යන කුසල නාමස්කන්ධයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

5. විපිය—

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහිදී අකුසල ධර්මයට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්—

අකුසල නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි හදයවස්තු රූපයයි.

**ප්‍රත්‍යොත්පන්න වශයෙන්** ලැබෙන අකුසල ධර්මයෝ නම්—

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අකුසල නාමස්කන්ධයෝ යි.

මෙහි අනුවාදය වශයෙන්:

**පුරේජාතං වත්‍ථු අකුසලානං ඛන්ධානං විප්පයුත්ත පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි හදය වත්‍ථු රූපය, දොළොස් අකුසල නාමස්කන්ධයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

## 21. අස්ථි ප්‍රත්‍යය

**අස්ථි** යනු ඇත හෙවත් විද්‍යමානය යන අර්ථ යි. උත්පාද, ස්ථිති, භඞ්ග යන **ක්‍ෂණත්‍රයට** පැමිණ තිබෙන ධර්මයෝ ඇති ධර්ම හෙවත් විද්‍යමාන ධර්මයෝ යි. උත්පාදාදී ක්‍ෂණත්‍ර-යට පැමිණ තිබෙන රූපාරූප ධර්මයෝ අන්‍ය රූපාරූප

ධර්මයන් ගේ හටගැනීමට හා බලවත් වීමට ද උපකාර වෙති. එසේ උපකාර වන්නේ තමන්ගේ විද්‍යමානත්වය හෙවත් අත්ථි භාවය නිසාය. මෙසේ තමාගේ අත්ථි භාවයෙන් අන්‍යවූ රූපාරූප ධර්මයන්ගේ හටගැනීමට හා බලවත් වීමට උපකාර වන ධර්මයන්ට **අත්ථි ප්‍රත්‍ය ධර්මයෝ** යයි කියනු ලැබේ.

**අත්ථි ප්‍රත්‍යය** සත්වැදෑරුම් වේ.

1. **සහජාතාත්ථි ප්‍රත්‍යය**
2. **වස්තු පුරේජාතාත්ථි ප්‍රත්‍යය**
3. **වස්තාරම්මණ පුරේජාතාත්ථි ප්‍රත්‍යය**
4. **ආරම්මණ පුරේජාතාත්ථි ප්‍රත්‍යය**
5. **පච්ඡාජාතාත්ථි ප්‍රත්‍යය**
6. **ආහාරාත්ථි ප්‍රත්‍යය**
7. **ඉන්ද්‍රියාත්ථි ප්‍රත්‍යය**

අත්ථි **ප්‍රත්‍යය** වන ධර්මයෝ තම් උත්පාදාදී **ක්‍ෂණත්‍රයට** පැමිණීම් වශයෙන් වර්තමාන භාවයට පැමිණි එකුන් අනූ චිත්තය, චෛතසික දෙපනසය, රූප අට විස්සය යන ධර්මයෝය. **නිර්වාණ ධර්මය** අත්ථි ප්‍රත්‍යය වන ධර්මයක් නොවේ.

**අත්ථි ප්‍රත්‍යය පිළිබඳ ත්‍රිරාශිය**

1. **සහජාතාත්ථි ප්‍රත්‍යයේ** සවරූපයෝ සහජාත ප්‍රත්‍යයෙහි මෙන්ද,

2. **වස්තු පුරේජාතාත්ථි ප්‍රත්‍යයේ** සවරූපයෝ වස්තු පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යයෙහි මෙන්ද,

3. වස්තාරම්මණ **පුරේජාතාත්ථි ප්‍රත්‍යයේ** සවරූපයෝ වස්තාරම්මණ පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යයෙහි මෙන්ද,

4. **ආරම්මණ පුරේජාතාත්ථි ප්‍රත්‍යයේ** සවරූපයෝ ආරම්මණ පුරේජාත ප්‍රත්‍යයෙහි මෙන්ද,

**5. පශ්චාජ්ජාතාස්ති ප්‍රත්‍යයයේ ස්වරූපයෝ** පශ්චාජ්ජාත ප්‍රත්‍යයෙහි මෙන් ද,

**6. ආහාරාස්ති ප්‍රත්‍යයයේ** ස්වරූපයෝ රූපාහාර ප්‍රත්‍යයෙහි මෙන් ද,

**7. ඉන්ද්‍රියාස්ති ප්‍රත්‍යයයේ** ස්වරූපයෝ රූප ජීවිතෙන්ද්‍රිය ප්‍රත්‍යයෙහි මෙන් ද දතයුත්තාහ.

**අස්ති ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනාවාර හෙවත් විධි තෙළෙසකි.**

**1. විධිය.**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්:

එක්විසි කුසල් සිත් හා අටතිස් චෛතසික ධර්මයෝ ය.

මෙහි අනුවාදය වශයෙන්-

**1. කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං අත්ථි පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන කුසල නාම ධර්මයන් පිළිබඳ වූ සතර නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

Free Distribution www.aathaapi.org

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(එම කුසල නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(එම කුසල නාමස්කන්ධයන් අතුරෙන් නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වෙත්.)

**2. විඝිය**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අඤ්ඤ පච්චයෙන පච්චයො, සහජාතං පච්ඡාජාතං.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාතාඤ්ඤ පච්ඡාජාතාඤ්ඤ යන අඤ්ඤ ප්‍රත්‍යය ශක්ති දෙකෙන් උපකාර වේ.)

මෙහි **සහජාතාඤ්ඤ ප්‍රත්‍යය** ශක්තියෙන් අව්‍යාකෘත ධර්මයට උපකාර වන **කුසල ධර්මයෝ** නම්:

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන අවයව වූද, සමූහ වූ ද නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්-

කුසල චිත්තජ රූපයෝ යි.

මෙහි **පච්ඡාජාතාඤ්ඤ ප්‍රත්‍යය** ශක්තියෙන් අව්‍යාකෘත ධර්මයට උපකාරවන **කුසල ධර්මයෝ** නම්-

පසුව පසුව උපදනා එක්විසි කුසල චිත්තයෝ ය, චෛතසික අටතිසය යන අවයව වූද, සමූහවූද නාමසකන්ධයෝ ය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්-

ව්‍යවස්ථාපන මනොවාරාවජ්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි තිජ, චතුජ කායයෝ ය.

මෙහි අනුවාද වශයෙන්:

**සහජාතාස්ථි ප්‍රත්‍යය**

**සහජාතා-කුසලාඛන්ධා චිත්තසමුට්ඨානානං රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන නාමස්කන්ධයෝ කුසල චිත්තජ රූපයන්ට සහජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**පච්ඡාජාතාස්ථි ප්‍රත්‍යය.**

**පච්ඡාජාතා- කුසලා ඛන්ධා පුරේජාතස්ස ඉමස්ස කායස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පච්ඡාජාතවූ හෙවත් පසුව උපදනා කුසල නාමස්කන්ධයෝ පූර්වයෙහි උපන් තිජ චතුජ කායයන්ට පච්ඡාජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

**8 විථිය.**

**කුසලො ධම්මො කුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසලව්‍යාකෘත ධර්මයට අස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

මෙහි කුසලාව්‍යාකෘත ධර්මයට අස්ථි ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වන **කුශල ධර්මයෝ** නම්:

එක්විසි කුසල චිත්තයෝය, චෛතසික අටතිසය යන අවයව වූද, සමූහ වූද කුසල නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යොත්පන්න** වශයෙන් ලැබෙන කුසලාව්‍යාකෘත ධර්මයෝ නම් එම කුසල නාමස්කන්ධයන් හා කුසල චිත්තජ රූපයෝ ය.

මෙහි අනුවාදය වශයෙන්:

**1. කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අත්ථි පච්චයෙන පච්චයො**

(එක්විසි කුසල චිත්තයෝ ය, චෛතසික අටතිසය ඝන කුසල නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි කුසල නාමස්කන්ධ තුනට හා කුසල චිත්තජ රූපයන්ටද අස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(කුසල නාමස්කන්ධ තුනක් ඉතිරි එක් කුසල නාමස්කන්ධයට හා කුසල චිත්තජ රූපයන්ටද අස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(කුසල නාමස්කන්ධ දෙකක් ඉතිරි කුසල නාමස්කන්ධ දෙකට හා කුසල චිත්තජ රූපයන්ට ද අස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**4. විපිය.**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට අස්ථිප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

අකුසල ධර්මයට අස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන අකුසල ධර්මයෝ නම්:

අකුසල් සිත් දෙළොසය චෛතසික සත් විස්සය යන අවයව වූ ද, සමූහ වූ ද අකුසල නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

අකුසල් සිත් දෙළොසය චෛතසික සත්විස්සය යන අකුසල නාමස්කන්ධයෝ ය.

මෙහි අනුවාද වශයෙන්:

**1. අකුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං අත්‍ථි පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි අකුසල නාමස්කන්ධ තුනට අස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස අත්‍ථි පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට අස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං අත්‍ථි පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධ දෙකක් ඉතිරි අකුසල නාමස්කන්ධ දෙකට අස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**5. වීථිය**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අත්‍ථි පච්චයෙන පච්චයො - සහජාතං පච්ඡාජාතං.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාතාස්ථි, පච්ඡාජාතාස්ථි යන අස්ථි ප්‍රත්‍යය ශක්ති දෙකෙන් උපකාර වේ.)

මෙහි අව්‍යාකෘත ධර්මයට සහජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්මයෝ** නම්-

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අවයව වූ ද, සමූහ වූ ද අකුසල නාමස්කන්ධයෝ යි.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

අකුසල චිත්තජ රූපයෝ යි.

අව්‍යාකෘත ධර්‍මයට පච්ඡජාතාසත්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන අකුසල ධර්මයෝ නම්:

පසුව පසුව උපදනා අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අකුසල නාමස්කන්ධයෝයි.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්‍මයෝ **නම්:**

පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද ස්ථිතිප්‍රාප්ත වූ තිජ චතුජ කායයෝ ය.

මෙහි අනුවාද වශයෙන්:

**1. සහජාතා අකුසලා ධම්මා චිත්ත සමුට්ඨානානං රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධයෝ සහජාතවූ අකුසල චිත්තජ රූපයනට සහජාතාසත්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. පච්ඡාජාතා අකුසලා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පසුව පසුව උපදනා අකුසල නාමස්කන්ධයෝ පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද ස්ථිතිප්‍රාප්තවූ තිජ චතුජ කායයන්ට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**6 විජ්ජිය.**

**අකුසලො ධම්මො අකුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසලාව්‍යාකෘත ධර්මයට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසලාව්‍යාකෘත ධර්මයට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **අකුසල ධර්‍මයෝ** නම්:

දොළොස් අකුසල චිත්තයෝය, සත්විසි චෛතසික-යෝය යන අකුසල නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අකුසලාව්‍යාකෘත ධර්මයෝ නම්:

අකුසල නාමස්කන්ධයන් හා අකුසල චිත්තජ රූපයෝයි.

මෙහි අනුවාද වශයෙන්:

**1. අකුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අඤ්ඤ පච්චයෙන පච්චයො.**

අකුසල නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි අකුසල නාමස්කන්ධ තුනට හා අකුසල චිත්තජ රූපයනටද අඤ්ඤ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්ත සමුට්ඨානා නඤ්ච රූපානං අඤ්ඤ පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට හා අකුසල චිත්තජ රූපයන්ටද අඤ්ඤ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං අඤ්ඤ පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධ දෙකක් ඉතිරි අකුසල නාමස්කන්ධ දෙකට හා අකුසල චිත්තජ රූපයන්ටද අඤ්ඤ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

7. **විපිය**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස අඤ්ඤ පච්චයෙන පච්චයො සහජාතං, පුරෙජාතං, පච්ඡාජාතං, ආහාරං, ඉන්ද්‍රියං.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට සහජාතාඤ්ඤ, පුරෙජාතාඤ්ඤ, පච්ඡාජාතාඤ්ඤ, ආහාරාඤ්ඤ, ඉන්ද්‍රියාඤ්ඤ යන අඤ්ඤ ප්‍රත්‍යය ශක්ති පසෙන් උපකාර වේ.)

**සහජාතාසත්ථි ප්‍රත්‍යය**

මෙහි **සහජාතාසත්ථි ප්‍රත්‍යය** ශක්තියෙන් අව්‍යාකෘත ධර්මයට උපකාරවන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

**ප්‍රවෘත්ති කාලයෙහි**

ඔවුනොවුන්ටද, ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ටද ප්‍රත්‍යය වන විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ ය.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් හා චිත්තජ රූපයෝය.

**ප්‍රතිසන්ධි කාලයෙහි**

ඔවුනොවුන්ටද ඔවුනොවුන්ට හා කර්මජ රූපයන්ටද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන අවයව වූද සමූහ වූද නාමස්කන්ධයන් හා හදයවස්තු රූපය ය.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය, චෛතසික පන්තිසය යන අවයව වූ ද, සමූහ වූ ද නාමස්කන්ධයන් හා කර්මජ රූපයෝ යි.

රූප **ධර්මයන්** අතුරෙන් සහජාතාසත්ථි ප්‍රත්‍යය ශක්තියෙන් අව්‍යාකෘත ධර්මයට ප්‍රත්‍යය වන අව්‍යාකෘත ධර්මයෝ නම්:

ඔවුනොවුන්ට හා උපාදාය රූපයන්ටද ප්‍රත්‍යය වන චිත්තජ, ප්‍රතිසන්ධි කර්මජ, බාහිර, ආහාරජ, ඍතුජ, අසඥසත්ව කර්මජ, ප්‍රවෘත්ති කර්මජ මහා භූත රූපයෝ යි.



Free Distribution www.aathaapi.org

ප්‍රත්‍යයොත්පන්න වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

භූතරූප සහිත වූ උපාදාය රූපයෝ ය.

**මෙහි අනුවාද වශයෙන් ප්‍රවෘත්ති කාලයෙහි**

**1. සහජාතො විපාකාබ්‍යාකතො කිරියාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්සය, චෛතසික අටතිසය යන අව්‍යාකෘත නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට හා චිත්තජ රූපයනටද සහජාතාස්ති ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වේ.)

**2. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට හා චිත්තජ රූපයනටද සහජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට හා චිත්තජ රූපයන්ටද සහජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**ප්‍රතිසන්ධි කාලයෙහි**

**4. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං කටත්තාච රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයේදී ප්‍රතිසන්ධි සිත් පසළොස ය, චෛතසික පන්තිසය, යන අව්‍යාකෘත නාමස්කන්ධයන් අතුරෙන් එක් නාමස්කන්ධයක් ඉතිරි නාමස්කන්ධ තුනට හා කර්මජ රූපයනටද සහජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස කටත්තාච රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

ප්‍රතිසන්ධි නාමස්කන්ධ තුනක් ඉතිරි එක් නාමස්කන්ධයට හා කර්මජ රූපයන්ටද සහජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**6. ෙද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං කටත්තාච රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධි නාමස්කන්ධ දෙකක් ඉතිරි නාමස්කන්ධ දෙකට හා කර්මජ රූපයනටද සහජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**7. ඛන්ධාවත්ථුස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ හදය වස්තු රූපයට සහජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**8. වත්ථු ඛන්ධානං අත්ථි පච්චයෙන පච්චයො.**

(ප්‍රතිසන්ධික්ෂණයේදී හදය වස්තු රූපය ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට සහජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ )

**9. එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං අත්ථි පච්චයෙන පච්චයො.**

(එක් මහා භූත රූපයක් ඉතිරි මහාභූත රූප තුනට සහජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**10 තයො මහාභූතා එකස්ස මහා භූතස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(මහා භූතරූප තුනක් ඉතිරි මහා භූතරූපයට සහජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**11 ද්වෙ මහාභූතා ද්වින්නං මහා භූතානං අත්ථි පච්චයෙන පච්චයො.**

(මහා භූතරූප දෙකක් ඉතිරි මහා භූත රූප දෙකට සහජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**12. මහාභූතා චිත්ත සමුට්ඨානානං රූපානං කටත්තාච රූපානං උපාදාය රූපානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(මහභූත රූපයෝ චිත්තජ රූපයන්ටද කර්මජ රූපයන්ටද උපාදාය රූපයන්ටද සහජාතසඬ්ඛ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**13. බාහිරං, ආහාර සමුට්ඨානං, උතු සමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහා භූතං තිණ්ණන්නං මහා භූතානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(බාහිර වූද, ආහාරජ වූද, ඍතුජ වූද, අසඤ්ඤ සත්ත වූද, මහා භූත රූපයන් අතුරෙන් එක් මහා භූත රූපයක් ඉතිරි මහා භූතරූප තුනට සහජාතසඬ්ඛ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**14. තයො මහාභූතා එකස්ස මහා භූතස්ස අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(බාහිරාදී වූ මහා භූතරූප තුනක් ඉතිරි මහා භූත රූපයට සහජාතසඬ්ඛ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**15. ද්වෙ මහාභූතා ද්වින්නං මහා භූතානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(බාහිරාදී වූ මහා භූත රූප දෙකක් ඉතිරි මහා භූත රූප දෙකට සහජාතසඬ්ඛ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**16. මහාභූතා කටත්තාච රූපානං උපාදාය රූපානං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො.**

(මහා භූත රූපයෝ කර්මජ රූපයන්ටද, උපාදාය රූපයන්ටද සහජාතසඬ්ඛ ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**පුරෙජාතසඬ්ඛ ප්‍රත්‍යය.**

**1. අරහා චක්ඛුං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති.**

(රහතන් වහන්සේ කාමාවචර ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිතින් චක්ෂු ප්‍රසාද රූපය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

**2. සොතං ඝාණං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, වත්ථුං අනිච්චතො දුක්ඛතො, අනත්තතො විපස්සති.**

(රහතන් වහන්සේ මහා ක්‍රියා සිතින් ශ්‍රොත ප්‍රසාද රූපය, ඝ්‍රාණප්‍රසාද රූපය, ජිව්හාප්‍රසාද රූපය, කායප්‍රසාද රූපය, වර්ණ රූපය, ශබ්ද රූපය, ගන්ධ රූපය, රස රූපය, ඵොට්ඨබ්බය, හදය වත්ථු රූපය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරයි.)

**3. දිබ්බෙන චක්ඛුනා රූපං පස්සති**

(රහතන්වහන්සේ දිව්‍යචක්ෂුරභිඥා ක්‍රියා සිතින් රූපයන් දකියි.)

**4. දිබ්බාය සොත ධාතුයා සද්දං සුණාති**

(රහතන් වහන්සේ දිව්‍ය ශ්‍රොත ක්‍රියා අභිඥා සිතින් දුර ප්‍රතිච්ඡන්නාදී ශබ්ද ශ්‍රවණය කරයි.)

**5. රූපායතනං චක්ඛු විඤ්ඤාණස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරෙජාතවූ රූපායතනය චක්ඛු විඥානයට පුරේ-ජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ )

**6. සද්දායතනං සොත විඤ්ඤාණස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරෙජාතවූ ශබ්දායතනය ශ්‍රොත විඥානයට පුරෙ ජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**7. ගන්ධායතනං ඝාණ විඤ්ඤාණස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ ගන්ධායතනය, ඝාන විඥානයට පුරෙජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**8 රසායතනං ජිව්හා විඤ්ඤාණස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ රසායතනය ජිව්හා විඥානයට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**9. ඵොට්ඨබ්බායතනං කාය විඤ්ඤාණස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ පඨවි තෙජෝ වායො සංඛ්‍යාත ඵොට්ඨබ්බායතනය කාය විඥානයට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**10. චක්ඛායතනං චක්ඛු විඤ්ඤාණස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරේජාත වූ චක්ෂුර් වස්තුව චක්ෂුර් විඥානයට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

**11. සොතායතනං සොත විඤ්ඤාණස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරේජාත වූ ශ්‍රොත වස්තුව ශ්‍රොත විඥානයට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**12. ඝාණායතනං ඝාණ විඤ්ඤාණස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ ඝ්‍රාණ වස්තුව ඝ්‍රාණ විඥානයට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**13. ජිව්හායතනං ජිව්හා විඤ්ඤාණස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරේජාත වූ ජිව්හායතනය ජිව්හා විඥානයට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**14 කායායතනං කායවිඤ්ඤාණස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරේජාත වූ කායායතනය කාය විඤ්ඤාණයට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**15. වත්ථු විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරේජාතවූ හදයවස්තු රූපය, විපාක ක්‍රියා සංඛ්‍යාත අව්‍යාකෘත නාමස්කන්ධයන්ට පුරේජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**පච්ඡාජාතාස්ථි ප්‍රත්‍යය**

**පච්ඡාජාතා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පුරේජාතස්ස ඉමස්ස කායස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පසුව උපන් විපාක සිත් දෙතිසය, ක්‍රියා සිත් විසිසය, චෛතසික අටතිසය යන අව්‍යාකෘත නාමස්කන්ධයෝ පූර්වයෙහි උපන් තිජ චතුජ කායයන්ට පච්ඡාජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**ආහාරාස්ථි ප්‍රත්‍යය**

**කබලිංකාරො ආහාරො ඉමස්ස කායස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(කබලීකාරාහාර නම්වූ ඕජාරූපය තිජ චතුජ කායයන්ට ආහාරාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**ඉන්ද්‍රියාස්ථි ප්‍රත්‍යය**

**රූප ජීවිතින්ද්‍රියං කටත්තා රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(ජීවිතින්ද්‍රිය රූපය කර්මජ රූපයන්ට ඉන්ද්‍රියාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**8. වීථිය**

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට පුරේජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි කුසල ධර්මයට පුරේජාතාසති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

මහා කුසල් අටට ප්‍රත්‍යය වන වර්තමාන නිෂ්පන්න රූප අටළොසය, දිබ්බචක්ඛු කුසලාභිඥාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්නාදී වර්තමාන රූපාරම්මණය, දිබ්බසොත කුසලාභිඥාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්නාදී වර්තමාන ශබ්දාරම්මණය යන ධර්මයෝ යි.

**ප්‍රත්‍යයෝත්පන්න** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්:

මහා කුසල් සිත් අටය, දිබ්බචක්ඛු, දිබ්බසොත කුසලාභිඥාය, විරති අප්‍රමාණ්‍යයන් හැර චෛතසික තෙතිසය යන ධර්මයෝ ය.

මෙහි අනුවාද වශයෙන්-

**1. සෙක්ඛාවා පුථුජ්ජනාවා චක්ඛුං අනිච්චතො, දුක්ඛතො, අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ පුද්ගලයෝ හෝ පෘථග්ජනයෝ හෝ පුරේජාත වූ චක්ෂුප්‍රසාදය අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් මහා කුසල් සිතින් විදර්ශනා කරන කල්හි ඒ පුරේජාත චක්ෂුප්‍රසාද රූපය, කාමාවචර කුසල් සිතට පුරේජාතාසති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**2. සොතං, ඝාණං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ වත්ථුං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ පුරේජාත වූ ශ්‍රොතප්‍රසාදය, ඝ්‍රාණප්‍රසාදය, ජිව්හා ප්‍රසාදය, කායප්‍රසාදය, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, හදයවස්තු රූපය යන රූප ධර්මයන් කාමාවචර මහා කුසල් සිතින් අනිත්‍ය, දුඃඛ, අනාත්ම වශයෙන් විදර්ශනා කරන කල්හි ඒ ශ්‍රොතප්‍රසාදදී රූප ධර්මයෝ මහා කුසල චිත්තයන්ට පුරොජාතාසති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. දිබ්බෙන චක්ඛුනා රූපං පස්සන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ පුරේජාත වූ දූර ප්‍රතිච්ඡන්නාදී වූ රූපය දිබ්බචක්ඛු කුසලාභිඥවෙන් දකින කල්හි පුරේජාත වූ ඒ රූපය දිබ්බචක්ඛු කුසලාභිඥවට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

**4. දිබ්බාය සොත ධාතුයා සද්දං සුණන්ති.**

(ශෛක්ෂ වූ හෝ පෘථග්ජන වූ හෝ පුද්ගලයෝ පුරේජාත වූ දූර ප්‍රතිච්ඡන්නාදී වූ ශබ්දය දිබ්බසොත කුසලාභිඥවෙන් අසන කල්හි පුරේජාත වූ ඒ ශබ්දය දිබ්බසොත කුසලාභිඥවට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වේ.)

**5. වත්ථු කුසලානං ඛන්ධානං අත්ථි පච්චයෙන පච්චයො.**

පුරේජාත වූ හෘදයවස්තු රූපය කුසල නාමස්කන්ධයන්ට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**9. විපිය.**

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අකුසල ධර්මයට පුරේජාතාස්ති ප්‍රත්‍යය ශක්ති-යෙන් උපකාර වන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

වර්තමාන නිෂ්පන්න රූප අටළොසය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන ධර්මයෝ යි.

මෙහි අනුවාද වශයෙන්-

**1. චක්ඛුං අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති, දිට්ඨි උප්පජ්ජති, විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්ස, උප්පජ්ජති.**

(පුරේජාත වූ චක්‍ෂුප්‍රසාදය ලෝභ සිතින් ආස්වාදනය කරණ කල්හි ද, ප්‍රීතිසහගත ලෝභ සිතින් එයට සතුටුවන කල්හිද රාගය උපදියි. දෘෂ්ටිය උපදියි. විචිකිච්ඡාව උපදියි. උද්ධච්චය උපදියි. දෞමනස්සය උපදියි.)

(මෙහිදී අව්‍යාකෘත ධර්මයක් වූ චක්‍ෂුප්‍රසාදය ආස්වාද-නාදිය කරණ කල්හි ඒ චක්‍ෂුප්‍රසාදය දෙලොස් අකුසල චිත්තයන්ට පුරේජාතාසත්ති ප්‍රත්‍යය ශක්තියෙන් උප-කාර වේ.)

**2. සොතං, ඝාණං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ වත්ථුං අස්සාදෙති, අභිනන්දති, තං ආරබ්භ රාගො උප්පජ්ජති දිට්ඨි උප්පජ්ජති විචිකිච්ඡා උප්පජ්ජති, උද්ධච්චං උප්පජ්ජති, දොමනස්සං උප්පජ්ජති.**

(පුරෙජාත වූ ශ්‍රොත, ඝ්‍රාණ, ජිව්හා, කාය ප්‍රසාදදීන්ද, රූප ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, සහ හදය වස්තුවද ලෝභ මූල සිතින් ආස්වාදනය කරන කල්හිද, ප්‍රීති සහගත සිතින් එයට සතුටුවන කල්හිද, රාගය උපදියි දිට්ඨිය විචිකිච්ඡාව උපදියි, උද්ධච්චය උපදියි, දෞර්මනස උපදියි.)

මෙහිදී ද ශ්‍රොත්‍රාදී වූ අව්‍යාකෘත ධර්මයෝ දෙළොස් අකුසල චිත්තයන්ට පුරේජාතාසත්ති ප්‍රත්‍යය ශක්තියෙන්, උපකාර වෙත්.

**3. වත්ථු අකුසලානං ඛන්ධානං අත්ථි පච්චයෙන පච්චයො.**

(පුරෙජාත වූ හදය වත්‍ථු රූපය අකුසලනාමස්කන්ධයන්ට පුරෙජාතාසත්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

12 විපිය.

**කුසලො ච අබ්‍යාකතො ච ධම්මා කුසලස්ස ධම්මස්ස අත්‍ථි පච්චයෙන පච්චයො සහජාතං පුරෙජාතං.**

(කුසල් වූ ද, අව්‍යාකෘත වූ ද ධර්මයෝ කුසල ධර්මයට සහජාතාස්ති, පුරෙජාතාස්ති යන ප්‍රත්‍යය ශක්ති දෙකෙන් උපකාර වෙත්.)

මෙහි කුසල, ධර්මයට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්:

(කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් හා පූර්ව පූර්ව චිත්තයන් **හා** උපදනා හදය වස්තු රූපය **යන** ධර්මයෝ ය.

**ප්‍රත්‍යාත්පනන** වශයෙන් ලැබෙන කුසල ධර්මයෝ නම්:

කුසල්සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්‍ධයෝ ය.

මෙහි අනුවාද වශයෙන්:

**1. සහජාතා කුසලො එකො ඛන්‍ධො ච වත්‍ථු ච තිණ්ණන්නං ඛන්‍ධානං අත්‍ථි පච්චයෙන පච්චයො.**

(සහජාත කුසලනාමස්කන්‍ධයන් අතුරෙන් එක් නාමස්කන්‍ධයක් හා පූර්ව චිත්තය හා උපදනා හදය වස්තු රූපයද ඉතිරි කුසල නාමස්කන්‍ධ තුනට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. තයො ඛන්‍ධා ච වත්‍ථු ච එකස්ස ඛන්‍ධස්ස අත්‍ථි පච්චයෙන පච්චයො.**

(එකී කුසල නාමස්කන්‍ධ තුනක් හා හදය වස්තු රූපය ඉතිරි කුසල නාමස්කන්‍ධයට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. මෙ ඛන්ධා ච වත්ථු ච ද්වින්නං ඛන්ධානං අත්ථි පච්චයෙන පච්චයො.**

(එකී කුසල් කඳු දෙකක් හා හදය වත්ථු රූපය ඉතිරි කුසල නාමස්කන්ධ දෙකට අත්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**11. වීරිය.**

**කුසලො ච අබ්‍යාකතො ච ධම්මා අබ්‍යාකතස්ස ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො සහජාතං පච්ඡාජාතං ආහාරං ඉන්ද්‍රියං.**

(කුසලාව්‍යාකෘත ධර්මයෝ අව්‍යාකෘත ධර්මයට සහජාතාස්ති පච්ඡාජාතාස්ති, ආහාරාස්ති, ඉන්ද්‍රියාස්ති යන අස්ති ප්‍රත්‍යය ශක්ති සතරෙන් උපකාර වෙත්.)

**සහජාතාස්ති ප්‍රත්‍යය**-

මෙහි අව්‍යාකෘත ධර්මයට **සහජාතාස්ති** ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාරවන **කුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්-

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන කුසල නාමස්කන්ධයන් හා ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන මහාභූත රූපයෝ ය.

**ප්‍රත්‍යුත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්-

කුසල චිත්තජ මහාභූත රූපයෝ යි.

මෙහි අනුවාදය වශයෙන්:

**කුසලා ඛන්ධා ච මහාභූතා ච චිත්තසමුට්ඨානානං රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(කුසල නාමස්කන්ධයන් හා මහාභූත රූපයෝද චිත්තජ රූපයන්ට සහජාතාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**පච්ඡාජාතාසති ආහාරාසති මිශ්‍රක ප්‍රත්‍යය**

අව්‍යාකෘත ධර්‍මයට පච්ඡාජාතාසති ආහාරාසති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන **කුසලාව්‍යාකෘත ධර්‍මයෝ** නම්-

ව්‍යවස්ථාපන මනොවාරාවජ්ජනාදි පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද සිටිති ප්‍රාප්ත තිජ චතුජ කායයන්ට ප්‍රත්‍යය වන පශ්චිම පශ්චිම වූ කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝය, ව්‍යවස්ථාපන මනොවාරාවජ්ජනාදි පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද සිටියට පැමිණි ඕජාවය යන ධර්‍මයෝ ය.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත** ධර්‍මයෝ නම්:

ව්‍යවස්ථාපන මනොවාරාවජ්ජනාදි පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද සිටියට පැමිණි තිජ චතුජ කායයෝ යි.

මෙහි අනුවාදය වශයෙන්-

**පච්ඡාජාතා කුසලා ධම්මා ච කබළීකාරො ආහාරො ච ඉමස්ස කායස්ස අත්ථි පච්චයෙන පච්චයො.**

(පශ්චිම පශ්චිම වූ කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් හා පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද සිටිති ප්‍රාප්ත ඕජාවය යන කුසලාව්‍යාකෘත ධර්‍මයෝ, පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද සිටිති ප්‍රාප්ත තිජ චතුජ කායයන්ට පච්ඡාජාතාසති ආහාරාසති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**පච්ඡාජාතාසති ඉන්ද්‍රියාසති මිශ්‍රක ප්‍රත්‍යය**

අව්‍යාකෘත ධර්‍මයට පච්ඡාජාතාසති ඉන්ද්‍රියාසති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **කුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්:

ව්‍යවස්ථාපන මනොවාරාවජ්ජනාදී පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද සිටියට පැමිණි කර්මජ කායයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම වූ කුසල් සිත් එක් විස්සය චෛතසික අටතිසය

යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝය, ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි රූප ජීවිතින්ද්‍රියය යන ධර්මයෝයි.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි ජීවිතෙන්ද්‍රිය රූපය හැර ඉතිරි කර්මජ රූපයෝයි.

මෙහි අනුවාදය වශයෙන්-

**පච්ඡාජාතා කුසලා ඛන්ධාච රූපජීවිතින්ද්‍රියඤ්ච කටත්තාච රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(පච්ඡාජාතවූ කුසල නාමස්කන්ධයන් හා ජීවිතෙන්ද්‍රිය රූපයද ස්ථිති ප්‍රාප්ත කර්මජ රූපයන්ට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.

**12. වීථිය**

**අකුසලොච අබ්‍යාකතොච ධම්මා අකුසලස්ස ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො. සහජාතං පුරෙජාතං.**

(අකුසල නාමස්කන්ධයන් හා අව්‍යාකෘත ධර්මයෝද අකුසල ධර්මයට සහජාතාස්ති පුරෙජාතාස්ති යන අත්ථි ප්‍රත්‍යය ශක්ති දෙකෙන් උපකාර වෙත්.)

මෙහි අකුසල ධර්මයට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවන අකුසලාව්‍යාකෘත ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොසය, චෛතසික සත් විස්සය යන අවයව වූ ද සමූහ වූ ද අකුසල නාමස්කන්ධයන් හා පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිති ප්‍රාප්ත හෘදය වස්තු රූපයද වෙති.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අකුසල ධර්මයෝ නම්:

අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අවයව නාමස්කන්ධයෝය.

මෙහි අනුවාද වශයෙන්:

**1. සහජාතො අකුසලො එකො ඛන්ධො ච වත්ථු ච තිණ්ණන්නං ඛන්ධානං අත්ථි පච්චයෙන පච්චයො.**

(සහජාත අකුසල නාමස්කන්ධයන් අතුරෙන් එක් අකුසල නාමස්කන්ධයක් හා පූර්ව චිත්තය හා ඉපිද ස්ථිතියට පැමිණි හදය වස්තු රූපයද ඉතිරි සහජාත අකුසල නාමස්කන්ධ තුනට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2 තයො ඛන්ධා ච වත්ථු ච එකස්ස ඛන්ධස්ස අත්ථි පච්චයෙන පච්චයො**

(අකුසල නාමස්කන්ධ තුනක් හා පුරේජාත හදය වත්ථු රූපයද ඉතිරි සහජාත අකුසල නාමස්කන්ධයට අත්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. ද්වෙ ඛන්ධා ච වත්ථු ච ද්වින්නං ඛන්ධානං අත්ථි පච්චයෙන පච්චයො.**

අකුසල නාමස්කන්ධ දෙකක් හා පුරේජාත හදය වත්ථු රූපයද ඉතිරි අකුසල නාමස්කන්ධ දෙකට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙති.

**13. වීථිය**

**අකුසලො ච අබ්‍යාකතො ච ධම්මා අබ්‍යාකතස්ස ධම්මස්ස අත්ථි පච්චයෙන පච්චයො, සහජාතං, පච්ඡාජාතං, ආහාරං, ඉන්ද්‍රියං.**

අකුසල්වූද අව්‍යාකෘතවූද ධර්මයෝ අව්‍යාකෘත ධර්මයට සහජාතාස්ති, පච්ඡාජාතාස්ති, ආහාරාස්ති, ඉන්ද්‍රියාස්ති යන අස්ති ප්‍රත්‍යය සතරෙන් උපකාර වෙති )

**සහජාතාස්ති ප්‍රත්‍යය**

මෙහි අව්‍යාකෘත ධර්මයට සහජාතාස්ති ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාරවන **අකුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්:

චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන අකුසල් සිත් දොළොසය චෛතසික සත්විස්සය යන අකුසල නාමස්කන්ධයන් හා ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන මහාභූත රූපයෝය.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

අකුසල චිත්තජ මහාභූත රූපයෝයි.

මෙහි අනුවාදය වශයෙන්-

**අකුසලා ඛන්ධා ච මහාභූතා ච චිත්තසමුට්ඨානානං රූපානං අඤ්ඤ පච්චයෙන පච්චයො.**

(අකුසල නාමස්කන්ධයන් හා මහාභූත රූපයෝද චිත්තජ රූපයනට සහජාතාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**පච්ඡාජාතාස්ථි ආහාරාස්ථි මිශ්‍රක ප්‍රත්‍යය**

අව්‍යාකෘත ධර්මයට පච්ඡාතාස්ථි ආහාරාස්ථි ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අකුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්:

ව්‍යවස්ථාපන මනොවාරාවජ්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතිප්‍රාප්ත තිජ චතුජ කායයන්ට ප්‍රත්‍යය වන පශ්චිම පශ්චිමවූ අකුසල් සිත් දොළොසය, චෛතසික සත්විස්සය යන අවයවවූද සමූහවූද නාමස්කන්ධයෝය, ව්‍යවස්ථාපන මනොවාරාවජ්ජනාදී පූර්වපූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි ඕජාවය යන ධර්මයෝයි.

**ප්‍රත්‍යෝත්පන්න** වශයෙන් ලැබෙන **අව්‍යාකෘත ධර්මයෝ** නම්:

ව්‍යවස්ථාපන මනොවාරාවජ්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි තිජ චතුජ කායයෝයි.

මෙහි අනුවාදය වශයෙන්-

**පච්ඡාජාතා අකුසලා ඛන්ධා ච කබලිංකාරො ආහාරො ච ඉමස්ස කායස්ස අඤ්ඤ පච්චයෙන පච්චයො.**

(පශ්චිම පශ්චිමවූ අකුසල් සිත් දෙළොසය, චෛතසික සත්විස්සය යන අවයවවූද, සමූහවූද අකුසල නාමස්කන්ධයන් හා පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද සම්ප්‍රාප්ත ඕජාවය යන අකුසලාව්‍යාකෘත ධර්මයෝ පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද සම්ප්‍රාප්ත තිජ චතුජ කායයන්ට පච්ඡාජාතාසත්ති, ආහාරාසත්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**පච්ඡාජාතාසත්ති ඉන්ද්‍රියාසත්ති මිශ්‍රක ප්‍රත්‍යය**

අව්‍යාකෘත ධර්මයට පච්ඡාජාතාසත්ති ඉන්ද්‍රියාසත්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වන **අකුසලාව්‍යාකෘත ධර්මයෝ** නම්:

ව්‍යවස්ථාපන, මනොද්වාරාවජ්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි කර්මජ කායයන්ට ප්‍රත්‍යය වන පඤ්චවොකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම වූ අකුසල් සිත් දෙළොසය, චෛතසික සත්විස්සය යන අවයව වූද, සමූහ වූද නාමස්කන්ධයෝය, ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි ජීවිතෙන්ද්‍රිය රූපය යන ධර්මයෝ යි.

**ප්‍රත්‍යයොත්පන්න** වශයෙන් ලැබෙන අව්‍යාකෘත ධර්මයෝ නම්:

ව්‍යවස්ථාපන මනොද්වාරාවජ්ජනාදී පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද ස්ථිතියට පැමිණි ජීවිතින්ද්‍රිය රූපය හැර ඉතිරි කර්මජ රූපයෝය.

මෙහි අනුවාදය වශයෙන්:

**පච්ඡාජාතා අකුසලා ඛන්ධාච රූප ජීවිතින්ද්‍රියඤ්ච කටත්තා රූපානං අත්ථි පච්චයෙන පච්චයො.**

(පච්ඡාජාත වූ අකුසල නාමස්කන්ධයන් හා ජීවිතින්ද්‍රිය රූපයද ස්ථිති ප්‍රාප්ත කර්මජ රූපයන්ට අස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

## 22. නාස්ති ප්‍රත්‍යය

එක් චිත්තසන්තානයක එක්වර එක් සිතක් මිස සිත් දෙකක් හෝ වැඩි ගණනක් නූපදී. එක් සිතක් ඉපිද නිරුද්ධව ගිය පසු අනික් සිත උපදී. මෙසේ නිරුද්ධ වන සිත එයට අනතුරුව උපදනා සිතට ඉපදීමට අවකාශ දෙමින් නිරුද්ධ වෙයි. පූර්ව චිත්තය නිරුද්ධ නොවන තාක් කල් අනික් සිතට ඉපදීමට අවකාශ නැත. එබැවින් චිත්ත සන්තානයෙහි තමන්ගේ ස්ථානය ගෙන අන්‍ය චිත්ත චෛතසික ධර්මයනට ඉපදිය හැකිවන පරිදි නිරුද්ධවන නාම ධර්මයෝ, තමතමන්ට අනතුරුව තමන්ගේ තැන ගෙන උපදනා නාම ධර්මයන්ට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.

නාස්ති ප්‍රත්‍යයෙහි ස්වරූපයෝ අනන්තර ප්‍රත්‍යයෙහි මෙනි. මේ ප්‍රත්‍යය දෙක්හිම ප්‍රත්‍ය ධර්මත් ප්‍රත්‍යෝත්පන්න ධර්මත් සමානය. අනන්තර ප්‍රත්‍යය ශක්තිය නම් පූර්වපූර්ව චිත්තයාගේ ඇති, චිත්ත පරම්පරාව නොසිඳෙන පරිදි නිරවුල් ලෙස ක්‍රමානුකූලව පශ්චිම පශ්චිම චිත්තයන්ගේ උත්පත්තියට උපකාර වන ශක්තියයි. චිත්ත වීථියක පිළිවෙලින් ඒ ඒ කෘත්‍යයන් සිදුකරමින් උපදනා චිත්තයන් අතුරෙන් පසු සිත ඉපදීමට උපකාර වන්නේත්, පසු සිත උපදවන්නේත් පූර්ව චිත්තයයි. එය පූර්ව චිත්තයාගේ ඇති අනන්තර ප්‍රත්‍යය ශක්තිය වේ. නාස්ති ප්‍රත්‍යය ශක්තිය වශයෙන් දක්වන ලද්දේ පූර්ව චිත්තයාගේ නැති බව හෙවත් නිරුද්ධ වීමය. අතරක් නැතිව අනතුරු සිත ඉපදවීමේ ශක්තිය ඇතත්, පූර්ව චිත්තයාගේ නිරුද්ධ වීමද පසු චිත්තයාගේ ඉපදීමට උපකාරයෙකි. නාස්ති ප්‍රත්‍යය යයි කියනු ලබන්නේ පූර්ව චිත්තයාගේ නිරුද්ධ වීමෙන් උපකාරවීම සලකාගෙන බව කිවයුතු.

**නාසති ප්‍රත්‍යය පිළිබඳ විසර්ජනා වාර හෙවත් විපි සතකි.**

මේ වීපි හා අනුවාද අනන්තර ප්‍රත්‍යයෙහි කී පරිද්දෙන් දතයුතු.

**1. වීපිය**

**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස නත්‍ථි පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය කුසල ධර්මයට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාද වශයෙන්:

**1. පුරිමා පුරිමා කුසලා ඛන්‍ධා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්‍ධානං නත්‍ථි පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ කුසල නාමස්කන්‍ධයෝ පශ්චිම පශ්චිම වූ කුසල නාමස්කන්‍ධයන්ට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. අනුලොමං ගොත්‍රභුස්ස, අනුලොමං වොදානස්ස, ගොත්‍රභු මග්ගස්ස, වොදානං මග්ගස්ස නත්‍ථි පච්චයෙන පච්චයො.**

(අනුලෝම චිත්තය ගොත්‍රභූ චිත්තයටද, අනුලෝම චිත්තය වොදාන චිත්තයටද, ගොත්‍රභූ සිත සෝවාන් මාර්ග සිතටද, වොදාන සිත ඉතිරි මාර්ග චිත්තයන්ටද නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. වීපිය.**

**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස නත්‍ථි පච්චයෙන පච්චයො.**

(කුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**කුසලං වුට්ඨානස්ස, මග්ගො ඵලස්ස, අනුලොමං සෙක්ඛාය ඵල සමාපත්තියා, නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලං ඵලසමාපත්තියා නත්ථි පච්චයෙන පච්චයො.**

(අන්තිම කුසල ජවනය තදාරම්මණයට හෝ භවාඞ්ගයටද මාර්ග කුසල චිත්තය ඵල චිත්තයටද, ශෛක්ෂ පුද්ගලයා ඵල සමාපත්තියට සමවදනා කල්හි අනුලොම චිත්තය ඵල සිතටද අෂ්ටසමාපත්ති ලාභී අනාගාමි ආර්යපුද්ගල තෙමේ නිරෝධ සමාපත්තියට සමවැද එයින් නැගීමෙහිදී නෙවසඤ්ඤානාසඤ්ඤා කුසල චිත්තය අනාගාමි ඵල චිත්තයටද නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**3. වීථිය.**

**අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස නත්ථි පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අකුසල ධර්මයට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාද වශයෙන්

**පුරිමා පුරිමා අකුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ඛන්ධානං නත්ථි පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ අකුසල නාමස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ අකුසල නාමස්කන්ධයන්ට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**4. වීථිය.**

**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස නත්ථි පච්චයෙන පච්චයො.**

(අකුසල ධර්මය අව්‍යාකෘත ධර්මයට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාදය වශයෙන්:

**අකුසලා වුට්ඨානස්ස නත්ථි පච්චයෙන පච්චයො.**

(අන්තිම අකුසල චිත්තය එයට අනතුරුව උපදනා තදාරම්මණ චිත්තයට හෝ භවාඞ්ග චිත්තයට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**5. විපිය.**

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස නත්ථි පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අව්‍යාකෘත ධර්මයට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

**1. පුරිමා පුරිමා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං විපාකාබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං නත්ථි පච්චයෙන පච්චයො.**

(පූර්ව පූර්ව වූ විපාකාව්‍යාකෘත, කිරියාව්‍යාකෘත නාමස්කන්ධයෝ පශ්චිම පශ්චිම වූ විපාකාව්‍යාකෘත, කිරියාව්‍යාකෘත නාමස්කන්ධයන්ට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙත්.)

**2. භවඞ්ගං ආවජ්ජනාය, කිරියං වුට්ඨානස්ස, අරහතො අනුලොමං ඵලසමාපත්තියා, නිරොධා වුට්ඨහන්තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතන කිරියං ඵලසමාපත්තියා නත්ථි පච්චයෙන පච්චයො.**

(භවාඞ්ගුපච්ඡේද චිත්තය ආවර්ජනා චිත්තයටද, අන්තිම ක්‍රියා ජවනය, තදාරම්මණයට හෝ භවාඞ්ගයටද, රහතන් වහන්සේගේ අනුලොම චිත්තය අර්හත්ඵල චිත්තයටද, නිරොධ සමවතින් නැගීමේදී නෙවසඤ්ඤානාසඤ්ඤ ක්‍රියා චිත්තය අර්හත්ඵල චිත්තයටද නාස්ති ප්‍රත්‍යය ශක්ති යෙන් උපකාර වේ.)

6. වීථිය.

**අබ්‍යාකතො ධම්මො කුසලස්ස ධම්මස්ස නත්ථි පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය කුසල ධර්මයට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාදය වශයෙන්-

**ආවජ්ජනා කුසලානං ඛන්ධානං නත්ථි පච්චයෙන පච්චයො.**

(ආවර්ජනා චිත්තය ප්‍රථම කුසල ජවනයට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ)

7. වීථිය.

**අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස නත්ථි පච්චයෙන පච්චයො.**

(අව්‍යාකෘත ධර්මය අකුසල ධර්මයට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි අනුවාදය වශයෙන්-

**ආවජ්ජනා අකුසලානං ඛන්ධානං නත්ථි පච්චයෙන පච්චයො.**

(ආවර්ජනා චිත්තය ප්‍රථම අකුසල ජවනයට නාස්ති ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.)

මෙහි විස්තරය අනන්තර ප්‍රත්‍යයෙහි දක්වන ලද පරිදි දතයුතු.

## 23. විගත ප්‍රත්‍යය

වෙන්ව ගිය විනාශයට ගිය හෙවත් උත්පාද, ස්ථිති, භඞ්ග යන ක්ෂණත්‍රය ඉක්මවූ ධර්මය **විගත ධර්මයයි.** විගත භාවයෙන් අන්‍ය ධර්මයනට උපකාර වන ධර්මය **විගත ප්‍රත්‍යය ධර්ම** නමි. විගත ප්‍රත්‍යය නාස්ති ප්‍රත්‍යයට සමානය. මේ දෙකෙහි ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ගේ

වෙනසක් නැත. විගත ප්‍රත්‍යය ශක්ති යයි අමුතු ප්‍රත්‍යය ශක්තියක් දක්වන ලද්දේ චිත්ත පරම්පරාවෙන් ඒ සිත වෙන්ව යන බව දැක්වීමට යයි කියනු ලැබේ. මේ චිත්තය පහව යාම, අනතුරු චිත්තයාගේ පහළවීමට උපකාරයෙකි.

**විගත ප්‍රත්‍යය** පිළිබඳ විපි සතත් එහි අනුවාදයනුත් නාස්ති ප්‍රත්‍යයෙහි දක්වන ලද පරිදි නත්ථි වෙනුවට **විගත** යයි **යොදා** ගතයුතු.

## 24. අවිගත ප්‍රත්‍යය

විනාශයට නොගිය හෙවත් උත්පාදදි ක්‍ෂණත්‍රය ඉක්ම නොගිය බව **අවිගත** භාවයයි. එසේ අවිගත භාව යෙන් අන්‍ය ධර්මයන්ට උපකාර වන ධර්මය **අවිගත ප්‍රත්‍යය ධර්මය** නමි. මේ අවිගත ප්‍රත්‍යය, අස්ති ප්‍රත්‍යයට සමානය. මේ දෙකෙහි ප්‍රත්‍යය ප්‍රත්‍යෝත්පන්න ධර්මයෝ සමානය. අස්ති ප්‍රත්‍යයෙහිදී ධර්මයාගේ ඇති බවම ප්‍රකට කොට වදාරා තිබේ. අවිගත ප්‍රත්‍යයෙහිදී ඒ ධර්මය නැති නොවූ බව හෙවත් නිරොධයට නොගිය බව දක්වයි. එබැවින් අස්ති ප්‍රත්‍යයෙහි ඇති බව මුල්කොට ගෙන ප්‍රත්‍යය ශක්තිය දැක්වීමද අවිගත ප්‍රත්‍යයෙහිදී නැති නොවූ බව මුල් කොට ප්‍රත්‍යය ශක්තිය දක්වා තිබෙන බවද පෙනේ.

**අවිගත ප්‍රත්‍යය** පිළිබඳ විපි තෙළෙසත් එහි අනුවාදත් අස්ථි ප්‍රත්‍යයෙහි දක්වන ලද පරිදි අත්ථි වෙනුවට **අවිගත** යයි **යොදා** ගතයුතු.

**සූවිසි ප්‍රත්‍යය** පිළිබඳ වූ **ඥානය** පිරිසිදු කරගැනීම පිණිස ඒ ධර්මයෝ **නාම රූප ධර්ම** වශයෙන්ද, **කාල** වශයෙන්ද **ජනකාජනක** වශයෙන්ද භවභෙදයාගේ වශයෙන්ද දැන ගැනීම ප්‍රයෝජනවත් වේ. එය සංක්‍ෂෙපයෙන් මෙහි දක්වනු ලැබේ.

| ප්‍රත්‍යය නාම | නාම-රූප වශයෙන් | | කාල වශයෙන් | | | | ජනකාජනක වශයෙන් | | භව භේදය වශයෙන් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නාම | රූප | අතීත | වර්තමාන | අනාගත | කාලවිමුක්ත | ජනක | උපස්ථම්භක | පඤ්චවොකාර | චතුවොකාර | එකවොකාර | බාහිර අනින්ද්‍රියබද්ධ |
| 1. හෙතු ප්‍රත්‍යය | + | — | — | + | — | — | + | + | + | + | — | — |
| 2. ආරම්මණ ,, | + | + | + | + | + | + | + | + | + | + | — | — |
| 3. අධිපති ,, | + | + | + | + | + | + | + | + | + | + | — | — |
| 4. අනන්තර ,, | + | — | + | — | — | — | + | — | + | + | — | — |
| 5. සමනන්තර ,, | + | — | + | — | — | — | + | — | + | + | — | — |
| 6. සහජාත ,, | + | + | — | + | — | — | + | + | + | + | + | + |
| 7. අඤ්ඤමඤ්ඤ ,, | + | + | — | + | — | — | + | + | + | + | + | + |
| 8. නිස්සය ,, | + | + | — | + | — | — | + | + | + | + | + | + |
| 9. උපනිස්සය ,, | + | + | + | + | + | + | + | + | + | + | — | — |
| 10. පුරේජාත ,, | — | + | — | + | — | — | + | + | + | — | — | — |
| 11. පච්ඡාජාත ,, | + | — | — | + | — | — | — | + | + | — | — | — |
| 12. ආසේවන ,, | + | — | + | — | — | — | + | — | + | + | — | — |
| 13. කර්ම ,, | + | — | + | + | — | — | + | + | + | + | + | — |
| 14. විපාක ,, | + | — | — | + | — | — | + | + | + | + | — | — |
| 15. ආහාර ,, | + | + | — | + | — | — | + | + | + | + | — | — |
| 16. ඉන්ද්‍රිය ,, | + | + | — | + | — | — | + | + | + | + | + | — |
| 17. ධ්‍යාන ,, | + | — | — | + | — | — | + | + | + | + | — | — |
| 18. මග්ග ,, | + | — | — | + | — | — | + | + | + | + | — | — |
| 19. සම්ප්‍රයුක්ත ,, | + | — | — | + | — | — | + | + | + | + | — | — |
| 20. විප්පයුත්ත ,, | + | + | — | + | — | — | + | + | + | — | — | — |
| 21. අත්ථි ,, | + | + | — | + | — | — | + | + | + | + | + | + |
| 22. නත්ථි ,, | + | — | + | — | — | — | + | — | + | + | — | — |
| 23. විගත ,, | + | — | + | — | — | — | + | — | + | + | — | — |
| 24. අවිගත ,, | + | + | — | + | — | — | + | + | + | + | + | + |

# සූවිසි ප්‍රත්‍යය විනිශ්චය

පටිච්චසමුප්පාද දෙශනායෙහි දක්වන ලද අවිද්‍යා දී ධර්ම සංස්කාරාදී ධර්මයන්ට ප්‍රත්‍යය වන ආකාර සංක්‍ෂෙපයෙන් මෙහි දක්වනු ලැබේ.

**අවිද්‍යාව - 1. පුණ්‍යාභිසංස්කාරයන්ට දෙයාකාරයකින් ප්‍රත්‍යයවේ.**

(1) ආරම්මණ ප්‍රත්‍යය
(2) උපනිශ්‍රය ප්‍රත්‍යය

**2. අපුණ්‍යාභි සංස්කාරයන්ට නොයෙක් අයුරින් ප්‍රත්‍යයවේ.**

(1) ආරම්මණ ප්‍රත්‍යය
(2) ආරම්මණාධිපති ප්‍රත්‍යය
(3) ආරම්මණූපනිශ්‍රය ප්‍රත්‍යය
(4) උපනිශ්‍රය ප්‍රත්‍යය
(5) අනන්තර ප්‍රත්‍යය
(6) සමනන්තර ප්‍රත්‍යය
(7) අනන්තරූපනිශ්‍රය ප්‍රත්‍යය
(8) ආසෙවන ප්‍රත්‍යය
(9) නත්ථි ප්‍රත්‍යය
(10) විගත ප්‍රත්‍යය
(11) හෙතු ප්‍රත්‍යය
(12) සහජාත ප්‍රත්‍යය
(13) අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය
(14) නිස්සය ප්‍රත්‍යය
(15) සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය
(16) අත්ථි ප්‍රත්‍යය
(17) අවිගත ප්‍රත්‍යය

3. අනෙඤ්ජාභිසංස්කාරයට-

උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

සංස්කාරයෝ - විඥානයන්ට දෙයාකාරයෙන් ප්‍රත්‍යයවේ.

(1) උපනිශ්‍රය ප්‍රත්‍යය
(2. කර්ම ප්‍රත්‍යය

විඥානය - 1. නාමයන්ට නවාකාරයෙන් ප්‍රත්‍යය වේ.

(1) සහජාත ප්‍රත්‍යය
(2) අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය
(3) නිශ්‍රය ප්‍රත්‍යය
(4) සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය
(5) විපාක ප්‍රත්‍යය
(6) ආහාර ප්‍රත්‍යය
(7) ඉන්ද්‍රිය ප්‍රත්‍යය
(8) අත්ථි ප්‍රත්‍යය
(9) අවිගත ප්‍රත්‍යය

2. වස්තු රූපයන්ට (ප්‍රතිසන්ධික්ෂණයෙහි)

(1) සහජාත ප්‍රත්‍යය
(2) අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය
(3) නිශ්‍රය ප්‍රත්‍යය
(4) සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය
(5) විපාක ප්‍රත්‍යය
(6) ආහාර ප්‍රත්‍යය
(7) ඉන්ද්‍රිය ප්‍රත්‍යය
(8) අත්ථි ප්‍රත්‍යය
(9) අවිගත ප්‍රත්‍යය

යන නවාකාරයෙන් ප්‍රත්‍යයවේ.

3. සෙසු රූපයනට - ඉහතකී නවාකාරයෙන් අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ශක්තිය හැර ඉතිරි අටාකාරයෙන් ප්‍රත්‍යය වේ.

4. අභිසංඛාර විඥානය - අසංඥසත්ව රූපයනට හෝ පංචවොකාර භවයෙහි කර්මජ රූපයනට හෝ උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

5 අරූප භවයෙහි විපාක නාමය-මනායතනයට

| | |
|---|---|
| (1) සහජාත ප්‍රත්‍යය | (5) විපාක ප්‍රත්‍යය |
| (2) අඤ්ඤමඤ්ඤ ,, | (6) අත්ථි ,, |
| (3) නිශ්‍රය ,, | (7) අවිගත ,, |
| (4) සම්ප්‍රයුක්ත ,, | යන සත් ආකාරයෙන් ප්‍රත්‍යයවේ. |

6. පංචවොකාර භවයෙහි විපාක නාමය
මනායතනයට- ප්‍රතිසන්ධික්ෂණයේදී

| | |
|---|---|
| (1) සහජාත ප්‍රත්‍යය | (5) විපාක ප්‍රත්‍යය |
| (2) අඤ්ඤමඤ්ඤ ,, | (6) අත්ථි ,, |
| (3) නිශ්‍රය ,, | (7) අවිගත ,, |
| (4) සම්ප්‍රයුක්ත ,, | යන සත් ආකාරයෙන් ප්‍රත්‍යයවේ. |

චක්ඛායතනාදි පසට – සයාකාරයකින් ප්‍රත්‍යයවේ.

| | |
|---|---|
| (1) සහජාත ප්‍රත්‍යය | (4) විප්‍රයුක්ත ප්‍රත්‍යය |
| (2) නිශ්‍රය ,, | (5) අත්ථි ,, |
| (3) විපාක ,, | (6) අවිගත ,, |

නාමරූප දෙක මනායතනයට අටාකාරයකින් ප්‍රත්‍යයවේ.

| | |
|---|---|
| (1) සහජාත ප්‍රත්‍යය | (5) සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය |
| (2) අඤ්ඤමඤ්ඤ ,, | (6) විප්‍රයුක්ත ,, |
| (3) නිශ්‍රය ,, | (7) අත්ථි ,, |
| (4) විපාක ,, | (8) අවිගත ,, |

නාමය – මනායතනයට යටත් පිරිසෙයින් සත් ආකාරයෙකින් ප්‍රත්‍යය වේ.

| | |
|---|---|
| (1) සහජාත ප්‍රත්‍යය | (5) විපාක ප්‍රත්‍යය |
| (2) අඤ්ඤමඤ්ඤ ,, | (6) අත්ථි ,, |
| (3) නිශ්‍රය ,, | (7) අවිගත ,, |
| (4) සම්ප්‍රයුක්ත ,, | |

Free Distribution www.aathaapi.org

තවද මේ නාම අතුරින් කිසි නාමයක් හේතු ප්‍රත්‍යය යෙන්ද කිසිවක් ආහාර ප්‍රත්‍යයයෙන්ද ප්‍රත්‍යය වේ.

වස්තුරූපය – මනායතනයට ප්‍රතිසන්ධික්ෂණයෙහිදී සයාකාරයකින් ප්‍රත්‍යය වේ.

(1) සහජාත ප්‍රත්‍යය (4) විප්‍රයුක්ත ප්‍රත්‍යය
(2) අඤ්ඤමඤ්ඤ ,, (5) අත්ථි ,,
(3) නිශ්‍රය ,, (6) අවිගත ,,

සතර මහා භූත රූපයෝ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙකෙහිම චක්ඛායතනාදියට සතරාකාරයකින් ප්‍රත්‍යය වේ.

(1) සහජාත ප්‍රත්‍යය (3) අත්ථි ප්‍රත්‍යය
(2) නිශ්‍රය ,, (4) අවිගත ,,

රූප ජීවිතෙන්ද්‍රිය චක්ඛාදි පඤ්ච ප්‍රසාදයනට තුන් පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

(1) අත්ථි ප්‍රත්‍යය (2) අවිගත ප්‍රත්‍යය (3) ඉන්ද්‍රිය ප්‍රත්‍යය

ආහාර රූපය තුන් පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

(1) අත්ථි ප්‍රත්‍යය (2) අවිගත ප්‍රත්‍යය (3) ආහාර ප්‍රත්‍යය

චක්ඛායතනාදි පඤ්ච – චක්ඛුසම්ඵස්සාදි පස් වැදෑරුම් ස්පර්ශයට සයාකාරයකින් ප්‍රත්‍යය වේ.

(1) නිස්සය ප්‍රත්‍යය (4) විප්පයුක්ත ප්‍රත්‍යය
(2) පුරේජාත ,, (5) අත්ථි ,,
(3) ඉන්ද්‍රිය ,, (6) අවිගත ,,

විපාකමනායතනය – මනොසම්ඵස්සයට නවාකාර යෙකින් ප්‍රත්‍යය වේ.

| | | | |
|---|---|---|---|
| (1) සහජාත | ප්‍රත්‍යය | (6) ඉන්ද්‍රිය | ප්‍රත්‍යය |
| (2) අඤ්ඤමඤ්ඤ | ,, | (7) සම්ප්‍රයුක්ත | ,, |
| (3) නිශ්‍රය | ,, | (8) අත්ථි | ,, |
| (4) විපාක | ,, | (9) අවිගත | ,, |
| (5) ආහාර | ,, | | |

චක්ඛුසම්ඵස්සාදි පස - පඤ්ච වෙදනාවන්ට අටාකාරයකින් ප්‍රත්‍යය වේ.

| | | | |
|---|---|---|---|
| (1) සහජාත | ප්‍රත්‍යය | (5) ආහාර | ප්‍රත්‍යය |
| (2) අඤ්ඤමඤ්ඤ | ,, | (6) සම්ප්‍රයුක්ත | ,, |
| (3) නිශ්‍රය | ,, | (7) අත්ථි | ,, |
| (4) විපාක | ,, | (8) අවිගත | ,, |

මනොසම්ඵස්ස — මනොද්වාරයෙහි කාමාවචර විපාක වේදනාවට පෙර කී සහජාතාදී අටාකාරයෙන් ප්‍රත්‍යයවේ.

වෙදනාව - තෘෂ්ණාවට එකම උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවේ.

තණ්හාව කාමූපාදානයට - උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වේ.

2. දිට්ඨුපාදානය, සීලබ්බතුපාදානය, අත්තවාදූපාදානයන ත්‍රිවිධ උපාදානයන්ට සත් පරිද්දෙකින් ප්‍රත්‍යය වේ.

| | | | |
|---|---|---|---|
| (1) සහජාත | ප්‍රත්‍යය | (5) අත්ථි | ප්‍රත්‍යය |
| (2) අඤ්ඤමඤ්ඤ | ,, | (6) අවිගත | ,, |
| (3) නිශ්‍රය | ,, | (7) හේතු | ,, |
| (4) සම්ප්‍රයුක්ත | ,, | | |

චතුර්විධ උපාදානයෝ - රූපාරූප භවයන්ටද, කාම භවයෙහි කුසලාකුසල කර්මයටද, උපපත්ති භවයටද උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වෙත්.

Free Distribution www.aathaapi.org

කාම භවයෙහි තමා හා සම්ප්‍රයුක්ත අකුසල කර්ම භවයට.

(1) සහජාත ප්‍රත්‍යය (5) අත්ථි ප්‍රත්‍යය
(2) අඤ්ඤමඤ්ඤ ,, (6) අවිගත ,,
(3) නිශ්‍රය ,, (7) හේතු ,,
(4) සම්ප්‍රයුක්ත ,,

යන සත් ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

සියලු උපාදානයෝම අනන්තරවූ කර්ම භවයට සයාකාරයෙන් ප්‍රත්‍යය වේ.

(1) අනන්තර ප්‍රත්‍යය (4) අත්ථි ප්‍රත්‍යය
(2) සමනන්තර ,, (5) විගත ,,
(3) අනන්තරූපනිශ්‍රය ,, (6) ආසෙවන ,,

කර්ම භවය ජාතියට දෙයාකාරයකින් ප්‍රත්‍යයවේ.

(1) කර්ම ප්‍රත්‍යය (2) උපනිශ්‍රය ප්‍රත්‍යය

ජාතිය - ජරා මරණාදියට උපනිශ්‍රය ප්‍රත්‍යය ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

නාමය - නාමයට සයාකාරයකින් ප්‍රත්‍යය වේ.

(1) අනන්තර ප්‍රත්‍යය (4) විගත ප්‍රත්‍යය
(2) සමනන්තර ,, (5) ආසෙවන ,,
(3) නත්ථි ,, (6) සම්ප්‍රයුක්ත ,,

නාමය - නාමරූපයන්ට පස් ආකාරයකින් ප්‍රත්‍යයවේ.

(1) හේතු ප්‍රත්‍යය (3) මග්ග ප්‍රත්‍යය (5) විපාක ප්‍රත්‍යය
(2) ධ්‍යාන ,, (4) කර්ම ,,

නාමය - රූපයට - පච්ඡාජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යයවේ.

රූපය - නාමයට - පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

නාමරූප - ප්‍රඥප්ති නාමයට දෙයාකාරයකින් ප්‍රත්‍යය වේ.

(1) ආරම්මණ ප්‍රත්‍යය (2) උපනිශ්‍රය ප්‍රත්‍යය

නාමරූප දෙක - නාමරූප දෙකට නවාකාරයකින් ප්‍රත්‍යය වේ.

(1) අධිපති ප්‍රත්‍යය
(2) සහජාත ,,
(3) අඤ්ඤමඤ්ඤ ,,
(4) නිශ්‍රය ,,
(5) ආහාර ,,
(6) ඉන්ද්‍රිය ප්‍රත්‍යය
(7) විප්‍රයුක්ත ,,
(8) අත්ථි ,,
(9) අවිගත ,,

## ප්‍රඥප්ති

නාමරූප දෙකින් අන්‍යවූ සම්මුතිය ප්‍රඥප්ති නම්වේ. පණවනු ලබන හෙයින්ද, පණවන හෙයින්ද එයට ප්‍රඥප්ති යයි කියනු ලැබේ.

## අර්ථ ප්‍රඥප්ති

1. සමූහ ප්‍රඥප්ති - පෘථිවි, පර්වත, ගංගා සාගර ඝනාදිය සමූහ ප්‍රඥප්ති නම්.
2. සණ්ඨාන ප්‍රඥප්ති - රථ ආදිය.
3. සත්ව ප්‍රඥප්ති - පුරුෂ, පුද්ගල, දිව්‍ය, මනුෂ්‍යාදිය.
4. දිසා ප්‍රඥප්ති - පෙර අපර ආදි දිසා.
5. කාල ප්‍රඥප්ති - උදය, සවස, රාත්‍රි ආදිය.
6. ආකාශප්‍රඥප්ති - කූප ගුහා ආදිය.
7. නිමිත්ත ප්‍රඥප්ති - පතකම්, උද්ගත නිමිති ආදිය.

**නාම ප්‍රඥප්ති** – පරමාර්ථයන්ට හෝ අර්ථ ප්‍රඥප්තීන්ට හෝ පණවන නාමය.

**1. විද්‍යමාන ප්‍රඥප්ති**

පරමාර්ථ වශයෙන් විද්‍යමාන රූප, වේදනා ආදියට රූප, වේදනා ආදියයි කියති.

**2. අවිද්‍යමාන ප්‍රඥප්ති**

පරමාර්ථ වශයෙන් නැති, ධාතු විකාරයක්මවූ භූමි, පර්වත ආදියට – භූමි, පර්වතයයි කියති.

**3. විද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති**

පරමාර්ථ වශයෙන් අභිඥා ඇත. ඒ අභිඥා ලැබූ පුද්ගලයාට ෂඩභිඥ යයි කියති. හේ අවිද්‍යමානය.

**4. අවිද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති**

ස්ත්‍රී ශබ්දයයි කී කල්හි පරමාර්ථ වශයෙන් ස්ත්‍රියක් නැතත්, ස්ත්‍රියගේ ශබ්දයක් ඇත.

**5. විද්‍යමානයෙන් විද්‍යමාන ප්‍රඥප්ති**

චක්ෂුර්විඥානයයි කී තැන පරමාර්ථ වශයෙන් චක්ෂුර් ප්‍රසාදයක්ද ඇත. විඥානයක්ද ඇත.

**6. අවිද්‍යමානයෙන් අවිද්‍යමාන ප්‍රඥප්ති**

රාජපුත්‍ර යයි කී කල්හි පරමාර්ථ වශයෙන් රජෙක්ද නැත. පුත්‍රයෙක්ද නැත.